# 2025

# වාර්ෂික අයවැය ඉදිරිපත් කිරීම







## 2024/2025

## ප්‍රගතිය හා ඉදිරි සැලසුම්

**රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය**

**රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය.**

**பொது நிர்வாகம், மாகாண சபைகள் மற்றும்**
**உள்ளூராட்சி அமைச்சு.**

**Ministry of Public Administration, Provincial Councils & Local Government**

| රාජ්‍ය පරිපාලන අංශය | ස්වදේශ කටයුතු අංශය | පළාත් සභා සහ<br>පළාත් පාලන අංශය |
|---|---|---|
| නිදහස් චතුරස්‍රය,<br>කොළඹ 07,<br>ශ්‍රී ලංකාව<br><br>சுதந்திர சதுக்கம்,<br>கொழும்பு 07,<br>இலங்கை<br><br>Independence Aqure,<br>Colombo 07,<br>Sri Lanka | “නිල මැදුර” ඇල්විටිගල මාවත<br>නාරාහේන්පිට<br>කොළඹ 05,<br>ශ්‍රී ලංකාව<br><br>"நில மெதுர",<br>எல்விடிகல மாவத்தை,<br>நாரஹன்பிட,<br>கொழும் 05,<br>இலங்கை<br><br>“Nila Madura”<br>Elvitigala Mawatha,<br>Narahenpita<br>Colombo 05, Sri Lanka | අංක 330<br>ආචාර්ය කොල්වින් ආර්.ද<br>සිල්වා මාවත<br>(යුනියන් පෙදෙස )<br>කොළඹ 02<br>ශ්‍රී ලංකාව<br><br>இல. 330,<br>டாக்டர். கொல்வின் ஆர்.டி.<br>சில்வா மாவத்தை (யூனியன்<br>பிளேஸ்),<br>கொழும்பு - 02, இலங்கை<br><br>No. 330,<br>Dr. Colvin R.de.Silva<br>Mawatha<br>( Union Place)<br>Colombo – 02<br>Sri Lanka |
| 011- 2 696 211/13<br>011- 2 166 000 | 011-2 050 450 | 011-2 305326/327<br>011- 2 303 280 |
| 011-2 695 279 | 011- 2 551 071 | 011- 2 699 720 |
| information@pubad.gov.lk | info@moha.gov.lk | info@pclg.gov.lk |
| www.pubad.gov.lk | www.moha.gov.lk | www.mpclg.gov.lk |

**<u>රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන ගරු අමාත්‍යතුමාගේ පණිවිඩය</u>**



2024 වර්ෂය, මෙරට දේශපාලනයේත් ආර්ථික හා සමාජයීය පසුබිමෙහිත් පැහැදිලි පරිවර්තනයන් සිදු වූ වර්ෂයකි. රාජ්‍ය සේවය එහිලා ප්‍රබල දායකත්වයක් සපයා තිබේ. ඔවුන් සමඟ එක්ව ගත වූ වසරේ පුළුල් ආර්ථික සහ සමාජයීය සාර්ථකත්වයක් ඇති කිරීමට රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය දැරූ භූමිකාවෙහි කාර්යභාරය සුවිශේෂී වූවකි.

රාජ්‍ය සේවකයාගේ වගකීම් සහ කාර්යභාරය මැනවින් අවබෝධ කරගනිමින් විධිමත් යාන්ත්‍රණයක් ඇතිකිරීමට අවශ්‍ය මූලික අඩිතාලම ගොඩනගා ගැනීමට 2024 වසරේදී රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයට හැකියාව ලැබී ඇත. නව ජාතික ක්‍රියාකාරී සැලැස්මක් සැකසීමට, දිවයිනේ සියලු පළාත් ආවරණය කරමින් ජනතා අදහස් ලබාගන්නා ලද අතර එමඟින් ගොඩනගා ගැනීමට නියමිත සැලසුම්, රාජ්‍ය සේවය කෙරෙහි ජනතාව තුළ තිබූ විශ්වාසය යළි පුබුදු කිරීමට ඉවහල් වනු ඇති බව මගේ විශ්වාසය යි.

අමාත්‍යාංශයක් ලෙස සාර්ථක ප්‍රගතියක් ලබා ගැනීම සඳහා ස්වදේශ කටයුතු අංශය සහ පළාත් සභා සහ පළාත් පාලන අංශය ඉටුකළ සේවාව ද ප්‍රශංසනීය වෙයි. ඔවුන් ද ඇතුළුව සමස්ත රාජ්‍ය සේවය ම විධිමත් කිරීම නව රජයේ මූලික අරමුණකි. **"කාර්යක්ෂම රාජ්‍ය සේවයක් - කුසලතා කේන්ද්‍රීය වෘත්තීයභාවයක්"** තේමාව යටතේ රජයේ ප්‍රතිපත්ති අනුව යමින් රාජ්‍ය සේවය ශක්තිමත් සහ විධිමත්භාවයට පත්කිරීම සඳහා කටයුතු කිරීමට රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය ඇතුළු සමස්ත රාජ්‍ය තන්ත්‍රය ම බැඳී සිටින බව සඳහන් කළයුතු ම ය. විශේෂයෙන්, රාජ්‍ය යාන්ත්‍රණය ඩිජිටල්කරණය කරමින් කාර්යයන් ද්විකරණයකින් සහ ප්‍රමාදයකින් තොරව මහජනතාවට සේවය සැපයීම අමාත්‍යාංශයේ අරමුණයි. ඒ වෙනුවෙන් මේ වන විට රාජ්‍ය අංශයේ මානව සම්පත් කළමණාකරණය සඳහා තොරතුරු තාක්ෂණ පද්ධතියක් සැකසෙමින් තිබේ. එමඟින් රාජ්‍ය සේවය සඳහා වූ ප්‍රතිපත්තියට අනුව සේවා ව්‍යාවස්ථාවන්හි ඇති ගැටලු හඳුනාගෙන, ඒවා සංශෝධනය කිරීම මඟින් සවිමත් රාජ්‍ය සේවයක් බිහි කිරීමේ හැකියාව පවතී.

මෙම සමස්ත රාජ්‍ය සේවා ක්‍රියාවලිය අවසානයේ සේවාලාභීන්, නැතහොත් ඵල ලබන්නන් බවට පත්වන්නේ රටේ පොදු ජනතාවයි. එහිදී සියලු කර්තව්‍යයන් සාක්ෂාත් කරගැනීමට දායකත්වය දැක්වූ වත්මන් පළාත් සභා සහ පළාත් පාලන නියෝජ්‍ය අමාත්‍ය ප්‍රභා රුවන් සෙනරත් මැතිතුමාට විශේෂ ස්තූතිය එක් කරන අතර එවකට අමාත්‍යාංශ ලේකම්තුමා ඇතුළු නිලධාරින්ට සහ සමස්ත රාජ්‍ය සේවයටම තුති පිදීමට ද මෙය අවස්ථාවක් කර ගනිමි. එළැඹුණු 2025 වර්ෂයේදී රජයේ ප්‍රතිපත්තිවලට අනුකූලව එකට එක්ව කටයුතු කරමින් පොහොසත් රටක් නිර්මාණය කිරීමට කැප වෙමු. එය ඔබට, මට, අප සැමට ලස්සන ජීවිතයක් උදාවීමට ද හේතුවනු ඇත.

**ඒ.එච්.එම්.එච්.අබයරත්න**
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය

# පළාත් සභා සහ පළාත් පාලන නියෝජ්‍ය අමාත්‍යතුමන්ගේ පණිවුඩය



ශ්‍රී ලාංකික ප්‍රජාවගේ ජීවන පැවැත්ම සඳහා පළාත් පාලන ආයතන විසින් සුවිශේෂී සේවාවන් රාශියක් මහජනතාව වෙත ළඟාකර දීමේ මෙහෙවර ඉටු කරනු ලබයි.

පළාත් පාලන ආයතන මහජනතාවට සුවිසල් සේවාවක් සලසන අතරම ආදායම් ඇතුළු විවිධ වත්කම් උපයමින් මහජන සේවාවන් පවත්වාගෙන යාමට ප්‍රයත්න දරයි. ඔවුන්ගේ ආදායම් මාර්ග තව දුරටත් විධිමත් හා පුළුල් කිරීමට, පොදු යටිතල පහසුකම් නඩත්තු කිරීමට සහ පොදු උපයෝගී සේවාවන් මැනවින් පවත්වා ගනිමින් ජනතා සේවය සැලසීමට නූතන තාක්ෂණය මුසුකොට ධාරිතා සංවර්ධනය කරමින් මහජනයාට සමීප සහ විනිවිදභාවයෙන් යුතුව සේවා සපයන ආයතන ලෙස ක්‍රියාකිරීම දිරි ගැන්වීමට අවශ්‍ය වැඩපිළිවෙල අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට වග බලාගැනීම අපගේ වගකීමයි.

"ක්ලීන් ශ්‍රී ලංකා" (Clean Sri Lanka) ව්‍යාපෘතිය යථාර්තයක් කරනු වස් පළාත් පාලන ආයතනවලට ඉමහත් කාර්යභාරයක් පැවරී ඇත.

ඒ අනුව ඩිජිටල්කරණයට අවස්ථා සලසමින් ආදායම් ඉපයීමත්, සේවා සැපයීමත් විනිවිද භාවයෙන් යුතුව කාර්යක්ෂමව හා සමාජ, ආර්ථික හා පාරිසරික යහපැවැත්ම තහවුරු වන ආකාරයට පළාත් පාලන ආයතන කාර්යභාරය ඉටු කිරීම අපගේ අභිප්‍රායයි. කසල කළමනාකරණය, ග්‍රාමීය මාර්ග, ප්‍රජා ජලසම්පාදන කටයුතු සහ අනෙකුත් පළාත් පාලන සේවාවන්ට අදාල යටිතලපහසුකම් තිරසාරව පවත්වාගනිමින් ජනතාවට සමීපව ඔවුන්ද සහභාගී කරගෙන අනාගත සංවර්ධන තීරණ ගැනීම හා ඒවා ක්‍රියාත්මක කිරීමේ යුගයක් කරා පළාත් පාලන ආයතන ප්‍රවිෂ්ඨ වී ඇත.

මේ වන විට සියලු පළාත් පාලන ආයතන මහජන නියෝජිතයින්ගෙන් තොරව පවත්වාගෙන යනු ලැබුවද, ඒ වෙත පැවරෙන වගකීම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට පළාත්සභා හා පළාත් පාලන ආයතනවල සියලු නිලධාරීන් ලබා දෙනු ලබන නොමඳ සහයෝගය පැසසුමට ලක් කරමි. එමෙන්ම අප අමාත්‍යාංශයේ සියලුම කටයුතු සාර්ථකව ක්‍රියාත්මක කිරීම තුළින් දේශයේ ජනජීවිතය ඉහල නැංවීම සඳහා අමාත්‍යාංශ ලේකම්තුමන් ප්‍රමුඛ සමස්ත කාර්ය මණ්ඩලය රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙත හා මා වෙත ලබා දෙනු ලබන සහයෝගය බෙහෙවින් අගය කරමි.

**පී. රුවන් සෙනරත් (පා.ම.)**

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන
නියෝජ්‍ය අමාත්‍ය

## රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ සුබ පැතුම් පණිවිඩය



රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ 2024 වර්ෂයට අදාළ වාර්ෂික ප්‍රගති වාර්තාව ඉදිරිපත් කරනු ලබන මෙම අවස්ථාව වන විට අප රට ද ආර්ථිකමය වශයෙන් ඉතාමත් අභියෝගාත්මක කාල පරිච්ඡේදයකට පත්ව ඇති මොහොතක් බව නොරහසකි. මෙම තත්ත්වයෙන් මිදීම සඳහා නාස්තිය, දූෂණය පිටු දකිමින්, අනවශ්‍ය වියදම් සීමා කරමින්, දැඩි මූල්‍ය විනයකින් රාජ්‍ය වියදම් අඩු කිරීමට රජය කටයුතු කරනු ලබයි.

එවැනි පරිසරයක් තුළ අමාත්‍යාංශය වෙත පැවරී ඇති කාර්යය හා කර්තව්‍ය 2025 අයවැය යෝජනා හා රජය විසින් විටින් විට ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ මත ප්‍රමුඛතාකරණයට පෙලගස්වා කටයුතු කළ බව සිහිපත් කරමි. පසුගිය වසරේ අග භාගයේ දී නව රජයක් පත්වීම නිසා රට තුල දේශපාලන ස්ථාවරත්වයක් ස්ථාපිත වීම අනාගතය සම්බන්ධයෙන් සුබවාදී මාවතක් නිර්මාණය වී තිබේ. එමෙන්ම ජනාධිපතිවරණය සහ පාර්ලිමේන්තු මැතිවරණයේ දී ජනතාව සහ රාජ්‍ය සේවකයන් විසින් පුරවැසියන් ලෙස රාජ්‍ය පාලනයෙන් අපේක්ෂා කරන ලද වෙනස පිළිබඳ අභිලාෂය මැනවින් අවබෝධ කරගෙන කටයුතු කිරීම ප්‍රමුඛ බව අවධාරණය කල යුතු වේ.

මෙම මූල්‍ය වර්ෂය සඳහා මහා භාණ්ඩාගාරය විසින් අමාත්‍යාංශය වෙත ලබාදෙනු ලැබූ ප්‍රතිපාදන දැඩි මූල්‍ය විනයක් සහිතව ඵලදායීව සහ කාර්යක්ෂමව අමාත්‍යාංශයේ කාර්ය හා කර්තව්‍යයන් සඳහා යොදවා ඇත. මානව සම්පත් සංවර්ධන සැළැස්මක් සැකසීමට පියවර ගැනීම, රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියක් සැකසීමට පියවර ගැනීම, අමාත්‍යාංශ රාජකාරීන් ඩිජිටල්කරණය කිරීමට සැලසුම් කිරීම, රාජ්‍ය නිලධාරී පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, රජයේ කාර්යාල සඳහා අත්‍යවශ්‍ය දීප ව්‍යාප්ත හා ඒකාබද්ධ නිලධාරීන්ගේ පුරප්පාඩු පිරවීමට අවශ්‍ය පියවර ගැනීම, හා නිලධාරීන්ගේ උසස් වීම් සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට කටයුතු කිරීම, දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය හරහා නව මාවතක් ඔස්සේ රාජ්‍ය සේවකයින්ට අවශ්‍ය පාඨමාලා හැදෑරීමට නව සැලැස්මක් සැකසීමට පියවර ගැනීම, අමාත්‍ය මණ්ඩල පත්‍රිකා සඳහා නිරීක්ෂණ ලබාදීම හා අදාල චක්‍රලේඛ නිකුත් කිරීම මඟින් රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට දායක වීම, විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ විශ්‍රාම වැටුප් අඛණ්ඩව ගෙවීමට හා ඔවුන්ගේ සුභසාධනයට අදාළ පියවර ගැනීමට කටයුතු කිරීම, පළාත් පාලන ආයතනවල ග්‍රාමීය භෞතික හා සමාජ යටිතල පහසුකම් සංවර්ධනයට අදාල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, දිස්ත්‍රික් ලේකම් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ජනතා සුභසාධනයට අදාල කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම, අමාත්‍යාංශය මඟින් 2024 වර්ෂය තුල කරනු ලැබූ කාර්යය හා කර්තව්‍යයන් අතරින් කිහිපයකි.

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ඉහත කාර්යභාරය සාර්ථකව හා ඵලදායීව ඉටු කිරීම සඳහා අවශ්‍ය මඟ පෙන්වීම හා උපදෙස් ලබාදීම සම්බන්ධව ගරු රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය ආචාර්ය ඒ.එච්.එම්.එච්.අබයරත්න මැතිතුමාටත් එතුමාට සහාය දෙමින් අප වෙත නිසි මඟ පෙන්වීම කරනු ලබන ගරු පළාත් සභා සහ පළාත් පාලන නියෝජ්‍ය අමාත්‍ය පී.රුවන් සෙනරත් මැතිතුමාටත්, මෙහි දී මාගේ කෘතඥතාවය පල කර සිටිමි. එමෙන්ම අමාත්‍යාංශයේ කාර්යභාරය සාර්ථකව ඉටු කිරීම සඳහා ඇප කැප වූ අතිරේක ලේකම්වරු, අධ්‍යක්ෂ ජනරාල්වරු, ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරු, ප්‍රධාන මූල්‍ය නිලධාරීන් ඇතුළු සමස්ථ කාර්ය මණ්ඩලයටත්, අමාත්‍යාංශය යටතේ පවත්නා දෙපාර්තමේන්තු සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනවල ප්‍රධානීන් හා එහි කාර්යය මණ්ඩලවලටත්, මාගේ හදපිරි ස්තූතිය පල කර සිටිමි. අමාත්‍යාංශයේ කාර්ය භාරය ඉදිරියටත් කාර්යක්ෂමව කරගෙන යාමට සමස්ථ කාර්ය මණ්ඩලයේ සහයෝගය හා කැපවීම ඉදිරියටත් අපේක්ෂා කරමින් මාගේ සුභාශිංසන මේ සඳහා එක් කරමි.

**එස්.ආලෝක බණ්ඩාර**
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

# රාජ්‍ය පරිපාලන අංශය

# පටුන


පිටු අංකය

| | | | | |
|---|---|---|---|---|
| **1.** | **හැඳින්වීම** | **01** | **-** | **02** |
| **2.** | **විෂයය ක්ෂේත්‍රය - මානව සම්පත් සංවර්ධන** | **03** | **-** | **11** |
| **3.** | **විෂයය ක්ෂේත්‍රය - ප්‍රතිපත්ති** | | | **11** |
| **4.** | **විෂයය ක්ෂේත්‍රය - පහසුකම් සැපයීම** | **12** | **-** | **13** |
| **5.** | **විෂයය ක්ෂේත්‍රය - සහායක සේවා** | **13** | **-** | **20** |
| **6.** | **විෂයය ක්ෂේත්‍රය - විශ්‍රාම වැටුප්** | **20** | **-** | **21** |
| **7.** | **විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව** | **21** | **-** | **26** |
| **8.** | **ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය** | **27** | **-** | **29** |
| **9.** | **මානව සම්පත් සංවර්ධන කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව** | **29** | **-** | **31** |
| **10.** | **දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය** | **31** | **-** | **32** |


**රූප සටහන් නාමාවලිය**


| | | | |
|---|---|---|---|
| රූප සටහන 1.1 | - | රාජ්‍ය පරිපාලන අංශයේ අවධානයට ලක්වූ ප්‍රමුඛ ක්ෂේත්‍රයන් | 02 |
| රූප සටහන 2.1 | - | දීප ව්‍යාප්ත සේවාවන්හි ස්ත්‍රී සහ පුරුෂ නිලධාරී නියෝජනය | 05 |
| රූප සටහන 2.2 | - | අමාත්‍යාංශය යටතේ පරිපාලනය වන දීප ව්‍යාප්ත සේවාවන්හි සමස්ත ස්ත්‍රී සහ පුරුෂ නිලධාරී ව්‍යාප්තිය | 05 |
| රූප සටහන 5.1 | - | 2024.11.30 දින දක්වා අමාත්‍යාංශීය ජල, විදුලි, දුරකථන සහ අන්තර්ජාල පහසුකම් වෙනුවෙන් දැරූ පිරිවැය | 14 |
| රූප සටහන 5.2 | - | 2024.12.31 දින දක්වා අමාත්‍යාංශ ගොඩනැගිලි නඩත්තුව හා ආරක්ෂාව වෙනුවෙන් දරන ලද වියදම | 14 |
| රූප සටහන 5.3 | - | ප්‍රාග්ධන විදයම් සඳහා ප්‍රතිපාදන වෙන් කිරිම සහ 2024.12.31 දිනට තත්‍ය වියදම | 15 |
| රූප සටහන 5.4 | - | පුනරාවර්තන විදයම් සඳහා ප්‍රතිපාදන වෙන් කිරිම සහ 2024.12.31 දිනට තත්‍ය වියදම | 15 |
| රූප සටහන 6.1 | - | විනය කමිටුව වෙත ඉදිරිපත් කරන ලද ගොනු | 20 |
| රූප සටහන 7.1 | - | සක්‍රීය කරන ලද නව විශ්‍රාමිකයින් සංඛ්‍යාව (ජනවාරි- දෙසැම්බර්) | 24 |
| රූප සටහන 7.2 | - | දායක මුදල් ආපසු ගෙවීම් (ජනවාරි- දෙසැම්බර්) | 25 |


**වගු නාමාවලිය**


| | | | |
|---|---|---|---|
| වගුව 2.1 | - | ඒකාබද්ධ සහ දීපව්‍යාප්ත සේවා සඳහා කරන ලද බඳවා ගැනීම් | 03 |
| වගුව 2.2 | - | දීපව්‍යාප්ත සේවාවන්හි ආයතනික කටයුතු | 04 |
| වගුව 2.3 | - | ඒකාබද්ධ සේවාවන්හි ආයතනික කටයුතු | 04 |
| වගුව 2.4 | - | අමාත්‍යාංශ නිලධාරීන් සඳහා ලබා දී ඇති පුහුණු වැඩසටහන් පිළිබඳ සාරාංශය | 05 |
| වගුව 2.5 | - | සේවාරම්භක පුහුණුව ලබා දීම | 05 |
| වගුව 2.6 | - | 2024.12.31 දින දක්වා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව සමස්ථ රාජ්‍ය සේවයේ දේශීය/ විදේශීය වැටුප් රහිත නිවාඩු ලබාගන්නා ලද නිලධාරීන්ගේ තොරතුරු | 07 |
| වගුව 2.7 | - | කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම | 07 |

| | | | |
|---|---|---|---|
| වගුව 2.8 | - | නව බඳවා ගැනීම් | 08 |
| වගුව 2.9 | | දෙමළ භාෂා පුහුණුව | 09 |
| වගුව 2.10 | - | ඉදිරි පුහුණු වැඩ සැලැස්ම | 09 |
| වගුව 2.11 | | 2024.12.31 දින මානව සම්පත් සංවර්ධන අංශයෙහි මූල්‍ය ප්‍රගතිය | 10 |
| වගුව 3.1 | - | රාජ්‍ය සේවයේ ප්‍රතිපත්තිමය තීරණ ලබා ගැනීම සඳහා අමාත්‍යාංශය වෙතින් සපයන ලද දායකත්වය පිළිබඳ සමස්ත සමාලෝචනය | 11 |
| වගුව 5.1 | - | තොරතුරු දැන ගැනීමේ පනත යටතේ ලැබුණු ඉල්ලීම් සම්බන්ධ සාරාංශ වාර්තාව | 14 |
| වගුව 5.2 | - | 2025 අයවැය ඇස්තමේන්තු සාරාංශය | 15 |
| වගුව 5.3 | - | සිදු කරන ලද විගණන විමසුම් සහ විශේෂ විගණන | 17 |
| වගුව 6.1 | - | විශ්‍රාමික නිලධාරීන් සහ විශ්‍රාමික සංගම් විසින් ඉදිරිපත් කරනු ලබන ගැටලු සහිත ලිපි සම්බන්ධ ප්‍රගතිය | 21 |
| වගුව 6.2 | - | විශ්‍රාම වැටුප් අංශය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ, අමාත්‍ය මණ්ඩල සංදේශ සහ අමාත්‍ය මණ්ඩල සටහන් | 21 |
| වගුව 7.1 | - | මාසික විශ්‍රාම වැටුප් ගෙවීම් සංඛ්‍යාව (ජනවාරි - දෙසැම්බර්) | 24 |
| වගුව 7.2 | - | පාරිතෝෂික ගෙවීම් (ජනවාරි - දෙසැම්බර්) | 24 |
| වගුව 7.3 | - | අග්‍රහාර රක්ෂණ අරමුදලට අයකිරීම් (ජනවාරි - දෙසැම්බර්) | 24 |
| වගුව 7.4 | - | රු.5000 මාසික දීමනාව ගෙවීම් (ජනවාරි - දෙසැම්බර්) | 24 |
| වගුව 7.5 | - | රු.3000 ක විශේෂ අත්තිකාරම් දීමනාව ගෙවීම | 25 |
| වගුව 7.6 | - | විශ්‍රාම වැටුප් විෂමතා සහ සංශෝධන (ජනවාරි - දෙසැම්බර්) | 25 |
| වගුව 7.7 | - | සක්‍රීය සේවයේ යෙදී සිටියදී ජීවිතක්ෂයට හෝ බෙලහීනතාවයට පත් ත්‍රිවිධ හමුදා හා පොලිස් සේවා සාමාජිකයින්ට වන්දි වැටුප් හා දීමනා ගෙවීම (2024 ජනවාරි - දෙසැම්බර් දක්වා) | 25 |
| වගුව 7.8 | - | රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ලැබීම් සහ ගෙවීම් (ජනවාරි - දෙසැම්බර්) | 25 |
| වගුව 7.9 | - | රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට අලුතින් එක්වූ සහ ඉවත් වූ සාමාජික සංඛ්‍යාව (ජනවාරි - දෙසැම්බර්) | 25 |
| වගුව 7.10 | - | රා.ප.ච. 14/2022 යටතේ දේශීය හා විදේශීය නිවාඩු ලබා ගන්නා ලද නිලධාරීන්ගෙන් අය කරනු ලැබූ වැන්දඹු/වැන්දඹු පුරුෂ දායක මුදල් ප්‍රමාණය | 26 |
| වගුව 7.11 | - | ආදායම් එකතු කිරීම් (ජනවාරි - දෙසැම්බර්) | 26 |
| වගුව 7.12 | - | පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් | 26 |
| වගුව 8.1 | - | 2024.01.01 සිට 2024.12.31 දින දක්වා කාලය තුළ විභාග අංශය මගින් පවත්වන ලද විභාග සම්බන්ධ තොරතුරු | 27 |
| වගුව 8.2 | - | 2024 වර්ෂයේ ක්‍රියාත්මක කළ පුහුණු වැඩසටහන් | 28 |
| වගුව 8.3 | - | 2025 වර්ෂයේ මුල් භාගය තුළ පැවැත්වීමට නියමිත විභාග | 29 |
| වගුව 9.1 | - | මූල්‍ය ක්‍රියාකාරීත්වය - 2024 | 31 |
| වගුව 10.1 | - | 2024.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය | 31 |
| වගුව 10.2 | - | 2024.121.31 දිනට ක්‍රියාත්මක වැඩසටහන්වල ප්‍රගතිය | 31 |

# 1. හැඳින්වීම

සිවිල් පරිපාලනයේ කේන්ද්‍රස්ථානය වෙමින් ජනතා කේන්ද්‍රීය රාජ්‍ය සේවයක් වෙනුවෙන් රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය, රාජ්‍ය යාන්ත්‍රණය තුළ ප්‍රමුඛතම කාර්යභාරයක් සිදු කරනු ලබයි. එහිදී රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය, මානව සම්පත් කළමනාකරණය, ආයතනික සංවර්ධනය පෙරදැරි කොට ගෙන ක්‍රියාත්මක වන පුළුල් විෂය පථයක් සහිත සුවිශාල කාර්යය භාරයක් අමාත්‍යාංශයේ රාජ්‍ය පරිපාලන අංශය තුළින් ඉටු වේ. ජාතික සංවර්ධන ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා දීප ව්‍යාප්ත සේවාවන් හා සමස්ත ඒකාබද්ධ සේවාවන්හි පරිපාලන කටයුතු සිදු කරමින් රාජ්‍ය සේවය තුළ මානව සම්පත වඩාත් ඵලදායී ලෙස කළමනාකරණය කිරීම මෙම අංශයේ මූලික පරමාර්ථය වේ.

මහජනතාවට තෘප්තිමත් රාජ්‍ය සේවාවක් සැපයීම සඳහා සාධාරණත්වය, සමරූපිතාවය හා කාර්යක්ෂමතාවය කෙරෙහි විශේෂයෙන් සැලකිලිමත් වෙමින්, පරිපාලන විධිවිධාන හා රෙගුලාසි සකස්කිරීම මෙම අමාත්‍යාංශය සතු මූලික වගකීමකි. ඒ අනුව ආයතන සංග්‍රහය හා අදාළ නව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ සකස්කරමින්, සංශෝධනය කරමින්, අවශ්‍ය අවස්ථාවලදී ඒ සම්බන්ධ නිරීක්ෂණ ලබා දීම ද මෙම අංශයෙන් සිදු කරනු ලබයි. රාජ්‍ය සේවා කටයුතු සම්බන්ධයෙන් ජාතික මට්ටමේ ප්‍රතිපත්ති සම්පාදනය, අර්ථකථනය හා ඒ සම්බන්ධ මාර්ගෝපදේශ සැපයීම මෙම අමාත්‍යාංශය වෙතින් ඉටුවන තවත් සුවිශේෂී කාර්යයකි. එමඟින් වඩා ඵලදායී සේවාවක් ලබා දීමට හැකිවන පරිදි සමස්ත රාජ්‍ය සේවයෙහි ම ක්‍රියාකාරීත්වය ගොඩනැගීම හා පාලනය සිදුකරනු ලබයි. රාජ්‍ය සේවයේ කාර්යය මණ්ඩල නිපුණතාව ඉහළ නැංවීම සඳහා අවශ්‍ය පුහුණුවීම් ලබාදීමද මෙම අමාත්‍යාංශය සතු තවත් එක් සුවිශේෂී කාර්යයභාරයකි.

**දැක්ම**

**" දැයට විශිෂ්ඨ රාජ්‍ය සේවයක් "**

**මෙහෙවර**

**"මානව සම්පත නිසි පරිපාලනය, කළමනාකරණය හා ප්‍රතිසංස්කරණය තුළින් විශිෂ්ඨ රාජ්‍ය සේවයක් තහවුරු කිරීම "**

**අරමුණු**

- රාජ්‍ය සේවයේ මානව සම්පත් කළමනාකරණ පිලිවෙතට අනුගත වෙමින් බඳවා ගැනීම්, පාරිශ්‍රමික සහ අනෙකුත් සේවා කොන්දේසි පිළිබඳ ඵලදායී රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය කිරීම.
- මහජන අවශ්‍යතා සඳහා ප්‍රතිචාර දැක්වීමේදී දැනට රාජ්‍ය සේවයේ සිටින සේවකයින්ගේ සිතුම් පැතුම් සහ ආකල්ප නව මානයන් කරා මෙහෙයවීම.
- රාජ්‍ය සේවයේ ඵලදායීතාව සහ ගුණාත්මක බව ඉහළ නැංවීම උදෙසා නව කළමනාකරණ ව්‍යුහයක් සම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- හර පද්ධතියක් ස්ථාපිත කොට බෙදා හදා ගැනීම (ප්‍රතිඵලාභිමුඛ ආකල්ප, වගවීම, සම්පත් විචක්ෂණයෙන් ලෙස යොදා ගැනීම, අපක්ෂපාතිත්වය, පාරදෘශ්‍යබව ආදියෙන් සමන්විතව)
- රාජ්‍ය අංශයේ පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම සහ පුහුණු වැඩසටහන් පැවැත්වීමට ඇවැසි පහසුකම් සැපයීම.
- විශ්‍රාම වැටුප් සම්බන්ධ ගැටළුවලට පිළියම් යෙදීම සඳහා විශ්‍රාම වැටුප් වැඩසටහන් සම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- රජයේ සංවර්ධන ඉලක්ක සහ ප්‍රමුඛතා සපුරාලීමේ හැකියාව සහිත රාජ්‍ය අංශයේ ආයතනික සංවර්ධනය සඳහා රාමුවක් සකස් කරගැනීම.
- සේවා සැපයුමේ ඵලදායීතාව සහ ගුණාත්මක බව ඉහළ නැංවීම සඳහා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය යොදා ගැනීම ප්‍රවර්ධනය කිරීම.
- රාජ්‍ය සේවයේ කාර්ය මණ්ඩලයේ නිපුණතාව වැඩි දියුණු කිරීම.
- වෙනස් වෙමින් පවතින තත්ත්වයන්ට අනුව කටයුතු කිරීම පිණිස පද්ධති සරල කිරීම සහ ක්‍රියාදාම යළි සකස් කිරීම සඳහා මාර්ගෝපදේශ වැඩි දියුණු කිරීම, වර්ධනය කිරීම සහ ක්‍රියාවට නැංවීම.

**සුවිශේෂී අවස්ථා**

- **නව බඳවාගැනීම්**
  - 2024 වර්ෂයේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයට විවෘත පදනමින් බඳවාගත් නවක නිලධාරීන් 51 දෙනෙකු හට 2024.08.15 දින පත්වීම් ලිපි ප්‍රදානය කර ඇත.



**ක්‍රමසම්පාදන සේවයේ පත්වීම් ප්‍රදානය**

  - ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ III ශ්‍රේණියට සීමිත පදනමින් බඳවාගත් නිලධාරීන් 08 දෙනෙකු සඳහා 2024.07.15 දින පත්වීම් ලිපි ප්‍රදානය කර ඇත.
  - ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයට විවෘත පදනමින් බඳවා ගන්නා ලද නිලධාරීන් 08 දෙනෙකු සඳහා 2024.09.18 දින පත්වීම් ලිපි ප්‍රදානය කරන ලදී.

- ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නිලධරයන් සඳහා විද්‍යාත්මක පර්යේෂණ නිබන්දනයක් හෝ පත්‍රිකාවක් සකස් කිරීම සම්බන්ධයෙන් පුහුණු වැඩසටහන් දෙකක් සංවිධානය කිරීම හා ඔවුන්ගේ ප්‍රකාශ එළි දැක්වීම් සඳහා අන්තර්ජාල ජර්නල් සඟරාවක් ආරම්භ කිරීම

- ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයට සීමිත පදනම මත බඳවාගත් නිලධාරින් 43 දෙනෙකු සඳහා 2024.10.14 දින පත්වීම් ලිපි ප්‍රදානය කරන ලද අතර, එම නිලධාරීන් සඳහා සේවාරම්භක පුහුණුව ආරම්භ කර ඇත.




ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයට සීමිත පදනම මත බඳවාගත් නිලධාරින් 43 දෙනෙකු සඳහා සේවාරම්භක පුහුණුව

## රාජ්‍ය පරිපාලන අංශයේ අවධානයට ලක්වූ ප්‍රමුඛ ක්ෂේත්‍රයන්

**රූප සටහන 1.1 - රාජ්‍ය පරිපාලන අංශයේ අවධානයට ලක්වූ ප්‍රමුඛ ක්ෂේත්‍රයන්**




අමාත්‍යාංශයට පැවරී ඇති විෂයය පරාසය යටතේ ඉටු කරනු ලබන කාර්යයන් සැලකිල්ලට ගනිමින් ප්‍රධාන විෂයය ක්ෂේත්‍ර 4ක් ඔස්සේ ඒවා ගොනුකර ඇති අතර, ඊට අමතරව ඉහත ප්‍රමුඛ ක්ෂේත්‍රයන් සඳහා සහය සැපයීම වෙනුවෙන් සහයක සේවා යටතේ තවත් අංශ හයක් සේවා සැපයීමේ කටයුතු සිදු කරනු ලබයි.

ඒ ඒ කාර්යයන් ඉටු කරනු ලබන අදාළ අංශ ද එම ප්‍රමුඛ ක්ෂේත්‍රයන් යටතෙහි ම ලා සලකමින් අමාත්‍යාංශය අත්පත් කරගෙන ඇති ප්‍රගතිය ඒ ඔස්සේ අධීක්ෂණය කිරීම සිදු කරයි

## 2. විෂයය ක්ෂේත්‍රය - මානව සම්පත් සංවර්ධන

රාජ්‍ය පරිපාලන අංශය යටතේ, ප්‍රධාන වශයෙන්ම දීපව්‍යාප්ත සේවාවන් සහ සියළුම ඒකාබද්ධ සේවාවන් සඳහා නවක නිලධාරීන් බඳවා ගැනීම, මානව සම්පත නිසි ලෙස පරිපාලනය හා කළමනාකරණය කිරීම ඔස්සේ ආංශික කාර්යය සාධන දර්ශකයන් සපුරා ගැනීම යන ඉලක්කයන් ඔස්සේ ක්‍රියාත්මක වන සියළුම අංශයන් මෙම විෂයය ක්ෂේත්‍රය යටතේ සලකනු ලබයි.

වගුව 2.1 - ඒකාබද්ධ සහ දීපව්‍යාප්ත සේවා සඳහා කරන ලද බඳවා ගැනීම්

| සේවා අංශය | වාර්ෂිකව බඳවාගත් ප්‍රමාණයන් | | | | | |
|---|---|---|---|---|---|---|
| | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
| දීපව්‍යාප්ත සේවා | | | | | | |
| ශ්‍රී ලංකා පරිපාලන සේවය | 221 | - | 253 | 01 | - | 62 |
| ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය | 36 | - | 32 | - | - | 61 |
| ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය | - | 1 | - | 10 | - | 08 |
| ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය | 233 | - | 133 | - | - | 20 |
| ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය | 106 | - | - | - | - | 50 |
| ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය | 34 | 30 | 223 | 71 | - | - |
| ඒකාබද්ධ සේවා | | | | | | |
| කළමනාකරණ සේවා නිලධාරි සේවය | 09 | - | - | - | 932 | - |
| භාෂා පරිවර්තක සේවය | - | - | - | - | 95 | - |
| පුස්තකාලයාධිපති සේවය | 13 | - | - | - | 22 | 38 |
| තොරතුරු තාක්ෂණ සේවය | 503 | 211 | - | - | 31 | 97 |
| සංවර්ධන නිලධාරි සේවය | - | 58,227 | 10,270 | 22,940 | - | 324 |
| කාර්යාල කාර්ය සහායක සේවය | 986 | 1,249 | 431 | - | 112 | 599 |
| රියදුරු සේවය | 209 | 175 | 86 | - | - | 83 |
| වාර්ෂික බඳවාගැනීම් සංඛ්‍යාව | **2,350** | **59,893** | **11,428** | **23,022** | **1,192** | **1,342** |

ඉහත සඳහන් සියළුම සේවාවන් වෙත බඳවාගන්නා ලද මානව සම්පත වඩාත් ඵලදායි ලෙස කළමනාකරණය කිරීම අරමුණු කරගනිමින් සිදු කරන ලද ආයතනික කටයුතුවල සමස්ත සාරාංශය දීප ව්‍යාප්ත හා ඒකාබද්ධ සේවා මට්ටමින් පහත පරිදි දැක්විය හැකිය.

### දීපව්‍යාප්ත සේවා

අමාත්‍යාංශය යටතේ පරිපාලනය වන දීපව්‍යාප්ත සේවාවන් හයෙහි 2024.12.31 දක්වා ආයතනික කටයුතු පහත පරිදි සිදු වී ඇත.

## වගුව 2.2 - දීපව්‍යාප්ත සේවාවන්හි ආයතනික කටයුතු

| කාර්යයන් | දීපව්‍යාප්ත සේවාවන් | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | ශ්‍රී.ලං.ග.සේ | ශ්‍රී.ලං.ක්‍ර.සේ | ශ්‍රී.ලං.ඉ.සේ | ශ්‍රී.ලං.ප.සේ | ශ්‍රී.ලං.වි.සේ | ශ්‍රී.ලං.වා.වි.සේ | ශ්‍රී.ලං.තා.සේ |
| **කාර්යය මණ්ඩලය** | | | | | | | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය සඳහා බඳවාගැනීම් සහ ආයතනික කටයුතු ඊට අදාළ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මඟින් සිදු කරනු ලබන අතර, ප්‍රතිපත්ති තීරණ ගැනීම මෙම අමාත්‍යාංශය මඟින් සිදු කරනු ලබයි. |
| අනුමත සංඛ්‍යාව | 2,065 | 1,299 | 1,527 | 3, 231 | 649 | 69 | |
| තත්‍ය සංඛ්‍යාව | 1,572 | 986 | 1,083 | 2,486 | 472 | 56 | |
| නව බඳවාගැනීම් | 20 | 50 | - | 62 | 61 | 08 | |
| ස්ථිර කිරීම් | 56 | 24 | 44 | 131 | 31 | 05 | |
| **උසස් කිරීම්** | | | | | | | |
| III සිට II | 65 | 26 | 49 | 19 | 23 | 03 | |
| II සිට I | 16 | 88* | 43 | 279 | 18 | 02 | |
| I සිට විශේෂ/අධි ශ්‍රේණියට | 24 | 05 | 14 | 75 | 04 | - | |
| විශ්‍රාම යාම් | 35 | 58 | 34 | 68 | 09 | 02 | |
| වාර්ෂික නොවන ස්ථාන මාරු | 174 | 74 | 13 | 486 | 05 | 01 | |
| වාර්ෂික ස්ථාන මාරු | 21 | 11 | - | 39** | - | - | |
| මුදාහැරීම් | 22 | 04 | 04 | 81 | - | - | |
| **විනය කටයුතු** | | | | | | | |
| විනය කටයුතු ආරම්භ කරන ලද සංඛ්‍යාව | 40 | 04 | 07 | 110 | 03 | - | |
| චෝදනා පත්‍ර නිකුත් කිරීම/නිදහසට කරුණු විමසීම | 17 | 05 | 06 | 20 | - | - | |
| විනය නියෝග නිකුත් කිරීම | 20 | 01 | 07 | 14 | 01 | - | |
| සේවා අත්හැරයාමේ නිවේදනවලට එරෙහිව කරන ලද අභියාචනා | 02 | - | 07 | 01 | 01 | - | |

** රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගයට අනුව ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ II ශ්‍රේණියේ නිලධාරීන් I ශ්‍රේණියට උසස් කිරීම සම්බන්ධව ඉදිරි ක්‍රියා මාර්ග ගනු ඇත. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2022 ප්‍රකාරව රාජකාරි ආවරණය කිරීම සඳහා I ශ්‍රේණියේ තනතුරු 88ක් පදනම් කරගෙන නිලධාරීන් 88ක් සඳහා දැනට සුදුසුකම් අනුව පූර්ණකාලීනව රාජකාරී ඉටු කිරීම යන පදනම මත නිලධාරීන් පත් කර ඇත.*

*****2025 වර්ෂයට අදාළව වාර්ෂික ස්ථාන මාරු චක්‍ර 39 ක් යටතේ ස්ථාන මාරුවීම් ලබා දී ඇති අතර, විශේෂයෙන් සඳහන් කර ඇති දිනයන් හැර 2025.03.02 දින සිට එම ස්ථාන මාරු ක්‍රියාත්මක වේ.***

## වගුව 2.3 - ඒකාබද්ධ සේවාවන්හි ආයතනික කටයුතු

| කාර්යය | භාෂා පරිවර්තක සේවය | පුස්තකාලයාධිපති සේවය | කළමනාකරණ (අධි) ශ්‍රේණිය | සංවර්ධන නිලධාරි සේවය | කළමනාකරණ සේවා නිලධාරි සේවය | රියදුරු සේවය | කාර්යාල කාර්ය සහයක සේවය | තොරතුරු සන්නිවේදන තාක්ෂණ සේවය 1 පන්තිය | 2 පන්තිය | 3 පන්තිය |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| **කාර්යය මණ්ඩලය** | | | | | | | | | | |
| අනුමත සංඛ්‍යාව | 636 | 618 | | ** | 29,785 | 9,443 | 17,218 | 130 | 524 | 2,766 |
| තත්‍ය සංඛ්‍යාව | 295 | 136 | | 79,443 | 24,629 | 8,521 | 15,035 | 90 | 279 | 1,549 |
| නව බඳවාගැනීම් | - | 38 | | - | - | 83 | 599 | 09 | 88 | 227 |
| ස්ථිර කිරීම | 01 | 15 | | 2,089 | 1,035 | 184 | 846 | - | 16 | 57 |
| **උසස් කිරීම්** | | | | | | | | | | |
| III සිට II | - | 08 | | 12,100 | 1,589 | 259 | 428 | 01 | - | 31 |
| II සිට I | - | 02 | | 70 | 319 | 42 | 153 | 02 | - | 39 |
| I සිට විශේෂ/ අධි ශ්‍රේණියට | - | - | | - | 170 | 62 | 379 | 01 | - | - |
| විශ්‍රාම යාම් | 03 | 10 | | 55 | 518 | 158 | 237 | 06 | 02 | 13 |
| වාර්ෂික නොවන ස්ථාන මාරු | 15 | 05 | | 1,806 | 1,223 | 300 | 312 | - | 16 | 51 |
| වාර්ෂික ස්ථාන මාරු | 09 | 03 | | 1,621 | 3,433 | 235 | 978 | - | 21 | 176 |
| මුදාහැරීම් | 07 | 01 | | 527 | 210 | 02 | 250 | 01 | 08 | 24 |
| **විනය කටයුතු** | | | | | | | | | | |
| විනය කටයුතු ආරම්භ කරන ලද සංඛ්‍යාව | 01 | - | 04 | 54 | 27 | 17 | 33 | - | 02 | - |
| චෝදනා පත්‍ර නිකුත් කිරීම/නිදහසට කරුණු විමසීම | 01 | - | 02 | 32 | 24 | 08 | 07 | - | 02 | - |
| විනය නියෝග නිකුත් කිරීම | - | - | | 35 | 11 | 15 | 18 | - | - | - |
| සේවා අත්හැරයාමේ නිවේදනවලට එරෙහිව කරන ලද අභියාචනා | 01 | - | - | 51 | 21 | 10 | 33 | - | 02 | - |

** * කලමනාකරණ සේවා දෙපාර්තමේන්තුව අනුමත කරමින් පවතී.*

දීපව්‍යාප්ත සේවාවන්ට බඳවාගැනීමේදී ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයටම සමාන අවස්ථා සලසා ඇති අතර, ස්ත්‍රී පුරුෂ භාවය අනුව නිලධාරීන්ගේ ව්‍යාප්තිය පහත ප්‍රස්තාරයන්හි නිරූපණය වේ

**රූප සටහන 2.1 - දීප ව්‍යාප්ත සේවාවන්හි ස්ත්‍රී සහ පුරුෂ නිලධාරී නියෝජනය**




**රූප සටහන 2.2 - අමාත්‍යාංශය යටතේ පරිපාලනය වන දීප ව්‍යාප්ත සේවාවන්හි සමස්ථ ස්ත්‍රී සහ පුරුෂ නිලධාරී ව්‍යාප්තිය**




**2024 වර්ෂයේ සුවිශේෂී කාර්යසාධනයන්**

- ♦ **අමාත්‍යාංශයේ නිලධාරීන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම.**

මානව සම්පත් සංවර්ධන අංශය විසින් අමාත්‍යාංශයේ සියළුම නිලධාරීන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් සේවා ගණයන් අනුව විශේෂීකරණය වෙමින් භෞතික ක්‍රමවේදය ඔස්සේ පැවැත්වීමට කටයුතු කර ඇත.

**වගුව 2.4 - අමාත්‍යාංශ නිලධාරීන් සඳහා ලබා දී ඇති පුහුණු වැඩසටහන් පිළිබඳ සාරාංශය**

| සේවා ගණය | දේශීය පුහුණු පාඨමාලා | | විදේශීය පුහුණු පාඨමාලා | |
|---|---|---|---|---|
| | කෙටි කාලීන | දිගු කාලීන | කෙටි කාලීන | දිගු කාලීන |
| කළමනාකරණ | 11 | 06 | 11 | - |
| කළමනාකරණ නොවන | 72 | - | - | - |

- ♦ **නවක නිලධාරීන් සඳහා සේවාරම්භක පුහුණු ලබාදීම**

**වගුව 2.5 - සේවාරම්භක පුහුණුව ලබා දීම.**

| සේවාව | සේවාරම්භක පුහුණුව ලබා දීම |
|---|---|
| **ඒකාබද්ධ සේවා** | |
| **පුස්තකාලයාධිපති සේවය** | III ශ්‍රේණියට බඳවාගත් නවක නිලධාරීන් සඳහා සේවාරම්භක පුහුණුව මැයි මස පවත්වා ඇත. |
| **කළමනාකරණ සේවා නිලධාරී සේවය** | සීමිත පදනමින් බඳවාගත් අධි ශ්‍රේණියේ නිලධාරීන් සඳහා සේවාරම්භක පුහුණුව පෙබරවාරි මස පවත්වන ලදී.<br>සීමිත පදනමින් III ශ්‍රේණියට බඳවාගත් නිලධාරීන් 729 ක් සඳහා සේවාරම්භක පුහුණුව පවත්වා ඇත. |
| **තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය** | 2 (II) ශ්‍රේණියේ නිලධාරීන් 88 ක් සඳහා සේවාරම්භක පුහුණුව ඉදිරි මාස කිහිපය තුළ පැවැත්වීමට නියමිතය. |

- ♦ **අමාත්‍යාංශයෙන් බැහැර නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය**

– 2024 වර්ෂය සඳහා කළමනාකරණ සේවා නිලධාරී සේවය 1 ශ්‍රේණියේ නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාග අවශ්‍යථාවය නිදහස් කිරීම වෙනුවෙන් පවත්වනු ලබන දින 10 ක පුහුණු පාඨමාලාව පැවැත්වීම සඳහා ප්‍රතිපාදන ඉල්ලා ඇති දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත ප්‍රතිපාදන ලබා දීම සහ එහි ප්‍රගතිය ලබා ගැනීමට කටයුතු කර ඇත. බදුල්ල, ගම්පහ, ත්‍රිකුණාමලය, කෑගල්ල, කුරුණෑගල, පුත්තලම, මොණරාගල, මඩකලපුව, ගාල්ල (මාතර), රත්නපුර, අනුරාධපුර, කිලිනොච්චි, කොළඹ, අම්පාර, මාතලේ යන දිස්ත්‍රික්ක මේ වන විට ප්‍රතිපාද නලබා දී ඇති දිස්ත්‍රික්ක වේ.

– රාජ්‍ය සේවයේ මානව සම්පතෙහි දැනුම වර්ධනය කිරීම සඳහා දිස්ත්‍රික් මට්ටමින් පවත්වනු ලබන පුහුණු වැඩසටහන් මාලාවෙහි කොළඹ, ගම්පහ, කළුතර, කුරුණෑගල, පුත්තලම, අනුරාධපුරය, පොළොන්නරුව, බදුල්ල, මොණරාගල යන දිස්ත්‍රික්කවල වැඩසටහන් 05 ක් මේ වන විට පවත්වා ඇති අතර, නිලධාරීන් 1,012 දෙනෙක් පුහුණුව ලබා ඇත.

- ♦ **කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම**

අමාත්‍යාංශයේ දෙපාර්තමේන්තුගත තනතුරු දරන ප්‍රාථමික, ශිල්පීය සේවා ගණයේ නිශ්චල ඡායාරූප ශිල්පී

තනතුර සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය පවත්වා ප්‍රතිඵල නිකුත් කර ඇත.

- **දූෂණ විරෝධී පුහුණුකරුවන් හා සුපිළිපන්න නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන**

පළාත් නවය සහ රේඛීය අමාත්‍යාංශ ආවරණය කරමින් දිවයින පුරා දූෂණ විරෝධී පුහුණුකරුවන් පුහුණු කිරීමේ නේවාසික පුහුණු වැඩසටහන් 10 ක් සහ සුපිළිපන්න නිලධාරීන් පුහුණු කිරීමේ එක් දින පුහුණු වැඩසටහන් 10 ක් මානව සම්පත් සංවර්ධන අංශයේ සම්බන්ධීකරණ සහාය ඇතිව සංවිධානය කර පවත්වන ලදී.

2025 – 2029 සඳහා නව ජාතික ක්‍රියාකාරී සැලැස්මක් සැකසීම සඳහා පළාත් නවයම ආවරණය වන පරිදි ජනතා අදහස් හා යෝජනා ලබා ගැනීම සඳහා වැඩසටහන් මාලාවක් අගෝස්තු මාසය පුරා සංවිධානය කර පවත්වන ලදී.

- **පුහුණුවීම් සඳහා දේශීය / විදේශීයව එළැඹ ඇති ගිවිසුම් පිළිබඳ තොරතුරු**

– **ශ්‍රී ලංකා මධ්‍යම සහ ඌව පළාත්වල කොවිඩ්-19 වසංගතයෙන් පීඩාවට පත් ප්‍රජාවන්ගේ සමාජ ආර්ථික ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය – (KOICA)**

මෙම ව්‍යාපෘතිය නුවරඑළිය දිස්ත්‍රික්කයේ නුවරඑළිය, වලපනේ, හඟුරන්කෙත, කොත්මලේ සහ අඹන්ගමුව යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල සහ බදුල්ල දිස්ත්‍රික්කයේ මහියංගනය, රිදීමාලියද්ද, හල්දුම්මුල්ල, බදුල්ල, බණ්ඩාරවෙල හා වැලිමඩ යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ක්‍රියාත්මක අතර, එමගින් තිරසාර සුරක්ෂිත පානීය ජලය සඳහා ප්‍රවේශය වැඩි දියුණු කිරීම, ප්‍රමාණවත් සනීපාරක්ෂක පහසුකම් සැපයීම, ජලය, සනීපාරක්ෂාව හා ස්වාස්ථ්‍යාව ආශ්‍රිත රෝග අවම කිරීම, පුද්ගලික ස්වස්ථතාව සහ පාරිසරික පිළිවෙත් ප්‍රවර්ධනය කිරීම, නිවාරක හා රෝගනාශක ප්‍රාථමික සෞඛ්‍ය සේවා පහසුකම් වැඩිදියුණු කිරීම, යහපත් කෘෂිකාර්මික පහසුකම් හා ව්‍යාපෘති සේවා වැඩිදියුණු කිරීම, පසු අස්වනු හානි අවම කිරීම සහ තෝරාගත් ප්‍රදේශවල ආහාර සුරක්ෂිතතාව සහ ගෘහ ආදායම ඉහළ නැංවීම අරමුණු කර ඇත. ව්‍යාපෘතියේ 2024.11.30 දිනට ප්‍රගතිය 65% ක් වේ.

– **රාජ්‍ය අංශයේ සේවක ආරවුල් විසඳීම සඳහා බේරුම්කාර යාන්ත්‍රණයක් හඳුන්වාදීම**

සේවාස්ථාන ප්‍රතිසංස්කරණ තුළින් ශ්‍රී ලංකාව තුළ ඉහළ ගුණාත්මකභාවයකින් යුතු රාජ්‍ය සේවයක් ගොඩනැගීම සඳහා මෙම අමාත්‍යාංශය සහ ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO) එක්ව රාජ්‍ය අංශයේ සේවක ආරවුල් විසඳීම සඳහා බේරුම්කාර යාන්ත්‍රණයක් හඳුන්වාදීම සඳහා කටයුතු කරමින් පවතී.

මීට අදාළ ව්‍යාපෘති වාර්තාවට 2024.04.30 දින අත්සන් තබා ඇති අතර, රාජ්‍ය ආයතනවල සේවා ස්ථාන සංසද හා ආංශික සංසද පිහිටුවීමේ කටයුතු හා ඊට අදාළ දැනුවත් කිරීමේ කටයුතු සිදු කරමින් පවතී. එසේම පළාත් සමථකරණ මණ්ඩල පිහිටුවීමේ කටයුතු හා ජාතික බේරුම්කරණ සංචිතය පිහිටුවීමට අදාළ කටයුතු සිදු කරමින් පවතී.

- **අමාත්‍ය මණ්ඩල තීරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය**

අමප/22/1049/605/017 හා 2022 සැප්තැම්බර් 23 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව ශ්‍රී ලංකාවේ මධ්‍යම සහ ඌව පළාත්වල වසංගතයෙන් පීඩාවට පත් ප්‍රජාවන්ගේ සමාජ - ආර්ථික ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමක් කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීම සඳහා UN Habitat ආයතන මගින් සකස් කර ඇති ක්‍රියාකාරී සැලැස්මට (2022-2025) අනුව 65% ක ප්‍රගතියක් මේ වන විට ළඟා කරගෙන ඇත.

අමප/23/2138/605/068 හා 2023 නොවැම්බර් 20 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව රාජ්‍ය සේවයේ ආරවුල් වැළැක්වීම සහ ආරවුල් නිරාකරණය සඳහා යාන්ත්‍රණයක් හඳුන්වා දීම යටතේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 05/2024 නිකුත් කර ඇති අතර, ඒ අනුව අංශ 05 ක් සඳහා සේවාස්ථාන සංසද පිහිටුවීමට අදාළ කටයුතු සිදු කරමින් පවතී. රාජ්‍ය පරිපාලන අංශයේ සේවා ස්ථාන සංසද සහ ආංශික සංසද පිහිටුවා ඇත.

අමප/24/2087/816/003 හා 2024 දෙසැම්බර් 02 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව “දිප ව්‍යාප්ත සේවාවන්ට අයත් විධායක නිලධාරීන් පුහුණු කිරීම සඳහා ශ්‍රී ලංකා ජනරජය වෙනුවෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය සහ ඉන්දියානු ජනරජය වෙනුවෙන් යහපාලනය සඳහා වන ජාතික මධ්‍යස්ථානය අතර අවබෝධතා ගිවිසුමට අත්සන් තැබීම” පිණිස රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලෙකම් වෙත බලය ලබාදුන් අතර, ඒ අනුව උක්ත ගිවිසුමට අත්සන් තැබීම 2024 දෙසැම්බර් 10 වන දින කොළඹ දී සිදුවිණි.

- **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 හා 14/2022 (II) ජ්‍යෙෂ්ඨත්වයට හා විශ්‍රාම වැටුපට හානියක් නොවන පරිදි රාජ්‍ය නිලධාරීන්ට දේශීය/ විදේශීය වැටුප් රහිත නිවාඩු ලබාදීම සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ ඉල්ලීම් සඳහා කමිටු නිර්දේශ ලබාදීම.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018 හා 02/2018 (1) චක්‍රලේඛවලට අනුව මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කිරීමට අවශ්‍ය දැනුම ලබා දීමට අදාළ පුහුණු වැඩසටහන් දකුණ, බස්නාහිර, වයඹ, උතුරුමැද,

සබරගමුව, බස්නාහිර පළාත් සභාව යන පළාත්වල නිලධාරීන් 923 ක් සඳහා පැවැත්වීම.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 05/2024 අනුව අංශ 05 ක් සඳහා (සෞඛ්‍යය, ප්‍රවාහන, අධ්‍යාපන, විදුලිබල හා බලශක්ති, වරාය හා ගුවන්සේවා) සේවාස්ථාන සංසද පිහිටුවීමට අදාළ කටයුතු සිදු කරමින් පවතී. රාජ්‍ය පරිපාලන අංශයේ සේවා ස්ථාන සංසද සහ ආංශික සංසද පිහිටුවා ඇත.

**වගුව 2.6 – 2024.12.31 දින දක්වා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 අනුව සමස්ථ රාජ්‍ය සේවයේ දේශීය/ විදේශීය වැටුප් රහිත නිවාඩු ලබාගන්නා ලද නිලධාරීන්ගේ තොරතුරු**

| නිවාඩු වර්ගය | නිවාඩු ලබා ගත් නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|
| **දේශීය වැටුප් රහිත නිවාඩු** | 3,460 |
| **විදේශීය වැටුප් රහිත නිවාඩු** | 7,673 |

- ♦ **කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම**

**වගුව 2.7 - කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම**

| සේවාව | | ප්‍රගතිය |
|---|---|---|
| **ශ්‍රී ලංකා පරිපාලන සේවය**<br>**ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය**<br>**ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය**<br>**ශ්‍රී ලංකා විද්‍යාත්මක හා වාස්තු විද්‍යාඥ සේවය** | – | පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2020 (I) සහ 2020 (II) විභාග නිවේදන නිරීක්ෂණ ලබා ගැනීම සඳහා 2024.04.08 දින ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙත යොමු කර ඇත |
| **ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවය** | – | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාග පහත පරිදි පවත්වා ඇත.<br>I වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2023.12.03, 2023.12.09 හා 2023.12.10<br>II වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2023.12.02 සහ 2023.12.03 |
| **ශ්‍රී ලංකා තාක්ෂණ සේවය** | – | 2018 (II) හා 2018 (III) ශ්‍රේණි සඳහා පවත්වන ලද කාර්යක්ෂමතා කඩඉම් විභාගවල ප්‍රතිඵල 2024 පෙබරවාරි හා මාර්තු මස නිකුත් කර ඇත. |
| | – | (2019 (III) හා 2019 (II) ශ්‍රේණි සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාග 2025 ජනවාරි මස පැවැත්වීමට නියමිතව ඇත. |
| | – | I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන III වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 7 කණ්ඩායම 2024 සැප්තැම්බර් මස විභාග පවත්වන ලදී. |
| | – | I ශ්‍රේණියේ නිලධාරීන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ තරග විභාගය - 2020 ප්‍රතිඵල 2024 පෙබරවාරි මස නිකුත් කර ඇත. |
| | – | I ශ්‍රේණියේ නිලධාරීන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ තරග විභාගය 2020/2022/2023 පැවැත්වීමට අයදුම් පත් කැඳවා ඇත. |
| **ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ සේවය**<br>**1 ,2 හා 3 පන්ති** | – | **“ කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2019 (I) 2023”** විභාග නිවේදන නිරීක්ෂණ 2024.09.04 දින ලැබී ඇති අතර, 2024.10.19 දින සිට 2024.10.27 දින දක්වා පැවැත්වීමට නියමිතය. |
| **පුස්තකාලයාධිපති සේවය**<br>**(II) හා (III) ශ්‍රේණි** | – | (II) හා (III) ශ්‍රේණි සඳහා **“කාර්යක්ෂමතා කඩඉම් විභාග 2018(II)2022 ”**ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින් පැවැත්වීම සඳහා රජයේ පුස්තකාලයාධිපති සේවයේ සේවා ව්‍යවස්ථාව සංශෝධනය කරීම සඳහා යොමු කර ඇත. |
| **භාෂා පරිවර්තක සේවය**<br>**1 පන්තිය** | – | **“ කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2016 (2024) ”** සැප්තැම්බර් මස පැවැත්වීමට නියමිතය. |

| | | |
|---|---|---|
| **කළමනාකරණ සේවා නිලධාරි සේවය (I) ශ්‍රේණිය** | – | **" කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2024 "** 2024.07.27 දින පවත්වා ප්‍රතිඵල නිකුත් කිරීමට නියමිතව ඇත. |
| **කළමනාකරණ සේවා නිලධාරි සේවය (II) ශ්‍රේණිය**<br><br>**කළමනාකරණ සේවා නිලධාරි සේවය (III) ශ්‍රේණිය** | – | (II) හා (III) ශ්‍රේණියේ නිලධාරීන් සඳහා **" කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2024"** විභාගයට අදාළ විභාග නිවේදනය නිරීක්ෂණ ලබා ගැනීම සඳහා 2024.06.11 දින ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙත යොමු කර ඇත. |
| **සංවර්ධන නිලධාරි සේවය** | – | **"කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2024",** 2024.06.30 දින පවත්වා ප්‍රතිඵල නිකුත් කිරීමට නියමිතව ඇත. |

- **2025 වර්ෂය තුළදී සිදු කිරීමට නියමිත නව බඳවාගැනීම්**

**වගුව 2.8 – නව බඳවා ගැනීම්**

| සේවාව | | නව බඳවා ගැනීම් සම්බන්ධ තොරතුරු |
|---|---|---|
| **ශ්‍රී ලංකා විද්‍යාත්මක හා වාස්තු විද්‍යාඥ සේවය** | –<br>– | ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ I ශ්‍රේණියේ තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීම.<br>බඳවා ගැනීමේ පටිපාටි සංශෝධන කටයුතු සිදු කිරීම සඳහා සාකච්ඡා පැවැත්වීම. |
| **ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවය** | – | |
| **ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ සේවය** | –<br>– | 2 පන්තියේ II ශ්‍රේණියට බඳවාගත් නවක නිලධාරීන්හට සේවාරම්භක පුහුණුව පැවැත්වීම<br>ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ සේවයේ 3 පන්තියේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගයේ ප්‍රතිඵල ඉදිරි මස තුළ නිකුත් කිරීමට නියමිත බැවින්, ඊට අදාළ සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම සහ බඳවා ගැනීම් කටයුතු. |
| **කළමනාකරණ සේවා නිලධාරි සේවය** | – | සීමිත පදනමින් බඳවා ගත් අධි ශ්‍රේණියේ නිලධාරීන් සඳහා පත්වීම් ලිපි ප්‍රදානෝත්සවය හා සේවාරම්භක පුහුණුව පැවැත්වීම. |
| **ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවය** | – | |
| **ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය** | – | සීමිත පදනම මත නිලධාරීන් 226 ක් හා සීමිත පදනම මත නිලධාරීන් 36 ක් III ශ්‍රේණියට බඳවා ගැනීම. |

- **සේවාරම්භක පුහුණු පැවැත්වීම**

  - ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයේ III ශ්‍රේණියට බඳවාගත් නවක නිලධාරීන් සඳහා සේවාරම්භක පුහුණුව මැයි මස පවත්වා ඇත.

  - කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියට බඳවාගත් නවක නිලධාරීන් සඳහා සේවාරම්භක පුහුණුව අගෝස්තු මස පවත්වා ඇත.

  - ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයට 2024.07.15 දින බඳවාගත් නවක නිලධාරීන් 07 දෙනකු සඳහා සහ 2024.10.14 දින සිට බඳවා ගත් නවක නිලධාරීන් 43 දෙනකු සඳහා සේවාරම්භක පුහුණු ආරම්භ කරන ලදී.

  - ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ හා ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ විවෘත හා සීමිත පදනමින් බඳවා ගන්නා ලද නිලධරයන් 98 දෙනෙකු සඳහා සේවාරම්භක පුහුණු පැවැත්වීම.




**සේවාරම්භක පුහුණු පැවැත්වීම**

**2024 වර්ෂයේ අත්පත් කර ගන්නා ලද සුවිශේෂ ඉලක්ක සහ ජයග්‍රහණ**

- ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ III ශ්‍රේණියට සීමිත පදනමින් බඳවා ගැනීම සඳහා 2018.04.08 දින පැවති විභාගයේ ප්‍රතිඵල මත නිලධාරීන් 08 දෙනෙකු බඳවා ගැනීමට සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් කළ අතර, ඉන් එක් නිලධාරියකු සහභාගි නොවූ බැවින්, නිලධාරීන් 07 දෙනෙකු පමණක් 2024.07.15 දින බඳවා ගැනීමට කටයුතු කිරීම හා එම නිලධාරීන් සඳහා සේවාරම්භක පුහුණුව ආරම්භ කිරීම.
- ක්‍රමසම්පාදන සේවා ව්‍යවස්ථාවට අනුව 2013 හා 2015 කණ්ඩායම්වල II ශ්‍රේණියේ නිලධාරීන්ට දින 60ක ක සේවාස්ථ පුහුණුව ලබා දීම 2024.09.06 දින ආරම්භ කරන ලදී.
- අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පැවති ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ I ශ්‍රේණියේ තනතුරු හා විශේෂ ශ්‍රේණියේ තනතුරු පිරවීම සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම.
- ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය බඳවා ගැනීමේ පටිපාටි සංශෝධනය කිරීම සම්බන්ධ වැමුළුක් පවත්වන ලදී.
- 2024 වර්ෂයේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ විවෘත පදනමින් බඳවා ගන්නා ලද නිලධාරයන් 51 දෙනෙකු සඳහා 2024.08.15 දින පත්වීම් ලිපි ප්‍රදානය කරන ලදී.
- 2024 වර්ෂය තුළ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නිලධරයන් සඳහා විද්‍යාත්මක සංස්කෘතියක් ප්‍රවර්ධනය කර ගැනීමේ පුහුණු වැඩසටහන 2024 අගෝස්තු මස පැවැත්වීම.
- ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නිලධරයන් සඳහා විද්‍යාත්මක පර්යේෂණ නිබන්ධනයක් හෝ පත්‍රිකාවක් සකස් කිරීම සම්බන්ධයෙන් පුහුණු වැඩසටහන් 02 ක් සංවිධානය කිරීම හා ඔවුන්ගේ ප්‍රකාශ එළි දැක්වීම සඳහා අන්තර්ජාල ජර්නල් සහරාවක් ආරම්භ කිරීම.
- 2024 වර්ෂයේ ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ විවෘත පදනමින් බඳවා ගන්නා ලද නිලධරයන් 08 දෙනෙකු සඳහා 2024.09.18 දින පත්වීම් ලිපි ප්‍රදානය කරන ලදී.
- ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ I ශ්‍රේණියේ සුදුසුකම්ලත් නිලධාරීන්, එම සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා වූ විධිමත් සම්මුඛ පරීක්ෂණය 2023.04.30 පැවැත්වූ අතර, පැවැති පුරප්පාඩු සංඛ්‍යාව අනුව නිලධාරීන් 02 දෙනෙකු 2022.07.01 දිනට හා නිලධාරීන් 16 දෙනෙක් 2023.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කරන ලදී.
- **MISCO දත්ත පද්ධතිය වැඩි දියුණු කිරීම**

  ඒකාබද්ධ සේවා නිලධාරීන්ගේ අපේක්ෂකයන්ගේ සම්මුඛ පරීක්ෂණ, බඳවා ගැනීම්, පත් කිරීම්, ආයතනගත කිරීම්, වැඩ භාරගැනීම්, උසස් කිරීම්, ස්ථිර කිරීම් සහ විශ්‍රාම ගැන්වීම් සම්බන්ධ කටයුතු ක්‍රියාත්මක කිරීමට MISCO තොරතුරු තාක්ෂණ පද්ධතිය භාවිතා වේ.
- **දෙමළ භාෂා පුහුණු පාඨමාලාව**

  අමාත්‍යාංශයේ නිලධාරීන් සඳහා දෙමළ භාෂා පුහුණු පාඨමාලාව රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ සම්පත්දායකත්වය යටතේ ප්‍රධානතම පුහුණු වැඩසටහනක් වශයෙන් ක්‍රියාත්මක කර ඇත.

**වගුව 2.9 – දෙමළ භාෂා පුහුණුව**

| සේවා මට්ටම | පුහුණු පාඨමාලාව | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|
| තෘතියික | පැය 200 පාඨමාලාව ප්‍රවීණතාව | 02 |
| ද්විතියික | පැය 150 පාඨමාලාව ප්‍රවීණතාව | 163 |
| ප්‍රාථමික | පැය 150 පාඨමාලාව ප්‍රවීණතාව | 88 |

- **ඉදිරි පුහුණු වැඩසටහන්**

**වගුව 2.10 – ඉදිරි පුහුණු වැඩ සැලැස්ම**

| සේවා ගණය | ක්‍රියාත්මක කිරීමට නියමිත වැඩසටහන් ගණන |
|---|---|
| කළමනාකරණ | 09 |
| කළමනාකරණ නොවන | 12 |
| සියලුම සේවා ගණ | 23 |

වගුව 2.11 – 2024.12.31 දිනට මානව සම්පත් සංවර්ධන අංශයෙහි මූල්‍ය ප්‍රගතිය

| පුහුණු වැඩසටහන | සහභාගී වූ සංඛ්‍යාව | සත්‍ය වියදම රු.මි. |
|---|---|---|
| **දේශීය** | 7375 | 6.97 |
| **විදේශීය** | 15 | 1.92 |

**2025 වර්ෂයේදී ඉටු කිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම්**

– ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නිලධාරීන්ගේ දැනුම වැඩි දියුණු කිරීම හා යාවත්කාලීන කිරීම සඳහා විද්‍යාත්මක සංස්කෘතියක් ප්‍රවර්ධනය කර ගැනීමේ පුහුණු වැඩසටහනේ තෙවන අදියර පැවැත්වීම

– ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ 1 ශ්‍රේණියේ නිලධරයින් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය (කළමනාකරණය පිළිබඳ ත්‍රෛමාසික සහතික පත්‍ර පාඨමාලාව) පැවැත්වීම

– ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ හා ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ නිලධාරීන්ගේ පෞද්ගලික ලිපි ගොනුවලට අදාළ (ස්ථිර කිරීම්, උසස් කිරීම්, කාර්යක්ෂමතා කඩඉම්, විශ්‍රාම ගැන්වීම් ආදිය) කටයුතු සම්බන්ධ ප්‍රගතිය පිළිබඳ වර්තමාන තත්ත්වය ඔවුන්ගේ ජංගම දුරකථනවලට කෙටි පණිවිඩ වලින් (SMS) දැනුම් දීම.

– ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ හා ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ නිලධාරීන්ගේ තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් සැකසීම.

– ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ III ශ්‍රේණිය සඳහා බඳවා ගන්නා ලද නවක නිලධාරීන් සඳහා සේවාරම්භක පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම.

– 2025.01.01 දිනට හා 2025.07.01 දිනට ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ නිලධාරීන් හා ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ නිලධාරීන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීම.

– ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයට බඳවාගත් නවක නිලධාරීන් 64 ක් සඳහා හා බඳවා ගැනීමට නියමිත නිලධාරීන් සඳහා සේවාරම්භක පුහුණුව ලබා දීම.

– රාජ්‍ය සේවා පුහුණු ආයතනය මානව සම්පත් සංවර්ධන අංශය යටතේ වෙනම ඒකකයක් ලෙස නැවත ස්ථාපනය කිරීම.

– මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කිරීම පිළිබඳ දැනුම ලබාදීමේ පුහුණු වැඩසටහන් පළාත් මට්ටමින් ක්‍රියාත්මක කිරීම.

– දිස්ත්‍රික් මට්ටමේ ධාරිතා සංවර්ධන වැඩසටහන් තවදුරටත් ශක්තිමක් කිරීම හා නියාමනය කිරීමේ ක්‍රමවේදයක් සකස් කිරීම

– රාජ්‍ය සේවයේ ආරවුල් වැළැක්වීම සහ ආරවුල් නිරාකරණය සඳහා යාන්ත්‍රණයක් හඳුන්වාදීම යටතේ අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලද ප්‍රවාහන, සෞඛ්‍ය, විදුලිබල හා බලශක්ති, වරාය, නාවික හා ගුවන් සේවා, අධ්‍යාපන යන අංශවල සේවා ස්ථාන සංසද, ආංශික සභා සහ අමාත්‍යාංශ මට්ටමින් ඒකක (Cell) පිහිටුවීමට අදාළ කටයුතු සිදු කිරීම, ජාතික රාජ්‍ය සංවාද සංසදය පිහිටුවීම, පළාත් මට්ටමින් සමථකරණ මණ්ඩල සහ ජාතික බේරුම්කරණ සභාව පිහිටුවීමට අදාළ කටයුතු සිදු කිරීම, රාජ්‍ය සේවයේ ආරවුල් සම්බන්ධයෙන් වාර්තා කිරීමට දත්ත පද්ධතියක් නිර්මාණය කිරීම හා මෙම යාන්ත්‍රණයට අදාළව ආයතන සංග්‍රහයට සංශෝධන ඇතුළත් කිරීම සහ රාජ්‍ය සේවා කොමිෂන් සභා රීති සැකසීම සම්බන්ධයෙන් වන නෛතික රාමුව සැකසීම

– ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA) සහ ඉන්දියාවේ යහපාලනය සඳහා වන ජාතික මධ්‍යස්ථානය (NCGG) අතර අවබෝධතා ගිවිසුමකට එළඹීම මගින් දීප ව්‍යාප්ත සේවාවන්ට අයත් විධායක නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය කිරීම සඳහා විදේශීය පුහුණු වැඩසටහන්වලට යොමු කිරීම සම්බන්ධව පහසුකම් සැපයීම් කටයුතු සිදු කිරීම

– "ක්ලීන් ශ්‍රී ලංකා " ජාතික වැඩසටහන යටතේ පොහොසත් රටක් සහ ලස්සන ජීවිතයක් නිර්මාණය කර ගැනීම වෙනුවෙන් නිකුත් කර ඇති 2024.12.30 දිනැති අංක: 22/2024 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය සම්බන්ධව මෙම අමාත්‍යාංශයේ සියලුම නිලධාරීන් දැනුවත් කිරීම සඳහා පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම.

– 2024 වර්ෂයේ මානව සම්පත් සංවර්ධන අංශය විසින් සිදු කළ කාර්යභාරය දක්වමින් කෙටි සඟරාව එළි දැක්වීම.

– ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ III ශ්‍රේණිය සඳහා විවෘත පදනම මත බඳවා ගන්නා නිලධාරීන් 139 දෙනෙකු සඳහා සේවාරම්භක පුහුණුව ලබාදීම.

– ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I, II හා III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය පැවැත්වීම.

- ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ සේවයේ II පන්තියේ II ශ්‍රේණියට බඳවාගත් නවක නිලධාරීන් සඳහා සේවාරම්භක පුහුණුව ලබාදීම.

- ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ සේවයේ III පන්තියේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගයේ ප්‍රතිඵල නිකුත් කිරීම හා ඊට අදාළ සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම හා බඳවා ගැනීම.




විද්‍යාත්මක සේවයේ හා වාස්තු විද්‍යාත්මක සේවයේ නිලධාරීන් සඳහා සේවාරම්භක පුහුණුව ලබාදීම

## 3. විෂයය ක්ෂේත්‍රය - ප්‍රතිපත්ති

### ආයතන අංශය

රාජ්‍ය සේවකයන් සම්බන්ධයෙන් සහ රාජ්‍ය සේවයේ යහපැවැත්ම සහතික වන අයුරින් ඊට අදාළ වන ප්‍රතිපත්ති සම්පාදනය සඳහා රජයට සහය වීම ආයතන අංශයේ ප්‍රධාන කාර්යය වන බැවින්, ඊට අදාළ කටයුතු ඉටු කිරීමේදී හා බලතල ක්‍රියාත්මක කිරීමේදී ආයතන සංග්‍රහය, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි ප්‍රධාන වශයෙන්ම ආධාර කර ගනී.

### 2024 වර්ෂයේ සුවිශේෂී කාර්යය සාධනයන්

♦ **වගුව 3.1 - රාජ්‍ය සේවයේ ප්‍රතිපත්තිමය තීරණ ලබා ගැනීම සඳහා අමාත්‍යාංශය වෙතින් සපයන ලද දායකත්වය පිළිබඳ සමස්ත සමාලෝචනය**

| සිදු කරන ලද කාර්යයන් | සංඛ්‍යාව |
|---|---|
| නිකුත් කරන ලද චක්‍රලේඛ සංඛ්‍යාව | 12 |
| නිකුත් කරන ලද චක්‍රලේඛ ලිපි සංඛ්‍යාව | 00 |
| යොමු කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ සංඛ්‍යාව | 13 |
| අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා සකස් කරන ලද නිරීක්ෂණ ගණන | 173 |
| සේවා ව්‍යවස්ථා සඳහා ලබා දුන් නිර්දේශ ගණන | 08 |
| බඳවා ගැනීම් පරිපාටි සඳහා ලබා දුන් නිර්දේශ ගණන | 106 |

♦ **තොරතුරු පනතට අදාළව යොමු කරන ලද ගැටලු**

මෙම වර්ෂය තුළ ඉල්ලීම් 201 ක් ලැබී ඇති අතර, ඉල්ලීම් 200 සඳහා පිළිතුරු ලබා දී ඇත.

♦ **වන්දි අනුමත කිරීම**

මෙම වර්ෂය තුළදී 2024.12.31 දක්වා වන්දි අනුමත කරන ලද වන්දි ගොනු 140 ක් සඳහා රු.මිලියන 144.00 ක වන්දි මුදලක් ප්‍රදානය කර ඇත.

♦ **උපදේශන හා පැහැදිලි කිරීම්**

ආයතන අංශය වෙත මෙම වර්ෂය තුළදී ගැටලු 3,600 ක් යොමු කර ඇති අතර, ඉන් ගැටලු 3,305ක් සඳහා පිළිතුරු ලබා දී ඇත. මීට අමතරව වාචික විමසීම් සඳහා ද පිළිතුරු ලබා දෙනු ලැබේ.

♦ රජයේ නිලධරයන්ට තම රැකියා සුරක්ෂිතතාව සහ විශ්‍රාම වැටුප් හිමිකම ආරක්ෂා කර ගනිමින් වැටුප් රහිත නිවාඩු මත රටේ දළ ජාතික නිෂ්පාදනයට දායක වීමට අවස්ථාව ලබාදුන් රා.පරි.ච. 14/2022 හි විධිවිධාන මගින් රජයේ නිලධාරීන් නිවාඩු ලබා ගැනීම හේතුවෙන් ඇති වූ ගැටලු නිරාකරණය සඳහා 2024.06.07 දිනැති රා.පරි.ච. 14/2022 (Iv) නිකුත් කර ඇත.

## 4. විෂයය ක්ෂේත්‍රය - පහසුකම් සැපයීම

### නිවාස හා සංවර්ධන අංශය

රාජ්‍ය නිලධාරීන්ට නිල නිවාස පහසුකම් සැපයීමේ අරමුණ පෙරදැරිව, රජයේ නිල නිවාස වෙන් කිරීම හා පරිපාලනය, දිවයින පුරා නව නිල නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, රජයේ නිවාඩු බංගලා හා නිකේතන වෙන් කිරීම හා පරිපාලනය සහ නිවාස හිමි නොවූ රජයේ නිලධාරීන් වෙත මහල් නිවාස ලබා දීම සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම යන මූලික කාර්යයන් හා ඊට අදාළ සෙසු සියලු රාජකාරි කටයුතු මෙම අංශය මඟින් සිදු කෙරේ.

### නිල පියස නිල නිවාස ව්‍යාපෘති

මෙම අංශය මඟින් පහත සඳහන් නිල නිවාස ව්‍යාපෘතීන්හි කටයුතු සම්පූර්ණයෙන් නිමකොට රාජ්‍ය නිලධාරීන්ගේ නිල නිවාස පහසුකම් වෙනුවෙන් වෙන්කර ඇත.

- කොළඹ නිල පියස
- මහනුවර නිල පියස
- මොණරාගල නිල පියස
- ගම්පහ නිල පියස

එහිදී මහනුවර නිල පියස හා මොණරාගල නිල පියසයන්හි පරිපාලන කටයුතු අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට ලබා දී ඇති අතර, කොළඹ නිල පියස හා ගම්පහ නිල පියසයන්හි පරිපාලන කටයුතු මෙම අමාත්‍යාංශය යටතේ සිදු වේ.

තවද, පොළොන්නරුව දිස්ත්‍රික්කය කේන්ද්‍රීය කර ගනිමින් අරඹන ලද නිවාස ඒකක 32 කින් සමන්විත නිල පියස නිල නිවාස ව්‍යාපෘතිය මොරටුව විශ්ව විද්‍යාලයීය උපදේශන සේවය යටතේ සෙන්ට්‍රල් ඉංජිනියරින් පුද්ගලික සමාගම විසින් ඉදි කිරීම් කටයුතු සිදු කරන ලද ව්‍යාපෘතියකි. රජයේ පවතින මූල්‍ය තත්ත්වය මත රාජ්‍ය වියදම් කළමනාකරණය හමුවේ මෙම ව්‍යාපෘතියෙහි ඉදි කිරීම් කටයුතු අංක: අමප/23/0942/605/036 හා 2023.06.13 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි තාවකාලික පදනම මත නවතා දමන ලදී.

### රජයේ නිල නිවාස

මෙම අමාත්‍යාංශය මඟින් පාලනය වන පහත නිල නිවාස ගරු අමාත්‍යවරුන්, රාජ්‍ය අමාත්‍යවරුන්, රජයේ මාණ්ඩලික නිලධාරීන් සහ රජයේ මාණ්ඩලික නොවන නිලධාරීන්ගේ පදිංචිය සඳහා වෙන්කර දීමට කටයුතු කරනු ලබයි.

- කැප්පෙටිපොල මාවත සමූහ නිවාස (නිවාස 104)
- බංගලා නිවාස (නිවාස 52)
- ජයවඩනගම නිවාස (නිවාස 18)
- ලොරිස් පටුමඟ නිවාස සංකීර්ණය (නිවාස 20)
- කොළඹ 08, ගෝතමී පාර නිවාස (නිවාස 02)
- කොළඹ 07 "නිල පියස" නිවාස සංකීර්ණය (නිවාස 40)

### ♦ නිවාඩු බංගලා හා නිවාඩු නිකේතන

දිවයින පුරා විසිරී සිටින රාජ්‍ය නිලධරයන්ගේ රාජකාරි හා පෞද්ගලික සංචාරක අවශ්‍යතා සපුරාලීම සඳහා නිවාඩු බංගලා 08ක් ද, රාජ්‍ය නිලධාරීන් ඇතුළු සියලු මහජනතාවගේ සංචාරක අවශ්‍යතා සපුරාලීම වෙනුවෙන් නිවාඩු නිකේතන 07 ක්ද මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

### 2024 වර්ෂයේ අත්පත් කර ගන්නා ලද සුවිශේෂී ඉලක්ක සහ ජයග්‍රහණ

- ♦ රුපියල් මිලියන 7.9 ක් සහ රුපියල් මිලියන 17.4 ක මුදලක් වැය කරමින් පිළිවෙලින් පොළොන්නරුව හා මහියංගනය නිවාඩු නිකේතන ප්‍රතිසංස්කරණය කිරීම.
- ♦ 2023.09.20 දිනැති 20/2023 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව විධායක ශ්‍රේණියේ නිලධාරීන් සඳහා ගම්පහ නිල පියස නිල නිවාස සංකීර්ණයේ නිවාස ඒකක 2024.03.15 දිනැතිව වෙන් කිරීම.
- ♦ මෙම අමාත්‍යාංශය යටතේ පවතින මාණ්ඩලික නොවන නිලධාරීන් සඳහා වෙන් කරනු ලබන ජයවඩනගම නිවාස සංකීර්ණයේ නිවාස ඒකක රාජ්‍ය පරිපාලන අංශයේ සුදුසු නිලධාරීන් සඳහා ලබා දීමට 02/2024 අභ්‍යන්තර චක්‍රලේඛය හඳුන්වා දීම සහ සුදුසු නිවාසලාභීන් තෝරා ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කර ඇත.

**2025 වර්ෂය තුළදී ඉටුකිරීමට අපේක්ෂිත කාර්යයන්**

- මේවනවිට ඉඩම් පවරා ගැනීමේ කටයුතු අවසන්ව නොමැති සංචාරක බංගලා සහ නිවාඩු නිකේතනයන්හි ඉඩම් පවරා ගැනීමේ කටයුතු කඩිනමින් අවසන් කිරීම.
- නුවරඑළිය (පැරණි) නිවුරඑළිය නව A1, නුවරඑළිය A2, නුවරඑළිය නව B දියතලාව A හා B, බණ්ඩාරවෙල 1 හා 2, මිහින්තලය, යාපනය, මුලතිව්, කතරගම සහ මොණරාගල යන සංචාරක බංගලා හා නිවාඩු නිකේතන නව සංචාරක ආකර්ෂණයක් ඇති වන පරිදි ප්‍රතිසංස්කරණය කිරිම.

## 5. විෂයය ක්ෂේත්‍රය - සහයක සේවා

අමාත්‍යාංශයේ විෂයය පථයට පැවරී ඇති කාර්යයන් ඉටු කරන සියලුම අංශ සඳහා අවශ්‍ය මූල්‍ය, යටිතල පහසුකම්, තොරතුරු තාක්ෂණ පහසුකම් සහ නියමිත නිති හා රෙගුලාසි අනුව කටයුතු සිදු කරන්නේද යන්න සොයා බැලීමේ යාන්ත්‍රණය ආදී පහසුකම් අවශ්‍ය පරිදි ප්‍රමාණාත්මකව සහ ගුණාත්මකව සපයාදීමේ කාර්යය ඉටු කරනු ලබන පහත අංශ මේ යටතේ සලකනු ලබයි.

- අභ්‍යන්තර පාලන අංශය
- මූල්‍ය අංශය
- තොරතුරු තාක්ෂණ අංශය
- අභ්‍යන්තර විගණන අංශය
- ක්‍රමසම්පාදන අංශය
- රාජ්‍ය සේවා ප්‍රතිසංස්කරණ අංශය

**අභ්‍යන්තර පාලන අංශය**

එක් එක් අංශ අතර මනා සම්බන්ධතාවක් ගොඩනගමින් ඔවුන්ගේ කාර්යය මණ්ඩලය වෙත අවශ්‍ය යටිතල පහසුකම් ලබාදෙමින් හා ආයතන පරිශ්‍රයේ යහපැවැත්ම ඇති කරමින්, අමාත්‍යාංශය වෙතින් මහජනතාවට හා සේවාවන් බලාපොරොත්තුවෙන් පැමිණෙන පාර්ශවයන්ට සුදුසු මඟපෙන්වීම හා සහයෝගය ලබා දීමට හැකි පරිසරයක් සකස් කිරීම මෙම අංශය වෙතින් ඉටු කරනු ලබයි.

**2024 වසරේ සුවිශේෂී කාර්යය සාධනයන්**

- ගුවන් හමුදාවේ ශ්‍රමදායකත්වය සහිතව අමාත්‍යාංශ ප්‍රධාන ගොඩනැගිල්ලේ පිටත අලුත්වැඩියා කිරීම සහ තීන්ත ආලේප කිරීමේ කටයුතු අර්ධයක් අවසන් කිරීම.
- 2024 වෙසක් උත්සවය වෙනුවෙන් අමාත්‍යාංශ පරිශ්‍රය තුළ සහ අවට පරිශ්‍රය වෙසක් පහන් කූඩු මගින් ආලෝකකරණය කිරිම.
- අමාත්‍යාංශයේ පිවිසුම් කොටසෙහි ක්ලැඩින් යොදා නවීකරණ කටයුතු සිදු කිරිම.
- අමාත්‍යාංශ නිලධාරීන් සඳහා නව දත්ත පද්ධතියකින් යුත් ඇඟිලි සලකුණු යන්ත්‍ර සවි කිරිම.
- අමාත්‍යාංශයේ අංශ සඳහා වායු සමීකරණ යන්ත්‍ර සවි කිරිම.
- අමාත්‍යාංශ පරිශ්‍රය ආලෝකකරණ කටයුතු කිරිම.
- අභ්‍යන්තර පාලන අංශයේ භාවිතයට ගත් පැරණි කබඩ් වෙනුවට ලිපි ගොනු ගබඩා කිරිම සඳහා බිත්ති කබඩ් සවි කිරීමේ කටයුතු සිදු කිරිම.
- අමාත්‍යාංශයේ එක් එක් අංශ සඳහා බ්ලයින්ඩර්ස් යෙදීම තුළින් එම අංශයන්හි සූර්යාවරණ පහසුකම් සැලසීම

**රූප සටහන 5.1 – 2024.11.30 දින දක්වා අමාත්‍යාංශයීය ජල, විදුලි, දූරකථන පවිත්‍රතා සේවා වෙනුවෙන් දැරූ පිරිවැය**




- අමාත්‍යාංශය සතු වාහන සඳහා ඉන්ධන භාවිතයට රු.මිලියන 17.17 ක් වැය කර ඇත.

- 2024 වර්ෂයේ අමාත්‍යාංශයේ ගොඩනැගිලි නඩත්තු වියදම හා ආරක්ෂක වියදම පහත ප්‍රස්තාරය මඟින් නිරූපණය වේ.

**රූප සටහන 5.2 – 2024.12.31 දින දක්වා අමාත්‍යාංශ ගොඩනැගිලි නඩත්තුව හා ආරක්ෂාව වෙනුවෙන් දරන ලද වියදම**




- 2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ පනත යටතේ 2024.01.01 සිට 2024.09.30 දක්වා මෙම අමාත්‍යාංශය වෙතින් ඉල්ලුම් කරන ලද තොරතුරු සහ ඒ සඳහා ලබා දී ඇති පිළිතුරු සම්බන්ධ ප්‍රගතිය පහත පරිදි වේ.

**වගුව 5.1 – තොරතුරු දැන ගැනීමේ පනත යටතේ ලැබුණු ඉල්ලීම් සම්බන්ධ සාරාංශ වාර්තාව**

| කරුණ | සංඛ්‍යාව |
|---|---|
| 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත යටතේ මෙම අමාත්‍යාංශය වෙත යොමු කර ඇති ලිපි ප්‍රමාණය | 415 |
| | |
| ලියාපදිංචි මුළු තොරතුරු ඉල්ලීම් සංඛ්‍යාව | 363 |
| දැනට පිළිතුරු යවා ඇති තොරතුරු ඉල්ලීම් සංඛ්‍යාව | 227 |
| තවදුරටත් ඉල්ලුම්කරුවන් වෙත පිළිතුරු යොමු කළ යුතු ලිපි | 136 |
| ප්‍රතික්ෂේප කළ මුළු තොරතුරු ඉල්ලීම් සංඛ්‍යාව | 03 |
| | |
| ලියාපදිංචි මුළු අභියාචනා සංඛ්‍යාව | 35 |
| අභියාචනා විභාග - තොරතුරු කොමිසම වෙත | - |
| තොරතුරු පනතට අදාල නොවන ලිපි ( අප අමාත්‍යාශයේ විෂය පථයට අයත් නොවන වෙනත් අමාත්‍යාංශ වලට අදාල තොරතුරු ඉල්ලීම්) | 52 |

## 2025 වර්ෂයේදී ඉටු කිරීමට අපේක්ෂිත කාර්යයන්

- ගුවන් හමුදාවේ ශ්‍රමදායකත්වය ලබා ගෙන සිදු කරමින් පවතින ප්‍රධාන ගොඩනැගිල්ලේ බිත්ත ආලේපය හා අලුත්වැඩියා කටයුතුවලට අදාළ ව්‍යාපෘතිය ඉදිරි මාස 03 ඇතුළත අවසන් කිරීමට සැලසුම් කර ඇත. එමෙන්ම අමාත්‍යාංශයේ එක් එක් අංශයන්හි ඇතුළත බිත්ති තීන්ත ආලේප කිරීමේ කටයුතු වාර්ෂික අයවැය ප්‍රතිපාදන මත ආරම්භ කිරීමට නියමිතය.

- අමාත්‍යාංශයේ ප්‍රධාන මල අපවහන පද්ධතිය අලුත්වැඩියා කිරීම සඳහා සැලසුම් සකස් කරමින් පවතින අතර, දැනට අංශ තුළ ස්ථාපනය කර ඇති වැසිකිලි පද්ධිති අලුත්වැඩියා කටයුතු සිදු කිරීමට සැලසුම් කර ඇත.

- ප්‍රවාහන අංශයට අයත් වාහන නඩත්තුව සහ ඊට අදාළ වියදම් පියවීම.

- අභ්‍යන්තර පාලන අංශයේ සේවයේ නියුතු නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය සඳහා වන වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

### මූල්‍ය අංශය

මූල්‍ය අංශය අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු හා ආයතනවල මූල්‍ය කළමනාකරණය හා පාලන කටයුතු සම්බන්ධයෙන් වගකීම උසුලන අතර මෙම අංශය ප්‍රසම්පාදන, මූල්‍ය වාර්තාකරණ, ගෙවීම් හා මානව සම්පත් ගෙවීම් යන ශාඛා 04 කින් සමන්විත වේ.

## 2024 වසරේ සුවිශේෂී කාර්යය සාධනයන්

- රාජ්‍ය පරිපාලන අංශයේ පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් සඳහා 2024 වර්ෂය වෙනුවෙන් පිළිවෙලින් රු.මිලියන 12,346 සහ 1,062 ක මුදලක් වෙන් කර ඇති අතර, 2024.12.31 දිනට දරන ලද සම්පූර්ණ වියදම රු. මිලියන 4,392 කි.

- වර්ෂය සඳහා සමස්ත ප්‍රාග්ධන ප්‍රතිපාදනයෙන් 25% ක්ද, පුනරාවර්තන ප්‍රතිපාදනයෙන් 33% ක්ද වියදම් කර ඇත.

**රූප සටහන 5.3 – ප්‍රාග්ධන වියදම් සඳහා ප්‍රතිපාදන වෙන් කිරිම සහ 2024.12.31 දිනට තත්‍ය වියදම**




**රූප සටහන 5.4 – පුනරාවර්තන වියදම් සඳහා ප්‍රතිපාදන වෙන් කිරිම සහ 2024.12.31 දිනට තත්‍ය වියදම**




*** ඉහත දක්වා ඇති වටිනාකම් සහ ප්‍රගතිය 2025.02.07 දින නිකුත්වීමට නියමිත 2024 වර්ෂය සඳහා වන අවසන් භාණ්ඩාගාර මුද්‍රිත සටහන් නිකුත් වීමෙන් පසුව සංශෝධනය විය හැකි බව සැලකිය යුතුයි.

- 2025 වර්ෂය සඳහා අපේක්ෂිත අයවැය ඇස්තමේන්තුව පහත පරිදි වේ.

**වගුව 5.2 – 2025 අයවැය ඇස්තමේන්තු සාරාංශය**

| අංශය | ඇස්තමේන්තුගත මුළු පිරිවැය ( රු.මිලි) | 2025 අයවැයෙන් අපේක්ෂිත වෙන්කිරීම (රු.මිලි) |
|---|---|---|
| අමාත්‍ය කාර්යාලය | 94 | 127 |
| රාජ්‍ය පරිපාලන අංශය | 3162 | 3977 |
| ***මුළු එකතුව*** | **3,256** | **4,104** |

### තොරතුරු තාක්ෂණ අංශය

- **අමාත්‍යාංශයීය නිල වෙබ් අඩවියේ ආරක්ෂාව පවත්වාගෙන යාම සහ වෙබ් අඩවියේ නව යාවත්කාලීන කිරීම් සිදු කිරීම.**

අමාත්‍යාංශයීය නිල වෙබ් අඩවියේ අරක්ෂාව තහවුරු කිරීම සහ අනෙකුත් ප්‍රමිතීන් පවත්වාගෙන යාම සඳහා වෙබ් අඩවිය සංවර්ධනය කරන ලද ආයතනය සමඟ එළඹී සේවා ගිවිසුම හා SSL සහතිකය ස්ථාපනය කිරීම මෙම වසරේදී ද සිදු කරන ලදි. මෙමගින් අමාත්‍යාංශයීය වෙබ් අඩවියේ ආරක්ෂණ දෝෂ නිවැරදි කර ගනිමින් ආරක්ෂාව තහවුරු කිරීම සිදු කරනු ලබයි.

- **මානව සම්පත් කළමණාකරණ තොරතුරු පද්ධතිය (HRMIS) සහ ලේඛණ කළමණාකරණ පද්ධතිය (DMS) නිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය**

වර්තමාන ඩිජිටල්කරණ සන්දර්භය තුළ කඩිනමින් රාජ්‍ය ආයතන හරහා ලාභදායී හා සතුටුදායක සේවා සැපයීම සඳහා ඉතා නිවැරදි මානව සම්පත් කළමණාකරණ තොරතුරු පද්ධතියක් නිර්මාණය කිරීමට අමාත්‍යාංශය මඟින් තීරණය කරන ලදි. සියලුම රාජ්‍ය ආයතන එක් ඩිජිටල්කරණය වූ වේදිකාවකට සම්බන්ධ කිරීම සඳහා ඒකාබද්ධ විස්තීරණ මානව සම්පත් කළමණාකරණ තොරතුරු පද්ධතියක් පිහිටුවීම අරමුණු කර ගනිමින් අමාත්‍යාංශ විෂය පථය යටතේ ඇති රාජ්‍ය නිලධාරීන්ගේ දත්ත ඇතුළත් මානව සම්පත් කළමණාකරණ තොරතුරු පද්ධතියක් නිර්මාණය

කිරීමේ මූලික පියවරක් ලෙස ආරම්භ කරන ලද HRMIS ව්‍යාපෘතියට අවශ්‍ය උපදේශන හා තාක්ෂණික සහය ලබා දීම සිදු කරන ලදි.

- **තොරතුරු තාක්ෂණික සහය ලබාදීම සඳහා යෙදවුමක් නිර්මාණය කිරීම. (IT Support App)**

අමාත්‍යාංශයේ සියලුම අංශ සඳහා තොරතුරු තාක්ෂණික ගැටලු සහ අවශ්‍යතාවලදී සහය ලබා දීම සඳහා මෘදුකාංග යෙදවුමක් නිර්මාණය කිරීම සිදු කරන ලදි. එම යෙදවුම මඟින් අදාළ අංශවල පරිගණක ඉන්වෙන්ට්‍රිය පවත්වාගෙන යාම සහ එක් එක් පරිගණකයේ මතුවන ගැටලු සම්බන්ධයෙන් තොරතුරු තාක්ෂණ අංශය දැනුවත් කිරීම සිදු කළ හැකිය.

- **රජයේ නිවාස හා ගොඩනැගිලි කුලී ආදායම් මෘදුකාංගය සංවර්ධනය කිරීම. (Ministerial Rental Information System)**

රජයේ නිවාස හා ගොඩනැගිලි කුළී ආදායම් ගණනය කිරීම සඳහා මෙම මෘදුකාංගය සංවර්ධනය කිරීම සිදු කරන ලද අතර, මූල්‍ය අංශය විසින් ඉදිරිපත් කරන ලද අවශ්‍යතා අනුව නිවාස කුළිය සහ හිඟ කුළිය අය කර ගැනීමට අදාළ තොරතුරු මෙම පද්ධතියට ඇතුළත් කිරීමට කටයුතු කරන ලද අතර, ඉදිරියටත් මෙම පද්ධතිය සංවර්ධනය කිරීමට නියමිතය.

- **පරිගණක පද්ධති මෙහෙයුම් මැදිරිය නඩත්තු කිරීම.**

අමාත්‍යාංශයේ ප්‍රධාන මධ්‍ය ජාලකරණ ස්විචය මිලදී ගැනීම, සයිබර් ආරක්ෂාව සඳහා Firewall යන්ත්‍රයේ බලපත්‍ර කාලය තවත් වසරක් සඳහා දීර්ඝ කර ගැනීම, Active directory (Domain Server) හි සේවා ගිවිසුම තවත් වසරක් සඳහා දීර්ඝ කිරීමට කටයුතු කරන ලදි.

- **ප්‍රති වෛරස පද්ධතිය ස්ථාපනය කිරීම.**

අමාත්‍යාංශය සඳහා නව ප්‍රතිවෛරස මෘදුකාංගයක් මිලදී ගැනීමට කටයුතු කරන ලද අතර, එම පහසුකම වසර 03ක් සඳහා මිලදී ගෙන ඇත. ප්‍රති වෛරස මෘදුකාංගය අමාත්‍යාංශ පරිගණක සඳහා ස්ථාපනය කිරීම මේ වන විට සිදු කර ඇත.

- **තොරතුරු තාක්ෂණ පුහුණු වැඩසටහන් පැවැත්වීම**

තොරතුරු තාක්ෂණ දැනුම වැඩි දියුණු කිරීම අරමුණු කර ගනිමින් අමාත්‍යාංශයේ සේවයේ නියුතු නිලධාරීන් සඳහා තොරතුරු තාක්ෂණය ප්‍රායෝගික භාවිතය, මයික්‍රොසොෆ්ට් පතුරුම්පත් සැකසීම (Microsoft excel), මයික්‍රොසොෆ්ට් දත්ත සමුදාය (Microsoft access), අන්තර්ජාල භාවිතය, තොරතුරු පද්ධති කළමණාකරණය, දත්ත හා තොරතුරු ඵලදායීව ඉදිරිපත් කිරීම වැනි මාතෘකා යටතේ පුහුණු වැඩසටහන් සිදු කරන ලදී.

අමාත්‍යාංශයෙන් බැහැර බාහිර ආයතනයන්හි සේවය කරන නිලධාරීන් වෙත දැනුම සම්ප්‍රේෂණය සඳහා මාර්ගගත පුහුණු වැඩසටහන් සඳහා සම්පත්දායකයන් වශයෙන් සහය ලබා දෙන ලදි. ඊට අමතරව අමාත්‍යාංශයේ විවිධ අංශයන්ට අදාළව පුහුණු සැසි සහ රැස්වීම් පැවැත්වීම සඳහා අවශ්‍ය පහසුකම් ලබා දීම (Zoom link සැකසීම වැනි) සහ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීමට සහය දක්වන ලදි.

- **නිවාඩු නිකේතන හා නිවාඩු බංගලා මාර්ගගතව වෙන් කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම.**

මෙම අමාත්‍යාංශය යටතේ පාලනය වන නිවාඩු නිකේතන හා නිවාඩු බංගලා වෙන් කිරීම මාර්ගගත ක්‍රමවේදය යටතේ සිදු කිරීමට අවශ්‍ය මාර්ගගත පද්ධතිය සංවර්ධනය සඳහා තාක්ෂණික සහය ලබා දීම සිදු කරන ලදි.

- **නව ඇඟිලි සළකුණු යන්ත්‍ර මිලදී ගැනීම**

අමාත්‍යාංශයේ භාවිතා කළ ඇඟිලි සළකුණු යන්ත්‍ර 2016 වසරේ දී මිලදී ගත් යන්ත්‍ර වන අතර, මෙම යන්ත්‍රවල පැවති දෝෂ තත්ත්වයන් හේතුවෙන් නව යන්ත්‍ර 10ක් මිලදී ගැනීමට අවශ්‍ය තාක්ෂණික සහය ලබා දීම සිදු කරන ලදි.

- **අමාත්‍යාංශය සඳහා තාක්ෂණික උපකරණ මිලදී ගැනීම**

අමාත්‍යාංශය තුළ දැඩි හිඟයක්ව පැවති පරිගණක, මොනිටර්, පරිගණක මුද්‍රණ යන්ත්‍ර, ඡායාපිටපත් යන්ත්‍ර මිලදී ගැනීමට අවශ්‍ය පිරිවිතර සකස් කිරීම මෙන්ම එම උපකරණ මිලදී ගැනීමෙන් පසු ස්ථාපනය කිරීම ද සිදු කරන ලදි. ඒ අනුව පරිගණක 35ක් ද, මොනිටර් 20ක් ද, මුද්‍රණ යන්ත්‍ර 10ක් ද, ඡායා පිටපත් යන්ත්‍ර 05ක් ද මිල දී ගැනීමට කටයුතු කරන ලදි.

- **ජාතික භාෂා අංශයේ ජාතික භාෂා ප්‍රතිපත්තිය නඟා සිටුවීම සඳහා පද්ධතියක් නිර්මාණය කිරීම. (Monitoring and Evaluation and Learning System – MEL System)**

2024.09.27 දිනැති අංක: 2403/53 දරණ අති විශේෂ ගැසට් නිවේදනය නිකුත් කිරීමට පෙර පැවති රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය යටතේ පැවති ජාතික භාෂා අංශය යටතේ ක්‍රියාත්මක වූ National languages Equality Advancement (NLEAP) ව්‍යාපෘතිය මගින් ශ්‍රී ලංකාවේ ඇති විවිධ රාජ්‍ය ආයතනවල භාෂා ප්‍රතිපත්තිය නඟාසිටුවීම සඳහා දැනුම ලබා දීම, දත්ත ලබා ගැනීම සහ ඇගයීම් සිදු කිරීම කරනු ලබන අතර, ඒ සඳහා Monitoring and Evaluation and Learning System (MEL System) යනුවෙන් පද්ධතියක් නිර්මාණය කිරීමට කටයුතු කරන ලදි. මෙය වෙබ් අඩවියේ යෙදවුමක් ලෙස සංවර්ධනය කිරීම සඳහා කටයුතු සැළසුම් කර ඇති අතර, එය නිර්මාණය කිරීමට අවශ්‍ය තාක්ෂණික සහය ලබා දීම සිදු කරන ලදී.

### අභ්‍යන්තර විගණන අංශය

අංක: 2403/53 හා 2024.09.27 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය නිකුත් කිරීමට පෙර පැවති රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ රාජ්‍ය පරිපාලන අංශය හා ඒ යටතේ පැවති විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, බහුකාර්යය සංවර්ධන කාර්යය සාධක බලකා දෙපාර්තමේන්තුව, පාර්ලිමේන්තු කටයුතු අංශය, ජාතික භාෂා අංශය, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA), දුරස්ථ අධ්‍යාපන මධ්‍යස්ථානය (DLC), රාජ්‍ය භාෂා කොමිෂන් සභාව (OLC), මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාව (NHRDC), භාෂා අධ්‍යාපන හා පුහුණුව පිළිබඳ ජාතික ආයතනය (NILET) යන ආයතනයන්ට අදාළව අනුමත වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්මකට අනුව විගණන කටයුතු සිදු කළ අතර, අවශ්‍යතාව අනුව විශේෂ විගණන පරික්ෂණ හා විමර්ශන සිදුකිරීම ද අභ්‍යන්තර විගණන අංශයේ විෂය පථයට අදාළ වේ.

### 2024 වසරේ සුවිශේෂී කාර්යය සාධනයන්

- පළමු, දෙවන, තුන්වන හා හතරවන කාර්තු සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට කටයුතු කර ඇත.



**විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම**

අභ්‍යන්තර විගණන අංශය විසින් සිදු කරන ලද විගණන විමසුම් සහ විශේෂ විගණන පරීක්ෂාවන් පිළිබඳ විස්තර පහත පරිදි වේ.

**වගුව 5.3 - සිදු කරන ලද විගණන විමසුම් සහ විශේෂ විගණන**

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | විෂයය (සංක්ෂිප්තව) |
|---|---|
| **රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය** | අමාත්‍යාංශයේ භූගත ජල ටැංකිය වෙනුවට ලීටර් 10000 ප්‍රමාණයේ අලුතින් ප්ලාස්ටික් ජල ටැංකි යෙදීමේ කටයුතු සම්බන්ධ අභ්‍යන්තර විගණන පරීක්ෂාව |
| | අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ පෞද්ගලික ලිපි ගොනු නඩත්තු කිරීම පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂණය - 2023 |
| | 2023 අමාත්‍යාංශයීය වාර්ෂික මානව සම්පත් සංවර්ධන සැලැස්ම ප්‍රකාරව පුහුණු පාඨමාලා පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂාව |
| | අමාත්‍යාංශයේ මූල්‍ය නොවන වත්කම්වලට අදාළ හානි හා පාඩු සම්බන්ධයෙන් කටයුතු කිරීම පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂාව |
| | අමාත්‍යාංශයේ පවිත්‍රතා සේවය හා ආරක්ෂක සේවයට අදාළ ගිවිසුම් පවත්වාගෙන යාම පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂාව |
| | අමාත්‍යාංශයේ වෙබ් අඩවියෙහි අන්තර්ගත තොරතුරු පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂාව |
| | අමාත්‍යාංශයේ මූල්‍ය ශාඛාවේ සරප් අංශයේ කාර්යභාරය පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂාව |
| | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය සතු සංචිත වාහන රාජකාරි කටයුතු සඳහා භාවිතා කිරීම පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂාව - 2024 |

| | |
|---|---|
| | අමාත්‍යාංශයේ තැපැල් අංශයේ කටයුතු පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂාව |
| | අමාත්‍යාංශයේ දෛනික ධාවන සටහන් පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂාව |
| | අමාත්‍යාංශයේ විදුලිය හා ජලය පරිභෝජනය පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂාව |
| | මහියංගණය, කතරගම හා මොණරාගල නිවාඩු නිකේතන පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂාව හා ගම්පහ නිල පියස නිවාස පිළිබඳ විගණන පරීක්ෂාව |
| | අමාත්‍යාංශය යටතේ පවතින නිවාඩු නිකේතන හා සංචාරක බංගලා වෙන් කිරීමේ ක්‍රියාවලිය හා ඉන් ලැබෙන ආදායම නිවැරදිව ගිණුම්ගත කිරීම පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂාව - 2023 |
| | රාජ්‍ය පරිපාලන අංශයේ වැටුප් ගෙවීම් ක්‍රියාවලිය පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂාව 2023/2024 අමාත්‍යාංශයේ දුරකථන සම්බන්ධතා හා දුරකථන වියදම් පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂාව |
| **බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව** | බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුවෙහි මූල්‍ය නොවන වත්කම් සම්බන්ධයෙන් වූ අභ්‍යන්තර විගණන පරීක්ෂාව |
| | බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුවෙහි අත්තිකාරම් බී ගිණුම, අමාත්‍යාංශයේ අත්තිකාරම් බී ගිණුමට ඒකාබද්ධ කිරීම පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂාව |
| **විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව** | විශ්‍රාම වැටුප් විගණන පරීක්ෂාව - 2024 (මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා මහියංගණය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය) |
| | විශ්‍රාම වැටුප් දත්ත පද්ධති විගණන පරීක්ෂාව 2024 පෙබරවාරි (හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය) 2024 ජූලි (කළුතර දිස්ත්‍රික්කය) |
| **ජාතික භාෂා අංශය** | ජාතික භාෂා අංශයේ කටයුතු පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂාව 2022/2023 |
| **පාර්ලිමේන්තු කටයුතු අංශය** | පාර්ලිමේන්තු කටයුතු අංශයේ වැටුප් ගෙවීමේ ක්‍රියාවලිය පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂණය |
| **රාජ්‍ය භාෂා කොමිෂන් සභාව** | රාජ්‍ය භාෂා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද විගණන විමසුම් සම්බන්ධයෙන් සිදුකළ පසු විපරම් පරීක්ෂාව - 2024 |
| | රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ වැටුප් ගෙවීමේ ක්‍රියාවලිය සම්බන්ධ අභ්‍යන්තර විගණන පරීක්ෂාව |
| | රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ මූල්‍ය අංශයේ කටයුතු පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂාව |
| **මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාව** | මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවෙහි බැංකු ගිණුම් සම්බන්ධයෙන් වූ අභ්‍යන්තර විගණන පරීක්ෂාව |
| | මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවෙහි සංචිත සහ වෙන්කළ වාහනවල දෛනික ධාවන සටහන් පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂාව (2023/2024 ජූලි දක්වා) |
| | මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවෙහි වැටුප් ගෙවීමේ ක්‍රියාවලිය පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂාව |
| **ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය** | ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනයේ බැංකු ගිණුම් සම්බන්ධයෙන් වූ අභ්‍යන්තර විගණන පරීක්ෂාව 2023 |
| | ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනයේ වෙබ් අඩවියෙහි අන්තර්ගත තොරතුරු පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂාව |
| **අභ්‍යන්තර විගණන අංශය විසින් සිදුකරන ලද විශේෂ විගණන පරීක්ෂාවන්** | පොළොන්නරුව නිවාඩු නිකේතනයේ පරිපාලන කටයුතු හා නඩත්තු කටයුතු පිළිබඳව සිදුකළ අභ්‍යන්තර විගණන පරීක්ෂණය |
| | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2019 හා කූට ලේඛන උපයෝගී කර ගනිමින් රාජ්‍ය දේපළ අවභාවිතා කිරීම - කේ.ඒ. ඩොනල්ඩ් ප්‍රනාන්දු මහතා (වි.වැ.අංක: 01-1026289 පිළිබඳව සිදුකළ අභ්‍යන්තර විගණන පරීක්ෂණය |

- රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට අයත් මහියංගණය, මොණරාගල, කතරගම, බණ්ඩාරවෙල හා දියතලාව යන නිවාඩු නිකේතන 07 ක ලිපි ගොනු පරීක්ෂාව හා භෞතික පරීක්ෂාව හා මහරගම, මහියංගණය හා බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි විශ්‍රාම වැටුප් ගෙවීම සම්බන්ධ දත්ත පද්ධතිය, ලිපි ගොනු පරීක්ෂාව හා භෞතික පරීක්ෂාව සිදු කරන ලදී.

- මීට අමතරව, සෑම මාසයකම හත්ලක්ෂ දස දහසකට ආසන්න විශ්‍රාමිකයින් සඳහා මාසිකව ගෙවනු ලබන විශ්‍රාම වැටුප් ගෙවීම් දත්ත පද්ධතිය විගණනය කිරීම මගින් හඳුනාගනු ලබන වැරදි හා අඩුපාඩු නිවැරදි කරගැනීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත විගණන වාර්තා යොමු කරනු ලැබේ.

### ක්‍රමසම්පාදන අංශය

අමාත්‍යාංශය වෙත පැවරෙන ක්‍රමසම්පාදන කාර්යභාරයට අයත් වන්නා වූ ක්‍රියාකාරකම් සැලසුම් කිරීම, මාර්ගෝපදේශයන් හා ක්‍රමෝපායන් සකස් කිරීම, වැඩසටහන්, ව්‍යාපෘති, සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, මෙහෙයවීම, ඇගයීම මෙන්ම ඒ හා සම්බන්ධ වන්නා වූ සේවාවන් ඉටු කිරීම සඳහා ක්‍රමසම්පාදන අංශය ස්ථාපිත කොට ඇත.

### 2024 වසරේ සුවිශේෂී කාර්යය සාධනයන්

- ජාතික බලශක්ති විභවයන්, ක්‍රමෝපායයන් හා මාර්ග සිතියම පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනු කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අදාළව නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 08/2023 හා 08/2023 (I) අනුව රජයේ ආයතනවල, බලශක්ති කළමනාකරණයට අදාළව ජලය, විදුලිය, ඉන්ධන හා දුරකථන පරිභෝජනයට අදාළව ප්‍රගති සමාලෝචනයට සම්බන්ධ කටයුතු.
  එම කාර්යය වඩාත් කාර්යක්ෂමව හා ඵලදායිව ඉටු කිරීම සඳහා මාසිකව තොරතුරු ඇතුළත් කිරීමට WEFT පරිගණක දත්ත පද්ධතිය නිර්මාණය කිරීම.
- 2023.02.06 දිනැති අංක: 23/0256/604/030 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි රාජ්‍ය මූල්‍ය ඒකාබද්ධ කරන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා ශූන්‍ය පාදක (Zero Based Budgeting – ZBB) ප්‍රවේශය භාවිතා කරමින් මෙම අමාත්‍යාංශයේ වියදම් සමාලෝචනය කිරීමට අදාළව පත් කරන ලද කමිටු වාර්තාවේ (PERC) ඇතුළත් නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අදාළ කටයුතු සිදු කිරීම
- රජයේ ආයතන සතු සංචාරක බංගලා හා නිවාඩු නිකේතන උපරිම ඵලදායි අයුරින් හා රජයට ආදායමක් ලැබෙන අයුරින් යොදාගැනීමට අදාළව 2024 අයවැය යෝජනාවක් ලෙස ලැබී තිබූ රු. 600 ක ව්‍යාපෘතියට අදාළව ව්‍යාපෘති අනුමත කිරීම හා අනෙකුත් සියලු සම්බන්ධීකරණ කටයුතු කිරීම.
- අමාත්‍යාංශයේ ක්‍රියාකාරී සැලැස්ම හා කාර්ය සාධන වාර්තා සකස් කිරීම.
- අමාත්‍යාංශයේ ප්‍රගති සමාලෝචනය සම්බන්ධ කටයුතු.
- ප්‍රගති වාර්තා, වාර්ෂික කාර්ය සාධන වාර්තාව සකස් කර නියමිත වේලාවට පාර්ලිමේන්තුව වෙත යොමු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම
- අමාත්‍යාංශයේ අනෙකුත් අංශවලට අවශ්‍ය තොරතුරු ලබා දීම
- අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කෙරෙන විදේශ ව්‍යාපෘතිවල ප්‍රගති සමාලෝචනය සහ පසුවිපරම් සිදු කිරීම.

### රාජ්‍ය සේවා ප්‍රතිසංස්කරණ අංශය

2024 වර්ෂයේ සුවිශේෂී කාර්ය සාධනයන් සහ ජයග්‍රහණ මෙන්ම ඉදිරි මාසවල ඉටු කිරීමට අපේක්ෂිත කාර්යයන්

- අමාත්‍යාංශයීය කාර්යයන් ඩිජිටල්කරණය හා අර්ථ්‍යකරණය සඳහා වන උපාය මාර්ගික සැලැස්මක් සකස් කිරීම

අමාත්‍යාංශයීය කාර්යයන් ඩිජිටල්කරණය හා අර්ථ්‍යකරණය සඳහා වන උපාය මාර්ගික සැලැස්ම මේ වන විට සකස් කර ඇති අතර, එය ඉදිරියේදී වෙබ් අඩවියෙහි භාෂා ත්‍රිත්වයෙන්ම පළ කිරීමට නියමිතය. එම උපාය මාර්ගික සැලැස්ම මගින් අමාත්‍යාංශය තුළ ඉදිරි වසර 05 තුළ දී ක්‍රියාත්මක කිරීමට නියමිත ඩිජිටල්කරණ උපාය මාර්ග හඳුනා ගෙන එම උපාය මාර්ග පාදකව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කොට ඇති අතර, රාජ්‍ය පරිපාලන

අංශයට අදාළ සැලසුම්ගත ක්‍රියාවලි මේ වන විට ආරම්භ කර ඇත.

- රාජ්‍ය අංශයේ මානව සම්පත් කළමනාකරණය සඳහා තොරතුරු තාක්ෂණ පද්ධතියක් (HRMIS) සහ ලේඛන කළමනාකරණ පද්ධතිය (DMS) සකස් කිරීම

රාජ්‍ය අංශයේ මානව සම්පත් කළමනාකරණය සඳහා තොරතුරු තාක්ෂණ පද්ධතියක් (HRMIS) සහ ලේඛන කළමනාකරණ පද්ධතිය (DMS) සකස් කිරීමට අදාළ ප්‍රසම්පාදන කටයුතු සිදු කර ඇත. මේ සඳහා අභිලාෂය පළ කිරීමේ ආරාධන EXPRESSIONS OF INTEREST (EOI) ක්‍රමය යටතේ ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇගයීම් කටයුතු සිදු කර අවසන් අතර, ඉහත පද්ධති ද්විත්වය සඳහා සුදුසු උපදේශන සේවා සැපයුම්කරුවන් ද්විත්වයක් තෝරා ගැනීම මේ වන විට අවසන් කර ඇත.

- අමාත්‍යාංශ ක්‍රියාවලි ප්‍රතිනිර්මාණය කිරීමේ වැඩසටහන සකස් කිරීම (BPR)

අමාත්‍යාංශ ක්‍රියාවලි ප්‍රතිනිර්මාණය කිරීමේ වැඩසටහන සකස් කිරීමට අදාළව දැනට රාජ්‍ය සේවයට මාණ්ඩලික නිලධාරීන් සහ ඒකාබද්ධ සේවා තුනකට අයත් නිලධාරීන් බඳවා ගැනීමේ සිට විශ්‍රාම යාම දක්වා වන ක්‍රියාවලි අධ්‍යයනය කිරීම උපදේශන ආයතනයක් මගින් සිදු කරමින් පවතී. ඒ සඳහා UNDP ශ්‍රී ලංකා ආයතනයේ මූල්‍ය අනුග්‍රහය මත KPMG Consultancy Pvt Ltd උපදේශන ආයතනය තෝරා ගෙන ඇත. එම ආයතනය මේ වන විට අමාත්‍යාංශය සමග එක්ව ක්‍රියාවලි ප්‍රතිනිර්මාණය කිරීමේ කටයුතු ආරම්භ කර ඇත. මෙම ක්‍රියාවලිය අදියර 04 කින් යුක්ත වේ. එහි පළමු අදියරේදී සැලසුම් කිරීමත්, දෙවන අදියරේදී දැනට පවතින ක්‍රියාවලීන් එලෙසම හඳුනා ගැනීමත්, තෙවන අදියරේදී අදාළ පාර්ශවකරුවන් සමග සාකච්ඡා කොට දැනට පවතින ක්‍රමවේදයෙහි අඩුපාඩු විශ්ලේෂණය කිරීමත්, සිව්වන අදියරේදී ඩිජිටල්කරණ පද්ධතියක් තුළ ක්‍රියාත්මක කළ හැකි නව ක්‍රමවේදයන් හා ක්‍රියාවලීන් හඳුන්වා දීමටත් අපේක්ෂිත අතර, මේ වන විට අවසන් අදියරේ කටයුතු සිදු වෙමින් පවතී.

- **ආකෘති පත්‍ර සරල කිරීම**

ක්‍රියාවලි ප්‍රතිනිර්මාණය කිරීමට අදාළව දැනට අමාත්‍යාංශයේ අභ්‍යන්තර හා බාහිර භාවිතා කරන ආකෘති පත්‍ර වෙනුවට රාජ්‍ය සේවාවන් ඩිජිටල්කරණයට සමගාමීව ඊට අනුරූපී පොදු ආකෘති පත්‍ර හඳුන්වා දීමට මූලික කටයුතු ආරම්භ කර කමිටුවක් පිහිටුවා ඇත.

- කාර්යය සහ සේවක සංඛ්‍යා අධ්‍යයනය

ඉහත අමාත්‍යාංශ ක්‍රියාවලි ප්‍රතිනිර්මාණය කිරීමේ වැඩසටහනට සමගාමීව දැනට අමාත්‍යාංශ කාර්යයන් හා වැඩ ප්‍රමාණය අධ්‍යයනය කිරීමට ද එමගින් අමාත්‍යාංශය සඳහා අවශ්‍ය ප්‍රශස්ත කාර්ය මණ්ඩලය තීරණය කිරීමට ද වැඩසටහන් ආරම්භ කිරීමට නියමිතව ඇත. ඒ සඳහා අවශ්‍ය සංකල්ප හඳුනා ගෙන සුදුසු පරිදි සකස් කර අවශ්‍ය අනුමැතීන් ලබා ගැනීමෙන් පසු එය ක්‍රියාත්මක කිරීම සඳහා වැඩසටහන් නිර්මාණය කිරීමට නියමිතය.

## 6. විෂයය ක්ෂේත්‍රය - විශ්‍රාම වැටුප්

විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය පරිපාලන ලේකම් වෙත බලතල පැවරී ඇති කාර්යයන් ඉටු කිරීම, විශ්‍රාම වැටුප් සම්බන්ධ ප්‍රතිපත්තිමය කරුණු සම්පාදනය කිරීම, විශ්‍රාමිකයන්ගේ හා විශ්‍රාමික සංගම්වලින් ඉදිරිපත් කෙරෙන ඉල්ලීම් සම්බන්ධයෙන් කටයුතු කිරීම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ආයතන කටයුතු සම්බන්ධීකරණය කිරීම විශ්‍රාම වැටුප් අංශය මඟින් සිදු කෙරේ.

- විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 12 හා 15 වගන්ති යටතේ විශ්‍රාම ගැන්වූ නිලධාරීන් සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන විනය කමිටුව වෙත ඉදිරිපත් කරන ලද ගොනු සංඛ්‍යාව පහත පරිදි වේ.

**රූප සටහන 6.1 - විනය කමිටුව වෙත ඉදිරිපත් කරන ලද ගොනු**



**වගුව 6.1 - විශ්‍රාමික නිලධාරීන් සහ විශ්‍රාමික සංගම් විසින් ඉදිරිපත් කරනු ලබන ගැටලු සහිත ලිපි සම්බන්ධ ප්‍රගතිය**

| මාසය | ලැබුණු ලිපි සංඛ්‍යාව | ගොනු කරන ලද ලිපි සංඛ්‍යාව | කටයුතු කළ ලිපි සංඛ්‍යාව |
|---|---|---|---|
| ජනවාරි | 247 | 64 | 183 |
| පෙබරවාරි | 209 | 43 | 166 |
| මාර්තු | 249 | 54 | 195 |
| අප්‍රේල් | 188 | 24 | 164 |
| මැයි | 272 | 43 | 229 |
| ජූනි | 231 | 40 | 191 |
| ජූලි | 353 | 45 | 308 |
| අගෝස්තු | 270 | 27 | 243 |
| සැප්තැම්බර් | 239 | 48 | 191 |
| ඔක්තෝබර් | 240 | 50 | 190 |
| නොවැම්බර් | 201 | 17 | 184 |
| දෙසැම්බර් | 293 | 37 | 256 |

- මෙම අංශය විසින් 2024 වර්ෂය තුළදී විශ්‍රාම වැටුප් වලට අදාළව චක්‍රලේඛ 01 ක්ද, චක්‍රලේඛ ලිපි 02 ක්ද, ගැසට් නිවේදන 01 ක්ද, අමාත්‍ය මණ්ඩල සංදේශ 02 ක් සහ අමාත්‍ය මණ්ඩල සටහන් එක බැගින් නිකුත් කර ඇත.

**වගුව 6.2 - විශ්‍රාම වැටුප් අංශය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ, චක්‍රලේඛ ලිපි, අමාත්‍ය මණ්ඩල සංදේශ සහ අමාත්‍ය මණ්ඩල සටහන්**

| චක්‍රලේඛ / සංදේශ අංකය | කරුණ |
|---|---|
| රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2024 | සියලුම රජයේ විශ්‍රාමිකයින් වෙත අන්තර්කාලීන දීමනාවක් ගෙවීම |
| රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි 01/2024 | වයස අවුරුදු 45 න් පසුව පත්වීම් ස්ථිර කරන ලද සේවකයින් වෙත විශ්‍රාම වැටුප් ලබාදීම (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/2014, 25/2014 (1) සහ 29/2019 සම්බන්ධයෙනි) |
| රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි 02/2024 | සියලුම රජයේ විශ්‍රාමිකයින් වෙත අන්තර්කාලීන දීමනාවක් ගෙවීම |
| අති විශේෂ ගැසට් නිවේදන අංක: 2415/61 (2024.12.20) | "විශේෂඥ වෛද්‍යවරුන්ගේ, ශ්‍රේණිගත වෛද්‍ය සහ දන්ත වෛද්‍ය නිලධාරීන්ගේ, වෛද්‍ය පරිපාලන ශ්‍රේණිවල සියලුම නිලධාරීන්ගේ, විශේෂඥ දන්ත වෛද්‍යවරුන්ගේ සහ ලියාපදිංචි වෛද්‍ය වෘත්තිකයන්ගේ අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 63 විය යුතුය" ලෙස සංශෝධනය කර ඇත. |
| සංදේශ අංකය: PA/Pns-01/74/2024 | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් ඒ.ජගත් ඩී. ඩයස් මහතාගේ සේවා කාලය දීර්ඝ කිරීම |

## 7. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

**2024 වසර තුළ අත්පත් කරගන්නා ලද සුවිශේෂ ජයග්‍රහණ පිළිබඳ තොරතුරු**

- **පාරිතෝෂික ගෙවීම් කාර්යක්ෂම කිරීම**

2024 දෙසැම්බර් මාසය තුළ දෙවතාවක් විශ්‍රාම වැටුප් ගෙවීම සිදු කරන ලද අතර, ඉන් පළමු අවස්ථාවේ ප්‍රථම විශ්‍රාම වැටුප් සක්‍රිය කර ඇති සියලුම විශ්‍රාමිකයින් සඳ 2024.12.31 වන විට පාරිතෝෂික ගෙවීම් සිදු කර ඇති අතර මේ වන විට විශ්‍රාම වැටුප් ආරම්භ කළ මාසයේ දීම පාරිතෝෂික ගෙවීම් සිදු කරනු ලැබේ. එසේම පාරිතෝෂික ගෙවීම් චෙක්පත් මගින් 2024 මාර්තු මස දක්වා සිදු වූ නමුත් මේ වන විට ස්ලිප් ක්‍රමය (Slip Method) හරහා ගෙවීම් කිරීම ආරම්භ කොට ඇති බැවින්, විශ්‍රාමිකයින්ට ප්‍රමාදයකින් තොරව තම ප්‍රතිලාභ අත්කර ගැනීමට පහසුකම් සලසා ඇත. ඒ අනුව 2024 දෙසැම්බර් මස 31 වන විට විශ්‍රාමිකයින් 40,926 ක් සඳහා පාරිතෝෂික ගෙවීම් සිදු කර ඇත.

- **වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප සඳහා හිඟ දායක මුදල් අය කිරීමේදී ඊට අදාළ පොළිය අය කළයුතු ආකාරය පිළිබඳ උපදෙස් ලබාදීම**

හිඟ වැන්දඹු අනත්දරු දායක මුදල් ගෙවීමේ දී අය කරනු ලබන පොළී ප්‍රතිශතය හා පොළී ක්‍රමය පිළිබඳ මතු වී තිබු ගැටළු සහගත තත්ත්වය නිරාකරණය කිරීම සඳහා ගරු නීතිපතිතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් විසින් ලබා දෙන ලද උපදෙස් හා මඟපෙන්වීම අනුව 2024.04.02 දිනැතිව විශ්‍රාම වැටුප් උපදෙස් ලිපි අංක 01/2024 නිකුත් කර ඇත.

- **ත්‍රිවිධ හමුදා හා පොලිස් නිලධාරීන් සඳහා රු. 5000.00 ක මාසික දීමනාව ගෙවීම වැන්දඹු අනත්දරු ගෙවීම් කාර්යක්ෂම කිරීම**

2024.08.06 දිනැති විශ්‍රාම වැටුප් උපදෙස් ලිපි අංක: 06/2024 මගින් ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් දුබලතාවයට පත්ව ඇති ත්‍රිවිධ හමුදා හා පොලිස් නිලධාරීන් වෙතද මිය ගොස් ඇති එම නිලධාරීන්ගේ යැපෙන්නන් වෙතද වයස අවුරුදු 55 දක්වා වන්දි වැටුප් හා දීමනා ගෙවීමේදී ඊට අදාළව රු. 5000.00 ක මාසික දීමනාව හිමි ගැන්වීම ත්‍රිවිධ හමුදාව හා පොලීසිය යන ආයතන වෙත පවරා ඇත.

- **වැන්දඹු අනත්දරු ගෙවීම් කාර්යක්ෂම කිරීම**

2024.08.01 දිනැති විශ්‍රාම වැටුප් උපදෙස් ලිපි අංක 05/2024 මගින් විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 03/2020 හි විධිවිධාන ප්‍රකාරව මාර්ගගත දත්ත පද්ධතිය හරහා යොමු කළ නොහැකි වැන්දඹු/ වැන්දඹු පුරුෂ/ අනත්දරු/ ආබාධිත අනත්දරු විශ්‍රාම වැටුප් අයදුම්පත්‍ර DS Portal දත්ත පද්ධතිය මගින් ඇතුළත් කිරීමට අවස්ථාව ලබාදීම තුලින් වැන්දඹු අනත්දරු ගෙවීම් කාර්යක්ෂම කිරීම සඳහා කටයුතු කර ඇත.

- **වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු ක්‍රමයේ ලියාපදිංචිය**

2024 දෙසැම්බර් මස 31 දින වන විට වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු ක්‍රමයේ ලියාපදිංචිය සඳහා ලැබී ඇති අයදුම්පත්වලින් 36,652 ක් සඳහා සාමාජික අංක නිකුත් කර ඇත.

- **රු. 3000/- ක විශේෂ අන්තර්කාලීන මාසික දීමනාවක් හිමි ගැන්වීම**

අංක: අමප/24/1453/601/090 හා 2024.07.24 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය හා අංක: අමප/20/1608/605/058 සහ 2024.08.12 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව රාජ්‍ය සේවයේ යෙදී විශ්‍රාම ගොස් ඇති සියලුම විශ්‍රාමිකයින් වෙත 2024 ඔක්තෝබර් මස සිට රු. 3000/- ක විශේෂ අන්තර්කාලීන මාසික දීමනාවක් හිමි ගැන්වීමට කටයුතු කර ඇත.

- **දත්ත පද්ධතීන් වැඩිදියුණු කිරීම**

- හමුදා විශ්‍රාම වැටුප් සඳහා සංශෝධනයන් සිදු කළ යුතු වන අවස්ථාවන්හි දී එය වඩාත් නිරවද්‍ය හා කාර්යක්ෂම ආකාරයෙන් සිදු කළ හැකි වන පරිදි හමුදා විශ්‍රාම වැටුප් සංශෝධනය සඳහා තොරතුරු පද්ධතියක් ) PD 6 Forces) සකස් කර මාර්ගගතව මුදා හැර ඇත.
- රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 අනුව දේශීය හා විදේශීය නිවාඩු ලබා ගන්නා ලද රාජ්‍ය නිලධාරින්ගේ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් සඳහා වන මාසික හෝ ත්‍රෛමාසික ප්‍රේෂණයන් තත්කාලීනව යාවත්කාලීන වන පරිදි වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රේෂණ කළමනාකරණ පද්ධතිය වැඩි දියුණු කර ඇත. මෙය මාර්ගගත තොරතුරු පද්ධතියක් හරහා මහජන බැංකුවේ දත්ත පද්ධතීන් සමග තාක්ෂණිකව සම්බන්ධවීම මගින් සිදු කරනු ලබන අතර, එම තොරතුරු පද්ධතිය නිවාඩු ලබා ගන්නා නිලධාරීන්ට වඩාත් පහසු වන ආකාරයෙන් නිවාඩුවක් අවසන් කිරීමට, නිවාඩුවක් දීර්ඝ කිරීමට හා නව නිවාඩුවක් ඇතුළත් කිරීමට හැකිවන ආකාරයේ නව සංස්කරණයක් සිදු කර ඇත.
- 2024.12.31 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 02/2024 අනුව විශ්‍රාමිකයින්ට නිදහස් දුම්රිය බලපත්‍ර ලබා ගැනීම සහ මගී ආසන වෙන් කිරීම සඳහා මාර්ගගත පද්ධිතයක් හඳුන්වා දී ඇත. එමගින් ස්වයංක්‍රීයව දත්ත පරීක්ෂාව යටතේ නිවැරදි ප්‍රතිලාභීන් හඳුනා ගැනීමටත්, විශ්‍රාමික නිදහස් දුම්රිය බලපත්‍ර සඳහා ගෙවීම් ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීමට හා ගමන් බලපත්‍ර මුද්‍රණය සඳහා වන රාජ්‍ය පිරිවැය අවම කිරීමත් සඳහා පහසුකම් සලසා ඇත.
- රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලෙහි දායක මුදල් ලැබීම සහ ප්‍රතිලාභ හිමිගැන්වීම චෙක්පත් භාවිතයෙන් සිදුවන අතර, එය ලංකා බැංකුවේ තොරතුරු තාක්ෂණ ඒකකය සමග ඒකාබද්ධ වෙමින් Online reconciliation හරහා මාර්ගගතව ප්‍රේෂණ ලබා ගැනීමටත්, එහි වාර්තා තබා ගැනීමටත් හැකි වන පරිදි රාජ්‍ය

සේවක අර්ථසාධක අරමුදල් (PSPF) ක්‍රියාවලිය ප්‍රතිනිර්මාණය (Re – engineer) කර ඇත.

- **වැන්දඹු හා අනත්දරු ක්‍රමයෙහි ලියාපදිංචි කිරීමේ තොරතුරු පද්ධතිය**

සියලුම රාජ්‍ය නිලධාරීන්ගේ සහ ඔවුන්ගේ යැපෙන්නන්ගේ තොරතුරු ඇතුළත් වන පරිදි සකස් කරන ලද මෙම තොරතුරු පද්ධිතය දැනට පවතින ලියාපදිංචි තොරතුරු පද්ධතියෙහි දත්ත හා ඊට අමතර දත්ත ද ඇතුළත් කර ඉදිරියේ දී විශ්‍රාමික ප්‍රතිලාභ පැතිකඩක් (Pension beneficiary profile) ලෙස අතථ්‍ය (Virtual file) ගොනුවක් නිර්මාණය කළ හැකි වන පරිදි සකසා ඇත. මෙම තොරතුරු පද්ධතිය මගින් රාජ්‍ය නිලධාරීන් සහ ඔවුන්ගේ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රතිලාභීන්ගේ අනන්‍යතාව සත්‍යාපනය කර ගත හැකි ආකාරයට QR කේතයක් සහිත හැඳුනුම්පතක් නිකුත් කිරීමට කටයුතු යොදා ඇත.

♦ රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධව විශ්‍රාමික මරණ කාර්යක්ෂමව දැන ගැනීම සඳහා තොරතුරු පද්ධතියක් සකස් කර ඇත.

- **නිල වෙබ් අඩවිය වැඩි දියුණු කිරීම**

විශ්‍රාමිකයින්ට තම ජාතික හැඳුනුම්පත් අංකය භාවිතයෙන් තමා අපේක්ෂා කරන විශ්‍රාම වැටුප් සේවාවෙහි වර්තමාන තත්ත්වය ත්‍රෛභාෂාවෙන්ම පරීක්ෂා කළ හැකි පරිදි වෙබ් අඩවිය නව්‍යකරණය කර ඇත.

♦ පුහුණු වැඩසටහන් පැවැත්වීම

_ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ විශ්‍රාම වැටුප් කළමනාකරණ දත්ත පද්ධතිය හා සම්බන්ධව කටයුතු කරන විවිධ රාජ්‍ය ආයතනයන්හි විෂය නිලධාරීන් හා දෙපාර්තමේන්තුවට අනුයුක්තව ප්‍රාදේශීය ලේකම් කාර්යලයන්හි සේවය කරන නිලධාරීන් සඳහා මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ සහ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ හා ද්විතීය මට්ටමේ නිලධාරීන් සඳහා දෙපාර්තමේන්තු පරිශ්‍රයේ පුහුණු වැඩසටහන් පැවැත්වීමට කටයුතු කර ඇති අතර, මේ වන විට අභ්‍යන්තර පුහුණු වැඩසටහන් 28 ක් මගින් 4,500 කට අධික නිලධාරීන් පිරිසක් සඳහා පුහුණුවීම් සිදු කර ඇත.

_ එමෙන්ම විෂයය අවශ්‍යතාවය අනුව වෙනත් රාජ්‍ය ආයතන මගින් පවත්වනු ලැබූ පුහුණු වැඩසටහන් 18 ක් සඳහා නිලධාරීන්හට සම්බන්ධවීමට අවස්ථාව ලබා දී ඇති අතර, විවිධ රාජ්‍ය ආයතන මගින් පවත්වනු ලැබූ පුහුණු වැඩසටහන් 24 ක් සඳහා සම්පත්දායකත්වය ලබාදීම සිදු කර ඇත.

_ තවද, 2024.06.05 දින දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාවක් සඳහා පැමිණි ත්‍රිකුණාමලය නාවික හා සාගරික විද්‍යා පීඨයේ නිලධාරීන් කණ්ඩායම සඳහා සාමාන්‍ය විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය, ත්‍රිවිධ හමුදාවන්ට අයත් නිලධරයන්ගේ සහ ඔවුන්ගේ යැපෙන්නන්ට විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ හිමිගැන්වීම, වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය සම්බන්ධයෙන් දැනුවත් කිරීමට කටයුතු කරන ලදී.

♦ **ජාතික විශ්‍රාමික දිනය සැමරීම**

ඔක්තෝබර් 08 දිනට යෙදෙන ජාතික විශ්‍රාමික දිනය වෙනුවෙන් විශ්‍රාමික ප්‍රජාවට ලබා දෙන සේවාවන් සම්බන්ධයෙන් දැනුවත් කිරීමක් සිදු කරමින් ජාතික පුවත්පත් ත්‍රිත්වයක ඇතුළු පිටු කිහිපයක අතිරේකයක් පළ කරන ලදී.

♦ **දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ සුබසාධනය වැඩිදියුණු කිරීම සඳහා පියවර ගැනීම**

_ දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ සුහදත්වය වර්ධනය කිරීම, කායික මානසික සෞඛ්‍ය තත්ත්වය යහපත්ව පවත්වා ගැනීම අරමුණු කරමින් දෙපාර්තමේන්තු ක්‍රීඩා සංගමය විසින් සිව්වනවරටත් සහද ක්‍රිකට් තරගාවලියක් සංවිධානය කරන ලදී. එමෙන්ම රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ සුබසාධක සංගමය මගින් පවත්වනු ලැබූ සැහැල්ලු පන්දු ක්‍රිකට් තරගාවලියේදී දෙපාර්තමේන්තු ක්‍රිකට් කණ්ඩායමට ශූරතාවය ලබා ගැනීමට අවස්ථාව ලැබුණ අතර, රාජ්‍ය සේවා නෙට්බෝල් සංගමය මගින් පවත්වනු ලැබූ වාර්ෂික නෙට්බෝල් තරගාවලියේ අනුශූරතාවය ලබා ගැනීමට හැකිවීම.




සැහැල්ලු පන්දු ක්‍රිකට් තරගාවලියේදී විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු ක්‍රිකට් කණ්ඩායම ශූරතාවය ලබාගත් අවස්ථාව

- ♦ **විශ්‍රාම වැටුප් ගෙවීම්**

**වගුව 7.1 - මාසික විශ්‍රාම වැටුප් ගෙවීම් සංඛ්‍යාව (ජනවාරි- දෙසැම්බර්)**

| මාසය | සිවිල් | වැන්දඹු හා අනත්දරු | හමුදා |
|---|---|---|---|
| ජනවාරි | 384,857 | 187,689 | 131,924 |
| පෙබරවාරි | 386,744 | 187,852 | 132,746 |
| මාර්තු | 387,909 | 188,062 | 133,261 |
| අප්‍රේල් | 389,421 | 188,419 | 134,175 |
| මැයි | 389,021 | 188,093 | 134,397 |
| ජූනි | 389,870 | 188,095 | 134,822 |
| ජූලි | 389,307 | 186,715 | 134,693 |
| අගෝස්තු | 390,969 | 187,366 | 135,485 |
| සැප්තැම්බර් | 392,966 | 187,913 | 136,468 |
| ඔක්තෝබර් | 394,183 | 188,233 | 137,193 |
| නොවැම්බර් | 395,177 | 188,537 | 137,737 |
| දෙසැම්බර් | 397,182 | 189,509 | 138,591 |

**රූප සටහන 7.1 - සක්‍රිය කරන ලද නව විශ්‍රාමිකයින් සංඛ්‍යාව (ජනවාරි- දෙසැම්බර්)**




**වගුව 7.2 - පාරිතෝෂික ගෙවීම් (ජනවාරි- දෙසැම්බර්)**

| මාසය | විශ්‍රාමිකයන් සංඛ්‍යාව | මුදල (රු.මි.) |
|---|---|---|
| ජනවාරි | 3,155 | 3,937.2 |
| පෙබරවාරි | 2,938 | 3,278.64 |
| මාර්තු | 3,263 | 3,666.21 |
| අප්‍රේල් | 3,716 | 4,144.11 |
| මැයි | 3,567 | 3,717.69 |
| ජූනි | 2,957 | 3,600.55 |
| ජූලි | 3,474 | 4,105.18 |
| අගෝස්තු | 3,722 | 3,978.60 |
| සැප්තැම්බර් | 2,408 | 2,677.72 |
| ඔක්තෝබර් | 4,702 | 5,659.54 |
| නොවැම්බර් | 3,097 | 3,530.32 |
| දෙසැම්බර් | 3,927 | 4,154.23 |
| එකතුව | - | **46,449.97** |

**වගුව 7.3 - අග්‍රහාර රක්ෂණ අරමුදලට අයකිරීම් (ජනවාරි - දෙසැම්බර්)**

| මාසය | විශ්‍රාමිකයින් සංඛ්‍යාව | මුදල (රු.මි) |
|---|---|---|
| ජනවාරි | 141,322 | 28.75 |
| පෙබරවාරි | 144,149 | 31.87 |
| මාර්තු | 146,051 | 31.21 |
| අප්‍රේල් | 148,225 | 32.07 |
| මැයි | 148,928 | 30.58 |
| ජූනි | 150,778 | 32.26 |
| ජූලි | 152,704 | 32.94 |
| අගෝස්තු | 154,857 | 33.32 |
| සැප්තැම්බර් | 157,362 | 34.45 |
| ඔක්තෝබර් | 159,207 | 33.80 |
| නොවැම්බර් | 160,888 | 34.25 |
| දෙසැම්බර් | 163,570 | 35.64 |
| එකතුව | - | **391.14** |

**වගුව 7.4 - රු.5000 මාසික දීමනාව ගෙවීම් (ජනවාරි - දෙසැම්බර්)**

| මාසය | විශ්‍රාමිකයින් ගණන | මුදල (රු..මි) |
|---|---|---|
| ජනවාරි | 604,097 | 3,016.23 |
| පෙබරවාරි | 606,394 | 3,027.73 |
| මාර්තු | 607,769 | 3,034.49 |
| අප්‍රේල් | 609,919 | 3,045.21 |
| මැයි | 609,688 | 3,044.05 |
| ජූනි | 610,682 | 3,049.01 |
| ජූලි | 610,523 | 3,048.31 |
| අගෝස්තු | 613,478 | 3,063.06 |
| සැප්තැම්බර් | 616,879 | 3,080.03 |
| ඔක්තෝබර් | 619,040 | 3,090.84 |
| නොවැම්බර් | 620,858 | 3,099.89 |
| දෙසැම්බර් | 624,595 | 3,118.51 |
| එකතුව | | **36,717.36** |

**වගුව 7.5 රු. 3000 ක විශේෂ අන්තර්කාලීන දීමනාව ගෙවීම**

| මාසය | විශ්‍රාමිකයින් ගණන | මුදල (රු..මි) |
|---|---|---|
| ඔක්තෝබර් | 679,960 | 2,021.16 |
| නොවැම්බර් | 681,822 | 2,026.77 |
| දෙසැම්බර් | 685,155 | 2,038.97 |
| **එකතුව** | | **6,086.90** |

**වගුව 7.6 - විශ්‍රාම වැටුප් විෂමතා සහ සංශෝධන (ජනවාරි - දෙසැම්බර්)**

| මාසය | සංඛ්‍යාව | ගෙවූ මුදල (රු.මි) |
|---|---|---|
| ජනවාරි | 1,023 | 134 |
| පෙබරවාරි | 879 | 116 |
| මාර්තු | 859 | 122 |
| අප්‍රේල් | 875 | 123 |
| මැයි | 675 | 81 |
| ජුනි | 970 | 137 |
| ජුලි | 911 | 129 |
| අගෝස්තු | 1,165 | 164 |
| සැප්තැම්බර් | 1,225 | 161 |
| ඔක්තෝබර් | 960 | 134 |
| නොවැම්බර් | 1,289 | 175 |
| දෙසැම්බර් | 1,205 | 162 |
| **එකතුව** | **12,036** | **1,638** |

**රූප සටහන 7.2 - දායක මුදල් ආපසු ගෙවීම (ජනවාරි - දෙසැම්බර්)**




**වගුව 7.7 - සක්‍රිය සේවයේ යෙදී සිටියදී ජීවිතක්ෂයට හෝ බෙලහීනතාවයට පත් ත්‍රිවිධ හමුදා හා පොලිස් සේවා සාමාජිකයින්ට වන්දි වැටුප් හා දීමනා ගෙවීම (ජනවාරි - දෙසැම්බර් දක්වා)**

| ආයතනය | සංඛ්‍යාව | ගෙවූ මුදල රු .මිලියන |
|---|---|---|
| යුද්ධ හමුදා | 32,680 | 40,046 |
| නාවික හමුදා | 1,304 | 1,601 |
| ගුවන් හමුදා | 476 | 484 |
| පොලිස් | 1,525 | 2,141 |
| ස්ථාවර දීමනා ගෙවීම් | 3,538 | 1,320 |
| රු 5000.දීමනාව ගෙවීම් | 34,645 | 1,179 |
| **එකතුව** | **74,168** | **46,771** |

**වගුව 7.8 - රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ලැබීම් සහ ගෙවීම් (ජනවාරි - දෙසැම්බර්)**

| මාසය | ලැබීම් (රු.මි) | ගෙවීම් (රු.මි) |
|---|---|---|
| ජනවාරි | 72.85 | 40.46 |
| පෙබරවාරි | 57.97 | 35.82 |
| මාර්තු | 69.20 | 31.74 |
| අප්‍රේල් | 52.42 | 49.35 |
| මැයි | 67.94 | 42.67 |
| ජුනි | 74.76 | 51.46 |
| ජුලි | 73.77 | 56.53 |
| අගෝස්තු | 78.92 | 66.30 |
| සැප්තැම්බර් | 59.66 | 44.52 |
| ඔක්තෝබර් | 60.81 | 45.69 |
| නොවැම්බර් | 40.61 | 45.46 |
| දෙසැම්බර් | 59.17 | 90.27 |
| **එකතුව** | 768.08 | 600.27 |

**වගුව 7.9 - රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට අලුතින් එක්වූ සහ ඉවත් වූ සාමාජික සංඛ්‍යාව (ජනවාරි - දෙසැම්බර්)**

| මාසය | අලුතින් එක් වූ සාමාජික සංඛ්‍යාව | ඉවත් වූ සාමාජික සංඛ්‍යාව |
|---|---|---|
| ජනවාරි | 419 | 314 |
| පෙබරවාරි | 403 | 300 |
| මාර්තු | 453 | 390 |
| අප්‍රේල් | 239 | 378 |
| මැයි | 361 | 412 |
| ජුනි | 340 | 350 |
| ජුලි | 462 | 334 |
| අගෝස්තු | 292 | 417 |
| සැප්තැම්බර් | 210 | 390 |
| ඔක්තෝබර් | 343 | 365 |
| නොවැම්බර් | 397 | 426 |
| දෙසැම්බර් | 571 | 469 |
| **එකතුව** | **4,490** | **4,545** |

**වගුව 7.10 - රා.ප.ච. 14/2022 යටතේ දේශීය හා විදේශීය නිවාඩු ලබා ගන්නා ලද නිලධාරීන්ගෙන් අය කරනු ලැබූ වැන්දඹු/වැන්දඹු පුරුෂ දායක මුදල් ප්‍රමාණය**

| මාසය | මුදල (රු) |
|---|---|
| ජනවාරි | 13,270,012.07 |
| පෙබරවාරි | 12,846,564.06 |
| මාර්තු | 14,089,911.51 |
| අප්‍රේල් | 15,157,688.43 |
| මැයි | 16,803,885.65 |
| ජූනි | 14,199,634.49 |
| ජූලි | 18,254,753.98 |
| අගෝස්තු | 18,566,514.70 |
| සැප්තැම්බර් | 16,390,856.51 |
| ඔක්තෝබර් | 18,931,045.13 |
| නොවැම්බර් | 18,886,845.09 |
| දෙසැම්බර් | 15,802,931.13 |
| **එකතුව** | **193,200,642.75** |

**වගුව 7.11 - ආදායම් එකතුකිරීම් (ජනවාරි - දෙසැම්බර්)**

| විස්තරය | එකතු කරන ලද ආදායම (රු.මි) |
|---|---|
| මධ්‍යම රජය | 24,605.27 |
| පළාත් සභා | 16,082.20 |
| ගුරු වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල | 521.82 |
| **එකතුව** | 41,209.29 |

* *දෙපාර්තමේන්තුවට අයත් ගොඩනැගිලි කුලී පදනම මත ලබාදීම මගින් 2024 ජනවාරි මස සිට දෙසැම්බර් 31 දක්වා රු.36,397,881.00 ක මුදලක් සහ නිවාඩු නිකේතන මගින් රු.6,548,500.00 ක මුදලක් රජයේ ආදායම් වශයෙන් උපයාදී ඇත.*

**වගුව 7.12 - පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම්**

| මාසය | පුනරාවර්තන වියදම (රු.මි) | ප්‍රාග්ධන වියදම (රු.මි) |
|---|---|---|
| ජනවාරි | 33,926.90 | 0.27 |
| පෙබරවාරි | 34,101.24 | 0.65 |
| මාර්තු | 34,514.41 | 0.51 |
| අප්‍රේල් | 36,847.14 | 0.37 |
| මැයි | 35,885.02 | 0.43 |
| ජූනි | 36,612.57 | 0.24 |
| ජූලි | 36,874.46 | 5.96 |
| අගෝස්තු | 36,957.35 | 0.15 |
| සැප්තැම්බර් | 36,628.98 | 5.22 |
| ඔක්තෝබර් | 41,084.84 | 1.25 |
| නොවැම්බර් | 39,124.56 | 1.14 |
| දෙසැම්බර් | 40,178.11 | 35.04 |
| **එකතුව** | **442,735.58** | **51.23** |

**2025 වර්ෂයේදී සිදු කිරීමට සැලසුම් කර ඇති විශේෂිත ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු**

- 1934 පෙබරවාරි 05 දින ප්‍රකාශයට පත් කර ඇති විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන සංශෝධනය කිරීම සඳහා ඉන්පසුව එනම්, 2024 වර්ෂය දක්වා නිකුත් කර ඇති සියලුම ගැසට් නිවේදනවල විධිවිධාන ඇතුළත් කරමින් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යාවත්කාලීන කර ප්‍රකාශයට පත් කිරීම.
- සන්නද්ධ සේවා විශ්‍රාම වැටුප් ගෙවීමට අදාළව නිකුත් කර ඇති සියළු විධිවිධාන අන්තර්ගත කරමින් උපදෙස් සංග්‍රහයක් මුද්‍රණය කිරීම.
- විදේශ විශ්‍රාමිකයින්ට තවදුරටත් ඵලදායී සේවාවක් සැලසීමේ අභිප්‍රායෙන් අවශ්‍ය විධිවිධාන සැලසීමට අදාලව විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 01/2018 සංශෝධනය කිරීම.
- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර ක්‍රියාවලි හා විශ්‍රාමික සේවා වඩා සරල කිරීම සඳහා iPMS ව්‍යාපෘතිය පරීක්ෂණ අවධි සම්පූර්ණ කර භාවිතය සඳහා මුදා හැරීම .
- රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධව විශ්‍රාම වැටුප් ලාභීන්ගේ මරණ කාර්යක්ෂමව වාර්තා කර ගැනීමේ ක්‍රමවේදයන් හඳුන්වා දීම. මෙමගින් විශ්‍රාමික ජීවිත සහතික ලබා දීමේ ක්‍රමවේදය වඩාත් ලිහිල් කිරීම.
- විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ආදායම් ලැබීම සැලකිල්ලට ගෙන වෙදමුල්ල හා රම්බොඩ නිවාඩු නිකේතනයන්හි නව ව්‍යාපාරික සැලැස්මක් යටතේ ක්‍රියාත්මක කිරීම.
- අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ මඟ පෙන්වීම යටතේ දෙපාර්තමේන්තුව තුළ අල්ලස හා දූෂණයෙන් තොර සුපිළිපන් රාජ්‍ය සේවයක් බිහිකිරීමට අදාල ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම.

# 8. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය

රාජ්‍ය අංශයේ විධායක නිලධාරීන්ගේ ශක්‍යතා වැඩිදියුණු කිරීම හා වෘත්තීය ප්‍රගමනයෙහිලා වගකීම පැවරී ඇති ප්‍රමුඛතම ආයතනය මෙම ආයතනය යි. රාජ්‍ය අංශයේ නිලධාරීන් සඳහා පුහුණු පාඨමාලා පැවැත්වීම, රාජ්‍ය අංශයේ ආයතන සඳහා කළමනාකරණ උපදේශකත්වයන් ලබාදීම හා පර්යේෂණ කාර්යයන් දිරිගැන්වීම ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ ප්‍රධානතම ක්‍රියාකාරී ක්ෂේත්‍රයන් වේ.




කථන ශිල්ප පුහුණුව සහතිකපත් ප්‍රදානෝත්සවය - 2024 පළමු කණ්ඩායම

**වගුව 8.1 – 2024.01.01 සිට 2024.12.31 දින දක්වා කාලය තුළ විභාග අංශය මගින් පවත්වන ලද විභාග සම්බන්ධ තොරතුරු**

| විභාග වර්ගය | පැවැත්වූ විභාග සංඛ්‍යාව | අපේක්ෂකයින් සංඛ්‍යාව |
|---|---|---|
| කාර්යක්ෂමතා කඩඉම් විභාග | 38 | 57,423 |
| බඳවා ගැනීමේ තරග විභාග | 08 | 556 |
| ආයතනයේ අභ්‍යන්තර විභාග | 09 | 402 |

**2024 වර්ෂය තුළ අත්පත්කර ගන්නා ලද සුවිශේෂ ජයග්‍රහණ**

- 2024.01.20 දින ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් සඳහා වූ II වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ "කළමනාකරණය සඳහා වූ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ භාවිතය" විෂය වෙනුවෙන් නිලධාරීන් 146 ක් සඳහා ප්‍රායෝගික පරිගණක පරීක්ෂණය තොරතුරු තාක්ෂණ අංශයේ සහයෝගයද ඇතිව පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම.
- 2024.03.03 දින ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ II වන ශ්‍රේණියේ බලයලත් නිලධාරීන් 121 සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම.
- 2024.06.19 දින විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල සියරට පේරුවේ පෞද්ගලික සහකාර තනතුරුවලට පුරප්පාඩු පිරීම සඳහා වන සීමිත තරග විභාගය සඳහා අපේක්ෂකයින් 22 ක් වෙනුවෙන් ප්‍රායෝගික පරිගණක පරීක්ෂණ පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම.
- සංවර්ධන නිලධාරී සේවයේ නිලධාරීන් සඳහා වූ I වන, II වන හා III වන කාර්යක්ෂමතා කඩඉම් විභාග 2024.06.30 දින දිවයින පුරා විභාග මධ්‍යස්ථාන 352 කදී අපේක්ෂකයින් 55,321 සඳහා සාර්ථකව පවත්වා අවසන් කිරීම හා II වන හා III වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයන්හි ප්‍රතිඵල 2024.08.31 දිනත්, I වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ ප්‍රතිඵල 2024.09.11 දිනත් ලෙස විභාගය පවත්වා මාස 2.5 ක කාලයක් ඇතුළත ප්‍රතිඵල නිකුත් කිරීම.
- රෙජිස්ට්‍රාර් සේවයේ III පන්තියේ II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය විභාගය අපේක්ෂකයින් 270ක් සඳහා 2024 ඔක්තෝබර් මසදී පැවැත්වීම.
- දීප ව්‍යාප්ත සේවයේ නිලධාරීන් සඳහා වූ I වන හා II වන කාර්යක්ෂමතා කඩඉම් විභාග 2024 දෙසැම්බර් මස පැවැත්වීම.
- තොරතුරු සන්නිවේදන තාක්ෂණ සේවයේ නිලධාරීන් සඳහා වූ I වන, II වන හා III වන කාර්යක්ෂමතා කඩඉම් විභාග අපේක්ෂකයින් 350 ක් සඳහා 2024 ඔක්තෝබර් මසදී පැවැත්වීම.
- රාජ්‍ය පරිපාලනයේ හොඳම භාවිතයන් සහ නවෝත්පාදනය පිළිබඳ සම්මන්ත්‍රණය (BP – IPAG) 2024 මාර්තු 15 වැනි දින ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ (SLIDA) පැවැත්විනි.
- **SLIDA Newsletter**
  SLIDA පුවත් පත්‍රිකාව වඩාත් ආකර්ශනීයව සහ නව ප්‍රවේශයකින් නිකුත් කිරීම සඳහා, 2024 අගෝස්තු මාසයේදී නිල වශයෙන් ඊ - අනුවාදයක් ලෙස 2024 අගෝස්තු මස සිට සෑම මසකම පළමු සතිය තුළ අදාළ ඊ - පවුත් පත්‍රිකාව SLIDA වෙබ් පිටුවේ පළ කෙරේ.

- **Faculty Knack Workshop**

SLIDA අධ්‍යනෙන්ද්‍රිය සහ කළමනාකරණය කාර්ය මණ්ඩලය සඳහා පර්යේෂණ කුසලතා වැඩමුළු මාලාවක් 2024 සැප්තැම්බර් 05 වන දින ආරම්භ කරන ලදී.

- **මධ්‍යගත අධ්‍යයන කළමනාකරණ පද්ධතිය (CAMS) හඳුන්වා දීම - අදියර 01**

සියලුම SLIDA වැඩසටහන් ඵලදායි හා කාර්යක්ෂව ලෙස කළමනාකරණය කිරීමට යාන්ත්‍රණයක් සැපයීම සඳහා නිර්මාණය කර ඇති වෙබ් පාදක අධ්‍යයන කළමනාකරණ පද්ධතියකි.

- **මධ්‍යගත විභාග කළමනාකරණ පද්ධතිය (CEMS)**

විභාග අපේක්ෂකයින්ට සහ පරිපාලන කාර්ය මණ්ඩලයට වඩාත් සුමට අත්දැකීමක් ලබා දෙමින් SLIDA හා විභාග ක්‍රියා පටිපටිවලට අදාළ සියලුම කාර්යයන් හැසිරවීම හා සංවේදී තොරතුරු ආරක්ෂා කරමින් බලයලත් පුද්ගලයන්ට පමණක් දත්ත පරීක්ෂා කිරීමට හෝ සංස්කරණය කිරීමට හැකි බව සහතික කිරීම සඳහා දත්ත ප්‍රවේශ පාලන යාන්ත්‍රණයන්ගෙන් මෙම පද්ධතිය සමන්විත වේ.

- **ද්වීතියික මට්ටමේ නිලධාරීන් සඳහා දැනුම වැඩිදියුණු කිරීමේ වැඩසටහන (KEASO)**

රාජ්‍ය අංශයේ ද්වීතියික මට්ටමේ නිලධාරීන් (සංවර්ධන නිලධාරීන්/කළමනාකරණ සේවා නිලධාරීන්) දැනුම හා කුසලතා ඉහළ නැංවීම සඳහා මෙම වැඩසටහන 2024 අගෝස්තු මාසයේදී ආරම්භ කරන ලදී. මේ යටතේ විෂය කාණ්ඩ 03 ක් යටතේ වැඩසටහන් 06 ක් පැවැත්වීමට සැලසුම් කර ඇත.

- **භාෂා වැඩසටහන්**

_ මේ යටතේ ප්‍රධාන වශයෙන් සන්ධාන භාෂාව (ඉංග්‍රීසි) පිළිබඳ වැඩසටහන් 04 ක් පවත්වනු ලබන අතර, වෘත්තීය ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාවේ පළමු හා දෙවන කණ්ඩායම් සඳහා පිළිවෙලින් නිලධාරීන් 43 හා 115 ක් ලියාපදිංචි වී ඇත.

_ මීට අමතරව රාජ්‍ය ආයතන 03 ක් සඳහා ඉංග්‍රීසි භාෂාව හා සම්බන්ධ පුහුණු උපදේශන වැඩසටහන් 03 ක් පවත්වා අවසන් කර ඇත.

_ Speech Craft වැඩසටහනෙහි (Toastmasters) එක් අදියරයක් පවත්වා අවසන් කර ඇත.

**8.2 වගුව - 2024 වර්ෂයේ ක්‍රියාත්මක කළ පුහුණු වැඩසටහන්**

| වැඩසටහන | පවත්වන ලද ගණන | පුහුණු වූ නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|---|
| සේවාරම්භක පුහුණු | 09 | 540 |
| ධාරිතා සංවර්ධන | 26 | 1,052 |
| ඩිප්ලෝමා | 02 | 80 |
| අභිරුචිගත ඉගෙනුම් හා සංවර්ධන වැඩසටහන් | 32 | 1,267 |

**2025 වර්ෂයේදී සිදු කිරීමට සැලසුම් කර ඇති විශේෂිත ක්‍රියාකාරකම්**

_ SLIDA Research Symposium (Jan 2025)

පර්යේෂණ සඳහා දැඩි උනන්දුවක් දක්වන රාජ්‍ය අංශයේ නිලධාරීන් සඳහා 2025 ජනවාරි මාසයේදී පර්යේෂණ සම්මන්ත්‍රණයක් (SLIDA Research Symposium) පැවැත්වීමට සැලසුම් කර ඇත.

_ Government Idea Contest (GIC) (Feb 2025)

2025 වර්ෂයේ සිට වාර්ෂිකව ක්‍රියාත්මක කිරීමට යෝජිත මෙම තරගාවලිය ඵලදායි රාජ්‍ය සේවයක් බිහි කිරීමට රජයේ නිලධාරීන්ගේ සංකල්ප හා අදහස් ලබා ගැනීමට සංවිධානය කරයි.

_ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ නිලධාරීන්ගේ ඉංග්‍රීසි භාෂා දැනුම වැඩි දියුණු කිරීමේ අරමුණින් වෘත්තීය සන්නිවේදනය පිළිබඳ ඩිප්ලෝමාව Diploma in Professional Communication (DPC) 2025 වර්ෂයේදී ආරම්භ කිරීමට සැලසුම් කර ඇත.

**8.3 වගුව - 2025 වර්ෂයේ මුල් භාගය තුළ පැවැත්වීමට නියමිත විභාග**

| විභාගය | අපේක්ෂකයින් සංඛ්‍යාව |
|---|---|
| ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය සඳහා බඳවා ගැනීමේ තරග විභාගය | 1000 (ආසන්න වශයෙන්) |
| නීති කෙටුම්පත් සම්පාදක දෙපාරතමේන්තුවේ සංස්කාරක III ශ්‍රේණියේ සහ ලේඛන සහකාර III ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීමේ තරග විභාගය | 500 (ආසන්න වශයෙන්) |
| රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර/කාර්යාලගත නිලධාරී බණ්ඩ -2 හි II පන්තියේ II ශ්‍රේණියේ තක්සේරුකරු තනතුරට බඳවා ගැනීම සඳහා වන විවෘත තරඟ විභාගය | 500 (ආසන්න වශයෙන් |
| කළමනාකරණ සේවයේ I වන හා II වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 3000 (ආසන්න වශයෙන් |
| දුම්රිය අධීක්ෂණ කළමනාකරණ/ මෙහෙයුම් කළමනාකරණ සේවයේ දුම්රිය එන්ජින් රියදුරු III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය | 58 |
| කළමනාකරණ සහකාර (තාක්ෂණ නොවන) MA 1-2 පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීමට අදාළ ලිඛිත පරීක්ෂණය | 111 |
| ස්වදේශ කටයුතු අංශයේ තාක්ෂණ සහකාර තනතුර සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 69 |
| ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ (දෙපාර්තමේන්තුගත) තනතුරට බඳවා ගැනීමේ තරඟ විභාගය | 120 |

## 9. මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව

රජයට මානව සම්පත් සංවර්ධනය උදෙසා ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශකත්වය ලබා දීමට සුදුසු ආයතනික රාමුවක් බිහිකිරීමයි. මානව සම්පත් සංවර්ධන ප්‍රතිපත්ති ක්‍රියාවලි සැලසුම, ප්‍රතිපත්ති සමාලෝචනය හා මානව සම්පත් සංවර්ධනය කිරීමත් යනාදී අංශ සඳහා මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව වගකීම් දරයි.

**2024 වසරේ සුවිශේෂී කාර්යය සාධනය**

- **මානව සම්පත් සංවර්ධන ප්‍රතිපත්තිය සකස් කිරීම**

ජාතික මානව සම්පත් සංවර්ධන ප්‍රතිපත්තිය ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව සමග සමපාත වන සේ සකස් කරන ලද අතර, එය 2024 අගෝස්තු 15 වැනි දින පැවති සත්‍යාපන (Validation) වැඩමුළුවේදී ඉදිරිපත් කරන ලදී. එම වැඩමුළුවේදී ප්‍රතිපත්තියේ එක් එක් අංශ සඳහා විශේෂිත කමිටු පිහිටුවීමට තීරණය කරන ලදී. ඒ අනුව, වෘත්තීය පුහුණු අංශයට අදාළ ප්‍රතිපත්තීන් පරීක්ෂා කිරීම සඳහා ආරම්භක රැස්වීම පැවැත්විණි.

- **(BIMSTEC) කලාපීය රටවල් සඳහා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම**

- ඉන්දියාව, භූතානය, බංග්ලාදේශය, මියන්මාරය, තායිලන්තය, නේපාලය සහ ශ්‍රී ලංකාව ඇතුළත් බහු-ආංශික තාක්ෂණික සහ ආර්ථික සහයෝගීතා (BIMSTEC) කලාපය සඳහා බෙංගාල බොක්ක ප්‍රවේශය තුළ, මානව සම්පත් සංවර්ධන (HRD) අංශයේ කේන්ද්‍රස්ථානය ලෙස කටයුතු කරන අතරම, එහි සාමාජිකයින් ලෙස බිම්ස්ටෙක් කලාපය සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කිරීමේ වගකීම මානව සම්පත් සංවර්ධන කවුන්සිලය (NHRDC) වෙත පවරා ඇත.

- මානව සම්පත් සංවර්ධනය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම (HRD) සකස් කර ඇති අතර, සියලුම සාමාජික රටවලින් අනුමැතිය ලබාගෙන ඇත.

- 2024 අගෝස්තු 21 සහ 22 යන දිනවල පැවති එක් එක් සාමාජික රටවලින් නියෝජිතයින් සමග පළමු විශේෂඥ කණ්ඩායමේ ක්‍රියාකාරී සැලැස්ම සාර්ථකව අවසන් කර ඇත. ඒ අනුව 2024 – 2029 කාල සීමාව සඳහා මානව සම්පත් සංවර්ධන ක්‍රියාත්මක සැලැස්මේ කෙටුම්පත සම්පූර්ණ කර විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා BIMSTEC ලේකම් කාර්යාලයට ඉදිරි කටයුතු සඳහා යොමු කරන ලද අතර, මේ වන විට ඒ සඳහා භූතානයේ අනුමැතිය ලැබී ඇත.





**මානව සම්පත් සංවර්ධන ප්‍රතිපත්තිය සත්‍යාපන වැඩමුළු**

**2024 වසර තුළදී අත්පත්කර ගත් ඉලක්කයන්**

- 13 වසරක අඛණ්ඩ අධ්‍යාපනයේ ඵලදායිතාවය මැන බැලීමේ අධ්‍යයනය අවසන් කොට වාර්තාව පිළියෙල කොට ඇත.
- TEVT පාඨමාලා හැදෑරූ සිසුන්ගේ රැකියා ගතවීම පිළිබඳ ඵයා අධ්‍යයනය අවසන් කොට ඇත.
- ශ්‍රම වෙළඳපළ ප්‍රවණතා පිළිබඳ අධ්‍යයනය අවසන් කොට ඇත.
- 2024 වර්ෂය සඳහා සංඛ්‍යාන අත්පොත පිළියෙල කොට ඇත.
- 2024 වර්ෂය සඳහා මානව ප්‍රාග්ධන සඟරාව NHRDC වෙබ් අඩවියෙහි පළකර ඇත.

**ආයතනයේ කාර්යයන් ඵලදායිව සිදු කර ගැනීම සඳහා යොදාගන්නා ලද ක්‍රියා මාර්ග**

- බාහිර සම්පත් දායකයන්ගේ ස්වේච්ඡා සහාය ලබා ගැනීම
- විවිධ පාර්ශවකරුවන් සමග “ Zoom” තාක්ෂණය ඔස්සේ සාකච්ඡා පැවැත්වීම
- ඊමේල් මගින් ලිපි ගනුදෙනු කිරීම මගින් කාර්යක්ෂමතාවය වැඩි කිරීම සහ පිරිවැය අවම කිරීම

**2025 වසර තුළදී සිදු කිරීමට නියමිත කාර්යයන්**

- ජාතික මානව සම්පත් සංවර්ධන ප්‍රතිපත්තිය අංශ අනුව සමාලෝචනය කිරීම හා යාවත්කාලීන කිරීම
- “බිම්ස්ටෙක්” මානව සම්පත් සංවර්ධන (HRD) ක්ෂේත්‍රයේ කේන්ද්‍රස්ථානය ලෙස කටයුතු කිරීම හා අදාළ සියලු ක්‍රියාකාරකම් සහ කටයුතුවලදී ශ්‍රී ලංකාව නියෝජනය කිරීම
- ශ්‍රම වෙළඳපොළ ප්‍රවණතා පිළිබඳ අධ්‍යයනය (ඇඟළුම් ක්ෂේත්‍රය)
- ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකාය තුළ අවධානමට ලක්විය හැකි කණ්ඩායම් මුහුණ දෙන ගැටලු අභියෝග සහ රටේ ශ්‍රම බලකායේ දායකත්වය සඳහා එහි බලපෑම්. (මත්ද්‍රව්‍ය භාවිතා කරන තරුණ කණ්ඩායම් ආශ්‍රයෙන්)
- තෘතියික අධ්‍යාපන හා වෘත්තීය පුහුණු (TEVT) ක්ෂේත්‍රයේ මානව සම්පත් අභියෝග අධ්‍යයනය (කථිකාචාර්යවරුන් සහ උපදේශකයින් කෙරෙහි අවධානය යොමු කිරීම)
- තාක්ෂණ විෂය ධාරාවේ උපාධිධාරීන් සහ ශ්‍රී ලංකාවේ රැකියා සඳහා ඇති බාධක පිළිබඳ අධ්‍යයනය
- දිස්ත්‍රික් මට්ටමින් සිදු කරන “රැකියා පොළ” සඳහා පහසුකම් සැලසීම
- මානව සම්පත් සංවර්ධනයට අදාළ කරගත හැකි තොරතුරු ඇතුළත් දත්ත බැංකුවක් පවත්වාගෙන යාම

- 2025 වර්ෂය සඳහා මානව ප්‍රාග්ධන 2025 වර්ෂය සඳහා මානව ප්‍රාග්ධන සහරාව පිළියෙල කිරීම

- 2025 වර්ෂය සඳහා සංඛ්‍යාන අත්පොත පිළියෙල කිරීම

- මූල්‍ය ප්‍රගතිය

**වගුව 9.1 - මූල්‍ය ක්‍රියාකාරීත්වය - 2024**

| විස්තරය | 2024 අයවැය රු.මි. | වියදම රු.මි. |
|---|---|---|
| පුනරාවර්තන වියදම් | 27.50 | 27.19 |
| ප්‍රාග්ධන වියදම් | 9.50 | 5.12 |
| **එකතුව** | **37.00** | **32.31** |

## 10. Distance Learning Center

**මූල්‍ය ප්‍රගතිය**

**10.1 වගුව - 2024.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය**

| ප්‍රධාන ක්‍රියාකාරකම | **2024** වර්ෂය තුළ අපේක්ෂිත ඉලක්කය (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය | |
|---|---|---|---|
| | | ලංසු කරගත් ප්‍රගතිය (රු.මි.) | ප්‍රතිශතය (%) |
| මුහුණට මුහුණ පුහුණු වැඩසටහන් | 3.6 | 6.2 | 172% |
| පරිගණකගත පුහුණු | 1.8 | 1.79 | 100% |
| පරිගණකගත (කුලී පදනම මත) | 2.4 | 2.22 | 92% |
| මාර්ගගත විභාග | 10.9 | 17.82 | 163% |
| මාර්ගගත වැඩසටහන් | 7.2 | 2.03 | 28% |
| ප්‍රාදේශීය මධ්‍යස්ථාන (RCs) | 29.7 | 4.11 | 14% |
| හවුල්කාරීත්ව වැඩසටහන් | | 7.34 | - |
| **මුළු ආදායම** | **55.6** | **41.5** | **75%** |

**2024 වර්ෂයේ ක්‍රියාත්මක වැඩසටහන්වල ප්‍රගතිය**

**10 .2 වගුව - 2024.12.31 දිනට ක්‍රියාත්මක වැඩසටහන්වල ප්‍රගතිය**

| අනු අංකය | වැඩසටහන | ක්‍රියාත්මක කළ වැඩසටහන් සංඛ්‍යාව | සහභාගි වූ ගණන |
|---|---|---|---|
| 01 | දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් | 43 | 1197 |
| 02 | මාර්ගගත විභාග පැවැත්වීම/ පරිගණක ගත විභාග පැවැත්වීම සඳහා පහසුකම් සැපයීම | 44 | 3712 |
| 03 | පරිගණක විද්‍යාගාර හා ශ්‍රවනාගාරය කුලී පදනම මත ලබා දීම | 13 | 416 |
| 04 | මාර්ගගත හා මාර්ගගත නොවන කෙටි කාලීන/දිගු කාලීන වෘත්තීය පාඨමාලා පැවැත්වීම | 03 | 118 |
| 05 | පෞද්ගලික - රාජ්‍ය හවුල්කාරීත්ව බැඳීම් සිදු කිරීම | 12 | 5526 |




කර්මාන්ත අමාත්‍යාංශයේ විද්‍යා ඒකකයට අනුයුක්ත නිලධාරීන් සඳහා කාර්යාල පද්ධති හා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නීති පිළිබඳව ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම

**2025 වර්ෂයේ ඉටු කිරීමට අපේක්ෂිත කාර්යයන්**

ශ්‍රී ලංකාවේ භූගෝලීය වශයෙන් විහිද ඇති කලාපයන් හරහා විසිර සිටිනා ඉගෙනුම්කරුවන්ගේ විවිධ අවශ්‍යතාවන්ට සරිලන පරිද්දෙන් 2025 වසර තුළ කලාපීය හවුල්කාරීත්ව මාදිලිය (කලාප මධ්‍යස්ථානය) හරහා සිය සේවාවන් පුලුල් කිරීමට දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථාන සමාගම සැලසුම් කර ඇත. 2025 වර්ෂයේදී උසස් ඩිප්ලෝමා පාඨමාලා 06 ක් හා ඩිප්ලෝමා පාඨමාලා 01 ක් පැවැත්වීමට කටයුතු යොදා ඇත.

# ස්වදේශ කටයුතු අංශය

# පටුන

**පිටු අංක**

**පළමු පරිච්ඡේදය**


01. හැඳින්වීම ...01
1.1. සමස්ත මූල්‍ය ප්‍රගතිය 2024 (130 වැය ශීර්ෂය- 2024.01.01 සිට 2024.12.31 දක්වා) ...02
1.2. විස්තරාත්මක මූල්‍ය ප්‍රගතිය ...03
1.2.1. ස්වදේශ කටයුතු ...04
1.2.2. ස්වදේශ කටයුතු-සංවර්ධන වැඩසටහන් ...05


**දෙවන පරිච්ඡේදය**


02. අභ්‍යන්තර අංශ වල ක්‍රියාකාරකම්හි සමස්ත ප්‍රගතිය ...06
2.1. පාලන අංශය ...06
2.5. ස්වදේශ කටයුතු අංශය ...10
2.5.1. දිස්ත්‍රික් පාලන අංශය ...10
2.5.2. ප්‍රාදේශීය පාලන අංශය ...11
2.5.3. ග්‍රාම නිලධාරි පාලන අංශය ...12
2.2. සංවර්ධන අංශය ...15
2.3. මූල්‍ය අංශය ...20
2.4. විමර්ශන අංශය ...23
2.6. අභ්‍යන්තර විගණන අංශය ...26
2.7. ඉංජිනේරු අංශය ...27
2.8. ක්‍රමසම්පාදන අංශය ...30
2.9. ප්‍රාදේශීය පරිපාලන ප්‍රතිසංස්කරණ අංශය ...31


**තෙවන පරිච්ඡේදය**


03. දිස්ත්‍රික් මට්ටමේ සමස්ත විස්තරාත්මක ප්‍රගති සාරාංශය ...35
3.1. කොළඹ දිස්ත්‍රික්කය ...35
3.2. ගම්පහ දිස්ත්‍රික්කය ...41
3.3. කළුතර දිස්ත්‍රික්කය ...42
3.4. මහනුවර දිස්ත්‍රික්කය ...45
3.5. මාතලේ දිස්ත්‍රික්කය ...48
3.6. නුවරඑළිය දිස්ත්‍රික්කය ...52
3.7. ගාල්ල දිස්ත්‍රික්කය ...54
3.8. මාතර දිස්ත්‍රික්කය ...56
3.9. හම්බන්තොට දිස්ත්‍රික්ක ...59
3.10. යාපනය දිස්ත්‍රික්කය ...62
3.11. මන්නාරම දිස්ත්‍රික්කය ...65
3.12. වවුනියාව දිස්ත්‍රික්කය ...69
3.13. මුලතිව් දිස්ත්‍රික්කය ...72
3.14. කිලිනොච්චි දිස්ත්‍රික්කය ...74
3.15. මඩකලපුව දිස්ත්‍රික්කය ...76
3.16. අම්පාර දිස්ත්‍රික්කය ...80
3.17. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය ...84

3.18. කුරුණෑගල දිස්ත්‍රික්කය……………………………………………………………….........87
3.19. පුත්තලම දිස්ත්‍රික්කය……………………………………………………………..…….......91
3.20. අනුරාධපුර දිස්ත්‍රික්කය...........................................................................................................94
3.21. පොළොන්නරුව දිස්ත්‍රික්කය.........................................................................................................97
3.22. බදුල්ල දිස්ත්‍රික්කය.........................................................................................................100
3.23. මොණරාගල දිස්ත්‍රික්කය.........................................................................................................103
3.24. රත්නපුර දිස්ත්‍රික්කය.........................................................................................................106
3.25. කෑගල්ල දිස්ත්‍රික්කය.........................................................................................................110

**හතරවන පරිච්ඡේදය**

4. රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව - පටුන.........................................................................113

**රූප සටහන් නාමාවලිය**

1.1. ස්වදේශ කටයුතු අංශයේ අභ්‍යන්තර අංශ සංයුතිය ...........................................................................01
1.2. සමස්ත ප්‍රාග්ධන වියදම් හා පුනරාවර්තන වියදම්.....................................................................02
2.1. ආදායම් වාර්තාව සංචාරක බංගලා ( 2024.01.01 සිට 2024.12.31 දක්වා).. .......................................09
2.2. එක් එක් සංචාරක බංගලා උපයා ඇති ආදායම ( 2024.01.01 සිට 2024.12.31 දක්වා).........................09
2.3. පුනරාවර්තන වියදම්. .........................................................................................................21
2.4. ප්‍රාග්ධන වියදම් ………………………………………………………………….....……........21
2.5. ක්‍රියාත්මක ප්‍රාග්ධන අරමුදල් වියදම්.........................................................................................22

**වගු නාමාවලිය**

1.1. සමස්ත මූල්‍ය ප්‍රගති සාරාංශය .........................................................................................02
1.2. සමස්ත ප්‍රාග්ධන වියදම් විශ්ලේෂණය .........................................................................................02
1.3. සමස්ත පුනරාවර්තන වියදම් විශ්ලේෂණය.........................................................................................03
1.4. ප්‍රාග්ධන වෙන්කිරීම (130-01 16 ). .........................................................................................03
1.5. පුනරාවර්තන වෙන්කිරීම ( 130-01-16 )..........................................................................................04
| වත්කම් කළමනාකරණය සහ භාණ්ඩ සමීක්ෂණ කටයුතු නියමිත දිනට කාර්යක්ෂමව සිදු කිරීම | |
| ඵලදායී හා කාර්යක්ෂම මූල්‍ය වාර්තාකරණ පද්ධතියක් පවත්වාගෙන යාම | |

**vi. ක්‍රියාත්මක ප්‍රාග්ධන අරමුදල් ව්‍යාපෘතිවල ප්‍රගතිය**

වගුව **2.17 :** මූල්‍ය අංශය - අමාත්‍යාංශයේ සියලු ප්‍රාග්ධන ව්‍යාපෘතිවල අයවැය අරමුදල් උපයෝගීතාවය

| ව්‍යාපෘතිය | අයවැය ඇස්තමේන්තුව (රු.මි.) | මුළු වියදම (රු.මි.) | වියදම්වල ප්‍රගතිය ලෙස % |
|---|---|---|---|
| 130-01-16 | 140 | 124.43 | 89% |
| 130-02-20 | 1,215 | 117.42 | 10% |
| මුළු එකතුව | **1,355** | **241.85** | **17%** |

රූප සටහන **2.5 :** ක්‍රියාත්මක ප්‍රාග්ධන අරමුදල් වියදම්



## 2.5. විමර්ශන අංශය

### i. විෂය පථය හා ක්‍රියාකාරීත්වය

රාජ්‍ය සේවයේ යහපාලනය උදෙසා අවශ්‍ය ගුණාංගයන්ගෙන් යුක්ත දිස්ත්‍රික් හා ප්‍රාදේශීය පාලන ව්‍යුහයන් පවත්වාගෙන යාම සහතික කරනු වස් දූෂණය සහ අක්‍රමිකතාවයන්ට එරෙහිව කටයුතු කිරීම, උපදෙස් ලබා දීම, යෝජනා ඉදිරිපත් කිරීම හා මෙහෙයවීම.

- 1905 මහජන පැමිණිලි ඒකකය හරහා ලැබෙන මහජන පැමිණිලි සඳහා දිස්ත්‍රික් ලේකම්/ප්‍රාදේශීය ලේකම් මගින් වාර්තා කැඳවා ගැටලු නිරාකරණට කටයුතු කිරීම.
- කිසියම් නිලධාරියකු අකටයුත්තක් සිදු කර ඇත්නම් මූලික විමර්ශන පැවැත්වීම.
- විධිමත් විනය පරීක්ෂණ සඳහා විමර්ශන නිලධාරීන් යොමු කිරීම.
- විධිමත් විනය පරීක්ෂණ සඳහා සාක්ෂි ලබාදීමට විමර්ශන නිලධාරීන් යොමු කිරීම.
- කාර්යාල පරීක්ෂණ පැවැත්වීම සහ අධීක්ෂණය. (අමාත්‍යාංශයේ විෂය පථයට අයත් ආයතන)
- චෝදනා වලින් තොරව, කාර්යක්ෂමව රාජකාරි කටයුතු සිදු කිරීම පිළිබඳව දිස්ත්‍රික් මට්ටමින් " Road Map for Better Service Delivery" නමින් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

### ii. විශේෂ ළඟා කර ගැනීම්

- මහජන පැමිණිලි කළමනාකරණය කිරීම සඳහා 1905 මහජන පැමිණිලි ඒකකයක් හඳුන්වා දීම.
- විමර්ශන අංශයේ දෛනික තැපැල දත්ත පද්ධතියට ඇතුළත් කිරීම.
- අංශය තුළ විමර්ශන තොරතුරු එක්රැස් කිරීම සඳහා විධිමත් පරිගණක දත්ත පද්ධතියක් නඩත්තුකර පවත්වාගෙන යාම.
- අංශය තුළ සුබ සාධක සංගමයක් පිහිටුවා ගැනීම තුළින් නිලධාරින්ගේ උපන්දින, අවමංගල කටයුතු, විනෝද චාරිකා ආදි වැඩකටයුතුවලට ශක්තියක් වීම.
- ඵලදායීතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මඟින් අංශයේ වැඩකටයුතු පහසුකර ගැනීමට කටයුතු කිරීම.
- අංශයේ ලේඛන ගොනු සම්බන්ධයෙන් ලේඛනාගාරයක් නඩත්තු කිරීම.
- අංශයේ නිලධාරීන්ගේ දැනුම, මානසික සුවය වැඩිදියුණුව උදෙසා පුස්තකාලයක් පවත්වාගෙන යාම.
- ප්‍රථමාධාර ඒකකයක් අංශය තුළ පවත්වාගෙන යාම.

### iv. අභියෝග

- අංශයේ නිලධාරීන් සැලකියයුතු සංඛ්‍යාවක් දේශීය හා විදේශීය නිවාඩු ලබාගෙන ඇති බැවින් විමර්ශන නිලධාරීන්ගේ පවතින හිඟය.
- දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන්හි පිහිටුවා ඇති විමර්ශන ඒකකවල කටයුතු අක්‍රියවීම නිසා සෘජුවම අමාත්‍යාංශයට ලැබෙන පැමිණිලි සංඛ්‍යාව ඉහළ යාම.
- විමර්ශන කටයුතු සිදුකිරීමේදී නිලධාරීන්ගේ පෞද්ගලික ආරක්ෂාවට අභියෝග එල්ලවීම.
- අනෙකුත් රාජ්‍ය ආයතනයන්ගෙන් තොරතුරු ලබා ගැනීමේදී ඇතිවන බාධා.
  - උදා: ශ්‍රී ලංකා පොලීසිය, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසන් සභාව
- දෙමළ මාධ්‍ය පැමිණිලි සම්බන්ධව කටයුතු කිරීමේදී භාෂා පරිවර්තනයෙහි ගැටලු පැන නැගීම.
- විමර්ශන රාජකාරි සඳහා දුරබැහැර දිස්ත්‍රික්කවලට යාම සඳහා අවශ්‍ය ප්‍රවාහන පහසුකම් ප්‍රමාණවත් පරිදි නොලැබීම.
- අනෙකුත් අංශවලට සාපේක්ෂව විමර්ශන අංශය තුළ දෛනිකව ඉතා විශාල වශයෙන් ලිපි ලේඛන ආශ්‍රිතව රාජකාරි කටයුතු සිදු කරයි. එහිදී, විමර්ශන වාර්තාවල ඡායා පිටපත් සහ මෘදු පිටපත් ලබා ගැනීමට සිදුවන බැවින් අංශය තුළ පවතින මුද්‍රණ යන්ත්‍ර සහ ඡායා පිටපත් යන්ත්‍ර නිරන්තරයෙන් භාවිතා කිරීමට සිදු වේ. නමුත් දැනට එම යන්ත්‍ර සඳහා අවශ්‍ය ටෝනර් පහසුකම් නොමැති වීම නිසා අංශයේ දෛනික රාජකාරි වලට බාධා එල්ල වී ඇත.

**v. අනාගත ඉලක්ක**

- මානව හා භෞතික සම්පත් පුළුල් කිරීම.
- නිලධාරීන්ගේ සේවා තෘප්තිය නංවාලීම සඳහා කටයුතු කිරීම.
- කාර්යාල පරීක්ෂණ පුළුල් කිරීම.
- දිස්ත්‍රික් විමර්ශන ඒකක ශක්තිමත් කිරීම.
- සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම අඛණ්ඩ ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා ඔවුන් සඳහා අදාලවන උසස් අධ්‍යාපන අවස්ථා ලබා දීම.
- පැමිණිල්ල මෙහෙයවීම හා සාක්ෂි ලබාදීමේ කටයුතුවල තත්ත්වයන් ඉහළ නැංවීමට වැඩපිළිවෙලක් සැකසීම.
- දිස්ත්‍රික් හා ප්‍රාදේශීය පාලන ව්‍යුහයට අයත් රාජ්‍ය ආයතනවල වංචා හා දූෂණ වැළැක්වීමේ යාන්ත්‍රණයක් හඳුන්වාදීම.
- දුරකථන මගින් ඉදිරිපත්වන මහජන පැමිණිලි සහ සෙසු පැමිණිලි සඳහා පසුවිපරම් ක්‍රියාවලියක් හඳුන්වාදීම.

**වගුව 2.18 : විමර්ශන අංශය - අපේක්ෂිත අයවැය යෝජනා 2025 (සාරාංශය)**

| # | ව්‍යාපෘතියේ නම | ඇස්තමේන්තුගත මුළු පිරිවැය (රු.මි.) | 2025 අයවැයෙන් අපේක්ෂිත වෙන් කිරීම් (රු.මි.) |
|---|---|---|---|
| 01. | විමර්ශන අංශයේ නිලධාරීන් සඳහා සැලසුම් කිරීමට නියමිත පුහුණු | 01 | 01 |
| 02. | දිස්ත්‍රික් මට්ටමින් ප්‍රාදේශීය පරිපාලනයේ රාජකාරියේ නියුතු මාණ්ඩලික නිලධාරීන් දැනුවත් කිරීම සඳහා වන පුහුණු වැඩමුළුව (" Road Map for Better Service Delivery") | 02 | 02 |
| 03. | චෝදනා වලට ලක්වන නිලධාරීන් සම්බන්ධව අධ්‍යයන පර්යේෂණයන් සිදු කිරීම | 01 | 01 |
| 04. | කාර්යාල පරීක්ෂණ රාජකාරී | 01 | 01 |
| 05. | සේවා ස්ථානයෙන් පිටත විමර්ශන නිලධාරීන් සඳහා සිදු කරනු ලබන පුහුණු (Out Bound Training for Investigation Officers) | 1.5 | 1.5 |
| 06. | Lap Top පරිගණක ලබාගැනීම. | 04 | 04 |
| 07. | විමර්ශන නිලධාරීන් සඳහා ගමන් මළු ( Bags) ලබාදීම | 01 | 01 |
| | **මුළු එකතුව** | **11.5** | **11.5** |

**vii. අංශයේ ප්‍රගතිය**

**වගුව 2.19 : විමර්ශන අංශයේ සාමාන්‍ය කාර්යයන්ගේ ප්‍රගතිය ( 2024.01.01 සිට 2024.12.31)**

| # | මූලික ක්‍රියාකාරකම් | ප්‍රගතිය | විස්තරය |
|---|---|---|---|
| 01. | ලැබී ඇති මහජන පැමිණිලි ප්‍රමාණය. (තැපැල,විද්‍යුත් තැපැල,ෆැක්ස්, 1905 දුරකථන පැමිණිලි මගින්) | 484 | 2024/01/01 සිට 2024/12/31 දක්වා |
| 02. | නිරාකරණය කරන ලද පැමිණිලි ප්‍රමාණය.<br>**i. මූලික විමර්ශන මගින්**<br>• අවසන් කරන ලද ගණන - 28<br>• අවලංගු කරන ලද ගණන - 02<br>• වෙනත් අංශ වලට යොමු කළ ගණන - 02<br>• ආරම්භ කර පවත්වා ගෙන, වාර්තා සකස් කර පවතින, වාර්තා සම්බන්ධයෙන් තීරණ ලබා දිය යුතු විමර්ශන ගණන - 79<br>• ආරම්භ කර නොමැති විමර්ශන ගණන - 23 | 49 | 2024/01/01 සිට 2024/12/31 දක්වා |

| # | මූලික ක්‍රියාකාරකම් | ප්‍රගතිය | විස්තරය |
|---|---|---|---|
| | **ii. කාරණා ගොනු මඟින්**<br>• අවලංගු කරන ලද ගණන - 05<br>• වෙනත් අංශ වලට යොමු කළ ගණන - 03<br>• ප්‍රාදේශීය ලේකම් හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙතින් වාර්තා කැඳවන ලද ගණන -109<br>• අවසන් කරන ලද ගණන - 90 | 207 | |
| | **iii. 1905 මහජන පැමිණිලි ඒකකය මඟින්**<br>• ක්‍රියාත්මක තත්ත්වයේ පවතින - 30<br>• අවසන් කරන ලද - 105 | 135 | |
| 03. | නිකුත් කළ චෝදනා පත්‍ර ගණන | 35 | 2024/01/01 සිට 2024/12/31 දක්වා |
| 04. | "Road Map for Better Service Delivery" දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම. | 07 | 2024/01/01 සිට 2024/12/31 දක්වා |
| 05. | කාර්යාල පරීක්ෂණ පැවැත්වීම | 03 | 2024/01/01 සිට 2024/12/31 දක්වා |

## 2.6. අභ්‍යන්තර විගණන අංශය

### i. විෂය පථය හා ක්‍රියාකාරීත්වය

ජාතික විගණන පනතේ 40 වගන්තිය පරිදි පිහිටුවා ඇති රාජ්‍ය පරිපාලන , ස්වදේශ කටයුතු , පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය, ප්‍රධාන අභ්‍යන්තර විගණක යටතේ පාලනය වන අතර ජාතික විගණකාධිපතිගේ 40(3) වගන්තිය, අංක DMA/01/2019 කළමනාකරණ විගණන චක්‍රලේඛ වගන්තිය හා මු.රෙ. 134 (1) අනුව ප්‍රධාන අභ්‍යන්තර විගණක සෘජුවම ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වශයෙන් අමාත්‍යාංශ ලේකම්වරයාට වාර්තා කිරීමේ වගකීම දරණ අතර අංක DMA/01/2019 කළමනාකරණ විගණන චක්‍රලේඛයේ (03) ඡේදය අනුව අංශයේ සියලු මූල්‍ය හා පාලන බලතල අමාත්‍යාංශ ලේකම්වරයාගේ සාජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මකවේ.

- වාර්ෂික විගණන සැලැස්ම පරිදි අභ්‍යන්තර විගණන සිදු කර අනාවරණය කරගත් අඩුපාඩු හා නිර්දේශ සාකච්ඡා කිරීමේ යාන්ත්‍රණයක් ලෙස කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක DMA/01/2019 ඡේද අංක 5.3 හි උපදෙස් පරිදි විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් පැවැත්වීම.
- කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක DMA/01/2019 ඡේද අංක 5.3 හි උපදෙස් පරිදි දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 හා රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව තුල කාර්තුගතව පැවැත්වෙන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 104 කට සමාජික ලෙස සහභාගී වීම.
- තෝරාගත් දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා අමාත්‍යාංශයේ එක් එක් අංශ වලට අදාලව වන ලෙස මූල්‍ය විගණනය, කාර්යසාධන විගණනය , මුදලට අගය විගණනය, පද්ධති විගණනය ලෙස අභ්‍යන්තර විගණනයන් සිදු කිරීම මඟින් විගණන විමසුම් නිකුත් කිරීම.
- දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 හි ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන්ගේ විගණන වාර්තා පසුවිපරම් සිදු කිරීම තුලින් ශක්තිමත් වූ මූල්‍ය පාලන පද්ධතියක් තහවුරු කිරීම.
- දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන්හි ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන්ගේ කාර්තු වාර්තා පදනම්ව කාර්තුගතව අමාත්‍යාංශ ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ වාර්තා සකස්කර මහා භාණ්ඩාගාරය වෙත යොමු කිරීම.

### ii. විශේෂ ළඟා කර ගැනීම්

- දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 හා රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව තුල කාර්තුගතව පැවැත්වෙන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 104 කට සමාජික ලෙස සහභාගී වීම.

### iv. අභියෝග

- අභ්‍යන්තර විගණන සැලැස්ම සාර්ථකව ඉටුකර ගැනීම.

### v. අනාගත ඉලක්ක

- විගණන විමසුම් වලින් තොර හෝ රාජ්‍ය ගිණුම් කාරක සභාව වෙත යොමුවන විගණන විමසුම් අවම කර ගත් අභ්‍යන්තර පාලනය ඉතා ශක්තිමත් වූ අමාත්‍යාංයක් බවට පත්කිරීම. දුරකථන මඟින් ඉදිරිපත්වන මහජන පැමිණිලි සහ සෙසු පැමිණිලි සඳහා පසුවිපරම් ක්‍රියාවලියක් හඳුන්වාදීම.

## 2.7. ඉංජිනේරු අංශය

### i. විෂය පථය හා ක්‍රියාකාරීත්වය

ඉංජිනේරු අංශයේ ප්‍රධානතම කාර්යයභාරය ලෙස රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ (ස්වදේශ කටයුතු අංශය) ප්‍රතිපාදන යටතේ ඉදිකිරීම් සිදුවන සියලුම දිස්ත්‍රික්කවල ඉදිකිරීම් ව්‍යාපෘති සම්බන්ධ කටයුතු, ප්‍රාදේශීය මට්ටමේ ඉදිකිරීම් අලුත්වැඩියාවන්, වෙනත් රාජ්‍ය ආයතන වලින් ලැබෙන ඉල්ලීම් වලට අදාල ගොඩනැගිලි ඉදිකිරීම් සම්බන්ධ වාස්තු විද්‍යා හා ඉංජිනේරුමය නිර්මාණ කටයුතු කිරීම, ඉදිකිරීම් පරිපාලනය හා එම සියලු ව්‍යාපෘතිවල තාක්ෂණික අධීක්ෂණය හා උපදේශනය සිදු කරනු ලබයි. තවද "නිල මැඳුර" ගොඩනැගිල්ලේ මෙහෙයුම්, නඩත්තු හා අලුත්වැඩියාවන් අධීක්ෂණය සම්බන්ධ කටයුතු සිදු කරනු ලබයි.

- ඉංජිනේරු හා නඩත්තු අංශයේ නිලධාරීන්ගේ රාජකාරී කටයුතු අධීක්ෂණය හා පාලනය
- ස්වදේශ කටයුතු අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ඉදිකිරීම් ව්‍යාපෘති අධීක්ෂණය හා උපදේශනය ලබාදීමට උපදේශන ආයතනයන් සම්බන්ධීකරණය කිරීම
- ස්වදේශ කටයුතු අමාත්‍යාංශය මඟින් ප්‍රතිපාදන වෙන් කරනු ලබන මුළු පිරිවැය ඇස්තමේන්තුව රු.මිලියන 200 ඉක්මවන ඉදිකිරීම් ව්‍යාපෘතිවලට අදාල සැලසුම් ඇස්තමේන්තු හා විචල්‍යතා වාර්තා නිර්දේශ කිරීම
- ප්‍රාදේශීය මට්ටමේ ඉදිකිරීම් අලුත්වැඩියාවන් සිදු කිරීම අධීක්ෂණය
- ඉදිකිරීම් සම්බන්ධ ව්‍යාපෘතිවල ප්‍රගතිය විමසීම
- ප්‍රතිපාදන ප්‍රභවයක් යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ක්‍රියාත්මක කරනු ලබන යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති වලට අදාල තාක්ෂණ සහාය ලබාදීම
- දිස්ත්‍රික් ඉංජිනේරු, තාක්ෂණික නිලධාරී, සහ තාක්ෂණ සහායක නිලධාරීන්ගේ වෘත්තීමය කාර්යභාරය අධීක්ෂණය
- අමාත්‍යාංශ/ දිස්ත්‍රික් ඉංජිනේරුවරුන්ගේ උසස්වීම් හා වරලත් සුදුසුකම් දත්ත ලබා ගැනීමේ කටයුතු සඳහා පහසුකම් සැපයීම සහ තාක්ෂණික කාර්ය මණ්ඩලවල පුහුණු අවශ්‍යතා සපුරාලීමට කටයුතු කිරීම
- ඉදිකිරීම් බෙරුම්කරණ ක්‍රියාවලිය සඳහා අමාත්‍යාංශ ලේකම්වරයාට අවශ්‍ය ඉංජිනේරුමය උපදෙස් ලබා දීම
- අවස්ථානුකූලව විමධ්‍යගත අයවැය සම්බන්ධ ව්‍යාපෘති, වෙනත් අමාත්‍යාංශ සහ රාජ්‍ය නොවන සංවිධාන විසින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති සම්බන්ධ තාක්ෂණික සහ ඉංජිනේරුමය උපදේශන කටයුතු සිදු කිරීම
- ස්වදේශ කටයුතු අංශයට අයත් සියලුම සංචාරක බංගලාවල ඉදිකිරීම් ව්‍යාපෘති හා නඩත්තු කටයුතු ක්‍රියාත්මක කිරීමට අදාල තාක්ෂණික උපදේශනය ලබා දීම
- ‘‘නිල මැඳුර’’ පරිපාලන සංකීර්ණයේ නඩත්තු කටයුතු පරිපාලනය හා තාක්ෂණික උපදේශනය හා ක්‍රියාත්මක කිරීම.

### ii. ප්‍රමුඛ පරාසයන්

- රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ (ස්වදේශ කටයුතු අංශය) ප්‍රතිපාදන වලින් ක්‍රියාත්මක ඉදිකිරීම් ව්‍යාපෘති අධීක්ෂණ කටයුතු කළමනාකරණය
- ප්‍රාදේශීය මට්ටමේ ඉදිකිරීම් අලුත්වැඩියාවන් අධීක්ෂණය කිරීම
- ඉදිකිරීම් සම්බන්ධ ව්‍යාපෘතිවල ප්‍රගති සමාලෝචනය
- ‘‘නිල මැඳුර" ගොඩනැගිල්ලේ මෙහෙයුම්, නඩත්තු හා අලුත්වැඩියාවන් අධීක්ෂණය

### iii.අභියෝග

- සුදුසුකම් සහිත තරඟකාරී උපදේශන ආයතන තෝරා නොගැනීම (මේ හේතුවෙන් අනුමත ප්‍රතිපාදන සීමාව ඉක්මවා වියදම් දැරීම)
- කොන්ත්‍රාත් කාලසීමාව ඉක්මවා ව්‍යාපෘති ඉදිකිරීම් කටයුතු කරගෙන යාම
- ඉදිකිරීම් කළමනාකරණය විෂයය පිළිබඳ ප්‍රවීණයන් නොවන නිලධාරීන් ව්‍යාපෘති පාලනය කිරීම හේතුවෙන් තම අභිමතය පරිදි සිදු කරන බොහෝ ඉදිකිරීම් නිසා ගැටලු ඇතිවීම
- සේවාදායකයාගේ මූලික අවශ්‍යතා නිසි පරිදි හඳුනා නොගැනීම - Conceptualization and

feasibility (මූල්‍ය පිරිවැය අවශ්‍යතා, Cost Benefit Analysis, Return on Investment, Payback Period ආදිය සැලකිය යුතුය.)

- දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල පළමු ශ්‍රේණියේ ඉංජිනේරුවරුන් නොමැතිවීම හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සුදුසුකම් සහිත තාක්ෂණ නිලධාරීන්ගේ හිඟය හේතුවෙන් ප්‍රමාණ පත්‍ර පරීක්ෂා කිරීම, නිර්දේශ කිරීම හා අනුමත කිරීම සඳහා තාක්ෂණ නිලධාරීන් නොමැති වීම
- ඉදිකිරීම් ව්‍යාපෘති සම්බන්ධ කටයුතු සඳහා තාක්ෂණ විමර්ෂණ හා තාක්ෂණ අභ්‍යන්තර විගණන කණ්ඩායම් යොදා නොගැනීම
- කාර්යය මණ්ඩල හිඟකම
- ඉදිකිරීම් කර්මාන්තයේ ද්‍රව්‍ය හිඟය හේතුවෙන් ඉදිකිරීම් කර්මාන්ත ප්‍රගතිය පසුබෑමට ලක්වීම
- ආර්ථික අර්බුදය හමුවේ ඉදිකිරීම් ද්‍රව්‍ය වල මිල උච්ඡාවචනය වීමෙන් ඉදිකිරීම් කර්මාන්තය දැඩි අභියෝගයකට ලක්වීම
- "නිල මැදුර"ගොඩනැගිල්ලෙහි මෙහෙයුම්, නඩත්තු හා අලුත්වැඩියාවන් සිදු කිරීම සඳහා වන විදුලි යාන්ත්‍රික උපකරණ හිඟය සහ මූල්‍ය ප්‍රවාහයක් නොමැතිවීම හා ගෙවීම ප්‍රමාද වීම. ගෙවීම් ප්‍රමාදය නිසා වෙනත් පාර්ශයවයන් සමඟ තිබෙන විශ්වාසය පළුදු වීම
- නිසි අධ්‍යයනයකින් තොරව දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් වසරක් තුළ ව්‍යාපෘති විශාල ප්‍රමාණයක් සිදු කරන බැවින් බොහොමයක් ව්‍යාපෘති අවශ්‍යතාවය, අධ්‍යයනයකින් තොරව ආරම්භ කිරීම
- දේශීය හා විදේශීය පුහුණු වැඩමුළු ලබාදීමේ අවශ්‍යතාව.

iv. **විශේෂ ළඟා කරගැනීම්**

- ඉදිකිරීම් කර්මාන්ත සම්බන්ධයෙන් ඉංජිනේරු අංශයේ කාර්යයභාරය ක්‍රියාවට නැංවීම.
- ඉදිකිරීම් ව්‍යාපෘතීන් කිහිපයක් මෙම වසර තුළ නිම කිරීමට පියවර ගැනීම.
- “නිල මැදුර” ගොඩනැගිල්ලේ මෙහෙයුම්, නඩත්තු හා අලුත්වැඩියාවන් සම්බන්ධව ක්‍රියාකාරීත්වය විධිමත් කිරීමට හැකි වීම තුළින් ගොඩනැගිල්ලේ නඩත්තු කාර්යයන් ක්‍රමවත් පරිදි සිදු කිරීමට හැකි වීම.
- දිස්ත්‍රික් මට්ටමින් ගොඩනැගිලි ඉදිකිරීම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී සලකා බැලිය යුතු ඉදිකිරීම් කළමනාකරණ පියවර සහ ක්‍රියා පටිපාටි හඳුන්වාදීමට හැකිවීම.

**iv.අනාගත ඉලක්ක**

- සේවාදායකයන්ට / භාවිතාකරන්නන්ට සහ මහජනතාවට මනා ලෙස ප්‍රතිචාර දැක්වීමත්, තෘප්තිමත් රාජ්‍ය සේවයක් සැපයීමට ඉඩ සැලසෙන පරිදි කාර්යාල ව්‍යුහය සංවර්ධනය කිරීම.
- සියලුම දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඉදිකිරීම් ව්‍යාපෘති කළමනාකරණ කටයුතු අධීක්ෂණය සහ තාක්ෂණික උපදෙස් ලබා දීම.
- මෙම අමාත්‍යාංශයේ ස්වදේශ කටයුතු අංශයට අයත් සියලුම සංචාරක බංගලාවල ඉදිකිරීම් ව්‍යාපෘති හා නඩත්තු කටයුතු ක්‍රියාත්මක කිරීමට අදාල තාක්ෂණික උපදේශනය ලබා දීම.
- මෙම අමාත්‍යාංශයේ ස්වදේශ කටයුතු අංශය මඟින් ප්‍රතිපාදන වෙන් කරනු ලබන ඉදිකිරීම් ව්‍යාපෘති හා රාජ්‍ය උත්සව සම්බන්ධයෙන් ඉංජිනේරුමය කටයුතු, අනෙක් රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධීකරණ කටයුතු කිරීම
- දිස්ත්‍රික් ඉංජිනේරුවරුන් හා වාස්තු විද්‍යාඥයින් උසස්වීම්, වෘත්තීය සුදුසුකම් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම හා වරලත් තත්ත්වය ලබා ගැනීමේ කටයුතු සඳහා පහසුකම් සැපයීම, තාක්ෂණික කාර්යය මණ්ඩලවල පුහුණු අවශ්‍යතා සපුරාලීමට කටයුතු කිරීම සහ ඔවුනට අවශ්‍ය ඉංජිනේරුමය හා තාක්ෂණික ක්‍රියාකාරකම් සංවිධානය කොට මෙහෙය වීම.
- රාජ්‍ය සේවා නිලධාරීන්ට විවේක කාලය තෘප්තිමත්ව ගත කිරීම සඳහා සංචාරක බංගලා වල පහසුකම් වැඩි දියුණු කිරීම.

**වගුව 2.20: ඉංජිනේරු අංශය - අපේක්ෂිත අයවැය යෝජනා 2025 (සාරාංශය)**

| # | ව්‍යාපෘතියේ නම | ඇස්තමේන්තුගත මුළු පිරිවැය (රු.මි.) | 2025 අයවැයෙන් අපේක්ෂිත වෙන් කිරීම් (රු.මි.) |
|---|---|---|---|
| 01. | "නිල මැදුර" ගොඩනැගිල්ලේ මෙහෙයුම්, නඩත්තු හා අධීක්ෂණ සේවා කාර්යයන් | 51.37 | 51.37 |
| 02. | ප්‍රධාන උපකරණ / පද්ධති බිඳවැටීම් පිළිසකර කිරීම්, "නිල මැදුර" ගොඩනැගිල්ලේ සුළු අලුත්වැඩියා කටයුතු | 22.66 | 22.66 |
| 03. | "නිල මැදුර" ගොඩනැගිල්ලේ විදුලි ජනක යන්ත්‍ර සඳහා ඉන්ධන අවශ්‍යතාව | 3.19 | 3.19 |
| 04. | ක්ෂේත්‍ර පරික්ෂා වියදම් | 2.36 | 2.36 |
| 05. | බේරුම්කරණ ක්‍රියාවලිය සඳහා වන පිරිවැය | 2.36 | 2.36 |
| 06. | පුහුණු වියදම් | 1.77 | 1.77 |
| **මුළු එකතුව** | | **83.71** | **83.71** |

**vi. අංශයේ මූල්‍ය ප්‍රගතිය (2024.01.01 සිට 2024.12.31දක්වා)**

**පුනරාවර්තන වියදම්** - "නිල මැදුර" ගොඩනැගිල්ලේ නඩත්තු කාර්යයන් සිදු කිරීම - රු.මි. 43.25

**ප්‍රාග්ධන වියදම්** - නැත

**v. අංශයේ ප්‍රගතිය**

**ආයතනයේ සාමාන්‍ය කාර්යයන්ගේ ප්‍රගතිය ( 2024.01.01 සිට 2024.12.31)**

- දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ "නිල මැදුර" ගොඩනැගිල්ලේ නඩත්තු කාර්යයන් සම්බන්ධයෙන් ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය (CECB ආයතනය) හා අදාළ සැපයුම් ආයතන සම්බන්ධීකරණය කර නඩත්තු කාර්යයන් සිදු කිරීම.

## 2.8 ක්‍රමසම්පාදන අංශය

### i. විෂය පථය හා ක්‍රියාකාරීත්වය

- අමාත්‍යාංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම හා ප්‍රගති පාලනය.
- අමාත්‍යාංශයීය වාර්ෂික කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.
- වාර්ෂිකව අයවැය කියවීමට අදාල ප්‍රගති වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම .
- ජාතික මට්ටමේ සම්පත් පැතිකඩ සකස් කිරීම.

### ii. අභියෝග

- බාහිර ආයතන ඉතා කෙටි කලකින් ඉල්ලා සිටින වාර්තා කඩිනමින් පිළියෙල කර ඉදිරිපත් කිරීම.
- ඉතාමත් සීමිත නිලධාරීන් කණ්ඩායමක් මඟින් කාර්යාල කටයුතු සිදුකිරීම.

### iii. අනාගත ඉලක්ක

- ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමින් දිගකාලීන සංවර්ධන සැලැස්මක් සකසා ජාතික අයවැය වෙන්කිරීමේ සිට සැලැස්මට අනුගතවන පරිදි ප්‍රතිපාදන නිදහස් කිරීමට අවශ්‍ය පසුබිම නිර්මාණය කිරීම හා ඒ ක්‍රියාත්මක කිරීමේදී ප්‍රගති පාලනයේදී හා ඇගයීමේදී අවශ්‍ය කටයුතු සැපයීම.
- අවශ්‍යතාවය අනුව ව්‍යාපෘති සංකල්ප පත්‍රිකා පිළියෙල කිරීම.
- තිරසාර සංවර්ධන අභිමතාර්ථ වලට අදාළව ස්වදේශ කටයුතු අංශයෙහි සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම.

### iv.අංශයේ ප්‍රගතිය

**සාමාන්‍ය කාර්යයන්ගේ ප්‍රගතිය**
**( 2024.01.01 සිට 2024.12.31)**

- අමාත්‍යාංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කොට අනුමැතිය ලබා ගෙන ඇත. හතරවෙනි කාර්තුව දක්වා ප්‍රගති සමාලෝචන වාර්තාව නිමකොට අවසන්ය.
- 2024 අමාත්‍යාංශයීය වාර්ෂික කාර්යසාධන වාර්තාව නියමිත දිනට නියමිත ප්‍රමාණයෙන් පාර්ලිමේන්තුවට ඉදිරිපත්කර ඇත.
- දිස්ත්‍රික් මට්ටමින් සිදුවන සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය මාසිකව ලබා ගනිමින් අමාත්‍යාංශ ලේකම්තුමාවෙත ඉදිරිපත් කිරීම.
- 2024/2025 වර්ෂය සඳහා අයවැය කියවීමට අදාල ප්‍රගති වාර්තාව සකස් කරමින් පවතී.

## 2.9. ප්‍රදේශීය පරිපාලන ප්‍රතිසංස්කරණ

### i. විෂය පථය

ජාතික ප්‍රතිපත්ති රාමුවෙහි සඳහන් අභිමතාර්ථ සාක්ෂාත් වන සේ මෙරට ප්‍රාදේශීය පරිපාලන ක්‍රියාදාම (දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල) මගින් සිදු කෙරෙන මහජන සේවා සැපයීම් යාන්ත්‍රණය වැඩිදියුණු කිරීම.

- මූලික තොරතුරු, ක්‍රියාවලීන් හා සම්පත් සඵලදායී ලෙස ඒකාබද්ධ කිරීමේ කටයුතුවලට ප්‍රමුඛත්වය ලබා දෙමින් ප්‍රාදේශීය හා දිස්ත්‍රික් පරිපාලනයට අදාළ කාර්යයන් සමාලෝචනය කිරීම.
- මහජන හිතකාමී අයුරින් වැඩ පියවර සරල කිරීමේ කටයුතු හා පුරවැසි ප්‍රඥප්ති සමාලෝචනය.
- දිස්ත්‍රික්, ප්‍රාදේශීය හා ග්‍රාම නිලධාරි කොට්ඨාස මට්ටම්වල ධාරිතා සංවර්ධන හා ආකල්ප ප්‍රවර්ධන කටයුතු සඳහා සහය ලබා දීම.
- අමාත්‍යාංශය යටතේ ඇති ආයතන හා අංශයන්හි ප්‍රගමණයට අදාළ වඩාත් ප්‍රශස්ත සේවා සැපයීමේ කටයුතු සම්බන්ධ මැදිහත්වීම.

### ii. ක්‍රියාකාරීත්වය

- ‘ඉ-ග්‍රාමනිලධාරි’ (eGN) ව්‍යාපෘතිය හා යාපනය ප්‍රදේශය තුළ ඉන්කියුබේටර/ ඇක්සලරේටර් සඳහා ව්‍යාපාරික මධ්‍යස්ථානයක් ස්ථාපිත කර ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය යන ව්‍යාපෘතීන්හි උපායමාර්ගික, ප්‍රසම්පාදන හා ව්‍යාපෘති කළමනාකරණ කටයුතු සිදු කිරීම.

- ආයතනික මට්ටමින් හඳුනාගනු ලබන නායකත්වයන් යටතේ ප්‍රාදේශීය හා දිස්ත්‍රික් පරිපාලනයට අදාළ කාර්යයන් සමාලෝචනය කිරීම සඳහා කටයුතු කිරීම හා විශේෂයෙන් මහජන හිතකාමී අයුරින් වැඩ පියවර සරල කිරීමේ කටයුතු හා පුරවැසි ප්‍රඥප්ති සමාලෝචනය.
- අමාත්‍යාංශය යටතේ ඇති ආයතන හා අංශයන්හි සේවා සැපයීමේ හා අභ්‍යන්තර සම්පත් කළමනාකරණ කාර්යයන්ට අවශ්‍ය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ යෙදවීම් හඳුන්වා දීම.
- අංශයේ විෂය පථයට අදාළ කාර්යයන්ට සම්පත් කළමනාකරණය ඇතුළු කටයුතු සඳහා සහාය වීම පිණිස රාජ්‍ය හා රාජ්‍ය නොවන පාර්ශවකරුවන් සමග සඵලදායී සහයෝගීතා ගොඩනැංවීම.

✓ ‘ඉ-ග්‍රාම නිලධාරි’ (eGN) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.

පුරවැසියන්ට හා නිලධාරීන්ට භාවිතා කිරීමට පහසු, විශේෂයෙන් සැලසුම් කරන ලද ගෘහ පාදක දත්ත සමුදායක් මත පදනම් වූ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පද්ධතියක් (දෘඩාංග, ත්‍රෛභාෂිත මෘදුකාංග හා අන්තර්ජාල සබඳතා ඇතුළත්) මගින් අවශ්‍ය මහජන සේවා සැපයීම හා සෙසු නිල කාර්යයන් ඉටුකිරීම පිණිස 14,022ක් වූ ග්‍රාම නිලධාරි ප්‍රජාව සවිබල ගැන්වීම අරමුණු කර ගනිමින් පෙර පැවති ඩිජිටල් යටිතල පහසුකම් විෂය භාර අමාත්‍යාංශය, ස්වදේශ කටයුතු විෂය බාර අමාත්‍යාංශය හා එක්ව 2016 දී මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. බිම් මට්ටමේ ගෘහ පාදක තොරතුරු අඩංගු රජයේ වඩාත් විශ්වසනීයම තොරතුරු ප්‍රභවය ලෙස මෙය වෙනත් නියාමන හා සංවර්ධන කාර්යයන් සඳහා ද සඵලදායී ලෙස යොදා ගත හැකිය.

2.8. පින්තූර:- ‘ඉ-ග්‍රාම නිලධාරි’ (eGN) ව්‍යාපෘතිය - ගෘහ ඒකක මට්ටමින් දත්ත එකතු කිරීමේ කටයුතු සිදු කිරීම.





2.9. පින්තූර:- කළුතර දිස්ත්‍රික්කයෙහි ගෘහ පුරවැසි දත්ත ආකෘති පත්‍ර පරිලෝකනය





2.10. පුත්තලම දිස්ත්‍රික්කයෙහි ග්‍රාම නිලධාරීන් සඳහා මූලික පරිගණක පුහුණුව වැඩසටහන්





- ✓ ඉන්කියුබේටර් / ඇක්සලරේටර් සඳහා ව්‍යාපාරික මධ්‍යස්ථානයක් යාපනයේ ස්ථාපිත කර ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම

තොරතුරු තාක්ෂණ ඇතුළු බහුවිධ ව්‍යාපාරික ක්ෂේත්‍ර හා විශේෂයෙන්ම නවෝත්පාදන හා තරුණ අංකුර ව්‍යාපාරිකයන් අරමුණු කරගනිමින්, ඉන්දීය රජයේ අධාර යටතේ යාපනය ප්‍රදේශය තුළ ව්‍යාපාරික මධ්‍යස්ථානයක් පිහිටුවීම හා පවත්වාගෙන යාම සඳහා යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සම්බන්ධීකරණයෙන් යුතුව සැලසුම් කර මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබයි.

**ii. විශේෂ ළඟා කර ගැනීම්**

- තිරසාර පුරවැසි සේවා සැපයීම් ක්‍රමවේදයක් උදෙසා පුළුල්, විශ්වාසනීය ඒකීය ගෘහ හා පුරවැසි දත්ත සමුදායක අවශ්‍යතාවය රාජ්‍ය ආයතන වෙත අවබෝධ කරවීම. මෙම අවශ්‍යතාව 'ඉ-ග්‍රාම නිලධාරි' (eGN) ව්‍යාපෘතිය මගින් ඉටු වන අතර, මෙම ව්‍යාපෘතියේ නියමු අදියරේ අත්දැකීම් පදනම් කර ගනිමින් එහි දෙවැනි අදියර ක්‍රියාත්මක වේ.
    - ✓ කළුතර, කොළඹ, මන්නාරම, පුත්තලම, හම්බන්තොට, ගාල්ල හා ගම්පහ දිස්ත්‍රික්කයන්හි ප්‍රා.ලේ කාර්යාල මට්ටමින් දත්ත එක්තු කිරීමේ නිලධාරී පුහුණු වැඩසටහන් පවත්වා අවසන් කර කළුතර හා මන්නාරම දිස්ත්‍රික්කයන්හි දත්ත එකතු කිරීමේ කටයුතු නිමකර ඇති අතර, කළුතර දිස්ත්‍රික්කයෙහි දත්ත එකතු කිරීමේ පත්‍රිකා පරිලෝකන කටයුතු ද සම්පූර්ණ කර ඇත. අනෙකුත් දිස්ත්‍රික්කයන්හි දත්ත එක්රැස් කිරීමේ කටයුතු සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතී.
    - ✓ ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන් ඉලක්ක කර ගත් ප්‍රචාරණය හා සන්නිවේදනය සඳහා බාහිර නිර්මාණකරුවන් වෙතින් සම්පූර්ණ කර ඇති ප්‍රචාරණ දැන්වීම්, පරිශීලක අත්පොත් හා සෙසු නිර්මාණ ආශ්‍රයෙන් ප්‍රචාරණ හා සන්නිවේදන සඳහා අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතී.

**iii. අභියෝග**

- <u>ඉ-ග්‍රාම නිලධාරි (eGN) ව්‍යාපෘතිය</u>
    - ✓ ග්‍රාම නිලධාරීන් වෙත ලබා දීමට නියමිතව තිබූ ටැබ් පරිගණක යන්ත්‍ර හා පරිගණක මුද්‍රණ යන්ත්‍ර සැපයීමේ ප්‍රසම්පාදන ක්‍රමවේදය සම්බන්ධයෙන් හා අදාළ අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි රාජ්‍ය මුදල් තත්ත්වය වෙත වන බලපෑම අවම වන සේ යෝජනා ඉදිරිපත් කිරීමට පත් කළ නිලධාරි කමිටුවේ වාර්තාව අනුව යෝජිත

වඩාත් සඵලදායී විකල්ප ක්‍රමවේද ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වීම.

- ✓ ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන ක්‍රියාවලීන් අනපේක්ෂිත පරිදි ප්‍රමාද වීම. බාහිර පාර්ශවකාර ආයතනවලින් අපේක්ෂිත සහාය නිසි කලට නොලැබීම නිසා ව්‍යාපෘතියේ සමස්ත ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාදවීම් සිදුවීම යනාදිය ඇතිවීම.
- ✓ රජයේ ප්‍රමුඛ ව්‍යාපෘතීන් හේතුවෙන් දත්ත එක්රැස් කිරීමේ කටයුතු ඉලක්කගත කාලය තුල අවසන් කිරීමට නොහැකි වීම.

- <u>**යාපනය ප්‍රදේශය තුළ ඉන්කියුබේටර් / ඇක්සලරේටර් සඳහා ව්‍යාපාරික මධ්‍යස්ථානයක් ස්ථාපිත කර ක්‍රියාත්මක කිරීම.**</u>
  - ✓ ඉන්කියුබේටර් පවත්වා ගෙන යාම සඳහා ප්‍රමාණවත් ඉඩකඩ සහිත ගොඩනැගිලි යාපනය නගරයේ හඳුනා ගැනීම දුෂ්කර වීම හා ඒ සඳහා දීර්ඝ කාලයක් ගතවීම.
  - ✓ ඉන්දීය රජය මූල්‍ය ආධාර ලබා ගැනීම සඳහා වූ අවබෝධතා ගිවිසුමෙහි කාලය දීර්ඝ කර ගැනීම සඳහා අනපේක්ෂිත කාලයක් ගතවීම.
  - ✓ සුදුසු උපදේශන සමාගමක් සොයා ගැනීමේ දුෂ්කරතාව.

iv. **අනාගත ඉලක්ක**

- විවිධ මට්ටම්වල රාජ්‍ය ආයතන විසින් සමාජ හා ආර්ථික සංවර්ධන ක්‍රියාවලීන්හි කඩිනම් සහ නිවැරදි තීරණ ගැනීම සඳහා නිවැරදි සහ යාවත්කාලීන තොරතුරු සැපයීම සඳහා ප්‍රජා පාදක ගෘහ සහ පුරවැසි දත්ත සමුදායක් ගොඩනැගීම මගින් දිවයිනේ සෑම නිවාස ඒකකයකටම අදාළව ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් ගෘහ ලේඛනයක් (Household Registry) සම්පාදනය.
- ඉහත කාර්යයට සමගාමීව සෑම නිවාස ඒකකයකටම සම්මත හා අනන්‍ය ගෘහ අංකයක් ලබා දීමේ ක්‍රමවේදයක් සකස් කිරීම (අමාත්‍ය මණ්ඩල තීරණ පරිදි).
- උක්ත දත්ත පද්ධතියේ සේවා සෙසු ආයතන සමග නිල කාර්යයන් සඳහා බෙදා හදා ගැනීම හා අවශ්‍ය අවස්ථාවන්හි දී ඒවාට මිලක් නියම කිරීමෙන් ව්‍යාපෘති පිරිවැය ආවරණය කර ගැනීමේ ව්‍යාපාර ආකෘතියක් හඳුන්වා දීම.
- බිම් මට්ටමේ සිට රජයේ ඩිජිටල් පරිවර්තනයට සහාය වීම සඳහා පරිගණක සාක්ෂරතාව සහ තාක්ෂණයෙන් ග්‍රාම නිලධාරීන් සවිබල ගැන්වීම.
- සරල සිට සංකීර්ණ ප්‍රවේශයන් දක්වා ප්‍රාදේශීය/ ග්‍රාමීය මට්ටමින් අදාළ පරිපාලන ප්‍රතිසංස්කරණ ඵලදායී ලෙස ඒකාබද්ධ කිරීම.
- ඒ ඒ තනතුරට අයත්, වෙනස් නොවන ජංගම දුරකථන අංකයක් බැගින් දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ප්‍රධානතම නිලධාරීන් වෙත හඳුන්වා දීම.
- ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විවිධ සේවාවන් සඳහා වූ පියවර සමාලෝචන කර සම්මතකරණය සහ ඒ වෙනුවෙන් මාර්ගෝපදේශ හඳුන්වා දීම.
- උපදේශන, පද්ධති සැලසුම් සහ සම්පත් සහාය සඳහා විවිධ රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන සමග හවුල්කාරිත්වය සහ තිරසාරභාවය පවත්වාගෙන යාම.
- අමාත්‍යාංශය යටතේ ඇති ආයතන හා අංශයන්හි සේවා සැපයීමේ හා අභ්‍යන්තර සම්පත් කළමනාකරණ කාර්යයන්ට අවශ්‍ය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ යෙදවීම්හි තිරසාර භාවිතය සඳහා සහාය වීම.

**වගුව 2.21 : ප්‍රාදේශීය පරිපාලන ප්‍රතිසංස්කරණ - අපේක්ෂිත අයවැය යෝජනා 2025 (සාරාංශය)**

| # | ව්‍යාපෘතියේ නම | ඇස්තමේන්තුගත මුළු පිරිවැය (රු.මි.) | 2025 අයවැයෙන් අපේක්ෂිත වෙන්කිරීම් (රු.මි.) |
|---|---|---|---|
| 01. | 'ඉ-ග්‍රාම නිලධාරි' ව්‍යාපෘතිය (eGN) | 3,900.00* | 990.80 |
| 02. | යාපනයේ ඉන්කියුබේටර් / ඇක්සලරේටර් සඳහා ව්‍යාපාරික මධ්‍යස්ථානයක් ස්ථාපිත කර ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය | 307.00 | 225.14 |

(*දැනට රු.මිලි. 1,689.22 පූර්ණ වියදම් ඇස්තමේන්තුවක් සඳහා අනුමැතිය ලැබී ඇත.)

**v. අංශයේ මූල්‍ය ප්‍රගතිය**
**(2024.01.01 සිට 2024.12.31 දක්වා)**

- 'ඉ-ග්‍රාම නිලධාරි' ව්‍යාපෘතිය සඳහා රු.මි. 1,150.00ක ප්‍රතිපාදන වෙන් වී ඇති අතර, රු. මිලියන 29.26ක මූල්‍ය ප්‍රගතියක් වසරේ මුල් කාර්තු තුන ඇතුළත ළඟා කර ගෙන ඇත.
- ඉන්කියුබේටර්/ ඇක්සලරේටර් සඳහා ව්‍යාපාර මධ්‍යස්ථානයක් යාපනයේ පිහිටුවීම සහ ක්‍රියාත්මක කිරීම ව්‍යාපෘතිය සඳහා රු.මි. 65.00ක ප්‍රතිපාදන වෙන් වී ඇති අතර, ව්‍යාපෘතිය සඳහා මුල් කාර්තු තුන ඇතුලත මූල්‍ය ප්‍රගතියක් වාර්තා නොවේ.

**vi. අංශයේ ප්‍රගතිය**

- <u>ඉ-ග්‍රාම නිලධාරි (eGN) ව්‍යාපෘතිය</u>

  - ✓ අමාත්‍ය මණ්ඩල තීරණ පරිදි ග්‍රාම නිලධාරීන් සඳහා 2 in 1 පරිගණක ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් හා සෙසු ව්‍යාපෘති කාර්යයන් වෙනුවෙන් රාජ්‍ය මුදල් වෙත වන බලපෑම අවම වන සේ විකල්ප යෝජනා ක්‍රියාත්මක කිරීමට අදාළ කටයුතු කිරීමට වන තාක්ෂණික ඇගයුම් කමිටුව පත් කිරීම සඳහා ප්‍රසම්පාදන අංශය දැනුවත් කර ඇත.
  - ✓ මෘදුකාංගයේ වැඩිදියුණුව හා අත්‍යවශ්‍ය සංශෝධන පිළිබඳව මෘදුකාංග සංවර්ධනකරු සමග පැවැත්වූ සාකච්ඡා අනුව එකඟ වූ මිල අනුව ප්‍රදානිත කොන්ත්‍රාත්තුවේ පළමු අදියර සම්පූර්ණ කර ඇත.
  - ✓ ගෘහ පුරවැසි දත්ත එකතු කිරීමේ ක්‍රියාවලිය දිස්ත්‍රික් මට්ටමින් මේ වන විට සාර්ථකව සිදු වෙමින් පවතින අතර, කළුතර සහ මන්නාරම දිස්ත්‍රික්කයන්හි දත්ත එකතු කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණයෙන්ම අවසන් කර ඇත.
  - ✓ ගෘහ දත්ත පත්‍රිකා පරිලෝකන කටයුතු සඳහා කොන්ත්‍රාත්තුව ප්‍රදානිත ආයතනය වෙතින් කළුතර දිස්ත්‍රික්කයේ සියලුම දත්ත පත්‍රිකා පරිලෝකන කටයුතු අවසන් කර ඇත.
  - ✓ කළුතර හා පුත්තලම දිස්ත්‍රික්කයන්හි සියලුම ප්‍රා.ලේ කාර්යාල ආවරණය වන පරිදි ග්‍රාම නිලධාරීන් සඳහා මූලික පරිගණක පුහුණුව ලබා දී අවසන් කර ඇති අතර, අනෙකුත් දිස්ත්‍රික්කයන්හි මෙම පුහුණු කටයුතු සම්බන්ධීකරණ කටයුතු සිදු කරමින් පවතී.

- <u>උතුරු ප්‍රදේශය තුළ ඉන්කියුබේටර් / ඇක්සලරේටර් සඳහා ව්‍යාපාරික මධ්‍යස්ථානයක් ස්ථාපිත කර ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය</u>

  - ✓ ඉන්දීය රාජ්‍ය ආධාර ලෙස මුලින් එකඟ වී තිබූ රු.මි. 250 සක්‍රීය කරවා ගැනීමට අවශ්‍ය මූලික වාර්තා සැකසීමට නැවත වඩාත් සුදුසු උපදේශන ආයතනයක් තෝරා ගැනීම සඳහා යාපනයේ දිස්ත්‍රික් ලේකම් වෙත දැනුම් දී ඇත.
  - ✓ යාපනය නගරයේ යෝජිත මධ්‍යස්ථානය වෙනුවෙන් යොදාගත හැකි රජයේ හෝ පෞද්ගලික ගොඩනැගිල්ලක් සොයා ගැනීම සඳහා යාපනයේ දිස්ත්‍රික් ලේකම් වෙත දැනුම් දී ඇත.

# තෙවන පරිච්ඡේදය

## 03. දිස්ත්‍රික් මට්ටමේ සමස්ත විස්තරාත්මක ප්‍රගති සාරාංශය.

### 3.1. කොළඹ දිස්ත්‍රික්කය

#### i. හැඳින්වීම

**පසුබිම**

වර්ග කිලෝමීටර 699 කින් සමන්විත කොළඹ දිස්ත්‍රික්කයේ ඡන්ද කොට්ඨාස ගණන 15 ක් ද, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ගණන 13ක් ද, ග්‍රාම නිලධාරී කොට්ඨාස 557ක් ද වන අතර ජනගහනය 2,477,922ක් වේ

**දිස්ත්‍රික්කයේ ප්‍රධාන සංරචක.**

**ප්‍රමුඛ පරාසයන්**

- පරිපාලන, ආයතනික කටයුතු හා මහජන පැමිණිලි
- මූල්‍ය කළමනාකරණය
- සමාජ සුබසාධනය
- මහජන සේවා සැපයීම
- දිස්ත්‍රික් ආර්ථික සංවර්ධනය
- සහනාධාර කළමනාකරණය
- හදිසි ආපදා තත්ත්ව කළමනාකරණය

**විෂය පථය**

- ප්‍රාදේශිය ලේකම් කාර්යාල 13ට හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ පාලන හා ආයතනික කටයුතු
- මහජනයා හෝ ආයතන විෂයෙහි ලැබෙන පැමිණිලි විමර්ශනය කරමින් සුදුසු ක්‍රියාමාර්ග ගැනීම
- දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය හා රේඛීය අමාත්‍යාංශ ප්‍රතිපාදන කාර්යක්ෂමව උපයෝජනය කිරීම සහ විනිවිද භාවයකින් යුතුව මූල්‍ය කළමනාකරණය පවත්වා ගෙන යාම
- විශ්‍රාම වැටුප්, වැඩිහිටි, ආබාධිත දීමනා ලබා දීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත අවශ්‍ය පහසුකම් සම්පාදනය
- තෝරාගත් පාරිභෝගික භාණ්ඩවල මිනුම් හා ප්‍රමිතීන් පවත්වාගෙන යාම
- පරිසර ආරක්ෂණ කටයුතු
- ගිනිඅවි හා පුපුරණ ද්‍රව්‍ය බලපත්‍ර නිකුත් කිරීම
- විවිධ අමාත්‍යාංශවලින් ලැබෙන ප්‍රතිපාදන තුළින් ආර්ථික සංවර්ධනයට දායකවන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
- අස්වැසුම ප්‍රතිලාභීන් සඳහා සහනාධාර ලබා දීම
- දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නඩත්තු කටයුතු හා අලුත්වැඩියා කටයුතු
- විවිධ ආපදා තත්ත්වයන් හමුවේ පීඩාවට පත්වූවන්ගේ පීඩාවන් සමනය කිරීම සඳහා සහනාධාර ලබාදීම.

**විශේෂ ළඟා කරගැනීම්**

- හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නව ගොඩනැගිල්ලේ පළමු අදියරේ වැඩ අවසන් කිරීම
- 2024 ජන හා නිවාස සංගණනයට අදාළව ගොඩනැගිලි ලැයිස්තු ගත කිරීමේ අදියර අවසන් කිරීම
- තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කිරුල ග්‍රාම නිලධාරි වසමේ පිහිටි හෙක්ටයාර් 0.7335 ක පමණ වපසරියක් සහිත හත්බෝධිය වත්ත නැමති ඉඩමේ, අනවසරයෙන් පදිංචි පවුල් 237ක් නාගරික සංවර්ධන අධිකාරියට අයත් මහල් නිවාසවලට පුනස්ථාපනය කිරීම අදියර වශයෙන් ක්‍රියාත්මක කිරීම - මේ මඟින් නිරන්තරයෙන් දැඩි සුළං ආපදා අවදානමට ලක් වී සිටි එම පවුල් සඳහා ආරක්ෂිත නිවාස ලබාදීමට හැකිවීම හා සංවර්ධන කටයුතු සඳහා ඉහළ වාණිජ වටිනාකමින් යුත් ඉඩමක් රජයට හිමිවීම.
- දැඩි අවදානම් තත්ත්වයේ පවතින වැකන්ද නිවාස යෝජනා ක්‍රමයේ පදිංචිකරුවන් 57ක් සඳහා විකල්ප නිවාස ලබා දීම තුළින් එම පවුල්වල ජීවිත හා දේපල සුරක්ෂිතතාවය තහවුරු කිරීම.
- කොළොන්නාව නගර සභාවට අයත් පර්චස් 49 ක ඉඩමක පිහිටි අනතුරුදායක අබලන් මහල් නිවාස ක්‍රමයක් වන මජීඩ් නිවාස

සංකීර්ණයේ පදිංචි පවුල් 47ක් සඳහා විකල්ප නිවාස ලබා දීම තුළින් එම පවුල්වල ජීවිත හා දේපල සුරක්ෂිතතාවය තහවුරු කිරීම.

- දෛනිකව රථවාහන හා පදිකයින් විශාල සංඛ්‍යාවක් භාවිතා කරනු ලබන අබලන් තත්ත්වයේ පවතින වැල්ලවත්ත කැනල් පටුමඟ හා දෙහිවල බණ්ඩාරනායක මාවත සම්බන්ධ වන පාලමේ ප්‍රතිසංස්කරණ කටයුතු දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව වෙත පවරා දීම මඟින් රථවාහන හා පදිකයින්ගේ ආරක්ෂාව තහවුරු කිරීම.
- විදේශ ණය ආධාර යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘතියක් වූ ඔරුගොඩවත්ත සිට කඩුවෙල අධිවේගී මාර්ගය දක්වා ඇති පැරණි ජලනල ඉවත් කර අළුතින් ජලනල එළීමේ ව්‍යාපෘතිය, ඉඩම් අත්පත් කර ගැනීම ඇතුළු වෙනත් විවිධ ගැටළු හේතුවෙන් ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වී තිබිණි. ව්‍යාපෘතියට අදාල ආයතන වන මාර්ග සංවර්ධන අධිකාරිය, ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය, තැපැල් දෙපාර්තමේන්තුව හා අදාල පළාත් පාලන ආයතන සම්බන්ධීකරණයෙන් එම ගැටළු විසඳීම මඟින් ව්‍යාපෘතිය අවසන් කිරීමට කටයුතු කිරීම.
- පනාගොඩ යුද හමුදා කඳවුරේ අපජලය බැහැර කිරීමේ පද්ධතියේ පැවති දුර්වලතා සඳහා පිළියම් ලබා දීම මඟින් එම අපජලය පිරිපහදු පද්ධති පහක් සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාදීමේ කටයුතු සම්බන්ධීකරණය කිරීම. එමඟින් යුද හමුදා කඳවුරේ අපජලය බැහැර කිරීම ක්‍රමවත් වීම සහ කඳවුර ආශ්‍රිත කුඹුරුයායට සිදු වූ පරිසර හානිය අවම වීම.

**අභියෝග**

- අඩු ආදායම්ලාභී ජනතාව ආර්ථිකමය වටිනාකමක් ඇති නිෂ්පාදන ක්ෂේත්‍රවලට යොමු කරවීම
- නාගරික වතු ආශ්‍රිත ජනතාවගේ සනීපාරක්ෂක පහසුකම් තහවුරු කිරීම
- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ නිෂ්පාදන අපනයන ප්‍රමිතියට පත්කිරීම
- වරින්වර මතුවන වසංගත තත්ත්ව පාලනය කිරීම
- පරිසරයට සිදුවන බලපෑම් අවම කරගනිමින් දිස්ත්‍රික් සංවර්ධන කටයුතු සිදු කිරීම
- විවිධ සංවර්ධන ව්‍යාපෘතීන් හා නායයෑම්, ගිනි ගැනීම් වැනි ආපදා තත්ත්වයන්වලදී විතැන්වන පවුල් සඳහා විකල්ප නිවාස හා ඉඩම් ලබා දීම

**අනාගත ඉලක්ක**

- හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නව ගොඩනැගිල්ලේ දෙවන අදියරේ වැඩ අවසන් කිරීම
- දැනට සිටින අඩු ආදායම්ලාභී ජනතාවගෙන් අවම ලෙස 25%ක්වත් නිෂ්පාදන ආර්ථිකයකට යොමු කිරීම
- වගා කළ හැකි සෑම ස්ථානයකම වගා කිරීම සඳහා ප්‍රජාව දිරිමත් කිරීම
- නාගරික ගෙවතු වගා ප්‍රවර්ධනය

**වගුව 3.1 කොළඹ දිස්ත්‍රික්කය - 2025 වර්ෂය සඳහා අපේක්ෂිත අයවැය යෝජනා (සාරාංශය)**

| # | ව්‍යාපෘතියේ නම | ඇස්තමේන්තුගත මුළු පිරිවැය (රු.මි.) | 2025 අයවැයෙන් අපේක්ෂිත වෙන් කිරීම් (රු.මි.) |
|---|---|---|---|
| 01. | හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නව ගොඩනැගිල්ලේ දෙවන අදියරේ වැඩ අවසන් කිරීම | 96.00 | 96.00 |

## ii. ආයතනයේ මූල්‍ය ප්‍රගතිය (2024.01.01 සිට 2024.12.31 දක්වා)

පුනරාවර්තන වියදම් - රු.මි. 2,527.34
ප්‍රාග්ධන වියදම් - රු.මි 238.00

**iii.** ආයතනයේ භෞතික ප්‍රගතිය

**වගුව 3.2 : කොළඹ දිස්ත්‍රික්කය - ක්‍රියාත්මක ප්‍රාග්ධන අරමුදල්වල ප්‍රගතිය (2024.01.01 සිට 2024.12.31 දක්වා)**

| # | සංරචකය | අරමුදල් මූලාශ්‍රය | වැඩසටහන | ව්‍යාපෘති සංඛ්‍යාව | මුළු ඇස්තමේන්තු පිරිවැය (රු.මි) | වියදම් (රු.මි) |
|---|---|---|---|---|---|---|
| 01. | ප්‍රවේශ මාර්ග | දේශීය | විමධ්‍යගත අයවැය වැඩසටහන,කොළඹ දිස්ත්‍රික්කයේ සංවර්ධන වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කිරීම,ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන | 604 | 771.07 | 738.28 |
| 02. | ග්‍රාමීය පාලම් | | විමධ්‍යගත අයවැය වැඩසටහන, කොළඹ දිස්ත්‍රික්කයේ සංවර්ධන වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කිරීම | - | 0.00 | 0.00 |
| 03. | ග්‍රාමීය විදුලි දිගු | | විමධ්‍යගත අයවැය වැඩසටහන | 2 | 1.55 | 1.46 |
| 04. | සනීපාරක්ෂක පහසුකම් | | විමධ්‍යගත අයවැය වැඩසටහන, කොළඹ දිස්ත්‍රික්කයේ සංවර්ධන වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කිරීම | 27 | 23.57 | 22.27 |
| 05. | ක්‍රීඩා පිටි | | විමධ්‍යගත අයවැය වැඩසටහන | 32 | 33.64 | 31.93 |
| 06. | සුළු වාරිමාර්ග | | විමධ්‍යගත අයවැය වැඩසටහන | 7 | 5.60 | 5.29 |
| 07. | ග්‍රාමීය ආර්ථික යටිතල | | විමධ්‍යගත අයවැය වැඩසටහන | 1 | 0.59 | 0.59 |
| 08. | ආගමික මධ්‍යස්ථාන සංවර්ධනය | | විමධ්‍යගත අයවැය වැඩසටහන,පිරිවෙන් අධ්‍යාපන වැඩිදියුණු කිරීමේ වැඩසටහන, කොළඹ දිස්ත්‍රික්කයේ සංවර්ධන වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කිරීම | 328 | 205.02 | 202.08 |
| 09. | සමාජ සුබ සාධනය | | විමධ්‍යගත අයවැය වැඩසටහන, කොළඹ දිස්ත්‍රික්කයේ සංවර්ධන වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කිරීම | 598 | 305.51 | 275.28 |
| 10. | නිවාස සංවර්ධනය | | විමධ්‍යගත අයවැය වැඩසටහන | - | 0.00 | 0.00 |
| 11. | සූරිය පැනල / විදුලිය | | විමධ්‍යගත අයවැය වැඩසටහන, කොළඹ දිස්ත්‍රික්කයේ සංවර්ධන වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කිරීම | 52 | 94.20 | 93.73 |

| # | සංරචකය | අරමුදල් මූලාශ්‍රය | වැඩසටහන | ව්‍යාපෘති සංඛ්‍යාව | මුළු ඇස්තමේන්තු පිරිවැය (රු.මි) | වියදම් (රු.මි) |
|---|---|---|---|---|---|---|
| 12. | ග්‍රාමීය ජල සැපයුම් | දේශීය | විමධ්‍යගත අයවැය වැඩසටහන | 2 | 0.52 | 0.52 |
| 13. | නිල සෙවන | | විමධ්‍යගත අයවැය වැඩසටහන | 27 | 28.25 | 27.37 |
| 14. | වෙනත් යටිතල පහසුකම් | | විමධ්‍යගත අයවැය වැඩසටහන, කොළඹ දිස්ත්‍රික්කයේ සංවර්ධන වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කිරීම | 207 | 155.43 | 153.33 |
| මුළු එකතුව | | | | **1,887** | **1,624.95** | **1,552.13** |

**පින්තූර 3.1 කොළඹ දිස්ත්‍රික්කයේ ව්‍යාපෘති හා වැඩසටහන්**



ව්‍යාපෘතියේ නම - වැලිකඩ බටහිර වසමේ හීන් ඇල මාර්ගය ආශ්‍රිතව උද්‍යාන මාවතේ අංක 31/1 නිවස පිටුපස සිට ඉදිරියට කිඹුල් වැටක් ස්ථාපනය කිරීම
ස්ථානය - ශ්‍රී ජ'පුර කෝට්ටේ - වැලිකඩ බටහිර වසම
මුළු පිරිවැය - රු.මි. 0.95
වියදම - රු.මි. 0.92
ආරම්භක දිනය - 2024.07.29
නිම කළ දිනය - 2024.08.09



ව්‍යාපෘතියේ නම - සංඝමිත්තා බාලිකා විද්‍යාලයේ මරදාන පෙදෙසෙහි තාප්පය සහ ගේට්ටුව නවීකරණය කිරීම.
ස්ථානය - තිඹිරිගස්යාය - උතුරු බොරැල්ල වසම
මුළු පිරිවැය - රු.මි. 1.00
වියදම - රු.මි. 0.91
ආරම්භක දිනය - 2024.03.28
නිම කළ දිනය - 2024.04.22

**iv. රාජ්‍ය ආදායම් උපයා ගැනීමේ ව්‍යාපෘති**

**වගුව 3.3 : කොළඹ දිස්ත්‍රික්කය - ආදායම් උපයා ගැනීම් 2024.01.01 සිට 2024.12.31 දක්වා**

| ආදායම් ශීර්ෂය | ආදායම (රු.මි) |
|---|---|
| විභාග හා අනෙකුත් බදු කුලී | 0.06 |
| ගොඩනැගිලි කුලී | 1.74 |
| වෙනත් ආදායම් | 16.10 |
| මුළු එකතුව | **17.90** |

## 3.2. ගම්පහ දිස්ත්‍රික්කය

### i. හැඳින්වීම

**පසුබිම**

දිවයිනේ සමස්ත භූමි ප්‍රමාණයෙන් 2.1% ක් පමණ වන ගම්පහ දිස්ත්‍රික්කයේ මුළු වපසරිය ආසන්න වශයෙන් ව.කි.මී. 1,387 කි. ගම්පහ දිස්ත්‍රික්කයේ මුළු ජනගහනය 2,638,733 ක් පමණ වේ. දිස්ත්‍රික්කයේ ජන ඝණත්වය වර්ග කිලෝමීටරයට.1,902 ක් වන අතර, මුළු පවුල් සංඛ්‍යාව 604,009 ක් පමණ වේ. පළාත් පාලන ආයතනයන්හි සංයුතිය ගත් කළ, මහ නගර සභා දෙකකින්, නගර සභා පහකින් හා ප්‍රාදේශීය සභා දොළහකින් සමන්විත වේ. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 13 කින් යුතු මෙම දිස්ත්‍රික්කය ග්‍රාම නිලධාරී වසම් 1,177 කින් සහ ගම් 1,774 කින් සමන්විත වේ.

**දිස්ත්‍රික්කයේ ප්‍රධාන සංරචක**

**ප්‍රධාන සංරචක**

- ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 ට අදාලව පාලන කටයුතු මෙහෙයවීම හා මහජන පැමිණිලි සම්බන්ධව කටයුතු කිරීම.
- දිස්ත්‍රික් ලේකම් කාර්යාල කටයුතු මැනවින් පවත්වා ගැනීම, මානව සම්පත් කළමනාකරණය, භෞතික සම්පත් වැඩි දියුණු කිරීම, ගිනි අවි බලපත්‍ර නිකුත් කිරීම, ගිනි අවි බලපත්‍ර නිර්දේශ කිරීම ආපදා කළමනාකරණය හා ඩෙංගු වසංගතය පාලනය කිරීම.
- ආහාර නිෂ්පාදනය,ආහාර සුරක්ෂිතතාව, මත් ද්‍රව්‍ය නිවාරණය, පරිසර ආරක්ෂණයට අදාළ කටයුතු ඉටු කිරීම.
- මිල පාලන, කුඩා ව්‍යාපාර සංවර්ධනය, ඵලදායිතා වැඩසටහන් හා ආපදා කළමනාකරණයට සම්බන්ධ කටයුතු කිරීම.
- සංස්කෘතික හා ආගමික උත්සව සංවිධානය හා සම්බන්ධීකරණය.
- දිස්ත්‍රික් ලේකම් යටතේ අනුමත බලධාරිත්වය තුළ කෙරෙන ව්‍යාපෘති කළමනාකරණය.
- 256 වැය ශීර්ෂය යටතේ මූල්‍ය කළමනාකරණය හා විනය පවත්වා ගෙන යාම.
- අනුමත ප්‍රතිපාදන සීමාව තුළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, මෙහෙය වීම හා සහනාධාර ප්‍රගති පාලනය.

**විශේෂ ළඟා කර ගැනීම්**

- ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය නව පරිපාලන ගොඩනැගිල්ලේ කාර්යාල ස්ථාපිත කිරීම.
- ජාඇල නව ප්‍රාදේශීය ලේකම් කාර්යාල සංකීර්ණයේ වැඩ නිම කිරීම.

**අභියෝග**

- දරිද්‍රතාවය අවම කිරීම සහ යටිතල පහසුකම් සංවර්ධනය.
- කසළ කළමනාකරණය.
- ආපදා කළමනාකරණය

**අනාගත ඉලක්ක**

- දිස්ත්‍රික්කයේ ජනතාවට වඩා කාර්යක්ෂම හා සඵලදායී රාජ්‍ය සේවයක් ලබා දීම.
- ග්‍රාමීය ආර්ථිකය සවිබල ගන්වමින් සියළුම ආකාරයේ දරිද්‍රතාවයෙන් පෙළෙන සියලුම වයස් කාණ්ඩයන්ට අයත් පිරිමි, කාන්තා හා ළමුන්ගේ අනුපාතය අවම වශයෙන් අඩකින් අඩු කිරීම.
- දිස්ත්‍රික්කය තුළ ආහාර සුරක්ෂිතතාව ඇති කිරීම.
- සියලුම මහජනතාවට පිරිසිදු පානීය ජලය ලබා දීම.
- ගුණාත්මක ඉහල විශ්වාසදායී, තිරසර සහ ආපදාවන්ට ඔරොත්තු දෙන යටිතල පහසුකම් දිස්ත්‍රික්කය තුළ සංවර්ධනය කිරීම.
- කාලගුණය සම්බන්ධ විපත්, වසංගත රෝග සහ ස්වභාවික ආපදාවන්ට ඔරොත්තු දීමේ සහ එවැනි තත්ත්වයන්ට මුහුණ දීමේ හැකියාව ශක්තිමත් කිරීම.
- දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රජාවගේ මූලික අවශ්‍යතාවන් වෙත කාර්යක්ෂම හා ගුණාත්මක ප්‍රවේශයක් තහවුරු කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම

**ii ආයතනයේ මූල්‍ය ප්‍රගතිය (2024.01.01 සිට 2024.12.31 දක්වා )**

පුනරාවර්තන වියදම - රු. මි. 2,640.41 ප්‍රාග්ධන වියදම - රු.මි. 558.21

**වගුව 3.4: ගම්පහ දිස්ත්‍රික්කය - 2025 වර්ෂය සඳහා අපේක්ෂිත අයවැය යෝජනා (සාරාංශය)**

| # | ව්‍යාපෘතියේ නම | ඇස්තමේන්තු ගත මුළු පිරිවැය (රු.මි) | 2025 අයවැයෙන් අපේක්ෂිත වෙන් කිරීම (රු.මි) |
|---|---|---|---|
| 01 | නව දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ල ඉදි කිරීම | 3,940.04 | 200.00 |
| 02 | ජාඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා නව සූර්ය පැනල පද්ධතියක් සවි කිරීම | 7.50 | 7.50 |
| 03 | මීරිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා නව සූර්ය පැනල පද්ධතියක් සවි කිරීම | 3.00 | 3.00 |
| 04 | මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා නව ගොඩනැගිලි සංකීර්ණයක් ඉදි කිරීම | 80.79 | 28.72 |
| **මුළු එකතුව** | | **4,031.29** | **239.22** |

**පින්තූර 3.2 ගම්පහ දිස්ත්‍රික්කයේ ව්‍යාපෘති හා වැඩසටහන්**



මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය
ව්‍යාපෘති නාමය - තෝන්ගහවත්ත 1 වන පටුමග සුදත් මහතාගේ නිවස දෙසට ඇති මාර්ගය කොන්ක්‍රීට් ඇතිරීම.
මුළු පිරිවැය - රු.මි. 0.80
වියදම - රු.මි. 0.72



කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය
ව්‍යාපෘතියේ නම - දකුණු කිඹුලපිටිය ලී මෝල අසල පාර තාර දමා සංවර්ධනය කිරීම
මුළු පිරිවැය - රු.මි. 0.50
වියදම - රු.මි. 0.39

**iii ආයතනයේ භෞතික ප්‍රගතිය**

**වගුව 3.5: ගම්පහ දිස්ත්‍රික්කය - ක්‍රියාත්මක ප්‍රාග්ධන අරමුදල් ව්‍යාපෘතිවල ප්‍රගතිය (2024.01.01 සිට 2024.12.31 දක්වා )**

| # | සංරචකය | අරමුදල් මූලාශ්‍රය | වැඩසටහන | ව්‍යාපෘති සංඛ්‍යාව | මුළු ඇස්තමේන්තු පිරිවැය (රු.මි) | වියදම (රු.මි) |
|---|---|---|---|---|---|---|
| 01 | ප්‍රවේශ මාර්ග | රේඛීය අමාත්‍යාංශ (දේශීය අරමුදල්) | විමධ්‍යගත අයවැය වැඩසටහන/ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන/ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන /විශේෂ ව්‍යාපාති / | 1175 | 1004.36 | 949.30 |
| 02 | ග්‍රාමීය පාලම් | | විමධ්‍යගත අයවැය වැඩසටහන/ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන/ විශේෂ ව්‍යාපාති | | | |
| 03 | ග්‍රාමීය විදුලි දිගු | | | 16 | 7.48 | 6.88 |
| 04 | සනීපාරක්ෂක පහසුකම් | | | 11 | 4.40 | 4.10 |
| 05 | ක්‍රීඩා පිටි | | | 46 | 39.27 | 35.45 |
| 06 | සුළු වාරිමාර්ග | | | 28 | 19.60 | 17.98 |
| 07 | ග්‍රාමීය ආර්ථික යටිතල | | සෞභාග්‍යා වැඩසටහන/ විමධ්‍යගතඅයවැය වැඩසටහන /ප්‍රාදේශීයසංවර්ධන වැඩසටහන | 30 | 23.40 | 20.49 |
| 08 | ආගමික මධ්‍යස්ථාන සංවර්ධනය | | පිරිවෙන් අධ්‍යාපනය ශක්තිමත් කිරීමේ සංවර්ධන වැඩසටහන/ විමධ්‍යගතඅයවැය වැඩසටහන /ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන/විශේෂ ව්‍යාපෘති | 317 | 241.60 | 223.31 |
| 09 | සමාජ සුබසාධනය | | විමධ්‍යගතඅයවැය වැඩසටහන /ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන | 627 | 303.63 | 278.65 |
| 10 | නිවාස සංවර්ධනය | | | | | |
| 11 | සූරිය පැනල/විදුලිය | | | 6 | 1.71 | 1.57 |
| 12 | ග්‍රාමීය ජල සැපයුම් | | | 11 | 4.15 | 3.74 |
| 13 | නිල සෙවණ | | | 3 | 1.20 | 1.17 |
| 14 | වෙනත් යටිතල පහසුකම් | | | 242 | 250.80 | 233.94 |
| **මුළු එකතුව** | | | | **2512** | **1901.60** | **1776.58** |

## 63.3. කළුතර දිස්ත්‍රික්කය

### i. හැඳින්වීම

**පසුබිම**

භූමි ප්‍රමාණය- වර්ග කිලෝමීටර් 1,598 කින් සමන්විත කළුතර දිස්ත්‍රික්කයේ, පළාත් පාලන ආයතන 13ක් ද, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 14 ක් ද, ග්‍රාම නිලධාරි වසම් 762 ක්ද, ගම් 2,524 ක් ද වන අතර ජනගහනය 1,296,003 ක් වේ.

**දිස්ත්‍රික්කයේ ප්‍රධාන සංරචක**

**ප්‍රධාන සංරචක**

- අඩු ආදායම් ලබන පවුල්වල මූලික අවශ්‍යතා සපුරාලමින් දුප්පත්කමින් මුදවා ගැනීම
- තිරසර කෘෂිකර්ම ප්‍රවර්ධනය
- බෝවන රෝග හා බෝනොවන රෝග වැළැක්වීම හා පාලනය කිරීම තුළින් නිරෝගිමත් ජනතාවක් බිහිකිරීම
- සැමට පිරිසිදු පානීය ජල පහසුකම් ලබාගැනීම, දිස්ත්‍රික්කයේ පුනර්ජනනීය බලශක්ති භාවිතය ඉහළ නැංවීම, ආපදාවන්ට ඔරොත්තු දෙන සවිමත් ග්‍රාමීය මාර්ග පද්ධතියක් ඇති කිරීම, දේශගුණික විපර්යාස හා ඒවායේ බලපෑම් වලට එරෙහිව ක්‍රියාත්මක වීම.

**විශේෂ ළඟා කර ගැනීම්**

- දිස්ත්‍රික්කයේ කාර්යාල ගොඩනැගිලිවල පහසුකම් පුළුල්කිරීම හරහා වඩාත් ඉහළ සේවාවක් ජනතාවට සැපයීම. දිස්ත්‍රික්කයේ ඔප්පු නොමැති ඉඩම් සඳහා ඔප්පු ලබා දීම තුලින් ජනතාවගේ පවතින ඉඩම් හිමිකාරීත්වය පිළිබඳ ගැටළු අවම කිරීම.

**අභියෝග**

- ගංවතුර, සුළිසුළං, නායයෑම්, නාගරික ජල ගැලීම් හා සුනාමි යන ආපදා තත්වයන්ට මුහුණ පෑමට සිදුවීම, දිස්ත්‍රික්කයේ ජනතාවගේ පවතින ඉඩම් හිමිකාරීත්වය පිළිබඳ ගැටළුව, දිස්ත්‍රික්කයේ ග්‍රාමීය ජනතාව නිෂ්පාදන ක්ෂේත්‍රය වෙත යොමු කරවීම.

**අනාගත ඉලක්ක**

- ආපදා තත්ත්වයන්ට සාර්ථකව මුහුණ දිය හැකි යාන්ත්‍රණයක් සහිත දිස්ත්‍රික්කයක් බවට පත්කිරීම, ඉඩම් සඳහා දීමනා පත්‍ර ලබා දීම වැඩිකිරීම මගින් ඉඩම් හිමිකාරීත්වය පිළිබඳ ගැටළු අවම කිරීම, දිස්ත්‍රික්කයේ ග්‍රාමීය ජනතාව නිෂ්පාදන ක්ෂේත්‍රය වෙත යොමු වීමෙන් රටේ ආර්ථිකයට දායකවන ප්‍රතිශතය වැඩි කිරීම.

### ii.ආයතනයේ මූල්‍ය ප්‍රගතිය

**(2024.01.01 සිට 2024.12.31 දක්වා)**

පුනරාවර්තන වියදම් - රු.මි. 2.701.74
ප්‍රාග්ධන වියදම් - රු.මි. 120.50

**වගුව 3.6: කළුතර දිස්ත්‍රික්කය - 2025 වර්ෂය සඳහා අපේක්ෂිත අයවැය යෝජනා. (සාරාංශය)**

| # | ව්‍යාපෘතියේ නම | ඇස්තමේන්තු ගත මුළු පිරිවැය (රු.මි.) | 2025 අයවැයෙන් අපේක්ෂිත වෙන් කිරීම් (රු.මි.) |
|---|---|---|---|
| 1 | ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම්<br>i. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය<br>ii.ප්‍රාදේශීය ලේකම් කාර්යාල | 40.000<br>93.216 | 40.000<br>93.216 |
| 2. | ගොඩනැගිලි හා ඉදිකිරීම් (අත්පත් කර ගැනීම්)<br>i. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය<br>ii.ප්‍රාදේශීය ලේකම් කාර්යාල | 295.4<br>10.0 | 295.4<br>10.0 |

iii. ආයතනයේ භෞතික ප්‍රගතිය

**වගුව 3.7: කළුතර දිස්ත්‍රික්කය - ක්‍රියාත්මක ප්‍රාග්ධන අරමුදල් ව්‍යාපෘතිවල ප්‍රගතිය**
**(2024.01.01 සිට 2024.12.31 දක්වා)**

| # | සංරචකය | අරමුදල් මූලාශ්‍රය | වැඩසටහන | ව්‍යා. සංඛ්‍යාව | ඇස්තමේන්තු ගත මුළු පිරිවැය (රු.මි.) | වියදම රු.මි. |
|---|---|---|---|---|---|---|
| 01 | ග්‍රාමීය යටිතල පහසුකම් , ජීවනෝපාය සංවර්ධනය, | 001-02-06-023-2509 | විමධ්‍යගත අයවැය වැඩසටහන | 736 | 528.31 | 518.51 |
| | | 001-02-06-022-2509 | විමධ්‍යගත අයවැය (විශේෂ)වැඩසටහන | 7 | 10.0 | 2.69 |
| | | 001-02-06-003-2509 | විමධ්‍යගත අයවැය (විශේෂ)වැඩසටහන | 16 | 54.74 | 20.751 |
| 02. | දසවිධ විශේෂ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධනය | 123-02-15-82-2506 | කඳුකර දශකය වැඩසටහන | 249 | 435.341 | 287.978 |
| 03. | ග්‍රාමීය ජීවනෝපාය සංවර්ධනය | 171-2-07-101-2202 | සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන | 18 | 20.978 | 20.740 |
| 04 | ග්‍රාමීය මාර්ග | 117-24-61-2104 | ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන | 61 | 87.715 | 86.86 |
| 05 | ආගමික මධ්‍යස්ථාන සංවර්ධනය | 203-02-01-18-2205,203-0201-11-2205, 203-02-01-14-2205 | ක්‍රිස්තියානි ආගමික කටයුතු | 04 | 4.07 | 3.94 |
| 06 | දහම්පාසල් සංවර්ධනය | 201-2-2-8-2205 | ඌන සංවර්ධිත දහම් පාසල් සංවර්ධනය කිරීම | 14 | 4.3 | 4.3 |
| 07 | ආගමික මධ්‍යස්ථාන සංවර්ධනය | 101-2-6-8-2205 | බුද්ධ ශාසන ආගමික හා සංස්කෘතික කටයුතු ව්‍යාපෘති | 28 | 14.725 | 14.725 |
| 08 | ආගමික මධ්‍යස්ථාන සංවර්ධනය | 126-02-05-02-2205 | පිරිවෙන් අධ්‍යාපනය ශක්තිමත් කිරීමේ වැඩසටහන | 10 | 4.85 | 4.768 |
| 09 | සංචාරක කර්මාන්තය | 122-2-06-2202-017 | සංචාරක සංවර්ධන වැඩසටහන | 7 | 17.90 | 17.44 |
| 10 | වැව්ලි කලාපයේ වතු යටිතල පහසුකම් | 001-02-06-022-2509 | ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන | 11 | 16.717 | 15.878 |
| 11 | පාසල් ක්‍රීඩා සංවර්ධනය | 194-2-7-009-2509 | ක්‍රිකට් ක්‍රීඩා සංවර්ධන වැඩසටහන | 15 | 20.451 | 18.348 |
| 12 | ආපදා අවම කිරීමේ ව්‍යාපෘතිය | 103-02-17-02-2509 | ආපදා අවම කිරීමේ වැඩසටහන | 02 | 30.65 | 23.96 |
| 13 | පාසල් සංවර්ධනය | 001-02-06-023-2509 | එතන මඩල පාසල් ගොඩනැගිල්ල සංවර්ධනය | 01 | 44.7 | 16.914 |
| **මුළු එකතුව** | | | | **420** | **1295.44** | **1057.80** |

කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශයේ සෞභාග්‍යා සංවර්ධන කාර්යාංශය යටතේ සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන ගම්මාන 21ක ක්‍රියාත්මකවන අතර 2024 වර්ෂයේදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 04 ක් සඳහා රු. මි. 20.978 ක මුදලක් ආයෝජනය කරමින් නව ව්‍යාපෘති 13 ක් සාර්ථකව ක්‍රියාත්මක වේ.මෙම ව්‍යාපෘතීන්හි ප්‍රතිලාභීන් සංඛ්‍යාව 1,900 ක් පමණ වන අතර සෘජු හා වක්‍ර රැකියා 1,000ක් පමණ උත්පාදනය කිරීමට මං සලසා ඇත.

**පින්තූර 3.3 : කළුතර දිස්ත්‍රික්කයේ ව්‍යාපෘති හා වැඩසටහන්**





කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පොතුපිටිය කොහුකර්මාන්ත නිෂ්පාදන ව්‍යාපෘතිය



**පාලින්දනුවර කිතුල් නිෂ්පාදන ගම්මාන ව්‍යාපෘතිය**



බණ්ඩාරගම බට පැළලි නිෂ්පාදන ව්‍යාපෘතිය



දොඩන්ගොඩ ප්‍රා. ලේ. කො. වසන්හේන පාර (ඇලදූව දෙමළ ප්‍රාථමික විදුහල ඉදිරිපිට පාර- 799 ඒ ඇලදූව රු.මි..4.0



බෝඹුවල විතානවත්ත පාර සංවර්ධනය කිරිම රු.මි.3.0



දොඩන්ගොඩ තලේමුල්ල මාර්ගය කොන්ක්‍රීට් අතුරා සකස් කිරීම.
රු මි.3.0

## 3.4. මහනුවර දිස්ත්‍රික්කය

### i. හැඳින්වීම

**පසුබිම**

මධ්‍යම කඳුකරයේ වර්ග කිලෝමීටර් 1,940 ක භූමි ප්‍රමාණයක් වසා පැතිර ඇති උතුරු අක්ෂාංශ 60.56 ත් 70.29 හා නැගෙනහිර දේශාංශ 80.25 ත් අතර පිහිටා ඇත. මැතිවරණ කොට්ඨාශ 13 ක් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 20 ක් වන අතර ග්‍රාම නිලධාරි කොට්ඨාශ 1,188 කි. මුළු ජනගහණය 1,499,168.00 කි.

**දිස්ත්‍රික්කයේ ප්‍රධාන සංරචක**

**ප්‍රධාන සංරචක**

- දිස්ත්‍රික්කයේ ප්‍රධාන පරිපාලන ඒකකය ලෙස ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා අනෙකුත් රාජ්‍ය ආයතන සම්බන්ධීකරණය කරමින් මහජනයා වෙත සේවා සැපයීම සහ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

**විෂය පථය**

- ව්‍යවස්ථාපිත රාජකාරි ඇතුළු සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ අනෙකුත් රාජ්‍ය ආයතන හා රාජ්‍ය නොවන සංවිධාන සම්බන්ධීකරණය කරමින් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

**ක්‍රියාකාරිත්වය**

- දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඇතුළු ප්‍රා. ලේ. කා. 20 ක් මගින් පරිපාලනමය කටයුතු ඉටු කිරීම, සංවර්ධන හා සමාජ සුබ සාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ අවශ්‍ය තාක්ෂණික සහාය ලබාදීම, විගණන කටයුතු මගින් අභ්‍යන්තර පරිපාලනය ශක්තිමත් කිරීම, මූල්‍ය කළමනාකරණය.

**විශේෂ ළඟා කරගැනීම**

- පාන් පිටි භාවිතය අවම කරමින් මහනුවර කලාපයේ පාසල් 10 ක ආපන ශාලා සඳහා ගුණාත්මක හා පෝෂණයෙන් ඉහළ ආහාර හඳුන්වා දීම.
- රසකාරක වර්ණක අවම කර ගුණාත්මක බිස්කට් වර්ග හඳුන්වා දීම. (මුරුංගා කොළ යොදා ගනිමින් ඇණු හා සුදු ඇණු රසැති)
- අලුතින් ව්‍යාපාර ක්ෂේත්‍රයට ඇතුළු වන ව්‍යාපාර සඳහා දින 12 ක නේවාසික පුහුණුවක් ලබා දීම. සහස් උයන පරිශ්‍රයේ ව්‍යාපාරකයින් 30 දෙනෙකු සඳහා Hand Tech අලෙවි කුටිය ස්ථාපිත කිරීම.
- ඈත පිටිසර ප්‍රදේශයේ රෝගීන් සඳහා ටෙලි මෙඩිසින් වැඩසටහන පැවැත්වීම - (රෝගියා, විශේෂඥ වෛද්‍යවරයෙක්, සමාජ සේවා නිලධාරි, හෙද නිලධාරි, යටතේ සම්බන්ධීකරණය කරමින්)
- සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් ක්‍රමයට බඳවා ගැනීමේ ජාතික මට්ටමේ හතරවන ස්ථානය ලබාගැනීම

**අභියෝග**

- ආහාර නිෂ්පාදන අමුද්‍රව්‍ය මිල.
- අමුද්‍රව්‍ය සපයා ගැනීමේ ගැටලුව
- වෙළඳ පොළ තරඟය
- අන්තර් ජාල සම්බන්ධතා වල ඇති දුෂ්කරතා
- පුද්ගලයින්ගේ ආර්ථික දුෂකරතා

**අනාගත ඉලක්ක**

- මෙය මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 20 තුළ කොට්ඨාසයකට පාසල් 10 බැගින් පාසල් 200 ක ප්‍රචලිත කිරීම.
- රසකාරක හා වර්ණක නොමැති ආහාර ද්‍රව්‍ය හඳුන්වා දීම.
- දිස්ත්‍රික්කය පුරා නව ව්‍යාපාර 565 ආරම්භ කිරීම.
- ව්‍යාපාර සැලසුම් සකස් කර මූල්‍ය පහසුකම් ලබා ගැනීම සඳහා ප්‍රාදේශීය සංවර්ධන බැංකුව හා සම්බන්ධීකරණය
- ටෙලි මෙඩිසින් වෛද්‍ය සේවය සියලුම ප්‍රවාහන දුෂ්කරතා ඇති ගම්මාන වල ව්‍යාප්ත කිරීම.
- සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් ක්‍රමයට බඳවාගැනීමේ මෙම වර්ෂයේ වාර්ෂික ඉලක්කය 4500 සම්පූර්ණ කිරීම

**ii.ආයතනයේ මූල්‍ය ප්‍රගතිය (2024.01.01 සිට 2024.12.31 දක්වා)**

පුනරාවර්තන වියදම් - රු.මි. 3,307.18 ප්‍රාග්ධන වියදම් - රු.මි. 225.38

iii. **ආයතනයේ භෞතික ප්‍රගතිය (2024.01.01 සිට 2024.12.31 දක්වා)**

**වගුව 3.8 : මහනුවර දිස්ත්‍රික්කය -ක්‍රියාත්මක ප්‍රාග්ධන අරමුදල් ව්‍යාපෘතිවල ප්‍රගතිය (2024.01.01 සිට 2024.12.31 දක්වා)**

| # | සංරචක | අරමුදල් මූලාශ්‍රය | වැඩසටහන | ව්‍යාපෘති සංඛ්‍යාව | මුළු ඇස්තමේන්තු පිරිවැය (රු.මි.) | වියදම (රු.මි.) |
|---|---|---|---|---|---|---|
| 1 | පෙර ව්‍යාපෘති සම්පූර්ණ කිරීම | දේශීය | විමධ්‍යගත | 99 | 41.92 | 753.81 |
| 2 | සංචාරක | | | 02 | 0.99 | |
| 3 | ජල | | | 24 | 8.32 | |
| 4 | විදුලි | | | 02 | 0.98 | |
| 5 | ග්‍රාමීය මාර්ග | | | 879 | 383.77 | |
| 6 | වෙළඳපල සංවර්ධන | | | 06 | 1.40 | |
| 7 | අධ්‍යාපන හා සෞඛ්‍ය | | | 92 | 44.85 | |
| 8 | ක්‍රීඩාපිටි හා පුස්තකාල | | | 18 | 6.20 | |
| 9 | කුඩා වාරිමාර්ග | | | 36 | 13.73 | |
| 10 | කෘෂිකර්ම සංවර්ධන | | | 11 | 6.48 | |
| 11 | ප්‍රජා සංවර්ධන | | | 958 | 108.96 | |
| 12 | ආගමික හා සංස්කෘතික | | | 465 | 115.39 | |
| 13 | සමාජ ආරක්ෂණ | | | 03 | 0.80 | |
| 14 | දිළිඳු පවුල්නගා සිටුවීම/සවිබල ගැන්වීම | | | 00 | 0.00 | |
| 15 | ව්‍යවසායකත්ව සංවර්ධන | | | 17 | 5.15 | |
| 16 | ආපදා කළමනාකරණය | | | 06 | 4.31 | |
| 17 | ග්‍රාමීය ආර්ථික | | | 01 | 30.50 | |
| 18 | වෙනත් සංවර්ධන | | | 04 | 0.50 | |
| 19 | ජීවනෝපාය හා ආහාර සුරක්ෂිතතාවය | | කඳුකර දශකය | 134 | 38.21 | |
| 20 | අධ්‍යාපන | | | 306 | 258.75 | 1,844.69 |
| 21 | පානීය ජලය | | | 85 | 72.90 | |
| 22 | ප්‍රවේශ මාර්ග | | | 2,217 | 1,355.69 | |
| 23 | කෘෂි සහ සුළු වාරිමාර්ග | | | 191 | 104.29 | |
| 24 | විදුලිය | | | 209 | 101.98 | |
| 25 | දුරකථන හා අන්තර්ජාල පහසුකම් | | | 04 | 0.02 | |
| 26 | සෞඛ්‍ය හා සනීපාරක්ෂක | | | 106 | 70.86 | |
| 27 | පරිසර හා ආපදා කළමනාකරණ | | | 27 | 9.35 | |
| 28 | නිවාස වැඩිදියුණු කිරීම | දේශීය | | 224 | 69.44 | |
| 29 | ක්‍රීඩාගාර ඉදිකිරීම් | | | 01 | 20 | 99.8 |
| 30 | ධාවන තීරු 8 කින් යුත් ධාවන පථ | | කඳුකර දශකය - විශේෂ | 01 | 44 | |
| 31 | පැති බැම් | | | 01 | 35 | |

| # | සංරචක | අරමුදල් මූලාශ්‍රය | වැඩසටහන | ව්‍යාපෘති සංඛ්‍යාව | මුළු ඇස්තමේන්තු පිරිවැය (රු.මි.) | වියදම (රු.මි.) |
|---|---|---|---|---|---|---|
| 32 | ග්‍රාමීය මාර්ග | | ග්‍රාමීය මාර්ග සංවර්ධනවැඩසටහන | 214 | 137.99 | 78.28 |
| 33 | ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය | | ජනාධිපති කාර්යාල-විශේෂ බලපත්‍ර වැඩසටහන | 488 | 247.45 | 247 |
| 34 | පාසැල් ක්‍රීඩා පිටි සංවර්ධන | | ක්‍රීඩා පිටි සංවර්ධන වැඩසටහන | 13 | 19.5 | 19 |
| 35 | ක්‍රිකට් පැති විකට් ඉදිකිරීම | | ක්‍රීඩා පිටි සංවර්ධන වැඩසටහන | 37 | 53.92 | 53 |

**පින්තූර 3.4: මහනුවර දිස්ත්‍රික්කයේ ව්‍යාපෘති හා වැඩසටහන්**



ස්ථානය - 270 අම්පිටිය උඩගම දකුණ
මුළු පිරිවැය - රු.මි. 0.60
වියදම - රු.මි. 0.58
ආරම්භක දිනය - 2024.08.14
නිමකල දිනය - 2024.08.16



ස්ථානය - 282-පහළ ඊරියගම
මුළු පිරිවැය - රු.මි 1.00
වියදම - රු.මි. 0.97
ආරම්භක දිනය - 2024.07.21
නිමකල දිනය - 2024.08.11

**iv. රාජ්‍ය ආදායම් උපයා ගැනීමේ ව්‍යාපෘති**

**වගුව 3.9: මහනුවර දිස්ත්‍රික්කය - ආදායම් උපයා ගැනීම් 2024.01.01 සිට 2024.12.31 දක්වා**

| ආදායම් ශීර්ෂය | ආදායම (රු.මි.) |
|---|---|
| මුද්දර ගාස්තු | 0.089 |
| රජයේ ගොඩනැගිලි කුලී | 7.44 |
| ගිනි අවි හා පුපුරන ද්‍රව්‍ය ගාස්තු | 1.52 |
| පෞද්ගලික දැව ප්‍රවාහන ගාස්තු | 1.70 |
| විභාග ගාස්තු | 0.017 |
| මෝටර් රථ ආදායම | 23.41 |
| පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ ගාස්තු | 35.47 |
| අනෙකුත් බලපත්‍ර ගාස්තු | 18.18 |
| වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ගාස්තු | 132.83 |

## 3.5. මාතලේ දිස්ත්‍රික්කය

### i. හැඳින්වීම

**පසුබිම**

ශ්‍රී ලංකාවේ මධ්‍ය ප්‍රදේශය ලෙස සැලකෙන මාතලේ දිස්ත්‍රික්කයේ විශාලත්වයෙන් වර්ග කිලෝමීටර් 1,993 කි. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 11 කින් සමන්විත මෙම දිස්ත්‍රික්කයේ ඡන්ද කොට්ඨාශ 4 කි. එමෙන්ම ග්‍රාම නිලධාරි කොට්ඨාශ 539 කින් සැඳුම් ලබන මාතලේ දිස්ත්‍රික්කයේ ගම්මාන 1,483 ක් පුරා විහිදී පවතී. එහි සමස්ත ජනගහනය 596,568 ක් වන අතර සිංහල දෙමල හා මුස්ලිම් යන ප්‍රධාන ජනවර්ග 3 ක් ජීවත්වන බහුවාර්ගික දිස්ත්‍රික්කයකි.

**දිස්ත්‍රික්කයේ ප්‍රධාන සංරචක**

**ප්‍රධාන සංරචක**

- සුළු අපනයන භෝග සංවර්ධනය
- සංචාරක සංවර්ධනය
- එළවළු හා පළතුරු නිෂ්පාදන ප්‍රවර්ධනය
- ඛනිජ සම්පත්
- මානව සම්පත් සංවර්ධනය

**විෂය පථය**

- දිස්ත්‍රික් පරිපාලනය
- සංවර්ධන කාර්යයන් මෙහෙයවීම
- කෘෂිකාර්මික සංවර්ධනය
- ඉඩම් හා ආයතනික සංවර්ධනය
- ආපදා කළමනාකරණය
- කුඩා ව්‍යාපාර සංවර්ධනය
- ඉඩම් පරිහරණ සැලසුම් කිරීම
- සමෘද්ධි හා ජීවනෝපාය සංවර්ධනය
- මුල්‍ය ක්‍රියාවලිය හසුරුවාලීම
- කාර්ය මණ්ඩල පුහුණු කිරීම්
- අභ්‍යන්තර විගණනය

**ක්‍රියාකාරිත්වය**

- දිස්ත්‍රික් ලේකම්ගේ පරිපාලනය යටතේ ප්‍රාදේශීය ලේකම්වරුන් 11 දෙනෙකු හරහා බිම් මට්ටමට විහිදී ගිය යාන්ත්‍රණයක් පවතින අතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය තුල ආයතන, සැලසුම්, සංවර්ධන, කෘෂිකර්ම, කුඩා ව්‍යාපාර, ඉඩම් පරිහරණ, පුහුණු, ආපදා, අභ්‍යන්තර විගණන, ඉඩම් හා ගිණුම් අංශ ලෙස අංශ ප්‍රධානීන් හරහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ක්‍රියාත්මක වේ.

**විශේෂ ළඟා කරගැනීම**

- කොවිඩ් හා ආර්ථික අර්බුදයෙන් බිඳවැටීම් සමනය කරගැනීමට හැකිවීම හා කඩිනමින් යථා තත්වයට පත්වීම.
- සංචාරක සංවර්ධනය ඉහල නැංවීම
- කෘෂිකාර්මික ඉපැයුම් ඉහල යාම
- දිස්ත්‍රික්කයේ අධ්‍යාපන මට්ටම ඉහල යාම
- ක්‍රීඩා අංශයේ ජයග්‍රහණයන්

**අභියෝග**

- කෘෂි නිෂ්පාදන සඳහා වනජීවීන්ගෙන් සිදුවන හානි ( උදා. වන අලි, රිලවුන් ගැටළුව)
- දිස්ත්‍රික්කයේ යටිතල පහසුකම් සංවර්ධනය අවම මට්ටමක පැවතීම
- කෘෂිකාර්මික නිපැයුම් සඳහා වෙළඳපල ගැටළු
- නගර සැලසුම් විධිමත් නොවීම
- මත් උවදුර/බෝ නොවන රෝග සීඝ්‍රයෙන් පැතිර යාම
- වකුගඩු රෝග / ළමා මන්ද පෝෂණය
- ඩෙංගු හා වසංගත රෝග ව්‍යාප්තිය
- අධ්‍යාපනයේ මානව හා භෞතික සම්පත් හිඟකම

**අනාගත ඉලක්ක**

- කෘෂි අපනයන ඉහල නැංවීම
- සංචාරක කර්මාන්ත ප්‍රවර්ධනය
- තිරසර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීම
- කෘෂි හා කාර්මික නිෂ්පාදන සඳහා විධිමත් වෙළඳපල සංවර්ධනය
- ආහාර සුරක්ෂිතතාව ඇති කිරීම
- යටිතල පහසුකම් සංවර්ධනය
- අධ්‍යාපන හා සෞඛ්‍ය පහසුකම් සංවර්ධනය
- මන්ද පෝෂණය අවම කිරීම
- බෝවන හා බෝ නොවන රෝග පාලනය

**ii.ආයතනයේ මූල්‍ය ප්‍රගතිය (2024.01.01 සිට 2024.12.31 දක්වා)**

පුනරාවර්තන වියදම් - රු. 3,402.868 ප්‍රාග්ධන වියදම් - රු. 2,216.048

**වගුව 3.10: මාතලේ දිස්ත්‍රික්කය - 2025 වර්ෂය සඳහා අපේක්ෂිත අයවැය යෝජනා (සාරාංශගතව)**

| # | ව්‍යාපෘතියේ නම | ඇස්තමේන්තුගත මුළු පිරිවැය (රු.මි.) | 2025 අයවැයෙන් අපේක්ෂිත වෙන් කිරීම් (රු.මි.) |
|---|---|---|---|
| 01. | නව නිල නිවාස සංකීර්ණ ඉතිරි වැඩ නිම කිරීම - පියවර 2 | 50.00 | 50.00 |
| මුළු එකතුව | | **50.00** | **50.00** |

**iii. ආයතනයේ භෞතික ප්‍රගතිය**

**වගුව 3.11: මාතලේ දිස්ත්‍රික්කය - ක්‍රියාත්මක ප්‍රාග්ධන අරමුදල් ව්‍යාපෘතිවල ප්‍රගතිය (2024.01.01 සිට 2024.12.31 දක්වා)**

| # | සංරචකය | අරමුදල් මූලාශ්‍රය | වැඩසටහන | ව්‍යාපෘති සංඛ්‍යාව | මුළු පිරිවැය (රු.මි) | වියදම (රු.මි) |
|---|---|---|---|---|---|---|
| 1 | සංචාරක සංවර්ධනය | ජනාධි.ලේ.කා | විමධ්‍යගත | 3 | 1.8 | 0.38 |
| 2 | පානීය ජල පහසුකම් | ජනාධි.ලේ.කා/ නාගරික සං හා නිවා.අමා/ ජල සම්. හා වතු යටි.පහ.අමා | විමධ්‍යගත /කඳුකර දශ. /ප්‍රාදේ.සං.වැඩසටහන /බවුසර් මඟින් ජලය ලබා දීමේ වැඩ. | 33 | 38.92 | 35.38 |
| 3 | විදුලිය | ජනාධි.ලේ.කා/ නාගරික සං හා නිවා.අමා/ සෞ. අමා. | විමධ්‍යගත / කඳුකර දශ. / ප්‍රාදේ.සං.වැඩසටහන /ප්‍රතිආශ්‍රතිකරණ ජල පෙරණ පද්ධතිවල විදුලි බිල්පත් පියවීම | 84 | 32.19 | 50.59 |
| 4 | ග්‍රාමීය මාර්ග | ජනාධි.ලේ.කා/ නාගරික සං හා නිවා.අමා/ ප්‍රවා. හා මහා. අමා./ජල සම්. හා වතු යටි.පහ.අමා | විමධ්‍යගත / කඳුකර දශ. / ප්‍රාදේ.සං.වැඩසටහන /ග්‍රාමීය මාර්ග වැඩ./ වතු යටිතල. | 684.0 | 592.37 | 550.71 |
| 5 | වෙළඳපල සංවර්ධනය | ජනාධි.ලේ.කා | විමධ්‍යගත | 1 | 8.5 | 8.4 |
| 6 | අධ්‍යාපන හා සෞඛ්‍ය | ජනාධි.ලේ.කා/ නාගරික සං හා නිවා.අමා/ ජල සම්. හා වතු යටි.පහ.අමා | විමධ්‍යගත / කඳුකර දශ. /ප්‍රා.සං.වැඩසටහන/ වතු යටිතල. | 223 | 459.17 | 388.21 |
| 7 | ග්‍රාමීය ක්‍රීඩාපිටි | ජනාධි.ලේ.කා | විමධ්‍යගත / ප්‍රා.සං.වැඩසටහන | 22 | 24.92 | 23.76 |
| 8 | සුළු වාර්මාර්ග | ජනාධි.ලේ.කා/ නාගරික සං හා නිවා.අමා/ | විමධ්‍යගත වැඩ./ කඳුකර දශ. /ප්‍රා.සං.වැඩසටහන | 70 | 82.78 | 73.98 |
| 9 | කෘෂිකාර්මික සංවර්ධනය | ජනාධි.ලේ.කා | විමධ්‍යගත /ප්‍රා.සං.වැඩසටහන | 7 | 1.4 | 1.77 |
| 10 | පොදු පහසුකම් සංවර්ධනය | ජනාධි.ලේ.කා/ නාගරික සං හා නිවා.අමා/ ජල සම්. හා වතු යටි.පහ.අමා | විමධ්‍යගත / කඳුකර දශ. / ප්‍රා.සං.වැඩසටහන | 7 | 61.35 | 49.79 |
| 11 | ආගමික හා සංස්කෘතික සංවර්ධනය | ජනාධි.ලේ.කා/ ජල සම්. හා වතු යටි.පහ.අමා | විමධ්‍යගත /ප්‍රා.සං.වැඩසටහන/ වතු යටිතල./කෝවිල් සං.වැඩ. | 343 | 109.12 | 97.69 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 12 | දිළිඳු පවුල් සංවර්ධනය | ජනාධි.ලේ.කා/ නාගරික සං හා නිවා.අමා | විමධ්‍යගත/ කඳුකර දශ. /ප්‍රා.සං.වැඩසටහන | 14 | 21.49 | 20.28 |
| 13 | ව්‍යවසායකත්ව සංවර්ධනය | ජනාධි.ලේ.කා | විමධ්‍යගත | 1,072 | 121.95 | 104.7 |
| 14 | ස්වභාවික ආපදා | නාගරික සං හා නිවා.අමා | කඳුකර දශ. | 6 | 10.36 | 9.99 |
| 15 | ග්‍රාමීය ආර්ථිකය | ජනාධි.ලේ.කා/ කාන්තා ළමා කට. හා සමාජ සවි. ගැන්. අමා | විමධ්‍යගත / සෞභාග්‍යා නිෂ්. වැඩ. | 8 | 3.22 | 1.65 |
| 16 | නිවාස සංවර්ධනය | නාගරික සං හා නිවා.අමා/ ජල සම්. හා වතු යටි.පහ.අමා | කඳුකර දශ. /වතු යටිතල./ ගම්පෙරලිය සෙවිලි තහඩු වැඩ. | 7 | 5.58 | 5.29 |
| 17 | වෙනත් | ජනාධි.ලේ.කා | විමධ්‍යගත /ප්‍රා.සං.වැඩසටහන | 14 | 8.75 | 5.16 |
| **මුළු එකතුව** | | | | **2,598** | **1,583.87** | **1,427.73** |

**පින්තූර 3.5: මාතලේ දිස්ත්‍රික්කයේ ව්‍යාපෘති හා වැඩසටහන්**

**කඳුකර දශකය 2024 -2033 දශවිධ විශේෂ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන**



පෙර තත්ත්වය



පසු තත්ත්වය

ව්‍යාපෘතියේ නම :- බඹරගහවත්ත කණිෂ්ඨ විද්‍යාලයේ නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම
ස්ථානය :- බඹරගහවත්ත
මුළු පිරිවැය : රු.මි. 0.80
වියදම :- රු.මි. 6.37
ආරම්භක දිනය :- 2024.06.05
නිමකල දිනය :- 2024.07.29

**විමධ්‍යගත අයවැය වැඩසටහන - 2024**



පෙර තත්ත්වය



පසු තත්ත්වය

ව්‍යාපෘතියේ නම :- කනන්ගමුව පුරාණ විහාරයේ දහම් පාසල් ගොඩනැගිල්ලේ සංවර්ධන කටයුතු සිදු කිරීම
ස්ථානය :- කනන්ගමුව
මුළු පිරිවැය :- රු.මි. 2.00
වියදම :- රු.මි. 1.66
ආරම්භක දිනය :- 2024.07.19
නිමකල දිනය :- 2024.08.22

**iv. රාජ්‍ය ආදායම් උපයා ගැනීමේ ව්‍යාපෘති**

**වගුව 3.12: මාතලේ දිස්ත්‍රික්කය - රාජ්‍ය ආදායම් උපයා ගැනීම් 2024.01.01 සිට 2024.12.31 දක්වා**

| ආදායම් ශීර්ෂය | ආදායම (රු.මි) | ආදායම් ශීර්ෂය | ආදායම (රු.මි) |
|---|---|---|---|
| දැව ප්‍රවාහන ගාස්තු | 0.76 | රාජ්‍ය ආදායම් | 13.69 |
| මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ බලපත්‍ර ගාස්තු | 0.62 | ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව යටතේ අයකරගත් ගාස්තු | 1.15 |
| ස්වදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ අයකරගත් ගාස්තු | 0.99 | පුද්. ලියාපදිංචි කිරීමේ පනත යටතේ ගාස්තු | 11.43 |
| නිල නිවාස කුලී | 6.30 | වැන්දඹු හා අනත්දරු දායක මුදල් | 68.34 |
| ඉඩම් හා අනෙකුත් බදු | 30.00 | භාණ්ඩ වෙන්දේසි මුදල් | 0.16 |
| විභාග ගාස්තු | 0.021 | දඩ මුදල් | 0.043 |
| මෝටර් රථ පනත යටතේ අයකරගත් ගාස්තු | 8.64 | රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි ගාස්තු | 0.034 |
| පොලී ආදායම් | 0.84 | මුද්දර ගාස්තු | 0.012 |
| **මුළු එකතුව** | | | **113.088** |

## 3.6. නුවරඑළිය දිස්ත්‍රික්කය

### i. හැඳින්වීම

**පසුබිම**

ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 ක් හා උපකාර්යාල 3 කින් සමන්විත දිස්ත්‍රික්කයෙහි ග්‍රාමනිලධාරී කොට්ඨාස 491 ක් වේ. කෘෂිකාර්මික කටයුතු සහ වාණිජ තේ වගාව දිස්ත්‍රික්කයේ ප්‍රධාන ආර්ථික කටයුතු වශයෙන් හඳුන්වා දිය හැකි ය.

ප්‍රධාන සංරචක වන්නේ දිස්ත්‍රික් හා ප්‍රාදේශීය පාලනයයි. දිස්ත්‍රික්කයේ ප්‍රමුඛ පරාස ලෙස දිස්ත්‍රික්කය තුළ රාජ්‍ය, පළාත් සභා පළාත් පාලන ආයතන, පෞද්ගලික ආයතන සම්බන්ධීකරණය තුළින් රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, රජය වෙනුවෙන් ආදායම් රැස් කිරීම සහ විමධ්‍යගත හා අනිකුත් මූලාශ්‍ර මඟින් ලැබෙන අරමුදල් යොදා ගනිමින් සංවර්ධනය කටයුතු ක්‍රියාත්මක කිරීම හා පුහුණුව හා සංවර්ධනය තුළින් රාජ්‍ය සේවයේ ඵලදායිතාවය ඉහළ නැංවීම ආදිය දැක්විය හැකිය.

**දිස්ත්‍රික්කයේ ප්‍රධාන සංරචක**

**ප්‍රධාන සංරචක**

- දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ කාර්ය මණ්ඩලයේ අභ්‍යන්තර පරිපාලනය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 හා උප කාර්යාල 03 ට අදාලව පාලන කටයුතු මෙහෙයවීම.
- සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- කාර්යක්ෂම මානව සම්පත් කළමනාකරණයක් උදෙසා කාර්ය මණ්ඩල පුහුණුව

**අභියෝග**

- දිස්ත්‍රික්කය තුළ වාසස්ථාන සඳහා සුදුසු ඉඩම් හිඟය
- ස්වභාවික ආපදා
- මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් සිදුවන විනාශය හා ජල පෝෂක ප්‍රදේශ විනාශය
- දිස්ත්‍රික් හා ප්‍රාදේශීය රාජකාරි සඳහා ප්‍රමාණවත් හොඳ තත්වයේ වාහන හිඟය
- සංවර්ධන ව්‍යාපෘති සඳහා අවශ්‍ය තාක්ෂණික නිළධාරීන්ගේ, (තාක්ෂණික) හිඟය

**අනාගත ඉලක්ක**

- දිස්ත්‍රික්කය තුළ කෝපි වගාව ප්‍රචලිතකර විදේශ විනිමය අවස්ථා ඉහළ නැංවීම.
- දිස්ත්‍රික්කය තුළ සංචාරක අවස්ථා පුළුල් කිරීම සඳහා මාර්ගෝපදේශ සංග්‍රහයක් එළි දැක්වීම.
- නව ව්‍යවසායකයින් බිහි කිරීම
- නුවරඑළිය දිස්ත්‍රික්කය මන්ද පෝෂණ මට්ටමින් ඉහළම අගයක පවතින බැවින් ජනතාවගේ පෝෂන මට්ටම ඉහළ නැංවීම.
- නුවරඑළියට වසන්තය වැඩසටහන යටතේ 2025 වර්ෂය වනවිට ආර්ථික සමෘද්ධිය ලඟා කරගනිමින් ජනතාව සතුටින් ජීවත්වන දිස්ත්‍රික්කයක් බවට පත් කිරීම

### ii.ආයතනයේ මූල්‍ය ප්‍රගතිය

**(2024.01.01 සිට 2024.12.31 දක්වා)**

පුනරාවර්තන වියදම් - රු.මි. 1,795.64
ප්‍රාග්ධන වියදම් - රු.මි. 41.45

3.6.නුවරඑළිය දිස්ත්‍රික්කයේ ව්‍යාපෘති හා වැඩසටහන්



වැතලාව වසමේ පබේහින්න මාර්ගයේ ඉතිරි කොටස සංවර්ධනය කිරීම
ඇස්තමේන්තු මුදල - රු.මි. 0.6
වියදම - රු.මි.0.51
ආරම්භ දිනය -2024-03-12
නිම කළ දිනය-2024-06-01

**වගුව 3.13: නුවරඑළිය දිස්ත්‍රික්කය- 2025 වර්ෂය සඳහා අපේක්ෂිත අයවැය යෝජනා. (සාරාංශය)**

| ව්‍යාපෘතියේ නම | ඇස්තමේන්තුගත මුළු පිරිවැය (රු.මි) | අපේක්ෂිත වෙන් කිරීම් (රු.මි) |
|---|---|---|
| අනෙකුත් ප්‍රාග්ධන වියදම් | 106.8 | 106.8 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පුනරාවර්තන වියදම් | 1560.4 | 1560.4 |
| **එකතුව** | **1,667.2** | **1,667.2** |

### iii. ආයතනයේ භෞතික ප්‍රගතිය (2024.01.01 සිට 2024.12.31 දක්වා)

ආයතනයේ සාමාන්‍ය කාර්යයන්ගේ ප්‍රගතිය :- 2023 වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට පෙර ලබා දීම

**වගුව 3.16: නුවරඑළිය දිස්ත්‍රික්කය -ක්‍රියාත්මක ප්‍රාග්ධන අරමුදල් ව්‍යාපෘතිවල ප්‍රගතිය**

| # | සංරචකය | ව්‍යාපෘති සංඛ්‍යාව | මුළු පිරිවැය (රු.මි.) | වියදම (රු.මි.) |
|---|---|---|---|---|
| 1 | විමධ්‍යගත අයවැය වැඩසටහන | 1,733 | 610.60 | 538.12 |
| 2 | ග්‍රාමීය මාර්ග | 10 | 34.55 | 30.05 |
| 3 | වතු යටිතල පහසුකම් | 98 | 112 | 42 |
| 4 | ආගමික හා සංස්කෘතික සංවර්ධනය | 56 | 33.19 | 31.02 |
| 5 | කඳුකර දශකය | 617 | 538.64 | 472.79 |
| 6 | සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය | 6 | 39.22 | 32.90 |
| 7 | සෞභාග්‍යා | 1 | 0.60 | 0.55 |
| **මුළු එකතුව** | | **2,521** | **1,368.80** | **1,147.43** |



**තිස්පනේ කන්ද වසමේ ප්‍රධාන මාර්ගයේ සිට වෛනමලේ දෙසට පිවිසෙන මාර්ගයේ ආරම්භක කොටස සංවර්ධනය**
ඇස්තමේන්තු මුදල - රු.මි. 0.6
වියදම - රු.578,347.52
ආරම්භ දිනය -2024-03-12
නිම කළ දිනය-2024-03.27

### iv. රාජ්‍ය ආදායම් උපයා ගැනීමේ ව්‍යාපෘති

**වගුව 3.15: නුවරඑළිය දිස්ත්‍රික්කය -ආදායම් උපයා ගැනීම් 2024.01.01 සිට 2024.12.31 දක්වා**

| # | විස්තරය | ආදායම් සංකේතාංකය | ආදායම (රු.මි.) |
|---|---|---|---|
| 01 | පෞද්ගලික දැව ප්‍රවාහනය | 1003-07-03 | 0.39 |
| 02 | රජයේ ගොඩනැගිලි කුලී | 2002-01-01 | 11.18 |
| 03 | 1968 අංක 32 දරණ පුද්ගලයින් ලි.ප. කිරීමේ පනත යටතේ ගාස්තු | 2003-02-03 | 18.94 |
| 04 | මෝටර් රථ ප්‍රවාහන පනත යටතේ අය කරනු ලබන ගාස්තු හා අනෙකුත් ලැබීම් | 2003-02-14 | 1.87 |
| 05. | බලපත්‍ර ගාස්තු හා වෙනත් | 1003-07-99 | 7.012 |
| 06. | රජයේ වත්කම් වලින් ලැබෙන අදායම් - වෙනත් | 2002-02-99 | 5.65 |
| 07. | විකුණුම් හා ගාස්තු විවිධ | 2003-02-99 | 112.28 |
| 08. | අනෙකුත් ලැබීම් | 2003-99-00 | 5.28 |
| 09. | මුද්දර ගස්තු | 1002-07-00 | 0.029 |
| 10. | මධ්‍යම රජය | 2004.01.00 | 46.15 |
| 11. | රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයට අදාල බලපත්‍ර ගාස්තු | 1003-07-05 | 0.37 |
| 12. | ප්‍රාග්ධන වත්කම් විකිණීම | 2006-02-02 | 0.078 |
| 13. | විභාග හා අනෙකුත් ගාස්තු | 2003-02-13 | 0.0005 |
| **මුළු එකතුව** | | | **209.280** |



සමර්සෙට් දමිල විද්‍යාලය වැසිකිලි පහසුකම් ඇති කිරීම, ජල පහසුකම් සැපයීම හා කාණු පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම
ඇස්තමේන්තු මුදල - රු.මි. 1.5
වියදම - රු. මි. 1.455
ආරම්භ දිනය -2024-03-12
නිම කළ දිනය-2024-08-11



**උඩමකුරුප්ප**
**ව්‍යාපෘතියේ නම - මහපිටිය මාර්ගය සංවර්ධනය කිරීම**
ඇස්තමේන්තු මුදල - රු.මි. 2
වියදම - රු. මි. 1.87
ආරම්භ දිනය -2024-03-29
නිම කළ දිනය-2024-05-20

## 3.7. ගාල්ල දිස්ත්‍රික්කය

### i. හැඳින්වීම

**පසුබිම**

ගාල්ල දිස්ත්‍රික්කය, වර්ග කිලෝමීටර 1,651.6 භූමි ප්‍රමාණයකින් යුක්ත වන අතර, ඡන්ද කොට්ඨාස ගණන 10 ක් ද, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 22 ක් ද, ග්‍රාම නිලධාරී කොට්ඨාස 895 ක් ද වන අතර ජනගහනය 1,138,686 ක් වේ. බෙන්තොට සිට ගෝවියාපාන දක්වා කිලෝමීටර 73 ක සංචාරක වශයෙන් අකර්ෂණීය සුන්දර වෙරළ තීරයක් ඇත.

**දිස්ත්‍රික්කයේ ප්‍රධාන සංරචක**

**ප්‍රධාන සංරචක**

- දිස්ත්‍රික් හා ප්‍රාදේශීය පරිපාලන කටයුතු නියාමනය කිරීම.
- ප්‍රජා පාදක සංවර්ධන හා සුභසාධන කටයුතු පුරෝකථනය, සැලසුම් ,කිරීම ක්‍රියාත්මක කිරීම
- පසුවිපරම් කිරීමට අදාළ කළමනාකරණ කටයුතු.
- පසුවිපරම් කිරීමට අදාළ කළමනාකරණ කටයුතු
- ආපදා කළමනාකරණ කටයුතු
- දිස්ත්‍රික් සමස්ත සංවර්ධන ප්‍රගතිය සම්බන්ධීකරණය කිරීම

**විෂය පථය**

- දිස්ත්‍රික්කයේ පරිපාලන කටයුතු
- ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමේ සංවර්ධන කටයුතු
- ප්‍රජා පාදක සුභ සාධන කටයුතු
- මහජන අවශ්‍යතා ඉටුවන පරිදි සංවර්ධන හා සුභසාධන කටයුතු මෙහෙයවීම හා කළමනාකරණය
- ළමා හා වනිතා සුභ සාධන කටයුතු
- නීතිය හා සාමය පවත්වා ගැනීමට අවශ්‍ය සම්බන්ධීකරණය
- පරිසර නියාමනය හා ආපදා කළමනාකරණය

**ක්‍රියාකාරීත්වය**

- ප්‍රාදේශීය ලේකම් කාර්යාල 22 මඟින් පරිපාලනමය, සංවර්ධන හා සුභ සාධන කාර්යයන් ඉටු කිරීම.

**විශේෂ ළඟා කරගැනීම**

- ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් පවත්වන ලද හොඳම භාවිතයන් සඳහා වූ පර්යේෂණ පත්‍රිකා එළිදැක්වීමේ දී "තිරසර ජීවනෝපායක් සඳහා වූ තිරසර ව්‍යවසායකත්වය" තේමා කරමින් මානව හැකියා පෝෂණය කිරීම අංශයෙන් ඉදිරිපත් කළ දිස්ත්‍රික් ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන සඳහා තෙවන ස්ථානය හිමිවීම
- විමධ්‍යගත සංවර්ධන වැඩසටහන යටතේ රු.මි.516 ක ප්‍රතිපාදන වලට අදාළව ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති 1,576 කින් 91% ක භෞතික ප්‍රගතියක් ලබා කර ගැනීම
- කඳුකර දශකය සංවර්ධන වැඩසටහන යටතේ රු.මි.400 ක ප්‍රතිපාදන වලට අදාළව ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති 559 කින් 78% ක භෞතික ප්‍රගතියක් ලබා කර ගැනීම

**අභියෝග**

- දිස්ත්‍රික්කයේ සියළුම ජනතාවගේ ජීවනෝපාය මාර්ග සුරක්ෂිත කිරීම
- ප්‍රාදේශීය නිෂ්පාදන හා ව්‍යවසායකත්වය වැඩි දියුණු කිරීමට වෙළඳපොළ අවස්ථා නිර්මාණය කිරීම
- මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහිවීම වළක්වාලීම
- සංචාරක කර්මාන්තය ආශ්‍රිත යටිතල පහසුකම් සම්පාදනය

**අනාගත ඉලක්ක**

- ඒකාබද්ධ ප්‍රවේශයක් තුළින් දිස්ත්‍රික්කයේ කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායක ප්‍රවර්ධනය කිරීම
- පහළ ආදායම් ලබන ජනතාවගේ මූලික අවශ්‍යතා සපයමින් ඔවුන් විසින් ජාතික ආර්ථිකයට දක්වන දායකත්වය ඉහළ නංවාලීමට ක්‍රියා කිරීම
- සෑම ආර්ථික ඒකකයක්ම ප්‍රවර්ධනය කර ජාතික ආර්ථිකයට දිස්ත්‍රික්කයේ දායකත්වය ඉහළ නංවාලීම

## ii.ආයතනයේ මූල්‍ය ප්‍රගතිය (2024.01.01 සිට 2024.12.31 දක්වා)

පුනරාවර්තන වියදම් - රු. මි. 3,604 ප්‍රාග්ධන වියදම් - රු. මි. 99.4

## iii. ආයතනයේ භෞතික ප්‍රගතිය

**වගුව 3.16: ගාල්ල දිස්ත්‍රික්කය - ක්‍රියාත්මක ප්‍රාග්ධන අරමුදල් ව්‍යාපෘතිවල ප්‍රගතිය (2024.01.01 සිට 2024.12.31 දක්වා)**

| # | සංරචකය | අරමුදල් මූලාශ්‍ය | වැඩ සටහන | ව්‍යාපෘති සංඛ්‍යාව | මුළු ඇස්තමේන්තු පිරිවැය (රු.මි) | වියදම (රු.මි) |
|---|---|---|---|---|---|---|
| 1 | ප්‍රවේශ මාර්ග | ශ්‍රී ලං ආ | විමධ්‍යගත අයවැය/ කඳුකර දශකය/ ග්‍රාමීය මාර්ග/ විමධ්‍යගත (විශේෂ)/ පිරිවෙන් සංවර්ධන වැඩසටහන/ කර්මාන්ත අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරන සංවර්ධන ව්‍යාපෘති | 1180 | 706.77 | 687.99 |
| 2 | ග්‍රාමීය පාලම් | | | 10 | 34.42 | 33.60 |
| 3 | ග්‍රාමීය විදුලි දිගු | | | 2 | 0.11 | 0.05 |
| 4 | සනීපාරක්ෂක | | | 21 | 6.87 | 6.63 |
| 5 | ක්‍රීඩා පිටි | | | 31 | 44.22 | 35.73 |
| 6 | සුළු වාරිමාර්ග | | | 18 | 10.49 | 9.93 |
| 7 | ග්‍රාමීය ආර්ථික යටිතල පහසුකම් | | | 53 | 24.45 | 23.23 |
| 8 | ආගමික මධ්‍යස්ථාන සංවර්ධනය | | | 282 | 79.17 | 73.09 |
| 9 | සමාජ සුබ සාධනය | | | 936 | 163.99 | 157.59 |
| 11 | සූර්ය පැනල/ විදුලිය | | | 4 | 11.64 | 11.49 |
| 12 | ග්‍රාමීය ජල සැපයුම් | | | 22 | 6.26 | 5.94 |
| 13 | නිල සෙවන | | | 91 | 40.41 | 40.05 |
| 14 | වෙනත් යටිතල පහසුකම් | | | 112 | 144.63 | 118.99 |
| **මුළු එකතුව** | | | | **2,762** | **1,273.43** | **1,204.3** |

## iv. රාජ්‍ය ආදායම් උපයා ගැනීමේ ව්‍යාපෘති

**වගුව 3.17: ගාල්ල දිස්ත්‍රික්කය - ආදායම් උපයා ගැනීම් 2024.01.01 සිට 2024.12.31 දක්වා**

| ආදායම් ශීර්ෂය | | ආදායම (රු.මි.) |
|---|---|---|
| 10.02.07.00 | මුද්දර ගාස්තු | 0.014 |
| 10.03.07.03 | පෞද්ගලික දැව ප්‍රවාහන ගාස්තු | 0.747 |
| 10.03.07.05 | මහජන ආරක්ෂක නීතිය හා සාමය පිළිබඳ බලපත්‍ර | 0.633 |
| 10.03.07.09 | කාබන් බද්ද | 0.224, |
| 10.03.07.99 | අනෙකුත් බලපත්‍ර ගාස්තු | 13.256 |
| 20.02.01.01 | ගොඩනැගිලි කුළී | 3.576, |
| 20.02.02.99 | පොළිය වෙනත් | 15.881 |
| 20.03.02.03 | පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ පණත යටතේ ගාස්තු | 22.916 |
| 20.03.02.13 | විභාග හා අනෙකුත් ගාස්තු | 0.021, |
| 20.03.02.14 | මෝටර් රථ පණත යටතේ ගාස්තු | 9.562 |
| 20.03.02.99 | විවිධ | 0.600 |
| 20.03.99.00 | අනෙකුත් ලැබීම් | 231.675 |
| 20.04.01.00 | සමාජ ආරක්ෂණ දායක මුදල් | 130.660 |
| 20.06.02.02 | ප්‍රාග්ධන වත්කම් විකිණීම (අනෙකුත්) | 0.323, |
| **මුළු එකතුව** | | **430.094** |

3.7. ගාල්ල දිස්ත්‍රික්කයේ ව්‍යාපෘති හා වැඩසටහන්



වාඩුවැලිවිටිය දකුණ සණස
අසලසිට කැකුලන්විල
මාර්ගය පෙර සවි ගල් ඇතිරීම
ස්ථානය :- වැලිවිටිය දිවිතුර
මුළු පිරිවැය :-රු.මි.0.58
වියදම :- රු.මි.0.56
2024.05.13-2024.06.25



අමුන්දරඇළ ටකරන්වත්ත
බෝක්කුව අසල සිට ඕමතු ඇළ
දක්වා ප්‍රතිසංස්කරණය කිරීම
ස්ථානය :- ඇල්පිටිය
මුළු පිරිවැය :-රු.මි.0.58
වියදම :- රු.මි.0.55
2024.04.26-2024.05.16



ලලිත් වික්‍රමසිංහ මාවතේ
ඔබවත්ත කොටසෙහි කාණු
පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම
ස්ථානය :- හික්කඩුව
මුළු පිරිවැය :-රු.මි.0.92
වියදම :- රු.මි. 0.87
2024.06.12-2024.06.20



පින්නදූව හෙළ බොජුන්හල
සංවර්ධනය කිරීම (පොළව සැකසීම/
වතුර ටැංකිය හා ආධාරකය ඉදිකිරීම/
තීන්ත ආලේප කිරීම/ මිදුල
ගල් ඇල්ලීම
ස්ථානය :- අක්මීමණ
මුළු පිරිවැය :-රු.මි.4.0
වියදම :- රු.මි. 4.0
2024.03.20-2024.07.15

## 3.8. මාතර දිස්ත්‍රික්කය

### i. හැඳින්වීම

**පසුබිම**

දකුණු ලක නිල්වලා නදිය අසබඩ මහ සයුරට මායිම්ව පිහිටි අභිමානනීය ඉතිහාසයකට උරුමකම් කියන මාතර දිස්ත්‍රික්කය ගාල්ල හා හම්බන්තොට දිස්ත්‍රික්කයන්ට මැදිව පිහිටා ඇති වර්ග හෙක්ටයාර 128,300 කින් සමන්විත මාතර දිස්ත්‍රික්කය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 16 කින් හා ග්‍රාමනිලධාරි කොට්ඨාශ 650 කින් සමන්විත වන අතර 2023 වර්ෂයේ මුළු ජනගහනය 921,310 වේ. මාතර දිස්ත්‍රික්කයේ ප්‍රධාන ජීවනෝපායන් ලෙස ධීවර, කෘෂිකර්මාන්තය, අපනයන බෝග වර්ග වන තේ, පොල් හා කුරුඳු වගාවන් පෙන්වා දිය හැකිය.

**දිස්ත්‍රික්කයේ ප්‍රධාන සංරචක**

**ප්‍රධාන සංරචක**

- කාර්යක්ෂම සහ ඵලදායි දිස්ත්‍රික් පරිපාලන ක්‍රමයක් පවත්වාගෙන යාම.
- වගකීම් සහගතව හා විචක්ෂණශීලි ලෙස සම්පත් භාවිතා කරමින් අපක්ෂපාතිත්වය, විනිවිදභාවය වැනි හර පද්ධති රාජ්‍ය සේවය තුල ස්ථාපිත කිරීම.

**විෂය පථය**

- දිස්ත්‍රික්කයේ ප්‍රධානියා ලෙස ක්‍රියාකරමින් දිස්ත්‍රික් බල ප්‍රදේශය තුල ජීවත්වන ජනතාවගේ ආරක්ෂාව තහවුරු කිරිමට ක්‍රියා කිරිම, විමධ්‍යගත අයවැය වැඩසටහන ක්‍රියාත්මක කිරීම හා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ ලේකම් වශයෙන් ක්‍රියාකරමින් දිස්ත්‍රික්කයේ සංවර්ධන කටයුතු සංවිධානය කිරිම, ක්‍රියාත්මක කිරිම හා අධීක්ෂණය කිරීම.

**ක්‍රියාකාරිත්වය**

- ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 16 ක් සම්බන්ධීකරණය කරමින් විචක්ෂණශීලිව සම්පත් භාවිතා කරමින් අපක්ෂපාතීත්වය රැකගනිමින් ජනතා තෘප්තිය ඉහළ නංවන අයුරින් කටයුතු කිරීම.
- දිස්ත්‍රික් බල ප්‍රදේශය තුල සියළුම අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වල පරිපාලන ප්‍රධානියා ලෙස ක්‍රියාකරමින් එම ආයතන වල අරමුණු පරමාර්ථයන් හා කාර්යයන් ඉටුවන පරිදි සම්බන්ධිකරණ කටයුතු කිරිම.
- දිස්ත්‍රික්කයේ සියළුම සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරිම හා අධීක්ෂණය කිරිම.

**අභියෝග**

- දිස්ත්‍රික්කය තුළ සේවා වියුක්තිය හා දිළිඳුභාවය අවම කිරිම.

**අනාගත ඉලක්ක**

- දිස්ත්‍රික් ප්‍රජාව, කෘෂි හා නිෂ්පාදන ආර්ථික රටාවන් සඳහා නැඹුරුකිරීම තුලින් ජීවන තත්වය උසස් කිරිම හා සේවා වියුක්තිය අවම කිරීම.
- මානව සම්පත උපරිම ලෙස ඵලදායිව හසුරවමින් දිස්ත්‍රික් ප්‍රජාවට කඩිනම් හා ප්‍රශස්ත සේවාවක්

### ii.ආයතනයේ මූල්‍ය ප්‍රගතිය (2024.01.01 සිට 2024.12.31 දක්වා)

පුනරාවර්තන වියදම්:- රු. මි. 2,817.944
ප්‍රාග්ධන වියදම් :- රු.මි. 140.007

වගුව **3.18** මාතර දිස්ත්‍රික්කය - **2025** වර්ෂය සඳහා අපේක්ෂිත අයවැය යෝජනා (සාරාංශගත)

| # | ව්‍යාපෘතියේ නම | ඇස්තමේන්තුගත මුළු පිරිවැය (රු. මි) | 2025 අයවැයෙන් අපේක්ෂිත වෙන් කිරීම් (රු. මි) |
|---|---|---|---|
| 01. | පිටබැද්දර ප්‍රා.ලේ. කාර්යාලයේ ඉදි කිරීම | 530.40 | 200.00 |
| 02. | මාලිම්බඩ ප්‍රා.ලේ.කාර්යාලයේ ඉතිරි වැඩ | 29.67 | 29.67 |
| 03. | දික්වැල්ල ප්‍රා.ලේ. කාර්යාලයේ ගොඩනැගිලි දෙක එකිනෙකට සම්බන්ධ කිරීම හා මායිම් තාප්පය ඉදිකිරීම. | 35.19 | 35.19 |
| 04. | අකුරැස්ස ප්‍රා.ලේ. කාර්යාලයේ ගොඩනැගිල්ල ඉදි කිරීම. | 439.40 | 439.40 |
| 05. | හක්මණ ප්‍රා.ලේ. කාර්යාලයේ ගොඩනැගිල්ල ඉදිකිරීම. | 383.00 | 383.00 |
| 06. | මාලිම්බඩ, දික්වැල්ල, තිහගොඩ ප්‍රා.ලේ. කාර්යාල සඳහා විදුලිසෝපාන ඉදි කිරීම. | 22.50 | 22.50 |
| 07. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට සහ ප්‍රා.ලේ. කාර්යාල 16 සඳහා සූර්යකෝෂ ස්ථාපනය කිරීම. | 49.70 | 49.70 |
| 08. | මිරිස්ස සංචාරක නගරය ජලයෙන් යටවීම වැළැක්වීම සඳහා සකස් කරනු ලබන ව්‍යාපෘතිය | 25.00 | 25.00 |
| 09. | කිරල කැලේ සංචාරක ආකර්ශනිය පාරිසරික පද්ධතියක් ලෙස සංරක්ෂණය කිරීම. | 25.00 | 25.00 |
| | මුළු එකතුව | **1,539.86** | **1,209.46** |

**iii.** ආයතනයේ භෞතික ප්‍රගතිය

වගුව **3.19:** මාතර දිස්ත්‍රික්කය - ආයතනයේ ප්‍රගතිය (**2024.01.01** සිට **2024.12.31** දක්වා)

| # | කාර්යය | සංඛ්‍යාව |
|---|---|---|
| 01. | අනවසර ඉඩම් සඳහා විධිමත් බලපත්‍රයක් නිකුත් කිරීම | 1,080 |
| 02. | පසු අයිතිය නම් නොකල බලපත්‍ර ඔප්පු අයිතිය ලබා දීම | 905 |
| 03. | ව්‍යාපාර නාම බලපත්‍ර නිකුත් කිරීම | 2,981 |
| 04. | ජාතික හැඳුනුම්පත් අයදුම්පත්, පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම | 26,942 |

වගුව **3.20:** මාතර දිස්ත්‍රික්කය - ක්‍රියාත්මක ප්‍රධාන ප්‍රාග්ධන අරමුදල් ව්‍යාපෘතිවල ප්‍රගතිය (**2024.01.01** සිට **2024.12.31** දක්වා)

| # | සංරචක | අරමුදල් මූලාශ්‍රය | වැඩසටහන | මුළු ඇස්තමේන්තු පිරිවැය (රු.මි) | වියදම (රු.මි) |
|---|---|---|---|---|---|
| 01. | ජීවනෝපාය නඟා සිටුවීම | 118-2-3-80-2202 | ජීවනෝපාය නගා සිටුවීම සඳහා ගෘහාශ්‍රිත ව එළවළු ඇති කිරීම. | 4.93 | 4.3 |
| 02. | ජනාධිපති ලේකම් කාර්යාලය | 001-2-06-023-2509 | විමධ්‍යගත අයවැය වැඩසටහන | 401.95 | 327.95 |
| 03. | නිවාස හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය | 123-02-15-82-2506 | කඳුකර දශකය | 500 | 481.62 |
| 04. | ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය | 117-2-4-61-2104 | ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන | 77.10 | 59.28 |
| 05. | බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව | 201-2-02-008-2205 | ඌන සංවර්ධන දහම් පාසල් | 1.7 | 1.65 |
| 06. | බෞද්ධ කටයුතු අමාත්‍යාංශය | 101-2-6-8-2205 | ආපදාවට ලක් වූ විහාරස්ථාන ප්‍රතිසංස්කරණය | 1.39 | 1.38 |
| 07. | අධ්‍යාපන අමාත්‍යාංශය | 126-02-05-02-2205(11) | අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම. | 13.70 | 13.07 |

| # | සංරචක | අරමුදල් මූලාශ්‍රය | වැඩසටහන | මුළු ඇස්තමේන්තු පිරිවැය (රු.මි) | වියදම (රු.මි) |
|---|---|---|---|---|---|
| 08. | බෞද්ධ කටයුතු අමාත්‍යාංශය | 101-2-6-1-2205 | විහාරස්ථාන සඳහා ලබා දෙන වෙනත් ප්‍රතිපාදන | 5.5 | 5.49 |
| 09. | කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය | 118-2-29-4-2507 | වැලිගම පොල් කොල මැලවීමේ රෝග මර්ධන වැඩසටහන | 12.37 | 12.32 |
| 10. | පරිසර, වනජීවී, වන සම්පත්, ජලසම්පාදන වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය, | 001-02-06-022-2509 | වතු යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම | 0.7 | 0.67 |
| 11. | අධිකරණ අමාත්‍යාංශයේ ජාතික සමඟිය හා ප්‍රතිසංවිධානය සඳහා වන කාර්යාලය | 110-1-2-30-2202 | අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති | 1.87 | 1.84 |
| මුළු එකතුව | | | | **1021.21** | **909.57** |

**පිංතූර 3.8:** මාතර දිස්ත්‍රික්කයේ ව්‍යාපෘති හා වැඩසටහන්



ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන

**මුළු පිරිවැය** **:-** රු.මි.77.10

වියදම :- රු.මි.59.28

ආරම්භක දිනය:- 2024.01.30

**iv.** රාජ්‍ය ආදායම් උපයා ගැනීමේ ව්‍යාපෘති

**වගුව 3.21:** මාතර දිස්ත්‍රික්කය - ආදායම් උපයා ගැනීම් 2024.01.01 සිට 2024.12.31 දක්වා

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | එකතු කරන ලද ආදායම (රු.මි) |
|---|---|---|
| 1002.07.000 | මුද්දර ගාස්තු | 0.031 |
| 2002.0101.0. | රජයේ ගොඩනැගිලි කුලී | 2.46 |
| 1003.07.0.99.0 | අනෙකුත් | 11.06 |
| 2003.0.99.00.0 | වෙනත් | 33.00 |
| 2003.02.130. | විභාග හා අනෙකුත් ගාස්තු | 0.006 |

## 3.9. හම්බන්තොට දිස්ත්‍රික්කය

### i. හැඳින්වීම

**පසුබිම**

ශ්‍රී ලංකාවේ ගිණිකොණ දිග සීමාවේ පිහිටා ඇති හම්බන්තොට දිස්ත්‍රික්කය විශාලත්වයෙන් වර්ග කි.මී. 2609කි. මෙය දිවයිනේ මුළු භූමි ප්‍රමාණයෙන් 1/25ක් පමණ වන අතර දිස්ත්‍රික්කයේ උපරිම දිග කි.මී. 106ක් ද උපරිම පළල කි.මී.39ක් ද වේ. දිස්ත්‍රික්කයට අයත්වන වෙරළබඩ තීරයේ දිග කි.මී. 151කි.

හම්බන්තොට දිස්ත්‍රික්කයේ මුළු භූමි ප්‍රමාණයෙන් ව.කි.මී. 11.5 ක් පමණ අභ්‍යන්තර ජලාශවලින් වැසී ඇත. අක්ෂාංශගත හා දේශාංශගත පිහිටීම අනුව උතුරු අක්ෂාංශ 6.0 සිට 6.5 දක්වාද නැගෙනහිර දේශාංශ 80.6 සිට 81.7 දක්වාද විහිදී ඇත. උතුරට මොණරාගල රත්නපුර හා අම්පාර දිස්ත්‍රික්ක වලින්ද බටහිරට මාතර දිස්ත්‍රික්කයෙන්ද දකුණනට හා නැඟෙනහිරට ඉන්දියන් සාගරයෙන්ද මෙම දිස්ත්‍රික්කය මායිම් වී ඇත.

| ජනගහනය | ජනගනත්වය ව.කි.මී.1ට | පවුල් සංඛ්‍යාව | මැතිවරණ කොට්ඨාස ගණන | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ගණන | ග්‍රාම නිලධාරී වසම් ගණන |
|---|---|---|---|---|---|
| 738,890 | 283 | 209,418 | 04 | 12 | 576 |

**දිස්ත්‍රික්කයේ ප්‍රධාන සංරචක**

**ප්‍රධාන සංරචක**

- ග්‍රාමීය මාර්ග සංවර්ධනය.
- පානීය ජල පහසුකම් ප්‍රවර්ධනනය.
- කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් දිරි ගැන්වීම.
- කෘෂිකර්මාන්තයට සිදුවන සත්ත්ව හානි අවම කිරීම. (අලි,මොණර ආදී...)
- පසු අස්වනු නාස්තිය අවම කිරීම.
- සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම.
- මත් උවදුර තුරන් කිරීම.
- හේන් ගොවිතැන පවත්වා ගැනීමට අවශ්‍ය නියාමනයන් ඇති කිරීම.
- අතිරේක භෝග වගාවන් ප්‍රවර්ධනය.
- නිවැරදි කසල කළමනාකරණය හා විද්‍යුත් අපද්‍රව්‍ය (E waste) ඉවත් කිරීමේ නිවැරදි ක්‍රමයක් ඇති කිරීම.

**විෂය පථය**

- රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී දිස්ත්‍රික් පරිපාලන කටයුතු මෙහෙයවීම.

**ක්‍රියාකාරීත්වය**

- රජයේ සංවර්ධන කටයුතු මෙහෙයෙවීම සහ ප්‍රගතිය සමාලෝචනය හා ආයතන අතර සම්බන්ධීකරණය කිරීම.
- දිළිඳුකම පිටු දැකීමට අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා දිළිඳු සහන කටයුතු සිදු කිරීම.
- කෘෂිකර්මාන්ත ප්‍රවර්ධන කටයුතු හා ගැටළු නිරාකරණය.
- ආපදා කළමනාකරණ සහ ආපදා සහන සේවා කටයුතු .
- දිස්ත්‍රික්කය තුළ ඉඩම් පරිහරණ සැලසුම් සැකසීම හා ඌණ උපයෝජිත ඉඩම් සංවර්ධනය සඳහා කටයුතු කිරීම.
- සමාජ ප්‍රතිලාභ හිමිවිය යුතු තැනැත්තන් හඳුනාගැනීම සහ ප්‍රතිලාභ ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.
- ආගමික හා සංස්කෘතික කටයුතු ප්‍රවර්ධනය කිරීම.
- සමාජ සුභසාධනය හා ජාතික ඒකාබද්ධතාවය ඇති කරලීමට කටයුතු කිරීම/ළමා හා කාන්තා සුභසාධන කටයුතු.
- සියළුම ක්‍රීඩාවන් ප්‍රවර්ධනයට කටයුතු කිරීම සහ දිස්ත්‍රික් මට්ටමින් කුසලතා පරිපූර්ණ ක්‍රීඩකයන් ජාතික තලයට රැගෙන යාම.
- ආර්ථික සාමාජීය හා භූගෝලීය තොරතුරු රැස්කිරීම යාවත්කාලීන කිරීම හා ප්‍රතිපත්ති සම්පාදනයට තොරතුරු ලබා දීම.
- ප්‍රාථමික සෞඛ්‍ය ප්‍රවර්ධන කටයුතු සම්බන්ධීකරණ ය හා බෝවන රෝග පාලනයට සහාය වීම.

- මහජන පැමිණිලි සම්බන්ධ කරුණු පිළිබඳ සොයා බැලීම හා ගැටළු සඳහා නිසි කටයුතු සිදු කිරීම.
- ග්‍රාමීය හා ප්‍රාදේශීය පරිපාලන කටයුතු අධීක්ෂණය හා මෙහෙයවීම.
- තරුණ ව්‍යවසාය සංවර්ධන කටයුතු හා වෘත්තීය නිපුණතාවය/කුඩා ව්‍යාපාර දිරිගැන්වීමට කටයුතු කිරීම

**විශේෂ ළඟා කර ගැනීම්**

- 2022/2023 මහ කන්නයේ වී මෙ.ටො. 15,000 ක ප්‍රමාණයක් රු.මි.1,800 කට ගොවීන්ගෙන් මිල දී ගෙන, කුඩා මෝල් හිමියන් මගින් ලංකාවේ දිස්ත්‍රික්ක 07කට බෙදා හැරීමට කටයුතු සිදු කිරීම. මෙහිදී වැඩිම වී ප්‍රමාණයක් මිල දී ගත් දිස්ත්‍රික්කය හම්බන්තොට වන අතර සහල් බෙදා හැරීම සාර්ථකව සිදු කිරීම.
- 2022/2023 යල සහ මහ කන්නයේ වැඩි වූ ඉන්ධන හා රසායනික පොහොර හිඟ වීම,මිල වැඩි විම, උඩ වළව ජලාශයේ ජල මට්ටම අඩු වීම සිදු වුවත්, කෘෂි කාර්මික ඉලක්ක ළඟා කර ගෙන දිස්ත්‍රික්කයේ ජනතාවගේ ආදායම් තතත්වය සුරක්ෂිත කිරීම.
- 2023 වර්ෂයේ මැද භාගයේදී වසර ගණනාවකට පසුව ඇති වූ දැඩි නියඟය හේතුවෙන් ඇති වූ පානීය ජල හිඟය හා වගා හානි වෙනුවෙන් කල යුතු කාර්යභාරය සාර්ථකව ඉටු කිරීම.
- වසර 30ක පමණ කාලයකට පසු අවසන් මාස 04හි ඇද හැලුනු අධික වර්ෂාපතනය හේතුවෙන් සිදුවූ හදිසි ආපදා තත්ත්වයන් මැනවින් කළමනාකරණය කරගෙන ආපදාවට ලක්වූ අයට සහන සැලසීම හා එමගින් හානී වූ ස්ථාන ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු සංවිධානය කිරීම.
- කඩා ඉවත් කිරීමට නියමිතව තිබූ සංචාරක බංගලාව ප්‍රතිසංස්කරණය කර නැවත ප්‍රයෝජනයට ගත හැකි මට්ටමට පත් කිරීම. කටයුතු කිරීම.

**අභියෝග**

- ප්‍රසම්පාදන කටයුතු වලදී භාණ්ඩවල මිල උච්ඡාවචනය වීම හේතුකොට ගෙන සහ ඇතැම් අමුද්‍රව්‍ය හා උපකරණ දේශීය වෙළඳපොළ තුළ සොයා ගැනීම අපහසු නිසා ඒවා ආනයනය කිරීමට සිදුවීමත් සමඟින් ඇති වූ විදේශ විනිමය ගලායෑම.
- විදුලි බිල් සහ ජල බිල් ගාස්තු එකවර විශාල ප්‍රමාණයකින් වැඩි වීම හේතුවෙන් පරිපාලන සංකීර්ණයේ කටයුතු විධිමත්ව කළමනාකරණය කිරීමට අපහසු වීම.
- ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන සහ අක්මුදල් ලැබීම ප්‍රමාද වීම හේතුවෙන් ගෙවීම් කටයුතු සිදුකිරීමේ දි අපහසුතාවයන් ට මුහුණ පෑමට සිදු වීම.
- වන සතුන්ගෙන් මිනිස් ජීවිතවලට හා වගාවන්ට සිදු වූ හානි නිසා ඇති වූ බලපෑම්.
- ආර්ථික අර්බුදය හමුවේ ලැබෙන ප්‍රතිපාදන සීමා වීම මත රාජකාරි කටයුතු කිරීමට සිදු වීම.
- රජයේ නිලධාරීන් දේශීය හා විදේශීය නිවාඩු ලබා ගැනීම හේතුවෙන් ප්‍රමාණවත් නිලධාරීන් නොමැති වීමෙන් ගැටළු ඇති වීම.
- ගොඩනැගිලි ඉදිකිරීමේ ද්‍රව්‍ය මිළ සීඝ්‍රයෙන් ඉහළ යාමෙන් ලුණුගම්වෙහෙර හා අඟුණුකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වැඩ අවසන් කර ගැනීමට නොහැකි වීම.

**අනාගත ඉලක්ක**

- විමධ්‍යගත අයවැය වැඩසටහන ඇතුළු දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිත සියළු සංවර්ධන වැඩසටහන් සැලසුම් කර ඇති නියමිත කාල සීමාව තුළ නිම කිරීම. 2024 වර්ෂයට නියමිත කෘෂි ව්‍යවසායකත්ව ගම්මාන වැඩසටහන් නියමිත කාල සීමාව තුළ නිම කිරීම.
- වර්ෂය සඳහා යෝජිත මැතිවරණ රාජකාරි කටයුතු නියමිත පරිදි සාර්ථකව සිදු කිරීම.
- පරිපාලන සංකීර්ණයේ හා අනෙකුත් රාජ්‍ය ආයතන සඳහා සූර්ය බලශක්ති පැනලයන් ලබා ගැනිමට කටයුතු කිරීම.
- රජයේ නව ප්‍රතිපත්ති හා සැලසුම් සාර්ථකව නිම කිරීමට අදාල සැලසුම් සිදුකිරීම.
  උදා- අස්වැසුම, EGN ව්‍යාපෘතිය,ජන සංගණනය, ආහාර සුරක්ෂිත වැඩසටහන්

3.9.හම්බන්තොට දිස්ත්‍රික්කයේ ව්‍යාපෘති හා වැඩසටහන්



ව්‍යාපෘතියේ න :-අඟුණුකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කාර්යාල නව සිව්මහල් ගොඩනැගිල්ල ඉදිකිරීම - අදියර III
ස්ථානය :-අඟුණකොළපැලැස්ස ප්‍රා.ලේ.කො.
මුළු පිරිවැය :- රු.මි.142.56
ආරම්භක දිනය :- කොන්ත්‍රාත් ආයතනය සමග ගිවිසුම් ගත වී ඇත. ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොමැත.

**ii.ආයතනයේ මූල්‍ය ප්‍රගතිය (2024.01.01 සිට 2024.12.31 දක්වා)**

පුනරාවර්තන වියදම් - රු. මි. 2,250.23 ප්‍රාග්ධන වියදම් - රු. මි. 170.54

**වගුව 3.22: හම්බන්තොට දිස්ත්‍රික්කය - 2025 වර්ෂය සඳහා අපේක්ෂිත අයවැය යෝජනා (සාරාංශය)**

| # | ව්‍යාපෘතියේ නම | ඇස්තමේන්තුගත මුළු පිරිවැය (රු.මි) | 2025 අයවැයෙන් අපේක්ෂිත වෙන් කිරීම් (රු.මි) |
|---|---|---|---|
| 01 | අඟුණුකොළපැලැස්ස නව සිව්මහල් කාර්යාල ගොඩනැගිල්ල ඉදි කිරීම - තෙවන අදියර | 255.55 | 170 |
| 02 | පරිපාලන සංකීර්ණය සඳහා සූර්යය පැනල සවි කිරීම | 90 | 90 |

**iii. ආයතනයේ භෞතික ප්‍රගතිය**

**වගුව 3.23: හම්බන්තොට දිස්ත්‍රික්කය - ක්‍රියාත්මක ප්‍රාග්ධන අරමුදල්වල ප්‍රගතිය (2024.01.01 සිට 2024.12.31 දක්වා)**

| # | සංරචකය | අරමුදල් මූලාශ්‍රය | වැඩසටහන් | ව්‍යාපෘති සංඛ්‍යාව | මුළු ඇස්තමේන්තු පිරිවැය (රු.මි.) | වියදම (රු.මි.) |
|---|---|---|---|---|---|---|
| 01 | ප්‍රවේශ මාර්ග | දේශීය | විමධ්‍යගත අයවැය වැඩසටහන | 91 | 336.56 | 141.14 |
| 02 | ක්‍රීඩා පිටි | | | 11 | 6.65 | 6.08 |
| 03 | සුළු වාරිමාර්ග | | | 10 | 5.55 | 4.83 |
| 04 | ග්‍රාමීය ආර්ථික යටිතල | | | 31 | 58.59 | 53.72 |
| 05 | ආගමික මධ්‍යස්ථාන සංවර්ධනය | | | 297 | 71.72 | 67.39 |
| 06 | සමාජ සුභසාධනය | | | 518 | 106.64 | 102.09 |
| 07 | සූර්යය පැනල විදුලිය | | | 1 | 0. 15 | 0.15 |
| 08 | ග්‍රාමීය ජල සැපයුම් | | | 27 | 60.04 | 22.94 |
| 09 | සනීපාරක්ෂක පහසුකම් | | | 41 | 4.65 | 4.5 |
| 14 | වෙනත් යටිතල පහසුකම් | | | 226 | 157.13 | 121.34 |
| | | | ගොඩනැගිලි ඉදිකිරීම් - අඟුණුකොළපැලැස්ස නව සිව්මහල් ගොඩනැගිල්ල ඉදි කිරීම - තෙවන අදියර | 1 | 85.55 (වැට් සහිත) | 48.27 |
| | **මුළු එකතුව** | | | **1254** | **893.08** | **572.45** |

**vi. රාජ්‍ය ආදායම් උපයා ගැනීමේ ව්‍යාපෘති**

**වගුව 3.24: හම්බන්තොට දිස්ත්‍රික්කය – ආදායම් උපයා ගැනීම් 2024.01.01 සිට 2024.12.31 දක්වා**

| ආදායම් ශීර්ෂය | ආදායම (රු.මි) |
|---|---|
| 1003-07-05 - බලපත්‍ර ගාස්තු | 0.40 |
| 1003-07-99 - ආදායම් සහතික නිකුත් කිරීම. | 7.74 |
| 2002.01.01 - ගොඩනැගිලි කුලී හා නිවාස කුලී | 67.40 |
| 2002.02.99 - රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ණය පොලී | 11.26 |
| 2003-02-03- පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ ගාස්තු | 12.31 |
| 2003.02.13 - විභාග හා අනෙකුත් ගාස්තු | 0.01 |
| 2003-02-99 - ජයභූමි දීමනා හා සේවා ගාස්තු | 0.13 |
| 003.99.00 - අනෙකුත් ලැබීම් | 29.73 |
| 2006.02.02 - ප්‍රාග්ධන වත්කම් විකිණීමේ ආදායම | 1.33 |
| **මුළු එකතුව** | 130.32 |

## 3.10. යාපනය දිස්ත්‍රික්කය

### i. හැඳින්වීම

**පසුබිම**

යාපනය දිස්ත්‍රික්කය, ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ උතුරු කෙළවර වන අතර එය ශ්‍රී ලංකාවේ අගනුවර සිට කි.මී 410 ක් ඈතින් පිහිටා ඇත. අභ්‍යන්තර ජලය ඇතුළුව මුළු භූමි ප්‍රමාණය වර්ග කි.මී. 1,025.00 කි. යාපනය දිස්ත්‍රික්කයේ මුළු ජනගහනය 2024.08.31 දිනට 632,115 කි.

**දිස්ත්‍රික්කයේ ප්‍රධාන සංරචක**

**ප්‍රමුඛ පරාස**

- කෘෂිකාර්මික සංවර්ධනය.
- කර්මාන්ත සංවර්ධනය (ගෘහ හා කුඩා හා මධ්‍ය ප්‍රමාණය).
- අධ්‍යාපන වැඩි දියුණු කිරීම.
- ග්‍රාමීය සෞඛ්‍ය අංශයේ සංවර්ධනය.
- සමාජ සුභසාධන කටයුතු දියුණු කිරීම.
- සංචාරක ව්‍යාපාරය කටයුතු දියුණු කිරීම.

**විෂය පථය**

- නවෝත්පාදනය හඳුන්වා දීම.
- කාර්යක්ෂම සේවා සැපයීම.
- ග්‍රාමීය ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීම.
- සංස්කෘතික හා සාම්ප්‍රදායික වටිනාකම් ආරක්ෂා කිරීම.
- ස්වභාවික විපත්වලට එරෙහිව ස්වයං ආරක්ෂක හෝ ආරක්ෂක පියවරයන් සූදානම් කිරීම.
- ප්‍රාදේශීය සහ ග්‍රාමීය මට්ටමින් සම්බන්ධීකරණ කටයුතු.

**ක්‍රියාකාරිත්වය**

- නිලධාරීන් සඳහා පුහුණුවීම් ලබා දීම.
- පරිගණක ජාල පද්ධති සකස් කිරීම.
- දේශීය නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම.
- ග්‍රාමීය මට්ටමේ ජනතාවගේ අධ්‍යාපනයට සහ සෞඛ්‍යයට උපකාර කිරීම.
- ග්‍රාමීය, ප්‍රාදේශීය සහ දිස්ත්‍රික් මට්ටමින් මහජන සේවාවන් සැපයීම සහතික කිරීම.
- ආපදා කළමනාකරණ සේවා ඒකකය මගින් ග්‍රාමීය මට්ටමින් කමිටු පිහිටුවීම.
- සංස්කෘතික උත්සව කාලෝචිත ලෙස පැවැත්වීම හා සංස්කෘතික පාරම්පරික වටිනාකම් ආරක්ෂා කිරීම.
- මැතිවරණ කටයුතු සම්බන්ධීකරණය.

**විශේෂ ළඟා කර ගැනීම්**

- දිස්ත්‍රික් ආහාර සුරක්ෂිතතා ජාලය (DFSN) යාපනය දිස්ත්‍රික්කයේ නිකුත් කරන ලදී.
- පෝෂණය සඳහා බහු අංශ ක්‍රියාකාරී සැලැස්ම සකස් කරන ලදී.

**අභියෝග**

- භාණ්ඩ මිලෙහි උච්ඡාවචනයන් සහ අස්ථාවරත්වයේ පීඩනය.
- තාක්ෂණික කුසලතා නොමැතිකම.
- නවීන තාක්ෂණය හා සංරක්ෂණ පහසුකම් නොමැතිකම.
- කෘෂිකාර්මික නිෂ්පාදනවල මිල උච්ඡාවචනය.
- ප්‍රවාහන පහසුකම් නොමැතිකම.

**අනාගත ඉලක්ක**

- කෘෂිකාර්මික දේශීය නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සහ ජනතාව ඉලක්ක කරගත් ආර්ථිකයේ තිරසාර වර්ධනයක් සහතික කිරීම.
- සංස්කෘතික වටිනාකම් සහ සම්ප්‍රදායන් ශක්තිමත් කිරීම.
- ඉහළ අගය එකතු කිරීමකින් ව්‍යසායන් ප්‍රවර්ධනය කිරීම සහ පවතින දේශීය අමුද්‍රව්‍ය සහිත ව්‍යවසායන් දිරිමත් කිරීම.
- ගැඹුරු මුහුදේ මසුන් ඇල්ලීම සහ මත්ස්‍ය නිෂ්පාදනය වැඩි කිරීම.
- ස්වභාවික සම්පත් තිරසාර ලෙස භාවිතා කිරීම.
- රැකියා සහ ජීවන තත්ත්වය ඉහළ නැංවීමත් සමඟ ධනය උත්පාදනය වැඩි කිරීම.
- දිළිඳුකම තුරන් කිරීම.

**ii. ආයතනයේ මූල්‍ය ප්‍රගතිය (2024.01.01 සිට 2024.12.31 දක්වා).**

පුනරාවර්තන වියදම් **රු.මි.** 2,127.835 ප්‍රාග්ධන වියදම් **රු.මි.** 69.674

**වගුව 3.25 : යාපනය දිස්ත්‍රික්කය - 2025 වර්ෂය සඳහා අපේක්ෂිත අයවැය යෝජනා. (සාරාංශය).**

| # | ව්‍යාපෘතියේ නම | ඇස්තමේන්තුගත මුළු පිරිවැය (රු.මි.) | 2025 අයවැයෙන් අපේක්ෂිත වෙන් කිරීම් (රු.මි.) |
|---|---|---|---|
| 1 | ගොඩනැගිල්ල සහ ව්‍යුහය - දිස්ත්‍රික්කය | 25.00 | 2.00 |
| 2 | ගොඩනැගිල්ල සහ ව්‍යුහය - අංශය | 31.50 | 12.00 |
| 3 | ගොඩනැගිල්ල සහ ව්‍යුහය - නිලසේවන | 2.50 | 2.00 |
| 4 | බලාගාරය, යන්ත්‍රෝපකරණ සහ උපකරණ | 15.00 | 5.00 |
| 5 | වාහන | 10.00 | 3.30 |
| 6 | ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ | 30.00 | 5.60 |
| 7 | බලාගාරය, යන්ත්‍රෝපකරණ සහ උපකරණ | 74.00 | 5.60 |
| 8 | ගොඩනැගිල්ල සහ ව්‍යුහය | 168.00 | - |
| 9 | වංකානායි පනාවෙඩ්ඩි මාර්ගයේ ජලාප්‍රවහන ඉදිකිරීම | 6.50 | - |
| 10 | වංකානායි හි ඉවත් කිරීමේ මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම | 16.50 | - |
| 11 | යාපනයේ ලුණු වතුර බැහැර කිරීමේ බැම්ම ඉදිකිරීම | 10.00 | - |
| 12 | ඉඩම් එළිපෙහෙළි කිරීම සහ නැවත පදිංචි කිරීමේ දීමනා | 10.60 | - |
| 13 | සාමාජිකයින් 3 දෙනෙකුට වැඩි නිවාස | 3,750.00 | - |
| 14 | සාමාජිකයින් 3 ට අඩු නිවාස | 100.00 | - |
| 15 | නිවාස අලුත්වැඩියා කිරීම (ප්‍රධාන) | 80.00 | - |
| 16 | නිවාස අලුත්වැඩියා කිරීම (පතල් කම්කරු) | 67.50 | - |
| 17 | නව වැසිකිළි ඉදිකිරීම | 413.39 | - |
| 18 | ළිං සහ ජල සම්බන්ධතා ඉදිකිරීම සහ අලුත්වැඩියා කිරීම | 77.00 | - |
| 19 | කෘෂි ළිං අලුත්වැඩියා කිරීම | 38.00 | - |
| 20 | නැවත පදිංචි කළ ප්‍රාදේශයට ප්‍රාදේශිය සභා මාර්ග ඉදිකිරීම | 600.00 | - |
| 21 | කෘෂිකාර්මික මාර්ග ඉදිකිරීම | 80.00 | - |
| 22 | පාසල් සහ පෙර පාසල් අලුත්වැඩියා කිරීම | 32.50 | - |
| 23 | සෞඛ්‍ය මධ්‍යස්ථානය ඉදිකිරීම | 6.00 | - |
| 24 | නැවත පදිංචි කළ ප්‍රාදේශයට KKS බස් නැවතුම්පොළ ඉදිකිරීම | 25.00 | - |
| 25 | පොදු වෙළඳපොළ ඉදිකිරීම | 9.00 | - |
| 26 | බහුකාර්ය ශාලාවක් ඉදිකිරීම | 9.00 | - |
| 27 | විදුලිය සඳහා සේවා සම්බන්ධතාවය | 30.60 | - |
| 28 | ජීවනෝපාය ක්‍රියාකාරකම් (කෘෂිකාර්මික, මසුන් ඇල්ලීම, පශු සම්පත්, කුඩා කර්මාන්ත සංවර්ධනය) | 96.30 | - |
| **මුළු එකතුව** | | **5,813.89** | **35.5** |

**iii.** ආයතනයේ භෞතික ප්‍රගතිය

**වගුව 3.26: යාපනය දිස්ත්‍රික්කය - කාරක ප්‍රාග්ධන අරමුදල් ව්‍යාපෘතිවල ප්‍රගතිය. (2024.01.01 සිට 2024.12.31 දක්වා)**

| # | සංරචකය | අරමුදල් මූලාශ්‍රය | වැඩසටහන් | ව්‍යාපෘති සංඛ්‍යාව | මුළු ඇස්තමේන්තු පිරිවැය රු.(මි) | වියදම් රු.(මි) |
|---|---|---|---|---|---|---|
| 01 | ප්‍රවේශ මාර්ග | දේශීය | විමධ්‍යගත ප්‍රාග්ධන අයවැය වැඩසටහන, ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන සහ සංවර්ධන වැඩසටහන | 212 | 120.69 | 105.27 |
| 02 | ග්‍රාමීය පාලම් | | | 16 | 8.54 | 6.57 |
| 03 | ග්‍රාමීය විදුලිබල ව්‍යාපෘතිය | | | 296 | 99.82 | 84.00 |
| 04 | සනීපාරක්ෂක පහසුකම් | | | 213 | 75.53 | 60.85 |
| 05 | ක්‍රිඩාංගනය | | | 401 | 262.81 | 222.91 |
| 06 | සුළු වාරිමාර්ග | | | 0 | 0 | 0 |
| 07 | ග්‍රාමීය ආර්ථික යටිතල පහසුකම් | | | 433 | 156.80 | 130.38 |
| 08 | ආගමික සංවර්ධනය | | | 266 | 104.82 | 77.77 |
| 09 | සමාජ සුබසාධනය | | | 644 | 122.30 | 104.42 |
| 10 | නිවාස සංවර්ධනය | | | 0 | 0 | 0 |
| 11 | සූර්ය පැනල / විදුලිය | | | 39 | 34.34 | 17.96 |
| 12 | ග්‍රාමීය ජල සැපයුම | | | 219 | 62.48 | 53.08 |
| 13 | නිල සෙවන | | | 0 | 0 | 0 |
| 14 | වෙනත් යටිතල පහසුකම් | | | 702 | 169.64 | 147.91 |
| මුළු එකතුව | | | | **3,441** | **1,217.77** | **1,011.12** |

**පිංතූර 3.10 : යාපනය දිස්ත්‍රික්කයේ ව්‍යාපෘති හා වැඩසටහන්**



ඩෙල්ෆ්ට් හි පොකුණ නිෂ්කාශනය



කරෙයිනගර් හි ඇල නිෂ්කාශනය

**iv.** රාජ්‍ය ආදායම් උපයා ගැනීමේ ව්‍යාපෘති

**වගුව 3.27 : යාපනය දිස්ත්‍රික්කය- ආදායම් උපයා ගැනීම් 2024.01.01 සිට 2024.12.31 දක්වා**

| # | ආදායම් ශීර්ෂය | ආදායම (රු.මි.) |
|---|---|---|
| 01. | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවට අදාළ ලියාපදිංචි ගාස්තු | 45.796 |
| 02. | පුද්ගලික දැව ප්‍රවාහනය | 0.286 |
| 03. | රජයේ ගොඩනැඟිලි සහ නිවාස සඳහා කුලියට දීම | 0.790 |
| 04. | විදේශ ගමන් බලපත්‍ර වීසා සහ ද්විත්ව පුරවැසිභාවය සඳහා ගාස්තු | 12.497 |
| 05. | මෝටර් රථ වාහන පනත යටතේ ගාස්තු | 4.647 |
| 06. | වෙනත් ලැබීම් | 13.881 |
| මුළු එකතුව | | **77.897** |

## 3.11. මන්නාරම දිස්ත්‍රික්කය

### i. හැදින්වීම

**පසුබිම**

මන්නාරම දිස්ත්‍රික්කය ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශයෙහි පිහිටා ඇති අතර වර්ග කිලෝමීටර 1,996 ක පමණ භූමි ප්‍රමාණයකින් සමන්විතය. නවතම වාර්තාවන්ට අනුව මන්නාරම දිස්ත්‍රික්කයේ ජනගහනය 111,930.00 පමණ වේ. පරිපාලනමය වශයෙන් මෙම දිස්ත්‍රික්කය වන්නි මැතිවරණ දිස්ත්‍රික්කයට අන්තර්ගත කර ඇත.

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ පහකින් සමන්විත මෙම දිස්ත්‍රික්කය ග්‍රාම නිලධාරී කොට්ඨාශ 153 ක් සහ ගම්මාන 616 ක් ආවරණය කරයි. එමෙන්ම පළාත් පාලන ආයතන පහක් මෙම දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මකව පවතී.

| ජනගහනය | | භූමි වර්ග කිලෝමීටර් | ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගණන | ග්‍රාමනිලධාරී කොට්ඨාශ ගණන |
|---|---|---|---|---|
| පවුල් සංඛ්‍යාව | සාමාජිකයින් සංඛ්‍යාව | | | |
| 49,138 | 162,919 | 1,996.00 | 5 | 153 |

**දිස්ත්‍රික්කයේ ප්‍රධාන සංරචක**

**ප්‍රධාන සංරචක**

- අධ්‍යාපන වැඩි දියුණු කිරීම.
- කෘෂිකර්මාන්තය සහ ධීවර කර්මාන්තය සංවර්ධන කිරීම.
- යටිතල පහසුකම් සහ සංචාරක කර්මාන්තය සංවර්ධන කිරීම.

**විෂය පථය**

- කාර්යක්ෂම සේවා සැපයීම.
- ග්‍රාමීය ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීම

**ක්‍රියාකාරිත්වය**

- දිස්ත්‍රික් ලේකම් කාර්යාල රජයේ දෙපාර්තමේන්තු හරහා ඍජුවම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

**විශේෂ ළඟා කරගැනීම**

- දිස්ත්‍රික්කයේ නිවාස නොමැති පවුල් සඳහා ස්ථිර නිවාස 33 ක් ලබාදීමට අනුමැතිය ලබාදී ඇත.
- දිළිඳුකම පිටුදැකීම සඳහා පවුල් 12,334 කට ඇස්වැස්ම ප්‍රතිලාභ ලබා දීම.
- අංක 387 විමධ්‍යගත අයවැය ව්‍යාපෘති, අංක 556 ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘති සහ දිස්ත්‍රික් සංවර්ධන ව්‍යාපෘති 286 ක් ක්‍රියාත්මක වෙමින් පවතින අතර එහි සම්පූර්ණ වටිනාකම රු.මි.409.615 කි. වැඩිදුර කාර්යාල ප්‍රතිසංස්කරණ කටයුතු සහ තොරතුරු තාක්ෂණ උද්‍යාන ඉදිකිරීම් කටයුතු එහි වටිනාකම 105.35 සහ ගැබිණි මව්වරුන් පවුල් 643 කට ගෙවා ඇති අතර එහි වටිනාකම රු. මිලියන 28.9 කි. අක්‍රීය ගෙවීම, වකුගඩු ගෙවීම සහ වැඩිහිටි ගෙවීම රුපියල් මිලියන 49.77ක් ගෙවා ඇත.
- උතුරු පළාතේ 15 වන පාසල් ජවන පිටිය හා ශුරතා මලල ක්‍රීඩා තරඟාවලියේ ප්‍රථම ස්ථානය අපේ දිස්ත්‍රික්කයට හිමි විය.
- යටිතල පහසුකම් විශේෂයෙන්ම මාර්ග, විදුලිය සහ ගෘහස්ත ජල සැපයුම වැඩිදියුණු කර ඇත.

**අභියෝග**

මානව සම්පත, මූල්‍ය සහ භෞතික සම්පත් ප්‍රමාණවත් නොවීම :- මේවා මහජනතාවට විශිෂ්ට සේවාවක් ලබා දීම සඳහා පරිපාලනයේ වැදගත්ම කොටස වේ.

- අපගේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට යටත් නිලධාරීන්ට කළමනාකරණ මට්ටම වැනි ප්‍රමාණවත් නිලධාරීන් නොමැත. මන්නාරම නගරය, මඩු, මාන්තෙයි බටහිර, සහ මුසලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල I පන්තියේ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ (SLAS) නිලධාරීන් නොමැති නිසා III පන්තියේ SLAS නිලධාරීන්

I ශ්‍රේණියේ SLAS කාර්යාල ලෙස රාජකාරි ආවරණය කරයි.

**අනාගත ඉලක්ක**

- යහ පාලන ක්‍රියාවලිය ගොඩ නැගීම තුළින් දිස්ත්‍රික්කය තිරසාර සංවර්ධනයක් කරා ගෙන යාමට ගොවි ගතික කාර්ය කණ්ඩායම් ප්‍රශස්ථ සම්පත් කළමනාකරණය සහ හුස්ම ගැනීම තුළින් ඵලදායී හා කාර්යක් පරිපාලනයකින් මිනිස් ජීවිතය සවිබල ගැන්වීම වැනි සියලුම පාර්ශ්වකරුවන්ගේ පරම සහභාගීත්වයෙන් සිදුකළ යුතුය. රාජ්‍ය, පෞද්ගලික දේශපාලනඥයන් සහ මහජනතාව මෙවන් සහයෝගීතාව සහ යහපාලන රජයේ ප්‍රතිපත්තිය සංවිධානය කර අප රට තුළ ක්‍රියාත්මක කළ යුතු අතර අපගේ ජාතිය සමස්ත ක්ෂේත්‍රයේම උපරිම සංවර්ධනය කරා ළඟා විය යුතුය.

**ii.ආයතනයේ මූල්‍ය ප්‍රගතිය (2024.01.01 සිට 2024.12.31 දක්වා)**

පුනරාවර්තන වියදම් - රු.මි. 303.41 ප්‍රාග්ධන වියදම් - රු.මි. 126.69

**වගුව 3.28 : මන්නාරම දිස්ත්‍රික්කය - 2025 වර්ෂය සඳහා අපේක්ෂිත අයවැය යෝජනා (සාරාංශය)**

| # | ව්‍යාපෘතියේ නම | ඇස්තමේන්තු ගත මුළු පිරිවැය (රු.මි) | 2025 අයවැයයෙන් අපේක්ෂිත වෙන් කිරීම් (රු.මි) |
|---|---|---|---|
| 01 | ග්‍රාමීය ප්‍රවේශය | 300.00 | 150.00 |
| 02. | ග්‍රාමීය පාලම | 50.00 | 30.00 |
| 03. | ග්‍රාමීය විදුලිබලය (රැහැන්) | 100.00 | 50.00 |
| 04. | සනීපාරක්ෂක පහසුකම් | 10.00 | 8.00 |
| 05. | ක්‍රීඩා පිටිය | 100.00 | 50.00 |
| 06. | සුළු වාරිමාර්ග | 50.00 | 25.00 |
| 07. | ග්‍රාමීය ආර්ථිකය | 100.00 | 50.00 |
| 08. | ආගමික සංවර්ධනය | 200.00 | 100.00 |
| 09. | සමාජ සුබසාධනය | 50.00 | 25.00 |
| 10. | නිවාස සංවර්ධනය | 6,000.00 | 4,000.00 |
| 11. | ග්‍රාමීය ජල සැපයුම | 100.00 | 600.00 |
| 12. | අනෙකුත් යටිතල පහසුකම් (බස් නැවතුම්පළ) | 500.00 | 300.00 |
| **මුළු එකතුව** | | **7,560.00** | **5,388.00** |

**iii.** **ආයතනයේ භෞතික ප්‍රගතිය**

**වගුව 3.29 : මන්නාරම දිස්ත්‍රික්කය - කාරක ප්‍රාග්ධන අරමුදල් ව්‍යාපෘති වල ප්‍රගතිය. (2024.01.01 සිට 2024.12.31) දක්වා.**

| # | සංරචක | අරමුදල් මූලාශ්‍රය | වැඩසටහන | ව්‍යාපෘති සංඛ්‍යාව | මුළු පිරිවැය (රු.මි.) | වියදම (රු.මි.) |
|---|---|---|---|---|---|---|
| 01. | ග්‍රාමීය ප්‍රවේශය | මුදල් අමාත්‍යාංශය සහ ජනාධිපති ලේකම් කාර්යාලය | DCB,RDB සහ DDP | 98 | 28.4 | 14.2 |
| | ග්‍රාමීය පාලම | | RIDP | | | |
| 02. | ග්‍රාමීය විදුලිබලය | මුදල් අමාත්‍යාංශය සහ ජනාධිපති ලේකම් කාර්යාලය | DCB,RDB සහ DDP | 40 | 7.525 | 3.25 |
| 03. | ක්‍රීඩා පිටිය | මුදල් අමාත්‍යාංශය සහ ජනාධිපති ලේකම් කාර්යාලය | DCB,RDB සහ DDP | 15 | 3.6 | 1.8 |
| 04. | සමාජ සුබසාධනය | මුදල් අමාත්‍යාංශය සහ ජනාධිපති ලේකම් කාර්යාලය | DCB,RDB සහ DDP | 367 | 60.46 | 32.4 |
| 05. | ග්‍රාමීය ජල සැපයුම | මුදල් අමාත්‍යාංශය සහ ජනාධිපති ලේකම් කාර්යාලය | DCB,RDB සහ DDP | 12 | 1.4 | 0.9 |
| 06. | අනෙකුත් යටිතල පහසුකම් (බස් නැවතුම්) | මුදල් අමාත්‍යාංශය සහ ජනාධිපති ලේකම් කාර්යාලය | DCB,RDB සහ DDP | 904 | 415.47 | 231.412 |
| | | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය | තොරතුරු තාක්ෂණ උද්‍යානය සහ වාහන උද්‍යානය සඳහා තෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම | 1 | 100 | |
| | | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය | ප්‍රතිසංස්කරණය සහ අලුත්වැඩියාව | 8 | 5.35 | 2.832 |
| **මුළු එකතුව** | | | | **1445** | **622.205** | **286.794** |

**පින්තූර 3.11: මන්නාරම දිස්ත්‍රික්කයේ ව්‍යාපෘති හා වැඩසටහන්**



ව්‍යාපෘතියේ නම :- නානාට්ටන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ජල ටැංකිය ඉදිකිරීම

ස්ථානය :- නානාට්ටන්
මුළු පිරිවැය :- රු.මි. 1.5
වියදම :- රු.මි. 1.5
ආරම්භක දිනය :- 2024.06.14
නිමකල දිනය :- 2024.09.15




ව්‍යාපෘතියේ නම :- ශාන්ත නිකලස් දේවස්ථානයේ අලුත්වැඩියා කටයුතු.

ස්ථානය :- ශාන්ත නිකලස්
මුළු පිරිවැය :- රු.මි 0.5
වියදම :- රු.මි 0.48
ආරම්භක දිනය :- 2024.08.20
නිමකල දිනය :- 2024.09.19




ව්‍යාපෘතියේ නම :- කල්ලිකඩ්ඩයිකාඩු දිව්‍ය මධ්‍යස්ථාන මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම.

ස්ථානය :- කල්ලිකඩ්ඩයිකාඩු
මුළු පිරිවැය :- රු.මි 0.25
වියදම :- රු.මි 0.25
ආරම්භක දිනය :- 2024.08.20
නිමකල දිනය :- 2024.09.19



ව්‍යාපෘතියේ නම :- ඕර්ඩ්ස් ගොඩනැගිල්ල තමරයිකුලම් ප්‍රතිසංස්කරණය කිරීම

ස්ථානය :- තමරයිකුලම්
මුළු පිරිවැය :- රු.මි 0.5
වියදම :- රු.මි 0.232
ආරම්භක දිනය :- 2024.07.25
නිමකල දිනය :- 2024.08.24

**iv.** **රාජ්‍ය ආදායම් උපයා ගැනීමේ ව්‍යාපෘති**

**වගුව 3.30. මන්නාරම දිස්ත්‍රික්කය - ආදායම් උපයා ගැනීම් 2024.01.01 සිට 2024.12.31 දක්වා**

| # | ආදායම් ශීර්ෂය | ආදායම (රු.මි.) |
|---|---|---|
| 01. | රෙජිස්රාර් ජනරාල් දෙපාර්තමේන්තුව | 10.069 |
| | මුළු එකතුව | **10.069** |

## 3.12. වවුනියාව දිස්ත්‍රික්කය

### i. හැඳින්වීම

**පසුබිම**

ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ පිහිටා ඇති වවුනියා දිස්ත්‍රික්කය වර්ග කිලෝමීටර් 1,891 ක් වන භූමි ප්‍රමාණයකින් යුක්තවේ. එය උතුරු පළාතේ මුළු භූමි ප්‍රමාණයෙන් 10% පමණ ආවරණය කරන අතර සමස්ථ භූමි ප්‍රමාණයෙන් 3% පමණ වේ. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හතරක් හා ග්‍රාම නිලධාරි වසම් 102 කින්ද සමන්විත දිස්ත්‍රික්යේ ආර්ථික ක්ෂේත්‍ර අතර කෘෂිකාර්මාන්තය, සත්ව පාලනය, මිරිදිය මත්ස්‍ය යන කර්මාන්තය ප්‍රධාන වේ.
2024 වර්ෂයට මුළු පවුල් සංඛ්‍යාව 45,071 ක් වන අතර මුළු ජනගහනය 192,572 ක් වේ. ජන සංයුතිය ශ්‍රී ලාංකේය දෙමළ 79.36% ක් සිංහල 10.23 **ක්** මුස්ලිම් 9.95% ක් සහ වෙනත් ජනවර්ග 0.14 **ක්** ලෙස වේ.

**දිස්ත්‍රික්කයේ ප්‍රධාන සංරචක**

**ප්‍රධාන සංරචක**

- කෘෂිකර්මය
- සෞඛ්‍යය
- අධ්‍යාපනය
- සමාජ සුබසාධනය

**විෂය පථය**

- වවුනියා දිස්ත්‍රික්කයේ ජනතාවගේ ජීවිත තත්ත්වය උසස් කිරීම සඳහා විශිෂ්ට සේවා සැපයීම.

**ක්‍රියාකාරිත්වය**

- රාජ්‍ය ප්‍රතිපත්ති සහ නීතිමය කටයුතු අනුමත ව්‍යාපෘති සහ සමාජ ආර්ථික සංවර්ධන ව්‍යාපෘති සමඟ
- ඒකාබද්ධව දිස්ත්‍රික්කයේ ජනතාවගේ යහපත් කටයුතු සහ සංවර්ධනය සඳහා සංවිධානය කිරීම.

**විශේෂ ළඟා කරගැනීම**

- උදු වගා කිරීම් හෙක්ටයාර් 5,500 ක් පමණ වැඩි වී ඇත. එය ජාතික වගා ප්‍රමාණයෙන් 55%ක් වේ.

**අභියෝග**

- ජනගහනයෙන් 45% ක් පමණ ජනතාව දුර්දතාවයෙන් හා ආහාර සුරක්ෂිතතාවයක් නොමැති වීම.

- **වාර්මාර්ග පද්ධතිය**
  දිස්ත්‍රික්කයේ වාරිමාර්ග වැව් 802 ක් පවතින අතර ඉන් 585ක් පමණක් ක්‍රියාත්මක තත්ත්වයේ නොපවතී එය කෘෂිකාර්මික ජල අවශ්‍යතා සපුරාගැනීමට අපහසුකම් ඇති වී ඇත. මෙය පවුල්වල අඩු ආදායමට සහ දුප්පත්කමට හේතු වී ඇත.
- **භුගත ජල විෂමතාවය**
  බොහෝ ප්‍රදේශවල භුගත ජලය භාවිතයට සුදුසු ගුණාත්මක තත්ත්වයෙහි නොමැති වීම.
- **අර්ධ සංවර්ධිත කර්මාන්ත ක්ෂේත්‍රය**
  ප්‍රධාන වශයෙන් කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යාපාරවල නව ආයෝජන නොමැතිවීම හේතුවෙන් කාර්මික අංශය මන්දගාමී වීම.
- **ව්‍යාපාරික මට්ටමේ පශුපාලනයේ වර්ධනය අඩුවීම.**
  බිත්තර අවශ්‍යතාවයෙන් 30% ක් පමණ දිස්ත්‍රික්කය තුළ නිපදවීමට අවශ්‍ය සම්පත් ඇති බැවින් කිරි නිෂ්පාදනයද සංවර්ධනය කළ හැකිය වුවද නවායෝජනය හා නව තාක්ෂණය නොමැති වීම සත්තු නිෂ්පාදන අංශය නොදියුණු වීමට හේතු වී ඇත.

**අනාගත ඉලක්ක**

- උදු වගා කිරීම **15%** කින් වැඩි කිරීම.
- නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ අඹ**,** රතු කෙසෙල්**,** ගස්ලබු**,** ගම්මිරිස් හා කුරුඳු ගම්මාන පිළිවෙලින් 02 ක් හා 01 ක් ඇතිකිරීම.
- සංචාරක ව්‍යාපාර සංවර්ධනය - දිස්ත්‍රික්ක 06 ක් සම්බන්ධ කරමින් **A9** මාර්ගයේ සංචාරක මධ්‍යස්ථානයක් ඇතිකර තිබීම**.**

- දේශීය නිෂ්පාදන වෙළඳපොළ පහසුකම් වැඩි කිරීම.
- 2025 වන විට බිත්තර නිෂ්පාදනය දෙගුණ කිරීම.
- දුප්පත්කම අවම කිරීමේ වැඩසටහන

**ii.ආයතනයේ මූල්‍ය ප්‍රගතිය (2024.01.01 සිට 2024.12.31 දක්වා)**

පුනරාවර්තන වියදම් - රු.මි. 625.65 ප්‍රාග්ධන වියදම් - රු.මි. 64.39

**iii. ආයතනයේ භෞතික ප්‍රගතිය**

**වගුව 3.31: වවුනියාව දිස්ත්‍රික්කය - ක්‍රියාත්මක ප්‍රාග්ධන අරමුදල් ව්‍යාපෘතිවල ප්‍රගතිය (2024.01.01 සිට 2024.12.31 දක්වා)**

| # | සංරචකය | අරමුදල් මූලාශ්‍රය | වැඩසටහන | ව්‍යාපෘති සංඛ්‍යාව | මුළු පිරිවැය රු.(මි) | වියදම රු.(මි) |
|---|---|---|---|---|---|---|
| 01. | ප්‍රවේශ මාර්ග | ගෘහස්ථ | දිස්ත්‍රික් විශේෂ සංවර්ධන වැඩසටහන | 26 | 13.87 | 13.875 |
| | | | විමධ්‍යගත ප්‍රග්ධන අයවැය | 11 | 4.250 | 4.250 |
| | | | ප්‍රදේශීය සංවර්ධන වැඩසටහන | 9 | 2.275 | 2.275 |
| | | M/ අධිවේගී මාර්ග | ග්‍රාමීය මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය | 34 | 50.00 | 49.021 |
| 03. | ග්‍රාමීය විදුලිබල ව්‍යාප්තිය | ගෘහස්ථ | දිස්ත්‍රික් විශේෂ වැඩසටහන | 4 | 1.100 | 1.100 |
| | | | විමධ්‍යගත ප්‍රග්ධන අයවැය | 5 | 1.760 | 1.760 |
| 04. | සනීපාරක්ෂක පහසුකම් | ගෘහස්ථ | දිස්ත්‍රික් විශේෂ සංවර්ධන වැඩසටහන | 1 | 0.100 | 0.100 |
| 05. | ක්‍රිඩා පිටිය | | දිස්ත්‍රික් සංවර්ධන ව්‍යාපෘතිය | 111 | 30.990 | 30.990 |
| | | | විමධ්‍යගත ප්‍රග්ධන අයවැය | 45 | 14.700 | 14.700 |
| | | | ප්‍රදේශීය සංවර්ධන වැඩසටහන | 8 | 1.550 | 1.550 |
| 06. | සුළු වාරිමාර්ග | ගෘහස්ථ | දිස්ත්‍රික් විශේෂ සංවර්ධන වැඩසටහන | 2 | 0.770 | 0.770 |
| | | | විමධ්‍යගත ප්‍රග්ධන අයවැය | 3 | 0.600 | 0.600 |
| | | | ප්‍රදේශීය සංවර්ධන වැඩසටහන | 1 | 0.200 | 0.200 |
| 07. | ආගමික සංවර්ධනය | ගෘහස්ථ | දිස්ත්‍රික් විශේෂ සංවර්ධන වැඩසටහන | 256 | 109.325 | 109.325 |
| | | | විමධ්‍යගත ප්‍රග්ධන ප්‍රග්ධන අයවැය | 123 | 31.593 | 31.593 |
| | | | ප්‍රදේශීය සංවර්ධන වැඩසටහන | 67 | 13.150 | 13.150 |
| 08. | ග්‍රාමීය ආර්ථික යටිතල පහසුකම් | ගෘහස්ථ | දිස්ත්‍රික් විශේෂ සංවර්ධන වැඩසටහන | 249 | 72.835 | 72.835 |
| | | | දිස්ත්‍රික් සංවර්ධන ව්‍යාපෘතිය | 287 | 57.597 | 57.597 |
| | | | විමධ්‍යගත ප්‍රග්ධන අයවැය | 67 | 12.825 | 12.825 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 10. | නිවාස සංවර්ධනය | M/නාගරික සංවර්ධන සහ නිවාස | කොන්ක්‍රීට් ගඩොල් සහ මෝටර් වර්ගයේ ස්ථිර නිවාස වැඩසටහන | 361 | 241.123 | 233.551 |
| 11. | සූර්ය පැනල/ විදුලිය | ගෘහස්ථ | දිස්ත්‍රික් විශේෂ සංවර්ධන වැඩසටහන | 1 | 0.400 | 0.400 |
| 12. | ග්‍රාමීය ජල සැපයුම | ගෘහස්ථ | දිස්ත්‍රික් විශේෂ සංවර්ධන වැඩසටහන | 1 | 0.100 | 0.100 |
| | | | විමධ්‍යගත ප්‍රග්ධන අයවැය | 9 | 1.735 | 1.735 |
| 13. | | M/නාගරික සංවර්ධන සහ නිවාස | ජල සම්බන්ධතා නල මාර්ගය I (CRIWMP) | 1 (1277 Beneficiaries) | 15.324 | 15.324 |
| | | | ජල සම්බන්ධතා නල මාර්ගය I (CRIWMP) | 1 (810 Beneficiaries) | 25.540 | 25.840 |
| 14. | නිල සෙවන | ගෘහස්ථ | දිස්ත්‍රික් විශේෂ සංවර්ධන වැඩසටහන | 1 | 0.200 | 0.200 |
| 15. | වෙනත් යටිතල පහසුකම් | ගෘහස්ථ | දිස්ත්‍රික් විශේෂ සංවර්ධන වැඩසටහන | 40 | 17.285 | 17.285 |
| | | | දිස්ත්‍රික් සංවර්ධන ව්‍යාපෘතිය | 5 | 3.350 | 3.350 |
| **මුළු පිරිවැය** | | | | **1732** | **725.603** | **725.603** |

**iv.** රාජ්‍ය ආදායම් උපයා ගැනීමේ ව්‍යාපෘති

**වගුව 3.32: වවුනියාව දිස්ත්‍රික්කය - ආදායම් උපයා ගැනීම් 2024.01.01 සිට 2024.12.31 දක්වා**

| # | ආදායම් ශිර්ෂය | ආදායම (රු.මි.) |
|---|---|---|
| 01. | වෙනත් ලැබීම් | 4.10 |
| 02. | ලියාපදිංචි ගාස්තු | 13.48 |
| 03. | රජයේ ගොඩනැඟිලි සහ නිවාස සඳහා කුලියට | 7.09 |
| 04. | මුද්දර එකතු කිරීම | 0.007 |
| 05. | විභාග ගාස්තු | 0.003 |
| **මුළු එකතුව** | | **24.68** |

## 3.13. මුලතිව් දිස්ත්‍රික්කය

### i. හැඳින්වීම

**පසුබිම**

හෙක්ටයාර 167,850 ක වපසරියකින් යුත් මුලතිව් දිස්ත්‍රික්කයේ ඡන්දදායකයින් 86,889 , ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 6 සහ ග්‍රාම නිලධාරී වසම් 136 සිටින අතර පවුල් 47,832 කින් සමන්විත සාමාජිකයින් 141,460 ක් ඇත.

**දිස්ත්‍රික්කයේ ප්‍රධාන සංරචක**

**ප්‍රධාන සංරචක**

- දිස්ත්‍රික් පරිපාලනය
- රජයේ කටයුතු සම්බන්ධීකරණය
- සමාජ හා සංස්කෘතික සංවර්ධනය
- ආර්ථික හා කාර්මික සංවර්ධනය

**විෂය පථය**

- රජයේ ප්‍රතිපත්තිවලට අනුකූලව සම්පත් ප්‍රශස්ත ලෙස කළමනාකරණය කිරීම, ජනතාවගේ අවශ්‍යතා සහතික කිරීම සහ පරිසරය ආරක්ෂා කිරීම.

**ක්‍රියාකාරීත්වය**

- ක්‍රියාත්මක කිරීමේ සීමිත ක්ෂේත.
- අනෙකුත් පාර්ශ්වකරුවන් සඳහා ඉලක්ක සැකසීම
- ඒකාබද්ධ කළමනාකාරිත්වය සහ ඉලක්ක සපුරා ගැනීම
- පෝෂණය කිරීම
- දිස්ත්‍රික්කයේ ප්‍රධාන කාර්යයන් පිළිබඳ වගකීම.

**විශේෂ ළඟා කරගැනීම**

- ප්‍රාග්ධන කටයුතු සියයට 70ක් අවසන් කර ඇත.
- නිලධාරීන් 830 ක් පුහුණු කර ඇත.
- විවිධාංගීකරණය වූ අයවැය වියදම මිලියන 85.5 කි

**අභියෝග**

- සංවර්ධන කටයුතු සඳහා ඉඩම් නොමැතිකම
- සංවර්ධන ව්‍යාපෘති සඳහා තාක්ෂණික කාර්ය මණ්ඩල හිඟය
- සැලසුම් සේවා කාර්ය මණ්ඩලයේ හිඟය

**අනාගත ඉලක්ක**

- කෘෂිකාර්මික නවීකරණ යෝජනා ක්‍රමය
- දිස්ත්‍රික් කාර්මික සංවර්ධන යෝජනා ක්‍රමය
- දිස්ත්‍රික් සංචාරක සංවර්ධන යෝජනා ක්‍රමය
- දිස්ත්‍රික් ප්‍රජා සංවර්ධන යෝජනා ක්‍රමය
- පිරිසිදුකම සහ හරිතාගාර යෝජනා ක්‍රමය

### ii.ආයතනයේ මූල්‍ය ප්‍රගතිය (2024.01.01 සිට 2024.12.31 දක්වා)

පුනරාවර්තන වියදම් - **රු.මි** 248.038 ප්‍රාග්ධන වියදම් - **රු.මි**.24.99

**වගුව 3.33: මුලතිව් දිස්ත්‍රික්කය - 2025 වර්ෂය සඳහා අපේක්ෂිත අයවැය යෝජනා. (සාරාංශගතව)**

| # | ව්‍යාපෘතියේ නම | ඇස්තමේන්තුගත මුළු පිරිවැය (රු.මි) | අපේක්ෂිත වෙන් කිරීම් (රු.මි) |
|---|---|---|---|
| 01. | දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම (දෙවන අදියර) | 644.85 | 644.85 |
| 02. | දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වැඩිදියුණු කිරීමේ වැඩ සැලසුම් | 90.4 | 90.4 |
| 03. | දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල නේවාසිකාගාර ගබඩා ලේඛනාගාරය ඉදිකිරීම | 87.00 | 87.00 |
| **මුළු එකතුව** | | **822.25** | **822.25** |

**පිංතූර 3.12 : මුලතිව් දිස්ත්‍රික්කයේ ව්‍යාපෘති හා වැඩසටහන්**



| | |
|---|---|
| ව්‍යාපෘතියේ නම | : ගබඩා කාමරය ඉදිකිරීම (16m x8m) |
| ස්ථානය | :දිස්ත්‍රික් ලේකම් කාර්යාලය |
| මුළු පිරිවැය | : 3,752,348.68 |
| පිරිවැය | : 3,552,348.68 |
| ආරම්භක දිනය | : 04.07.2023 |
| අවසන් දිනය | : 25.08.2023 |



| | |
|---|---|
| ව්‍යාපෘතියේ නම | : නිවස ප්‍රතිසංස්කරණය කිරීම |
| ස්ථානය | : සෙල්වපුරම් |
| මුළු පිරිවැය | : රු.මි. 1.0 |
| පිරිවැය | : රු.මි. 0.4 |
| ආරම්භක දිනය | : 27.06.2024 |
| අවසන් දිනය | : 31.12.2024 |

**iii. ආයතනයේ භෞතික ප්‍රගතිය**

**වගුව 3.34 : මුලතිව් දිස්ත්‍රික්කය - කාරක ප්‍රාග්ධන අරමුදල් ව්‍යාපෘති වල ප්‍රගතිය. (2024.01.01 සිට 2024.12.31) දක්වා.**

| # | සංරචකය | මූලා | වැඩසටහන | ව්‍යාපෘති සංඛ්‍යාව | මුළු පිරිවැය (රු.මි.) | පිරිවැය (රු.මි.) |
|---|---|---|---|---|---|---|
| 1 | මාර්ග සංවර්ධනය | දේශිය මූලා | විමධ්‍යගත අයවැය | 76 | 37.16 | 6.52 |
| 2 | ග්‍රාමීය පාලම් | | | 3 | 1.35 | 0.82 |
| 3 | ග්‍රාමීය විදුලිය | | | 9 | 2.72 | 1.42 |
| 4 | සනීපාරක්ෂක පහසුකම් | | | 12 | 5.20 | 3.09 |
| 5 | ක්‍රීඩා පිටි | | | 95 | 19.85 | 7.12 |
| 6 | කුඩා ජල වාරිමාර්ග | | | 0 | - | - |
| 7 | ග්‍රාමීය ආර්ථික යටිතල පහසුකම් | | | 16 | 4.55 | 2.39 |
| 8 | ආගමික ස්ථාන සංවර්ධනය | | | 46 | 15.85 | 11.44 |
| 9 | සමාජ සුබසාධනය | | | 23 | 18.10 | 2.35 |
| 10 | නිවාස පහසුකම් | | | 112 | 60.177 | 39.65 |
| 11 | සූර්ය කෝෂ විදුලිය | | | 6 | 1.77 | 0.94 |
| 12 | ග්‍රාමීය ජල සැපයුම් | | | 8 | 2.20 | 1.50 |
| 13 | වෙනත් යටිතල පහසුකම් | | | 224 | 50.20 | 16.07 |
| 14 | නිල සෙවන | | | 0 | - | - |
| 15 | සංචාරක | | සංචාරක අමාත්‍යාංශය | 1 | 8.646 | 2.191 |
| 16 | පරිපාලනය ශක්තිමත් කිරීම | | ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | 45 | 49.447 | 27.67 |
| **මුළු එකතුව** | | | | **676** | **277.22** | **123.171** |

**iv. රාජ්‍ය ආදායම් උපයා ගැනීමේ ව්‍යාපෘති**

**වගුව 3.35 : මුලතිව් දිස්ත්‍රික්කය - ආදායම් උපයා ගැනීම් 2024.01.01 සිට 2024.12.31 දක්වා**

| ආදායම් ශීර්ෂය | | ආදායම (රු.මි.) |
|---|---|---|
| 1003.07.02 | රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව | 4.85 |
| 1003.07.03 | පුද්ගලික දැව ප්‍රවාහන බලපත්‍ර | 0.03 |
| 1003.07.05 | ආරක්ෂක අමාත්‍යාංශය | 0.025 |
| 1003.07.99 | බලපත්‍ර බදු සහ වෙනත් | 0.027 |
| 2002.01.01 | රජයේ නිවාස ගොඩනැගිලි කුලිය | 1.440 |
| 2002.02.99 | පොලී සහ වෙනත් | 1.604 |
| 2003.02.03 | ජාතික හැඳුනුම්පත | 2.485 |
| 2003.02.06 | පශු සම්පත් මාරු දීමනාව | 0.047 |
| 2003.02.14 | මෝටර් ප්‍රවාහන සහ වෙනත් | 4.122 |
| 2003.02.99 | විවිධ වියදම් | 0.162 |
| 2003.99.00 | වෙනත් රිසිට්පත් ණය | 3.132 |
| 2004.01.00 | විශ්‍රාම වැටුප් | 12.306 |
| 2006.02.02 | වාහන සහ අනෙකුත් | 0.411 |
| **මුළු එකතුව** | | **30.649** |

## 3.14. කිලිනොච්චි දිස්ත්‍රික්කය

### i. හැඳින්වීම

**පසුබිම**

වර්ග කිලෝමීටර 1,279 කින් සමන්විත කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 04 ක් ද, ග්‍රාම නිලධාරී වසම් ක්ද පවුල් 354 ක්ද ගම් 9550,610 ක් ද වන අතර ජනගහණය 150,125ක් වේ.

**දිස්ත්‍රික්කයේ ප්‍රධාන සංරචක**

**ප්‍රධාන සංරචක**

- දිළිඳුකම තුරන් කිරීම
- ජීවනෝපාය ප්‍රවර්ධනය
- යහපාලන පරිපාලනය
- තාක්ෂණික පරිහරණය

**විෂය පථය**

- දිළඳුකම හැකි ප්‍රමාණයක් අවම කිරීම
- ස්ථිර සාර ආදායම් මට්ටම තහවුරු කිරීම
- යහපාලනය තහවුරු කිරීම
- විද්‍යුත්කරණය මඟින් මහජන සේවාවන් ලබාදීම ලිහිල් කිරීම

**ක්‍රියාකාරීත්වය**

- සමෘද්ධි ව්‍යාපෘති හා ස්වයං රැකියා අවස්ථාවන් ලබාදීම
- ස්වයං අවශ්‍යතාවයන් ඉටු කරන අයුරෙන් ජීවනෝපාය ආධාර ලබාදීම
- තාක්ෂණික සංවර්ධනය සඳහා සම්පත් කාර්යක්ෂමව භාවිතා කිරීම

**විශේෂ ළඟා කරගැනීම**

- ප්‍රතිලභීන් 26 දෙනෙකුට නිවාස ලබාදී ඇත.
- ග්‍රාමීය ජල යෝජනා ක්‍රමය 02 ක් ලබාදී ඇත.
- ග්‍රාමීය විදුලිය යෝජනා ක්‍රමය 09 ක් ප්‍රදානය කර ඇත.
- ග්‍රාමීය එළු අභිජනන යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභීන් 56 දෙනෙකු සඳහා මිලියන 4.90 ක් වටිනා එළුවන් බෙදා දී ඇත.
- නාගරික සංවර්ධන යෝජනා ක්‍රමය යටතේ පවුල් 500 කට නිවාස ලබාදී තිබෙනවා.

**අභියෝග**

- මුදල් හිඟකම
- යෙදුම් ලබා ගැනීමේ ප්‍රමාදය
- මුදල් උද්ධමනයේ බලපෑම

**අනාගත ඉලක්ක**

- කිලිනොච්චි දිස්ත්‍රික්කයේ දිළිඳුකමින් තොර ජන සමාජයක් බිහි කිරීම
- තිරසාර සංවර්ධන මට්ටම තහවුරු කිරීම.
- සියලු ක්‍රියාකාරකම්වල යහපාලනය සහතික කිරීම
- පරිපාලනයේ තාක්ෂණික භාවිතය වැඩි දියුණු කිරීම

### ii.ආයතනයේ මූල්‍ය ප්‍රගතිය

**(2024.01.01 සිට 2024.12.31 දක්වා)**

පුනරාවර්ත වියදම් - රු.මි. 461.16
ප්‍රාග්ධන වියදම් - රු.මි. 11.84

**වගුව 3.36: කිලිනොච්චි දිස්ත්‍රික්කය - 2025 වර්ෂය සඳහා අපේක්ෂිත අයවැය යෝජනා (සාරාංශය)**

| # | ව්‍යාපෘතියේ නම | ඇස්තමේන්තු ගත මුළු පිරිවැය (රු.මි) | 2025 අයවැයයෙන් අපේක්ෂිත වෙන් කිරීම් (රු.මි) |
|---|---|---|---|
| 01 | ජීවනෝපාය ආධාර ලබා දීම | 500.0 | 500.0 |
| 02 | යටිතල පහසුකම් සැපයීම | 300.0 | 300.0 |
| 03 | අවතැන් වූ ජනතාවට නිවාස ලබාදීම | 200.0 | 200.0 |

iii. **ආයතනයේ භෞතික ප්‍රගතිය**

**වගුව 3.37: කිලිනොච්චි දිස්ත්‍රික්කය - ක්‍රියාත්මක ප්‍රාග්ධන අරමුදල් ව්‍යාපෘතිවල ප්‍රගතිය (2024.01.01 සිට 2024.12.31 දක්වා)**

| # | සංරචකය | අරමුදල් මූලාශ්‍රය | වැඩසටහන | ව්‍යාපෘති සංඛ්‍යාව | මුළු පිරිවැය (රු.මි) | වියදම (රු.මි) |
|---|---|---|---|---|---|---|
| 01. | ප්‍රවේශ මාර්ග | ඒකාබද්ධ අරමුදල | | 17 | 18.85 | 17.6 |
| 02. | ග්‍රාමීය පාලම් | | | | | |
| 03. | ග්‍රාමීය විදුලි දිගු | | | 09 | 1.8 | 1.4 |
| 04. | සනීපාරක්ෂක පහසුකම් | | | | | |
| 05. | ක්‍රීඩා පිටි | | | 06 | 2.05 | 1.55 |
| 06. | සුළු වාරිමාර්ග | | | 06 | 4.15 | 3.5 |
| 07. | ආගමික මධ්‍යස්ථාන සංවර්ධනය | | පන්සල් ප්‍රතිසංස්කරණය | 02 | 0.6 | 0.6 |
| 08. | සමාජ සුබ සාධනය | | | 79 | 31.4 | 25.53 |
| 09. | නිවාස සංවර්ධනය | | **නිවාස වැඩසටහන** | 26 | 23.6 | 1.6 |
| 10. | සූරිය පැනල/ විදුලිය | | | | | |
| 11. | ග්‍රාමීය ජල සැපයුම් | | | 02 | 0.18 | 0.18 |
| 12. | නිල සෙවන | | | 01 | 01 | 01 |
| 13. | වෙනත් වටිතල පහසුකම් | | | 41 | 18.47 | 15.5 |
| මුළු එකතුව | | | | **192** | **108.5** | **73.36** |

**පිංතූර 3.13: කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ව්‍යාපෘති හා වැඩසටහන්**



ව්‍යාපෘතියේ නම : - නිවාස වැඩසටහන
ස්ථානය : - උමයාල්පුරම්
මුළු පිරිවැය :- රුමි. 4.92
වියදම :- රුමි.4.90
ආරම්භක දිනය :- 30.10.2024
නිමකල දිනය :- 31.12.2024



ව්‍යාපෘතියේ නම :- නිවාස වැඩසටහන
ස්ථානය :- කඳවල
මුළු පිරිවැය :- රු.මි. 1.
වියදම :- රු.මි. 0.2
ආරම්භක දිනය :-26.07.2024
නිමකල දිනය :- 31.12.2024

## 3.15. මඩකලපුව දිස්ත්‍රික්කය

### i. හැඳින්වීම

**පසුබිම**

මඩකළපුව දිස්ත්‍රික්කය උතුරෙන් වෙරුගල් ගඟ හා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය ද නැගෙනහිරින් බෙංගාල බොක්ක ද දකුණ හා නිරිත දිගින් අම්පාර දිස්ත්‍රික්කය ද බස්නාහිර හා වයඹ දිශාවේ පොලොන්නරුව දිස්ත්‍රික්ක වලින් මායිම් කර ඇත. මෙම දිස්ත්‍රික්කයේ සම්පූර්ණ භූමිය වර්ග ප්‍රමාණය කි.මී. 2,624.19 වන අතර ශ්‍රී ලංකාවේ මුළු භූමි ප්‍රමාණයේ 3.8% ප්‍රතිශතයක් වේ.

2023 වැනි අවුරුද්දේ දත්ත අනුව දිස්ත්‍රික්කය තුළ ජීවත්වන පවුල් සංඛ්‍යාව 205,933 වන අතර මුළු ජනගහණය 654,985 ලෙස සඳහන් වේ .එම ජනගහණයේ ඝණත්වය වූය වර්ග කිලෝ මීටරයකට පුද්ගලයන් 229 වූහ .මෙම දිස්ත්‍රික්කය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 14 කින් ද ග්‍රාම නිලධාරි වසම් 345 කින් ද බෙදී ඇත . තවද ඡන්ද දායක කොට්ඨාශ තුනකින් යුක්තයකි .දිස්ත්‍රික්කයේ ආර්ථිකය කෘෂිකර්ම, ධීවර හා පශු සම්පත් ආදි කර්මාන්ත වලින් රඳා පැවති.

**දිස්ත්‍රික්කයේ ප්‍රධාන සංරචක**

**ප්‍රධාන සංරචක**

- දිස්ත්‍රික්කයේ ප්‍රධාන ආර්ථික කටයුතු ලෙස කෘෂි බෝග,පශු සම්පත් සහ ධීවර කර්මාන්තය යන අංශවේ.
- කුඩා හා මධ්‍යම ප්‍රමාණ කර් මාන්ත හා සෙසු කර්මාන්ත කටයුතු ඉහළ නැංවීම.
- කෘෂිකර් ම සඳහා වාරිමාර් ග යෝජනා ක්‍රම වැඩි දියුණු කිරීම.
- යටිතල පහසුකම් පුළුල් කිරීම.
- නිවාස නොමැති අයට නිවාස ලබාදීම.
- ප්‍රමාණවත් රෝග නිවාරණ කටයුතු සහ සෞඛ්‍ය සේවා ලබා දීම.
- දිස්ත්‍රික්කයේ ජීවත්වන සියළු දරු දැරියන් සඳහා ගුණාත්මක අධ්‍යාපන ලබාදීම
- සංචාරක නිෂ්පාදනය සංවර්ධනය කිරීම.
- රැකියා විරහිත භාවය අඩු කිරීම.
- දිස්ත්‍රික්කයේ සමස්ත පරිපාලනය සහ සම්පත් කළමනාකරණය නිසියාකාරව සිදුකිරීම.

**විෂය පථය**

- විශිෂ්ඨ මහජන සේවාවන් තුළින් මඩකලපුව දිස්ත්‍රික්කයේ ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීම.
- ඵලදායී ප්‍රදේශයේ මට්ටමේ සංවර්ධන හා පරිපාලනයක් තුළින් විශිෂ්ට රාජ්‍ය සේවයක් සහතික කරමින් මඩකළපු දිස්ත්‍රිකයේ ජනතාවගේ ජීවන තත්වය ඉහල නැංවීම.

**ක්‍රියාකාරිත්වය**

- රජයේ ප්‍රතිපත්ති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීම
- විනිවිද පෙනෙන, අපක්ෂපාති සහ වගකීම් සහගත රාජ්‍ය සේවයක් ලබා දීමට
- සමාජ ආර්ථික හා සංස්කෘතික වටිනාකම් ප්‍රවර්ධන කිරීම සහ ආරක්ෂා කිරීම
- සේවා සැපයීමේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම
- පහසු සහ සාධාරණ ප්‍රවේශය කෙරෙහි අවධානය යොමු කරමින් ජනතාවගේ ජීවන තත්ත්වය නඟාසිටුවීම සඳහා ආර්ථික සංවර්ධන ක්‍රියාකාරම් සංවර්ධනය කිරීම සහ සහාය වීම
- නවීන තොරතුරු තාක්ෂණය සහ නවෝන්පාදන හරහා සේවාවේ ඵලදායිතාව වැඩි දියුනු කිරීම
- ස්වභාවික සම්පත් කලමනාකරණය සහ තිරසාර කෘෂිකාර්මික පියවර සංවර්ධනය කිරීම
- අවදානම් සහ ආපදා කළමනාකරණය සඳහා පූර්ව සලසුම් ක්‍රියාකාරකම් සහතික කිරීම
- මැතිවරණ කටයුතු සම්බන්ධීකරණය කිරීම
- විවාහය, උපත සහ මරණය වැනි ලියාපදිංචි අයතින් සුරක්ෂිත කර ගනීමට මහජනතාවට සහාය වීම

**විශේෂ ළඟා කරගැනීම**

- ග්‍රාමීය මාර්ග 309 ක් රු.මි. 750.00 කින් ඉදිකරන ලදී.
- ප්‍රතිලාභීන් 90 දෙනෙකුට එළුවන් 270ක් සපයන ලදී.

- ජනාධිපති ලේකම් කාර්යාලයේ අරමුදල රු.මි. 1,865ක් යටතේ ව්‍යාපෘති 1,552 ක් සිදු කර ඇත.
- මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නව ගොඩනැගිල්ල නිම කර ජනතා අයිතියට පත් කරන ලදී.
- සාමාජික දෙකකට වඩා සිටි පවුල්වලට සාමාන්‍ය වැසිකිලි සහිත නිවාස 206 ක් ඉදිකර ඇත.
- ලෝක ආහාර වැඩසටහන යටතේ රු.මි. 29.00 ක ප්‍රතිලාභ ප්‍රතිලාභීන්ට බෙදා දෙන ලදී.
- සෞභාග්‍ය නිෂ්පාදන ගම්මානය යටතේ ප්‍රතිලාභීන් 20 දෙනෙකුට එළුවන් 83ක් ලබා දෙන ලදී.

**අභියෝග**

- දිළිඳුකම පිටුදැකීම සහ සමාජ ආර්ථික අභියෝග.
  - සීමිත මූල්‍ය සම්පත් සහ අඩු ආදායම් සහ රැකියා විරහිත තරුණයන්.
- දේශගුණ විපර්යාස.
  - ජල හිඟය හේතුවෙන් කුඩා වැව් බොහොමයක් අතහැර දමා ඇත.
- ගොවිතැනට ප්‍රමාණවත් ජලය නොමැතිකම,වෙලඳපොලවලට ඇති දුර්වල ප්‍රවේශය, ගබඩා පහසුකම් නොමැතිකම සහ දුර්වල සැපයුම් දාමයන් නිසා පසු අස්වනු පාඩු සහ ගොවීන්ගේ ලාභය අඩු වේ.
- ප්‍රාග්ධනයට ප්‍රවේශය නොමැතිකම, උපදේශනය සහ ව්‍යාපාර ජාලයන් ආරම්භ කිරීම වලක්වාලීම වැනි බාධක.
- විශේෂයෙන්ම ග්‍රාමීය ප්‍රදේශවල සෞඛ්‍ය සේවා සහ අධ්‍යාපන මට්ටම් සඳහා සීමිත ප්‍රවේශය.

**අනාගත ඉලක්ක**

- තිරසාර හා දේශගුණයට ඔරොත්තු දෙන ගොවිතැන ප්‍රවර්ධනය කිරීමට වාරිමාර්ග හා ජල කළමනාකරණ පද්ධති වැඩිදියුණු කිරීම තුළින් වගා කළ හැකි භූමි ප්‍රමාණය 20% කින් වැඩි කිරීම.
- තිරසාර ජලජීවී වගා ව්‍යාපෘති පුළුල් කිරීම සහ ධීවර යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම.
- විශේෂයෙන්ම ග්‍රාමීය ප්‍රදේශවල සෞඛ්‍ය සේවා සඳහා ප්‍රවේශය වැඩි දියුණු කිරීම සහ මන්දපෝෂණය තුරන් කිරීම.
- තරුණ විරැකියාව විසඳීම සඳහා STEM අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම සහ තරුණයින් සඳහා වෘත්තීය පුහුණුව වැඩි කිරීම.
- හරිත බලශක්ති ව්‍යාපෘති ප්‍රවර්ධනය කිරීම සහ කෘෂිකර්මාන්තයේ සහ ධීවර කර්මාන්තයේ බලශක්ති කාර්යක්ෂමතාව ප්‍රවර්ධනය කිරීම.
- ඔරොත්තු දෙන යටිතල පහසුකම් කෙරෙහි අවධානය යොමු කරමින් මුළු දිස්ත්‍රික්කයම ආවරණය වන පරිදි ජල හා සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම.
- ආපදා අවදානම අවම කිරීම සඳහා පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති සහ හදිසි සූදානම සංවර්ධනය කිරීම.
- දේශගුණික විපර්යාස අනුවර්තන වැඩසටහන් සහ දේශගුණික මූල්‍යකරණය ප්‍රවර්ධනය කිරීම.
- වෙරළ පරිසර පද්ධති සහ තෙත්බිම් ආරක්ෂා කිරීම සහ පාසිකුඩා සහ කායන්කේනි වෙරළ තීරයන් සඳහා නිල් කොඩි සහතිකය ලබා ගැනීම.

**ii.ආයතනයේ මූල්‍ය ප්‍රගතිය (2024.01.01 සිට 2024.12.31 දක්වා)**

පුනරාවර්තන වියදම් - රු.මි. 2,457.81 ප්‍රාග්ධන වියදම් - රු.මි. 1,702.90

**වගුව 3.38 : මඩකලපුව දිස්ත්‍රික්කය - 2025 වර්ෂය සඳහා අපේක්ෂිත අයවැය යෝජනා (සාරාංශගතව)**

| # | ව්‍යාපෘතියේ නම | ඇස්තමේන්තු ගත මුළු පිරිවැය (රු.මි.) | 2025 අයවැයයෙන් අපේක්ෂිත වෙන් කිරීම් (රු.මි.) |
|---|---|---|---|
| 01. | සැතපුන් 22 ක් ධාරිතාව සහිත වී වියළුම් පද්ධතියක් ස්ථාපිත කිරීම | 105.00 | - |
| 02 | මඩකලපුව කලපුව හැරීම | 250.00 | - |
| මුළු එකතුව | | **355.00** | **-** |

**iii. ආයතනයේ භෞතික ප්‍රගතිය**

**වගුව 3.39: මඩකලපුව දිස්ත්‍රික්කය - ක්‍රියාත්මක ප්‍රාග්ධන අරමුදල් ව්‍යාපෘතිවල ප්‍රගතිය (2024.01.01 සිට 2024.12.31 දක්වා).**

| # | සංරචකය | අරමුදල් මූලාශ්‍රය | වැඩසටහන | ව්‍යාපෘති සංඛ්‍යාව | මුළු පිරිවැය (රු.මි) | වියදම (රු.මි) |
|---|---|---|---|---|---|---|
| 01. | ප්‍රවේශ මාර්ග | දේශීය | ග්‍රාමීය මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය | 311 | 750.19 | 637.19 |
| | | | විවිධාංගාකරණය වූ ඇයවැය යෝජනාව | 28 | 7.9 | 7.66 |
| | | | දිස්ත්‍රික් විශේෂ සංවර්ධන සැලැස්ම | 83 | 384.55 | 231.34 |
| 02. | ග්‍රාමීය විදුලි ව්‍යාප්තිය | | දිස්ත්‍රික් විශේෂ සංවර්ධන සැලැස්ම | 6 | 3.5 | 1.43 |
| | | | විවිධාංගාකරණය වූ ඇයවැය යෝජනාව | 7 | 2.15 | 2.09 |
| 03. | ක්‍රිඩාංගන | | දිස්ත්‍රික් විශේෂ සංවර්ධන සැලැස්ම | 132 | 294.20 | 266.08 |
| | | | විවිධාංගාකරණය වූ ඇයවැය යෝජනාව | 65 | 88.03 | 83.20 |
| 04. | සුළු වාරිමාර්ග | | දිස්ත්‍රික් විශේෂ සංවර්ධන සැලැස්ම | 7 | 71.00 | 7.12 |
| 05. | ග්‍රාමීය ආර්ථික යටිතල පහසුකම් | | ග්‍රාමීය එළු වගා ව්‍යාපෘතිය | 258 | 66.95 | 53.19 |
| | | | විවිධාංගාකරණය වූ ඇයවැය යෝජනාව | 118 | 53.24 | 51.76 |
| 06. | ආගමික සිද්ධස්ථාන සංවර්ධනය | | දිස්ත්‍රික් විශේෂ සංවර්ධන සැලැස්ම | 446 | 257.77 | 220.56 |
| | | | විවිධාංගාකරණය වූ ඇයවැය යෝජනාව | 383 | 121.40 | 117.50 |
| 07. | සමාජ සුබසාධනය | | දිස්ත්‍රික් විශේෂ සංවර්ධන සැලැස්ම | 1,621 | 768.65 | 690.95 |
| | | | විවිධාංගාකරණය වූ ඇයවැය යෝජනාව | 430 | 106.12 | 103.90 |
| 08. | නිවාස සංවර්ධන ව්‍යාපෘතිය | | නිවාස සංවර්ධන ව්‍යාපෘතිය | 244 | 220.17 | 219.85 |
| 09. | සූර්ය කෝෂ/විදුලිය | | | 209 | 9.75 | 9.75 |
| 10. | ග්‍රාමීය ජල සැපයුම | | ජල සැපයුම | 2 | 1.00 | 0.95 |
| | | | දිස්ත්‍රික් විශේෂ සංවර්ධන සැලැස්ම | 262 | 6.35 | 6.35 |

| # | සංරචකය | අරමුදල් මූලාශ්‍රය | වැඩසටහන | ව්‍යාපෘති සංඛ්‍යාව | මුළු පිරිවැය (රු.මි) | වියදම (රු.මි) |
|---|---|---|---|---|---|---|
| | | | විවිධාංගාකරණය වූ ඇයවැය යෝජනාව | 3 | 1.23 | 1.19 |
| 11. | අනෙකුත් යටිතල පහසුකම් | දේශීය | නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම | 1 | 100.5 | 95.59 |
| | | | දිස්ත්‍රික් විශේෂ සංවර්ධන සැලැස්ම | 246 | 111.85 | 110.26 |
| | | | විවිධාංගාකරණය වූ ඇයවැය යෝජනාව | 78 | 85.70 | 73.80 |
| මුළු එකතුව | | | | **4,939** | **3,512.20** | **2,991.70** |

**පින්තූර 3.14 : මඩකලපුව දිස්ත්‍රික්කයේ ව්‍යාපෘති හා වැඩසටහන්**



ව්‍යාපෘතියේ නම :- ග්‍රාමීය එළු වගාව
ස්ථානය :- මඩකළපුව දිස්ත්‍රික්
මුළු පිරිවැය :- රු.මි. 8.00
වියදම :- රු.මි. 5 .6
ආරම්භක දිනය :-2024.01.01
නිමකල දිනය :-2024.12.31



ව්‍යාපෘතියේ නම:-ග්‍රාමීය මාර්ගවලට බොරළු දැමීම
ස්ථානය :-මඩකළපුව දිස්ත්‍රික්
මුළු පිරිවැය :- රු.මි.750.00
වියදම :-
ආරම්භක දිනය :- 2024.01.01
නිමකල දිනය :- 2024.08.31

**iv. රාජ්‍ය ආදායම් උපයා ගැනීමේ ව්‍යාපෘති**

**වගුව 3.40 : මඩකලපුව දිස්ත්‍රික්කය - ආදායම් උපයා ගැනීම් 2024.01.01 සිට 2024.12.31 දක්වා**

| ආදායම් ශීර්ෂය | ආදායම (රු.මි.) |
|---|---|
| රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව ලියාපදිංචි ගාස්තු | 28.54 |
| ඉඩම් හා අනෙකුත් බදු | 0.006 |
| විභාග සහ අනෙකුත් ගාස්තු | 0.011 |
| ගොඩනැගිලි කුලිය | 2.29 |
| වෙනත් ආදායම් | 12.51 |
| මුළු එකතුව | **43.36** |

## 3.16. අම්පාර දිස්ත්‍රික්කය

### i. හැඳින්වීම

**පසුබිම**

නැගෙනහිර පළාතේ පිහිටි අම්පාර දිස්ත්‍රික්කය මෙරට වී සහ උක් නිෂ්පාදනය ඇතුළු කෘෂිකර්මාන්තය සඳහා විශාල දායකත්වයක් ලබා දෙන දිස්ත්‍රික්කයක් වන අතර එහි භූමි ප්‍රමාණය වර්ග කිලෝ මීටර් 4,415ක් වේ. මනාව විහිදුනු අභ්‍යන්තර වාරි ජල පද්ධතිය ගොවිතැන සඳහා ඉතා යෝග්‍ය වේ. මෙය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 19 කින් හා උප ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකින්, මහනගර සභා 02, එක් නගර සභාවක් සහ ප්‍රාදේශීය සභා 17 කින් සමන්විත වන අතර එහි මුළු ජනගහනය 820,061 කි. මෙහි ජාතීන් සියල්ලේම විවිධත්වයක් ඇති අතර 46.06% මුස්ලිම්, 36.39% සිංහල, 17.06% දෙමළ, 0.18% බර්ගර් හා 0.3% වෙනත් ජාතීන් ද ජීවත් වේ.

**දිස්ත්‍රික්කයේ ප්‍රධාන සංරචක**

**ප්‍රධාන සංරචක**

- සංචාරක ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය සඳහා කටයුතු කිරීම.
- ප්‍රාදේශීය සංවර්ධනය.
- පෙර පාසල් අධ්‍යාපනය ඇතුළු සියළු අධ්‍යාපන අංශයන් වැඩිදියුණු කිරීම.
- කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයින් සවිබල ගැන්වීම.
- කාන්තා හා යෞවන ව්‍යවසායකත්ව සංවර්ධනය හා ඔවුන් සවිබල ගැන්වීම.
- සෞඛ්‍ය, ජල හා සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම.
- ගොවීන් ශක්තිමත් කිරීම සහ ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීමට සහාය වීම.
- පරිසර සංරක්ෂණය සහ ප්‍රතිස්ථාපනය.
- දිස්ත්‍රික්කයේ පවත්නා සම්පත් ඵලදායීව යොදා ගනිමින් විදේශ විනිමය ඉපයීම සඳහා නව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- යෞවන ප්‍රජාව සඳහා සුදුසු වෘත්තීය පුහුණු අවස්ථා විවර කර ඔවුන්ට ජාත්‍යන්තර රැකියා සඳහා මග සලසා දීම.

**විෂය පථය**

- රජයේ ප්‍රතිපත්ති සහ තිරසාර සංවර්ධන ඉලක්ක අනුව සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පහසුකම් සැලසීම සඳහා දිස්ත්‍රික් පරිපාලන සහ සංවර්ධන කටයුතු මෙහෙයවීම.

**ක්‍රියාකාරිත්වය**

- ප්‍රාදේශීය ලේකම් කාර්යාල 19 හා උප ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාළ කටයුතු පරිපාලනය සහ අධීක්ෂණය
- දිස්ත්‍රික්කය තුළ සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම.
- අනෙකුත් රේඛීය අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු මඟින් දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම.
- රේඛීය අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු මඟින් සපයනු ලබන මූල්‍ය සහ අනෙකුත් සම්පත් කළමනාකරණය.
- කෘෂිකාර්මික කටයුතු සහ පොහොර බෙදා හැරීමේ වැඩසටහන මෙහෙයවීම සහ අධීක්ෂණය කිරීම.
- කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයින්, අඩු ආදායම්ලාභී පවුල්, කාන්තාවන් සහ තරුණ ප්‍රජාව සවිබල ගැන්වීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- මහජනතාවට වඩා හොඳ සෞඛ්‍ය සේවාවක් සැපයීමට අවශ්‍ය පහසුකම් සැලසීම.
- සංස්කෘතික, ආගමික සහ අනෙකුත් පොදු උත්සව සංවිධානය කිරීම.
- දිස්ත්‍රික්කයේ ආර්ථික, සමාජීය සහ භූගෝලීය තොරතුරු රැස් කිරීම සහ යාවත්කාලීන කිරීම සහ ඒ මඟින් රජයේ ප්‍රතිපත්ති සැකසීම සඳහා පහසුකම් සැලසීම.
- ළමා හා කාන්තා සුබසාධන සේවා ඇතුළු සමාජ සේවා පහසුකම් සැපයීම.
- ආපදා කළමනාකරණය සහ පුනරුත්ථාපනය.
- මැතිවරණ කටයුතු සඳහා පහසුකම් සැලසීම.

- දිස්ත්‍රික්කයේ පවත්නා ඉඩම් නිසි භාවිතය මඟින් උපරිම ප්‍රතිලාභ අත්කරගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම සහ ඉඩම් අවභාවිතය අවම කිරීම.
- දිළිඳු ප්‍රජාව වෙත සමාජ සුබසාධක ප්‍රතිලාභ ලබාදීම.
- ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා මෙහෙයවීම.
- දිස්ත්රික්කයේ සංවර්ධන කටයුතු වලදී දේශපාලන අධිකාරිය හා අදාළ රාජ්‍ය/ රාජ්‍ය නොවන ආයතන අතර සම්බන්ධීකරණය ඇති කිරීම.

**අභියෝග**

- COVID - 19 ලෝක ව්‍යසනයේ අතුරු ප්‍රතිඵල සහ දැඩි ආර්ථික අර්බුද හමුවේ වුවද ස්ථාපිත ඉලක්ක ළඟා කරගැනීම.
- වී ගොවිතැන ප්‍රමුඛ වගා කටයුතු සඳහා ජලය හිඟ වීම හා වන අලින්ගෙන් මෙන්ම ස්වාභාවිකව සිදුවන ව්‍යසන.
- නිසි කසළ කළමනාකරණය.
- මත්ද්‍රව්‍ය ව්‍යාප්තිය නිසා යහපත් සෞඛ්‍යසම්පන්න අනාගත පරපුරක් බිහි කිරීමට ගැටළු පැන නැගීම.
- මුහුදුබඩ ප්‍රදේශ දැඩිව ඛාදනය වීම.
- කෘෂිකාර්මික හා කාර්මික නිෂ්පාදන වල ඵලදායීතාව ඉහළ නැංවීමට අවශ්‍ය තාක්ෂණික දැනුම හිඟ වීම.
- දිස්ත්‍රික්කයේ පවතින සම්පත් ඵලදායීව යොදා ගැනීම සඳහා නිසි විද්‍යාත්මක පර්යේෂණ ක්‍රියාත්මක නොවීම.
- ජාතික සංවර්ධනය සඳහා තම දායකත්වය සැපයීමට ජනතාව තුළ ඇති උනන්දුව හීන වීම.

**අනාගත ඉලක්ක**

- 2025 වන විට දිස්ත්‍රික්කයේ සැම දෙනාටම පිරිසිදු පානීය ජලය ලබාදීම සහ නිසි සෞඛ්‍ය පහසුකම් සලසා දීම, තරුණ ප්‍රජාව සහ විශේෂ අවශ්‍යතා ඇති සියළුදෙනාටම රැකියා ලබා දීම හා රැකියා මත පදනම් වූ වැටුප් ලබා දීම, කුඩා පරිමාණ කර්මාන්ත ඇතුළු ආර්ථික සංවර්ධනයට දායක වන කර්මාන්ත සහ අනෙකුත් රැකියා සඳහා අවශ්‍ය පහසුකම් සලසා දීම.
- ගොවීන්, ධීවරයින්, සත්ත්ව පාලනය කරන්නන් සහ කුඩා පරිමාණ ආහාර නිෂ්පාදකයින්ගේ ආදායම් මාර්ග දෙගුණ කිරීම හරහා 2030 වන විට දිළිඳුකම පිටුදැකීම.
- නිසි නිවාරණ යාන්ත්‍රණ, නිසි ප්‍රතිකාර, නිසි මානසික සෞඛ්‍ය සහතික කිරීම සහ යහපත් ජීවන රටාවකට පහසුකම් සැලසීම තුළින් බෝ නොවන රෝග හේතුවෙන් සිදුවන මරණ 1/3 කින් අඩු කිරීම.
- අලි මිනිස් ගැටුම් අවම කිරීමට කටයුතු කිරීම මඟින් ගොවීන්ගේ අස්වැන්නේ සුරක්ෂිතබව තහවුරු කිරීම මෙන්ම මිනිස් ජීවිත හා අලින් ආරක්ෂා කිරීමට කටයුතු කිරීම.
- රටේ අනාගතය වෙනුවෙන් යහපත් හා විනයානුකූල තරුණ පිරිසක් බිහි කිරීම.

**ii.ආයතනයේ මූල්‍ය ප්‍රගතිය**
**(2024.01.01 සිට 2024.12.31 දක්වා)**

පුනරාවර්තන වියදම් - රු. මි. 2,697.80
ප්‍රාග්ධන වියදම් - රු. මි. 123.74

**iii. ආයතනයේ භෞතික ප්‍රගතිය**

**වගුව 3.41: අම්පාර දිස්ත්‍රික්කය - ආයතනයේ සාමාන්‍ය කාර්යයන්හි ප්‍රගතිය (2024.01.01 සිට 2024.12.31 )**

| # | කාර්යය | සංඛ්‍යාත්මකව | ප්‍රතිශතය (%) |
|---|---|---|---|
| 01. | අනවසර ඉඩම් සඳහා විධිමත් බලපත්‍ර නිකුත් කිරීම. | 992 | 100% |
| 02. | පසු අයිතිය නම් නොකළ බලපත්‍ර ඔප්පු අයිතිය ලබා දීම. | 1,505 | 100% |
| 03. | ව්‍යාපාර නාම බලපත්‍ර නිකුත් කිරීම. | 631 | 100% |
| 04. | ජාතික හැඳුනුම්පත් අයදුම්පත් පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම. | 25,661 | 100% |

**වගුව 3.42 : අම්පාර දිස්ත්‍රික්කය - ක්‍රියාත්මක ප්‍රාග්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය (2024.01.01 සිට 2024.12.31) දක්වා**

| # | වැඩසටහනේ නම | ව්‍යාපෘති සංඛ්‍යාව | අනුමත ප්‍රතිපාදන මුදල (රු. මි.) | මුළු වියදම (රු. මි.) |
|---|---|---|---|---|
| 01. | විමධ්‍යගත අයවැය වැඩසටහන | 1,834 | 655.42 | 624.18 |
| 02. | ජනාධිපති ලේකම් කාර්යාලීය විශේෂ ව්‍යාපෘති | 387 | 408.71 | 320.68 |
| 03. | නැවත පදිංචි කිරීම් හා යටිතල පහසුකම් ව්‍යාපෘති | 714 | 155.00 | 151.01 |
| 04. | ආගමික ස්ථාන සංවර්ධනය | 27 | 6.82 | 6.46 |
| 05. | ගෘහස්ථ එළු පාලන ව්‍යාපෘති | 56 | 5.00 | 4.838 |
| 06. | කඳුකර දශකය | 13 | 5.00 | 4.897 |
| 07. | සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන | 5 | 10.585 | 10.328 |
| 08. | සංචාරක ව්‍යාපෘති | 8 | 9.937 | 7.966 |
| 09. | වෙනත් සංවර්ධන ව්‍යාපෘති | 165 | 66.23 | 63.19 |
| | **මුළු එකතුව** | **3,606** | **3,209** | **1,322.70** |

උක්ත සඳහන් පරිදි විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ විවිධ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති හා ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලද අතර, ඒ යටතේ රු. මිලියන 165.28 ක අධ්‍යාපන හා සෞඛ්‍ය ක්ෂේත්‍ර වල ව්‍යාපෘති 343ක් ද රු. මිලියන 177.025 ක ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති 811ක් ද රු. මිලියන 148.64 ක ආගමික හා සංස්කෘතික ක්ෂේත්‍ර වල ව්‍යාපෘති 380ක් ද රු. මිලියන 17.88 ක ක්‍රීඩාපිටි හා පුස්තකාල සංවර්ධන ව්‍යාපෘති 89ක් හා වෙනත් විවිධ ක්ෂේත්‍ර වලට අයත් ව්‍යාපෘති රාශියක් සිදුකරන ලදී. ජනාධිපති ලේකම් කාර්යාලීය විශේෂ ව්‍යාපෘති යටතේ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති, ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති සහ පෙරපාසල් හා කාන්තා සංවිධාන සඳහා විවිධ ව්‍යාපෘති රාශියක් සිදු කරන ලද අතර, ක්‍රීඩා අංශයේ ප්‍රවර්ධනය වෙනුවෙන් රු. මිලියන 11.40 ක පමණ ව්‍යාපෘති 92ක් ද ලෙස සිදු කරන ලදී.

**පිංතූර 3.15 : අම්පාර දිස්ත්‍රික්කයේ ව්‍යාපෘති හා වැඩසටහන්**



**ව්‍යාපෘතියේ නම -** පරගස්වැව විහාරස්ථානයේ ආවාස ගෙය පිළිසකර කිරීම
**ස්ථානය** – පරගස්වැව
**ඇස්තමේන්තු මුදල -** රු.මි 0.50
**මුළු වියදම** – රු.මි 0.47
**වැඩ ආරම්භ කළ දිනය** – 2024.08.30
**වැඩ අවසන් කළ දිනය** – 2024.09.05



**ව්‍යාපෘතියේ නම -** වෙප්පයියඩි පිල්ලයාර් අරනෙරි පාසල ප්‍රතිසංස්කරණය කිරීම, අන්නමලෙයි-2
**ස්ථානය** - නාවිදන්වෙලි
**ඇස්තමේන්තු මුදල -** රු.මි 1.50
**වියදම** – රු.මි 1.42
**වැඩ ආරම්භ කළ දිනය** – 2024.06.12
**වැඩ අවසන් කළ දිනය** – 2024.06.26




**ව්‍යාපෘතියේ නම** – කල්මුනේ අල් මනාර් මධ්‍ය මහා විද්‍යාලය ගෘහස්ථ ක්‍රීඩාංගණය වැඩිදියුණු කිරීම, මරදමුනෙයි
**ස්ථානය** – මරදමුනෙයි
**ඇස්තමේන්තු මුදල -** රු.මි 3.00
**වියදම** – රු.මි 2.91
**ආරම්භ කළ දිනය** – 2024.05.27
**අවසන් කළ දිනය** - 2024.06.27

**iv. රාජ්‍ය ආදායම් උපයා ගැනීමේ ව්‍යාපෘති**

**වගුව 3.43: අම්පාර දිස්ත්‍රික්කය - ආදායම් උපයා ගැනීම් 2024.01.01 සිට 2024.12.31 දක්වා**

| # | ආදායම් ශීර්ෂය | ආදායම් (රු.මි) |
|---|---|---|
| 01. | ගොඩනැගිලි කුලී | 0.62 |
| 02. | විභාග ගාස්තු | 0.39 |
| 03. | ලියාපදිංචි ගාස්තු (ADR) | 30.24 |
| 04. | ආදායම් සහතික | 28.19 |
| 05. | මෝටර්රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | 48.87 |
| 06. | පුද්ගලයන් ලියාපදිංචිකිරිමේ දෙපාර් තමේන්තුව | 8.76 |
| **මුළු එකතුව** | | **117.07** |

## 3.17. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය

### i. හැඳින්වීම

**පසුබිම**

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය වූ කලී දිගු ඓතිහාසික පසුබිමක් ඇති, ස්භාවික වරායකින්, කෘෂිකාර්මික හා ධීවර වැනි ආර්ථික කටයුතුවලින් සපිරි, ස්වභාව සෞන්දර්යයෙන් අනූන ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතේ පිහිටි ප්‍රදේශයකි. එහි භූමිය වර්ග කි. මී. 2,727 කි. මූතූර්, ත්‍රිකුණාමලය හා සේරුවිල ලෙස මැතිවරණ කොට්ඨාශ 03 ඇත. ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ 11 ක් පවතින අතර ග්‍රාම නිලධාරි කොට්ඨාශ 230 ක් ඇත.

2023 අවසන් වන විට ජනගහනය 494,969 ක් විය. එයින් 44% ක් මුස්ලිම්ද, සිංහල 25% ක්ද දෙමළ 30% ක වන අතර සෙසු 1% බර්ගර් හා අනෙකුත් ජාතීත්ව අයත් වේ.

**දිස්ත්‍රික්කයේ ප්‍රධාන සංරචක**

ප්‍රධාන සංරචක

- සාමාන්‍ය පරිපාලනය හා ආයතනික සේවා
- කෘෂිකාර්මය, සෞඛ්‍ය, ධීවර, සංචාරක, ක්‍රීඩා, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධනය

විෂය පථය

- රජයේ සංවර්ධන ප්‍රමුඛතා සාක්ෂාත් කර ගැනීම සඳහා දිස්ත්‍රික් මට්ටමේ ආයතනික රාමුවක් සැකසීමෙන් දිස්ත්‍රික්කයේ කාර්යක්ෂම හා ඵලදායී රාජ්‍ය පරිපාලන පද්ධතියක් පවත්වාගෙන යාම.

ක්‍රියාකාරීත්වය

- රජයේ දිස්ත්‍රික් නියෝජිතයා ලෙස කටයුතු කිරීම
- දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය රාජ්‍ය පරිපාලනයට අදාළ ප්‍රතිපත්ති, සැලසුම් සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

විශේෂ ළඟා කරගැනීම

- නැගෙනහිර පළාතේ වඩාත්ම ජවසම්පන්න දිස්ත්‍රික්කය වීම, රටේ දළ දේශීය නිෂ්පාදිතය (GDP) සඳහා වැඩි දායකත්වයක් ඇත.

අභියෝග

- සීමිත අරමුදල් සහ තාක්ෂණික කාර්ය මණ්ඩල හිඟය, ආදාන ද්‍රව්‍ය සහ අලෙවි පහසුකම්.
- ස්වභාවික විපත්, වන සතුන්ගේ උවදුරු, අවදානමට ලක්විය හැකි පුද්ගලයින් සඳහා අඩු අවස්ථාවන්.
- ආර්ථික අර්බුදය සහ අලෙවිකරණ පහසුකම් අවහිර කිරීම.

අනාගත ඉලක්ක

- රාජ්‍ය සේවා සැපයීමේ සියලුම අංශවල ඵලදායිතා වැඩිදියුණු කිරීම
- තිරසාර සංවර්ධන ඉලක්ක සහ ඉලක්ක සපුරා ගැනීම.

### ii.ආයතනයේ මූල්‍ය ප්‍රගතිය (2024.01.01 සිට 2024.12.31 දක්වා)

පුනරාවර්තන වියදම් - රු.මි. 1,312.11
ප්‍රාග්ධන වියදම් - රු.මි. 99.62

**වගුව 3.44: ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය - 2025 වර්ෂය සඳහා අපේක්ෂිත අයවැය යෝජනා. (සාරාංශය)**

| # | ව්‍යාපෘතිය | ඇස්තමේන්තු මුළු පිරිවැය (රු.මි.) | 2025 අයවැයෙන් අපේක්ෂිත ප්‍රතිපාදන (රු.මි.) |
|---|---|---|---|
| 01 | නිවාස සංවර්ධනය | 400.00 | 400.00 |
| 02 | ග්‍රාමීය මාර්ග සංවර්ධනය | 300.00 | 300.00 |
| 03 | කෘෂිකර්මය | 900.00 | 900.00 |
| 04 | පශු සම්පත් | 400.00 | 400.00 |
| 05 | ධීවර කර්මාන්තය | 100.00 | 100.00 |
| 06 | සෞඛ්‍ය සහ පෝෂණය | 500.00 | 500.00 |
| 07 | සංචාරක ව්‍යාපාරය | 100.00 | 100.00 |
| 08 | සුළු වාරිමාර්ග | 800.00 | 800.00 |
| 09 | පරිසරය | 20.00 | 20.00 |
| 10 | කර්මාන්ත | 50.00 | 50.00 |
| 11 | ග්‍රාමීය ජල සැපයුම | 100.00 | 100.00 |
| 12 | ග්‍රාමීය පාලම් | 100.00 | 100.00 |
| 13 | ග්‍රාමීය විදුලිබල ව්‍යාප්තිය | 100.00 | 100.00 |
| 14 | සනීපාරක්ෂක පහසුකම් | 250.00 | 250.00 |
| 15 | පොදු ක්‍රීඩාංගන | 30.00 | 30.00 |
| 16 | රජයේ ගොඩනැගිල්ල | 200.00 | 200.00 |
| 17 | සමාජ සුබසාධනය | 3000.00 | 3000.00 |
| **මුළු එකතුව** | | **7,350.00** | **7,350.00** |

iii. **ආයතනයේ භෞතික ප්‍රගතිය**

**වගුව 3.45 : ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය - ක්‍රියාත්මක ප්‍රාග්ධන අරමුදල් ව්‍යාපෘතිවල ප්‍රගතිය (2024.01.01 සිට 2024.12.31 දක්වා)**

| # | ව්‍යාපෘතිය | අරමුදල් මූලාශ්‍රය | වැඩසටහන | ව්‍යාපෘති ගණන | මුළු පිරිවැය (රු.මි.) | වියදම (රු.මි.) |
|---|---|---|---|---|---|---|
| 01 | යටිතල පහසුකම් සහ ප්‍රජා සංවර්ධනය | මුදල් අමාත්‍යාංශය | විමධ්‍යගත ප්‍රාග්ධන අයවැය වැඩසටහන - 2024 | 754 | 230.00 | 220.29 |
| 02 | යටිතල පහසුකම් සහ ප්‍රජා සංවර්ධනය | මුදල් අමාත්‍යාංශය | විශේෂ සංවර්ධන වැඩසටහන - 2024 | 24 | 5.00 | 4.98 |
| 03 | යටිතල පහසුකම් සහ ප්‍රජා සංවර්ධනය | මුදල් අමාත්‍යාංශය | දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන - 2024 | 1,151 | 228.84 | 172.51 |
| 04 | සෞඛ්‍ය සහ පෝෂණය | කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය | පෙර පාසල් උදෑසන ආහාර වැඩසටහන - 2024 | 263 | 72.24 | 63.42 |
| 05 | සංචාරක ව්‍යාපාරය | සංචාරක අමාත්‍යාංශය | සංචාරක ව්‍යාපෘතිය 2024 | 2 | 10.00 | 9.95 |

| # | ව්‍යාපෘතිය | අරමුදල් මූලාශ්‍රය | වැඩසටහන | ව්‍යාපෘති ගණන | මුළු පිරිවැය (රු.මි.) | වියදම (රු.මි.) |
|---|---|---|---|---|---|---|
| 06 | පශු සම්පත් | කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය | එළු පාලන වැඩසටහන-2024 | 57 | 4.92 | 4.67 |
| 07 | නිවාස සංවර්ධනය | නිවාස හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය | නිවාස වැඩසටහන - 2016/2021/2023 | 217 | 77.42 | 67.69 |
| 08 | නිවාස සංවර්ධනය | නිවාස හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය | නිවාස වැඩසටහන - 2024 | 232 | 208.10 | 197.27 |
| 10 | යටිතල පහසුකම් සහ ප්‍රජා සංවර්ධනය | ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යාංශය | පාසල් ක්‍රීඩා හා ප්‍රජා සංවර්ධනය | 39 | 4.39 | 3.76 |
| 11 | ග්‍රාමීය සංවර්ධන | සෞභාග්‍යා නිෂ්පාදන කාර්යාංශය | සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන - 2024 | 15 | 21.41 | 20.48 |
| 12 | ප්‍රජා සංවර්ධනය | නිවාස හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය | විදුලි සැපයුම ලබාදීම | 2 | 0.05 | 0.05 |
| 13 | ප්‍රජා සංවර්ධනය | නිවාස හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය | ජල සැපයුම ලබා දීම | 556 | 25.96 | 24.68 |
| මුළු එකතුව | | | | **3,729** | **900.54** | **800.51** |

**පිංතූර 3.16 : ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ව්‍යාපෘති හා වැඩසටහන්**



ව්‍යාපෘතියේ නම :- කුඩා ගල්මැටියාව වැව හි දොළ ගොඩනැගීම(DDP)
ස්ථානය :- තම්පලකමම්, ගල්මෙටියාව උතුර.
මුළු පිරිවැය :- රු.මි. 0.50
වියදම :- රු.මි. 0.47
ආරම්භක දිනය :21.08.2024
නිමකළ දිනය :-27.07.2024

**iv. රාජ්‍ය ආදායම් උපයා ගැනීමේ ව්‍යාපෘති**

**වගුව 3.46: ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය - ආදායම් උපයා ගැනීම් 2024.01.01 සිට 2024.12.31 දක්වා**

| # | ආදායම් ශීර්ෂය | ආදායම (රු.මි.) |
|---|---|---|
| 01 | මුද්දර ගාස්තු | 0.002 |
| 02 | රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි ගාස්තු | 24.79 |
| 04 | ඉඩම් සහ වෙනත් බදුදීම් | 0.007 |
| 05 | විභාග සහ අනෙකුත් වියදම් | 7.046 |
| මුළු එකතුව | | **31.845** |

## 3.18. කුරුණෑගල දිස්ත්‍රික්කය

### i. හැඳින්වීම

**පසුබිම**

වර්ග කිලෝමීටර් 4,816 කින් සමන්විත කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඡන්ද කොට්ඨාස ගණන 14 ක් ද, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 30 ක් ද, ග්‍රාම නිලධාරී කොට්ඨාස 1,610 ක් ද වන අතර ජනගහනය 1,913,167 ක් ද වේ. එසේම දිස්ත්‍රික්කය තුළ කුරුණෑගල මහ නගර සභාව සහ කුලියාපිටිය නගර සභාව පිහිටා ඇති අතර ප්‍රාදේශීය සභා 19 ක් පිහිටා ඇත. පොලිස් ස්ථාන 47 කින් සමන්විත මෙම දිස්ත්‍රික්කය තුළ ගොවිජන සේවා මධ්‍යස්ථාන 56 කින් ජනතාවට සේවා සැපයීම් සිදු කරයි.

**දිස්ත්‍රික්කයේ ප්‍රධාන සංරචක**

**ප්‍රධාන සංරචක**

- මානව සම්පත් සංවර්ධනය
- ආර්ථික සංවර්ධනය
- සමාජ සංවර්ධනය
- යහපාලනය

**විෂය පථය හා ක්‍රියාකාරීත්වය**

- කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය දිස්ත්‍රික්කයේ ප්‍රමුඛතම සේවා සපයන්නා ලෙස ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස තිහක ග්‍රාම නිලධාරි වසම් සියල්ල සම්බන්ධීකරණය කරමින්, සැලසුම් සහගතව සම්පත් හා ආයතන ඵලදායී ලෙස කළමනාකරණය කරමින්, පුරවැසි අවශ්‍යතා තෘප්තිමත් කිරීම තුලින් තිරසර සංවර්ධනයක් ඇතිකිරීමට කටයුතු කරනු ලබයි.

**විශේෂ ළඟා කරගැනීම්**

- ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ අධීක්ෂණයට යටත් වන ආයතනයන්හි මූල්‍ය හා කාර්යසාධනය පිළිබඳ ඇගයීම් සඳහා සකස් කර ඇති පරිගණක තොරතුරු කළමනාකරණ පද්ධතිය මගින් රාජ්‍ය ආයතන ඇගයීම් තරහාවලියේ දී 2017/2018 වර්ෂ සඳහා රන් සම්මානය හිමිකර ගැනීම.
- ISO 9001- 2015 තත්ත්ව සහතිකය 2018 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා අඛණ්ඩව පවත්වා ගැනීම.
- ජාතික ඵලදායීතා සම්මාන තරහාවලියේ දී 2015 (2016) වර්ෂයේ අන්තර් දෙපාර්තමේන්තු කාණ්ඩයේ ප්‍රථම ස්ථානය දිනා ගැනීම.
- සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා සාමාජිකයින් බඳවා ගැනීම ජාතික මට්ටමේ 2017/2018 වර්ෂයන්හි දෙවන ස්ථානය හා 2019 වර්ෂයේ තෙවන ස්ථානය දිනා ගැනීම.
- දහම් පාසල් සිසු නිපුනතා තරහාවලිය - 2019 ජාතික මට්ටමේ 2 වන සහ 5 වන ස්ථාන හිමි කර ගැනීම.
- හොඳම රැකියා සේවා මධ්‍යස්ථානය තේරීමේ තරගය - 2019 ජාතික මට්ටමේ දෙවන ස්ථානය ලබා ගනිමින් රිදී සම්මානය ලබා ගැනීම.
- රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ අධික්ෂණයට යටත් වන ආයතනයන්හි මෙහෙයුම් අනුකූලතාවයන් හා මෙහෙයුම් කාර්ය සාධනය පිළිබඳව ඉහල කාර්ය සාධන මට්ටමක් කරා ළඟා විම (ගිණුම් වර්ෂ 2019-2020)

**අභියෝග**

- තිරසර සංවර්ධනය උදෙසා ආකල්පමය පෙළගැස්වීමක් ඇති කිරීම.
- වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙතින් නියමිත දිනට ප්‍රතිපාදන නොලැබීම හා ප්‍රමාණවත් පරිදි අක්මුදල් නොලැබීම.

**අනාගත ඉලක්ක**

- භෞතික මූල්‍ය හා මානව සම්පත් උපරිම ලෙස ප්‍රයෝජනයට ගනිමින් දිස්ත්‍රික්කයේ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම.
- තිරසර සංවර්ධන ක්‍රියාදාමය තුළ පරිසර හිතකාමී පරිසරයක් ගොඩනැගීම.
- නූතන තාක්ෂණය භාවිතයෙන් වඩා කාර්යක්ෂම හා ඵලදායී රාජ්‍ය සේවාවක් ලබාදීම.

**ii.ආයතනයේ මූල්‍ය ප්‍රගතිය (2024.01.01 සිට 2024.12.31 දක්වා)**

පුනරාවර්තන වියදම් - **රු.මි**. 5,383.73 ප්‍රාග්ධන වියදම් - **රු.මි**. 67.99

iii. **ආයතනයේ භෞතික ප්‍රගතිය (2024.01.01 සිට 2024.12.31 දක්වා)**

වගුව **3.47 : කුරුණෑගල දිස්ත්‍රික්කය - ක්‍රියාත්මක ප්‍රාග්ධන අරමුදල් ව්‍යාපෘතිවල ප්‍රගතිය. (2024.01.01 සිට 2024.12.31 දක්වා)**

| # | සංරචකය | අරමුදල් මූලාශ්‍ර | වැඩසටහන | ව්‍යාපෘති සංඛ්‍යාව | මුළු ඇස්තමේන්තු පිරිවැය (රු.මි) | වියදම (රු.මි) |
|---|---|---|---|---|---|---|
| 1 | ප්‍රවේශ මාර්ග | දේශීය | විමධ්‍යගත අයවැය වැඩසටහන/ ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන/ විශේෂ සංවර්ධන වැඩසටහන I හා II අදියර/ කඳුකර දශකය වැඩසටහන (2024 – 2034)/ ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන/ පාසල් ක්‍රිකට් සංවර්ධන වැඩසටහන/ වතු යටිතල පහසුකම් වැඩසටහන/ සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන/ ආගමික මධ්‍යස්ථාන සංවර්ධන වැඩසටහන/ සංස්කෘතික මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීමේ වැඩසටහන 2024/ සංචාරක ගමනාන්තවල සංචාරක පහසුකම් වැඩිදියුණු කිරීමේ වැඩසටහන 2024/ පිරිවෙන් අධ්‍යාපනය ශක්තිමත් කිරීමේ වැඩසටහන/ ප්‍රාදේශීය උද්භිත උද්‍යාන වැඩිදියුණු කිරීමේ වැඩසටහන 2024/ ප්‍රාදේශීය රෙජිස්ටාර් කාර්යාල වැඩිදියුණු කිරීමේ වැඩසටහන | 1,056 | 660.10 | 650.85 |
| 2 | ග්‍රාමීය පාලම් | | | 6 | 6.53 | 6.49 |
| 3 | ග්‍රාමීය විදුලි දිගු | | | 14 | 6.67 | 6.37 |
| 4 | සනීපාරක්ෂක පහසුකම් | | | 84 | 22.74 | 21.91 |
| 5 | ක්‍රීඩා පිටි | | | 56 | 58.87 | 54.48 |
| 6 | සුළු වාරිමාර්ග | | | 66 | 37.75 | 37.12 |
| 7 | ග්‍රාමීය ආර්ථික යටිතල පහසුකම් | | | 92 | 28.22 | 28.03 |
| 8 | ආගමික මධ්‍යස්ථාන සංවර්ධනය | | | 619 | 135.56 | 133.53 |
| 9 | සමාජ සුබ සාධනය | | | 4380 | 401.90 | 388.11 |
| 10 | නිවාස සංවර්ධනය | | | 47 | 16.20 | 16.17 |
| 11 | සූරිය පැනල/විදුලිය | | | 33 | 19.33 | 18.68 |
| 12 | ග්‍රාමීය ජල සැපයුම් | | | 54 | 17.28 | 16.28 |
| 13 | නිල සෙවන | | | 24 | 6.82 | 6.82 |
| 14 | වෙනත් යටිතල පහසුකම් | | | 241 | 125.52 | 101.64 |
| **මුළු එකතුව** | | | | **6,772** | **1,543.49** | **1,486.47** |

පිංතූර 3.17 : කුරුණෑගල දිස්ත්‍රික්කයේ ව්‍යාපෘති හා වැඩසටහන්



ව්‍යාපෘතියේ නම :- ඉහළ ගලයාය වසමේ ගලයාය රන්දිය විද්‍යාලයේ පිවිසුම් ගේට්ටුව
ස්ථානය :- පන්නල
ප්‍රතිපාදන මුදල :- රු.200,000.00
වියදම :- රු.170,975.00
ප්‍රතිපාදන මුදල :- රු.200,000.00
ආරම්භක දිනය :- 2024.06.12
නිමකල දිනය :- 2024.07.01



ව්‍යාපෘතියේ නම :- ගොන්නව ශ්‍රී සාරානන්ද විහාරස්ථාන චෛත්‍ය මළුවේ ඉදිරි කටයුතු සඳහා
ස්ථානය :- පඬුවස්නුවර නැගෙනහිර
ප්‍රතිපාදන මුදල :- රු.200,000.00
වියදම :- රු.215,619.26
ආරම්භක දිනය :- 2024.05.27
නිමකල දිනය :- 2024.08.16



ව්‍යාපෘතියේ නම :- නැදලගමුව දකුණ වසමේ නැදලගමුව මහා විද්‍යාලයේ සුහුරු පන්ති කාමරයේ බිම ටයිල් කිරීම
ස්ථානය :- පන්නල
ප්‍රතිපාදන මුදල :-රු.175,000.00
වියදම :- රු.149,600.00
ආරම්භක දිනය :- 2024.05.23
ආරම්භක දිනය :- 2024.07.01
නිමකල දිනය :- 2024.07.10



ව්‍යාපෘතියේ නම :- කටුපිටිය ටැංපිටිය විහාරයේ සංවර්ධන කටයුතු
ස්ථානය :- මල්ලවපිටිය
ප්‍රතිපාදන මුදල :-රු.100,000.00
වියදම :- රු.97,000.00
ආරම්භක දිනය :- 2024.05.23
නිමකල දිනය :- 2024.05.27



ව්‍යාපෘතියේ නම :- නැදලගමුව දකුණ වසමේ දුංගල්පිටිය ප්‍රධාන ඇනිකට් එක ප්‍රතිසංස්කරණය කිරීම
ස්ථානය :- පන්නල
ප්‍රතිපාදන මුදල :- රු.150,000.00
වියදම :- රු.128,250.00
ආරම්භක දිනය :- 2024.06.24
නිමකල දිනය :- 2024.07.31



ව්‍යාපෘතියේ නම මැල්වත්ත පළමු පටුමග ඉතිරි කොටස කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීම
ස්ථානය :-මාවතගම
ප්‍රතිපාදන මුදල :-රු.100,000.00
වියදම :-රු.98,000.00
ආරම්භක දිනය :-2024.07.19
නිමකළ දිනය :-2024.07.31



ව්‍යාපෘතියේ නම :-මොහොත්තවගොඩ ප්‍රාථමික වෛද්‍ය මධ්‍යස්ථානයේ වැසිකිලි පද්ධතිය නවීකරණය කිරීම
ස්ථානය :- පඬුවස්නුවර නැගෙනහිර
ප්‍රතිපාදන මුදල :- රු.250,000.00
වියදම :- රු.240,236.63
ආරම්භක දිනය :- 2024.07.23
නිමකළ දිනය :- 2024.07.27



ව්‍යාපෘතියේ නම :- දෙමටව පානීය ජල ව්‍යාපෘතියේ ජල ටැංකියේ ප්‍රතිසංස්කරණ කටයුතු කිරීම
ස්ථානය :- පඬුවස්නුවර නැගෙනහිර
ප්‍රතිපාදන මුදල :- රු.100,000.00
වියදම :- රු.96,850.00
ආරම්භක දිනය :- 2024.06.10
නිමකල දිනය :- 2024.07.30

**iv.** **රාජ්‍ය ආදායම් උපයා ගැනීමේ ව්‍යාපෘති**

**වගුව 3.48 : කුරුණෑගල දිස්ත්‍රික්කය - ආදායම් උපයා ගැනීම් 2024.01.01 සිට 2024.12.31 දක්වා**

| ආදායම් ශීර්ෂය | ආදායම (රු.මි.) |
|---|---|
| මුද්දර ගාස්තු | 0.34 |
| පෞද්ගලික දැව ප්‍රවාහනය | 2.21 |
| මහජන ආරක්ෂක අමාත්‍යාංශයට අදාල බලපත්‍ර ගාස්තු | 4.04 |
| කාබන් බද්ධ | 0.13 |
| අනෙකුත් බලපත්‍ර ගාස්තු | 33.30 |
| රජයේ ගොඩනැගිලි කුලී | 3.64 |
| රජයේ කැලෑවලින් ලැබෙන ආදායම් | 3.19 |
| ඉඩම් හා අනෙකුත් බදු කුලී | 4.47 |
| අනෙකුත් | 17.35 |
| විභාග හා අනිකුත් ගාස්තු | 0.02 |
| මොටර් රථ ප්‍රවාහන පනත යටතේ අයකරනු ලබන ගාස්තු හා අනෙකුත් ලැබීම් | 25.12 |
| හැඳුනුම්පත් ගාස්තු | 37.59 |
| විවිධ | 3.26 |
| දඩ මුදල් හා රාජ සන්තක කිරිම | 0.078 |
| අනෙකුත් ලැබීම්(රජයේ ආදායම් -විවිධ) | 35.32 |
| වැන්දඹු අනත්දරු හා විශ්‍රාම වැටුප් දායක අරමුදල | 197.33 |
| ප්‍රාග්ධන වත්කම් විකිණීම | 0.12 |
| **මුළු එකතුව** | **367.58** |

## 3.19. පුත්තලම දිස්ත්‍රික්කය

### i. හැඳින්වීම

**පසුබිම**

පුත්තලම පරිපාලන දිස්ත්‍රික්කය ශ්‍රී ලංකාවේ වයඹ පලාතට අයත්ව පිහිටා ඇති අතර එය උතුරු දිශාවෙන් මන්නාරම් දිස්ත්‍රික් මායිමේ මෝදරගම් ආරු වලින් ද නැගෙනහිරින් කුරුණෑගල හා අනුරාධපුර දිස්ත්‍රික්ක වලින් ද දකුණු දිශාවෙන් ගම්පහ දිස්ත්‍රික්කයේ මා ඔයෙන් ද බස්නාහිර දිශාවෙන් ඉන්දියන් සාගරයෙන් ද වට ව පිහිටා ඇත.

වර්ග කිලෝමීටර 3,072කින් සමන්විත පුත්තලම දිස්ත්‍රික්කයේ ඡන්ද කොට්ඨාස 5 ක් ද, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 16 ක් ද, ග්‍රාම නිලධාරී කොට්ඨාස 548 ක් ද වන අතර ජනගහණය 942,327ක් වේ.

**දිස්ත්‍රික්කයේ ප්‍රධාන සංරචක**

**ආයතනයේ විෂය පථය, ක්‍රියාකාරීත්වය**

- අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභාව හා වෙනත් ආයතන සමග සම්බන්ධීකරණය පවත්වා ගෙන යමින්
- මහජන සුභසිද්ධිය සඳහා දිස්ත්රික් හා ප්‍රදේශීය පරිපාලන කටයුතු මෙහෙය වීම.

**ප්‍රමුඛ පරාසයන්**

- ව්‍යවස්ථාපිත රාජකාරි
- ආපදා සහන සේවා කටයුතු
- දිළිඳුකම පිටුදැකීම
- දිස්ත්‍රික් හා ප්‍රාදේශීය සංවර්ධනය

විශේෂ ළඟා කරගැනීම

- කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් බිහිකිරීමේ වාර්ෂික ඉලක්ක සාක්ෂාත් කර ගැනීම.

**අභියෝග**

- අලි මිනිස් ගැටුම
  කාලගුණික විපර්යාසයන් හේතුවෙන් ඇතිවෙන හදිසි
- ආපදා තත්ත්වයන්
- ප්‍රා.ලේ කොට්ඨාස අතර මානව හා භෞතික සම්පත් බෙදීයාමේ විෂමතාවය

අනාගත ඉලක්ක

- ඉහළ සමාජ ආර්ථික මට්ටමකින් යුත් සුරක්ෂිත
- ජන සමාජයක් ස්ථාපනය කිරීම.
- ආයතනික කාර්යක්ෂමතාව හා ඵලදායීතාව ඉහළ නැංවීම.
- දිස්ත්‍රික්කය තුල පවත්නා ඌන උපයෝජිත සම්පත් ඵලදායීව යොදාගනිමින් සංවර්ධන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම.

### ii .ආයතනයේ මූල්‍ය ප්‍රගතිය

**( 2024.01.01 සිට 2024.12.31 දක්වා)**

පුනරාවර්තන වියදම් - රු.මි 158.00 ප්‍රාග්ධන වියදම් - රු.මි 497.00

**iii. ආයතනයේ භෞතික ප්‍රගතිය**

**වගුව 3.49 : පුත්තලම දිස්ත්‍රික්කය - ක්‍රියාත්මක ප්‍රාග්ධන අරමුදල් ව්‍යාපෘතිවල ප්‍රගතිය. (2024.01.01 සිට 2024.12.31 දක්වා)**

| # | සංරචකය | අරමුදල් මූලාශ්‍රය | වැඩසටහන් | ව්‍යාපෘති සංඛ්‍යාව | මුළු ඇස්තමේන්තු පිරිවැය රු. (මි) | වියදම රු. (මි) |
|---|---|---|---|---|---|---|
| 1 | ප්‍රවේශ මාර්ග | දේශීය | විමධ්‍යගත අයවැය | 406 | 163.1850 | 144.80268 |
| | | | ප්‍රාදේශීය සංවර්ධන | 33 | 19.8500 | 18.892328 |
| 2 | ක්‍රීඩා පිටි | | විමධ්‍යගත අයවැය | 15 | 4.6200 | 4.210133 |
| | | | ප්‍රාදේශීය සංවර්ධන | 2 | 0.5500 | 0.04807 |
| 3 | සුළු වාරිමාර්ග | | විමධ්‍යගත අයවැය | 15 | 5.2950 | 4.46188 |
| 4 | ග්‍රාමීය ආර්ථික යටිතල | | විමධ්‍යගත අයවැය | 1 | 0.1500 | 0.1425 |
| | | | ප්‍රාදේශීය සංවර්ධන | 1 | 0.1000 | 0.09865 |
| 5 | ආගමික මධ්‍යස්ථාන සංවර්ධනය | | විමධ්‍යගත අයවැය | 184 | 51.4650 | 48.131426 |
| | | | ප්‍රාදේශීය සංවර්ධන | 42 | 6.9500 | 6.754285 |
| 6 | සමාජ සුබ සාධනය | | විමධ්‍යගත අයවැය | 737 | 130.313 | 120.92256 |
| | | | ප්‍රාදේශීය සංවර්ධන | 96 | 33.869 | 32.064607 |
| 7 | සූරිය පැනල / විදුලිය | | විමධ්‍යගත අයවැය | 14 | 5.1750 | 4.648716 |
| | | | ප්‍රාදේශීය සංවර්ධන | 6 | 1.8260 | 1.456677 |
| 8 | ග්‍රාමීය ජල සැපයුම් | | විමධ්‍යගත අයවැය | 5 | 1.9000 | 1.830752 |
| | | | ප්‍රාදේශීය සංවර්ධන | | | |
| 9 | වෙනත් යටිතල පහසුකම් | | විමධ්‍යගත අයවැය | 246 | 96.897 | 88.069094 |
| | | | ප්‍රාදේශීය සංවර්ධන | 13 | 4.955 | 3.727292 |
| **මුළු එකතුව** | | | | 1816 | 527.1 | 480.2617 |

**පිංතූර 3.18 : පුත්තලම දිස්ත්‍රික්කයේ ව්‍යාපෘති හා වැඩසටහන්**



ව්‍යාපෘතියේ නම :- වජිතර ඉරණවිල සාන්ත/නාත්/හලා/ලයේ අමතර පන්ති කණිටු විද්‍යා කාමරයක් ඉදි කිරීම
ස්ථානය :- මහවැව ප්‍රාකොට්ඨාසය .ලේ.
ප්‍රතිපාදන ප්‍රමාණය :- රු . 1,500,000.00
ආරම්භක දිනය :- 2024.06.24
නිමකල දිනය :- 2024.09.07



ව්‍යාපෘතියේ නම :- හස්තිපුර තැලවිල්ල ප්‍රතිසංස්කරණය කිරීම
ස්ථානය :- පුත්තලම ප්‍රාකොට්ඨාසය .ලේ.
ප්‍රතිපාදන ප්‍රමාණය :- රු . 1,000,000.00
ආරම්භක දිනය :- 2024.06.24
නිමකල දිනය :- 2024.09.07

**iv. රාජ්‍ය ආදායම් උපයා ගැනීමේ ව්‍යාපෘති**

**වගුව 3.50 : පුත්තලම දිස්ත්‍රික්කය - ආදායම් උපයා ගැනීම් 2024.01.01 සිට 2024.12.31 දක්වා**

| විස්තරය | ආදායම (රු.මි.) |
|---|---|
| දැව බලපත්‍ර ආදායම | 0.3615 |
| තුවක්කු බලපත්‍ර ගාස්තු | 2.8079 |
| බලපත්‍ර ගාස්තු හා අනෙකුත් | 14.5964 |
| නිවාස කුලී | 3.4513 |
| පොළිය අනෙකුත් | 10.3973 |
| දඩ මුදල් හා රාජ සන්තක කිරීම් | 18.5599 |
| විභාග ගාස්තු | 0.0072 |
| මෝටර් රථ ආදායම | 7.6071 |
| විකුණුම් ගාස්තු | 0.0925 |
| රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහන | 3.985 |
| විකුණුම් ගාස්තු - අනෙකුත් ලැබීම් | 18.8596 |
| වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් | 63.3384 |
| වාහන විකිණීම | 0.0094 |
| භාණ්ඩ විකිණීම | 0.2298 |
| මුළු එකතුව | **144.3033** |

## 3.20. අනුරාධපුර දිස්ත්‍රික්කය

### i. හැඳින්වීම

**පසුබිම**

වර්ග කිලෝ මීටර 7,179 කින් සමන්විත අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඡන්ද කොට්ඨාශ 07 ක්ද, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 22 ක්ද, ග්‍රාම නිලධාරී කොට්ඨාශ 694 ක්ද, වන අතර, ජනගහනය 1,047,893 ක් වේ.

**දිස්ත්‍රික්කයේ ප්‍රධාන සංරචක.**

ප්‍රමුඛ පරාසයන්

- දිස්ත්‍රික් හා ප්‍රාදේශීය පරිපාලනයට අදාළ ව්‍යවස්ථාපිත කාර්යයන්
- ඉඩම් කළමනාකරණය
- යටිතල පහසුකම් සංවර්ධනය
- සේවා නියුක්ති හා ව්‍යවසායකත්ව සංවර්ධනය
- සමාජ සවිබල ගැන්වීම ආරක්ෂණය හා අධ්‍යාත්මික සංවර්ධනය
- පරිසර සංරක්ෂණය
- ආපදා කළමනාකරණය
- තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය
- ආගමික හා ජාතික උත්සව සංවිධානය

**විෂයපථය**

- නව තාක්ෂණය අනුගත කිරීම.
- රාජ්‍ය යාන්ත්‍රණය විධිමත් කිරීම.
- තොරතුරු කළමනාකරණය
- රජයේ ඉඩම් හඳුනා ගැනීම.නිදහස් කිරීම නිත්‍යානුකූල කිරිම.
- සංවර්ධනය කළ යුතු ස්ථාන හඳුනා ගැනීම.
- අධීක්ෂණය මෙහෙයවීම
- දිස්ත්‍රික්කයේ / කොට්ඨාශයේ ජනතාව ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම.
- ආන්තික සහ විශේෂ අවශ්‍යතා සහිත සමාජ කොටස් සඳහා වන සමාජ සුභසාධන කාර්යයන් පවත්වාගෙන යාම.
- පරිසර හා තිරසර සංවර්ධනය
- ජීවිත හා දේපළ ආරක්ෂා කිරිම, පරිසරය සංරක්ෂණය කිරීම
- පරිසර හිතකාමී කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය
- රාජ්‍ය පොසොන් උත්සවය හා අනෙකුත් ආගමික උත්සව හා නිදහස් උත්සවය, අලුත් සහල් මංගල්‍ය

### ii. ආයතනයේ මූල්‍ය ප්‍රගතිය (2024.01.01 සිට 2024.12.31 දක්වා)

පුනරාවර්තන වියදම් - රු.මි. 5,622.77
ප්‍රාග්ධන වියදම් - රු.මි. 1,732.98

### iii. ආයතනයේ භෞතික ප්‍රගතිය

**වගුව 3.51: අනුරාධපුර දිස්ත්‍රික්කය - ආයතනයේ ප්‍රගතිය (2024.01.01 සිට 2024.12.31 දක්වා )**

| # | කාර්යය | සංඛ්‍යාත්මකව | ප්‍රතිශතය % |
|---|---|---|---|
| 01 | රාජ්‍ය නොවන සංවිධාන ලි.ප. කිරීම | 4 | 100 |
| 02 | තොරතුරු පනත අනුව තොරතුරු ලබාදීම | 15 | 87 |
| 03 | ගිනි අවි බලපත්‍ර අලුත් කිරීම | 1,675 | 91.33 |
| 04 | අබිං බලපත්‍ර නිකුත් කිරීම | 48 | 90.56 |

**වගුව 3.52: අනුරාධපුර දිස්ත්‍රික්කය - ක්‍රියාත්මක ප්‍රාග්ධන අරමුදල් ව්‍යාපෘති වල ප්‍රගතිය (2024.01.01 සිට 2024.12.31 දක්වා )**

| # | සංරචකය | අරමුදල් මූලාශ්‍රය | වැඩසටහන | ව්‍යාපෘති සංඛ්‍යාව | මුළු පිරිවැය (රු.මි) | වියදම (රු.මි) |
|---|---|---|---|---|---|---|
| 01. | ප්‍රවේශ මාර්ග | දේශීය | විමධ්‍යගත අයවැය වැඩසටහන වෙනත් වැඩසටහන් | 316<br>12 | 148.65<br>24.31 | -<br>23.80 |
| 02. | ක්‍රීඩා පිටි | | | 15<br>9 | 3.92<br>11.86 | -<br>10.46 |
| 03. | සුළු වාරිමාර්ග | | | 43 | 19.29 | - |
| 04. | ග්‍රාමීය ආර්ථික යටිතල පහසුකම් | | | 8 | 0.47 | - |
| 05. | ආගමික මධ්‍යස්ථාන සංවර්ධනය | | | 290<br>28 | 59.88<br>16.83 | 16.57 |
| 06. | සමාජ සුබ සාධනය | | | 234<br>03 | 63.31<br>20.07 | 19.82 |
| 08. | සූරිය පැනල/ විදුලිය | දේශීය | විමධ්‍යගත අයවැය වැඩසටහන | 13 | 3.24 | - |
| 09. | ග්‍රාමීය ජල සැපයුම් | | | 10 | 4.04 | - |
| 10. | නිල සෙවන | - | - | - | - | - |
| 11. | වෙනත් යටිතල පහසුකම් | - | විමධ්‍යගත අයවැය වැඩසටහන වෙනත් වැඩසටහන් | 733<br>13 | 191.55<br>35.44 | 31.94 |
| 12. | ග්‍රාමීය ආර්ථික සංවර්ධනය | දේශීය | | 61<br>03 | 22.20<br>13.69 | 12.48 |
| **මුළු එකතුව** | | | | **1,791** | **638.75** | **115.07** |

**රු.මි.**

විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ වූ මුළු වියදම = 584.01

අනෙකුත් වැඩසටහන් වල මුළු වියදම = 115.07

2024.08.31 දක්වා ක්‍රියාත්මක ප්‍රාග්ධන අරමුදල් ව්‍යාපෘති වල මුළු වියදම = **699.08**

**පිංතූර 3.19 : . අනුරාධපුර දිස්ත්‍රික්කයේ ව්‍යාපෘති හා වැඩසටහන්**



ව්‍යාපෘතියේ නම :- දළදා පුර ග්‍රාම නිලධාරී කාර්යාලයේ ඉතිරි වැඩ නිම කිරීම

ස්ථානය :- 408 දළදා පුර

මුළු පිරිවැය :- රු.මි.0.588

වියදම :- රු.මි. 0.582-

ආරම්භ කළ දිනය :-2024.05.13

අවසන් කළ දිනය : 2024.06.13



ව්‍යාපෘතියේ නම :- සායන මධ්‍යස්ථානයේ ඉදිකර ඇති වැසිකිළිය අළුත්වැඩියා කිරීම

ස්ථානය :- 546 කට්ටමුරිච්චාන

මුළු පිරිවැය :- රු.මි. 0.250

වියදම :- රු.මි. 0.242

ආරම්භ කළ දිනය : 2024.05.02

අවසන් කළ දිනය :2024.06.15

**iv. රාජ්‍ය ආදායම් උපයා ගැනීමේ ව්‍යාපෘති**

**වගුව 3.53 : අනුරාධපුර දිස්ත්‍රික්කය - ආදායම් උපයා ගැනීම් 2024.01.01 සිට 2024.12.31 දක්වා**

| ආදායම් ශීර්ෂය | ආදායම ( රු.මි.) |
|---|---|
| බලපත්‍ර ගාස්තු හා වෙනත් | 10.61 |
| රජයේ ගොඩනැඟිලි කුලී | 10.10 |
| රජයේ කැලෑවලින් ලැබෙන ආදායම | 14.37 |
| ඉඩම් හා අනෙකුත් බදුකුලී | (-1.17) |
| පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පණත යටතේ ගාස්තු | 24.07 |
| මෝටර් රථ ආදායම් | 8.95 |
| **මුළු එකතුව** | **66.95** |

## 3.21. පොළොන්නරුව දිස්ත්‍රික්කය

### i. හැඳින්වීම

**පසුබිම**

උතුරින් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයෙන් ද, දකුණින් අම්පාර දිස්ත්‍රික්කයෙන් ද, බටහිරින් අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් සහ මාතලේ දිස්ත්‍රික්කයෙන් ද, නැගෙනහිරින් මඩකලපු දිස්ත්‍රික්කයෙන් ද මායිම් වී ඇත.

| භෞතික පිහිටීම හා වෙනත් විශේෂ තොරතුරු | | | |
|---|---|---|---|
| පිහිටීම | | උතුරු අක්ෂාංශ 7' 40" - 8' 21" | |
| | | නැගෙනහිර දේශාංශ 80' 44" - 81' 20" | |
| විශාලත්වය | | වර්ග කිලෝ මීටර් 3317.04 | |
| අභ්‍යන්තර ජලාශ | | වර්ග කිලෝ මීටර් 140.21 | |
| වන ජීවී ප්‍රදේශ | | හෙක්ටයාර් 156,224.70 | |
| වන සංරක්ෂණ | | හෙක්ටයාර් 48,460.42 | |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සංඛ්‍යාව | 7 | ගොවිජන සේවා මධ්‍යස්ථාන සංඛ්‍යාව | 13 |
| මහා නගර සභා සංඛ්‍යාව | 1 | ප්‍රාදේශීය සභා සංඛ්‍යාව | 7 |
| ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව | 295 | ඡන්ද කොට්ඨස සංඛ්‍යාව | 3 |
| පාසල් සංඛ්‍යාව | 253 | ගම්මාන සංඛ්‍යාව | 657 |
| ලියාපදිංචි ඡන්ද සංඛ්‍යාව | 345,769 | පොලිස් ස්ථාන සංඛ්‍යාව | 11 |
| මුළු ජනගහනය | 506,636 | | |
| ස්ත්‍රී | 260,005 | මුළු නිවාස සංඛ්‍යාව | 135,772 |
| පුරුෂ | 246,631 | ස්ථිර නිවාස | 110,019 |
| මුළු පවුල් සංඛ්‍යාව | 140,062 | අර්ධ ස්ථිර නිවාස | 17,942 |
| ස්ත්‍රී මූලික | 19,911 | තාවකාලික නිවාස | 2,141 |
| පුරුෂ මූලික | 120,151 | නිවාස නොමැති පවුල් | 2,443 |

**දිස්ත්‍රික්කයේ ප්‍රධාන සංරචක**

**ප්‍රධාන සංරචක**

- කෘෂිකර්ම, ධීවර හා සත්ත්ව නිෂ්පාදන
- අධ්‍යාපන හා සෞඛ්‍ය
- කර්මාන්ත
- සංචාරක

**විෂය පථය**

- මධ්‍යම රජය හා පළාත්සභා යටතේ පාලනය වන ඉලක්කගත ආයතන හා ප්‍රමුඛ පරාසයන් හා සබැඳි සිවිල් හා රාජ්‍ය නොවන සංවිධාන සම්බන්ධීකරණය කරමින් මෙම ක්ෂේත්‍රයන්ගේ සංවර්ධනය සඳහා අවශ්‍ය මැදිහත්වීම ලබා දීම.

**ක්‍රියාකාරීත්වය**

- ශක්තීන්, දුර්වලතා, අවස්ථා හා තර්ජන හඳුනා ගනිමින් උපායමාර්ගික සැලැස්මක් අනුව ක්ෂේත්‍රයන් ප්‍රවර්ධනය සඳහා කටයුතු කිරීම.

**විශේෂ ළඟාකර ගැනීම**

- කවුඩුල්ල හා මින්නේරිය ජාතික වනෝද්‍යාන ආශ්‍රිත ආදායම රු.මි 563 දක්වා ඉහළ නැංවී ඇති ඇති අතර මෙය 2023 වර්ෂයට සාපේක්ෂව 18% වර්ධනයකි
- වගා කන්න 02 තුල හෙක්ටයාර් 138,000 ක පමණ වී වගා කටයුතු සිදු කිරීම හා මෙ.ටොන් ලක්ෂ හතක් පමණ වී නිෂ්පාදයක් සිදු කිරීම.

**අභියෝග**

- ජල දුෂ්කරතා (විශේෂයෙන් හිඟුරක්ගොඩ ප්‍රා.ලේ කොට්ඨාසයේ), බීජ හා කෘෂි රසායන හා පොහොර මිළ ඉහළ යාම.
- ඉංග්‍රීසි මාධ්‍ය භාෂා පරිවර්ථයන් හැරුණු කොට අනෙකුත් භාෂා පරිවර්ථකයන්ගේ පවතින දැඩි ඌණතාවය, විදේශ මුදල් මගින් ගෙවීම් පහසුකම් අවමවීම හේතුවෙන් විදෙස් සංචාරකයන් දුෂ්කරතාවයන්ට ලක්වීම.
- පාසල් අධ්‍යාපන විභාග ප්‍රතිඵල සාපේක්ෂව පහළ මට්ටමක පැවතීම නිරීක්ෂණය

අනාගත ඉලක්ක

- වාර්ෂික වී අස්වැන්න මෙ.ටොන් ලක්ෂ 9.00 දක්වා ඉහළ නැංවීම
- වාර්ෂිකව සංචාරක ආදායම 10% පමණ ඉහළ නැංවීම
- පාසල් අධ්‍යාපන විභාග ප්‍රතිඵල ජාතික සාමාන්‍ය අගයට වඩා ඉහළ නැංවීම

**ii.ආයතනයේ මූල්‍ය ප්‍රගතිය**

**(2024.01.01 සිට 2024.12.31දක්වා)**

පුනරාවර්තන වියදම් - රු.මි. 2,512.173
ප්‍රාග්ධන වියදම් - රු.මි. 710.673

වගුව **3.54:** පොළොන්නරුව දිස්ත්‍රික්කය **- 2025** වර්ෂය සඳහා අපේක්ෂිත අයවැය යෝජනා. (සාරාංශගතව)

| # | ව්‍යාපෘතියේ නම | ඇස්තමේන්තුගත මුළු පිරිවැය (රු.මි.) | අපේක්ෂිත වෙන් කිරීම් (රු.මි.) |
|---|---|---|---|
| 1 | විමධ්‍යගත අයවැය වැඩසටහන | 350 | 350 |
| 2 | ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන | 50 | 50 |
| 3 | සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන | 15 | 15 |
| 4 | ප්‍රතිආශ්‍රිතකරණ ජල පෙරණ පද්ධතිවල විදුලි බිල්පත් පියවීම | 5 | 5 |
| 5 | ලෝක ආහාර වැඩසටහන | 50 | - |
| 6 | ගෘහාශ්‍රිත එළවළු ඇති කිරීමේ ව්‍යාපෘතිය | 5 | 5 |
| **මුළු එකතුව** | | **475** | **425** |

iii. ආයතනයේ භෞතික ප්‍රගතිය

**වගුව 3.55 : පොළොන්නරුව දිස්ත්‍රික්කය - ක්‍රියාත්මක ප්‍රාග්ධන අරමුදල් ව්‍යාපෘතිවල ප්‍රගතිය (2024.01.01 සිට 2024.12.31 දක්වා).**

| # | සංරචකය | අරමුදල් මූලාශ්‍රය | වැඩසටහන් | ව්‍යාපෘති සංඛ්‍යාව | මුළු ඇස්තමේන්තු පිරිවැය (රු.මි) | වියදම (රු.මි) |
|---|---|---|---|---|---|---|
| 1 | ඉදිකිරීම්/මිලදීගැනීම් | දේශීය | විමධ්‍යගත අයවැය වැඩසටහන | 1,891 | 337 | 331.5 |
| 2 | ග්‍රාමීය මාර්ග | | ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන | 14 | 26.31 | 26.31 |
| 3 | නිෂ්පාදන ගම්මාන | | සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන | 5 | 13.4 | 11.71 |
| 4 | ග්‍රාමීය ජල සැපයුම් | | ප්‍රතිආශ්‍රිතකරණ ජල පෙරණ පද්ධතිවල විදුලි බිල්පත් පියවීම | 41 | 3.44 | 2.6 |
| 5 | ග්‍රාමීය ආර්ථික | විදේශීය | ලෝක ආහාර වැඩසටහන | 1 | 61.31 | 60.5 |
| 6 | ග්‍රාමීය ආර්ථික | දේශීය | ගෘහාශ්‍රිත එළවළු ඇති කිරීමේ ව්‍යාපෘතිය | 7 | 1.96 | 1.9 |
| 7 | ආගමික මධ්‍යස්ථාන සංවර්ධනය | විදේශීය | මහජන චීන සමූහාණ්ඩු ආධාර යටතේ විහාරස්ථාන සංවර්ධනය | 10 | 6.6 | 6.6 |
| 8 | පුරවැසි සේවා දත්ත පද්ධතිය හා ඒකාබද්ධ සංවර්ධන සැලැස්ම | | CDLG ව්‍යාපෘතිය - පුරවැසි සේවා දත්ත පද්ධතිය හා තමන්කඩුව ඒකාබද්ධ සංවර්ධන සැලැස්ම | 1 | 10.86 | 9.78 |
| 9 | ඉදිකිරීම් / සංචාරක ප්‍රවර්ධන | දේශීය | ගල්ඔය පාරිසරික උද්‍යානය සංවර්නය | 6 | 20.32 | 19.03 |
| 10 | ඉදිකිරීම් / පාසල් ක්‍රිකට් සංවර්ධන | | ක්‍රීඩාංගන හා පැති විකට්වු ඉදිකිරීම | 13 | 15.6 | 14.46 |
| **මුළු එකතුව** | | | | **1,989** | **496.8** | **484.39** |

**iv.** රාජ්‍ය ආදායම් උපයා ගැනීමේ ව්‍යාපෘති

වගුව **3.56:** පොළොන්නරුව දිස්ත්‍රික්කය - ආදායම් උපයා ගැනීම් **2024.01.01** සිට **2024.12.31** දක්වා

| # | ආදායම් ශීර්ෂය | විස්තරය | ආදායම (රු.මි.) |
|---|---|---|---|
| 01 | 10.02.07.00 | මුද්දර ගාස්තු | 0.012 |
| 02 | 10.03.07.03 | පෞද්ගලික දැව ප්‍රවාහනය - වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 0.182 |
| 03 | 10.03.07.05 | රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයට අදාළ බලපත්‍ර ගාස්තු | 0.237 |
| 04 | 10.03.07.99 | බලපත්‍ර ගාස්තු - අනෙකුත් | 8.020 |
| 05 | 20.02.01.01 | රජයේ ගොඩනැඟිලි කුලී හා නිවාස කුලී | 6.584 |
| 06 | 20.02.02.99 | ණය පොළීය | 6.175 |
| 07 | 20.03.01.00 | මාර්ග නීති පොත් | 0.016 |
| 08 | 20.03.02.03 | 1968 දරණ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ පනත යටතේ ගාස්තු | 9.378 |
| 09 | 20.03.02.13 | විභාග හා අනෙකුත් ගාස්තු | 0.001 |
| 10 | 20.03.02.14 | මෝටර් රථ වාහන පනත | 0.978 |
| 11 | 20.03.02.99 | විකුණුම් සහ ගාස්තු | 0.025 |
| 12 | 20.03.03.02 | දඩ මුදල් රාජ සන්තක කිරීමේ | 0.004 |
| 13 | 20.03.07.00 | රජයේ වී මිල දී ගැනීමේ වැඩසටහන | 13.605 |
| 14 | 20.03.99.00 | විකුණුම් සහ ගාස්තු අනෙකුත් ලැබීම් | 88.617 |
| 15 | 20.04.01.00 | මධ්‍යම රජය - සමාජ ආරක්ෂණ දායකත්වය | 32.933 |
| 16 | 20.06.02.00 | ප්‍රාග්ධන වත්කම් විකිණීම | 0.189 |
| | | **මුළු එකතුව** | 166.956 |

## 3.22. බදුල්ල දිස්ත්‍රික්කය

### i. හැඳින්වීම

**පසුබිම**

ශ්‍රී ලංකාවේ මධ්‍යම කඳුකරයෙහි නැගෙනහිර කොටසෙහි පිහිටි බදුල්ල දිස්ත්‍රික්කය භූගෝලීය වශයෙන් විෂමතාවයන්ගෙන් අනූන දිස්ත්‍රික්කයකි. භූමි ප්‍රමාණය වර්ග කිලෝ මීටර් 2,861 ක් වන මෙම ප්‍රදේශය විවිධ දේශගුණික තත්ත්වයන්වලින් සමන්විත වේ. පරිපාලනමය වශයෙන් දිස්ත්‍රික්කය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 15 ක් ද, ග්‍රාම නිලධාරී වසම් 567 ක් ද වන අතර සමස්ත ජනගහණය 899,145 කින් සමන්විත වන අතර ජන ව්‍යාප්තිය අනුව සිංහල දෙමළ මුස්ලිම් වශයෙන් මිශ්‍ර ජන ව්‍යාප්තියක් පෙන්නුම් කරනු ලැබේ. තවද දිස්ත්‍රික්කය ඡන්ද කොට්ඨාස ගණන 09 කින් ද, මහා නගර සභා 2 කින්ද, නගර සභා 1 කින් ද ප්‍රාදේශීය සභා 15 කින් ද සමන්විත වේ.

පාරසරික වශයෙන් ආකර්ෂණීය දියඇලි සහ දර්ශනීය කඳු පංතියෙන් සමන්විත සංචාරක ආකර්ශනීය දිස්ත්‍රික්කයක් වන අතර එය ජෛව විවිධත්වයෙන් ආඪ්‍ය තුරු සියොතුන්ගෙන් ගහන විවිධ දේශගුණික කලාපයන්ගෙන් සමන්විත වේ. කඳුකරය ආශ්‍රිත ප්‍රදේශවල තේ වගාව දක්නට ලැබෙන අතර වී ගොවිතැනද මෙම දිස්ත්‍රික්කයේ බහුලව සිදු කෙරේ. එමෙන්ම ජාතික මට්ටමේ එළවළු නිෂ්පාදනය සඳහා විශාල දායකත්වයක් ද සපයනු ලැබේ. තවද ආදී වාසි ජනාවාස සහිත මෙම දිස්ත්‍රික්කය ඌව වෙල්ලස්ස ඓතිහාසික වශයෙන් ප්‍රසිද්ධියක් ලබා ඇත.

**දිස්ත්‍රික්කයේ ප්‍රධාන සංරචක**

**ප්‍රධාන සංරචක**

**ප්‍රමුඛ පරාසයන්**

- ග්‍රාමීය වතු ජනතාවගේ ආර්ථික සහ ජීවන තත්ත්වය ඉහල නැංවීම
- කෘෂිකාර්මික ක්ෂේත්‍රය නවීකරණය කිරීම
- ග්‍රාමීය හා වතු ප්‍රදේශවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම
- ස්වභාවික ආපදා කළමනාකරණය

**විෂය පථය**

- රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම
- රේඛීය අමාත්‍යාංශවලින් කරනු ලබන විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- දිස්ත්‍රික්කයේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා කළමනාකරණය
- දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරිපාලනය කිරීම.

**ක්‍රියාකාරීත්වය**

- දිස්ත්‍රික් ලේකම්ගේ ප්‍රධානත්වයෙන් සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් මගින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සම්බන්ධීකරණය කර ගනිමින් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා විවිධ ආයතනික මට්ටමේ කාර්යයන්, සංවර්ධන ව්‍යාපෘති, සමාජ සුබ සාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

**විශේෂ ළඟා කර ගැනීම්**

- මාර්ග සංවර්ධන ක්ෂේත්‍රයේ දියුණුවක් අත්පත් කරගෙන තිබීම
- කාර්යක්ෂම ආපදා කළමනාකරණ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක වීම

**අභියෝග**

- ග්‍රාමීය හා වතු ජනතාවගේ දරිද්‍රතාවයට විසඳුම් සෙවීම
- තෝරාගත් ප්‍රදේශ සංවර්ධනය සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොලැබීම (අධ්‍යාපන, සෞඛ්‍ය, නිවාස, ක්‍රීඩා)
- වන සතුන්ගෙන් වගාවන්ට හානි සිදු වීම
- ස්වභාවික ආපදා තත්ත්වයන්

**අනාගත ඉලක්ක**

- කෘෂිකර්මාන්තය නවීකරණය තුලින් ගොවියාගේ ආර්ථිකය දියුණු තලයකට ගෙන ඒම
- සංචාරක ක්ෂේත්‍රයේ සංවර්ධනය තුලින් දිවයිනේ ප්‍රමුඛම සංචාරක ආකර්ෂණ ප්‍රදේශය බවට පත් කිරීම.

**ii.ආයතනයේ මුල්‍ය ප්‍රගතිය (2024.01.01 සිට 2024.12.31 දක්වා)**

පුනරාවර්තන වියදම් - රු.මි. 2,521.90 ප්‍රාග්ධන වියදම් - රු. මි. 65.76

**වගුව 3.57 : බදුල්ල දිස්ත්‍රික්කය - 2025 වර්ෂය සඳහා අපේක්ෂිත අයවැය යෝජනා (සාරාංශය)**

| # | ව්‍යාපෘතියේ නම | ඇස්තමේන්තු ගත මුළු පිරිවැය (රු.මි.) | 2025 අයවැයෙන් අපේක්ෂිත වෙන් කිරීම (රු.මි.) |
|---|---|---|---|
| 01. | ගොඩනැගිලි අළුත්වැඩියා | 102.46 | 102.46 |
| 02. | ගොඩනැගිලි ඉදිකිරීම | 235.00 | 235.00 |

**iii. ආයතනයේ භෞතික ප්‍රගතිය**

**වගුව 3.58 : බදුල්ල දිස්ත්‍රික්කය - ක්‍රියාත්මක ප්‍රාග්ධන අරමුදල් ව්‍යාපෘතිවල ප්‍රගතිය (2024.01.01 සිට 2023.12.31 දක්වා)**

| # | සංරචකය | අරමුදල් මූලාශ්‍රය | වැඩසටහන | ව්‍යාපෘති සංඛ්‍යාව | මුළු පිරිවැය (රු.මි.) | වියදම ( රු.මි.) |
|---|---|---|---|---|---|---|
| 1 | ප්‍රවේශ මාර්ග | දේශීය | කදුකර දශකය | 2112 | **1954.5** (කදුකර දශකය) | 2,884.43 |
| 2 | ග්‍රාමීය විදුලිය | | | - | | |
| 3 | ග්‍රාමීය විදුලි දිගු | | | 14 | | |
| 4 | සනීපාරක්ෂක පහසුකම් | | | 98 | **514** (විමධ්‍යගත අයවැය) | |
| 5 | ක්‍රීඩා පිටි | | විමධ්‍යගත අයවැය | 61 | | |
| 6 | සුළු වාරිමාර්ග | | | 224 | | |
| 7 | ග්‍රාමීය ආර්ථික යටිතල | | | 17 | **1076** (වැඩසටහන් කිහිපයක්) | |
| 8 | ආගමික මධ්‍යස්ථාන සංවර්ධනය | | වැඩසටහන් කිහිපයක්, පිරිවෙන් අධ්‍යාපනය ශක්තිමත් කිරීම | 300 | | |
| 9 | සමාජ සුභ සාධන | | ග්‍රාමීය මාර්ග | 656 | | |
| 10 | නිවාස සංවර්ධනය | | | 65 | **116** (ග්‍රාමීය මාර්ග) පිරිවෙන් | |
| 11 | සූරිය පැනල / විදුලිය | | | 4 | | |
| 12 | ග්‍රාමීය ජල සැපයුම් | | | 166 | | |
| 13 | නිල සෙවන | | | - | **0.607** අධ්‍යාපනය ශක්තිමත් කිරීම | |
| 14 | වෙනත් යටිතල පහසුකම් | | | 123 | | |
| **මුළු එකතුව** | | | | **3,840** | **3661.107** | **2884.43** |

**පිංතුර 3.20 : බදුල්ල දිස්ත්‍රික්කයේ ව්‍යාපෘති හා වැඩසටහන්**



ව්‍යාපෘතියේ නම- වැලිමඩ, අළුත් කොලණිය වටබැද්ද මාර්ගය කොන්ක්‍රීට් කිරීම

මුළු පිරිවැය - රු. මි. 0.97
වියදම - රු. මි 0.97
ආරම්භක දිනය - 2024.05.31
අවසන් දිනය - 2024.06.19



ව්‍යාපෘතියේ නම- පස්සර, බිබිලේගම බටහිර, හෙල උඩුතුර මාර්ගය කොන්ක්‍රීට් කිරීම

මුළු පිරිවැය - රු. මි. 1
වියදම - රු. මි. 0. 96
ආරම්භක දිනය -2024.07.23
අවසන් දිනය -2024.07.25



ව්‍යාපෘතියේ නම- බදුල්ල වේවැස්ස අභ්‍යන්තර මාර්ගය කොන්ක්‍රීට් කිරීම

මුළු පිරිවැය - රු. මි. 0.97
වියදම - රු. මි.. 0.96
ආරම්භක දිනය - 2024.06.01
අවසන් දිනය - 2024.06.05

**iv. රාජ්‍ය ආදායම් උපයා ගැනීමේ ව්‍යාපෘති**

**වගුව 3.59 බදුල්ල දිස්ත්‍රික්කය – ආදායම් උපයා ගැනීම් 2023.01.01 සිට 2023.12.31 දක්වා**

| ආදායම් ශීර්ෂය | ආදායම් (රු.මි.) |
|---|---|
| මුද්දර ගාස්තු 10.02.07.00 | 0.015 |
| විභාග හා අනෙකුත් ගාස්තු 20.03.02.13 | 0.014 |
| ගොඩනැගිලි කුළී 20.02.01.01 | 7.928 |
| වෙනත් ආදායම් | 57.38 |
| රජයේ වත්කම්වලින් ලැබෙන වෙනත් ආදායම් 20.02.02.99 | 10.60 |
| විවිධ 20.03.02.99 | 46.73 |
| අනෙකුත් ලැබීම් 20.03.99.00 | 0.047 |
| **මුළු එකතුව** | **65.345** |

## 3.23. මොණරාගල දිස්ත්‍රික්කය

### i. හැඳින්වීම

**පසුබිම**

ඌව පළාතට අයත් මොනරාගල දිස්ත්‍රික්කය, ශ්‍රී ලංකාවේ නැගෙනහිර හා ගිණිකොණ දිශානුගතව පිහිටා ඇත. මුළු බිම් ප්‍රමාණය වර්ග කිලෝමීටර් 5659 ක් පමණ වන අතර, ශ්‍රී ලංකාවේ දෙවන විශාලම දිස්ත්‍රික්කය වේ. නිරපේක්ෂ පිහිටීම අනුව උතුරු අක්ශාංශ $6^{0}$ $17^{1}$ ත් $7^{0}$ $28^{1}$ සහ නැගෙනහිර දේශාංශ $80^{0}$ $50^{1}$ ත් $80^{0}$ $35^{1}$ ත් අතර පිහිටා ඇති මෙම දිස්ත්‍රික්කයේ අන්තර් මධ්‍ය හා වියළි දේශගුණික කලාප වලට අයත් වේ.

නැගෙනහිරින් හා උතුරින් අම්පාර දිස්ත්‍රික්කයද, බටහිරින් හා උතුරින් බදුල්ල දිස්ත්‍රික්කයෙන් ද, දකුණින් හම්බන්තොට දිස්ත්‍රික්කයෙන් ද, නිරිත දිගින් රත්නපුර දිස්ත්‍රික්කයෙන්ද මායිම්ව පිහිටා ඇති මෙම දිස්ත්‍රික්කයේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 11 කින් හා ග්‍රාම නිලධාරි කොට්ඨාශ 319 ද ගම්මාන 1,330 කින් සමන්විත වේ.

මැතිවරණ කොට්ඨාශ 3 කින් ද, ප්‍රාදේශීය සභා 10 ක පළාත් පාලන ආයතන වලට අයත් දිවයිනේ නාගරික පළාත් පාලන ආයතන නොමැති දිස්ත්‍රික්කයකි. මුළු ජනගහණය 574,503 වන අතර ස්ත්‍රී ජනගහනය 290,183 හා පුරුෂ ජනගහනය 284,320 ද වේ. පවුල් 174,955 හා නිවාස 158,612 ක් පවති.

**දිස්ත්‍රික්කයේ ප්‍රධාන සංරවක**

**ප්‍රධාන සංරවක**

- දිළිඳුකම අවම කිරිම
- ග්‍රාමීය මාර්ග සංවර්ධනය
- ආගමික ස්ථාන සංවර්ධනය
- සෞඛ්‍ය ප්‍රවර්ධනය සහ පෝෂණ තත්ත්වය ඉහළ නැංවීම

**විෂය පථය**

- දිළිඳුකම අවම කිරිම පිණිස කටයුතු සම්පාදනය කිරීම
- ග්‍රාමීය මාර්ග සංවර්ධනය
- කිරීම පිණිස කටයුතු සම්පාදනය කිරීම
- ආගමික ස්ථාන සංවර්ධනය කිරීම පිණිස කටයුතු සම්පාදනය කිරීම
- සෞඛ්‍ය ප්‍රවර්ධනය සහ පෝෂණ තත්ත්වය ඉහළ නැංවීම පිණිස කටයුතු සම්පාදනය කිරීම
- පරිසරය ආරක්ෂා කිරීම පිණිස කටයුතු සම්පාදනය කිරීම

**ක්‍රියාකාරිත්වය**

- දිළිඳුකම අවම කිරිම සඳහා සිදුකල යුතු ක්‍රියාමාර්ග හඳුනාගැනීම, සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පසු විපරම් කිරීම.
- ප්‍රතිසංස්කරණය කළයුතු මාර්ග හඳුනාගැනීම, සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පසුවිපරම් කිරීම
- සංවර්ධනය කලයුතු ආගමික ස්ථාන හඳුනාගැනීම, සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පසුවිපරම් කිරීම
- සෞඛ්‍ය ප්‍රවර්ධනය සහ පෝෂණ තත්ත්වය ඉහළ නැංවීම සඳහා සිදුකල යුතු ක්රියාමාර්ග හඳුනාගැනීම, සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පසු විපරම් කිරීම.
- පරිසරය ආරක්ෂා කිරීම සඳහා සිදුකල යුතු ක්‍රියාමාර්ග හඳුනාගැනීම, සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පසු විපරම් කිරීම.

**විශේෂ ළඟා කරගැනීම**

- දිළිඳු බව අවම කිරිම.
- ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරිම.
- ග්‍රාමීය ජනතාවට විදුලිය හා පානීය ජලය ලබාදීම.
- විනාශ වී ගිය කුඩා හා විශාල වැව ප්‍රතිසංස්කරණය කිරීම.
- සියලුම පාසල් වල ප්‍රතිඵල වර්ධනයක් ඇති කිරීම.
- වගකඩු හා අනෙකුත් බෝනොවන රෝග පාලනය කිරීම.

**අභියෝග**

- වියළි කාලගුණ තත්වයන්හිදි කෘෂිකර්මාන්තයට හා පරිභෝජනයට අවශ්‍ය ජලය හිඟකම.

- ගොවින්ගේ අස්වනු සඳහා නිසි මිලක් නොලැබීම.
- අලි මිනිස් ගැටුම් ඉහළ යාම.
- නීති විරෝධී මත්පැන් හා මත්ද්‍රව්‍ය භාවිතයෙන් ළමුන් හා තරුණ පිරිස් මුදවා ගැනීම.
- වගුකඩු හා අනෙකුත් බෝනොවන රෝග පාලනය.
- බහුතර ජනතාවකට ස්ථිර ආදයම් මාර්ග නොමැතිවීම

**අනාගත ඉලක්ක**

- වියළි කාලගුණ තත්වයන්ට මුහුණ දීමට හැකිවන පරිදි වාරිමාර්ග පද්ධතියක් ඇති කිරීම.
- මත්ද්‍රව්‍ය හා මත්පැන් වලින් තොර දිස්ත්‍රික්කයක් බවට පත් කිරීම.
- දිස්ත්‍රික්කයෙන් දිළිඳුබව තුරන් කිරීම.
- වගුකඩු ඇතුළු බෝනොවන රෝග පාලනය කිරීම.
- කෘෂිකර්මාන්තයට තරුණ පරපුර යොමු කිරීම.
- දිස්ත්‍රික්කයේ ජනතාවට ස්ථිර ආදයම් මාර්ග උත්පාදනයට සහය වීම.
- දිස්ත්‍රික්කයේ සියලුම ජනතාවට කර්යක්ෂම සේවාවක් සැපයීම.

**ii**.ආයතනයේ මූල්‍ය ප්‍රගතිය

(**2024.01.01** සිට 2024**.12.**31 දක්වා)

පුනරාවර්තන වියදම් - රු.මි.1,638.17
ප්‍රාග්ධන වියදම් - රු.මි. 256.62

**වගුව 3.60 : මොණරාගල දිස්ත්‍රික්කය - 2025 වර්ෂය සඳහා අපේක්ෂිත අයවැය යෝජනා (සාරාංශය)**

| # | ව්‍යාපෘතියේ නම | ඇස්තමේන්තුගත මුළු පිරිවැය (රු.මි.) | 2025 අයවැයෙන් අපේක්ෂිත වෙන් කිරීම (රු.මි.) |
|---|---|---|---|
| 01. | සාමාන්‍ය පරිපාලන හා ආයතන සේවා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 1,492.46 | 1,492.46 |
| 02. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල | 1,492.46 | 1,492.46 |
| | **මුළු එකතුව** | **2,984.92** | **2,984.92** |

iii. **ආයතනයේ භෞතික ප්‍රගතිය**

**වගුව 3.61: මොණරාගල දිස්ත්‍රික්කය - ක්‍රියාත්මක ප්‍රාග්ධන අරමුදල් ව්‍යාපෘතිවල ප්‍රගතිය (2024.01.01 සිට 2024.12.31 දක්වා)**

| # | වැඩසටහන | අරමුදල් මූලාශ්‍රය | සංරචකය | ව්‍යාපෘති සංඛ්‍යාව | මුළු ඇස්තමේන්තු පිරිවැය රු. (මි) | වියදම රු. (මි) |
|---|---|---|---|---|---|---|
| 01. | විමධ්‍යගත අයවැය වැඩසටහන | දේශීය | ප්‍රවේශ මාර්ග | 244 | 100.36 | 300.08 |
| | | | ප්‍රජා සංවර්ධනය | 542 | 81.51 | |
| | | | ආගමික සහ සංස්කෘතික | 132 | 29.85 | |
| | | | අධ්‍යාපන සහ සෞඛ්‍ය | 123 | 43.67 | |
| | | | පානීය ජලය | 7 | 7.33 | |
| | | | විදුලිය | 4 | 1.59 | |
| | | | ක්‍රීඩා පිටි සංවර්ධනය | 8 | 1.76 | |
| | | | සුළු වාරිමාර්ග | 14 | 15.46 | |
| | | | කෘෂිකාර්මාන්ත සංවර්ධනය | 7 | 8.77 | |
| | | | සමාජ ආරක්ෂණ | 3 | 2.12 | |
| | | | දිළිඳු පවුල් නගා සිටුවීම | 6 | 6.22 | |
| | | | ව්‍යවසාය සංවර්ධනය | 8 | 13.27 | |
| | | | වෙළඳපොල සංවර්ධනය | 2 | 0.50 | |
| | | | වෙනත් | 2 | 0.70 | |
| | | | **අනු එකතුව** | **1102** | **313.11** | **300.08** |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 02. | ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන | දේශීය | ප්‍රවේශ මාර්ග | 48 | 41.55 | 68.23 |
| | | | ප්‍රජා සංවර්ධනය | 116 | 14.80 | |
| | | | ආගමික සහ සංස්කෘතික | 29 | 9.42 | |
| | | | විදුලිය | 01 | 0.70 | |
| | | | අධ්‍යාපන සහ සෞඛ්‍ය | 10 | 4.50 | |
| | | | ක්‍රීඩා පිටි සංවර්ධනය | 01 | 0.08 | |
| | | | සුළු වාරිමාර්ග | 03 | 6.40 | |
| | | | කෘෂිකාර්මාන්ත සංවර්ධනය | 03 | 1.56 | |
| | | | දිළිඳු පවුල් නගා සිටුවීම | 01 | 0.04 | |
| | | | සමාජ ආරක්ෂණ | 06 | 0.95 | |
| **අනු එකතුව** | | | | **218** | **80.00** | **68.23** |
| 03 | ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන | දේශීය | ප්‍රවේශ මාර්ග | 36 | 53.94 | 53.21 |
| 04 | පාසල් පෝෂණ වැඩසටහන | විදේශීය | ප්‍රජා සංවර්ධනය | 302 | 77.98 | 76.63 |
| **මුළු එකතුව** | | | | **1658** | **525.03** | **498.15** |

**පිංතූර 3.21 : මොණරාගල දිස්ත්‍රික්කයේ ව්‍යාපෘති හා වැඩසටහන්**



**ව්‍යාපෘතියේ නම :- පාසල් පෝෂණ වැඩසටහන - කුකුල් පාලන ව්‍යාපෘතිය**

- ස්ථානය - සෙල්ලකතරගම
- වියදම - රු. 241,887.83 (එක් ප්‍රතිලාභියෙක් සඳහා)
- ආරම්භ කළ දිනය - 2024.05.01
- නිමකළ දිනය - 2024.05.25



ව්‍යාපෘතියේ නම :- යොවුන් සේනාංකය අතුරු මාර්ගය කොන්ක්‍රීට් කිරීම

- ස්ථානය - මොනරාගල
- වියදම - රු. 934,839.50
- ආරම්භ කළ දිනය - 2024.06.01
- නිමකළ දිනය - 2024.06.15

**iv. රාජ්‍ය ආදායම් උපයා ගැනීමේ ව්‍යාපෘති**

**වගුව 3.62: මොණරාගල දිස්ත්‍රික්කය - ආදායම් උපයා ගැනීම් 2024.01.01 සිට 2024.12.31 දක්වා**

| ආදායම් ශීර්ෂය | ආදායම (රු.මි) |
|---|---|
| ඉඩම් හා අනෙකුත් බදු කුළී | 0.003 |
| විභාග හා අනෙකුත් ගාස්තු | 0.005 |
| ගොඩනැගිලි කුළී | 6.804 |
| **මුළු එකතුව** | **6.812** |

## 3.24. රත්නපුර දිස්ත්‍රික්කය

### i. හැඳින්වීම

**පසුබිම**

රත්නපුර දිස්ත්‍රික්කයේ සමස්ත ජනගහනය 1,250,219 පමණ වේ. දිස්ත්‍රික්කයේ භූමි ප්‍රමාණය වර්ග කිලෝමීටර 3,275.4. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ගණන18 කි.

**දිස්ත්‍රික්කයේ ප්‍රධාන සංරචක**

**ප්‍රධාන සංරචක**

- ස්වාභාවික ආපදා කළමණාකරණය
- වතු ප්‍රජාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම.
- ග්‍රාමීය ව්‍යවසායකත්ව සංවර්ධනය
- ග්‍රාමීය, නාගරික සහ වතු ප්‍රදේශවල යටිතල පහසුකම් සංවර්ධනය

**විෂය පථය**

- රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම
- රජයේ විවිධ අමාත්‍යාංශ විසින් පවරනු ලබන කාර්යයන් සම්බන්ධීකරණය
- සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ ප්‍රගති පාලනය
- දිස්ත්‍රික්කයේ සියලු ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරිපාලනය

**විශේෂ ළඟා කරගැනීම**

- මාර්ග සංවර්ධන ක්ෂේත්‍රයේ විශේෂ දියුණුවක් අත්පත් කරගැනීම
- අධ්‍යාපන ක්ෂේත්‍රය සංවර්ධන ඉලක්ක සපුරා තිබීම
- දිස්ත්‍රික්කයේ ළමා ශ්‍රමය අවම කරගෙන තිබීම

**අභියෝග**

- දිස්ත්‍රික්කයේ දරිද්‍රතාවයෙන් පෙළෙන ජනයාට විසඳුම් ලබාදීම
- අධ්‍යාපන, සෞඛ්‍ය, නිවාස, යන ක්ෂේත්‍රයන් සඳහා ප්‍රමාණවත් පරිදි අරමුදල් නොලැබීම.
- නිවාස අහිමි ජනයා සඳහා නිවාස පහසුකම් ලබාදීම
- රැකියා විරහිත තරුණ තරුණියන් සඳහා රැකියා ලබාදීම
- ගංවතුර සහ නායයාම් වැනි ස්වාභාවික ආපදා සඳහා ස්ථිර විසඳුම් සෙවීම
- ඉඩම් අයිතිය සම්බන්ධයෙන් ගැටලු පැවතීම
- වන සතුන්ගෙන් වගාවන්ට හානි සිදු වීම.

**අනාගත ඉලක්ක**

- රත්නපුර දිස්ත්‍රික්කය කෘෂිකර්මාන්තයෙන් ස්වයංපෝෂිත කිරීම
- අධ්‍යාපනික ක්ෂේත්‍රය සංවර්ධනයෙන් දිවයිනේ ප්‍රමුඛ දිස්ත්‍රික්කය බවට පත් කිරීම.
- දිස්ත්‍රික්කයේ සියලුම ජනතාවගේ නිවාස අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම
- සියලු ජනතාවගේ පානීය ජල අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම
- සංචාරක ආකර්ශනීය ප්‍රදේශයන් බවට රත්නපුර දිස්ත්‍රික්කය පත් කිරීම.

### ii. ආයතනයේ මූල්‍ය ප්‍රගතිය
**(2024.01.01 සිට 2024.12.31 දක්වා)**

පුනරාවර්තන වියදම් - රු.මි. 2,900.37
ප්‍රාග්ධන වියදම් - රු.මි. 84.24

**වගුව 3.63: රත්නපුර දිස්ත්‍රික්කය - 2025 වර්ෂය සඳහා අපේක්ෂිත අයවැය යෝජනා (සාරාංශය)**

| # | ව්‍යාපෘතියේ නම | ඇස්තමේන්තුගත මුළු පිරිවැය (රු.මි.) | 2025 අයවැයෙන් අපේක්ෂිත වෙන් කිරීම් (රු.මි.) |
|---|---|---|---|
| 01. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ඉදිකිරීම්, මාර්ග හා පරිශ්‍ර අලංකරණ කටයුතු | 696.20 | 25.00 |
| 02. | කල්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගොඩනැගිලි ඉදිකිරීම් | 390.00 | 340.00 |
| 03. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා යන්ත්‍ර , උපකරණ හා ගෘහ භාණ්ඩ මිලදී ගැනීම් | 20.00 | 20.00 |
| | **මුළු එකතුව** | **1,106.20** | **385.00** |

**iii.** ආයතනයේ භෞතික ප්‍රගතිය

වගුව **3.64 :** රත්නපුර දිස්ත්‍රික්කය - ක්‍රියාත්මක ප්‍රාග්ධන අරමුදල් ව්‍යාපෘතිවල ප්‍රගතිය **(2024.01.01** සිට **2024.12.31** දක්වා**)**

| # | සංරචකය | අරමුදල් මූලාශ්‍රය | වැඩසටහන | ව්‍යාපෘති සංඛ්‍යාව | මුළු පිරිවැය (රු.මි.) | වියදම (රු.මි.) |
|---|---|---|---|---|---|---|
| 01. | ග්‍රාමීය මාර්ග | නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය | කඳුකර දශකය වැඩසටහන | 992 | 751.06 | 713.067 |
| | | ජනාධිපති කාර්යාලය | විමධ්‍යගත අයවැය වැඩසටහන | 414 | 229.38 | 223.47 |
| | | ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය | ග්‍රාමීය මාර්ග වැඩසටහන | 129 | 223.47 | 223.47 |
| 02. | ග්‍රාමීය පාලම් | නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය | කඳුකර දශකය වැඩසටහන | 8 | 4.80 | 4.61 |
| 03. | සනීපාරක්ෂක පහසුකම් | නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය | කඳුකර දශකය වැඩසටහන | 61 | 29.34 | 25.42 |
| | | ජනාධිපති කාර්යාලය | විමධ්‍යගත අයවැය වැඩසටහන | 5 | 1.2 | 1.2 |
| 04. | ක්‍රීඩා පිටි | ජනාධිපති කාර්යාලය | විමධ්‍යගත අයවැය වැඩසටහන | 20 | 6.00 | 5.82 |
| 05. | සුළු වාරිමාර්ග | නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය | කඳුකර දශකය වැඩසටහන | 16 | 14.5 | 13.23 |
| | | ජනාධිපති කාර්යාලය | විමධ්‍යගත අයවැය වැඩසටහන | 9 | 3.12 | 3.12 |
| 06. | ග්‍රාමීය ආර්ථික යටිතල | නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය | කඳුකර දශකය වැඩසටහන | 92 | 66.721 | 56.752 |
| | | කාන්තා ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන | 8 | 17.49 | 17.49 |
| 07. | ආගමික මධ්‍යස්ථාන සංවර්ධනය | බෞද්ධ කටයුතු අමාත්‍යාංශය | ග්‍රාමීය බෞද්ධ විහාරස්ථාන සංවර්ධන වැඩසටහන | 8 | 3.87 | 3.87 |
| | | අධ්‍යාපන අමාත්‍යාංශය | පිරිවෙන් සංවර්ධන වැඩසටහන-ඩෙස් පුටු ලබා දීම | 2 | 1.19 | 1.19 |
| | | | පිරිවෙන් සංවර්ධන වැඩසටහන | 11 | 4.74 | 4.74 |
| | | මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | මුස්ලිම් පල්ලි සංවර්ධන වැඩසටහන | 17 | 7.77 | 7.77 |
| | | ජනාධිපති කාර්යාලය | විමධ්‍යගත අයවැය වැඩසටහන | 292 | 75.87 | 74.48 |

| # | සංරචකය | අරමුදල් මූලාශ්‍රය | වැඩසටහන | ව්‍යාපෘති සංඛ්‍යාව | මුළු පිරිවැය (රු.මි.) | වියදම (රු.මි.) |
|---|---|---|---|---|---|---|
| | | ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය | වතු යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන | 7 | 2.7 | 2.53 |
| | | ජනාධිපති කාර්යාලය | විමධ්‍යගත අයවැය වැඩසටහන | 1430 | 177.05 | 173.89 |
| 08. | නිවාස සංවර්ධනය | නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය | කඳුකර දශකය වැඩසටහන | 110 | 150.48 | 96.15 |
| 09. | ග්‍රාමීය ජල සැපයුම් | නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය | කඳුකර දශකය වැඩසටහන | 67 | 35.26 | 33.29 |
| | | ජනාධිපති කාර්යාලය | විමධ්‍යගත අයවැය වැඩසටහන | 33 | 11.10 | 10.99 |
| 10. | වෙනත් යටිතල පහසුකම් | නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය | කඳුකර දශකය වැඩසටහන | 169 | 99.37 | 92.56 |
| | | ජනාධිපති කාර්යාලය | විමධ්‍යගත අයවැය වැඩසටහන | 131 | 48.46 | 47.26 |
| | | ක්‍රීඩා අමාත්‍යාංශය | ක්‍රිකට් ක්‍රීඩාව සංවර්ධනය කිරීමේ වැඩසටහන | 29 | 23.00 | 23.00 |
| | | වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | විදුලි වැට ඉදිකිරීමේ වැඩසටහන | 3 | 12.09 | 3.44 |
| | | කිතුල් සංවර්ධන මණ්ඩලය | කිතුල් සංවර්ධන වැඩසටහන | 7 | 1.14 | 1.14 |
| **මුළු එකතුව** | | | | **4,070** | **2,001.17** | **1,863.94** |

**පිංතූර 3.22 : රත්නපුර දිස්ත්‍රික්කයේ ව්‍යාපෘති හා වැඩසටහන්**



**ව්‍යාපෘතියේ නම :-** දෙල්ගමුව උඩකඩ සුසාන භූමියට යන මාර්ගය සංවර්ධනය කිරීම
**ස්ථානය :-** කුරුවිට ප්‍රා.ලේ.කො. දෙල්ගමුව
**මුළු පිරිවැය** :-රු.මි.1.00
**වියදම** :-රු. මි. 0.97
**ආරම්භක දිනය** :-2024.03.14
**නිමකළ දිනය** :-2024.06.20



**ව්‍යාපෘතියේ නම :-** දෙල්ගමුව දළදා මාවතෙ ගාව වෙන්දේසි කොටසට යන මාර්ගයේ මැද කොටස කොන්ක්‍රීට් කිරීම
**ස්ථානය :-**කුරුවිට ප්‍රා.ලේ.කො.
**මුළු පිරිවැය** :- රු.මි.0.50
**වියදම** :- රු.මි.0. 43
**ආරම්භක දිනය** :-2024.03.18
**නිමකළ දිනය** :-2024.06.25

**iv. රාජ්‍ය ආදායම් උපයා ගැනීමේ ව්‍යාපෘති**

**වගුව 3.65: රත්නපුර දිස්ත්‍රික්කය - රාජ්‍ය ආදායම් උපයා ගැනීම් 2024.01.01 සිට 2024.12.31දක්වා**

| # | ආදායම් ශීර්ෂය | ආදායම (රු.මි.) |
|---|---|---|
| 01. | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව -ලියාපදිංචි ගාස්තු | 0.15 |
| 02. | පෞද්ගලික දැව ප්‍රවාහන ගාස්තු | 0.54 |
| 03. | ආරක්ෂක අමාත්‍යාංශයට අදාළ ගාස්තු | 1.02 |
| 04. | කාබන් බද්ධ සඳහා ආදායම් | 0.5 |
| 05. | අනෙකුත් -බලපත්‍ර ගාස්තු | 16.40 |
| 06. | රජයේ ගොඩනැගිලි කුලී | 2.74 |
| 07. | ඉඩම් හා අනෙකුත් බදු | 0.08 |
| 08. | වෙනත් -පොලිය | 12.36 |
| 09. | විභාග දෙපාර්තමේන්තුව -විභාග ගාස්තු | 0.03 |
| 10 | මෝටර් රථප්‍රවාහන දෙපාර්තමේන්තුව හා අදාල ගාස්තු | 2.17 |
| 11 | පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ ගාස්තු | 24.92 |
| 12 | විවිධ - රජයේ ආදායම | 30.41 |
| 13 | දඩමුදල් හා රාජසන්තක කිරීම් | 18.06 |
| 14 | සමාජ ආරක්ෂණ දායක අරමුදල් | 90.37 |
| 15 | ප්‍රාග්ධන වත්කම් විකිණීම -වෙන්දේසි මුදල් ඇතුළුව | 0.37 |
| **මුළු එකතුව** | | **200.12** |

## 3.25. කෑගල්ල දිස්ත්‍රික්කය

### i. හැඳින්වීම

**පසුබිම**

සබරගමු පළාතේ පිහිටි කෑගල්ල දිස්ත්‍රික්කය ශ්‍රී ලංකාවේ මධ්‍ය කඳුකර ප්‍රදේශයත් නිරිත දිග තැනිතලා ප්‍රදේශයත් අතරමැද පිහිටි බිම් ප්‍රදේශයකි. ජනගහනය 950729. පරිපාලනමය වශයෙන් දිස්ත්‍රික්කය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 11කට බෙදා දක්වා ඇත. කෑගල්ල දිස්ත්‍රික්කය උතුරු අක්ෂාංශ 6.50 -7.20 සහ නැගෙනහිර දේශාංශ 80.10ත් 80.35ත් අතර පිහිටා තිබෙන අතර ව.කි.මී.1693 ක විශාලත්වයකින් යුක්ත වේ. ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව 573 ක් වන අතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 11 කි . මෙයට අයත් ගම්මාන සංඛ්‍යාව 1,677 කි. පළාත් පාලන ආයතන 12 කින් සමන්විත වන මෙහි පළාත් පාලනය පහසු කිරිම උදෙසා එය ප්‍රාදේශීය සභා 11 ක් හා නගර සභා එකක් ලෙස බෙදා වෙන් කර ඇත.

**දිස්ත්‍රික්කයේ ප්‍රධාන සංරචක.**

**ප්‍රමුඛ පරාසයන්**

- ගුණාත්මක යටිතල පහසුකම් සංවර්ධනය.
- ආරක්ෂාකාරි පානීය ජලය සහ සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරිම.
- කෘෂිකර්ම භෝග වගා ප්‍රවර්ධනය.
- කෘෂිකර්මාන්තය ආශ්‍රිතව සිදුවන සත්ත්ව හානි පසු අස්වනු හානි අවම කිරිම.
- ආපදා කළමනාකරණය.
- සැමට ගුණාත්මක අධ්‍යාපනයක් ලැබීම තහවුරු කිරිම.
- රජයේ ඉඩම් ආශ්‍රිත ගැටළු සඳහා විසඳුම් ලබා දිම.
- කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් දිරිගැන්වීම.
- අපනයන ආශ්‍රිත කර්මාන්ත ප්‍රවර්ධනය.
- සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය

**විෂය පථය**

- රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුකූලව පරිපාලන කටයුතු සිදුකරමින් කෑගල්ල දිස්ත්‍රික්කය සමාජ ආර්ථික ඉලක්ක ළගා කර ගනිමින් තිරසාර සංවර්ධන අරමුණු ළගා කර ගැනීමට අදාල ක්‍රියාකාරී දායකත්වය ලබා දීම.

**ක්‍රියාකාරිත්වය**

- රජය මඟින් ක්‍රියාත්මක කරන සංවර්ධන කටයුතු මෙහෙයවීම, අධීක්ෂණය, පසුවිපරම සහ ප්‍රගති සමාලෝචනය.
- ග්‍රාමීය හා ප්‍රාදේශිය පරිපාලන කටයුතු අධීක්ෂණය හා මෙහෙයවීම.
- දිස්ත්‍රික්කය තුල ඇති සියළුම රාජ්‍ය ආයතන සහ රාජ්‍ය නොවන සංවිධාන සම්බන්ධිකරණය.
- ඉඩම් පරිහරණය සඳහා ක්‍රමවත් සැලැස්මක් සකස් කිරිම සහ ඌන ඵලදායි ඉඩම්වල ඵලදායිත්වය වැඩි කිරිම.
- පාරිභෝගික අධිකාරිය හා එක්ව දිස්ත්‍රික්කය තුල පාරිභෝගික ආරක්ෂණ වැඩ පිළිවෙලක් ක්‍රියාවට නැංවීම.
- වතු ප්‍රජාව සඳහා අවශ්‍ය පහසුකම් වැඩි දියුණු කිරීම.
- ස්ත්‍රී පුරුෂ සමාජභාවය අත්පත් කර ගැනීම සඳහා සහය වීම හා කාන්තාවන් සහ ගැහැණු ළමයින් බල ගැන්විම.
- මත්ද්‍රව්‍ය නිවාරණය,මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය, කාන්තා හිංසනය,ළමා අපචාර අවම කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ආගමික හා සංස්කෘතික කටයුතු වැඩිදියුණු කිරිම හා ආගම් අතර සංහිඳියාව සඳහා අවශ්‍ය කටයුතු කිරිම.
- කෑගල්ල දිස්ත්‍රික්කය සංචාරක ගමනාන්තයක් ලෙස සංවර්ධනය.
- සියළුම ක්‍රිඩාවන් සඳහා පහසුකම් වැඩි දියුණු කිරිම තුලින් ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ ක්‍රිඩකයන් බිහිකිරිම.

**අභියෝග**

- කෘෂිකර්මාන්තය ආශ්‍රිතව රිලවුන්, වඳුරන්, ඌරන්, ඉත්තෑවන් හා දඬුලේනන් වැනි සතුන්ගෙන් සිදුවන හානි.
- කඳු බෑවුම් සහිත භූමි පැවතීම නිසා නායයාමේ තත්ත්වයන් හා පහත් බිම් සඳහා ගංවතුර

තත්ත්වය හේතුවෙන් දිස්ත්‍රික්කයේ ආපදා අවදානම වැඩිවීම.

- පානීය ජල පහසුකම් හා වගාවන් සඳහා ජලය ප්‍රමාණවත් නොවීම.
- පාසල් හැරගිය උසස් අධ්‍යාපනය නොලබන පිරිස සුදුසු වෘත්තීන් සඳහා යොමු නොවීම.
- කර්මාන්ත අංශයේ දියුණුව ප්‍රමාණවත් නොවීම.
- ග්‍රාමීය ප්‍රදේශ වල යටිතල පහසුකම් දුර්වල තත්වයක පැවතීම.
- කඳුකර බිම් සහිත බව නිසා ජල පහසුකම් ප්‍රමාණවත් නොවීම නිසා වී වගාව ඇතුළු ආහාර භෝග වගා බිම් ප්‍රමාණය අඩු වීම නිසා දිස්ත්‍රික්කයේ ආහාර සුරක්ෂිතතාවය අඩු වීම.
- මිරිදිය ධීවර කර්මාන්තය ප්‍රවර්ධනය සඳහා පවතින ජලාශ ප්‍රමාණය ප්‍රමාණවත් නොවීම.
- දිස්ත්‍රික්කයේ දරිද්‍රතාවය හා බැදුනු ළමා පෝෂණ ඌණතා.
- වතු ආශ්‍රිත ජනතාවගේ පහසුකම් අඩු බව.

**අනාගත ඉලක්ක**

- ආහාර සුරක්ෂිතතාවය ඇති කිරීම, සැමට සුරක්ෂිත පානීය ජලය සහ සනීපාරක්ෂක පහසුකම් ලබා දීම සහ අපනයනය ඉලක්ක කරගත් කෘෂි කාර්මික ව්‍යාපෘති සහ කර්මාන්ත ප්‍රවර්ධනය තුලින් ජනතාවගේ ජීවන තත්වය උසස් කිරීම

**වගුව 3.66 : කෑගල්ල දිස්ත්‍රික්කය - 2025 වර්ෂය සඳහා අපේක්ෂිත අයවැය යෝජනා (සාරාංශව)**

| # | යෝජනාව | ඇස්තමේන්තු ගත මුලු පිරිවැය (රු.මි.) |
|---|---|---|
| 1 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ නිල නිවාස අළුත්වැඩියා කිරීම් | 39.67 |
| 2 | ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ නිවාස අළුත්වැඩියා කිරීම් | 117.67 |

**ii. ආයතනයේ මූල්‍ය ප්‍රගතිය (2024.01.01 සිට 2024.12.31 දක්වා)**

පුනරාවර්තන වියදම් - රු.මි. 740.62
ප්‍රාග්ධන වියදම් - රු.මි. 67.78

**iii. ආයතනයේ භෞතික ප්‍රගතිය**

**වගුව 3.67 : කෑගල්ල දිස්ත්‍රික්කය - ක්‍රියාත්මක ප්‍රාග්ධන අරමුදල්වල ප්‍රගතිය (2024.01.01 සිට 2024.12.31 දක්වා)**

| # | සංරචකය | අරමුදල් මූලාශ්‍රය | වැඩසටහන | ව්‍යාපෘති සංඛ්‍යාව | මුළු පිරිවැය රු.(මි) | වියදම රු.(මි) |
|---|---|---|---|---|---|---|
| 01. | විමධ්‍යගත අයවැය වැඩසටහන | දේශීයව | සංවර්ධන කටයුතු | 2681 | 446.19 | 446.19 |
| 02 | කඳුකර දශකය වැඩසටහන | | සංවර්ධන කටයුතු | 2502 | 969.48 | 969.48 |
| 03 | ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන | | ප්‍රාදේශීය සංවර්ධන විශේෂ වැඩසටහන | 437 | 44.25 | 44.25 |
| 04 | මාර්ග සංවර්ධනය | | ග්‍රාමීය මාර්ග සංවර්ධනය | 289 | 184.56 | 184.56 |
| 05 | සංචාරක වැඩසටහන | | සංචාරක ආකර්ශනිය ස්ථාන සංවර්ධනය හා යටිතල පහසුකම් සංවර්ධනය | 21 | 49.29 | 49.29 |
| 06 | විශේෂ සංවර්ධන ව්‍යාපෘති | | කෑගල්ල දිස්ත්‍රික්කයේ සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කිරීම | 475 | 316.078 | 316.078 |
| 07 | වතු ප්‍රජාවගේ යටිතල පහසුකම් වැඩි දියුනු කිරීම | | වතු යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම | 74 | 35.69 | 35.69 |
| 08 | කෘෂිකාර්මික | | වාණිජ දූරියන් වගාව අක්කර 12 ක් ඇති කිරීම | දූරියන් පැල 560 | 0.218 | 0.218 |

**පින්තූර 3.23 කැගල්ල දිස්ත්‍රික්කයේ ව්‍යාපෘති හා වැඩසටහන්**



ස්ථානය-   අරණායකප්‍රා.ලේ. කොට්ඨාශය
ජම්බුගස්මඩ ග්‍රාම නිලධාරි වසම
ව්‍යාපෘතියේ නම- ජම්බුගම්මඩ බුදුමැදුර අසල සිට මොරටිය හංසිය දක්වා ගමමැද (විකල්ප) මාර්ගය සංවර්ධනය කිරීමමුළු පිරිවැය-970,000.00
ව්‍යාපෘතිය - ආරම්භ කළ දිනය -2024.07.10
ව්‍යාපෘතිය -නිම කළ දිනය - 2024.07.24



ස්ථානය-වරකාපොල ප්‍රා.ලේ.කොට්ඨාශය
මාම්පිට වසම
ව්‍යාපෘතියේ නම - කොණ්ඩගල ග්‍රාම සංවර්ධන සමිති ශාලාව ස්වයං රැකියා පුහුණු මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමපිරිවැය- රු. රු 1,000,000.00
ආරම්භ කල දිනය-- 2024.07.17
නිම කළ දිනය - 2024.09.25



ස්ථානය-දැරණියගල ප්‍රා.ලේ.කො.
ස්ථානය. දෙහිගස්දෙනිය
ව්‍යාපෘතියේ නම - පුරන් කුඹුරු ආශ්‍රිත කිරවගා ව්‍යාපෘතිය පිරිවැය- රු. 150000/_
ආරම්භ කල දිනය-- 2024.03.21
නිම කළ දිනය - 2024.12.05

**iv.** රාජ්‍ය ආදායම් උපයා ගැනීමේ ව්‍යාපෘති

වගුව **3.68 :**  කැගල්ල දිස්ත්‍රික්කය **-** ආදායම් උපයා ගැනීම් **2024.01.01** සිට **2024.12.31** දක්වා

| අදායම් ශීර්ෂය | ආදායම (රු.මි) |
|---|---:|
| මුද්දර ගාස්තු | 0.096 |
| විභාග සහ අනෙකුත් ගාස්තු | 0.011, |
| ගොඩනැගිලි කුලී | 2.78 |
| වෙනත් ආදායම් | 57.33 |
| ඉඩම් හා අනෙකුත් බදු කුලී | 0.0008 |
| **මුළු එකතුව** | **60.2178** |

## හතරවෙනි පරිච්ඡේදය

# 04.රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

## 1 ආයතනික පැතිකඩ

### 1.1. හැඳින්වීම

වර්තමානයේ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව, ඉඩම් ලියාපදිංචි කිරීමේ අරමුණ පෙරදැරිව 1864 වර්ෂයේදී ස්ථාපිත කර ඇත. එහි ප්‍රධාන කාර්යාලය කොළඹ ද, ශාඛා කාර්යාල එනම්, ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාල ප්‍රධාන නගරවල ද පිහිටුවන ලදී. මේ කාර්යාල පිහිටුවීම මඟින් අපේක්ෂා කරනු ලැබුවේ මහජනතාවගේ ඉඩම් පිළිබඳ අයිතිය ලියාපදිංචි කිරීමයි. අයිතිය ලියාපදිංචි කිරීමට අවුරුදු ගණනාවක් ගතවන හෙයින්, අන්තර් කාලීන පියවරක් වශයෙන් ප්‍රථමයෙන්ම ඉඩම් සම්බන්ධ නීත්‍යානුකූල ලේඛන ලියාපදිංචි කිරීමේ ක්‍රමයක් ඇති කිරීමට විධිවිධාන යොදන ලදී. 1998 වර්ෂයේදී විධිමත් ලෙස ඉඩම්වල අයිතිය ලියාපදිංචි කිරීමේ අරමුණින් 1998 වර්ෂයේ අංක 21 දරණ ඉඩම් හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත බලාත්මක කරන ලදී.

1998 අංක 21 දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත මගින් අනුමත කළ ප්‍රතිපාදන මත හිමිකම් ලියාපදිංචි කටයුතු පරිගණක ආශ්‍රිතව සිදු කිරීම ආරම්භ කරන ලද්දේ 2003 වර්ෂයේදී ය. මිනින්දෝරු දෙපාර්තමේන්තුව, ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව, ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව සහ රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව ඒකාබද්ධව ආරම්භ කළ මෙම ක්‍රියාදාමයේ දෙපාර්තමේන්තුවේ කාර්යභාරය සඳහා තෝරාගත් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය ආශ්‍රිතව හිමිකම් ලියාපදිංචි කිරීමේ කාර්යාල ද ආරම්භ කරන ලදී.

සිවිල් ලියාපදිංචි කිරීමේ කටයුතු එනම් උප්පැන්න, විවාහ හා මරණ ලියාපදිංචි කිරීම දෙපාර්තමේන්තුවට පවරනු ලැබූයේ 1867 වසරේදී ය. මුල් කාලයේදී ශ්‍රී ලංකාවේ උප්පැන්න ලියාපදිංචි කිරීම පිළිබඳව වැඩි සැලකිල්ලක් දක්වා නොමැත. 1895 අංක 1 දරණ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීම පිළිබඳ ආඥා පනත සම්මත කිරීමත් සමඟ දෙපාර්තමේන්තුවේ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීම පිළිබඳ කාර්යයන් පුළුල් වූ අතර මේ වනවිට ශ්‍රී ලාංකික ජනතාවගේ සිවිල් අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ අරමුණ ඇතිව උප්පැන්න, විවාහ හා මරණ සහ දේපලවලට අදාළ නෛතික ලේඛන ලියාපදිංචි කිරීමේ කටයුතු සිදු කරනු ලැබේ.

1992 වර්ෂයේ දී, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල ඒකාබද්ධ කර පැවති දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් අංශය ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමට විමධ්‍යගත කරන ලදී. එහිදී කාර්යාලය භාරව රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත වගකිව යුතු අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයෙකු පත් කරන ලදී. එසේම දෙපාර්තමේන්තු කටයුතු පහසු කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරයා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයෙකු වශයෙන්ද අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල් වශයෙන් ද බලතල පවරන ලදී.

## 1.2. ආයතනයේ දැක්ම හා මෙහෙවර



දැක්ම

*මහජනතාවගේ සිවිල් අයිතිවාසිකම් , නිශ්චල සහ චංචල දේපලවල නීත්‍යානුකූල අයිතිය තහවුරු කරන ලිපි ලේඛන ලියාපදිංචිය, සංරක්ෂණය කිරීම සහ සහතික පිටපත් නිකුත් කිරීමේ ජනතා කේන්ද්‍රිය සේවා සම්පාදනයේ පෙර ගමන්කරු වශයෙන් කටයුතු කිරීම*



මෙහෙවර

*නිශ්චල හා චංචල දේපලවලට අදාළ නෛතික ලේඛන ලියාපදිංචි කිරීම සහ ශ්‍රී ලංකාවේ ඉඩම් හිමිකම් ලියාපදිංචි කිරීම සහ ජන ජීවිතයේ වැදගත් අවස්ථා වන විවාහ, උපත් සහ මරණ ලියාපදිංචි කිරීම, එම ලේඛන සංරක්ෂණය කිරීම සහ ඉල්ලීම මත ඒවායේ සහතික කරන ලද පිටපත් නිකුත් කිරීම සහ එමගින් ජනතාවට සිය අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට සහාය වීම*

## 1.3. ප්‍රමුඛ පරාසයන්

- පරිපාලනය සඳහා මානව සම්පත් කළමනාකරණය ***(පාලන/පුහුණු)***
- කාර්යක්ෂම හා ඵලදායී පරිපාලනය සඳහා අඛණ්ඩ යටිතල පහසුකම් සැපයීම ***(පාලන/ සැපයුම්)***
- පරිපාලනය සඳහා විනිවිද මූල්‍ය කළමනාකරණය***(ගිණුම්)***
- බහු ආංශික සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම***(සංවර්ධන)***
- සිවිල් අයිතිවාසිකම් තහවුරු කිරීම ***(සිවිල්)***
- නිශ්චල හා චංචල දේපලවල නීත්‍යානුකූල අයිතිය තහවුරු කිරීම***(නොතාරිස්)***
- නව තාක්ෂණය තුළින් මහජන සේවා පුළුල් කිරීම ***(තාක්ෂණ)***
- මූල්‍ය විගණනය***(අභ්‍යන්තර විගණන)***
- සංවර්ධන දර්ශක සඳහා දත්ත හා තොරතුරු ලබා දීම***(සංඛ්‍යාලේඛන)***

### 1.4. ආයතනයේ විෂය පථය

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් තුනකි.

1. නිශ්චල හා චංචල දේපලවලට අදාළ ලේඛන , ඇටෝර්නි බලපත්‍ර , නිශ්චල දේපලවලට අදාළ හිමිකම් හා සිවිල් ලියාපදිංචි කිරීම
2. භාරකාරත්වය සහ ලේඛන සංරක්ෂණය
3. සහතික පිටපත් නිකුත් කිරීම

## 2 ක්‍රියාකාරීත්වය

2.1 ලේඛන ලියාපදිංචි කිරීම

- නිශ්චල දේපලවලට අදාළ ලේඛන ලියාපදිංචි කිරීම
- චංචල දේපලවලට අදාළ ලේඛන ලියාපදිංචි කිරීම
- ඇටෝර්නි බලපත්‍ර ලියාපදිංචි කිරීම

2.2 හිමිකම් ලියාපදිංචි කිරීම

- නිශ්චල දේපලවලට අදාළ හිමිකම් ලියාපදිංචි කිරීම

2.3 සිවිල් ලියාපදිංචි කිරීම

- ශ්‍රී ලංකාව තුළ සිදු වන සියලුම විවාහ, උපත් හා මරණ ද, විදේශයන්හිදී සිදු වන ශ්‍රී ලාංකිකයන්ගේ විවාහ, උපත් සහ මරණ ලියාපදිංචි කිරීම.
- ළමයින් දරුකමට හදා ගැනීමේ අධිකරණ නියෝග ලියාපදිංචි කිරීම සහ එම ළමයින්ගේ උපත නැවත ලියාපදිංචි කිරීම.උඩරට විවාහ හා දික්කසාද ඉල්ලීම් මත තීරණ ගැනීම.
- උඩරට විවාහ හා දික්කසාද ලියාපදිංචි කිරීම.

2. භාරකාරත්වය සහ ලේඛන සංරක්ෂණය

- සිවිල් සහ ඉඩම් හා ලේඛන ලියාපදිංචියට අදාළ ලේඛන , නොතාරිස් ඔප්පු දෙවන පිටපත් හා සංරක්ෂණය කළ යුතු අනෙකුත් ලියවිලි හා ලේඛනවල භාරකාරත්වය සහ සංරක්ෂණය කිරීම.

3. සහතික පිටපත් නිකුත් කිරීම.

- සහතික පිටපත් නිකුත් කිරීමට නියමිත සියලු ලේඛනවල සහතික කළ පිටපත් එසේ ලබා ගැනීමට බලය ලත් පුද්ගලයින්ට නිකුත් කිරීම.

### අනුශාංගික ක්‍රියාකාරකම්

- විවාහ,උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර්වරුන් පත් කිරීම හා පාලනය
- නොතාරිස්වරුන් පත් කිරීම හා ඔවුන්ගේ පෞද්ගලික ලිපිගොනු පවත්වාගෙන යාම.
- ඔප්පු මත හා වෙනත් ලියවිලි මත නියමිත මුද්දර ගාස්තු ගෙවන බවට සහතික වීම.
- සහතික පිටපත්වල පරිවර්තන නිකුත් කිරීම.
- සංශෝධන කිරීම
- ජීව සංඛ්‍යාති වාර්තා ප්‍රකාශයට පත් කිරීම

## 3 විශේෂ ළඟා කර ගැනීම්

- සුහුරුපාය පරිශ්‍රයෙහි කන්සියුලර් අංශය පිහිටුවීම.
- ඉ-ඉඩම් ව්‍යාපෘතියට අදාළව 2024 වර්ෂයේ පළමු අදියරය තවත් කායීාල 10කට හා දෙවන අදියරය නියමු කායීාලවල ස්ථාපනය කිරීම.
- ඉ-ජනගහන ව්‍යාපෘතිය යටතේ කොළඹ දිස්ත්‍රික්කයේ හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ද ජාතික උප්පැන්න සහතිකය නිකුත් කිරීම ආරම්භ කිරීම.

## 4 අභියෝග

ඉ-ඉඩම් ව්‍යාපෘතිය

- ඉඩම් රෙජිස්ට්‍රාර් කායීාලවල කවුළු හා අනෙකුත් අංශ මෘදුකාංගය නිවැරදිව ස්ථාපනය කිරීමට උචිත පරිදි සකස් කර ගැනීම.
- ඉඩම් රෙජිස්ට්‍රාර් කාරයාලයන් පුරා නිසි පරිදි LGN සබඳතා සකස් කර ගැනීම.
- ඉඩම් රෙජිස්ට්‍රාර් කාරයාලයන් සුදුසු පරිදි ජාලගතකරණය කර ගැනීම.
- ඉඩම් රෙජිස්ට්‍රාර් කාරයාලයන්හි මූලික දත්ත සකස් කර ගැනීම.

- මෘදුකාංගයෙහි පළවන සහ දෙවන අදියරයන් ස්ථාපනය සඳහා අදාළ නිලධාරීන්ට පුහුණුව ලබා දීම.
- මෘදුකාංගය ස්ථාපනයට අදාළ යටිතල පහසුකම් සැපයීම.

ඉ-ජනගහන ව්‍යාපෘතිය

- දැනට අතින් ලියා නිකුත් කරන උප්පැන්න සහතිකය වෙනුවට ඉ-ජනගහන ලේඛන වැඩසටහන යටතේ නිකුත් කරන ජාතික උප්පැන්න සහතිකය සෑම පුද්ගලයෙකුටම නිකුත් කිරීමට හැකි පරිදි ක්‍රමවේදය සකස් කිරීම.
- සියළුම ප්‍රාදේශිය ලේකම් කාර්යාලයන්හි ස්ථාපිත කර ඇති දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් අංශයන්ට අවශ්‍ය භෞතික සම්පත් අවශ්‍ය අවම මට්ටමින්වත් සම්පූර්ණ කිරීම.
- තොරතුරු තාක්ෂණයට අදාලව භාවිතා කරන අන්තර්ජාල සම්බන්ධතාවයේ (LGN සම්බන්ධතාවය) ගැටළු පැවැතීම.
- දෙපාර්තමේන්තුව සඳහා Data backup and DR Site සකස් කර ගැනීම.
- ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි ස්ථාපිත කර ඇති දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් අංශයන්හි අතිරේක දිස්ත්‍රික් තනතුරේ පුරප්පාඩු පැවතීම.

ඉ-උ.වි.ම. ව්‍යාපෘතිය

- මාර්ගගතව උපත්, විවාහ හා මරණ සහතික ඉල්ලුම් කිරීමේ ක්‍රියාවලිය මහජනතාව අතර තවදුරටයත් ප්‍රචලිත කිරීම.
- නියමු ව්‍යාපෘතියක් ලෙස විදේශ දූත මණ්ඩල කාර්යාල 7 ක උපත්, විවාහ හා මරණ සහතික ඉල්ලුම් කිරීමේ දත්ත පද්ධතිය ස්ථාපනය කිරිම මගින් එරටේදීම ශ්‍රී ලාංකික ජනතාවට තම උපත්, විවාහ හා මරණ සහතික ඉල්ලුම් කිරීමේ හැකියාව ලබාදිම.

## 5 අනාගත ඉලක්ක

ඉ-ඉඩම් ව්‍යාපෘතිය

- මෘදුකාංගයෙහි පළවන අදියරය සථාපිත ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 9 හි මෘදුකාංගයේ දෙවන අදියරය ස්ථාපනය කිරීම.
- ඉඩම් රෙජිස්ට්‍රාර් කායීාල 41 ක පළවන අදියරය සහ දෙවන අදියරය ස්ථාපනය කිරීම.
- 2025 වර්ෂයේ මෘදුකාංගයෙහි 3වන අදියරය සකස් කර අවසන් කර ගැනීම.
- මෘදුකාංගය ස්ථාපනයට අවශ්‍ය යටිතල පහසුකම් ලබා ගැනීම.

ඉ-ජනගහන ව්‍යාපෘතිය

- දැනට නියමු ව්‍යාපෘති මගින් ක්‍රියාත්මක වන ජාතික උප්පැන්න සහතික නිකුත් කිරීමේ
- වැඩපිළිවෙල මුළු දිවයිනටම අදාලව ක්‍රියාත්මක කිරීම.
- ඉ-ජනගහන ලේඛන වැඩසටහන යටතේ දත්ත පද්ධතියෙන් මරණ ලියාපදිංචි කර ඒ තුළින් මරණ සහතිකය නිකුත් කිරීම.
- පළමු අදියර ලෙස විවාහ ලියාපදිංචි කිරීමට අදාල කටයුතු ඉ-ජනගහන ලේඛන වැඩසටහන් දත්ත පද්ධතිය තුළින් සිදු කර ගැනීම.
- ජනගහන ලේඛනයක් නිර්මාණය කර ඒ තුළින් යාවත්කාලීන පුරවැසි දත්ත හුවමාරු කර ගැනීමේ ක්‍රමවේදයක් සකස් කිරීම.

ඉඩම් හා ලේඛන ලියාපදිංචි කටයුතු

- නව තාක්ෂණය යොදා ගනිමින් ලේඛන ලියාපදිංචි කිරීමේ කටයුතු කාර්යක්ෂම කිරීම.
- නොතාරිස් දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම තුළින් මහජනතාවට නීත්‍යානුකූල නොතාරිස්වරයෙකු හඳුනා ගැනීමට සහය වීම.

සිවිල් ලියාපදිංචි කටයුතු

- ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටියදී මිය ගිය හමුදා සාමාජිකයින්ගේ මරණ ලියාපදිංචි ලේඛන දැනට පරිලෝකනය කර අවසන් කර ඇත.මෙලෙස පරිලෝකනය අවසන් කරන සහතික 19,900 ක දත්ත පද්ධතියට ඇතුළත් කර ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් මරණ සහතික ලබාදීමට කටයුතු කිරීම.
- ජාතික උප්පැන්න සහතික නිකුත් කිරීම සියලුම දිස්ත්‍රික්කයන් ආවරණය වන පරිදි දියත්කර ප්‍රාදේශීය කාර්යාල මගින් නිකුත් කිරීමට සැලසුම් කිරීම.
- රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ අත්පොතෙහි සිවිල් ලියාපදිංචියට අදාළ කාණ්ඩයන් සංශෝධනය

අවසන්කර ඇති බැවින් දමිළ පරිවර්ථනයේ පරිච්ඡේද අවසන් පරිච්ඡේද දෙක ලැබීමෙන් පසු මුද්‍රණය කර නිකුත් කිරීමට අපේක්ෂිතය.

- රෙජිස්ට්‍රාර්වරුන්ගේ පෞද්ගලික ලිපි ගොනු සම්බන්ධ පියවරයන් මාර්ග ගත ක්‍රමවේදයක් යටතේ සිදුකිරීමට මෘදුකාංගයක් සැකසීම.
- විවාහ, උපත් සහ මරණ සහතික පරිවර්තනය කිරීම සඳහා මෘදුකාංගයක් සැකසීම.
- රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ අත්පොතෙහි සිවිල් ලියාපදිංචියට අදාළ කාණ්ඩයන් භාෂා තුනෙන්ම ඉ- පොතක් ලෙස දෙපාර්තමේන්තු වෙබ් අඩවියට මුදා හැරීම.
- සියලුම ලේඛනගාර ස්වයංක්‍රීය පද්ධතියක් යටතේ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ක්‍රමවේද සැකසීම.
- සිවිල් ලියාපදිංචියට අදාළ පනත් සංශෝධනය කිරීමට පියවර ගැනීම.

I. 1951අංක 17 දරණ උප්පැන්න මරණ ලියාපදිංචි කිරීමේ පනත

II. 1907 අංක 19 දරණ සාමාන්‍ය විවාහ ලියාපදිංචි කිරීමේ ආඥා පනත

III. 1952 අංක 44 දරණ උඩරට විවාහ හා දික්කසාද පනත

IV. 1951 අංක 13 දරණ මුස්ලිම් විවාහ දික්කසාද පනත

V. 1941 අංක 24 දරණ ළමයින් දරුකමට හදාගැනීමේ පනත

VI. 1981 අංක 04 දරණ කොන්සල් කර්තව්‍ය පනත

VII. 2016 අංක 16 දරණ මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) සංශෝධන පනත

VIII. 2010 අංක 19 දරණ මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) පනත

## 6 සමුච්චිත මූල්‍ය ප්‍රගතිය

### පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් හි ප්‍රගතිය 2024.12.31 දිනට




| විස්තරය | රු. මි. | % |
|---|---|---|
| ශුද්ධ ප්‍රතිපාදන (01,02) | 3,890 | |
| මුළු වියදම | 3,652 | 94% |
| **ඉතිරි ප්‍රතිපාදන** | **238** | **14%** |




| විස්තරය | රු.මි. | % |
|---|---|---|
| ශුද්ධ ප්‍රතිපාදන (01,02) | 415 | |
| මුළු වියදම | 313 | 76% |
| ඉතිරි ප්‍රතිපාදන | **102** | **24%** |

## 7 භෞතික ප්‍රගතිය

### 7.1. පාලන අංශය

#### 7.1.1. සංවර්ධන හා පුහුණු ඒකකය

<u>ගොඩනැඟිලි අලුත්වැඩියා සහ පුනුරුත්ථාපන</u>

- ප්‍රධාන කාර්යාලයේ රියදුරු විවේකාගාරය ඉදි කිරීම, විදුලි පද්ධතිය අලුත්වැඩියා කිරීම, රාක්ක සවි කිරීම හා අභ්‍යන්තර බෙදා වෙන් කිරීම් සිදු කිරීම ප්‍රධාන කාර්යාලයේ සැපයුම් අංශයේ පවතින කාමර වෙන් කිරීම හා රාක්ක සවි කිරීම, පස්වන මහලේ සිට වතුර ටැංකිය සුද්ධ කිරීම සඳහා බිත්ති ඉණිමඟක් සවි කිරීම, ගිණුම් අංශයේ රාක්ක සවි කිරීම, 6වන මහලේ අභ්‍යන්තර බෙදා වෙන් කිරීම, 6වන මහලේ ජනෙල් වා කවුළු දැමීම, රියදුරු විවේකාගාරය අසල interlock ඇල්ලීම.




*ප්‍රධාන කාර්යාලයේ අභ්‍යන්තර බෙදා වෙන් කිරීම් කටයුතු*

- සුහුරුපාය පරිශ්‍රයෙහි මධ්‍යම ලේඛනාගාරයේ කන්සියුලර් අංශය පිහිටුවීම



*සුහුරුපාය පරිශ්‍රයෙහි මධ්‍යම ලේඛනාගාරයේ කන්සියුලර් අංශය පිහිටුවීම*

- මඩකලපුව ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අභ්‍යන්තර බෙදා වෙන් කිරීම්,රාක්ක සවි කිරීම
- උතුරු පළාත් ලේඛනාගාරය ස්ථාපිත කිරීම
- මීගමුව ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ වහලය අලුත්වැඩියාව, සේවාලාභීන්ට රැඳී සිටිය හැකි පරිදි පරිශ්‍රය සැකසීම, මුදල් කවුළුවේ සිට ආලින්දය අවසන් වන තෙක් වැසි ආවරණයක් සැකසීම, වට තාප්පයේ පැති දෙකක් සම්පූර්ණයෙන් පිළිසකර කිරීම



*ප්‍රධාන කාර්යාලයේ රියදුරු විවේකාගාරය ඉදි කිරීම*



*ඇල්පිටිය ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අලුත්වැඩියා කටයුතු*



*මඩකලපුව ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අභ්‍යන්තර බෙදා වෙන් කිරීම් සහ රාක්ක සවි කිරීම*

- වයඹ උතුරු මැද කලාප කාර්යාලයේ රාක්ක ස්ථාපිත කිරීම, රාක්ක ප්‍රතිසංස්කරණය කිරීම
- කළුතර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ජනේලවල කැඩී ඇති අගුළු පිළිසකර කිරීම හා දිරාපත්ව ඇති ජනෙල් කණු පිළිසකර කිරීම
- මාළිගාවත්ත මධ්‍යම ලේඛනාගාරයේ අත්වැටවල් සකස් කිරීම
- පානදුර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ පිටුපස තාප්පයට ආරක්ෂිත වැටක් සැකසීම

- ගාල්ල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ විදුලි පද්ධතිය, ඇලුමිනියම් දොර සහ වැසිකිළි පද්ධති නවීකරණය කිරීම
- ඇල්පිටිය නිල නිවසේ ඉදිරිපස වහලය,දොරවල් හා ජනෙල් පිළිසකර කිරීම තීන්ත ආලේප කිරීම
- ගම්පහ ස.රෙ.ජ කාර්යාලයේ ජල, විදුලි, වැසිකිළි අලුත්වැඩියා කිරීම
- මාතලේ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අලුත්වැඩියා කිරීම
- රත්නපුර දිස්ත්‍රික් සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයේ විදුලි වයර් යොදා ගනිමින් විදුලිය ලබා ගැනීම
- පොළොන්නරුව ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අභ්‍යන්තර බෙදා වෙන් කිරීම්
- අත්තනගල්ල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ඉඩකඩ වැඩි කර ගැනීම
- මධ්‍යම කලාප කාර්යාලයේ, පුත්තලම ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ සහ මාතලේ දිස්ත්‍රික් සහකාර රෙජිස්ට්‍රාර් කාර්යාලයේ තිර රෙදි දැමීම

- බදුල්ල ස.රෙ.ජ. කාර්යාලයේ හා ගාල්ල සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයේ අලුත්වැඩියා කටයුතු
- ගම්පොළ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ බිත්ති පිළිසකර කිරීම

<u>සේවක පුහුණු සහ ධාරිතා වර්ධනය</u>

- ඇටෝර්නි බලපත්‍ර ලියාපදිංචිය, ඔප්පුවක් ලියා අත්සන් කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු සහ ඉඩම් නීතිය, කන්සියුලර් පනත (විදේශ උපත්/විවාහ/මරණ) ලියාපදිංචිය, දරුකමට හදා ගැනීම පිළිබඳ පනත හා උපත් නැවත ලියාපදිංචි කිරීම, අතුරුදහන්වූවන්ගේ මරණ ලියාපදිංචිය, අතුරුදහන්වූවන්ගේ මරණ ලියාපදිංචිය හා දරුකමට හදා ගැනීම(දෙමළ මාධ්‍යය), මරණ ලියාපදිංචි කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන්
-



ප්‍රසම්පාදනය පිළිබඳ දෙදින පුහුණු වැඩසටහන

- රාජකාරි ආවරණ කටයුතු සිදු කරන නවක ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් සඳහා ව්‍යවස්ථාපිත කරුණු පිළිබඳ පුහුණු වැඩසටහන
- කල් ගත වූ උපත් ලියාපදිංචි කිරීම සම්බන්ධ පුහුණු වැඩසටහන
- විශේෂ ඇටෝර්නි බලපත්‍ර ලියාපදිංචි කිරීම, උප්පැන්න මරණ ආඥා පනත, ලේඛන ලියාපදිංචි කිරීම, නොතාරිස් ආඥා පනත, විවාහ ලියාපදිංචිය හා දරුකමට හදා ගැනීම හා පත්ඉරු නැවත ප්‍රතිෂ්ඨාපනය පිළිබඳ පුහුණු වැඩසටහන - දෙමළ මාධ්‍යය
- බස්නාහිර පළාත් ලේඛන ලියාපදිංචියෙහි නිරත සංවර්ධන නිලධාරීන්, කළමනාකාර සහකාර නිලධාරීන් සහ ලේඛන සහකාර නිලධාරීන් සඳහා ව්‍යවස්ථාපිත කරුණු පිළිබඳ පුහුණුව - අදියර 01
- තොරතුරු තාක්ෂණ නියෝජිතායතනය මඟින් පවත්වනු ලබනපරිගණක තාක්ෂණය හා ධාරිතා සංවර්ධනය පුහුණු වැඩසටහන සඳහා නිපුණතා මට්ටම තීරණය කිරීමේ පරීක්ෂණය
- රෙජිස්ට්‍රාර්වරුන් බඳවා ගැනීම පිළිබඳ පුහුණු වැඩසටහන
- ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ 35 වන වගන්තිය පිළිබඳ පුහුණු වැඩසටහන
- දෙමළ භාෂා පැය 150 භාෂා ප්‍රවීනතාවය
- ප්‍රසම්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන - අදියර 01, අදියර 02
- නොතාරිස් ආඥා පනතේ 31 වගන්තිය පිළිබඳ පුහුණු වැඩසටහන අදියර 01, 02
- බස්නාහිර පළාත් ලේඛන ලියාපදිංචියෙහි නිරත සංවර්ධන නිලධාරීන්, කළමනාකාර සේවා නිලධාරීන් සහ ලේඛන සහකාර නිලධාරීන් සඳහා ව්‍යවස්ථාපිත කරුණු පිළිබඳ පුහුණු වැඩසටහන - අදියර 02
- ලේකම් පරිචය සම්බන්ධ පුහුණු වැඩසටහන
- නවක පොත්බැඳුම්කරුවන් සඳහා දෙදින සේවාරම්භක පුහුණු වැඩසටහන - අදියර 01, අදියර 02
- ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල සහ සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලවල කවුළු රාජකාරී සිදු කරන නිලධාරීන් සඳහා නීති දැනුම හා මෘදු කුසලතා වර්ධනය කිරීමේ පුහුණු වැඩසටහන
- පශ්චාත් උපාධි පාඨමාලා වැඩසටහන්



*වයඹ උතුරුමැද පළාත් නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන*

- ලේඛන ලියාපදිංචි ආඥා පනත 36 -39 වගන්ති පිළිබඳ පුහුණු වැඩසටහන
- ඌව පළාත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවයේ නියුතු දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන අදියර 01, අදියර 02

- උතුරු හා නැගෙනහිර පළාත් නිලධාරීන් සඳහා ඉ - විද්‍යුත් දත්ත පද්ධති පිළිබඳ පුහුණු වැඩසටහන - දෙමළ මාධ්‍ය
- උතුරු පළාතේ ලේඛන ලියාපදිංචියෙහි නිරත නිලධාරීන් සඳහා ව්‍යවස්ථාපිත කරුණු පිළිබඳ පුහුණු වැඩසටහන - දෙමළ මාධ්‍යය
- දකුණු පළාත්, මධ්‍යම පළාත් හා ඌව සබරගමුව කලාපයේ නිලධාරීන් සඳහා ඉ - විද්‍යුත් දත්ත පද්ධති පිළිබඳ පුහුණු වැඩසටහන
- වයඹ පළාතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවයේ නියුතු දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන අදියර 01, අදියර 02
- සබරගමුව පළාත් පුහුණු වැඩසටහන (රත්නපුර, කෑගල්ල දිස්ත්‍රික්ක) අදියර 01
- ග්‍රාමීය රෙජිස්ට්‍රාර්වරුන් බඳවා ගැනීම පිළිබඳ පුහුණු වැඩසටහන
- වයඹ පළාත් පුහුණුව (පුත්තලම දිස්ත්‍රික්කය) අදියර 01, අදියර 02
- ඇඹිලිපිටිය ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ විගණිත තොරතුරු පසුවිපරම් කිරීමේ පුහුණු වැඩසටහන
- කවුළු රාජකාරී සිදු කරන නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන අදියර 01,02
- උතුරුමැද පළාත් පුහුණුව අදියර 01, අදියර 02
- ICTA ආයතනය මගින් සිදු කරන පරිගණක පුහුණු වැඩසටහන
- කිළිනොච්චි, මන්නාරම හා වව්නියාව දිස්ත්‍රික්වල නිලධාරීන් සඳහා අභ්‍යන්තර විගණන පසු විපරම් පරීක්ෂණ පිළිබඳ පුහුණුව - දෙමළ මාධ්‍යය
- NAITA ආයතනය මගින් පොත්බැඳුම්කරුවන් සඳහා පවත්වන විභාගය - NVQ 03
- ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන අදියර 01, අදියර 02
- STFL ආයතනය මගින් පවත්වන ප්‍රසම්පාදන පුහුණු වැඩසටහන
- කවුළු රාජකාරී සිදු කරන නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන (සිංහල/දෙමළ මාධ්‍යය)
- ලේඛන ලියාපදිංචිය සහ පූර්වතාව, උඩරට විවාහ පනත, හිමිකම් පනත, සාමාන්‍ය විවාහ ලියාපදිංචි පනත, දරුකමට හදාගැනීමේ පනත, උපත් විවාහ මරණ සංශෝධනය, හිමිකම් පනත - දෙමළ මාධ්‍යය , මුස්ලිම් විවාහ හා දික්කසාද පනත, ලේඛන ලියාපදිංචිය හා නොතාරිස් ආඥා පනත - දෙමළ මාධ්‍යය, කන්සියුලර් පනත (විදේශ උපත්/විවාහ/මරණ) ලියාපදිංචිය, ලේඛන ලියාපදිංචිය හා සංශෝධනය පිළිබඳ පුහුණු වැඩසටහන්
- ලේඛන ලියාපදිංචි පනත හා ගැටළු සාකච්ඡා කිරීම
- මධ්‍යම පළාත් පුහුණු වැඩසටහන - අදියර 01, අදියර 02, අදියර 03 / 04
- දකුණු පළාත් පුහුණු වැඩසටහන - අදියර 01, අදියර 02
- කාර්යාල කාර්ය සහයක නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන - අදියර 01, අදියර 02
- Computer Society of Sri Lanka ආයතනය මගින් පැවැත්වූ තොරතුරු තාක්ෂණ සම්මන්ත්‍රණය
- තොරතුරු තාක්ෂණයට අදාළ භාණ්ඩ ප්‍රසම්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන
- ඌව පළාත් පුහුණු වැඩසටහන - අදියර 03
- කොළඹ, පුත්තලම, රත්නපුර හා කුරුණෑගල දිස්ත්‍රික් නිලධාරීන් සඳහා ඉ-ජනගහන පද්ධතිය පිළිබඳ පුහුණු වැඩසටහන
- දිස්ත්‍රික් නිලධාරීන් සඳහා ඉ-ජනගහන පද්ධතිය පිළිබඳ පුහුණු වැඩසටහන





*ඇඹිලිපිටිය නායකත්ව පුහුණු මධ්‍යස්ථානයේ පැවති ධාරිතා වර්ධන වැඩසටහන*

- ආයතන සංග්‍රහය සහ ප්‍රසම්පාදනය, ලිපිගොනුකරණය, භාණ්ඩ සමීක්ෂණය පිළිබඳ පුහුණු වැඩසටහන්
- හිමිකම් පුහුණුව මධ්‍යම/සබරගමුව හා ඌව පළාත් පුහුණු වැඩසටහන
- ඇඹිලිපිටිය නායකත්ව සංවර්ධන පුහුණු මධ්‍යස්ථානයේ පැවති රෙජිස්ට්‍රාර් ජනරාල් සේවයේ නිලධාරීන් සඳහා ව්‍යවස්ථාපිත කරුණු හා ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහ




*මධ්‍යම පළාත් නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන*

### 7.1.2 තොරතුරු තාක්ෂණ ඒකකය

- **ICTA Cloud අවකාශය තුල ස්ථාපිත කර ඇති සියළුම දත්ත පද්ධති දෙපාර්තමේන්තුව තුල ස්ථාපිත කිරීම. (Data Center for DR Site)**

| | |
|---|---|
| භෞතික ප්‍රගතිය | මේ වන විට ආයතනයක් තෝරා ගෙන අවසන් බැවින් ජනවාරි තුළ සුහුරුපාය යෙහි Data center ස්ථාපිත කිරිමට අපේක්ෂිතයි. |
| මූල්‍ය ප්‍රගතිය | රු. මිලිනය 50 (මෙතෙක් ගෙවීම් සිදු කර නොමැත) |

- **වෙබ් අඩවිය ප්‍රතිව්‍යුහගත කිරිම.**

| | |
|---|---|
| භෞතික ප්‍රගතිය | වෙබ් අඩවියේ නව සංවර්ධන ක්‍රියාවලියේ පළමු අදියර වූ මුල් පිටු මූලාකෘතිය (Home Page Prototype) අවසන් කර ඇත. එම මූලාකෘතිය හා අන්තර්ගතයන් වැඩිදියුණු කිරීම් කටයුතු සිදු කරමින් පවතී. |
| මූල්‍ය ප්‍රගතිය | රු. මිලිනයක් (මෙතෙක් ගෙවීම් සිදු කර නොමැත) |

- **EBMD මෘදුකාංග සංවර්ධනය**

| | |
|---|---|
| භෞතික ප්‍රගතිය | ව්‍යාපෘතියේ වැඩිදියුණු කිරිමේ යෝජනා වල තාක්ෂණික ලේඛන සකස් කරමින් පවතී. |
| මූල්‍ය ප්‍රගතිය | - |

- E-POP, EBMD, eTitle, eLand ව්‍යාපෘති සඳහා අවශ්‍ය තාක්ෂණික සහාය සහ කාලීන අවශ්‍යතා අනුව ඊට අදාල නව වැඩිදියුණු කිරිම් සිදු කිරීම අවස්ථානුකුලව තොරතුරු තාක්ෂණ ඒකකයෙන් සිදු කරනු ලැබේ.

| ව්‍යාපෘතියේ නම | EBMD |
|---|---|
| ස්ථානය | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව |
| ආරම්භක දිනය | ඔක්තෝම්බර් 2020 |
| නිමකළ දිනය | දෙසැම්බර් 2020 |

**අපේක්ෂිත අරමුණු**

- මහජනතාවට කඩිනමින් හා පහසුවෙන් උපත්, මරණ සහ විවාහ සහතික පිටපත් ලබා දීමේ ක්‍රමවේදයක් ඇති කිරීම.
- උපත්,මරණ සහ විවාහ ලේඛන සංරක්ෂණය සඳහා දත්ත පද්ධතියක් ඇති කිරීම.

## e-BMD Revamp ව්‍යාපෘතිය යටතේ නවීකරණය කරන ලද නව උපත්, විවාහ සහ මරණ සහතික නිකුත් කිරීමේ දත්ත පද්ධතිය







### eBMD ව්‍යාපෘතියේ ප්‍රගතිය

- 2021 වර්ෂය තුළ ආරම්භ වූ eBMD එක් දින සේවාව හා Online eBMD සේවාව මේ වන විට සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල ක්‍රියාත්මක වේ.
- 2021 වර්ෂයේ දී නව දත්ත පද්ධතිය සහ මෘදුකාංගය සැකසීමෙන් අනතුරුව උපත්, විවාහ සහ මරණ සහතිකපත් දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබා ගැනීමේ හැකියාව ඇත.
- eBMD පද්ධතිය මඟින් අයදුම්පතක් පිරවීමකින් තොරව පුද්ගලයින්ගේ විස්තර ඇතුළත් කර පිටපත් නිකුත් කිරීමේ සේවාව ද මේ වන විට ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල ක්‍රියාත්මක වේ.
- උපත්, විවාහ සහ මරණ සහතික ලබා ගැනීමේ දී නිකුත් කරන මුදල් ගෙවීමේ කුවිතාන්සිය(A86) වෙනුවට, SMS පණිවිඩයක් යැවීම තුළින් ජංගම

දුරකතනය වෙත FDF ආකෘතියට A86 ආකෘති පත්‍රය යොමු කිරීමේ පහසුකම වර් 2023ෂයේ දී දත්ත පද්ධතිය තුළ ස්ථාපනය කරන ලදී. මේ වන විට ඊට අදාල පුහුණු කිරීම් සිදු කරමින් පවතී. මෙම වර්ෂය අවසානය වන විට සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් A86 වෙනුවට Digital Receipt නිකුත් කිරීම ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරනු ඇත.

- Online eBMD වැඩසටහන යටතේ මහජනතාවට තමන්ගේ ජංගම දුරකතනය භාවිත කොට online ක්‍රමයට උපත්, විවාහ හා මරණ සහතික ඉල්ලුම් කිරීමේ පහසුකම ලබා දී මේ වන විට එය සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ක්‍රියාත්මක වේ .
- eBMD දත්ත පද්ධතිය සඳහා API පහසුකම ඇතුලත් කර තිබීම තුලින් උපත්, විවාහ සහ මරණ සහතික වල නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමේ පහසුකම අනෙකුත් රාජ්‍ය ආයතන වලටද ලබා දී ඇත. (උදා: ආගමන විගමන දෙපාර්තමේන්තුව, පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා පොලිසිය, බුද්ධි අංශය, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව සහ කම්කරු අමාත්‍යාංශය.)
- මහජනතාවට වඩාත් පහසුවෙන් දෙපාර්තමේන්තු සේවාව ලබා දීමටත්, සේවාව වඩාත් කාර්යක්ෂමව කිරීමටත්, ලිපි ද්‍රව්‍ය වියදම අවම කිරීම තුළින් රාජ්‍ය වියදම අඩු කිරීමේ අරමුණින් ඉහත සේවාවන් ආරම්භ කර ඇත.

## 7.2 නොතාරිස් අංශය

### 2024 වර්ෂයේ ලැබූ ප්‍රගතිය

- ඔප්පු ලියාපදිංචි කිරීමේ අත්පොත දෙමළ භාෂාවට පරිවර්ථනය කර ඇත.
- කේවියට් දැන්වීම් ලියාපදිංචි කිරීම සම්බන්ධව චක්‍රලේඛය නිකුත් කරන ලදී.
- සමථ චක්‍රලේඛය කෙටුම්පත් කර ඇත.

### මූල්‍ය ප්‍රගතිය (2024.01.01. සිට 2024.12.31 දක්වා)

| # | කාර්යය | ප්‍රමාණය | ආදායම (රු.) |
|---|---|---|---|
| 01 | නොතාරිස් නව බලපත්‍ර ලබා දීම | 577 | 1,731,000 |
| 02 | නොතාරිස් අතිරේක භාෂා බලපත්‍ර ලබා ගැනීම | 352 | 1,056,000 |
| 03 | නොතාරිස් කලාප මාරු කිරීම | 190 | 570,000 |
| 04 | ඇටෝර්නි බලපත්‍ර අවලංගු කිරීම | 413 | 248,000 |
| 05 | ඇටෝර්නි පරීක්ෂා කිරීමේ ගාස්තු | 26 | 15,600 |
| 06 | ඇටෝර්නි සහතික පිටපත් නිකුත් කිරීම<br>(සාමාන්‍ය)<br>(එක්දින) | <br>157<br>659 | <br>93,850<br>659,000 |
| 07 | උඩෘත පිටපත් නිකුත් කිරීම (සාමාන්‍ය)<br>(එක්දින) | 87<br>398 | 51,800<br>398,000 |
| 08 | වංචල දේපළ ලියාපදිංචිය | 256 | 337,860 |
| | **එකතුව** | | **5,161,110** |

**ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාල 50 ලේඛන ලියාපදිංචියෙන් ලද ආදායම (2024.01.01. සිට 2024.12.31 දක්වා)**

| අනු අංකය | ප්‍රධාන කාර්යයන් | සාමාන්‍ය සේවය | | එක්දින සේවය | |
|---|---|---|---|---|---|
| | | අයදුම්පත් සංඛ්‍යාව | ලද ආදායම (රු.) | අයදුම්පත් සංඛ්‍යාව | ලද ආදායම (රු.) |
| 01. | ලේඛන ලියාපදිංචිය | 915,438 | 105,541,914.00 | 160,297 | 134,780,300.00 |
| 02. | පත්‍රිඉරු නිකුත් කිරීම | 189,027 | 45,450,560.00 | 1,613,853 | 513,123,381.00 |
| 03. | ඔප්පු පිටපත් නිකුත් කිරීම | 82,689 | 54,125,419.00 | 141,806 | 153,897,185.00 |

**දිස්ත්‍රික් කාර්යාල 14 හි ලද ආදායම (2024.01.01. සිට 2024.12.31 දක්වා)**

| අනු අංකය | ප්‍රධාන කාර්යයන් | සාමාන්‍ය සේවය | | එක්දින සේවය | |
|---|---|---|---|---|---|
| | | අයදුම්පත් සංඛ්‍යාව | ලද ආදායම (රු.) | අයදුම්පත් සංඛ්‍යාව | ලද ආදායම (රු.) |
| 01. | ඇටර්නි බලපත්‍ර ලියාපදිංචිය | 28,929 | 52,699,909.00 | 27,249 | 67,810,636.00 |
| 02. | පත්‍රිඉරු පිටපත් නිකුත් කිරීම | 1,197 | 720,654.00 | 5,108 | 5,102,181.00 |
| 03. | ඇටර්නි පිටපත් නිකුත් කිරීම | 1,730 | 1,039,200.00 | 6,376 | 6,364,363.00 |

**කලාප කාර්යාලයන්හි ලද ආදායම (2024.01.01. සිට 2024.12.31 දක්වා)**

| අනු අංකය | ප්‍රධාන කාර්යයන් | සාමාන්‍ය සේවය | | එක්දින සේවය | |
|---|---|---|---|---|---|
| | | අයදුම්පත් සංඛ්‍යාව | ලද ආදායම (රු.) | අයදුම්පත් සංඛ්‍යාව | ලද ආදායම (රු.) |
| 01. | ඇටර්නි බලපත්‍ර ලියාපදිංචිය | 18,434 | 32,030,727.00 | 12,907 | 39,318,000.00 |
| 02. | පත්‍රිඉරු පිටපත් නිකුත් කිරීම | 914 | 554,181.00 | 2,481 | 2,466,109.00 |
| 03. | ඇටර්නි පිටපත් නිකුත් කිරීම | 2,572 | 1,601,672.00 | 3,529 | 3,506,400.00 |

### 7.2.1 හිමිකම් ඒකකය

හිමිකම් ලියාපදිංචිකිරීමේ වැඩසටහන දැනට හිමිකම් ලියාපදිංචි කිරීමේ කාර්යාල 31 ක ක්‍රියාත්මක වේ. ඉඩම් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන බිම්සවිය වැය ශීර්ෂය ( 122-2-3-4-2509 ) යටතේ මෙම වැඩසටහන සඳහා ප්‍රතිපාදන ලබා දෙනු ලබයි.

**හිමිකම් ලියාපදිංචි කිරීමේ ප්‍රගතිය**

- 2024 .01.01 සිට 2024.12.31 දක්වා ලියාපදිංචි කරන ලද උපලේඛන ප්‍රමාණය
  - රජය - 23,376
  - පුද්ගලික - 21,617
  - එකතුව - **44,993**
- ලියාපදිංචි කරන ලද පසුගනුදෙනු සංඛ්‍යාව - 72,676

<u>හිමිකම් ලියාපදිංචි කිරීමේ ආදායම</u>




* ලියාපදිංචි කිරීමේ කටයුතු පුළුල් වීම හා ගාස්තු සංශෝධනය මත 2023 වර්ෂයේ සිට

**ඉටු කළ කාර්යයන්**

**2024 වසරේ නව හිමිකම් කාර්යාල 06 ක් ස්ථාපිත කිරීමට නියමිතයි**

- කොළඹ/ඇඹිලිපිටිය/නාරම්මල/නිකවැරටිය/මඩකලපුව/අම්පාර/යාපනය/වව්නියාව/මුලතිව්/කිලිනොච්චිය/මන්නාරම/මතුගම
- නව හිමිකම් කාර්යාල 12 ආරම්භ කිරීම සඳහා මූලික න්‍යායාත්මක හා පුහුණු වැඩසටහන් පවත්වා ඇත.
- ප්‍රායෝගික පුහුණු සඳහා ආසන්නතම හිමිකම් රෙජිස්ට්‍රාර් කාර්යාලය වෙත නිලධාරීන් යොමු කර ඇත.
- නව කාර්යාල ආරම්භය සඳහා පරිගණක/කාර්යාල උපකරණ වැනි භෞතික සම්පත්ද එම කාර්යාල සඳහා ලබා දී ඇත.(මුද්‍රණ යන්ත්‍ර හැර)
- නව කාර්යාල ස්ථාපනයේදී අවශය (විශේෂයෙන් උතුරු/ නැගෙනහිර පළාත් වල) කාර්ය මණ්ඩල සපයා ගැනීමේ ගැටළු තව දුරටත් පවතී.

- **පුහුණු වැඩසටහන්**

හිමිකම් අංශයට අනුයුක්ත කරන ලද නවක නිලධාරීන් සඳහා ද, දකුණ/මධ්‍යම/ඌව සබරගමුව/වයඹ/උතුරු මැද /උතුරු/ නැගෙනහිර කලාපයන්හි හිමිකම් කාර්යාල වල කාර්යය මණ්ඩලය සඳහා ද පුහුණු වැඩසටහන් ද, ජාතික පුහුණු වැඩසටහනක් ද පවත්වා ඇත.



1.හිමිකම් ලියාපදිංචිය පිළිබඳ ජාතික පුහුණු වැඩසටහන - 1 ( ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය)







2.හිමිකම් ලියාපදිංචිය පිළිබඳ ජාතික පුහුණු වැඩසටහන - 2 (යාපනය - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය) (උතුරු/නැගෙනහිර කලාප වල නව හිමිකම් කාර්යාල සඳහා)



3.වයඹ/උතුරු මැද කලාපයේ හිමිකම් කාර්යාල සඳහා පුහුණු වැඩසටහන - (කුරුණෑගල)



4. දකුණු කලාප හිමිකම් කාර්යාල සඳහා පුහුණු වැඩසටහන ( ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය)

5.හිමිකම් ලියාපදිංචි කිරීමේ කාර්යාල වල නවක නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන (ප්‍රධාන කාර්යාලය)

6. මධ්‍යම/ඌව සබරගමුව කලාප වල හිමිකම් කාර්යාල සඳහා පුහුණු වැඩසටහන ( ඇඹිලිපිටිය - නායකත්ව පුහුණු මධ්‍යස්ථානය )

7. හිමිකම් කාර්යාල වල මෘදුකාංගය හරහා දිනපොත් රිසිට් පත මුද්‍රණය පිළිබඳ පුහුණු වැඩසටහන (ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය)

### මෘදුකාංගය සංවර්ධනය කිරීම

- 2000-2014 දක්වා ලියාපදිංචි කටයුතු ඉඩම් අමාත්‍යාංශයේ බිම්සවිය වැඩසටහන මඟින් නිර්මාණය කළ මෘදුකාංගය හරහා සිදු කර ඇත.
- 2014 - කොළඹ විශ්ව විද්‍යාලය මඟින් දත්ත පද්ධතිය සංවර්ධනය කරන ලදී.
- මෙම මෘදුකාංගය වඩා වැඩි දියුණු කර පද්ධතිය හරහා සැලසිය හැකි සේවාවන් පුළුල් කිරීමේ අරමුණින් මෘදුකාංගය සංවර්ධනය කිරීමට නියමිතය.
- එසේම ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මඟින් නිර්දේශිත “Online Digital Land Registry” ක්‍රමය ස්ථාපිත කිරීම සඳහා ද මෙම E - හිමිකම් ලියාපදිංචි කිරීමේ මෘදුකාංගය 2024 දෙසැම්බර් වන විට සංවර්ධනය කිරීමට යෝජනා කර ඇත.
- මෘදුකාංගය සංවර්ධනය කිරීම සම්බන්ධව පත් කරන ලද කමිටු නිර්දේශය අනුව, දිවයිනේ සියළුම හිමිකම් රෙජිස්ට්‍රාර්වරුන්ගේ අදහස් කලාප මට්ටමින් ලබාගෙන අවශ්‍යතාවය හඳුනාගන්නා ලදී.(2024 ජනවාරි -මාර්තු)
- හිමිකම් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලියට ඍජුවම දායක වන හිමිකම් රෙජිස්ට්‍රාර්වරු, අතිරේක හිමිකම් රෙජිස්ට්‍රාර්වරු සමඟ සාකච්ඡා කර පද්ධතියේ සංවර්ධනය කිරීමේ අවශ්‍යතාවය සකස් කරන ලදී. (2024 මාර්තු-මැයි)
- තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව ( 2024 මැයි-ජූලි )
- 2024.07.26 දින මෙම වාර්තාව ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා භාර දී ඇත.
- 2024.08. 12 දින අමාත්‍යාංශ මට්ටමේ උපදේශාත්මක ප්‍රසම්පාදන කමිටුවක් පත්කිරීම සඳහා අමාත්‍යාංශය වෙත යොමු කර ඇත.
- 2024,10.24 ඉහත අමාත්‍යාංශ උපදේශනාත්මක ප්‍රසම්පාදන කමිටුව පළමු වරට රැස් විය.
- මෙම පද්ධති සංවර්ධනය සඳහා මිලියන 60 ප්‍රතිපාදන ඉඩම් අමාත්‍යාංශය වෙතින් ලැබුණු නමුත් මේ වන තුරු ප්‍රසම්පාදන කටයුතු සම්පූර්ණ කිරීමට නොහැකි වී ඇත.

### පද්ධති සංවර්ධනය තුලින් අපේක්ෂිත ප්‍රතිලාභ

1. දැනට පද්ධතිය තව දුරටත් වැඩි දියුණු වීම
2. සංශෝධන සඳහා වැයවන කාලය අඩු වීම (සති 02 සිට දින 03 දක්වා)
3. ලේඛන ආශ්‍රයෙන් නිකුත් කරන පිටපත් වෙනුවට පද්ධතියෙන්ම ලබාගත් වඩා නිවැරදි විශ්වාසදායී පිටපත් නිකුත් කිරීමට හැකි වීම
4. ඒ තුලින් පිටපත් නිකුත් කිරීමට කාලය හා වැඩ පියවර අවම වීම නිසා ඉක්මන් සේවයක් ලබාදීමට හැකි වීම.

5. ලියාපදිංචියට ලැබෙන උපලේඛන / පසු ගණුදෙනු වැඩ නිම වූ වහාම පුද්ගලයා / ආයතනය දැනුවත් කළ හැකි වීම
6. හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව/ සර්වේයර් ජනරාල් දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධ වීම තුලින් කටයුතු කඩිනම් වීම
7. රජයේ මුද්දර බදු ආදායම නිවැරදිව, කඩිනමින් ගණනය කර ගැනීමට හැකිවීම
8. මාර්ගගත ක්‍රමයට සේවා සැපයීමට හැකිවීම
9. පුද්ගලයින් හිමිකම් කියන නිශ්චල දේපල තොරතුරු කඩිනමින් ලබා ගැනීමට හැකිවීම
10. අදාල අනෙකුත් ආයතන සමඟ දත්ත හුවමාරුවට පහසුකම් සැපයිය හැකි වීම

**හිමිකම් ලියාපදිංචි කිරීමේ බිම් සවිය වැඩසටහනට අදාල වැය ශීර්ෂය මඟින් ලැබුණු ප්‍රතිපාදන මඟින් 2024 වර්ෂයේදී සිදු කරන ලද අනෙකුත් වැඩ කටයුතු**

- ඇල්පිටිය හිමිකම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් අංශය වායුසමීකරණය කිරීම
- ඇල්පිටිය හිමිකම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් අංශය සඳහා තිර රෙදි යෙදීම
- නාරම්මල කාර්යාලයේ හිමිකම් අංශය අභ්‍යන්තර බෙදා වෙන් කිරීම් සිදු කිරීම/වායුසමීකරණය කිරීම
- අත්තනගල්ල හිමිකම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් අංශය තිර රෙදි යෙදීම
- හිමිකම් කාර්යාල සඳහා ස්ථාවර භාණ්ඩ ලබා දීම (දැනට ක්‍රියාත්මක වන කාර්යාල 31 ට අමතරව නව කාර්යාල 12 ක් වෙනුවෙන්)
  - පරිගණක ( Desktop / Laptop)
  - UPS උපාංග
  - Scanners
  - ඡායා පිටපත් යන්ත්‍ර
  - මුද්‍රණ යන්ත්‍ර ( හිමිකම් සහතික මුද්‍රණයට /රෙජිස්ට්‍රි මුද්‍රණයට) මෙතෙක් බෙදා හැර නොමැත
  - මාණ්ඩලික මේස/පුටු
  - ලිපිකරු මේස/පුටු
  - සේවා ලබා ගැනීමට පැමිණෙන මහජනතාව සඳහා පුටු
  - වානේ කබඩ්/ වානේ අල්මාරි
  - වානේ රාක්ක

**කාර්යයන් ඉටු කිරීමේදී මතුව ඇති ගැටළු :**

- අනුමත කාර්ය මණ්ඩලයක් නොමැති වීම
  - කාර්යය මණ්ඩලය සපයා ගැනීමේ අපහසුතා (විශේෂයෙන් උතුරු හා නැගෙනහිර)
- අන්තර්ජාල පහසුකම් වල ගැටළු (අවශ්‍ය තරම් access points නොමැති වීම)
  - ඉදිරියේදී සියලුම ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලවල හිමිකම් ලියාපදිංචිය ආරම්භ කිරීමට නියමිත බැවින් මේ සඳහා විසඳුමක් ලැබීම අත්‍යාවශ්‍ය වේ.
- පරිගණක මෘදුකාංගයක් හරහා ලියාපදිංචි කටයුතු සිදු කරන බැවින් කලාප මට්ටමින් හෝ තොරතුරු තාක්ෂණ නිලධාරීන්ගේ අවශ්‍යතාවයක් පැවතීම.

### 7.2.2. ඉ-ඉඩම් ඒකකය

- **ප්‍රමුඛ පරාසයන්** ඉ-ඉඩම් මෘදුකාංගයේ දෙවන අදියරය රාජකාරී අවසන් කර දෙපාර්තමේන්තුව වෙත ලබා ගැනීම
- **විෂය පථය** ඉඩම් රෙජිස්ට්‍රාර් කායීාල වෙත මෘදුකාංගයේ දෙවන කොටසෙහි පුහුණු අදියරය ස්ථාපිත කර අත්හදා බැලීම
- **විශේෂ ළගා කර ගැනීම්** 2024 වර්ෂයේ පළමු අදියරය තවත් කායීාල 10කට හා දෙවන අදියරය නියමු කායීාල වෙත ස්ථාපනය කිරීම.

### 2025 වර්ෂය සඳහා අපේක්ෂිත අයවැය යෝජනා (සාරාංශගතව)

| # | ව්‍යාපෘතියේ නම | ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.(මි) | 2025 අයවැයෙන් අපේක්ෂිත වෙන් කිරීම් රු.(මි) |
|---|---|---|---|
| 1 | ඉ-ඉඩම් ව්‍යාපෘතිය | 310 | උපකරණ - රු.(මි) 100<br>ලිපි ද්‍රව්‍ය - රු.(මි) 25<br>නඩත්තු හා සේවා - රු.(මි) 25<br>අනෙකුත් කටයුතු - රු.(මි) 10<br>පරිලෝකනය - රු.(මි) 150 |

### භෞතික ප්‍රගතිය (2024.01.01 සිට 2024.12.31 දක්වා)

- මෙම වසරේ මෘදුකාංගය ස්ථාපනය කල යුතු කාර්‍යාල 10න් බදුල්ල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්‍යාලය වෙත මෘදුකාංගය ස්ථාපනය කිරීම.
- මෙම වසරේ මෘදුකාංගය ස්ථාපනය කල යුතු කාර්‍යාල 10 හි මූලික දත්ත අදාළ කාර්යාල වලින් ලබා ගැනීම සහ ඒවා මෘදුකාංගයට ඇතුළත් කිරීම සඳහා අදාළ මෘදුකාංග සංවර්ධන ආයතනයට ලබා දීම.
- මෙම වසරේ පත්තිරු පරිලෝකනය කල යුතු ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 17හි පරිලෝකන කටයුතු අවසන් කිරීම.
- ඉ-ඉඩම් මෘදුකාංගයෙහි අදියර I හා අදියර II ට අදාල UAT පරීක්ෂාව සිදු කිරීම.

## 7.3 සිවිල් ලියාපදිංචි අංශය

### 2024 වර්ෂයට ප්‍රගතිය

- රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ සිවිල් ලියාපදිංචියට අදාළ වන 1907අංක 19 දරණ සාමාන්‍ය විවාහ අඥා පනත සහ 1951අංක 13 දරණ මුස්ලිම් විවාහ හා දික්කසාද පනත සංශෝධනය කිරීමට අවශ්‍ය පියවර ගැනීම.
- කොට්ඨාස රෙජිස්ට්‍රාර්වරුන්ගේ විනය කටයුතු විධිමත් කිරීම සඳහා විනය කාර්යය සංග්‍රහයක් සකස් කිරීමට පියවර ගැනීම.
- සිවිල් ලියාපදිංචිය හා සම්බන්ධ ආකෘති පත්‍ර යාවත්කාලීන කිරීමට අවශ්‍ය පියවර ගැනීම.
- සිවිල් ලියාපදිංචියට අදාළව මෙතෙක් නිකුත් කරන ලද සියලුම චක්‍රලේඛයන් ඇතුළත් කරමින් රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ අත්පොතෙහි III කාණ්ඩයේ සිට IX වන කාණ්ඩය දක්වා වූ කොටස් සංශෝධනය කොට අවසන් කර ඇති අතර එය දෙමළ පරිවර්තනයට යොමු කිරීම.
- ඉ-ජනගහන ව්‍යාපෘතිය යටතේ 2021 වර්ෂයේ සිට උපත ලද ළමුන් සඳහා ජාත්‍යන්තර ප්‍රමිතියකින් සහ ආරක්ෂිත උපාංගයන්ගෙන් සමන්විත ජාතික උප්පැන්න සහතිකය නිකුත් කිරීමට පියවර ගැනීම.
- මාර්ගගත ක්‍රමය ඔස්සේ උප්පැන්න, විවාහ හා මරණ සහතික පිටපත් නිකුත් කිරීම.
- සිවිල් ලියාපදිංචියට අදාළව විගණන විමසුම් වාර්තාවන් මඟින් යොමු කරනු ලබන නිරීක්ෂණ , නිර්දේශ හා යෝජනා මත පදනම්ව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි ස්ථාපිත දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් අංශ වෙත අවශ්‍ය උපදෙස් හා නියෝග ලබාදීම.

### කාර්යය ප්‍රගතිය (2024.12.31)

| | කාර්යය | මුළු ප්‍රමාණය | නිම කළ ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | ලියාපදිංචි දේවස්ථාන දෙපාර්තමේන්තුව යටතේ විවාහ කටයුතු සිදු කිරීම සඳහා ගැසට් කිරීම | 08 | 05 |
| 02 | දරු සහතික නිකුත් කිරීම (B149) ආකෘති පත්‍ර නිකුත් කිරීම) | 1,397 | 1,220 |
| 03 | අතුරුදහන් වූ පුද්ගලයන්ගේ මරණ සහතික සහ | 59 ( මරණ) | 59 ( මරණ) |

| | කාර්යය | මුළු ප්‍රමාණය | නිම කළ ප්‍රමාණය |
|---|---|---|---|
| | නොදුටු පුද්ගලයන්ගේ සහතික නිකුත් කිරීම | 380(නොදුටු සහතික) | 380(නොදුටු සහතික) |
| 04 | විදේශ ජාතිකයින් හා ශ්‍රී ලාංකිකයින් අතර වන විවාහ ලියාපදිංචිය සඳහා අනුමැතිය ලබා දීම | 1,673 | 1,659 |
| 05 | දික්කසාද නියත තීන්දු අනුව විවාහ ලේඛන මත දික්කසාද සටහන් කිරීම | 8,460 | 6,960 |

### මූල්‍ය ප්‍රගතිය (2024.01.01 – 2024.12.31)

| | කාර්යය | අයදුම්පත් ප්‍රමාණය | පිටපත් ප්‍රමාණය | ආදායම (රු) |
|---|---|---|---|---|
| 01. | උප්පැන්න, විවාහ හා මරණ සහතික ඉංග්‍රීසි භාෂාවට පරිවර්ථනය කිරීම - ප්‍රධාන කාර්යාලය | 17,715 | 28,824 | 17,294,400.00 |
| 02 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි උප්පැන්න, විවාහ හා මරණ සහතිකයන් ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කිරීම | 9,914 | 12,497 | 7,499,570.00 |
| 03. | සුහුරුපායෙහි ස්ථාපිත විවාහ, උප්පැන්න හා මරණ සහතික නිකුත් කිරීමේ කවුළුවට අදාළ ආදායම | 60,607 | 94,758 | 11,769,710.00 |
| 04. | සාමාන්‍ය සහ මාර්ගගත ක්‍රමය ඔස්සේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි විවාහ, උප්පැන්න හා මරණ සහතික පිටපත් නිකුත් කිරීම | 4,787,059 | 7,551,425 | 975,739,400.00 |
| 05. | ප්‍රකාශපත්‍ර මත කටයුතු කිරීම | 92,957 | | 5,595,111.00 |
| 06. | සාමාන්‍ය විවාහ ලියාපදිංචි කිරීම | 138,612 | | 23,559,980.00 |
| 07. | මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීම | 18,874 | | 4,940,230.00 |

### 7.3.1 ඉ-ජනගහණ ලේඛන වැඩසටහන

සිවිල් ලියාපදිංචි කිරීම සම්බන්ධ තොරතුරු හා යාවත්කාලීන තොරතුරු පරිගණක දත්ත පද්ධතියකට ඇතුළත් කර, ඒ තුළින් ආකර්ෂණීය, නිවැරදි, පිළිගැනීම වැඩි කඩිනම් ප්‍රතිචාර කේතයක් සහිත මුද්‍රිත සහතිකයක් ලබාදීම අරමුණු කරගෙන ඉ-ජනගහණ ලේඛන වැඩසටහන ආරම්භ කර ඇත. මෙහි විෂය පථය ලෙස

- උපත් ලියාපදිංචිය සහ ඒ හරහා සෑම උපතක් සඳහාම "මගේ අංකය " ලෙසින් ඒකීය අනන්‍යතාඅංකයක් ලබා දීම.
- දරුකමට හදා ගැනීම් ලියාපදිංචිය
- මරණ ලියාපදිංචිය
- විවාහ ලියාපදිංචිය
- උපත්/විවාහ/මරණ සහතිකවල සංශෝධන සිදු කිරීම.
- සහතික / වාර්තා නිකුත් කිරීම.
- ජනගහණ ලේඛනයට තොරතුරු ඇතුළත් කිරීම සහ යාවත්කාලීන කිරීම දැක්විය හැකිය.

මෙහිදී මුල් අදියර යටතේ උපත් ලියාපදිංචියට අදාලව පමණක් කටයුතු සිදු කරනු ලබන අතර ඒ යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක් (දෙහිවල, ගම්පහ, හඟුරන්කෙත, කුරුණෑගල, තමන්කඩුව සහ රත්නපුර) මුල් කරගනිමින් සජීවී දත්ත පද්ධතිය තුළ නියමු ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී. එසේම ප්‍රධාන දිස්ත්‍රික් නියමු ව්‍යාපෘතිය ලෙස කළුතර දිස්ත්‍රික්කයේ

2021.01.01 දින සිට සිදු වූ උපත්වලට අදාලව ජාතික උප්පැන්න සහතිකය නිකුත් කිරීමේ සමාරම්භක උත්සවය 2023.12.05 දින ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය අශෝක ප්‍රියන්ත මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදුව කළුතර දිස්ත්‍රික්කයේ ජාතික උප්පැන්න සහතිකය නිකුත් කිරීමේ කටයුතු මේ වන විට ආරම්භ කර ඇත.

මෙම වැඩසටහන යටතේ කොළඹ දිස්ත්‍රික්කයේ හෝමාගම, කඩුවෙල, මහරගම හා කැස්බෑව යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි ද ජාතික උප්පැන්න සහතිකය නිකුත් කිරිම ආරම්භ කරන ලදී.

### 7.4 සංඛ්‍යාලේඛන අංශය

| ක්‍රියාකාරකම් | කාර්යය නිමකිරීමට සැලසුම් කල දිනය | කාර්යය සම්පූර්ණකරන ලද දිනය | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|
| ලියාපදිංචි උපත් විවාහ සහ මරණ සංඛ්‍යාව ගනනය කිරීම 2023 | 2024.03.31 - 100% | 2024.03.31 | 100% නිම කර ඇත |
| ලියාපදිංචි උපත් විවාහ සහ මරණසංඛ්‍යාව ගනනය කිරීම 2024 | 2024.12.31 - 50% | සකසමින්පවතී. | 70% නිම කර ඇත |
| උපත් විවාහ සහ මරණ දත්ත ගොනුසැකසීම 2020 | 2024.12.31 - 100% | 2024.12.31 | සකස් කරන ලද අවසන් දත්ත ගොනු පරීක්ෂා කරමින් පවති. |
| උපත් විවාහ සහ මරණ දත්ත ගොනු සැකසීම 2021 | 2024.12.31 - 30% | සකසමින්පවතී. | 50% නිම කර ඇත - එවන ලද ගොනු වල දත්ත පරික්ෂා කිරීම සහ හිඟ දත්ත ගෙන්වා ගැනීම සිදුකරමින් පවති. |
| උපත් විවාහ සහ මරණ දත්ත ගොනු සැකසීම 2022 | 2024.12.31 - 100% | 2024.12.31 | සකස් කරන ලද අවසන් දත්ත ගොනු පරීක්ෂා කරමින් පවති. |
| උපත් විවාහ සහ මරණ දත්ත ගොනුසැකසීම 2023 | 2024.12.31 - 30% | සකසමින්පවතී. | 50% නිම කර ඇත - එවන ලද ගොනු වල දත්ත පරික්ෂා කිරීම සහ හිඟ දත්ත ගෙන්වා ගැනීම සිදුකරමින් පවති. |
| උපත්,විවාහ සහ මරණ දත්ත වගු සකස්කිරීම 2020 | 2024.12.31 - 75% | සකසමින්පවතී. | සකස් කරන ලද අවසන් දත්ත ගොනු/ දත්ත වගු පරික්ෂා කරමින් පවති. |
| උපත්, විවාහ සහ මරණ දත්ත වගුසකස් කිරීම 2022 | 2024.12.31 - 75% | සකසමින්පවතී. | සකස් කරන ලද අවසන් දත්ත ගොනු/ දත්ත වගු පරික්ෂා කරමින් පවති. |
| මරණයට හේතුව කේත කිරීම/ වාර්තාවසකස් කිරීම 2020 | 2024.12.31 - 100% | 2024.12.31 | කේත කිරීම අවසන් කර ඇති අතර (100%) සකස් කරන ලද අවසන් දත්ත ගොනු/දත්ත වගු පරික්ෂා කරමින් පවති. |
| මරණයට හේතුව කේත කිරීම/ වාර්තාවසකස් කිරීම 2021 | 2024.12.31 - 50% | සකසමින්පවතී. | මරණයට හේතුව කේත කිරීම - 50% නිම කර ඇත. |
| මරණයට හේතුව කේත කිරීම/ වාර්තාවසකස් කිරීම 2018 | 2024.12.31 - 30% | සකසමින්පවතී. | මරණයට හේතුව කේත කිරීම - 30% නිම කර ඇත. |
| තිරසර සංවර්ධන දර්ශක සකස් කිරීම 2020<br>දර්ශක අංක 3.1.1, 3.2.1, 3.2.2, 3.4.1, 3.7.2 | 2024.12.31 - 100% | 2024.12.31 | සකස් කරන ලද අවසන් දත්ත ගොනු/ දත්ත වගු පරික්ෂා කරමින් පවති. |
| මධ්‍ය වාර්ෂික ජනගහනය ඇස්තමේන්තුකිරීම 2024 | 2024.08.31 - 100% | 2024.08.31 | මධ්‍යවාර්ෂික ජනගහනය 2024 සැප්තැම්බර් මාසයේදී ප්‍රකාශයට පත් කර ඇත. |

## 8 ආදායම් උපයා ගැනීමේ ව්‍යාපෘති

### 254 වැය ශීර්ෂයට අදාළ ආදායම උපයා ගැනීම (2024.12.31)




| මුළු ආදායම 2024 දෙසැම්බර් 31 දක්වා | | | |
|---|---|---|---|
| රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ ආදායම | රු. මි. | | |
| | **2023** | **2024** | **වර්ධනය** |
| | 2,408.9 | 2,616.7 | 9 % |

| විස්තරය | 2023<br>රු. මි. | 2024<br>රු. මි. | % |
|---|---|---|---|
| ලියාපදිංචි කිරීමේ ආදායම | 2,400 | 2,612 | 9% |
| Land | 1,502 | 1,581 | 5 % |
| BMD | 898 | 1,031 | 15 % |
| නොතාරිස් ආදායම | 8.9 | 4.7 | -47% |
| **මුළු ආදායම** | **2,408.9** | **2,616.7** | **9%** |

# පළාත් සභා
# හා
# පළාත් පාලන
# අංශය

# පටුන


| | | පිටු අංකය |
|---|---|---|
| **1.** | **හැඳින්වීම** | 1 |
| **2.** | **සමස්ත මූල්‍ය ප්‍රගතිය** | 2 |
| **3.** | **දේශීය අරමුදල් මත ක්‍රියාත්මකවන වැඩසටහන් හා ව්‍යාපෘතිවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය** | 2-31 |
| 3.1. | සංවර්ධන අංශය | 2-5 |
| 3.2. | ජාතික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සහායක මධ්‍යස්ථානය | 5-7 |
| 3.3. | පළාත් සභා අංශය | 7-10 |
| 3.4. | පළාත් පාලන අංශය | 10-13 |
| 3.5. | නීති අංශය | 14-15 |
| 3.6. | පාලන හා පුහුණු අංශය | 15-19 |
| | • තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය | 20-23 |
| 3.7. | මූල්‍ය අංශය | 23-24 |
| 3.8. | වියදම් විමංසන අංශය | 24-26 |
| 3.9. | අභ්‍යන්තර විගනන අංශය | 26-28 |
| 3.10. | ක්‍රමසම්පාදන අංශය | 28-29 |
| 3.11. | ව්‍යාපෘති අධීක්ෂණ අංශය | 30-31 |
| **4.** | **විදේශීය අරමුදල් මත ක්‍රියාත්මකවන වැඩසටහන් හා ව්‍යාපෘතිවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය** | 31-41 |
| 4.1. | පුරනැගුම (අතිරේක ප්‍රතිපාදන) / පළාත් පාලන ආයතන වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතිය | 31 |
| 4.2. | ග්‍රාමීය පාලම් ව්‍යාපෘතිය (අදියර V) | 32 |
| 4.3. | මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය (GCWMP) | 33 |
| 4.4. | මහ කොළඹ ජල හා අපද්‍රව්‍ය ජල කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන (GCWWIIMP) | 34 |
| 4.5. | නැඟී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය (RIDEP) | 35-36 |
| 4.6. | ප්‍රවාහන සම්බන්ධතා සහ වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය | 36-37 |
| 4.7. | ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධති සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය (PSSP) | 37-39 |
| 4.8. | ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය (LDSP) | 39-40 |
| 4.9. | සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ (GEM) ව්‍යාපෘතිය | 40-41 |
| **5.** | **දේශීය ණය සහ සංවර්ධන අරමුදල (LLDF)** | 42-45 |
| **6.** | **පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය (SLILG)** | 45-49 |
| **7.** | **2025 වසරේදී ක්‍රියාත්මක කිරීමට යෝජිත ඉදිරි සැලසුම්** | 49-56 |

# 1. හැඳින්වීම

## 1.1. ආයතනයේ දැක්ම, මෙහෙවර

### 1.1.1. දැක්ම

පළාත් සහ ප්‍රාදේශීය ආණ්ඩුකරණයක් සඳහා බලගැන්වීම

### 1.1.2. මෙහෙවර

ජනතා හිතවාදී නීතිරීති හා ප්‍රතිපත්ති සම්පාදනය මඟින් හා නූතන තාක්ෂණයේ සහාය ඇතිව දේශීය සම්පත් පූර්ණ උපයෝජනයට ලක් කරමින් විනිවිදභාවයෙන් හා වග වීමෙන් කටයුතු කිරීම සඳහා පළාත් සභා හා පළාත් පාලන ආයතනවලට මඟපෙන්වීම සහ සහායවීම

## 1.2. පැවරී ඇති කාර්යයන් හා කර්තව්‍යයන්

2024.11.25 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කරන ලද නව අමාත්‍යාංශවල කාර්යයන් හා කර්තව්‍යයන් පිළිබඳ නිවේදනයට අනුව පළාත් සභා සහ පළාත් පාලන අංශයේ කාර්යයන් හා කර්තව්‍යයන්.

I. පළාත් සභාවලට අදාළ කටයුතු නියාමනය කිරීම.

II. පළාත් සභා හා පළාත් පාලන ආයතන පරිපාලනයෙහි සෑම මානයක් සම්බන්ධයෙන්ම පර්යේෂණ පැවැත්වීම.

III. පළාත් සභා හා පළාත් පාලන ආයතනවල අඩු පහසුකම් සහිත ක්ෂේත්‍ර/ අංශ හඳුනාගෙන අදාළ පහසුකම් ලබා දීම සඳහා විශේෂ ව්‍යාපෘති සැලසුම් කර ක්‍රියාත්මක කිරීම.

IV. පළාත් සභාවල මන්ත්‍රීවරුන්, නිලධාරීන් හා සේවකයින් පුහුණු කිරීම.

V. පළාත් පාලන ආයතනවලට අදාළ රජයේ කර්තව්‍යයන්.

VI. පොදු පහසුකම් සංවර්ධනය සඳහා පළාත් පාලන ආයතනවලට ණය පහසුකම් ලබා දීම.

VII. පළාත් පාලන ආයතනයන්හි මන්ත්‍රීවරුන් නිලධාරීන් හා සේවකයින් පුහුණු කිරීම.

## 1.3. පළාත් සභා සහ පළාත් පාලන අංශය යටතේ පවතින අංශ

1. රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන නියෝජ්‍ය අමාත්‍ය කාර්යාලය
2. ලේකම් කාර්යාලය
3. පාලන හා පුහුණු අංශය
   i. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඒකකය
4. පළාත් සභා අංශය
5. පළාත් පාලන අංශය
6. සංවර්ධන අංශය
7. ව්‍යාපෘති අධීක්ෂණ අංශය
8. ක්‍රමසම්පාදන අංශය
9. නීති අංශය
10. මූල්‍ය අංශය
11. වියදම් විමංසන අංශය
12. අභ්‍යන්තර විගණන අංශය
13. ජාතික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සහායක මධ්‍යස්ථානය
14. පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය
15. දේශීය ණය සහ සංවර්ධන අරමුදල

## 2. සමස්ත මූල්‍ය ප්‍රගතිය
## (2024.01.01 සිට 2024.12.31 දක්වා)

රු.

| වැඩසටහන | 2024 සංශෝධිත අයවැය ඇස්තමේන්තුව | 2024.12.31 දක්වා මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|
| **පුනරාවර්තන වියදම්** | **354,000,000** | **280,410,703** |
| පුද්ගල පඩිනඩි | 172,000,000 | 158,194,395 |
| වෙනත් පුනරාවර්තන වියදම් | | |
| මෙහෙයුම් | 166,000,000 | 114,853,994 |
| සංවර්ධන | 16,000,000 | 7,362,314 |
| **ප්‍රාග්ධන වියදම්** | **32,310,000,000** | **14,107,552,503** |
| මෙහෙයුම් | 88,000,000 | 42,345,518 |
| සංවර්ධන | | |
| වෙනත් ප්‍රාග්ධන වියදම් | 1,009,164,882 | 992,895,362 |
| දේශීය සංවර්ධන ව්‍යාපෘති | 1,520,960,317 | 686,895,186 |
| විදේශීය ආධාර ලබන සංවර්ධන ව්‍යාපෘති | 29,691,874,801 | 12,385,416,437 |
| **මුළු එකතුව** | **32,664,000,000** | **14,387,963,206** |

**පළාත් සභා සඳහා දායකත්වය** රු.

| වැඩසටහන | 2024 අයවැය ඇස්තමේන්තුව | 2024.12.31 දක්වා මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|
| **ප්‍රාග්ධන වියදම්** | **8,600,000,000** | **8,271,207,620** |
| විදේශීය ආධාර ලබන සංවර්ධන ව්‍යාපෘති | 8,600,000,000 | 8,271,207,620 |
| **මුළු එකතුව** | **8,600,000,000** | **8,271,207,620** |

## 3. දේශීය අරමුදල් මත ක්‍රියාත්මකවන වැඩසටහන් හා ව්‍යාපෘතිවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය (2024.01.01 සිට 2024.12.31 දක්වා)

### 3.1. සංවර්ධන අංශය

**1. අරමුණ**

පළාත් පාලන ආයතන බල ප්‍රදේශවල ජීවත් වන ප්‍රජාවන්ට එම ආයතනවලින් ප්‍රතිලාභ සැලසෙන පරිදි යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා දේශීය අරමුදල් යෙදවීම තුළින් මහජන සේවා සම්පාදනය කාර්යක්ෂම හා ඵලදායී කිරීම සහ ඒ මඟින් අන්තර් පළාත් විෂමතා අවම කිරීමට දායකත්වය ලබා දීම.

**<u>2. ක්‍රියාත්මක කරන ප්‍රධාන සංවර්ධන වැඩසටහන්</u>**

1. පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ වැඩසටහන (ප්‍රාග්ධන)
2. ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන (පුනරාවර්තන)
3. බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ 2009 සිට 2014 දක්වා වන හිඟ බිල්පත් නිරවුල් කිරීම.

- **ඉටු කරනු ලබන අනෙකුත් කාර්යයන්**

පළාත් පාලන ආයතන වල පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම සඳහා පහත කටයුතු සිදු කිරීම.

1. පළාත් පාලන ආයතනවලට අදාල වන පරිදි සංශෝධිත පුරවැසි ප්‍රඥප්තිය හඳුන්වා දීම.
2. පුරවැසි ප්‍රඥප්තිය ඇතුලත් මාර්ගෝපදේශ අත්පොත මුද්‍රණය කිරීමට කටයුතු සිදු කිරීම.

## 3. 2024.01.01 සිට 2024.12.31 දක්වා කාර්ය සාධනය

| අනු අංකය | වැඩසටහන | 2024 වර්ෂය සඳහා ප්‍රතිපාදනය (රු.) | 2024.12.31 දිනට වියදම (රු.) | මූල්‍ය ප්‍රගතිය | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| 1 | පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ වැඩසටහන (ප්‍රාග්ධන) | 384,125,199.00 | 194,533,208.89 | 51% | 98% |
| 2 | ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන (පුනරාවර්තන) | 16,000,000.00 | 7,362,313.99 | 46% | 100% |
| 3 | බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ හිඟ බිල්පත් නිරවුල් කිරීම | 972,039,928.69 | 972,039,928.69 | 100% | 100% |
| | **එකතුව** | **1,372,165,127.69** | **1,173,935,451.57** | **86%** | **99%** |

එක් එක් ප්‍රධාන සංවර්ධන වැඩසටහන් යටතේ 2024.12.31 දින වන විට ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

### 1. පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ වැඩසටහන (ප්‍රාග්ධන)

2024 වර්ෂය සඳහා වෙන් වු රු. මි. 384.12 ක ප්‍රතිපාදනය පහත පරිදි යොදවා ගැනීමට කටයුතු කර ඇත.

- 2021 වර්ෂයේ අනුමත කර අර්ධ වශයෙන් නිම කර ඇති ව්‍යාපෘති අතරින් 40% ට වැඩි භෞතික ප්‍රගතියක් පෙන්වා ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන වෙන් කරන ලදී.
- 2023 වර්ෂයේ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව මඟින් ලබා දුන් උපදෙස් පරිදි ක්‍රියාත්මක කල ආදාහනාගාර හා පොදු වැසිකිළි වලට අදාල ව්‍යාපෘතිවල ඉතිරි වැඩ අවසන් කිරීමට ප්‍රතිපාදන වෙන් කරන ලදි.
- 2024 වර්ෂය සඳහා ඉදිරිපත් වී ඇති අත්‍යවශ්‍ය නව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ප්‍රතිපාදන වෙන් කරන ලදි.

මෙම වැඩසටහනට අදාළව 2023 වර්ෂයේ අවිච්ඡේද කල ව්‍යාපෘති 07 ක් සහ 2024 වර්ෂයේ නව ව්‍යාපෘති 85 ක් ක්‍රියාත්මක කිරීම සඳහා අනුමත කළ අතර 2024 වර්ෂයේ ක්‍රියාත්මක කල මුළු ව්‍යාපෘති ගණන 92 ක් වේ. එයින් ව්‍යාපෘති 76 ක වැඩ 2024.12.31 දින වන විට අවසන් කිරීමට හැකි විය. තවත් ව්‍යාපෘති 06 ක වැඩ අවසන් අදියරේ පවතී. වසර අග රටෙහි පැවති අයහපත් කාලගුණික තත්ත්වය හා අධික වර්ෂාව හේතුවෙන් ඉතිරි ව්‍යාපෘති 10 ඉදිකිරීමේ කටයුතු සිදු කිරීමට නොහැකි වී ඇත.

| 2024 ප්‍රතිපාදන (රු.) | 2024.12.31 දිනට මුළු වියදම (රු.) | මූල්‍ය ප්‍රගතිය (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|
| 384,125,199.00 | 194,533,208.89 | 51% | 98% |



නෙළුව ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාර ගොඩනැගිල්ල ඉදිකිරීම සහ බාහිර කටයුතු
නෙළුව ප්‍රා.ස - දකුණු පළාත



කරමැටිය සතිපොළ සඳහා කඩ කාමර ඉදි කිරීම
මීගහකිවුල ප්‍රා.ස - ඌව පළාත

**2. ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන (පුනරාවර්තන)**

2024 වර්ෂය සඳහා වෙන් වූ රු. මි. 16 ක ප්‍රතිපාදනය පහත පරිදි යොදවා ගැනීමට කටයුතු කර ඇත.

- 2023 වර්ෂයේ ක්‍රියාත්මක කල ව්‍යාපෘතිවල ඉතිරි වැඩ අවසන් කිරීමට ප්‍රතිපාදන වෙන් කරන ලදී.
- ප්‍රාදේශීය සභාවල දෛනික රාජකාරි කටයුතු කර්යක්ෂමව පවත්වා ගෙන යාමට අවශ්‍ය කරන අත්‍යවශ්‍ය අළුත්වැඩියා හා නඩත්තු කටයුතු සිදු කිරීම සඳහා ප්‍රතිපාදන වෙන් කරන ලදී.

මෙම වැඩසටහනට අදාළව 2023 වර්ෂයේ අවිච්ඡේද කල ව්‍යාපෘති 02 ක් සහ 2024 වර්ෂයේ නව ව්‍යාපෘති 17 ක් ක්‍රියාත්මක කිරීම සඳහා අනුමත කළ අතර 2024 වර්ෂයේ ක්‍රියාත්මක කල මුළු ව්‍යාපෘති ගණන 19 ක් වේ. එයින් ව්‍යාපෘති 16 ක වැඩ 2024.12.31 දින වන විට අවසන් කිරීමට හැකි වූ අතර එක් ව්‍යාපෘතියක් අවලංගු කිරීමට සිදු විය. වසර අග රටෙහි පැවති අයහපත් කාලගුණික තත්ත්වය හා අධික වර්ෂාව හේතුවෙන් ඉතිරි ව්‍යාපෘති 2 ක්‍රියාත්මක කිරීමට නොහැකි වි ඇත.

| 2024 ප්‍රතිපාදන (රු.) | 2024.12.31 දිනට මුළු වියදම (රු.) | මූල්‍ය ප්‍රගතිය (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|
| 16,000,000.00 | 7,362,313.99 | 46% | 100% |



රෝලර් යන්ත්‍රය අලුත්වැඩියා කිරීම
ලුණුගම්වෙහෙර ප්‍රා.ස - දකුණු පළාත



කලවාන ප්‍රාදේශීය සභා කාර්යාල ගොඩනැගිල්ල සහ වාහන නැවතුම් අංගනය අළුත්වැඩියා කිරීම
කලවාන ප්‍රා.ස - සබරගමුව පළාත

**3. බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ හිඟ බිල්පත් නිරවුල් කිරිම**

බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ 2009-2014 කාලය තුල ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සඳහා ගෙවිය යුතුව පවතින හිඟ බිල්පත් ගෙවීම සිදු කර ඇත.

| 2024 ප්‍රතිපාදන (රු.) | 2024.12.31 දිනට මුළු වියදම (රු.) | මූල්‍ය ප්‍රගතිය (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|
| 972,039,928.69 | 972,039,928.69 | 100% | 100% |

4. **පළාත් පාලන ආයතනවල කාර්යය සාධනය ඉහල නැංවීම සඳහා වන කාර්ය පටිපාටි සහ පුරවැසි ප්‍රඥප්තිය සකස් කිරීම**

- අමාත්‍යාංශය, පළාත් පාලන ආයතන ධාරිතා සංවර්ධන ව්‍යාපෘතිය (CDLG), තෝරා ගත් පළාත් පාලන ආයතනවල විවිධ විෂයයන්ට අදාල නිලධාරින් හා පළාත් පාලන ක්ෂේත්‍රයට අදාල විද්වතුන් සම්බන්ධ කර ගනිමින් වැඩමුළු පවත්වා වඩාත් වැදගත් අංශ 30 ක් සඳහා කාර්ය පටිපාටි සකස් කරන ලදි.
- පුරවැසි ප්‍රඥප්තිය ඇතුලත් මාර්ගෝපදේශ අත්පොත් මුද්‍රණය කිරීම.

| පළාත් පාලන ආයතනය | භාෂාව | මුද්‍රණය කර ඇති පොත් ප්‍රමාණය |
|---|---|---|
| මහා නගර සභා/ නගර සභා/ ප්‍රාදේශිය සභා | සිංහල | 530 |
| | දෙමළ | 280 |

## 3.2. ජාතික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සහායක මධ්‍යස්ථානය

### 1. අරමුණ

පළාත් පාලන ආයතනයන්හි අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම ඵලදායී ලෙස ඉටුකර ගැනීම සඳහා සහාය වන තාක්ෂණික හස්තය වශයෙන් ක්‍රියාත්මක වෙමින් සාර්ථක ක්‍රම පිළිබඳව තොරතුරු විසුරුවා හැරීමත්, විශේෂිත ස්ථාන සඳහා සුදුසු කසළ කළමනාකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ මග පෙන්වීම.

### 2. ප්‍රධාන කාර්යයන්

1. ජාතික කසල කළමනාකරණ ප්‍රතිපත්තිය අනුව ඉදිරි සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් පාලන ආයතන යොමු කිරීම.
2. පළාත් පාලන ආයතන සඳහා නාගරික ඝන අපද්‍රව්‍ය කළමනාකරණයට අදාළ වන සුදුසු ව්‍යාපෘති හඳුනාගෙන ක්‍රියාත්මක කිරීම.
3. වැඩ අවසන් ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිවල බිල්පත් නිරවුල් කිරීම සහ පසුවිපරම් කිරීම
4. අපද්‍රව්‍ය කළමනාකරණ දත්ත පද්ධතියක් ස්ථාපනය කර යාවත්කාලීන කිරීම
5. සියළුම පළාත් පාලන ආයතනවල 3R ක්‍රමවේදය ස්ථාපිත කිරීමට අවශ්‍ය උපදෙස් මගපෙන්වීම් ලබාදීම.
6. පළාත් පාලන ආයතනවල පවත්වාගෙන යන කොම්පෝස්ට් අංගනවල නිෂ්පාදන ධාරිතාවය සහ කොම්පෝස්ට් අලෙවිය ඉහළ නැංවීම සඳහා කටයුතු කිරීම.
7. පළාත් පාලන ආයතනවල ප්‍රතිචක්‍රීකරණය කළ හැකි කසළ කළමනාකරණය විධිමත් කිරීම.
8. පළාත් මට්ටමේ අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රධාන සැලැස්ම සකස්කිරීම සඳහා මාර්ගෝපදේශ සංග්‍රහයක් සකස් කිරීම සහ තෝරාගත් පළාත් දෙකක අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රධාන සැලසුම් සකස් කිරීම.
9. පළාත් පාලන ආයතනවල ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු සාර්ථක කරගැනීම සඳහා දේශීය, විදේශීය රාජ්‍ය නොවන සංවිධාන සමග සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම.
10. අපද්‍රව්‍ය කළමනාකරණයට සම්බන්ධ සෙසු පාර්ශවකාර ආයතන විසින් සංවිධානය කරනු ලබන වැඩමුළු, සාකච්ඡා සඳහා සක්‍රීය දායකත්වය දැක්වීම.
11. පළාත් පාලන ආයතනවල ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ක්ෂේත්‍රයේ සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ ධාරිතා වර්ධනය සඳහා පුහුණු අවස්ථා ලබාදීම.
12. වෙරළ ආශ්‍රිතව ජනනය වන කසළ බැහැර කිරීම පිණිස ක්‍රමවේද හඳුනා ගැනීම
13. පවතින කසළ කඳු පුනරුත්ථාපනය කිරීම සහ නව කසළ කඳු ඇතිවීම වළක්වා ගැනීම පිණිස ක්‍රියාමාර්ග ගැනීමට පළාත් පාලන ආයතන යොමු කිරීම.
14. USAID ආධාර යටතේ දිවයිනේ සියලුම පළාත් පාලන ආයතනවල අපද්‍රව්‍ය කළමනාකරණය ශ්‍රේණිගත කිරීමේ ක්‍රමවේදය සකස් කිරීම

**3. 2024.01.01 සිට 2024.12.31 දක්වා කාර්යසාධනය**

2024 වර්ෂය සඳහා ජාතික ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ සහායක මධ්‍යස්ථානය වෙත ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන් වෙනුවෙන් පහත වැය විෂයන් යටතේ ප්‍රතිපාදන වෙන් කර ඇත.

| අ.අ. | ව්‍යාපෘතියේ නම | 2024 ප්‍රතිපාදන (රු.) | 2024.12.31 දිනට වියදම (රු.) | භෞතික ප්‍රගතිය (%) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|
| 1 | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය (130-2-21-016-2504) | 150,000,000.00 | රු. 23,250,028.40 | 88% | 15.5% |
| 2 | පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීම - අපද්‍රව්‍ය කළමනාකරණය සහ ප්‍රාදේශීය සභාවල යටිතල පහසුකම් සංවර්ධනය (130-2-21-019-2202) | 136,835,117.83 | 15,022,099.43 | 64.4% **සටහන I** | 10.9% |
| 3 | Waste to Value ව්‍යාපෘතිය (130-2-21-026-2504) | 275,000,000.00 | 35,000,000.00 (2024.10.31 ප්‍රගතිය) | 100% | 13% |
| | **එකතුව** | **561,835,117.83** | **78,697,673.42** | **84.1%** | **14.3%** |

**සටහන I :** 130-2-21-019-2202 යටතේ ප්‍රතිපාදන වෙන්වූයේ 2021 වර්ෂයේ අයවැය යෝජනා මඟින් ක්‍රියාත්මක වූ වැඩ අවසන් නොකළ ව්‍යාපෘතිවල භාවිතයට ගැනීමට හැකිවන පරිදි අත්‍යවශ්‍ය ඉතිරි වැඩ කොටස් සම්පූර්ණ කිරීම සඳහාය. එසේම එම වැඩ අවසන් නොවූ ව්‍යාපෘති තෝරා ගැනීම මහා භාණ්ඩාගාරයේ එකඟතාවය ඇතිව සිදු කරන ලෙස උපදෙස් ලබා දී තිබුණි. වැඩ අවසන් කිරීම සඳහා තෝරාගත් ව්‍යාපෘතිවලට අදාළ පෙර ගිවිසුම් අහෝසිකර නොතිබීම හේතුවෙන් මහා භාණ්ඩාගාරයේ අවශ්‍ය එකඟතාවය ලබාගැනීම ප්‍රමාද විය. ඉන්පසු ඉතිරි ප්‍රතිපාදන සඳහා අඩු ආදායම්ලාභී පළාත් පාලන ආයතනවල ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානවල සිදුකළයුතු අත්‍යවශ්‍ය නවීකරණ සහ අලුත්වැඩියාවන් සඳහා තෝරාගත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් කාලයක් නොමැති විය.

ඉහත වැඩසටහන් අතරින් වැය විෂය 130-2-21-016-2504 යටතේ ප්‍රතිපාදන සලසා ඇති ව්‍යාපෘති අතරින් පහත සඳහන් ව්‍යාපෘතිවල වැඩ අවසන් කර ඇත.

1. වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ කොම්පෝස්ට් අංගනය ඉදි කිරීම
2. ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ වැසිකිළිය ඉදි කිරීම
3. ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ කොම්පෝස්ට් නිෂ්පාදන ගොඩනැගිල්ල ඉදි කිරීම
4. ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ කාර්යාල විවේකාගාරය ඉදි කිරීම
5. පන්නල ප්‍රාදේශීය සභාවේ මළ අපද්‍රව්‍ය ප්‍රතිකර්ම පද්ධතිය ඉදි කිරීම
6. කොලොන්න ප්‍රාදේශීය සභාවේ නොදිරන ගබඩා මධ්‍යස්ථානයක් ඉදි කිරීම

මීට අමතරව ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සහයක මධ්‍යස්ථානය විසින් පහත වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී.

1. KOICA ආධාර යටතේ බදුල්ල, වවුනියාව යන දිස්ත්‍රික්ක සඳහා ඒකාබද්ධ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘති ස්ථාපිත කිරීම සඳහා වූ ව්‍යාපෘතියේ ද්විපාර්ශ්වික ගිවිසුම අත්සන් කිරීම.

2. JICA ආධාර යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිත මළ අපජල පිරිපහදු පද්ධති මඟින් ඉවත් කරන පාංශු කළමනාකරණය කිරීමේ ව්‍යාපෘතියෙහි ගිවිසුම අත්සන් කිරීම.

3. පළාත් මට්ටමෙන් සිදු කරනු ලබන ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධ ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම සහ ඇගයීම සඳහා එක් එක් පළාතේ පැවැත්වීමට සූදානම් කර ඇති වැඩසටහන් නැගෙනහිර, දකුණු, වයඹ, සබරගමුව, ඌව පළාත්වල පවත්වා අවසන් කිරීම.

4. පළාත් පාලන ආයතනවලින් නිපදවනු ලබන කොම්පෝස්ට් පොහොරවල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා එක් එක් පළාත්වල කොම්පෝස්ට් අංගන සහිත පළාත් පාලන ආයතනවල සේවක මහත්ම මහත්මීන් සඳහා පුහුණු වැඩමුළු සංවිධානය කරන ලද අතර මේ වන විට උතුරුමැද, සබරගමුව, මධ්‍යම, වයඹ, ඌව, බස්නාහිර පළාත්වල වැඩමුළු පවත්වා ඇත.

5. දිවයිනේ සියලුම පළාත් පාලන ආයතනවල නාගරික ඝන අපද්‍රව්‍ය කළමනාකරණය ශ්‍රේණිගත කිරීම සඳහා ATLAS මෙවලම භාවිතය සම්බන්ධයෙන් පළාත් විනිශ්චය මණ්ඩල දැනුවත් කිරීමේ වැඩසටහන් පළාත් 09හිම පවත්වා අවසන් කිරීම.

## 3.3. පළාත් සභා අංශය

### 1. අරමුණ

පළාත් සභාවල ක්‍රියාකාරිත්වයට පහසුකම් සැලසීම, මධ්‍යම රජය හා පළාත් සභා අතර සම්බන්ධීකරණය හා පළාත් සභාවල මානව සම්පත් සංවර්ධනය මඟින් ඵලදායී හා කාර්යක්ෂම පළාත් සභා ක්‍රමයක් ඇති කිරීම.



ද්‍රව්‍ය ප්‍රතිසාධන මධ්‍යස්ථානය පළාත් පාලන ආයතන වෙත භාර දීම - කැස්බෑව



ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ ප්ලාස්ටික් හා පෙට් බෝතල් එක් රැස් කිරීම සඳහා විශේෂ දැල් උපකරණ ලබා දීම



පන්නල ප්‍රාදේශීය සභාවේ ගලි අපද්‍රව්‍ය පිරිපහදු කිරීමේ මධ්‍යස්ථානය ඉදිකිරීම

### 2. ප්‍රධාන කාර්යයන්

1. මධ්‍යම රජය හා පළාත් සභා අතර විධිමත් සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් ගොඩනැගීම සඳහා පළාත් ප්‍රධාන ලේකම්වරුන් හා මධ්‍යම රජයේ ආයතන සම්බන්ධ කර ගනිමින් අන්තර් පළාත් විෂය සම්බන්ධීකරණ සමුළුව පැවැත්වීම.

2. පළාත් සභා හා පළාත් පාලන ආයතන සඳහා ඉඩම් අත්පත් කරගැනීම.

3. පළාත් සභා සඳහා අවශ්‍ය වන අමාත්‍ය මණ්ඩල සංදේශ සකස් කිරීම.

4. පළාත් රාජ්‍ය සේවයේ වයස අවුරුදු 45 ඉක්මවා පත්වීම් ලබා දී ඇති නිලධාරින් සඳහා විශ්‍රාම වැටුප් හිමිකම ලබා දීම සඳහා කටයුතු කිරීම.

5. කළමනාකරණ සේවා චක්‍රලේඛ 03/2014 අනුව පළාත් රාජ්‍ය සේවයේ නව තනතුරු ඇති කිරීම.

6. සංශෝධිත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99 යටතේ පළාත් සභාවල විශ්‍රාමික නිලධාරීන් වෙත වාහන බලපත්‍ර නිකුත් කිරීම.

7. පළාත් පාලන ආයතනවල අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කිරීම සඳහා කටයුතු කිරීම.

8. පළාත් පාලන ආයතනවල GIS සහ GPS පද්ධතිය භාවිතා කරමින් භූගෝලීය දත්ත පද්ධතියක් නිර්මාණය කිරීම.

9. පළාත් සභාවල කටයුතුවලට අදාලව ලැබෙන පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා පිළිතුරු සකස් කර පාර්ලිමේන්තුවට යොමු කිරීම.

10. පළාත් සභාවල කටයුතුවලට අදාලව උපදේශක කාරක සභා වෙතින් ලැබෙන ලිපි සඳහා පිළිතුරු යොමු කිරීම.

11. පළාත් සභාවල කටයුතුවලට අදාලව මහජන පෙත්සම් කාරක සභාව වෙතින් ලැබෙන ලිපි සඳහා පිළිතුරු සකස් කර පාර්ලිමේන්තුවට යොමු කිරීම.

12. පළාත් සභා සඳහා වාහන මිලදී ගැනීම සම්බන්ධව කටයුතු කිරීම.

13. පළාත් සභාවන්වල කටයුතුවලට අදාලව ජනාධිපති කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය, අනෙකුත් අමාත්‍යාංශ, ආයතන සහ මහජනතාව විසින් යොමු කරනු ලැබු පැමිණිලි සම්බන්ධව කටයුතු කිරීම.

14. පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ අධීක්ෂණ හා මෙහෙයුම් කටයුතු සිදු කිරීම.

15. පළාත් සභා ධුරධාරීන් හා නිලධාරීන් සම්බන්ධ කරගත හැකි තොරතුරු කාර්තුමය වශයෙන් යාවත්කාලීන කිරීම.

16. කාර්ය මණ්ඩල සමාලෝචනය පිළිබඳව පළාත් මට්ටමින් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

**3. 2024.01.01 සිට 2024.12.31 දක්වා කාර්යසාධනය**

1. ගරු පළාත් සභා සහ පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පළාත් ප්‍රධාන ලේකම්වරුන් සමඟ සාකච්ඡා වාර 02ක් පවත්වා ඇත.

2. ඉඩම් අත්කර ගැනීමට අදාලව සියළුම පළාත් වෙතින් ඉල්ලීම් 33ක් මෙම අමාත්‍යාංශය වෙත පළාත් ප්‍රධාන ලේකම්වරුන්ගේ නිර්දේශය සහිතව යොමු කර ඇති අතර, නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් 15ක් ඉදිරි කටයුතු සඳහා ඉඩම් අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. අඩුපාඩු සහිතව යොමු කර ඇති අයදුම්පත් 11ක් අඩුපාඩු සකස් කර නැවත යොමු කරන ලෙස පළාත් ප්‍රධාන ලේකම්වරුන් වෙත දැනුම් දී ඇති අතර ඉතිරි ඉල්ලීම් 07 ඉඩම් අමාත්‍යාංශය වෙත යොමු කිරීම සඳහා කටයුතු සිදු කරමින් පවතී.

   04 වන වගන්තිය ප්‍රකාරව විරෝධතා පරීක්ෂණ පැවැත්වීම සඳහා පළාත් ප්‍රධාන ලේකම්ගේ නිර්දේශ සහිතව නිලධාරීන් 04 දෙනෙකු පත් කිරීමද, විරෝධතා නොමැති බවට වු නිර්දේශ 04ක් ඉඩම් අමාත්‍යාංශයට යොමු කිරීම ද, විරෝධතා පරීක්ෂණ වාර්තා අනුව නිර්දේශ 04ක් ඉඩම් අමාත්‍යාංශය වෙත යොමු කිරීම ද, ඉඩම් අත්පත් අරමුණු සංශෝධනය කිරීම් 01ක් සඳහා නිර්දේශ ඉඩම් අමාත්‍යාංශය වෙත යොමු කිරීම ද, 38(අ) අතුරු විධානය යටතේ ඉඩම් අත්කර ගැනීමට අදාලව ඉඩම් අමාත්‍යාංශයට නිර්දේශ 06ක් ඉදිරිපත් කිරීමද 50(1) වගන්තිය යටතේ අත්හැරීම් 02ක් ද සිදු කර ඇත.

3. පළාත් සභා සඳහා අවශ්‍ය වන අමාත්‍ය මණ්ඩල සංදේශ 03ක් සකස් කර අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත.

- පළාත් රාජ්‍ය සේවයේ වයස අවුරුදු හතලිස් පහෙන් (45) පසුව ස්ථිර පත්වී ලද විශ්‍රාම වැටුප් අහිමි සේවකයන් සඳහා විශ්‍රාම වැටුප් හිමිකම ලබා දීම සඳහා වූ අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කිරීම.

- පළාත් පාලන ආයතනවල සේවය කරනු ලබන තාවකාලික, අනියම්, ආදේශක, කොන්ත්‍රාත් සහ සහන පදනම මත බඳවාගත් සේවකයින් ස්ථිර කිරීම සඳහා වන අමාත්‍ය මණ්ඩල සංදේශය.

- පළාත් පාලන ආයතන සඳහා කළමනාකරණ සේවාවක් ස්ථාපිත කිරීමේ අමාත්‍ය මණ්ඩල තීරණය සංශෝධනය කිරීම සඳහා වූ අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කිරීම.

4. පළාත් රාජ්‍ය සේවයේ වයස අවුරුදු 45 ඉක්මවා පත්වීම් ලබා දී ඇති නිලධාරින් සඳහා විශ්‍රාම වැටුප් හිමිකම ලබා දීම සඳහා ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමිව ඇති අතර ඒ සම්බන්ධව සියලුම පළාත් දැනුවත් කිරීම සඳහා අදාල චක්‍රලේඛ ලිපිය පළාත් වෙත යොමු කර ඇත.

5. පළාත් පාලන ආයතනවල සේවය කරන 2023.08.29 දිනට දින 180ක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද තාවකාලික, අනියම්, ආදේශක, කොන්ත්‍රාත් සහ සහන පදනම මත බඳවාගෙන ඇති සේවකයින් 8,435කගේ සේවය ස්ථිර කිරීම සඳහා කටයුතු සිදුකර ඇති අතර, පළාත් පාලන ආයතන සඳහා දරන්නාට පෞද්ගලික වන සේ තනතුරු 2,542 ක් ඇති කිරීමට පළාත්වලින් ලද මු.රේ 71 අයදුම්පත් හා සාධාරණීකරන වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. (සබරගමුව පළාත 199, ඌව පළාත 337, නැගෙනහිර පළාත 873, මධ්‍යම පළාත 174, බස්නාහිර පළාත 587, වයඹ පළාත 372) දකුණු පළාතින් හා උතුරු මැද පළාතින් යොමු කර ඇති මු.රේ 71 අයදුම්පත් හා සාධාරණීකරන වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට කටයුතු කරමින් පවතී.

6. සංශෝධිත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99 යටතේ පළාත් සභාවල විශ්‍රාමික නිලධාරීන් වෙත වාහන බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධව පළාත් වලින් ලද අයදුම්පත් 178 අතරින් අඩුපාඩු සහිත අයදුම්පත් 20ක් නැවත පළාත් වෙත යොමු කල අතර නිවැරදි ලෙස යොමු කර ඇති අයදුම්පත් 171ක් (2023 වර්ෂය අවසානයේ ලද අයදුම්පත් 13ක් ද ඇතුලත්ව) නිර්දේශ කර වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.

7. අභ්‍යන්තර විගණන ඒකක පිහිටුවීමට අදාලව පළාත්වලින් ගෙන්වා ගන්නා ලද තොරතුරු 2023.06.28 දිනැතිව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලදී. එසේම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2024.01.17 දින නැවත පළාත්වලින් නිර්දේශ කැඳවා ඇත. ඒ අනුව මධ්‍යම, සබරගමුව, නැගෙනහිර, දකුණ යන පළාත්වල තොරතුරු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කරන අතර බස්නාහිර, වයඹ, ඌව, සබරගමුව, උතුර හා නැගෙනහිර පළාත්වල යටපත් කළ හැකි තනතුරු පෙන්වා දෙමින් නැවත නිර්දේශ එවන ලෙසට ප්‍රධාන ලේකම් වෙත නැවත ලිපි යවා ඇති අතර උතුරු මැද පළාත් සභාව තුල වෙනම අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කිරීම අනවශ්‍ය බව දන්වා ඇත.

8. පළාත් පාලන ආයතනවල GIS සහ GPS පද්ධතිය භාවිතා කරමින් භූගෝලීය දත්ත පද්ධතියක් නිර්මාණය කිරීමේ වැඩසටහන යටතේ වයඹ පළාත මේ වන විට එම පද්ධතිය නිර්මාණය කිරීමේ වැඩ අවසන් කර ඇති අතර, දකුණ , උතුරු මැද , ඌව , සබරගමුව , උතුර , බස්නාහිර යන පළාත් සිතියම්ගත කිරීමේ ක්‍රියාවලිය සිදු කරමින් පවතී. නැගෙනහිර හා මධ්‍යම යන පළාත්

ඉදිරියේදී මේ ක්‍රියාවලිය ආරම්භ කිරීමට නියමිතව ඇත.

9. පාර්ලිමේන්තුවෙන් යොමු කර ඇති පාර්ලිමේන්තු ප්‍රශ්න 03න් පාර්ලිමේන්තු ප්‍රශ්න 01ක් සඳහා පළාත් ප්‍රධාන ලේකම්වරුන්ගෙන් තොරතුරු ලබා ගෙන පිළිතුරු පාර්ලිමේන්තුව වෙත යොමු කර ඇති අතර, යොමු කල එක් ප්‍රශ්නයක් සාකච්ඡාව සඳහා නොගන්නා බව දැනුම් දුන් බැවින් ඒ සඳහා පිළිතුරු යොමු කර නොමැත. එක් ප්‍රශ්නයක් 2024 වසර අවසානයේ ලද අතර ඒ සඳහා පළාත් වෙතින් තොරතුරු කැඳවා ඇත.

10. උපදේශක කාරක සභා වෙත ඉදිරිපත් කර ඇති යෝජනා 03ක් සම්බන්ධව පළාත් ප්‍රධාන ලේකම්වරුන්ගෙන් තොරතුරු කැඳවීම සිදු කර ඇති අතර යෝජනා 02ක් සම්බන්ධව පිළිතුරු උපදේශක කාරක සභාව වෙත යොමු කර ඇති අතර ඉතිරි යෝජනාව සම්බන්ධව පළාතින් තොරතුරු ලද පසු උපදේශක කාරක සභාව වෙත පිළිතුරු යොමු කිරීමට කටයුතු කරනු ලබයි.

11. මහජන පෙත්සම් කාරක සභා ව විසින් එවා ඇති මහජන පෙත්සම් 09කට මෙම අමාත්‍යාංශයේ නිර්දේශය මහජන පෙත්සම් කාරක සභාව වෙත යොමු කර ඇත.

12. පළාත් සභා සඳහා අවශ්‍ය වාහන ලබා ගැනීම සම්බන්ධව පළාත් වෙතින් යොමු කල අයදුම් පත් 05ක් නිර්දේශ කර කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත අනුමැතිය සඳහා යොමු කර ඇත.

13. පළාත් සභාවන්වල කටයුතුවලට අදාලව ජනාධිපති කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය, අනෙකුත් අමාත්‍යාංශ ආයතන සහ මහජනතාව විසින් යොමු කරනු ලැබූ පැමිණිලි හා අභියාචනා 126ක් සම්බන්ධව අදාල පාර්ශව දැනුවත් කිරීමට කටයුතු කර ඇත.

14. පළාත් සභා ධුරධාරීන් හා නිලධාරීන් සම්බන්ධ කරගත හැකි තොරතුරු කාර්තුමය වශයෙන් යාවත්කාලීන කිරීම සිදු කර ඇත.

15. කාර්ය මණ්ඩල සමාලෝචනය පිළිබඳව පළාත් මට්ටමින් පුහුණු වැඩමුළු පැවැත්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලද අතර මේ වන විට වයඹ, දකුණු යන පළාත්වල වැඩසටහන් පවත්වා ඇත.

**3.4. පළාත් පාලන අංශය**

**1. අරමුණ**

ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන පද්ධතියේ කාර්ය සාධනය කළමනාකරණය කිරීම හා එහි කටයුතු නව තාක්ෂණයත් සමඟ එක් කිරීම මගින් සීග්‍ර සංවර්ධන දිශානතියකට යොමු කර වඩාත් මහජන හිතකාමී කාර්යක්ෂම පළාත් පාලන ආයතනයක් බිහිකිරීමට කටයුතු කිරීම.

**2. ප්‍රධාන කාර්යයන්**

1. පළාත් පාලන ආයතන පද්ධතියෙහි අවශ්‍යතා හඳුනා ගැනීම සහ ප්‍රතිපත්ති සම්පාදනය.

2. නව පළාත් පාලන ආයතන සංස්ථාපනය, සීමා මායිම් නිර්ණය කිරීම සහ ව්‍යුහය තීරණය කිරීමට අදාළ කටයුතු.

3. සහෝදර නගර/ මිතුරු නගර සංකල්පය යටතේ විදේශ රාජ්‍ය සමඟ ගිවිසුම්වලට එළඹීමේ දී අවශ්‍ය සහය ලබා දීම හා මාර්ගෝපදේශකත්වය ලබා දීම.

4. පළාත් පාලන ආයතන සඳහා අණපනත් හා නීති සම්බන්ධ අවශ්‍ය උපදෙස් හා මඟපෙන්වීම ලබා දීම.

5. රාජ්‍ය ගිණුම්කාරක සභා කටයුතු සඳහා පළාත් පාලන ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම හා සහභාගීත්වය.

6. පාර්ලිමේන්තු ප්‍රශ්න, මහජන පෙත්සම් කාරක සභාව හා උපදේශකකාරක සභාවලින් ඉදිරිපත් වන ගැටලු සඳහා පිළිතුරු ලබා දීම.

7. පළාත් පාලන ආයතන සඳහා තොරතුරු තාක්ෂණ විසඳුම් ලබා දීම.

8. පළාත් පාලන ආයතන සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ පිළිබඳව ප්‍රසම්පාදන කොමිෂන් සභාව වෙත කෙටුම්පත් ඉදිරිපත් කිරීම.

9. පළාත් පාලන ආයතන සඳහා කාර්ය සාධන මෙවලම හඳුන්වා දී ඒ අනුව පළාත් පාලන ආයතන ඇගයීමට ලක් කර ස්වර්ණපුරවර සම්මාන උළෙල පැවැත්වීම.

10. රේඛීය අමාත්‍යාංශය ලෙස අවශ්‍ය අවස්ථාවල දී පළාත් පාලන කොමසාරිස්වරුන් හා සහකාර පළාත් පාලන කොමසාරිස්වරුන් සම්බන්ධීකරණය කිරීම.

11. පළාත් පාලන ක්ෂේත්‍රයට අදාළ කටයුතු හා සම්බන්ධ අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කිරීම.

12. පළාත් පාලන ආයතනවල කාර්යය හා කටයුතු ඒකීය ක්‍රමයකට පවත්වා ගැනීම උදෙසා අවශ්‍ය මඟ පෙන්වීම.

13. පළාත් පාලන ආයතන මධ්‍යම රජයේ ආයතන සමඟ සිදු කරන කටයුතුවල දී මැදිහත් වීම සහ සම්බන්ධීකරණය.

14. පළාත් පාලන ආයතන සම්බන්ධව ඉදිරිපත්වන අධිභාර අභියාචනා කමිටු පැවැත්වීම.

15. පළාත් පාලන ආයතන සඳහා පොදු මානව සම්පත් සංවර්ධන උපාය මාර්ග ක්‍රමයක් හඳුන්වා දීම.

16. පළාත් පාලන ආයතන ස්වයං මූලනය කිරීම සඳහා ක්‍රමෝපාය හඳුන්වා දීම.

17. පළාත් පාලන ආයතන බල ප්‍රදේශවල සංචාරක යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා හඳුනාගත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

18. මහජන පැමිණිලි සම්බන්ධයෙන් සොයා බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ලබා දීම සඳහා අවස්ථාවෝචිත පරිදි අදාළ පළාත් ප්‍රධාන ලේකම්/ පළාත් පාලන කොමසාරිස්/ පළාත් පාලන ආයතන ප්‍රධානීන් වෙත යොමු කිරීම.

## 3. 2024.01.01 සිට 2024.12.31 දක්වා කාර්යසාධනය

**1. රාජ්‍ය ගිණුම්කාරක සහා කටයුතු සඳහා පළාත් පාලන ආයතන සම්බන්ධීකරණය කිරීම.**

පළාත් පාලන ආයතනවල විගණන කටයුතු සම්බන්ධයෙන් නිසි මඟපෙන්වීමක් සිදු කරනු ලබයි.

**ප්‍රගතිය :**

2021 වර්ෂයේ පැවති ගිණුම්කාරක සභා රැස්වීම් නියෝග පරිදි සියලුම පළාත් පාලන ආයතන සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශයක් හඳුන්වා දීමට අදාළව මේ වන විට ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව විසින් යොමු කරන ලද කෙටුම්පත් ප්‍රසම්පාදන මාර්ගෝපදේශය සංශෝධනය කිරීමේ කටයුතු සිදු කරමින් පවතින අතරතුර 2024/11/25 දිනැති ගැසට් නිවේදනය මඟින් භාණ්ඩ, වැඩ හා උපදේශන නොවන සේවා ප්‍රසම්පාදනය කිරීමට අදාළ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයක් සහ ප්‍රසම්පාදන අත්පොත ප්‍රකාශයට පත් කර ඇති බැවින් ඒ අනුව සියලුම පළාත් පාලන ආයතන සඳහා සැකසීමට නියමිත ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ ඉදිරි සංශෝධන කටයුතු සිදු කර එය සැකසීමට නියමිතයි.

**2.පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හා මහජනතාව විසින් පාර්ලිමේන්තුව වෙත යොමු කරනු ලබන ගැටලු**

- **පාර්ලිමේන්තු ප්‍රශ්න**

පළාත් සභා හා පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමන් වෙතින් පිළිතුරු අපේක්ෂාවෙන් යොමු කරනු ලබන ගැටලු අදාල පළාතේ ප්‍රධාන ලේකම් වෙත යොමු කර පළාත් වලින් ලබා ගන්නා නිරීක්ෂණ මත අදාල පිළිතුරු පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

**ප්‍රගතිය :**

2024 වර්ෂය සඳහා ඉදිරිපත් වූ පාර්ලිමේන්තු ප්‍රශ්න ගණන 05ක් වන අතර, එම ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයා ඇත.

- **මහජන පෙත්සම් කාරක සභාව/අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**

පළාත් පාලන ආයතන වෙතින් තම අවශ්‍යතා ඉටු කර ගැනීමට නොහැකි වන ඇතැම් පුද්ගලයන් හා කණ්ඩායම් විසින් මහජන පෙත්සම් කාරක සභාව සහ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව මඟින් ඉදිරිපත් කරනු ලබන පෙත්සම් සඳහා අදාල පළාත් වෙතින් තොරතුරු ලබා ගෙන එම පුද්ගලයන්ට සහන සැලසිය හැකි පරිදි මැදිහත්කරුවෙකු ලෙස කටයුතු කරනු ලබයි.

**ප්‍රගතිය :**

2024 වර්ෂය සඳහා මහජන පෙත්සම් කාරක සභාව වෙතින් පෙත්සම් 09ක් මෙම අමාත්‍යාංශය වෙත යොමු කර ඇති අතර එම පෙත්සම් 09ට අදාල පිළිතුරු මහජන පෙත්සම් කාරක සභා කාර්යංශය වෙත යොමු කර ඇත.

උපදේශක කාරක සභාව වෙතින් යෝජනා 08ක් ඉදිරිපත් වී ඇති අතර එම සියලු යෝජනා සඳහා ම පිළිතුරු උපදේශක කාරක සභාව වෙත යොමු කර ඇත.

**3. මහජන පැමිණිලි විමර්ශනය කිරීම.**

මහ නගර සභා 24, නගර සභා 41 හා ප්‍රාදේශීය සභා 276 ක් ලෙස පිහිටුවා ඇති පළාත් පාලන ආයතන වලින් මහජනතාව හා විවිධ ආයතන වෙත සපයන සේවා සම්බන්ධයෙන් අතෘප්තියට පත් වුවහොත් එවැනි අවස්ථාවක ඒ සම්බන්ධව මෙම අමාත්‍යාංශය වෙත මහජනතාව හා විවිධ ආයතන විසින් පැමිණිළි යොමු කරනු ලැබේ. එලෙස යොමු කරනු ලබන පැමිණිළි සම්බන්ධයෙන් සොයා බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ලබා දීම සඳහා අවස්ථාවෝචිත පරිදි අදාළ පළාත් ප්‍රධාන ලේකම්/ පළාත් පාලන කොමසාරිස්/ පළාත් පාලන ආයතන ප්‍රධානීන් වෙත යොමු කරනු ලැබේ.

| පළාත | ලැබු පැමිණිලි සංඛ්‍යාව | ගත් ක්‍රියා මාර්ගය |
|---|---|---|
| බස්නාහිර | 1256 | පළාත් පාලන කොමසාරිස් වෙත යොමු කර ඇත. |
| මධ්‍යම | 1074 | |
| දකුණු | 217 | |
| උතුරු | 33 | |
| නැගෙනහිර | 52 | |
| වයඹ | 249 | |
| උතුරු මැද | 163 | |
| ඌව | 310 | |
| සබරගමුව | 196 | |
| පොදු | 105 | අදාළ ආයතනවලට යොමු කිරීම. |
| **එකතුව** | **3655** | |

**4. අධිභාර සම්බන්ධ කටයුතු**

පළාත් පාලන ආයතන වල ගිණුම් විගණනය කිරීමේදී නීතියට පටහැනි සෑම ගිණුම් විෂයක්ම විගණකාධිපතිවරයා විසින් ප්‍රතික්ෂේප කර එම කරුණු සම්බන්ධයෙන් බලය දෙන තැනැත්තන් විෂයෙහි අධිභාර පැනවීම සිදු කරනු ලැබේ.

එසේ අධිභාර කරනු ලබන අධිභාරකරුවන්ට 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 172 වගන්ති ප්‍රකාරව දින 30 ක් ඇතුළත රේඛීය අමාත්‍යාංශයේ ලේකම් වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැක. තවද නගර සභා ආඥා පනතේ 255 අධිකාරය ප්‍රකාරව දින 30 ක් ඇතුළත හා මහ නගර සභා ආඥා පනතේ 252 අධිකාරය ප්‍රකාරව දින 14 ක් ඇතුළත රේඛීය විෂය භාර අමාත්‍යවරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කළ යුතුය.

**ප්‍රගතිය :**

එලෙස මෙම අමාත්‍යාංශය වෙත ලැබෙන අභියාචනා සම්බන්ධයෙන් අභියාචනා කමිටුවක් මඟින් තීරණ ලබා දීමේ කටයුතු සිදු කරනු ලැබේ. මෙම වසර තුළ ලැබී තිබූ අභියාචනා 40 න් 30 ක් සඳහා මේවන විට තීරණ ලබා දී ඇත.

**5. පළාත් පාලන ආයතන ඩිජිටල්කරණය කිරීම**

ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන පද්ධතියේ කාර්ය සාධනය කළමනාකරණය කිරීම හා එහි කටයුතු නව තාක්ෂණයත් සමඟ එක් කිරීම මඟින් සීග්‍ර සංවර්ධන දිශානතියකට යොමු කර වඩාත් මහජන හිතකාමී කාර්යක්ෂම පළාත් පාලන ආයතනයක් බිහි කිරීමට කටයුතු කිරීම මෙහි ප්‍රධාන අරමුණයි. මේ සඳහා රු.මි. 30 ක් වෙන්කර ඇත.

**ප්‍රගතිය :**

පළාත් පාලන ආයතනවල මහජන සේවාවන් හා ගෙවීම් මාර්ගගතව පවත්වා ගෙන යාමට හා පළාත් පාලන ආයතන තුළ ආදායම් රැස් කිරීමට අදාළ ගිණුම් කටයුතු සඳහා නිර්මාණය කරන මෘදුකාංග පද්ධතිය හඳුන්වා දීම සඳහා පුහුණු වැඩසටහන් පළාත් පාලන ආයතන 136ක පවත්වා ඇති අතර දැනට මෙම පද්ධතිය පළාත් පාලන ආයතන 74ක භාවිතා කරයි. තව ද දකුණු පළාතේ පළාත් පාලන ආයතන 49ක් සඳහා මෙම මෘදුකාංග පද්ධතිය හඳුන්වා දීමට නියමිත ය.

2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා මූල්‍ය ප්‍රගතිය රු.මි. 15.98 කි.

**6. පළාත් පාලන ආයතන බල ප්‍රදේශවල සංචාරක යටිතල පහසුකම් සංවර්ධනය කිරීම - 2024 අයවැය යෝජනා**

මෙමඟින් සංචාරක සංවර්ධනය සඳහා අත්‍යාවශ්‍ය මූලික යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, සංචාරක ක්ෂේත්‍රයට අදාළ යටිතල පහසුකම් මෙහෙයවීම හා නඩත්තු කිරීම සඳහා පළාත් පාලන ආයතනවලට අවශ්‍ය අරමුදල් සපයාගත හැකිවන ලෙස ආදායම් වර්ධනය කිරීම, සංචාරක ව්‍යාපාරය ආශ්‍රිතව ඇති ඍජු හා වක්‍ර ජීවනෝපාය මාර්ග වර්ධනය කිරීම හා එමඟින් ක්ෂේත්‍රයේ ආදායම් මට්ටම ඉහළ නැංවීම මෙහි ප්‍රධාන අරමුණු වේ.

**ප්‍රගතිය :**

පළාත් පාලන ආයතන බල ප්‍රදේශවල සංචාරක යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා වෙන් වූ මිලියන 1000ක මුදලින් ව්‍යාපෘති 92ක් අනුමත කර ඇති අතර ව්‍යාපෘති 48ක වැඩ අවසන් වී ඇත. ඒ අනුව 2024.12.31 වන දිනට භෞතික ප්‍රගතිය 84.44%ක් වේ. 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා මූල්‍ය ප්‍රගතිය රු.මි. 453.10 කි. දෙසැම්බර් මස අගදී රු.මි. 150 ක ප්‍රතිපාදන වෙනත් ව්‍යාපෘතියකට මාරු කර ඇත.

**7. ස්වර්ණපුරවර සම්මාන උළෙල - 2023**

පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ ජනතාවට කාර්යක්ෂම හා ගුණාත්මක සේවාවක් ලබාදීම මෙහි අරමුණයි. මේ සඳහා රු.මි. 5 ක් වෙන්කර ඇත.

**ප්‍රගතිය :**

සියලුම පළාත් පාලන ආයතන අනුකූලතාවය, කාර්යක්ෂමතාවය, ඵලදායීතාවය, සියලු කණ්ඩායම්වල ඇතුළත්භාවය හා නවෝත්පාදනය යන ක්ෂේත්‍ර යටතේ ලබා ගත් ලකුණු අනුව ශ්‍රේණිගත කර අවසන් කර ඇත. ඉහළම කාර්ය සාධනයක් පෙන්නුම් කරන ලද පළාත් පාලන ආයතන සඳහා සම්මාන ප්‍රදානය සිදු කරන ලදී. 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා මූල්‍ය ප්‍රගතිය රු.මි. 4.9 කි.

**පළාත් පාලන ආයතන බල ප්‍රදේශවල සංචාරක යටිතල පහසුකම් සංවර්ධනය කිරීම**



තිරුවිල් උද්‍යානය - වැල්වෙට්ටිතුරායි



කච්චතිමුනායි සංචාරක ස්ථානය - පූනගරි








ස්වර්ණපුරවර සම්මාන උළෙල - 2023

## 3.5. නීති අංශය

### 1. අරමුණ

රටේ සමස්ත ජනතාවගේ පොදු අපේක්ෂාවන් මුදුන්පත්වන ආකාරයට, ඵලදායීවූද , කාර්යක්ෂමවූද ජනතාවාදී ප්‍රාදේශීය ආණ්ඩුකරණයක් ශ්‍රී ලංකාව තුළ පවත්වාගෙන යාම සහතික කරලීම සඳහාත්, සමානාත්මතාවයෙන් යුතු තිරසර මානව සංවර්ධනයක් ලඟා කර ගැනීම සඳහාත් පහසුකම් සළසාලීම සහ උපදෙස් ලබා දීම පිණිස අමාත්‍යාංශයේ නීති අංශය ස්ථාපිත කර ඇත.

### 2. ප්‍රධාන කාර්යයන්

1. පළාත් පාලනය සහ පළාත් සභාවලට අදාළ ජාතික මට්ටමේ නීති සම්පාදන කාර්යය.
2. ප්‍රතිපත්ති සම්පාදන කාර්යයේදී අවශ්‍ය නෛතික උපදෙස් ලබාදීම.
3. පළාත් පාලන ආයතන/ පළාත් සභාවලට අදාළ අනු නීති සම්පාදන කටයුතුවලදී අවශ්‍යතාවය මත මාර්ගෝපදේශ සැපයීම් සහ සම්පත් දායකත්වය.
4. පළාත් පාලන ආයතන සංස්ථාපන ගැසට් නිවේදන ඇතුලු මධ්‍යම රජයේ පළාත් පාලන අමාත්‍යවරයා විසින් නිකුත් කළ යුතු නියෝග සම්බන්ධ කටයුතු.
5. පාර්ලිමේන්තු තේරීම් කාරක සභා/ උපදේශක කාරක සභා ආංශික අධීක්ෂණ කමිටුවලදී අමාත්‍යාංශය නියෝජනය කිරීම.
6. අමාත්‍යාංශය හා සම්බන්ධ නඩු කටයුතු සම්බන්ධව නීතිපති දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය/ පහළ අධිකරණ කටයුතු සම්බන්ධව අමාත්‍යාංශය වෙනුවෙන් පෙනී සිටීම.(මානව හිමිකම්/ ඔම්බුඩ්ස්මන් පැමිණිලි ඇතුලුව)
7. අමාත්‍යාංශයට අදාළ ගිවිසුම් පරීක්ෂා කිරීම හා අදාළ නෛතික ගැටලුවලට උපදෙස් ලබාදීම.

### 3. 2024.01.01 සිට 2024.12.31 දක්වා කාර්ය සාධනය

**1. මහා නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා පනත සංශෝධනය කිරීම**

නීති කෙටුම්පත් සම්පාදක විසින් සංශෝධන ඇතුළත් කොට සකස් කරනු ලැබූ මහා නගර සභා සහ ප්‍රාදේශීය සභා අවසන් පනත් කෙටුම්පත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලභාවය පිළිබඳ සහතිකය ලබා ගැනීම සඳහා නීතිපති වෙත යොමුකොට ඇත.

**2. රජය විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණය මත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනත සංශෝධනය කිරීම.**

2023 වසරේ පැවැත්වීමට නියමිතව තිබූ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා කැඳවන ලද නාමයෝජනා ආපසු කැඳවීම සහ නව නාමයෝජනා කැඳවීම සඳහා විධිවිධාන සැලසීම සඳහා පළාත් පාලන ආයතන ඡන්ද විමසීම (විශේෂ විධිවිධාන ) පනත් කෙටුම්පතක් සකස් කොට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලභාවය පිළිබඳ සහතිකය ලබා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සඳහා 2024/12/01 දින අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත්කර ඇත.

ඒ සඳහා ලද තීරණය අනුව, නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරන ලද පනත් කෙටුම්පත 2024.12.20 වන දින අමාත්‍ය මණ්ඩල සංදේශයක් මඟින් ගැසට් පත්‍රයේ පළ කිරීමටත් ඉන් අනතුරුව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඉල්ලන ලදී. අනතුරුව එකී අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා ලද තීරණය අනුව පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා රජයේ මුද්‍රණාලයාධිපති වෙත යොමු කර ඇත.

**3. රජයේ අයවැය යෝජනා අනුව යෝජිත නව පළාත් පාලන ආයතන සංස්ථාපනයට අදාළ ගැසට් නිවේදන පිළියෙල කිරීම.**

අයවැය පරාජයවීම හේතුවෙන් ආණ්ඩුකාරවරයා විසින් විසිරුවා හැර ඇති ඇල්පිටිය ප්‍රාදේශීය සභාව සංස්ථාපනය කර , එම ප්‍රාදේශීය සභාවේ ධුර කාලය 2024.11.05 දින ආරම්භ විය යුතු බවට නියම කරමින් හිටපු ගරු අග්‍රාමාත්‍යතුමිය/

අමාත්‍යතුමිය විසින් 2024.11.01 දිනැති අංක 2408/14 දරන ගැසට් නිවේදනය ප්‍රකාශයට පත්කර ඇත.

**4. පළාත් පාලන ආයතන සඳහා හඳුන්වා දී ඇති නව ගිණුම් ක්‍රමයට අදාළ රීති සකස් කිරීමේ වැඩසටහන.**

අමාත්‍යාංශ ලේකම් විසින් පත්කරනලද විද්වත් කමිටුවක නිර්දේශ පරිදි සකස්කරන ලද පළාත් පාලන ආයතන සඳහා වූ මූල්‍ය හා පරිපාලන රීති සහ නියෝග සංග්‍රහයේ මෘදු පිටපත, 1989 අංක 12 දරණ පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනත සමඟ කියවිය යුතු මහා නගර සභා ආඥා පනතේ 289, නගර සභා ආඥා පනතේ 193 සහ 194, ප්‍රාදේශීය සභා පනතේ 171 සහ 184 වගන්තිවල ප්‍රතිපාදන ප්‍රකාර එක් එක් පළාතේ ක්‍රියාත්මක විය යුතු අනු නීති ලෙස ගැසට් නිවේදනයක් මඟින් ප්‍රකාශ කිරීමට අවශ්‍ය පියවර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරවරුන් සහ ප්‍රධාන ලේකම්වරුන් වෙත යොමුකර ඇත.

එකී රීති මඟින් ප්‍රතිපාදන සලසා ඇති, පළාත් පාලන ආයතන සඳහා හඳුන්වාදීමට නියමිත නව ගිණුම්ක්‍රමය ක්‍රියාත්මක කළ යුතු ආකාරය සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් තුනක් ආසියානු පදනමේ සහයෝගීත්වයෙන් පළාත් නවය ආවරණය කරගනිමින් කොළඹ, අනුරාධපුරය සහ අවසාන වැඩසටහන 2024/12/17 දින ඔහිය දී පවත්වන ලදී.

**5. ජලභීතිකා ආඥා පනතේ සංශෝධන කටයුතු අවසන් කිරීම.**

අවසන් පනත් කෙටුම්පත සකස්කොට නීතිපතිගේ සහතිකය ලබා ගැනීම සඳහා යොමු කරන ලද අතර ඒ සම්බන්ධයෙන් නීතිපති විසින් සංශෝධන කිහිපයක් යෝජනා කර ඇත. එකී යෝජිත සංශෝධන ඇතුළත් කොට නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරන ලද කෙටුම්පත නිර්දේශ ලබා ගැනීම සඳහා 2024/11/26 දින කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය වෙත යොමුකර ඇත.







**3.6. පාලන හා පුහුණු අංශය**

**1.අරමුණ**

මානව සම්පත් කළමනාකරණය හා ධාරිතාවන් සංවර්ධන කිරීමට කුසලතාවයන් සපිරි නිලධාරී පිරිසක් බිහි කිරීම සහ පවත්නා භෞතික සම්පත් උපරිම ඵලදායිතාවයෙන් යොදා ගනිමින් අමාත්‍යාංශයේ අපේක්ෂිත ඉලක්ක ලඟා කර ගැනීමට සම්පත් මෙහෙයවීම.

**2. ප්‍රධාන කාර්යයන්**

- ***මානව සම්පත් කළමනාකරණය***

✓ අනුමත කාර්යය මණ්ඩලය යාවත්කාලීන කිරීම.

✓ අවශ්‍යතාවය අනුව නව තනතුරු ඇති කිරීම.

✓ පෞද්ගලික ලිපිගොනු යාවත්කාලීන කිරීම, නිලධාරීන් විශ්‍රාම ගැන්වීමේ කටයුතු, ස්ථාන මාරුවලට අදාළ කටයුතු.

✓ ගරු අමාත්‍යතුමන්ලාගේ තාවකාලික කාර්යය මණ්ඩලය පත්කිරීමට අදාළ කටයුතු.

- ***මානව සම්පත් සංවර්ධනය***

✓ දේශීය හා විදේශීය පුහුණු කටයුතු සම්බන්ධීකරණය කිරීම.

- **සාමාන්‍ය පරිපාලන කටයුතු**

✓ උපයෝගී සේවාවන් සපයා ගැනීමට (ආරක්ෂක සේවා, සනීපාරක්ෂක සේවා) අදාළ කටයුතු.

✓ අමාත්‍යාංශයේ සියලුම වාහනවල ලියාපදිංචි කිරීම, අනුයුක්ත කිරීම, රක්ෂණය, නඩත්තුව, ඉන්ධන සම්බන්ධ කටයුතු හා සංචිත වාහන සැපයීමට අදාළ කටයුතු.

✓ තැපැල විධිමත්ව පවත්වාගෙන යාම.

✓ යන්ත්‍රෝපකරණ නඩත්තුව.

✓ තොරතුරු තාක්ෂණ අංශයේ කටයුතු

✓ භාෂා පරිවර්තනයට අදාළ කටයුතු.

- ✓ අමාත්‍යාංශයේ විෂය පථයට අයත් අංශ හා ආයතන කටයුතුවලට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශ අමාත්‍ය මණ්ඩල ලේකම් වෙත යොමු කිරීම සහ අමාත්‍ය මණ්ඩල සංදේශ සම්බන්ධ නිරීක්ෂණ සැපයීම.
- ✓ රජයේ නිලධරයන් ආණ්ඩුවට අමතර සේවා ඉටුකිරීම වෙනුවෙන් වන දීමනා සම්බන්ධ කටයුතු , අතිකාල දීමනා, නිවාඩු දින වැටුප් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/93 අනුව හදිසි අනතුරු වන්දි සම්බන්ධයෙන් වන කටයුතු, නිල ඇඳුම් හා විවිධ ගෙවීම් වලට අදාළ කටයුතු.
- ✓ නිවාඩු, ගමන් වියදම්, දුම්රිය අනුග්‍රහ වාර ප්‍රවේශ පත්‍ර, ගිවිසුම් හා බැඳුම්කර, රාජ්‍ය සේවක ණය යෝජනා ක්‍රම, අග්‍රහාර රක්ෂණ ප්‍රතිලාභ ආදී පරිපාලන කටයුතු.
- ✓ රාජ්‍ය සේවයෙන් පරිබාහිර තනතුරු සඳහා මුදා හැරීමට අදාල කටයුතු.
- ✓ ජ්‍යෙෂ්ඨත්වයට හා විශ්‍රාම වැටුපට හානියක් නොවන පරිදි රාජ්‍ය නිලධරයන්ට දේශීය/විදේශීය වැටුප් රහිත නිවාඩු ලබාදීමට අදාල කටයුතු
- ✓ මාණ්ඩලික නිලධාරී රැස්වීම් පැවැත්වීම හා ශ්‍රවනාගාරය වෙන්කිරීම් වලට අදාළ කටයුතු.
- ✓ ලේඛනාගාරය පවත්වා ගැනීමට අදාළ කටයුතු.
- ✓ අමාත්‍යාංශ විමසීම් කවුළුව සහ දුරකථන හුවමාරුව විධිමත්ව පවත්වාගෙන යාම.

**4. කාර්යය මණ්ඩලය**

2024.12.31 දිනට යාවත්කාලීන කරන ලද කාර්යය මණ්ඩල තොරතුරු පහත පරිදි වේ.

| අ.අ. | තනතුර | විශේෂීකරණය | පන්තිය /ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | සිටින සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|---|---|
| **ජ්‍යෙෂ්ඨ මට්ටම** | | | | | | |
| 1 | අතිරේක ලේකම් | පාලන හා පුහුණු | විශේෂ | 1 | 0 | 1 |
| 2 | අතිරේක ලේකම් | සංවර්ධන | විශේෂ | 1 | 1 | 0 |
| 3 | අතිරේක ලේකම් | පළාත් සභා හා පළාත් පාලන | විශේෂ | 1 | 1 | 0 |
| 4 | අධ්‍යක්ෂ ජනරාල් | ක්‍රමසම්පාදන | විශේෂ | 1 | 1 | 0 |
| 5 | ප්‍රධාන මූල්‍ය නිලධාරි | - | විශේෂ | 1 | 1 | 0 |
| 6 | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | පාලන හා පුහුණු | 1 | 1 | 1 | 0 |
| 7 | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | පළාත් පාලන | 1 | 1 | 1 | 0 |
| 8 | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | පළාත් සභා | 1 | 1 | 1 | 0 |
| 9 | ප්‍රධාන ගණකාධිකාරි | - | 1 | 1 | 1 | 0 |
| 10 | ගණකාධිකාරි | - | 1 | 1 | 1 | 0 |
| 11 | ප්‍රධාන අභ්‍යන්තර විගණක | - | 1 | 1 | 1 | 0 |
| 12 | අධ්‍යක්ෂ | ඉංජිනේරු/ සංවර්ධන | 1 | 1 | 0 | 1 |
| 13 | අධ්‍යක්ෂ | ඉංජිනේරු/ ජා.ස.අ.ක.ස.ම | 1 | 1 | 1 | 0 |
| 14 | අධ්‍යක්ෂ | ක්‍රමසම්පාදන | 1 | 1 | 0 | 1 |
| 15 | ප්‍රධාන නීති නිලධාරි | - | 1 | 1 | 0 | 1 |
| 16 | සහකාර ලේකම් | පාලන හා පුහුණු | 111/11 | 1 | 1 | 0 |

| අ.අ. | තනතුර | විශේෂීකරණය | පන්තිය /ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | සිටින සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|---|---|
| 17 | සහකාර ලේකම් | පළාත් සභා | 111/11 | 1 | 0 | 1 |
| 18 | සහකාර ලේකම් | පළාත් පාලන | 111/11 | 1 | 1 | 0 |
| 19 | නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ | ජා.ස.අ.ක.ස.ම | 111/11 | 1 | 1 | 0 |
| 20 | නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ | ව්‍යාපෘති | 111/11 | 1 | 0 | 1 |
| 21 | නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ | - | 111/11 | 2 | 3 | 0 |
| 22 | අභ්‍යන්තර විගණක | - | 111/11 | 2 | 0 | 2 |
| 23 | ගණකාධිකාරි | ගෙවීම් | 111/11 | 1 | 1 | 0 |
| 24 | ගණකාධිකාරි | සැපයුම් | 111/11 | 1 | 1 | 0 |
| 25 | ඉංජිනේරු | සන අපද්‍රව්‍ය | 111/11 | 1 | 1 | 0 |
| 26 | ඉංජිනේරු | සංවර්ධන | 111/11 | 1 | 0 | 1 |
| 27 | නීති නිලධාරි | - | 111/11 | 1 | 1 | 0 |
| 28 | නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | 111/11 | 1 | 1 | 0 |
| **තෘතීය මට්ටම** | | | | | | |
| 29 | පරිපාලන නිලධාරි | - | අධිශ්‍රේණි | 1 | 0 | 1 |
| 30 | භාෂා පරිවර්තක | - | 1/ විශේෂ | 2 | 1 | 1 |
| 31 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි | - | 11/1 | 1 | 1 | 0 |
| **ද්විතීය මට්ටම** | | | | | | |
| 32 | සංවර්ධන නිලධාරි | - | 111/11/1 | 82 | 72 | 10 |
| 33 | තාක්ෂණ නිලධාරි | - | 111/11/1 | 1 | 1 | 0 |
| 34 | කළමනාකරණ සේවා නිලධාරි | - | 111/11/1 | 40 | 20 | 20 |
| 35 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | - | 111/11/1 | 1 | 1 | 0 |
| 36 | නිශ්චල ඡායාරූප ශිල්පී | - | 111/11/1 විශේෂ | 1 | 1 | 0 |
| 37 | කැමරා ශිල්පී | | 111/11/1 විශේෂ | 1 | 1 | 0 |
| **ප්‍රාථමික මට්ටම** | | | | | | |
| 38 | විදුලි කාර්මික | - | 111/11/1/විශේෂ | 1 | 1 | 0 |
| 39 | රියදුරු | - | 111/11/1/විශේෂ | 18 | 14 | 4 |

| අ.අ. | තනතුර | විශේෂීකරණය | පන්තිය /ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | සිටින සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|---|---|
| 40 | සංචාරක බංගලා භාරකරු/ ප්‍රධාන සුපවේදී | - | 111/11/1/විශේෂ | 2 | 2 | 0 |
| 41 | කාර්යාල කාර්ය සහායක | - | 111/11/1/විශේෂ | 21 | 18 | 3 |
| 42 | අත් උදවුකරු | | 111/11/1/විශේෂ | 1 | 1 | 0 |
| 43 | සංචාරක බංගලා සහායක කණ්ඩලම සංචාරක බංගලාව | - | 111/11/1 | 1 | 1 | 0 |
| එකතුව | | | | **204** | **158** | **48** |

**ව්‍යාපෘති කළමණාකරණ ඒකකය**

| අ.අ. | තනතුර | විශේෂීකරණය | පන්තිය /ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | සිටින සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|---|---|
| 1 | අතිරේක ලේකම් | ව්‍යාපෘති අධීක්ෂණ | විශේෂ | 1 | 1 | 0 |
| 2 | ප්‍රසම්පාදන විශේෂඥ | ව්‍යාපෘති | (කොන්ත්‍රාත් පදනම) | 1 | 0 | 1 |
| 3 | උපදේශක ඉංජිනේරු | ව්‍යාපෘති | (කොන්ත්‍රාත් පදනම) | 1 | 0 | 1 |
| 4 | සංවර්ධන නිලධාරි | - | 111/11/1 | 7 | 7 | 0 |
| 5 | කළමනාකරණ සේවා නිලධාරී | - | 111/11/1 | 2 | 2 | 0 |
| 6 | රියදුරු | - | 111/11/1/විශේෂ | 1 | 1 | 0 |
| 7 | කාර්යාල කාර්ය සහයක | - | 111/11/1/විශේෂ | 1 | 1 | 0 |
| එකතුව | | | | **14** | **12** | **2** |

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/2014 (1) යටතේ දෙපාර්තමේන්තුගත පත්වීම් ලෙස බඳවාගෙන ඇතත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් කර නොමැති නිලධාරීන්

| | |
|---|---|
| කළමනාකරණ සහකාර | 20 |
| රියදුරු | 12 |
| කාර්යාල කාර්ය සේවක | 11 |
| **එකතුව** | **43** |

**5. 2024.01.01 සිට 2024.12.31 දක්වා කාර්යසාධනය**

| අ.අ. | කාර්යය / වියදම | ශුද්ධ ප්‍රතිපාදන (රු.) | වැයකළ මුදල (රු.) | ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| 01 | යන්ත්‍රෝපකරණ නඩත්තුව (රාජ්‍ය අමාත්‍ය කාර්යාලය සහ අමාත්‍යාංශය) | 3,500,000.00 | 3,337,170.60 | 95% |
| 02 | වාහන නඩත්තුව (රාජ්‍ය අමාත්‍ය කාර්යාලය සහ අමාත්‍යාංශය) | 22,000,000.00 | 19,370,107.69 | 88% |

| අ.අ. | කාර්යය / වියදම | ශුද්ධ ප්‍රතිපාදන (රු.) | වැයකළ මුදල (රු.) | ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| 03 | දේශීය හා විදේශීය පුහුණු (රාජ්‍ය අමාත්‍ය කාර්යාලය සහ අමාත්‍යාංශය) | 2,500,000.00 | 302,000.00 | 12% |
| 04 | ඉන්ධන ලබාදීම් (රාජ්‍ය අමාත්‍ය කාර්යාලය සහ අමාත්‍යාංශය) | 12,000,000.00 | 11,316,056.37 | 94% |
| 05 | ගොඩනැගිලි නඩත්තුව (රාජ්‍ය අමාත්‍ය කාර්යාලය සහ අමාත්‍යාංශය) | 24,000,000.00 | 437,190.00 | 2% |
| 06 | ජල හා විදුලි බිල්පත් ගෙවීම් (රාජ්‍ය අමාත්‍ය කාර්යාලය සහ අමාත්‍යාංශය) | 15,000,000.00 | 14,692,217.09 | 98% |
| 07 | තැපැල් හා සන්නිවේදන ගාස්තු (රාජ්‍ය අමාත්‍ය කාර්යාලය සහ අමාත්‍යාංශය) | 5,500,000.00 | 4,049,655.09 | 74% |
| 08 | බාහිර සේවා ලබාගැනීම්<br>- සනීපාරක්ෂක සේවා ⟶ | 11,000,000.00 | 10,132,598.16 | 92% |
| | - ආරක්ෂක සේවා ⟶ | 4,300,000.00 | 3,118,386.19 | 73% |
| 09 | කාර්යය මණ්ඩලයේ වැටුප් වර්ධක ගෙවීම්, උසස් කිරීම්/ විශ්‍රාම ගැන්වීම් කටයුතු | - | - | 100% |
| 10 | කාර්යය මණ්ඩලවලට අදාළ රාජකාරී | - | - | ස්ථාන මාරුවීම් ලැබීගිය නිලධාරීන් සංඛ්‍යාව = 17<br>ස්ථාන මාරුවීම් ලැබී පැමිණි සංඛ්‍යාව = 12 |
| 11 | අමාත්‍ය කාර්ය මණ්ඩල පත්කිරීම් හා අදාළ කටයුතු | - | - | 100% |
| 12 | නිලධාරීන්ගේ පෞද්ගලික සුභසාධනය හා දුක්ගැනවිලි කළමනාකරණය සම්බන්ධ කටයුතු | - | - | පවතින සීමාවන් තුළ හැකි උපරිම අන්දමින් ඉටුකර ඇත. |
| 13 | පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම | - | - | 100% |
| 14 | අමාත්‍ය මණ්ඩල සංදේශ පිළිබඳ කටයුතු | - | - | 100% |

- **ජ්‍යෙෂ්ඨතාවයට හා විශ්‍රාම වැටුපට හානියක් නොවන පරිදි රාජ්‍ය නිලධරයන්ට දේශීය/ විදේශීය වැටුප් රහිත නිවාඩු ලබා දීම.**

| **2024.12.31** වන විට තොරතුරු | | |
|---|---|---|
| තනතුර | දේශීය නිවාඩු ලබාගත් නිලධාරීන් ගණන | විදේශ නිවාඩු ලබාගත් නිලධාරීන් ගණන |
| සංවර්ධන නිලධාරි | 01 | 06 |
| තාක්ෂණික නිලධාරි | - | 01 |
| කළමනාකරණ සේවා නිලධාරි | 01 | - |
| කළමනාකරණ සහකාර | 03 | 01 |
| කාර්යාල කාර්ය සහායක | 01 | - |
| රියැදුරු | 01 | 02 |
| **එකතුව** | **07** | **10** |

## ✠ *තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයට අදාළ තොරතුරු*

### 1. අරමුණ

පළාත් පාලන ආයතනවලින් සපයන මහජන සේවාවන් මාර්ගගත ක්‍රමය ඔස්සේ සපයමින් මහජනතාවගේ ජීවන තත්වය උසස් කිරීමට කටයුතු කිරීම හා තොරතුරු තාක්ෂණය භාවිතයෙන් අමාත්‍යාංශයේ රාජකාරී කටයුතු පහසු කිරීමට සහය වෙමින් කඩදාසිවලින් තොර පරිසරයක් පවත්වාගෙන යාමට කටයුතු කිරීම.

### 2. ප්‍රධාන කාර්යයන්

1. භාවිතා කරන්නන්ට අදාළ තොරතුරු නිකුත් කිරීම සඳහා සතිපතා අමාත්‍යාංශ වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම.
2. දත්ත හා තොරතුරු රැස්කර දත්ත පද්ධතියක් සකස් කිරීම.
3. අමාත්‍යාංශයේ දැනට පවතින සම්බන්ධතා ජාල පද්ධතිය ප්‍රතිස්ථාපනය කිරීම සහ අධීක්ෂණය කිරීම.
4. අමාත්‍යාංශයේ අංශ සඳහා විවිධ තොරතුරු සඳහා තාක්ෂණ සහය ලබා දීම.
5. LGN 2.0 ව්‍යාපෘතිය සුපරීක්ෂාව හා සම්බන්ධීකරණය කිරීම.
6. අමාත්‍යාංශය තුළ කඩදාසි භාවිතයෙන් තොර පරිසරයක් පවත්වා ගැනීම.
7. අමාත්‍යාංශයේ සියලුම කාර්යය මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ දැනුම වර්ධනය සඳහා අවශ්‍ය පුහුණු වැඩටහන් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම.
8. විවිධ අංශවල අවශ්‍යතාවය අනුව මෘදුකාංග නිර්මාණය කිරීම හා එමගින් කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය ඉහළනැංවීම

### 3. 2024.01.01 සිට 2024.12.31 දක්වා කාර්යසාධනය

| කාර්යයන් | ප්‍රගතිය |
|---|---|
| පළාත් පාලන ආයතන සපයන සේවා සඳහා තොරතුරු තාක්ෂණික විසඳුම් ලබාදීමට සකස් කරන ලද Empowering Local Government - A Comprehensive Digitalization Project for Local Government ව්‍යාපෘතිය | මෙම ව්‍යාපෘතියට වෙබ් අඩවි දෙකකින් යුත් මෘදුකාංග පද්ධතියක් අයත්වේ.<br>**elgservices.lk**<br>• For online customers<br><br>**apps.elgservices.lk**<br>• For local government employees<br><br>මහජනතාවට elgservices.lk මගින් පළාත් පාලන ආයතනවලට කරන ගෙවීම් (වරිපනම්, කඩකුලී ආදිය) හා වෙන්කරගැනීම් මාර්ගගත ක්‍රමය ඔස්සේ නිවසේ සිටම ඉටුකර ගතහැකි පරිදි සකස් කර ඇත.<br><br>apps.elgservices.lk පළාත් පාලන ආයතනවල සියලුම ගිණුම් කටයුතු සඳහා සකස් කර ඇති අතර මෙමගින් පාරිභෝගිකයින් සඳහා ලදුපත් නිකුත් කිරීමේ සිට අවසාන ගිණුමට අවශ්‍ය වාර්තා ලබා ගැනිම දක්වා කාර්යයන් සිදුකළ හැක.<br><br>දැනට පළාත් 3ක ක්‍රියාත්මක වන මෙම පද්ධතිය මධ්‍යම පළාතේ පළාත් පාලන ආයතන 40කත් සබරගමුව පළාතේ පළාත් පාලන ආයතන 28කත් නැගෙනහිර පළාතේ පළාත් පාලන ආයතන 19කත් වශයෙන් දිවයින පුරා පළාත් පාලන ආයතන 87 ක ක්‍රියාත්මක වේ. |




තවද elgservices.lk වෙබ් අඩවිය මගින් මාර්ගගත ගෙවීම් ලබා ගැනීම සඳහා ලංකා බැංකුවේ සහ මහජන බැංකුවේ Payment Gateway සම්බන්ධ කර ඇත.

## Payment Gateway

- Setup fee, other charges - waived off.
- Annual fee Rs. 25,000.00

- Setup fee, other charges - waived off.
- No annual fee

**Convenience fee for customer 1.5% reduced to 1%**

තවද මේ වන විට මධ්‍යම පළාතේ පළාත් පාලන ආයතන 35කට හා සබරගමු පළාතේ පළාත් පාලන ආයතන10 කට මාර්ගගත ගෙවීම් ලබා ගැනීම සඳහා Payment Gateway පහසුකම බැංකු සමඟ සම්බන්ධ වී ලබා දී ඇත.

**Central Province**




**Sabaragamuwa Province**




තවද, මෙම මෘදුකාංගය CAT2020 මෘදුකාංගයට සමාන කාර්යයන් ඉටු කරන බැවින් CAT2020 මෘදුකාංගය මිලදී ගැනීමේදී එක් පලාත් පාලන ආයතනයකට වැයවන රු. ලක්ෂ 11.5 යන මුදල මෙම මෘදුකාංගය මඟින් රජයට ඉතිරි කර දේ. ඒ අනුව ඉහත සඳහන් පලාත් පාලන ආයතන 87 තුළ මෙම මෘදුකාංගය ස්ථාපිත කිරීමෙන් මේවනවිට රු. මිලියන 100ක (87 x 11.5) මුදලක් රජයට ඉතිරිකර දී ඇත.

තවද, CAT2020 මෘදුකාංගය සඳහා වාර්ෂිකව නඩත්තු ගාස්තු ලෙස ලක්ෂ 2.5 ක පමණ මුදලක් වැයවන අතර එම මුදල ද මෙමඟින් ඉතිරි වී ඇත. ඒ අනුව 87 x 2.5 = රුපියල් ලක්ෂ 217.5 මුදලක් රජයට වාර්ෂිකව ඉතිරි කර දීමට හැකියාව ලැබී ඇත.

තවද මෙම පද්ධතිය මඟින් එක් එක් පලාත් පාලන ආයතනය ලබා ගන්නා ආදායම් විස්තර අමාත්‍යාංශයට නිරීක්ෂණය කල හැකි වීම. දැනට පළාත් පාලන ගිණුම් ක්‍රම සඳහා යොදා ගැනෙන නව ගිණුම් ක්‍රමය හා පැරණි ගිණුම් ක්‍රමය යන ගිණුම් ක්‍රම දෙකම මෙම මෘදුකාංගයට ඇතුලත් කර ඇත.

පළාත් පාලන ආයතන සපයන සේවා සඳහා තොරතුරු තාක්ෂණික විසඳුම් ලබාදීමට සකස් කරන ලද ව්‍යාපෘතියට අදාලව සිදුකරන ලද වැඩමුළු පහත පරිදි පවත්වා ඇත.

| | |
|---|---|
| | 2024.01.19 දින යාපනය උතුරු පළාත් සභාවේදී<br>2024.01.30 දින අනුරාධපුර උතුරු මැද පළාත් සභාවේදී<br>2024.02.06 දින නැගෙනහිර පළාත් සභාවේදී<br>2024.03.05 දින රත්නපුර සබරගමුව පළාත් සභාවේදී<br>2024.04.04 දින Zoom තාක්ෂණය ඔස්සේ මධ්‍යම පළාත් සභාව සමඟ<br>2024.06.18 හා 2024.06.19 යන දෙදින නැගෙනහිර පළාත් සභාවේදී<br>2024.07.02 දින රත්නපුර සබරගමුව පළාත් සභාවේදී<br><br>පළාත් පාලන ආයතන මඟින් එක් රැස් කරනු ලබන වරිපනම් ආදායම ගණනය කිරීමට අදාලව මෘදුකාංග වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය දත්ත විශ්ලේෂණය හා තොරතුරු රැස්කිරීම සඳහා වැඩමුලුවක් 2024.09.03 දින මාතලේ මහානගර සභාවේදී පැවැත්විය.<br><br>වරිපනම් ආදායම් ගණනය කිරීමට අදාලව වැඩි දියුණු කරන ලද මෘදුකාංගය පිලිබඳ සමාලෝචනය කිරීම සඳහා වැඩමුලුවක් 2024.10.30 දින නවයාලතැන්න පළාත් පාලන පුහුණු මධ්‍යස්ථානයේදී පැවැත්විය.<br><br>පළාත් පාලන ආයතනවල ඇති ගැටලු නිරාකරණය කිරීම හා නව මෘදුකාංග නව පහසුකම් හඳුන්වාදීම සම්බන්ධයෙන් පුහුණු වැඩසටහනක් 2024.09.10 දින ස්වදේශ කටයුතු අංශයේ දී පැවැත්විය.<br><br>තවද ඉහත පළාත් සඳහා මෙම මෘදුකාංගය භාවිතා කිරීම පිළිබඳ විවිධ විමසීම් හා ගැටළු ඉදිරිපත් කිරීමටත්, විවිධ උපදෙස් ලබාදීමටත් WhatsApp Group 3 ක් සකස් කර ඇති අතර එමගින් මේ වන විට 1,000කට අධික ගැටලු ප්‍රමාණයක් සඳහා පිළිතුරු සපයා ඇත |
| දෘඩාංග සහ මෘදුකාංග ගැටළු ඇතුළු තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආශ්‍රිත කරුණු සඳහා සහය වීම | නඩත්තු කටයුතු සිදු කරන ලද පරිඝණක සංඛ්‍යාව - 88<br>නඩත්තු කටයුතු සිදු කරන ලද මුද්‍රණ යන්ත්‍ර සංඛ්‍යාව - 12<br>නඩත්තු කටයුතු සිදු කරන ලද Scanner යන්ත්‍ර සංඛ්‍යාව - 01<br>**එකතුව 101**<br><br>එමගින් රජයට ඉතිරි කර දුන් මුදල = රු.1,086,500.00 |
| අමාත්‍යාංශයේ වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම | තොරතුරු තාක්ෂණ අංශයට එවා ඇති සියලුම තොරතුරු දින පදනම මත යාවත්කාලීන කර ඇත.<br> |

| | |
|---|---|
| අමාත්‍යාංශයේ ෆේස්බුක් පිටුව යාවත්කාලීන කිරීම | තොරතුරු තාක්ෂණ අංශයට එවා ඇති සියලුම තොරතුරු දින පදනම මත යාවත්කාලීන කර ඇත.   |
| අමාත්‍යාංශය තුළ කඩදාසි භාවිතයෙන් තොර පරිසරයක් පවත්වා ගැනීම | a) ලේඛණාගාරය සඳහා මෘදුකාංග පද්ධතියක් සකස් කර ඉදිරි කටයුතු සඳහා පාලන අංශය වෙත භාර දීම.<br>b) තොග කළමනාකරණ පද්ධතිය සකස් කිරීම හා හඳුන්වා දීම |
| Zoom රැස්වීම් සඳහා යොමු සකස් කිරීම හා තාක්ෂණික සහය ලබා දීම. | a) සකස් කරන ලද zoom යොමු ගණන = 280<br>b) සහභාගී වූ zoom / භෞතික රැස්වීම් ගණන = 302 |

## 3.7. මූල්‍ය අංශය

### 1. අරමුණ

පළාත් සභා හා පළාත් පාලන අංශයේ දැක්ම හා මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය මූල්‍යමය පහසුකම් සපයා දීම හා දේශීය සහ විදේශීය අරමුදල් ඵලදායීව හා කාර්යක්ෂමව යොදා ගනිමින් මහජන මුදල් පිළිබඳව විනිවිදභාවයකින් යුතුව කටයුතු කිරීම.

### 2. ප්‍රධාන කාර්යයන්

1. විසර්ජන පනත මගින් වෙන්කරනු ලැබූ මුදල් හා විදේශ ව්‍යාපෘති යටතේ වෙන්කරන ලද මුදල් එම වෙන්කරන ලද කාර්යයන් සඳහාම යොදවා ගනිමින් ද එසේ වෙන්කරන ලද මුදලේ අතිරික්තයක් වේ නම් වෙනත් අවශ්‍ය කාර්යයක් සඳහා මාරුකිරීම තුළින් සියලුම මුදල් ඵලදායීව වියදම් කර ඒ පිළිබඳ විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු අවසාන ගිණුම (මූල්‍ය ප්‍රකාශන) නියමිත දිනට ඉදිරිපත් කිරීම.
2. පළාත් සභා සහ පළාත් පාලන අංශයේ අරමුණු හා ඉලක්ක සපුරාගැනීම පිණිස අවශ්‍ය භෞතික සම්පත් ප්‍රමාදයකින් තොරව ලබාදීම හා සියලුම වත්කම් නිසි පරිදි කළමනාකරණය කිරීම.
3. දේශීය සහ විදේශීය ව්‍යාපෘතිවල ගිණුම් වාර්තා, මාසිකව, කාර්තුමය සහ වාර්ෂික වශයෙන් භාණ්ඩාගාරයට නිසි වේලාවට ඉදිරිපත් කර කලට වේලාවට අරමුදල් ලබා ගැනීම.
4. අත්තිකාරම් බී ගිණුම යටතේ වෙන්වන ප්‍රතිපාදන මගින් රජයේ නිලධාරීන්ට ප්‍රමාදයකින් තොරව අවශ්‍ය ණය හා

අත්තිකාරම් මුදල් ලබාදීමට කටයුතු කිරීම සහ ඒ සඳහා වූ ගිණුම් නියමිත දිනට පෙර ඉදිරිපත් කිරීම.

5. පළාත් සභා සහ පළාත් පාලන අංශයට අවශ්‍ය වන භාණ්ඩ සහ උපකරණ මිලදී ගැනීමේදී මෙන්ම පළාත් පාලන බල ප්‍රදේශවල සංවර්ධන හා යටිතල පහසුකම් සැපයීමේ කටයුතු සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සහ යන්ත්‍රෝපකරණ මිලදී ගැනීමේදී ඒ සඳහා වූ ප්‍රසම්පාදන ක්‍රියාවලිය විනිවිද භාවයකින් හා කාර්යක්ෂමව ඉටු කිරීම.

6. විගණකාධිපතිගේ විගණන විමසුම්වලට සහ අභ්‍යන්තරික වශයෙන් පැන නැගුණ විගණන විමසුම්වලට අප්‍රමාදව ප්‍රතිචාර දැක්වීම හා අනාවරණය කෙරෙන අඩුපාඩු නිවැරදි කරගැනීමට අප්‍රමාදව කටයුතු කර තිබීම සහ රාජ්‍ය ගිණුම්කාරක සභා අවස්ථාවට අවශ්‍ය අවස්ථාවන්හි දී පෙනී සිටීම.

8. පළාත් පාලන ආයතන බල ප්‍රදේශවල ක්‍රියාත්මක වන විවිධ සංවර්ධන කටයුතු සහ සේවාවන් සඳහා අප්‍රමාදව මුදල් නිදහස් කිරීම.

9. සිවිල් කොන්ත්‍රාත්තු, උපදේශන සේවා ඇතුළු කාර්යයන් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවලට අවශ්‍ය මුල්‍ය උපදෙස් ලබාදීම.

**3. 2024.01.01 සිට 2024.12.31 දක්වා කාර්යසාධන**







## 3.8. වියදම් විමංසන අංශය

**1. අරමුණ**

පළාත් සභා හා පළාත් පාලන ආයතනවල මූල්‍ය කටයුතු සම්බන්ධීකරණය හා විමංසනය කිරීම

**2. ප්‍රධාන කාර්යයන්**

1. පළාත් සභා වෙත මධ්‍යම රජය විසින් වාර්ෂිකව දෙනු ලබන ප්‍රදානයන් හා උපයනු ලබන ආදායම් එම ආයතන විසින් උපයෝගී කරගනු ලබන ආකාරය පිළිබඳ අඛණ්ඩ ඇගයීම් කිරීම හා වාර්තාකරණය.

2. පළාත් සභා වෙත මූල්‍ය ප්‍රතිපාදන නිදහස් කිරීම හා පළාත් සභා හා පළාත් පාලන ආයතන මූල්‍ය කටයුතු සම්බන්ධීකරණය හා ගැටළු සමාලෝචනය.

3. ආමාත්‍යාංශය විසින් පළාත් සභා හා පළාත් පාලන ආයතන වෙත ලබා දී ඇති වාහන පැවරීම හා ඒ හා සම්බන්ධිත වෙනත් කාර්යයන් ඉටු කිරීම හා සම්බන්ධීකරණය.

4. පළාත් පාලන ආයතන වෙත මධ්‍යම රජය විසින් වාර්ෂිකව දෙනු ලබන ප්‍රදානයන් හා උපයනු ලබන ආදායම් එම ආයතන විසින් උපයෝගී කරගනු ලබන ආකාරය පිළිබඳ අඛණ්ඩ ඇගයීම් කිරීම හා වාර්තාකරණය.

5. පළාත් පාලන ආයතන සම්බන්ධ කළමනාකරණ තොරතුරු පද්ධතිය විමංසනය.

6. විවිධ රාජ්‍ය ,ව්‍යවස්ථාපිත ආයතන හා බාහිර පාර්ශවයන් විසින් පළාත් සභා හා පළාත් පාලන ආයතන සම්බන්ධ ඉල්ලුම් කරන දත්ත හා තොරතුරු ලබා දීම.

7. පළාත් සභා මූල්‍ය කටයුතු සමාලෝචනය හා කාර්තුමය සමාලෝචන වාර්තා සකස් කිරීම හා අදාළ පාර්ශව වෙත යොමු කිරීම.

**3 2024.01.01 සිට 2024.12.31 දක්වා කාර්යසාධනය**

1. 2024 වර්ෂය තුළදී ද මධ්‍යම රජය විසින් දෙනු ලබන ප්‍රදානයන් හා පළාත් සභා ආදායම් ඇස්තමේන්තුගත වියදම් සීමාවන්ට යටත්ව එම ආයතන විසින් වියදම් කරනු ලබන ආකාරය පිළිබඳව අඛණ්ඩ ඇගයීමක් කරගෙන යනු ලබයි. 2024 වර්ෂයේ පළමු, දෙවන හා තෙවන කාර්තුව සඳහා පළාත් සභා මූල්‍ය කාර්යය සාධන වාර්තා සකස් කර අවසන් කර ඇත. එලෙසම 2023 වර්ෂයේ දත්ත පදනම් කරගෙන 2023 වාර්ෂික පළාත් සභා මූල්‍ය කාර්යසාධන වාර්තාව සකස් කර අවසන් කර ඇත.

2. පළාත් සභා හා පළාත් පාලන ආයතනවල සේවක සංඛ්‍යා සම්බන්ධයෙන් පවත්වා ගෙන යනු ලබන දත්ත පද්ධතිය 2024 වර්ෂය සඳහා යාවත්කාලීන කර ඇත.

3 පළාත් පාලන ආයතනයන්හි වර්ෂයේ ආදායම් හා වියදම් පිළිබඳ තොරතුරු ඇතුළත් දත්ත පද්ධතිය 2024 වර්ෂයට අදාලව වාර්ෂිකව යාවත්කාලීන කරන ලද අතර, එම තොරතුරු විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව පළාත් පාලන ආයතනවල මූල්‍ය කාර්යය සාධනය සම්බන්ධ 2023 වාර්ෂික වාර්තාව සහ 2024 අර්ධ වාර්ෂික වාර්තාව සකස් කර සියලුම පළාත් පාලන කොමසාරිස්වරුන් වෙත යවා ඇත. පළාත් පාලන ආයතන වන මහා නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා වල පොදු පහසුකම් පිළිබඳ තොරතුරු රැස්කර එම තොරතුරු අදාළ වාර්තාවට ඇතුළත් කිරීමට කටයුතු කර ඇත.




4.




**පළාත් සභා හා පළාත් පාලන ආයතන මූල්‍ය කාර්යසාධන වාර්තා**

මෙම අමාත්‍යාංශයේ මෙහෙයවීම යටතේ ක්‍රියාත්මක වන විදේශාධාර ව්‍යාපෘතීන්හි මූල්‍ය කාර්ය සාධනය හා සම්බන්ධ තොරතුරු මාසිකව ලබා ගෙන එම තොරතුරු පළාත් සභා මූල්‍ය කාර්ය සාධන වාර්තාවට ඇතුළත් කිරීමට කටයුතු කර ඇත.

5. පළාත් සභාවන්හි මූල්‍ය කටයුතු විමංසනය කිරීමේ අරමුණින් විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම, විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම, බැංකු සැසඳුම් පිළියෙළ කිරීම, අත්තිකාරම් ගිණුම් සැසඳීම, අග්‍රිම ගිණුම් සැසඳීම යනා දී කටයුතු සම්බන්ධයෙන් විශේෂයෙන් සකසා යවනු ලැබූ ආකෘති පත්‍ර මඟින් ගෙන්වාගත් දත්ත සමාලෝචනයකර 2023 වර්ෂයේ අවසන් කාර්තුව සඳහා මූල්‍ය සමාලෝචන කාර්තු වාර්තා සකස් කර අදාළ පාර්ශව වෙත ඉදිරිපත් කර ඇත. එලෙසම 2024 වර්ෂයේ පළමු හා දෙවන කාර්තු වාර්තා සහ 2024 තුන්වන කාර්තුව සඳහා පළාත් කිහිපයකට අදාළව මූල්‍ය සමාලෝචන වාර්තා සකස් කර අදාළ පාර්ශව වෙත ඉදිරිපත් කර ඇත.

6. පළාත් සභා මට්ටමින් ක්‍රියාත්මක පාසල් පෝෂණ වැඩසටහන සඳහා පළාත් සභා සහ මහා භාණ්ඩාගාරය සම්බන්ධීකරණය කර ගෙවීම් කටයුතු සිදු කිරීම

7. පළාත් පාලන ආයතනවල මූල්‍ය හා භෞතික තොරතුරු සම්බන්ධ කළමනාකරණ තොරතුරු පද්ධතිය, දත්ත විශ්ලේෂණ හා දෘශ්‍යකරණ ඒකකය හා ඒකාබද්ධව විමංසනය කිරීම.

8. අමාත්‍යාංශය මගින් පළාත් පාලන ආයතන වෙත ලබා දී ඇති වාහන, පළාත් මට්ටමින් පැවරීම් කිරීම.

9. පළාත් පාලන ආයතනවල 2024 වර්ෂයේ අයවැය ලේඛන සහ 2023 වර්ෂයේ අවසන් ගිණුම් වාර්තා දත්ත ඇතුළත් දත්ත පදනමක් පවත්වාගෙන යාම

### 3.9. අභ්‍යන්තර විගණන අංශය

**1. අරමුණ**

අමාත්‍යාංශයේ අපේක්ෂිත අරමුණු ළඟා කර ගැනීමේදී භෞතික හා මානව සම්පත් කාර්යක්ෂම සහ ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සඳහා වන සාර්ථක අභ්‍යන්තර පාලන ක්‍රම පවතින්නේද යන්න ඇගයීම හා එම පාලන ක්‍රමයයන්වල අගය එකතු කිරීම, වැඩිදියුණු කිරීම සඳහාවන මාර්ගෝපදේශ සැපයීම.

**2. ප්‍රධාන කාර්යයන්**

1. විගණන සැලැස්ම අනුව විගණන අවධානම් ක්ෂේත්‍ර සැලකිල්ලට ගෙන විගණන කටයුතු සිදු කිරීම.
2. මූලික වාර්තාව ඉදිරිපත් කිරීම.
3. අභ්‍යන්තර විගණනය අංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීම හා ඒ අනුව මාසික ප්‍රගතිය වාර්තා කිරීම.
4. කළමනාකරණ විගණන කමිටු රැස්වීම් පැවැත්වීම.
5. ව්‍යාපෘති අභ්‍යන්තර විගණන සමාලෝචන කමිටු රැස්වීම් පැවැත්වීම
6. අමාත්‍යාංශයේ සහ විදේශීය ව්‍යාපෘති සම්බන්ධයෙන් කාර්තු වාර්තා ඉදිරිපත් කිරීම.
7. අමාත්‍යාංශය යටතේ පවත්නා විදේශාධාර ව්‍යාපෘතිවලට අදාළව විගණන කටයුතු සිදු කිරීම.
8. රාජ්‍ය ගිණුම් කාරක සභාව කැඳවීම් කරන අවස්ථාවලදී ඒ සඳහා සහභාගීවීම.
9. අමාත්‍යාංශ ලේකම් විසින් පවරනු ලබන විශේෂ විමර්ශන සිදු කිරීම.
10. දේශීය ව්‍යාපෘතිවලට අදාළව විගණන කටයුතු සිදු කිරීම.
11. ඉදිරි වර්ෂය (2025) සඳහා විගණන සැලැස්ම පිළියෙල කිරීම
12. ඉදිරි වර්ෂය (2025) සඳහා අභ්‍යන්තර විගණනය අංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීම

**3. 2024.01.01. සිට 2024.12.31 දක්වා කාර්යසාධනය**

1. මූලික වාර්තාව ඉදිරිපත් කිරීම.
2. 2024 වර්ෂය සඳහා සංශෝධිත අභ්‍යන්තර විගණන සැලැස්ම ඉදිරිපත් කිරීම.
3. 2024 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනය අංශයේ සංශෝධිත වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ඉදිරිපත් කිරීම.
4. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව 2024.12.31 දක්වා මාසික ප්‍රගතිය වාර්තා කිරීම.
5. කළමනාකරණ විගණන කමිටු රැස්වීම් 03 ක් පැවැත්වීම.
6. ව්‍යාපෘති අභ්‍යන්තර විගණන සමාලෝචන කමිටු රැස්වීම් වාර 03 ක් පැවැත්වීම.

   (IV වන කාර්තුවට අදාළ රැස්වීම 2025.01.23 පැවැත්වීමට සැලසුම් කර ඇත.)
7. අමාත්‍යාංශයේ සහ විදේශීය ව්‍යාපෘති සම්බන්ධයෙන් කාර්තු වාර්තා ඉදිරිපත් කිරීම.
8. අමාත්‍යාංශ ලේකම් විසින් පවරන ලද විශේෂ විගණන 03 ක් සිදු කිරීම.

(i) පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ නිවාඩු

(ii)අමාත්‍යාංශයේ ලේඛනාගාරයේ Software මෘදුකාංගය පවත්වාගැනීම

(iii)දේශීය ණය සහ සංවර්ධන අරමුදල සම්බන්ධයෙන් විශේෂ විමර්ශනයක් සිදු කිරීම.

9. 2025 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන සැලැස්ම පිළියෙල කිරීම ආරම්භ කිරීම.

10. අභ්‍යන්තර විගණන සැලැස්ම අනුව විගණනයන් සිදු කිරීම.

**වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම අනුව ප්‍රගතිය:-**

| අනු අංකය | විගණන ක්ෂේත්‍රය | ප්‍රගතිය (%) |
|---|---|---|
| **1 වන කාර්තුව** | | |
| 01 | පුද්ගලික ලිපිගොණු පවත්වාගෙන යාම සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100 |
| 02 | වැටුප් ගෙවීම් කටයුතු සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100 |
| 03 | ඉදිරි වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම, කාර්යසාධන වාර්තාව, අයවැය කාරක සභා අවස්ථාව සඳහා ප්‍රගති වාර්තාව, ආයතනික ප්‍රතිඵල රාමුව සකස් කිරීම පිළිබඳ අභ්‍යන්තර විගණනය | 100 |
| 04 | ව්‍යාපෘති අධීක්ෂණ කටයුතු සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100 |
| 05 | පළාත් පාලන ආයතන වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතිය සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100 |
| 06 | ප්‍රවාහන සම්බන්ධතා සහ වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය (පළාත් මාර්ග ව්‍යාපෘතිය) සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100<br>(ව්‍යාපෘති අවසන් කිරීම හා වත්කම් පවරාගැනීමට අදාළව විගණනය කළ යුතු බැවින් විගණනය 4වන කාර්තුවේ සිදු කිරීමට නියමිතය) |
| **2 වන කාර්තුව** | | |
| 08 | සේවා ගිවිසුම් හා නඩත්තු කටයුතු සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100 |
| 09 | වත්කම් කළමනාකරණය සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100 |
| 10 | වැටුප් ගෙවීම් කටයුතු සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100 |
| 11 | ගෙවීම් වවුචර් කළමනාකරණය සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100 |
| 12 | පළාත් සභා හා පළාත් පාලන ආයතනවල මූල්‍ය කටයුතු සම්බන්ධීකරණය හා විමංශනය කිරීම සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100 |
| 13 | පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ වැඩසටහන (ප්‍රාග්ධන හා පුනරාවර්තන) සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100 |
| 14 | ග්‍රාමීය පාලම් ව්‍යාපෘතිය සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100 |
| 15 | ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපාතිය සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100 |
| 16 | සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100 |
| **3 වන කාර්තුව** | | |
| 17 | අමාත්‍යාංශයේ වාහන පරිපාලන සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100 |
| 18 | රාජ්‍ය නිලධාරීන්ගේ ඇප තැබීම, ඇප ලේඛන නඩත්තු කිරීම හා පුද්ගල ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100 |

| අනු අංකය | විගණන ක්ෂේත්‍රය | ප්‍රගතිය (%) |
| --- | --- | --- |
| 19 | වැටුප් ගෙවීම් කටයුතු සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100 |
| 20 | ප්‍රසම්පාදන කටයුතු කළමනාකරණය සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100 |
| 21 | තැම්පත් ගිණුම් ක්‍රියාකාරකම් සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100 |
| 22 | ජාතික අයවැය චක්‍රලේඛ අංක 04/2023 සහ 03/2023 මඟින් ලබා දී ඇති උපදෙස් පරිදි 2021 වර්ෂයේ ආරම්භ කළ නමුත් වැඩ අවසන් කිරීමට නොහැකි වූ කසල කළමනාකරණ ව්‍යාපෘතිවල වැඩ නිම කිරීම පිළිබඳ අභ්‍යන්තර විගණනය | 100 |
| 23 | පළාත් පාලන ආයතන සඳහා හඳුන්වාදීමට නියමිත නව රීති, රෙගුලාසි හා අතුරු ව්‍යවස්ථා පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100 |
| 24 | පළාත් පාලන ආයතන සඳහා තොරතුරු තාක්ෂණ පද්ධතියක් ස්ථාපිත කිරීම සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100 |
| 25 | මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය (GCWWMP) මහ කොළඹ ජල සහ අපජල කළමනාකරණ වැඩි දියුණු කිරීමේ වැඩසටහන - 3 කොටස (GCWWMIP) ව්‍යාපෘති මහ කොළඹ ජල සහ අපජල කළමනාකරණ වැඩි දියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - 3 කොටස (GCWWMIIP) ව්‍යාපෘති | 100 |
| **4 වන කාර්තුව** | | |
| 26 | මූල්‍ය කළමනාකරණය සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100 |
| 27 | වැටුප් ගෙවීම් කටයුතු සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100 |
| 28 | ගෙවීම් වවුචර් කළමනාකරණය සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100 |
| 29 | පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ වැඩසටහන (ප්‍රාග්ධන) විගණනය | 100 |
| 30 | පළාත් ආණ්ඩුකාර සමුළුව, අන්තර් පළාත් විෂය සම්බන්ධීකරණ සමුළුව පැවැත්වීම හා විශ්‍රාමික නිලධාරීන් වෙත වාහන බලපත්‍ර නිකුත් කිරීම විගණනය | 100 |
| 31 | ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය විගණනය | 100 |
| 32 | සාමාන්‍ය අධ්‍යාපන නව්‍යකරණ ව්‍යාපෘතිය විගණනය | 100 |
| 33 | ග්‍රාමීය පාලම් ව්‍යාපෘතිය සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100 |

## 3.10. ක්‍රමසම්පාදන අංශය

**1. අරමුණ**

අමාත්‍යාංශයේ අරමුණු සාක්ෂාත් කරගැනීමට අදාළ සැලසුම්, මාර්ගෝපදේශ හා ක්‍රමෝපායන් සකස් කිරීම, ඒවා ක්‍රියාත්මක කිරීම මෙන්ම සමාජ ආර්ථික සංවර්ධනයට ඉවහල් වන්නා වූ ප්‍රතිපත්ති/ උපායමාර්ග/ සැලසුම්/ වැඩසටහන්/ ව්‍යාපෘති සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, මෙහෙයවීම හා ඇගයීම හා ඊට අදාළ සෙසු කාර්යයන් ඉටු කිරීම සඳහා අමාත්‍යාංශයේ සෙසු අංශවලට අවශ්‍ය සහයෝගය ලබා දීම.

| කාර්යය | ප්‍රගතිය |
|---|---|
| 1. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සැකසීම | අමාත්‍යාංශයේ 2024 වසරට අදාළ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර එය අවශ්‍ය පරිදි යාවත්කාලීන කර ඇත.<br>• ක්‍රියාකාරී සැලැස්මට අනුව ඒ ඒ අංශ හා ආයතනවල මූල්‍ය හා භෞතික ප්‍රගතිය කාර්තුමය වශයෙන් ලබා ගැනීම හා එම වාර්තා අදාළ ආයතනවලට ඉදිරිපත් කර ඇත.<br>• අමාත්‍යාංශයේ 2025 වසරට අදාළ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම ආරම්භ කර ඇත. |
| 2. කාර්යසාධන වාර්තාව සැකසීම | අමාත්‍යාංශයේ 2023 වසරට අදාළ කාර්යසාධන වාර්තාව සකස් කර අදාළ ආයතනවලට ඉදිරිපත් කර ඇත. |
| 3. 2025 අයවැය කාරක සභා අවස්ථාවට ඉදිරිපත් කරනු ලබන වාර්තාව සැකසීම | අමාත්‍යාංශයේ 2025 වර්ෂයේ අයවැය කාරක සභා අවස්ථාවට ඉදිරිපත් කරනු ලබන 2024.12.31 දිනට අදාළ ප්‍රගතිය හා 2025 ඉදිරි සැලසුම් ඇතුළත් වාර්තාව සකස්කිරීමේ කටයුතු සිදු කරමින් පවතී. |
| 4. ආයතනික ප්‍රතිඵල රාමුව සකස් කිරීම | අමාත්‍යාංශයේ ආයතනික ප්‍රතිඵල රාමුව සකස්කර අවසන්ව ඇත. |
| 5. තිරසර සංවර්ධන අරමුණුවලට අදාළ කටයුතු සම්බන්ධීකරණය කිරීම | අමාත්‍යාංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව තිරසර සංවර්ධන අභිමතාර්ථ හඳුනාගෙන ඇති අතර අදාළ ආයතනවලට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇත. |
| 6. පළාත් පාලන ආයතනවල ධාරිතා සංවර්ධන ව්‍යාපෘතිය (CDLG) යටතේ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) සහ ආසියානු පදනමේ තාක්ෂණික හා මූල්‍ය ආධාර මත සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | • සැලසුම් ඒකකය යටතේ සාක්ෂි පදනම් කරගත් ප්‍රතිපත්ති සම්පාදනය සඳහා දත්ත විශ්ලේෂණ සහ දෘශ්‍යකරණ ඒකකය පිහිටුවීමට අදාළ කටයුතු සිදු කරමින් පවතී. අදාළ කළමනාකරණ දත්ත පද්ධතියේ සංවර්ධන කටයුතු නිමවෙමින් පවතී. ආසියානු පදනම විසින් එහි සංවර්ධන කටයුතු නිමකොට අමාත්‍යාංශය වෙත බාර දීමට කටයුතු කෙරෙමින් පවතී.<br>• අමාත්‍යාංශය මඟින් සිදු කරන ලද ව්‍යාපෘති පිළිබඳ පශ්චාත් ඇගයීමක් සිදු කර වාර්තාව එළිදක්වා ඇත.<br>• අමාත්‍යාංශයේ කාර්යමණ්ඩලය පන්සියයකට (500) පමණ කළමනාකරණ හා ඇගයීම් ක්ෂේත්‍රය ඇතුලු විවිධ ක්ෂේත්‍ර සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් 22 ක් පවත්වා ඇත.<br>• අමාත්‍යාංශයේ පරිගනක හා මුද්‍රණ යන්ත්‍ර නඩත්තුව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන උපකරණ කට්ටල (Tool Kit) හා අමාත්‍යාංශයේ ප්‍රධාන ශ්‍රවනාගාරය සඳහා ස්මාර්ට් පුවරුවක් (Smart board) ලබා දී ඇත. |
| 7. නව විදේශීය ව්‍යාපෘතිවල ප්‍රාරම්භක කටයුතු සිදු කිරීම | • Capacity Building for Sustainable Management of Rural Water Supply Schemes under PS Managing Model (CapWass) - මෙම වැඩසටහනට අදාළ ක්‍රියාකාරකම් අවසන් කර ඇත. ඒ අනුව අදාළ උප ව්‍යාපෘති නඩත්තු කිරීම සඳහා ඒ ඒ පාර්ශව අතර ගිවිසුම අත්සන් තබා ඇත.<br>• සෙමාවුල් ව්‍යාපෘතිය (Saemaul Project) - පස් අවුරුදු සංවර්ධන වැඩසටහනෙහි සංකල්ප පත්‍රිකාව සකස්කර ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවට යොමු කිරීම. කොරියානු රජය වෙනුවෙන් සෙමාවුල් පදනම (Saemaul Foundation) , මෙමඅමාත්‍යාංශය හා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව එක්ව ඇති කරගෙන ඇති ත්‍රයිපාර්ශවික ගිවිසුම යටතේ 2026 - 2031 කාලයේ දී ක්‍රියාත්මක කිරීමට නියමිත පස් අවුරුදු ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන (ඇ.ඩො.මිලියන 10) සඳහා වන සංකල්ප පත්‍රිකාව සකස්කර එයට ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ හා විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ එකඟතාවය ලබාගෙන ඇත.<br>• මෙම ව්‍යාපෘතියට අදාළ ජාතික මෙහෙයුම් කමිටු රැස්වීමක් පවත්වා ඇත. |

### 3.11. ව්‍යාපෘති අධීක්ෂණ අංශය

#### 1. අරමුණ

විවිධ ජාත්‍යන්තර මූල්‍ය ආයතන මඟින් ලබාදෙන ණය හා ප්‍රදාන යටතේ ක්‍රියාත්මක විදේශාධාර ව්‍යාපෘති මනා අධීක්ෂණයකින් යුක්තවත් ව්‍යාපෘති අරමුණු සාක්ෂාත් කරගැනීමට හැකිවන ලෙසත් මෙහෙයවීම සිදු කිරීම.

#### 2. ප්‍රධාන කාර්යයන්

1. විදේශාධාර ව්‍යාපෘති මෙහෙයවීමේ විධායක ආයතනය ලෙස විදේශාධාර ආයතන සම්බන්ධීකරණය (Doner Coordination) හා ව්‍යාපෘති යෝජනා සම්බන්ධයෙන් එම ආයතන සමඟ සාකච්ඡා කිරීම. (Doner Negotiation).

2. ව්‍යාපෘති ගිවිසුම් පරීක්ෂා කිරීම, එම ගිවිසුම් ජාතික ප්‍රතිපත්තීන්ට අනුව නැවත සකස් කිරීම, අදාළ අනුමැතින් ලබා ගැනීම හා ගිවිසුම්වලට එළඹීම.

3. ව්‍යාපෘති කාර්ය මණ්ඩල සේවා දිගු ලබා දීම ආදී මානව සම්පත් කළමණාකරණය.

4. විදේශාධාර ව්‍යාපෘතිවල ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධයෙන් පහසුකම් සැපයීම.
5. ජාතික මෙහෙයුම් කමිටු රැස්වීම සංවිධානය කිරීම හා ඉන් හඳුනාගන්නා ගැටළු විසඳීම සඳහා මැදිහත්වීම.

6. ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම, වාර්තා පිළියෙල කිරීම හා ඉන් නිරීක්ෂණය කරන දුර්වලතා / ගැටළු සම්බන්ධයෙන් මැදිහත්වීම.

7. විවිධ ආයතන මඟින් ඉල්ලුම් කරන වාර්තා සකස් කිරීමට අදාළ විශ්ලේෂණයන් සිදු කිරීම හා එම වාර්තා සකස් කිරීම.

8. ව්‍යාපෘති සම්බන්ධයෙන් වූ අමාත්‍ය මණ්ඩල සංදේශ සකස් කිරීම, අනුමැතිය ලබා ගැනීම හා තීරණ ක්‍රියාත්මක කිරීම.

9. දූත මණ්ඩල රැස්වීම් (Mission) හා අනෙකුත් රැස්වීම් (Kick off Meeting, Wrap up Meeting, etc...) සඳහා සම්බන්ධවීම.

10. විදේශ අරමුදල් සහිත ව්‍යාපෘතිවල සේවය කරන විදේශ කාර්ය මණ්ඩලයට සහ ඔවුන්ගේ යැපෙන්නන්ට වීසා නිකුත් කිරීමේ කටයුතුවලට අදාළ සම්බන්ධීකරණය සිදු කිරීම

11. ව්‍යාපෘතිවලට අදාළව මුදල් අමාත්‍යාංශය ඇතුළු විවිධ ආයතන මඟින් කැඳවනු ලබන රැස්වීම්වලට අදාළ ලේඛන සකස් කර ඉදිරිපත් කිරීම හා සහභාගී වීම.

12. සේවා යෝජකයා වශයෙන් කොන්ත්‍රාත්කරුවන්ගේ විවිධ ගැටළු හේතුවෙන් Dispute Board, බේරුම්කරණ මණ්ඩල (Arbitration) හා නඩු කටයුතු සම්බන්ධයෙන් කටයුතු කිරීම.

#### 3. 2024.01.01 සිට 2024.12.31 දක්වා කාර්යසාධනය

1. 2024 වර්ෂයේ විදේශාධාර ව්‍යාපෘති සඳහා වෙන් වූ රු.මිලියන 35,333.00 ක ප්‍රතිපාදන ඒ ඒ ව්‍යාපෘතියේ සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මෙහෙයවා ඇති අතර දෙසැම්බර් මස අවසානය වන විට රු.මිලියන 20,751.18 ක මුදලක් උපයෝජනය කර ඇත.

2. පහත සඳහන් සියළුම ව්‍යාපෘතිවලට අදාළව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සහ ව්‍යාපෘති අධීක්ෂණ කාර්යයන් සම්බන්ධීකරණය කිරීම සිදු කර ඇත.
   i. පළාත් පාලන ආයතන වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතිය (පුරනැගුම)
   ii. ග්‍රාමීය පාලම් ව්‍යාපෘතිය- අදියර 5
   iii. 1) මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය
   2) මහ කොළඹ ජල සහ අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීම ආයෝජන වැඩසටහන (කොටස 3)
   iv. පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය
   v. නැගී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය
   vi. ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධති සවිබලගැන්වීමේ ව්‍යාපෘතිය
   vii. සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය
   viii. ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය

3. මෙම ව්‍යාපෘති අතුරින් පළාත් පාලන ආයතන වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතිය (පුරනැගුම), පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය හා ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධති සවිබලගැන්වීමේ ව්‍යාපෘතිය හා ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය යන ව්‍යාපෘති මේ වන විට අවසන්ව ඇත.

4. සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතියේ පළාත්වලට අදාළ මූල්‍ය කළමනාකරණ, ප්‍රසම්පාදන සහ පාරිසරික හා සමාජ ආරක්ෂක කළමනාකරණ ක්‍රියාකාරකම් සඳහා තාක්ෂණික සහය සැපයීම හා අදාළ සම්බන්ධීකරණ කාර්යයන් සිදු කර ඇත.

5. විදේශාධාර ව්‍යාපෘතිවල සේවා දිගු ලබා දීම ඇතුළු අනෙකුත් ව්‍යාපෘති පරිපාලනමය කාර්යයන් ඉටු කර ඇත. ඒ අනුව, 2024 වර්ෂයේ සේවා කාලය සම්පූර්ණ වී ඇති තනතුරු සඳහා සේවා දිගු 125 ක් ලබාදී ඇත.

6. මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක විදේශ ආධාර ව්‍යාපෘති වලට අදාල ප්‍රගතිය විශ්ලේෂණය හා පැන නැගී ඇති ගැටළු විසඳීම ඉලක්ක කර ප්‍රගති සමාලෝචන රැස්වීම් 15ක් හා ජාතික මෙහෙයුම් කමිටු රැස්වීම් 07 ක් මෙම වසර තුළ පවත්වා ඇත. එමගින් ව්‍යාපෘතිවල ගැටලු නිරාකරණය සඳහා අදාළ මැදිහත්වීම් සිදු කර ඇත.

7. "ග්‍රාමීය පාලම් ව්‍යාපෘතිය, නැගී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය, පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය, මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය හා ප්‍රාදේශීය සංවර්ධන සහයක ව්‍යාපෘතිය" යන ව්‍යාපෘති සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශ 08 ක් සකස් කර ඇති අතර එම අමාත්‍ය මණ්ඩල සංදේශ 08 සඳහාම අමාත්‍ය මණ්ඩල අනුමැතිය ද ලැබී ඇත.

8. 2024 වසරේ දෙසැම්බර් මස දක්වා දූත මණ්ඩල රැස්වීම් 14 ක් සඳහා අනුමැතිය (Mission Clearance) ලබා දීමට කටයුතු කර ඇත.

9. එමෙන්ම මෙම වසර තුල විදේශාධාර ව්‍යාපෘතිවල කාර්ය මණ්ඩලවල සේවය කරන විවිධ නිලධාරින් හා ඔවුන්ගේ යැපෙන්නන් 229 ක් සඳහා වීසා පහසුකම් ලබා ගැනීමට අවශ්‍ය නිර්දේශ ලබා දී ඇත.

10. මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතියට අදාළව සහ මේ වන විට වසා දැමූ පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතියට අදාළව ද නඩු කටයුතු 04 ක්, Arbitration 03ක් හා Dispute Board 03 ක් පවතින අතර ඊට අදාළ නෛතික ලේඛන සැකසීම, අදාළ පරීක්ෂණ (hearings) සඳහා සහභාගී වීම, නීතිපති දෙපාර්තමේන්තුවේ සාකච්ඡා සඳහා සහභාගී වීම ආදී කටයුතු සිදු කර ඇත.

## 4. විදේශීය අරමුදල් මත ක්‍රියාත්මක වන වැඩසටහන් හා ව්‍යාපෘතිවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය (2024.01.01 සිට 2024.12.31 දක්වා)

### 4.1. පුරනැඟුම (අතිරේක ප්‍රතිපාදන)/ පළාත් පාලන ආයතන වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතිය

| | | |
|---|---|---|
| 1 | සමස්ත ආයෝජනය (රු.මි.) | 13,500 (USD 67.84 Mn) |
| 2 | ණය ආධාර සපයන ආයතන සහ මුදල් ප්‍රමාණයන් (රු.මි.) | ආසියානු සංවර්ධන බැංකුව - 12,190 – (USD 60 Mn) |
| 3 | 3.1 ව්‍යාපෘති කාල සීමාව (අවුරුදු) | අවුරුදු 6 |
| | 3.2 ආරම්භක වසර / අවසාන වසර | 2017 / 2024<br>*මෙම ව්‍යාපෘතිය අවසන්ව ඇත. |
| 4 | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ප්‍රදේශ (පළාත්/ දිස්ත්‍රික්ක/ පළාත් පාලන ආයතන/ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස/ ග්‍රාම නිලධාරී වසම්/ ගම්) | බස්නාහිර, වයඹ, දකුණු, ඌව, මධ්‍යම, උතුරු මැද පළාත් |

**5. ව්‍යාපෘතියේ අරමුණ**

ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීම

**6. මූල්‍ය ප්‍රගතිය (රු.මිලියන)**

| A | B | B/A | C | D | D/C | B+D | (B+D)/A |
|---|---|---|---|---|---|---|---|
| **සමස්ත ආයෝජන මුදල** | **2023.12.31 දක්වා සමස්ත මූල්‍ය ප්‍රගතිය** | **ප්‍රතිශතය (%)** | **2024 වර්ෂය සඳහා වෙන් කිරීම** | **2024.01.01 සිට 2024.12.31 දක්වා ප්‍රගතිය** | **ප්‍රතිශතය (%)** | **සමුච්චිත ප්‍රගතිය** | **ප්‍රතිශතය (%)** |
| 13,500.00 | 13,107.34 | 97% | 400.00 | 331.33 | 82% | 13,438.67 | 99.5% |

**7. 2024.12.31 දිනට භෞතික ප්‍රගතිය**

2023.09.30 වර්ෂය අවසන් වන විට ව්‍යාපෘතියේ සියළුම භෞතික කටයුතු 100% ක් අවසන් කර ඇත.

## 4.2. ග්‍රාමීය පාලම් ව්‍යාපෘතිය (අදියර V)

| | | |
|---|---|---|
| **1** | සමස්ත ආයෝජනය (රු.මි ) | 14,112 |
| **2** | ණය ආධාර සපයන ආයතන සහ මුදල් ප්‍රමාණයන් (රු.මි ) | නෙදර්ලන්තය 14,112 |
| **3** | 3.1 ව්‍යාපෘති කාල සීමාව<br>3.2 ආරම්භක වසර/ අවසාන වසර | අවුරුදු 3 මාස 11<br>ජූලි 2021 සිට 2025 ජූලි 05 |
| **4** | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ප්‍රදේශ | දිවයින පුරා |

## 5. ව්‍යාපෘතියේ අරමුණු

1. ජාතික ආර්ථික වර්ධනය අරමුණු කර ගනිමින් ග්‍රාමීය ජනතාවගේ ගමනාගමන පහසුව සහ ජීවන තත්වයේ ගුණාත්මකභාවය වර්ධනය කර ගැනීම
2. ග්‍රාමීය ජනතාවගේ පොදු සුරක්ෂිත බව වර්ධනය කිරීම
3. ග්‍රාමීය ප්‍රදේශවල මෙතෙක් භාවිතයට නොගත් සම්පත් උපරිම ලෙස ප්‍රයෝජනයට ගැනීම
4. පහසු ප්‍රවේශ සැපයීම තුළින් හුදෙකලා ප්‍රදේශවල සංවර්ධනය ඉහළ නැංවීම

## 6. මූල්‍ය ප්‍රගතිය (රු. මිලියන)

| A | B | B/A | C | D | D/C | B+D | (B+D)/A |
|---|---|---|---|---|---|---|---|
| **සමස්ත ආයෝජන මුදල** | **2023.12.31 දක්වා සමස්ත මූල්‍ය ප්‍රගතිය** | **ප්‍රතිශතය (%)** | **2024 වර්ෂය සඳහා වෙන් කිරීම** | **2024.01.01 සිට 2024.12.31 දක්වා ප්‍රගතිය** | **ප්‍රතිශතය (%)** | **සමුච්චිත ප්‍රගතිය** | **ප්‍රතිශතය (%)** |
| 14,112 | 9,526.54 | 67.5% | 4,500 | 947.82 | 21% | 10,474.36 | 74% |

**7. 2024.12.31 දිනට භෞතික ප්‍රගතිය**

7.1. 2023.12.31 දිනට සමුච්චිත භෞතික ප්‍රගතිය (A)

තනි මංතීරු පාලම් 53 ක සහ ද්විත්ව මංතීරු පාලම් 4 ක ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පැවතුනි.

7.2. වර්ෂය තුළ ප්‍රගතිය (2024.01.01 සිට 2024.12.31 දක්වා) (B)

පාලම් 106 ක ඉදිකිරීම් නිමකර ඇත. පාලම් 32ක පාදම ඉදිකිරීම නිමවා ඇත. පාලම් 12 ක පාදම ඉදිකරමින් පවතී.

7.3.2024.12.31 දිනට සමුච්චිත ප්‍රගතිය (A+B)

පාලම් 106 ක ඉදිකිරීම් නිමකර ඇත. පාලම් 32 ක පාදම ඉදිකිරීම නිමවා ඇත. පාලම් 12 ක පාදම ඉදිකරමින් පවතී



පාලම් අංක 5115,



## 4.3. මහකොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය ( GCWMP)

| | | |
|---|---|---|
| 1 | සමස්ත ආයෝජනය (රු.මි.) | 22,189 |
| 2 | ණය ආධාර සපයන ආයතන සහ මුදල් ප්‍රමාණයන් (රු.මි.) | ආසියානු සංවර්ධන බැංකුව – 13,647<br>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය – 8,542 |
| 3 | 3.1 ව්‍යාපෘති කාල සීමාව (අවුරුදු) | අවුරුදු 15 |
| | 3.2 ආරම්භක වසර / අවසාන වසර | 2010 - 2025 |
| 4 | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ප්‍රදේශ (පළාත්/ දිස්ත්‍රික්ක/ පළාත් පාලන ආයතන/ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස/ ග්‍රාම නිලධාරී වසම්/ ගම්) | බස්නාහිර පළාත / කොළඹ දිස්ත්‍රික්කය / කොළඹ මහ නගර සභා බල ප්‍රදේශය / කොළඹ සහ තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස / මෝදර, මාදම්පිටිය, ලුණුපොකුණ, පිටකොටුව, මාලිගාවත්ත නැගෙනහිර, ගාලු මුවදොර, වනාතමුල්ල, කොල්ලුපිටිය, බොරැල්ල දකුණ, බම්බලපිටිය, කිරුල, වැල්ලවත්ත උතුර, වැල්ලවත්ත දකුණ යන ග්‍රාම නිලධාරී වසම් |

**5. ව්‍යාපෘතියේ අරමුණු**

1. වැඩිදියුණු කළ අපජල කළමනාකරණ සේවාවක් හරහා, වඩා හොඳ නාගරික පරිසරයක් නිර්මාණය කරගැනීම
2. මහජන සෞඛ්‍යය ඉහල නැංවීම තුලින් කොළඹ සහ තදාසන්න ප්‍රදේශවල පදිංචිකරුවන්ගේ සෞඛ්‍ය ගැටලු නිරාකරණය කිරීම
3. භූගත සහ මතුපිට ජල මූලාශ්‍ර වල සහ සාගර/ වෙරළාසන්න ජලයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම
4. සනීපාරක්ෂක තත්ත්වයන් වැඩිදියුණු කිරීම තුලින් කොළඹ නගරයේ සහ තදාසන්න ප්‍රදේශවල පදිංචිකරුවන්ගේ ජීවන තත්වයන් උසස් කිරීම

**6.මුල්‍ය ප්‍රගතිය (රු. මිලියන)**

| A | B | B/A | C | D | D/C | B+D | (B+D)/A |
|---|---|---|---|---|---|---|---|
| **සමස්ත ආයෝජන මුදල** | **2023.12.31 දක්වා සමස්ත මූල්‍ය ප්‍රගතිය** | **ප්‍රතිශතය (%)** | **2024 වර්ෂය සඳහා වෙන් කිරීම** | **2024.01.01 සිට 2024.12.31 දක්වා ප්‍රගතිය** | **ප්‍රතිශතය (%)** | **සමුච්චිත ප්‍රගතිය** | **ප්‍රතිශතය (%)** |
| 22,189 | 15,989 | 72% | 2,200 | 1,300 | 59% | 17,289 | 77.9% |

**7. 2024.12.31 දිනට භෞතික ප්‍රගතිය**

7.1. 2023.12.31 දිනට සමුච්චිත භෞතික ප්‍රගතිය (A) – 96.8%.

7.2. වර්ෂය තුළ ප්‍රගතිය (2024.01.01 සිට 2024.12.31 දක්වා) (B) – 1.2%

7.3. 2024.12.31 දිනට සමුච්චිත ප්‍රගතිය (A+B) – 98%




තිඹිරිගස්යාය පොම්පාගාරය



බොරැල්ල පොම්පාගාරය

## 4.4. මහකොළඹ ජල සහ අපද්‍රව්‍ය ජල කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන – (GCWWIIMP)

| | | |
|---|---|---|
| **1** | සමස්ත ආයෝජනය (රු.මි ) | 31,285 |
| **2** | ණය ආධාර සපයන ආයතන සහ මුදල් ප්‍රමාණයන් (රු.මි ) | ආසියානු සංවර්ධන බැංකුව - 6,660<br>යුරෝපා ආයෝජන බැංකුව – 16,500<br>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය – 8,125 |
| **3** | 3.1 ව්‍යාපෘති කාල සීමාව (අවුරුදු)<br>3.2 ආරම්භක වසර/ අවසාන වසර | Years 11<br>2014 - 2025 |
| **4** | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ප්‍රදේශ (පළාත්/ දිස්ත්‍රික්ක/ පළාත් පාලන ආයතන/ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස/ ග්‍රාම නිලධාරී වසම්/ ගම්) | බස්නාහිර පළාත / කොළඹ දිස්ත්‍රික්කය / කොළඹ මහ නගර සභා බල ප්‍රදේශය / කොළඹ සහ තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස / කිරුල, නාරහේන්පිට, තිඹිරිගස්යාය,හැව්ලොක් ටවුන්, කුරුඳුවත්ත, කිරුලපනේ, පාමන්කඩ නැගෙනහිර ග්‍රාම නිලධාරී වසම් |

**5. ව්‍යාපෘතියේ අරමුණු**

1. නගරය, එහි ජල මාර්ග සහ මුහුදේ දූෂණය අවම කිරීම සඳහා සනීපාරක්ෂක සේවා කාර්යක්ෂමතාව ඉහල නැංවීම සහ ආවරණය පුළුල් කිරීම
2. එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්කය (SDG) 6 (පිරිසිදු ජලය සහ සනීපාරක්ෂාව) වෙත දායක වීම සහ වැඩිදියුණු කල මහජන සෞඛ්‍ය සේවාවක් සහ වඩා හොඳ ජීවනෝපායන් කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කිරීම.
3. මහ කොළඹ ජල සම්පාදන හා අපජල සේවා පද්ධතිවල කාර්යක්ෂමතාව සහ ඒ සම්බන්ධ මූල්‍ය පද්ධතිවල තිරසාරභාවය වැඩි දියුණු කිරීම

**6.මූල්‍ය ප්‍රගතිය (රු. මිලියන)**

| A | B | B/A | C | D | D/C | B+D | (B+D)/A |
|---|---|---|---|---|---|---|---|
| **සමස්ත ආයෝජන මුදල** | **2023.12.31 දක්වා සමස්ත මූල්‍ය ප්‍රගතිය** | **ප්‍රතිශතය (%)** | **2024 වර්ෂය සඳහා වෙන් කිරීම** | **2024.01.01 සිට 2024.12.31 දක්වා ප්‍රගතිය** | **ප්‍රතිශතය (%)** | **සමුච්චිත ප්‍රගතිය** | **ප්‍රතිශතය (%)** |
| **වාරික 02**<br>1,743 | 1,741 | 99.89% | - | - | - | 1,741 | 99.89% |
| **වාරික 03**<br>29,542 | 6,367 | 21.55% | 5,500 | 18.3 | 0.33% | 6,385 | 21.61% |

**7. 2024.12.31 දිනට භෞතික ප්‍රගතිය**

7.1. 2023.12.31 දිනට සමුච්චිත භෞතික ප්‍රගතිය (A)

වාරික 02 – 57.27%
වාරික 03 – 19.25%

7.2 වර්ෂය තුළ ප්‍රගතිය (2024.01.01 සිට 2024.12.31 දක්වා) (B)

වාරික 02 – ණය ලබා දෙන කාල සීමාව අවසන්
වාරික 03 – 0.93%

7.3. 2024.12.31 දිනට සමුච්චිත ප්‍රගතිය (A+B)

වාරික 02 – 57.27%
වාරික 03 – 20.18%



නාරාහේන්පිට පොම්පාගාරයේ ඉදිකිරීම් කටයුතු



තලකොටුව උද්‍යානය පොම්පාගාරය

**4.5.** නැගී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය (RIDEP)

| | | |
|---|---|---|
| **1** | සමස්ත ආයෝජනය (රු.මි ) | දේශීය = රු.මි. 3,474<br>විදේශීය = යෙන්.මි. 12,957<br>**එකතුව = රු.මි. 20,622**<br>(ණය ගිවිසුම අත්සන් කරන අවස්ථාවේ රු. 1= 0.706 යෙන් අනුව) |
| **2** | ණය ආධාර සපයන ආයතන සහ මුදල් ප්‍රමාණයන් | 12,957 JPY |
| **3** | 3.1 ව්‍යාපෘති කාල සීමාව (අවුරුදු)<br>3.2 ආරම්භක වසර/ අවසාන වසර | 07<br>2017-2028 |
| **4** | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ප්‍රදේශ (පළාත්/ දිස්ත්‍රික්ක/ පළාත් පාලන ආයතන/ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස/ ග්‍රාම නිලධාරී වසම්/ ගම්) | උතුරු පළාත,<br>නැගෙනහිර පළාත,<br>උතුරු මැද පළාත, ඌව පළාත |

**5.** ව්‍යාපෘතියේ අරමුණු

1. සෘජුවම දරිද්‍රතාව පිටු දැකීමේ අරමුණ පාදක කර හෝ ඊට අදාළ මූලික නිර්ණායක වන එම ප්‍රදේශවල පදිංචි පවුල්වල ආරම්භක ජීවන තත්ත්වය වර්ධනය කිරීම.
2. වී අස්වනු හා අනෙකුත් කෘෂි නිෂ්පාදන ප්‍රවාහනයට අවශ්‍ය ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීම, වකුගඩු ආශ්‍රිත රෝග නිවාරණය කිරීම සඳහා ඉහළ ගුණාත්මකභාවයෙන් යුක්ත පානීය ජලය ලබා දීම
3. ප්‍රධාන වශයෙන් වී අස්වැන්න වැඩිකිරීම පිණිස දැනට අක්‍රීය තත්වයේ ඇති කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ වාරිමාර්ග සංවර්ධනය කිරීම.

**6.** මූල්‍ය ප්‍රගතිය (රු. මිලියන)

| A | B | B/A | C | D | D/C | B+D | (B+D)/A |
|---|---|---|---|---|---|---|---|
| සමස්ත ආයෝජන මුදල | 2023.12.31 දක්වා සමස්ත මූල්‍ය ප්‍රගතිය | ප්‍රතිශතය (%) | 2024 වර්ෂය සඳහා වෙන් කිරීම | 2024.01.01 සිට 2024.12.31 දක්වා ප්‍රගතිය | ප්‍රතිශතය (%) | සමුච්චිත ප්‍රගතිය | ප්‍රතිශතය (%) |
| 20,622.00 | 6,041.65 | 29.29% | 2,500.00 | 1,262.27 | 50.49% | 7,303.92 | 35.42% |
| වාර්ෂික මූල්‍ය ප්‍රගතිය මුදල් පදනම මත වේ. | | | | | | | |

**7. 2024.12.31** දිනට භෞතික ප්‍රගතිය

7.1. 2023.12.31 දිනට සමුච්චිත භෞතික ප්‍රගතිය (A) - 50.8% ලෙස දක්වා තිබුනද එය 40% (Design සඳහා ගණනය කළ 10.8% ක ප්‍රමාණය ඉවත් කරන ලදි)

7.2. වර්ෂය තුළ ප්‍රගතිය (2024.01.01 සිට 2024.12.31 දක්වා) (B) - JICA අරමුදල් නොලැබීම නිසා වැඩ අත්හිටුවා තිබූ අතර අලුතින් වැඩ කිසිවක් ආරම්භ නොවීය.

7.3 2024.12.31 දිනට සමුච්චිත ප්‍රගතිය (A+B) - 40%



වවුනියා දිස්ත්‍රික්යේ වවුනියා දකුණ දමිල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පුතියවේලාර් සින්නකුලම් පානීය ජල ව්‍යාපෘතිය හි නල එලීම් කටයුතු සිදු කිරීම



මොනරාගල දිස්ත්‍රික්කයේ බඩල්කුඹුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වෙලන්හින්න - කිරිගල්පොත්ත මාර්ගයේ U වර්ගයේ පැති කාණු ඉදිකිරීම



බදුල්ල දිස්ත්‍රික්කයේ කන්දේකැටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මහන්තේවෙල අමුණ හා ඇල මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම



අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගලෙන්බිඳුනුවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හිඹුටුගොල්ලෑව - තම්මැන්නාගම - කොලොන්ගස්වැව මාර්ගය සංවර්ධනය කිරීමෙන් පසු

### 4.6. ප්‍රවාහන සම්බන්ධතා සහ වත්කම් කළමණාකරණ ව්‍යාපෘතිය - පළාත් මාර්ග සංවර්ධන සංරචකය

| | | |
|---|---|---|
| 1 | සමස්ත ආයෝජනය (රු.මි ) | 16,352.3 |
| 2 | ණය ආධාර සපයන ආයතන සහ මුළු ඇස්තමේන්තු පිරිවැය | ලෝක බැංකුව 16,352.3<br>ශ්‍රී ලංකා රජය 205.7 |
| 3 | **3.1** ව්‍යාපෘති කාල සීමාව (අවුරුදු)<br>**3.2** ආරම්භක වසර / අවසාන වසර | 05<br>2019 ජනවාරි -2024 ජූනි |
| 4 | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ප්‍රදේශ (පළාත්/දිස්ත්‍රික්ක/පළාත් පාලන ආයතන /ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස /ග්‍රාම නිලධාරී වසම්/ගම්) | ශ්‍රී ලංකාවේ සියලුම පළාත් ආවරණය වන පරිදි ක්‍රියාත්මක වේ.<br>*මෙම ව්‍යාපෘතිය 2024.07.15 දිනෙන් අවසන්ව ඇත. |

### 5. ව්‍යාපෘතියේ අරමුණු

1. පළාත් 09 යෙහි මාර්ග කි.මී. 400 කාපට් අතුරා (asphalt) සංවර්ධන කිරීම.
2. පළාත් මාර්ග අධිකාරි / දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලවල හැකියාව වර්ධනය.
3. සියලුම පළාත් කාර්යය මණ්ඩලවලට ප්‍රයෝජන ගත හැකි වන පරිදි බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අනුබද්ධව නිර්මාණ හා සැලසුම් පුහුණු ආයතනය (Design Centre) කිරීම හා අවශ්‍ය දත්ත පද්ධතියට ගබඩා කිරීම

**6.මූල්‍ය ප්‍රගතිය (රු. මිලියන)**

| A | B | B/A | C | D | D/C | B+D | (B+D)/A |
|---|---|---|---|---|---|---|---|
| සමස්ත ආයෝජන මුදල | **2023.12.31** දක්වා සමස්ත මූල්‍ය ප්‍රගතිය | ප්‍රතිශතය (%) | **2024** වර්ෂය සඳහා වෙන් කිරීම | **2024.01.01** සිට **2024.12.31** දක්වා ප්‍රගතිය | ප්‍රතිශතය (%) | සමුච්චිත ප්‍රගතිය | ප්‍රතිශතය (%) |
| FA 16352.3 | 14,710.6 | 89.5% | 1900 | 1641.7 | 86.4% | 16352.3 | 100% |
| DF 205.7 | 168.7 | 82% | 37 | 37 | 100% | 205.7 | 100% |

**7. 2024.12.31 දිනට භෞතික ප්‍රගතිය**

7.1. 2023.12.31 දිනට සමුච්චිත භෞතික ප්‍රගතිය (A) - 87 %

7.2. වර්ෂය තුළ ප්‍රගතිය (2024.01.01 සිට 2024.12.31 දක්වා) (B) - 10 %

7.3. 2024.12.31 දිනට සමුච්චිත ප්‍රගතිය (A+B) - 97 %



පුත්තලම මාර්ගය



ඉහළ පුලියන්කුලම මාර්ගය
කැකිරාව ප්‍රා.සභාව

## 4.7. ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධති සවිබල ගැන්වීමේ - ව්‍යාපෘතිය (PSSP)

| | | |
|---|---|---|
| **1** | සමස්ත ආයෝජනය (පළාත් සංරචකය) | රු.මි 27,994.95<br>ඇ.ඩො.මි 134.15 |
| **2** | ණය ආධාර සපයන ආයතන සහ මුළු ඇස්තමේන්තු පිරිවැය | ලෝක බැංකුව<br>රු.මි. 38,363.64 (ඇ.ඩො. මි 200)<br>(ඇ.ඩො.මි 09 ක මුදලක් **CERC** අරමුදල සඳහා ලබා ගන්නා ලදී) |
| **3** | **3.1** ව්‍යාපෘති කාල සීමාව (අවුරුදු)<br>**3.2** ආරම්භක වසර / අවසාන වසර | 05<br>2019 ජනවාරි -2024 ජූනි<br>*මෙම ව්‍යාපෘතිය 2024.06.30 දිනෙන් අවසන්ව ඇත. |
| **4** | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ප්‍රදේශ (පළාත්/දිස්ත්‍රික්ක/පළාත් පාලන ආයතන/ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස /ග්‍රාම නිලධාරී වසම්/ගම්) | ශ්‍රී ලංකාවේ සියලුම දිස්ත්‍රික්ක හා පළාත් ආවරණය වන පරිදි ක්‍රියාත්මක වේ. |

**5. අරමුණ**

ශ්‍රී ලංකාවේ ප්‍රාථමික සෞඛ්‍ය සේවාවේ ගුණාත්මකබව වර්ධනය කරමින් බෝ නොවන රෝග අවදානම ඇති පුරවැසියන් හඳුනාගෙන එම රෝග පාලනය කිරීම හා කළමණාකරණය කිරීම.

- **ව්‍යාපෘතිය මගින් අපේක්ෂා කරන නිමැවුම**

1. ප්‍රාථමික සෞඛ්‍ය ඒකක 550 ක් හඳුනාගෙන ඒ ආශ්‍රිත වයස අවුරුදු 35 ට වැඩි ජනගහනයෙන් 25%ක් ලියාපදිංචි කර බෝ නොවන රෝග නිවාරණය සඳහා සත්කාරක සේවා සැපයීම හා එම කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම.
2. ව්‍යාපෘතිය සඳහා ලබා දී ඇති DLI ඉලක්ක 09 ක් සපුරාලීම.
3. පළාත් සෞඛ්‍ය ආයතනවල නව ගොඩනැගිලි මෙන්ම වෙනත් ඉදිකිරීම් සිදු කිරීම හා පවතින

යටිතල පහසුකම් නවීකරණය කිරීම, වැඩි දියුණු කිරීම.

4. රසායනාගාර, ETU, ඖෂධ ගබඩා පහසුකම් වැඩි දියුණු කිරීම හා අළුතින් ඉදිකිරීම.
5. වෛද්‍ය හා වෛද්‍ය නොවන උපකරණ මිලදී ගැනීම.
6. කාර්ය මණ්ඩල පුහුණු කිරීම හා ධාරිතා සංවර්ධනය.
7. ප්‍රජා දැනුවත් කිරීම.
8. තොරතුරු තාක්ෂණික උපකරණ හා සබඳතා ලබා දීම.
9. රසායනාගාර නියදි පරීක්ෂාව සඳහා ප්‍රවාහන පහසුකම් ඇති කිරීම.
10. උපයෝගිතා වාහන මිලදී ගැනීම.
11. රෝගී සත්කාරක සේවාවේ පහසුකම් ඉහළ දැමීම සඳහා පානීය ජල පහසුකම්, වැසිකිළි පහසුකම්, රෝගීන් සඳහා රැඳී සිටීමේ පහසුකම් (Waiting Area Improvement) වැඩි දියුණු කිරීම.

**6. මූල්‍ය ප්‍රගතිය - පළාත් සංරචකය**

| A | B | B/A | C | D | D/C | B+D | (B+D)/A |
|---|---|---|---|---|---|---|---|
| සමස්ත ආයෝජන මුදල | 2023.12.31 දක්වා සමස්ත මූල්‍ය ප්‍රගතිය | ප්‍රතිශතය (%) | 2024 වර්ෂය සඳහා වෙන් කිරීම | 2024.01.01-2024.12.31 දක්වා ප්‍රගතිය | ප්‍රතිශතය (%) | සමුච්චිත ප්‍රගතිය | ප්‍රතිශතය (%) |
| 27,994.95 | 23,353.40 | 83% | 3,600.00 | 3,297.10 | 91.5% | 26,650.50 | 95% |











දමන ප්‍රාදේශීය රෝහල - නව බාහිර රෝගී අංශය



හදිසි ප්‍රතිකාර ඒකකය- දිස්ත්‍රික් මූලික රෝහල ඇඹිලිපිටිය

* 2024.06.30 වන විට ව්‍යාපෘතියේ සියලුම භෞතික කටයුතු අවසන් කර ඇත.

## 4.8. ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය (LDSP)

| | | |
|---|---|---|
| **1** | සමස්ත ආයෝජනය (රු.මිලියන) | රු.මි. 18,016<br>(ඇ.ඩො.මි. 100.84) |
| **2** | ණය ආධාර සපයන ආයතන සහ මුදල් ප්‍රමාණයන් (රු.මි.) | ලෝක බැංකුව - රු.මි 12,530<br>(ඇ.ඩො.මි.69.42 )<br>යුරෝපා හවුල - රු.මි. 4,233<br>(ඇ.ඩො.මි. 24.42)<br>ශ්‍රී ලංකා රජය - රු.මි. 1,253<br>(ඇ.ඩො.මි. 7.00) |
| **3** | **3.1** ව්‍යාපෘති කාල සීමාව (අවුරුදු)<br>**3.2** ආරම්භක වසර / අවසාන වසර | අවුරුදු 5 මාස 5<br>2019.06.30 -2024.11.30<br>*මෙම ව්‍යාපෘතිය 2024.11.30 දිනෙන් අවසන් වූ අතර 2025.03.31 දක්වා ව්‍යාපෘතියේ අවසන් ගිණුම් කටයුතු සිදු කිරීමට නියමිතය. |
| **4** | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ප්‍රදේශ (පළාත් /දිස්ත්‍රික්ක/පළාත් පාලන ආයතන /ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස /ග්‍රාම නිලධාරී වසම්/ගම්) | සියළුම පළාත් පාලන ආයතන ආවරණය වන පරිදි උතුර, උතුරු මැද, ඌව හා නැගෙනහිර පළාත් |

**5. ව්‍යාපෘති අරමුණ**

පළාත් පාලන ආයතනවල හැකියාවන් ශක්තිමත් කිරීම හා එම ප්‍රදේශවල ආර්ථික යටිතල පහසුකම් සංවර්ධනය කිරීම මඟින් වගකීමෙන් හා වගවීමෙන් යුතු පළාත් පාලන සේවාවක් මහජනයාට සැපයීම.

**6.මූල්‍ය ප්‍රගතිය (රු. මිලියන)**

| A | B | B/A | C | D | D/C | B+D | (B+D)/A |
|---|---|---|---|---|---|---|---|
| **සමස්ත ආයෝජන මුදල** | **2023.12.31 දක්වා සමස්ත මූල්‍ය ප්‍රගතිය** | **ප්‍රතිශතය (%)** | **2024 වර්ෂය සඳහා වෙන් කිරීම** | **2024.01.01 සිට 2024.12.31 දක්වා ප්‍රගතිය** | **ප්‍රතිශතය (%)** | **සමුච්චිත ප්‍රගතිය** | **ප්‍රතිශතය (%)** |
| 18,016 | 6,943.15 | 38.5% | 7,050.00 | 6,751.33 | 95.7% | ***23,026.48** (13,694.48 + 3332.00 +6000.00) | 76% |

(* මුළු ඇස්තමේන්තුගත පිරිවැය ආරම්භයේ පැවැති ඇමරිකානු ඩොලරයේ පරිවර්තන අනුපාතය මත (2019) පදනම් වේ. එබැවින් සමුච්චිත වියදම රුපියල්වලින් සැලකූවිට මුළු ඇස්තමේන්තුගත පිරිවැයට වඩා වැඩි වේ. තවද සමුච්චිත ප්‍රගතියට කොවිඩ් අරමුදල සඳහා වෙන් වූ රු. මි. 3,332.00 ක මුදල සහ ආර්ථික අර්බුදය සඳහා වෙන් වූ රු.මි. 6,000.00ක මුදල ද එකතු විමෙන් සමුච්චිත ප්‍රගතිය රු.මි. 23,026.43 වී ඇත.)

**7. 2024.12.31 දිනට භෞතික ප්‍රගතිය**

**7.1.** 2023.12.31 දිනට සමුච්චිත භෞතික ප්‍රගතිය (A) - 70.14 %
**7.2.** 2024.01.01 සිට 2024.12.31 දක්වා ප්‍රගතිය (B) – 29.86 %
**7.3**. 2024.12.31 දිනට සමුච්චිත ප්‍රගතිය (A+B) - 100 %



වෙළඳපොළ සංකීර්ණය වැඩිදියුණු කිරීම - ගල්නෑව



BT4 - නින්දවූර් හි පෙර පාසල් සංකීර්ණය

**4.9. සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ (GEM) ව්‍යාපෘතිය**

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන්නේ අධ්‍යාපන අමාත්‍යාංශය සහ පළාත් අධ්‍යාපන අධිකාරීන් (PEAs) විසිනි. රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය විසින් මූල්‍ය කළමනාකරණය, ප්‍රසම්පාදන සහ පාරිසරික හා සමාජ ආරක්ෂණ ක්‍රියාකාරකම් සඳහා පළාත්වලට තාක්ෂණික සහාය ලබා දෙයි.

| | | |
|---|---|---|
| **1** | සමස්ත ආයෝජනය (රු.මිලියන) | ඇමරිකානු ඩොලර් මිලියන 100 |
| **2** | ණය ආධාර සපයන ආයතන සහ මුදල් ප්‍රමාණයන් (රු.මි.) | ලෝක බැංකුව<br>ඇමරිකානු ඩොලර් මිලියන 100 |
| **3** | **3.1** ව්‍යාපෘති කාල සීමාව (අවුරුදු)<br>**3.2** ආරම්භක වසර/ අවසාන වසර | 06<br>2018/2019 – 2024/ – 2025 |
| **4** | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ප්‍රදේශ<br>(පළාත්/ දිස්ත්‍රික්ක/ පළාත් පාලන ආයතන/ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස/ ග්‍රාම නිලධාරී වසම්/ ගම්) | සියළුම පළාත් |

**5. අරමුණ**

ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සහ භාරකාරත්වය ශක්තිමත් කිරීම.

**6. මූල්‍ය ප්‍රගතිය (රු. මිලියන)**

මෙම ව්‍යාපෘතිය අධ්‍යාපන බලධාරීන් විසින් ක්‍රියාත්මක කරන අතර පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය මගින් පළාත් අංශ සඳහා මූල්‍ය, ප්‍රසම්පාදන හා පාරිසරික කටයුතු වෙනුවෙන් තාක්ෂණික සහාය ලබාදෙයි. . 2020, 2021, 2022 ,2023 හා 2024 වර්ෂවල පළාත් විසින් පිළිවෙලින් රු. මි. 400.92, 2,010.10, 2,672.32, 3,613.69 හා 4,998.86 ක ව්‍යාපෘති මුදලක් වැය කර ඇත.

| A | B | B/A | C | D | D/C | B+D | (B+D)/A |
|---|---|---|---|---|---|---|---|
| සමස්ත ආයෝජන මුදල | 2023.12.31 දක්වා සමස්ත මූල්‍ය ප්‍රගතිය | ප්‍රතිශතය (%) | 2024 සඳහා වෙන් කිරීම | 2024.01.01-2024.12.31 දක්වා ප්‍රගතිය | ප්‍රතිශතය (%) | සමුච්චිත ප්‍රගතිය | ප්‍රතිශතය (%) |
| 13,695.89* | 8,697.03 | 83% | 5,015.00 | 4,998.86 | 99% | 13,695.89 | 100% |

* පළාත් සභා සංරචකය පමණි.

**7. 2023.12.31 දිනට සමුච්චිත භෞතික ප්‍රගතිය**

මෙම ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුමේ ආකාරව, 2023 වර්ෂය සඳහා පහත සඳහන් බෙදාහැරීම් හා සම්බන්ධිත දර්ශක (Disbursement Link Indicators – DLIs)/ කාර්ය සාධනය පදනම් කරගත් කොන්දේසි (Performance Based Conditions – PBCs) සාක්ෂාත් කරන ලදී.

ඉලක්කගත පාසල් 500 ක සිසුන්ගෙන් අවම වශයෙන් 80% ක ඉංග්‍රීසි භාෂා ඉගෙනීමේ ප්‍රතිඵල වැඩිදියුණු විය. ඉංග්‍රීසි භාෂා ඉගෙනීමේ ප්‍රතිඵල වැඩිදියුණු කිරීම සඳහා ඉංග්‍රීසි භාෂා ඉගෙනුම් වැඩිදියුණු කිරීමේ (ELLE) වැඩසටහන යටතේ අවම වශයෙන් පාසල් 500ක සිසුන්ට සෘජු මැදිහත්වීම්වලින් ප්‍රතිලාභ ලැබීය.

***DLI 2 - ගණිතය ඉගෙනීමේ ප්‍රතිඵල වැඩිදියුණු කිරීම***

ඉලක්කගත පාසල් 500ක අවම වශයෙන් 80%ක සිසුන්ගේ ගණිත භාෂා ඉගෙනීමේ ප්‍රතිඵල වැඩිදියුණු විය. අවම වශයෙන් පාසල් 500 ක සිසුන් ගණිත භාෂා ඉගෙනුම් ප්‍රතිඵල වැඩිදියුණු කිරීම සඳහා ගණිත ඉගෙනුම් වැඩිදියුණු කිරීමේ (MLE) වැඩසටහන යටතේ සෘජු මැදිහත්වීම්වලින් ප්‍රතිලාභ ලැබීය.

***DLI 3 - නව වෘත්තීය සුදුසුකම් ලත් ගුරුවරුන් සංඛ්‍යාව වැඩි කිරීම***

වෘත්තීයමය වශයෙන් සුදුසුකම් ලත් නව ගුරුවරුන්ගේ සංඛ්‍යාව වැඩි කිරීම - අතිරේක වෘත්තීය සුදුසුකම් ලත් ගුරුවරුන් 20,000 ක් (කාන්තාවන් 50%)

***DLI – 4* පුළුල් කරන ලද පාසල් සෞඛ්‍ය හා පෝෂණ වැඩසටහන සංවර්ධනය කර ක්‍රියාත්මක කර ප්‍රතිඵල ලබා ගැනීම**

පාසල් සෞඛ්‍ය හා පෝෂණ වැඩසටහන පුළුල් කර සංවර්ධනය කර ක්‍රියාත්මක කර ප්‍රතිඵල ලබා ඇත - COVID-19 වසංගතය වැළැක්වීම සහ සනීපාරක්ෂක පිළිවෙත් ප්‍රවර්ධනය කිරීම ඇතුළු පාසල් සෞඛ්‍ය හා පෝෂණ වැඩ සටහන සෑම අධ්‍යාපන කලාපයකටම හඳුන්වා දී ඇත.

## 5. දේශීය ණය සහ සංවර්ධන අරමුදල (LLDF)

LOCAL LOANS & DEVELOPMENT FUND

### 1. අරමුණ

දිවයිනේ පළාත් පාලන ආයතන වල මහජන උපයෝගීතා සේවා සැපයීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය සහ ආදායම් උත්පාදක ව්‍යාපෘති සඳහා ආයෝජනය කිරීමට අවශ්‍ය අරමුදල් සහන ණය ක්‍රමයක් යටතේ සැපයීම සහ එම ණය මුදල් සහ ඊට අදාළ සහන පොළී ආපසු අයකර එමගින් පළාත් පාලන ආයතන වල මූලධන ස්වරූපයේ සංවර්ධන ව්‍යාපෘති වලට නැවත නැවතත් ණය මුදල් ලබාදීම මගින් එම ආයතන වල ශක්තිමත් ශේෂපත්‍රයක් ගොඩනැංවීමට මූල්‍ය ආයතනයක් වශයෙන් කටයුතු කිරීම අරමුදලේ මූලික අරමුණ වේ.

### 2. ප්‍රධාන කාර්යයන්

දැනට ශ්‍රී ලංකාව තුළ සංස්ථාපනය කර ඇති මහා නගර සභා 23,නගර සභා 42 සහ ප්‍රාදේශීය සභා 276 ද ඇතුළුව පළාත් පාලන ආයතන 341 සඳහා අවශ්‍ය දිගුකාලීන මූල්‍ය පහසුකම් සහනදායී පොළී අනුපාතයක් යටතේ සැපයීම අරමුදලේ මූලික කාර්ය භාරය වේ.

### 3. 2024.01.01 සිට 2024.12.31 දක්වා කාර්යසාධනය

2024 වර්ෂයේ දේශීය ණය සහ සංවර්ධන අරමුදලෙන් පළාත් පාලන ආයතනවල යටිතල පහසුකම් සහ ආදායම් උත්පාදක ව්‍යාපෘති සඳහා සහනදායී පොළී අනුපාත යටතේ ණය ලබාදීමට කටයුතු කර ඇති අතර මෙම ව්‍යාපෘති විශේෂයෙන්ම රටේ ජාතික ගැටළුවලට විසඳුම් වශයෙන් එම විෂය ක්ෂේත්‍රය කෙරෙහි ප්‍රමුඛතාවය ලබාදෙමින් ආරම්භ කර ඇත.

ගරු අග්‍රාමාත්‍ය හා විෂයභාර අමාත්‍යතුමන්ගේ හා අමාත්‍යාංශ ලේකම්තුමන්ගේ පූර්ණ මගපෙන්වීම යටතේ පුනර්ජනනීය බලශක්ති නිෂ්පාදනය කරන ව්‍යාපෘති ආදාහනාගාර ඉදිකිරීමේ ව්‍යාපෘති සහ ඩිජිටල් පුස්තකාල ව්‍යාපෘති සඳහා වැඩි ප්‍රමුඛතාවයක් ලබාදී ඇත. ඒ අනුව 2024.08.30 දිනට ණය ලබාදීමට කටයුතු කර ඇති ව්‍යාපෘති අතුරින් කොමසාරිස් මණ්ඩලය විසින් අනුමත කර ඇති ලැයිස්තුව පහත පරිදි වේ.

| අ.අ. | පළාත් පාලන ආයතනය | ව්‍යාපෘතිය | ණය මුදල (රු.) |
|---|---|---|---|
| 1 | අඹගමුව ප්‍රා.ස | සූර්ය පැනල ව්‍යාපෘතිය | 5,000,000 |
| 2 | නුවරඑළිය ප්‍රා.ස | සූර්ය පැනල ව්‍යාපෘතිය | 4,480,000 |
| 3 | මස්කෙළිය ප්‍රා.ස | සූර්ය පැනල ව්‍යාපෘතිය | 1,760,000 |
| 4 | අකුරණ ප්‍රා.ස | සූර්ය පැනල ව්‍යාපෘතිය | 6,080,000 |
| 5 | මාතලේ ප්‍රා.ස | සූර්ය පැනල ව්‍යාපෘතිය | 4,800,000 |
| 6 | නාඋල ප්‍රා.ස | සූර්ය පැනල ව්‍යාපෘතිය | 2,000,000 |
| 7 | නැගෙනහිර නුවරගම්පලාත ප්‍රා.ස | සූර්ය පැනල ව්‍යාපෘතිය | 5,600,000 |
| 8 | මිහින්තලේ ප්‍රා.ස | සූර්ය පැනල ව්‍යාපෘතිය | 1,800,000 |
| 9 | කහටගස්දිගිලිය ප්‍රා.ස | සූර්ය පැනල ව්‍යාපෘතිය | 6,000,000 |
| 10 | ඇලහැර ප්‍රා.ස | සූර්ය පැනල ව්‍යාපෘතිය | 4,800,000 |
| 11 | දිඹුලාගල ප්‍රා.ස | සූර්ය පැනල ව්‍යාපෘතිය | 11,648,000 |
| 12 | වැලිකන්ද ප්‍රා.ස | සූර්ය පැනල ව්‍යාපෘතිය | 3,299,280 |
| 13 | බෝපෙ පෝද්දල ප්‍රා.ස | සූර්ය පැනල ව්‍යාපෘතිය | 7,280,000 |
| 14 | හබරාදූව ප්‍රා.ස | සූර්ය පැනල ව්‍යාපෘතිය | 3,600,000 |
| 15 | කරන්දෙණිය ප්‍රා.ස | සූර්ය පැනල ව්‍යාපෘතිය | 2,400,000 |
| 16 | රජගම ප්‍රා.ස | සූර්ය පැනල ව්‍යාපෘතිය | 2,400,000 |
| 17 | ඉමදූව ප්‍රා.ස | සූර්ය පැනල ව්‍යාපෘතිය | 3,600,000 |
| 18 | අක්මීමන ප්‍රා.ස | සූර්ය පැනල ව්‍යාපෘතිය | 2,880,000 |
| 19 | අම්බලන්ගොඩ ප්‍රා.ස | සූර්ය පැනල ව්‍යාපෘතිය | 7,200,000 |
| 20 | අකුරැස්ස ප්‍රා.ස | සූර්ය පැනල ව්‍යාපෘතිය | 5,600,000 |

| අ.අ. | පළාත් පාලන ආයතනය | ව්‍යාපෘතිය | ණය මුදල (රු.) |
|---|---|---|---|
| 21 | මාලිම්බඩ ප්‍රා.ස | සූර්ය පැනල ව්‍යාපෘතිය | 4,800,000 |
| 22 | පිටබැද්දර ප්‍රා.ස | සූර්ය පැනල ව්‍යාපෘතිය | 4,800,000 |
| 23 | තිහගොඩ ප්‍රා.ස | සූර්ය පැනල ව්‍යාපෘතිය | 4,800,000 |
| 24 | වීරකැටිය ප්‍රා.ස | සූර්ය පැනල ව්‍යාපෘතිය | 4,800,000 |
| 25 | බදුල්ල ම.න.ස | සූර්ය පැනල ව්‍යාපෘතිය | 14,000,000 |
| 26 | පැලියගොඩ න.ස | සූර්ය පැනල ව්‍යාපෘතිය | 2,400,000 |
| 27 | නාරම්මල ප්‍රා.ස | සූර්ය පැනල ව්‍යාපෘතිය | 3,120,000 |
| 28 | වාරියපොල ප්‍රා.ස | සූර්ය පැනල ව්‍යාපෘතිය | 8,800,000 |
| 29 | කලවාන ප්‍රා.ස | සූර්ය පැනල ව්‍යාපෘතිය | 7,200,000 |
| 30 | ගඟ ඉහල කෝරලේ ප්‍රා.ස | වෙළඳ සංකීර්ණය | 30,000,000 |
| 31 | කඩුගන්නාව න.ස | ආදාහනාගාරය | 20,000,000 |
| 32 | අනුරාධපුර ම.න.ස | අවමංගල ශාලාව | 28,800,000 |
| 33 | බෝපෙ පෝද්දල ප්‍රා.ස | ආදහානාගාරය | 50,000,000 |
| 34 | කොටපොල ප්‍රා.ස | සතිපොල | 10,000,000 |
| 35 | අකුරැස්ස ප්‍රා.ස | මහජන පුස්තකාලය | 12,000,000 |
| 36 | අකුරැස්ස ප්‍රා.ස | අවමංගල ශාලාව | 20,800,000 |
| 37 | දික්වැල්ල ප්‍රා.ස | ආදාහනාගාරය | 20,000,000 |
| 38 | බදුල්ල ම.න.ස | ක්‍රීඩා සංකීර්ණය | 49,800,000 |
| 39 | රිදීමාලියද්ද ප්‍රා.ස | විදුලි සැපයීම් ව්‍යාපෘතිය | 1,250,000 |
| 40 | බිබිල ප්‍රා.ස | සතිපොල | 9,000,000 |
| 41 | සීතාවක ප්‍රා.ස | කාර්යාල ගොඩනැගිල්ල | 100,000,000 |
| 42 | කැස්බෑව න.ස | වාණිජ ගොඩනැගිල්ල | 200,000,000 |
| 43 | පැල්මඩුල්ල ප්‍රා.ස | හෙලබොජුන් හල | 22,640,000 |
| 44 | ඇඹිලිපිටිය ප්‍රා.ස | කාර්යාල ගොඩනැගිල්ල | 48,000,000 |
| 45 | බලන්ගොඩ න.ස | විශ්‍රාම ශාලාව | 16,000,000 |
| 46 | කහවත්ත ප්‍රා.ස | ජල ව්‍යාපෘතිය | 21,280,000 |
| 47 | මීගමුව ම.න.ස | පුස්තකාලය ඉදිකිරීම | 118,800,000 |
| 48 | කොලොන්න ප්‍රා.ස | වෙළඳ සංකීර්ණය | 10,000,000 |
| 49 | වත්තේගම න.ස | සූර්ය පැනල ව්‍යාපෘතිය | 5,400,000 |
| 50 | අඟුණකොළපැලැස්ස ප්‍රා.ස | සූර්ය පැනල ව්‍යාපෘතිය | 4,800,000 |
| | **එකතුව** | | **945,517,280** |

- ණය ලබාදීමට යෝජිත ව්‍යාපෘති පහතින් දැක්වේ.

| අ.අ. | පළාත් පාලන ආයතනය | ව්‍යාපෘතිය | ණය මුදල (රු.) |
|---|---|---|---|
| 1 | කෝට්ටේ ම.න.ස | සූර්ය පැනල ව්‍යාපෘතිය | 50,000,000 |
| 2 | කඩුවෙල ම.න.ස | සූර්ය පැනල ව්‍යාපෘතිය | 80,000,000 |
| 3 | කොටිකාවත්ත ප්‍රා.ස | සූර්ය පැනල ව්‍යාපෘතිය | 20,000,000 |
| 4 | පන්විල ප්‍රා.ස | සූර්ය පැනල ව්‍යාපෘතිය | 2,000,000 |
| 5 | උකුවෙල ප්‍රා.ස | සූර්ය පැනල ව්‍යාපෘතිය | 7,000,000 |
| 6 | අලව්ව ප්‍රා.ස | සූර්ය පැනල ව්‍යාපෘතිය | 15,000,000 |
| 7 | උඩුබද්දාව ප්‍රා.ස | සූර්ය පැනල ව්‍යාපෘතිය | 35,000,000 |
| 8 | කල්පිටිය ප්‍රා.ස | සූර්ය පැනල ව්‍යාපෘතිය | 40,000,000 |
| 9 | ආණමඩුව ප්‍රා.ස | සූර්ය පැනල ව්‍යාපෘතිය | 20,000,000 |
| 10 | බලපිටිය ප්‍රා.ස | සූර්ය පැනල ව්‍යාපෘතිය | 10,000,000 |
| 11 | හක්මන ප්‍රා.ස | සූර්ය පැනල ව්‍යාපෘතිය | 10,000,000 |
| 12 | අඟුනකොලපැලැස්ස ප්‍රා.ස | සූර්ය පැනල ව්‍යාපෘතිය | 7,000,000 |
| 13 | මොණරාගල ප්‍රා.ස | සූර්ය පැනල ව්‍යාපෘතිය | 20,000,000 |
| 14 | බුත්තල ප්‍රා.ස | සූර්ය පැනල ව්‍යාපෘතිය | 15,000,000 |
| 15 | කොටිකාවත්ත ප්‍රා.ස | ආදාහනාගාරය | 60,000,000 |
| 16 | පැලියගොඩ න.ස | අවමංගල ශාලාව | 25,000,000 |
| 17 | තනමල්විල ප්‍රා.ස | ආදාහනාගාරය | 20,000,000 |
| | **එකතුව** | | **436,000,000** |

- **පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති වලින් පළාත් පාලන ආයතනවලට සහ මහජනතාවට ලැබෙන පහත සඳහන් වාසි අරමුණු කරගෙන පහත ව්‍යාපෘති අරඹා ඇත.**

  i. අළුතින් බලශක්තිය නිෂ්පාදනය කරන බැවින් විදුලිබල නිෂ්පාදනය සම්බන්ධ වූ ජාතික ගැටළුවට විසඳුමක් වේ.

  ii. ජාතික විදුලිබල පද්ධතියට අතිරේක විදුලිබල ප්‍රමාණයක් එකතු කිරීම මගින් ජාතික නිෂ්පාදිතය වැඩිකර ගැනීම හා ඒ අනුව 2024 මුල් මාස 08 තුල කිලෝ වොට් 1211 ක් ජාතික විදුලිබල පද්ධතියට එකතු කිරීමට හැකියාව ලැබී ඇති බවට ගණන් බලා ඇත.

  iii. පළාත් පාලන ආයතනවල ඉහල යන විදුලි බිල ශුන්‍ය කිරීමට හැකියාව ලැබේ.

  iv. පරිසර දූෂණය වැළැක්වේ.

  v. බලශක්තියෙන් සුරක්ෂිත රටක් කරා යාමට මෙරට තුල ඇති ඉහල විභවය මෙන්ම පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රය වෙනුවෙන් පළාත් පාලන ක්ෂේත්‍රය තුල ප්‍රශස්ථ ආයෝජන සහිත වාතාවරණයක් ඇතිකිරීම.

- පසුගිය වසරවල ආරම්භකර දැනට කරගෙන යන ව්‍යාපෘති සඳහා 2024.01.01 සිට 2024.12.31 දක්වා ණය නිකුත් කල ප්‍රමාණය.

| අ.අ. | පළාත් පාලන ආයතනය | ව්‍යාපෘතිය | වටිනාකම (රු.) |
|---|---|---|---|
| 1 | පුත්තලම න.ස | වෙළඳ සංකීර්ණය | 3,430,000 |
| 2 | හක්මන ප්‍රා.ස | සූර්ය පැනල ව්‍යාපෘතිය | 6,360,000 |
| 3 | නුවරඑළිය ම.න.ස | වෙළඳ සංකීර්ණය | 55,760,000 |
| 4 | බෙන්තොට ප්‍රා.ස | වෙළඳ සංකීර්ණය | 8,130,300 |
| 5 | පානදුර ප්‍රා.ස | වෙළඳ සංකීර්ණය | 2,855,300 |
| 6 | බලන්ගොඩ ප්‍රා.ස | වේලිඔය ව්‍යාපෘතිය | 1,357,000 |
| 7 | වෙන්නප්පුව ප්‍රා.ස | සූර්ය පැනල ව්‍යාපෘතිය | 17,557,768 |
| 8 | කෑගල්ල ප්‍රා.ස | වෙළඳ සංකීර්ණය | 1,043,390 |
| 9 | කුලියාපිටිය ප්‍රා.ස | වෙළඳ සංකීර්ණය | 14,300,000 |
| 10 | මීගමුව ම.න.ස | පුස්තකාලය ඉදිකිරීම | 118,500,000 |
| 11 | කොටපොල ප්‍රා.ස | වෙළඳ සංකීර්ණය | 5,500,000 |
| 12 | අනුරාධපුර ම.න.ස | අවමංගල උත්සව ශාලාව | 9,398,612 |
| 13 | පැලියගොඩ න.ස | සූර්ය පැනල ව්‍යාපෘතිය | 2,400,000 |
| 14 | බලංගොඩ න.ස | වෙළඳ සංකීර්ණය | 5,000,000 |
| 15 | ගඟඉහල කෝරලේ ප්‍රා.ස | වෙළඳ සංකීර්ණය | 24,000,000 |
| 16 | ඇඹිලිපිටිය ප්‍රා.ස | පුස්තකාලය ඉදිකිරීම | 2,700,000 |
| 17 | නාරම්මල ප්‍රා.ස | සූර්ය පැනල ව්‍යාපෘතිය | 3,120,000 |
| | **එකතුව** | **345,642,370** | |

- දිවයින පුරා ජාතික විදුලිබල පද්ධතියට එකතු කිරීමට හැකිවන මුළු ධාරිතාවය පහතින් දැක්වේ.



- **ආයතනයේ කාර්යසාධනය ඉහළනැංවීම සඳහා 2024 වර්ෂයේ කරන ලද වෙනත් කාර්යයන්**

i. ආසියානු පදනමේ මූල්‍ය සහ තාක්ෂණික අනුග්‍රහයෙන් දේශීය ණය සහ සංවර්ධන අරමුදල සඳහා 2024 – 2028 ව්‍යාපාර සැළැස්මක් පිළියෙලකර අනුමතකර ක්‍රියාත්මක කිරීම.

ii. නව පරිගණක පද්ධතියක් ස්ථාපනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකිරීම.

iii. ආසියානු පදනමේ මූල්‍ය සහ තාක්ෂණික අනුග්‍රහයෙන් මූල්‍ය සහ ණය කාර්ය පටිපාටි සංග්‍රහය පිළියෙල කිරීම.

iv. නව ණය යෝජනා ක්‍රම හඳුන්වාදීම.

- සූර්ය බලශක්ති : සූර්ය පැනල ව්‍යාපෘති
- සනීපා :ආයුර්වේද මධ්‍යස්ථාන
- දැනුම :පුස්තකාල ඉදිකිරීම
- සිටි ලින්ක් : මගී ප්‍රවාහන සේවා
- නිසල අරණ : ආදාහනාගාර

v. පළාත් මට්ටමින් දැනුවත්කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

vi. පළාත් මට්ටමින් හිඟ ණය අයකිරීමේ වැඩසටහන් පැවැත්වීම.

vii. දේශීය ණය සහ සංවර්ධන අරමුදල් ආඥා පනත සංශෝධනය කිරීම සඳහා කමිටුවක් පත්කර අවශ්‍ය කටයුතු සිදුකිරීම.

viii. අභ්‍යන්තර විගණන අංශයක් ඇති කර අඩුපාඩු අවම කර වියදම් වල විනිවිද භාවය ඇති කිරීම.

ix. දීර්ඝ කාලයක් තිස්සේ හිඟව පැවති දඹුල්ල මහ නගර සභාවේ රු.මිලියන 106 ක ණය මුදල 2024 ජනවාරි සිට අයකිරීමට කටයුතු කිරීම.

## 6. පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය (SLILG)

### 1. හැදින්වීම

- පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය 1999 අංක 31 දරණ පාර්ලිමේන්තු පනත මඟින් ස්ථාපිත කර ඇත.
- මෙම ආයතනයේ කටයුතු පරිපාලනය සහ කළමනාකරණය කිරීම සඳහා පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයේ ලේකම් ඇතුළු නිල බලයෙන් පත්වන සාමාජිකයන් 8 දෙනෙකු සහ අමාත්‍යාංශයේ ගරු ඇමතිතුමා විසින් පත්කරනු ලබන සාමාජිකයන් 5 දෙනෙකු ඇතුළත් අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කර තිබේ.
- මෙම ආයතනයේ පරිපාලන කටයුතු ප්‍රධාන විධායක නිලධාරියා වන අධ්‍යක්ෂකවරයා විසින් සිදුකරනු ලැබේ.

### 2. අරමුණ

1. පළාත් සභා හා පළාත් පාලන ආයතන මඟින් පාලනයෙහි ආයතනික ශක්තිමත් කිරීම, වැඩිදියුණු කිරීම පිණිස කාර්යසාධනය දියුණු කිරීම සඳහා පළාත් කළමනාකරණ සංවර්ධන පුහුණු ඒකකවල හවුල්කාරිත්වය ඇතිව වැඩසටහන් සකස් කිරීම.
2. පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල කාර්යසාධනය දියුණු කිරීම සඳහා පුහුණු වැඩසටහන් සකස් කොට මෙහෙයවීම උදෙසා පළාත් කළමනාකරණ සංවර්ධන පුහුණු ඒකකවලට සහාය දෙමින් ධාරිතා වර්ධනය කිරීම.
3. පළාත් පාලනයෙහි පාර්ශවකරුවන්ට තාක්ෂණික හා අනෙකුත් තොරතුරු ලබා දෙමින් පළාත් සභා සහ පළාත් පාලන ආයතන වෙනුවෙන් සම්පත් මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියා කිරීම.
4. අදාළ ජාතික හා ජාත්‍යන්තර ආයතන සමඟ සහයෝගීතාවයන් ඇති කිරීම උදෙසා පළාත් සභා හා පළාත් පාලනය වෙනුවෙන් මධ්‍යම ආයතනය ලෙස ක්‍රියා කිරීම.
5. මානව සම්පත් සංවර්ධනයේදී, කළමනාකරණ පද්ධති වැඩි දියුණු කිරීමේදී

හා උප ජාතික පාලන ආයතනවල සංවිධානමය වෙනස්කම් වෙනුවෙන් පහසුකම් සැලසීමේදී විශේෂඥ සහායක සේවා ලබා දීම.

6. පළාත් සභා සහ පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීම සඳහා කාර්යක්ෂම හා සඵලදායක පුහුණු උපදේශන හා පර්යේෂණ සේවා සැපයීමට හැකියාව ලබා දීම පිණිස පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයෙහි කාර්යසාධනය වැඩි දියුණු කිරීම.

### 3. ප්‍රධාන කාර්යයන්

1. පළාත් සභා හා පළාත් පාලන ආයතනවල සභිකයන්ට, නිලධරයන්ට හා සේවකයන්ට ඔවුන්ගේ රාජකාරී කටයුතු වඩාත් කාර්යක්ෂම හා වඩාත් ඵලදායී ලෙස ඉටුකිරීමට හැකිවන පරිදි පුහුණු අවශ්‍යතාවන් සපුරාලීම සඳහා පළාත් හා පළාත් පාලන කළමනාකරණයට අදාළ පුහුණු පාඨමාලා පැවැත්වීම.

2. ආයතනය විසින් පවත්වනු ලබන පුහුණු පාඨමාලා සාර්ථකව අවසන් කරනු ලබන තැනැත්තන් සඳහා සහතිකපත්‍ර ප්‍රදානය කිරීම.

3. යහපත් රාජ්‍ය පාලනයක් ඇති කිරීම තහවුරු කිරීමේ අදහසින් රටතුළ ප්‍රවීණ පළාත් හා පළාත් පාලන නිලධරයන්ගෙන් හා පිරිස්වලින් සමන්විත සේවක සංචිතයක් ගොඩනැංවීමේලා සහාය වීම.

4. පළාත් හා පළාත් පාලන කළමනාකරණය පිළිබඳ විශේෂඥයන්ගේ සේවය පළාත් සභාවලට හා පළාත් පාලන ආයතනවලට ලබාගැනීමට සැළැස්වීම.

5. පළාත් සභාවල හා පළාත් පාලන ආයතනවල සංවිධාන පද්ධති හා කළමනාකරණ හැකියාවන් වැඩිදියුණු කිරීමෙන් ඒ ඒ පළාත් සභාවලට හා පළාත් පාලන ආයතනවලට සහාය වීම.

6. පළාත් සභා හා පළාත් පාලන ක්ෂේත්‍රයේ උපදේශක තත්ත්වයේ පැවරුම් භාරගැනීම.

7. පළාත් හා පළාත් පාලන ආයතනවල කළමනාකරණ පද්ධතිවල හා පරිචයන්හි විවේචනාත්මක ඇගයීමක් කිරීමේලා මණ්ඩප ඇති කිරීම.

8. කළමනාකරණ සංවර්ධනය හා වැඩ පිළිබඳ ප්‍රතිමාන ස්ථාපනය කිරීම, වන්දි ගෙවීමේ ක්‍රම නිශ්චය කිරීම සහ සාමාන්‍යයෙන් පළාත් කළමනාකරණ සංවර්ධනය සහ පුහුණු කිරීමේ ඒකකවල සහ පළාත් පාලන ආයතන වල ඵලදායීත්වය වැඩිදියුණු කිරීම පිණිස පළාත් කළමනාකරණ සංවර්ධනය සහ පුහුණු කිරීමේ ඒකකවලට (MDTUs) හා පළාත් පාලන ආයතනවලට සහාය වීම.

9. ආයතනයේ පරමාර්ථ හා සමාන පරමාර්ථ ඇති, ශ්‍රී ලංකාව තුළ හෝ විදේශයන්හී පිහිටි වෙනත් බාහිර සංවිධාන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.

10. පළාත් සහ පළාත් පාලනය පිළිබඳ සම්මේලන හා සම්මන්ත්‍රණ සඳහා අනුග්‍රහය දැක්වීම, පැවැත්වීම සහ ඒ පිළිබඳ පොතපත හා සඟරා පළකිරීම.

11. පළාත් පාලනය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සකස් කිරීමේ කාර්යය සඳහා අමාත්‍යවරයාට අවශ්‍ය දත්ත හා තොරතුරු සැපයීම.

12. ආයතනයේ කර්තව්‍ය පිළිබඳ අදාළ ආයතන හා මහජනතාව අතර තොරතුරු පතළ කිරීම.

13. පළාත් සහ පළාත් පාලන ආයතනවල සියලු අංශයන් පිළිබඳව පර්යේෂණ පැවැත්වීම, ප්‍රවර්ධනය කිරීම සහ ඒ සඳහා සහාය දැක්වීම.

4. **2024.01.01 සිට 2024.12.31 දක්වා කාර්යසාධනය**

| අංශයේ නම | වැඩමුළුවේ නම | භෞතික ප්‍රගතිය | | |
|---|---|---|---|---|
| | | සැලසුම් කළ වැඩමුළු ගණන | පවත්වන ලද වැඩමුළු ගණන | භෞතික ප්‍රගතිය (%) |
| භෞතික සැලසුම් හා පරිසර අංශය | පරිසර බලපත්‍ර නිකුත්කිරීම හා නෛතික ක්‍රියාවලිය | 01 | 01 | 100% |
| | පුස්තකාල සහායකවරුන් සඳහා වන තෙදින පුහුණු වැඩමුළුව | 01 | 01 | 100% |
| ඉංජිනේරු අංශය | වායුසමීකරණ නඩත්තු කිරීම පිළිබඳ පුහුණු වැඩමුළුව | 01 | 01 | 100% |
| | ජලනල තාක්ෂණය සහ වතුර මෝටර් සවිකිරීම පිළිබඳ පුහුණු වැඩමුළුව | 01 | 01 | 100% |
| | ප්‍රසම්පාදනය පිළිබඳ මූලික පියවරයන් | 01 | 01 | 100% |
| | තිරසාර බව සඳහා පළාත් පාලන ආයතන ඩිජිටල්කරණය කිරීම පිළිබඳ දැනුවත්කිරීමේ පුහුණු වැඩමුළුව | 01 | 01 | 100% |
| නීති අංශය | පළාත් පාලන නිතිය පිළිබඳ පුහුණු වැඩමුළුව | 01 | 01 | 100% |
| | අතුරු ව්‍යවස්ථා සකස්කිරීම පිළිබඳ පුහුණු වැඩමුළුව | 01 | 01 | 100% |
| | බදු සහ අදායම් අයකිරීම පිළිබඳ වැඩමුළුව | 01 | 01 | 100% |
| | ගිවිසුම් ක්‍රියාවලිය සහ දේපළ කළමනාකරණය පිළිබඳ වැඩමුළුව | 01 | 01 | 100% |
| | පළාත් පාලන ආයතනවල උසාවි කටයුතු පිළිබඳ පුහුණු වැඩමුළුව | 01 | 01 | 100% |
| | පළාත් පාලන නිතිය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව | 01 | 01 | 100% |
| පොදු කළමනාකරණ අංශය | රාජ්‍ය සේවකයින් බඳවා ගැනීම හා පත් කිරීමේ ක්‍රියාපටිපාටි පිළිබඳ වැඩමුළුව | 01 | 01 | 100% |
| | ගබඩා කළමනාකරණය සහ වාර්තා කාමර පවත්වාගෙන යාම පිළිබඳ පුහුණු වැඩමුළුව | 01 | 01 | 100% |
| | පෞද්ගලික ලිපිගොනු නඩත්තුව පිලිබඳ පුහුණු වැඩමුළුව | 01 | 01 | 100% |
| තොරතුරු තාක්ෂණ අංශය | Proramme on Computer Hardware and Preventive Maintenance | 01 | 01 | 100% |
| | Programme on Web Development Using Word Process | 01 | 01 | 100% |
| | Programme on Graphic Design Using Canva | 01 | 01 | 100% |
| | Programme on Google Workspace | 01 | 01 | 100% |
| මූල්‍ය කළමනාකරණ අංශය | පළාත් පාලන ආයතන වල මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම පිළිබඳ පුහුණු වැඩමුළුව | 01 | 01 | 100% |
| | පළාත් පාලන ආයතන සඳහා වටුප් පරිවර්තන පිළිබඳ පුහුණු වැඩමුළුව | 01 | 01 | 100% |
| | මූල්‍ය කළමනාකරණ ඩිප්ලෝමාව | 01 | 01 | 60% |
| පර්යේෂණ හා සංවර්ධන අංශය | EXCEL for E- Governance and Research දෙදින වැඩමුළුව | 01 | 01 | 100% |
| | පළාත් පාලන ආයතනවල අදායම් අංශයේ කාර්ය සාධනය ඉහල නැංවීම පිළිබඳ දෙදින වැඩමුළුව | 01 | 01 | 100% |
| පුහුණු හා අධ්‍යයන අංශය | පළාත් පාලන ඩිප්ලෝමාව | 01 | 01 | 100% |
| | පළාත් පාලන ආයතනවල පරිපාලන ගැටලු පිළිබඳ පුහුණු වැඩමුළුව | 01 | 01 | 100% |
| | පළාත් පාලන ආයතනවල අදායම් එකතු කිරීමේ ගැටලු පිළිබඳ වැඩමුළුව | 01 | 01 | 100% |
| | පළාත් පාලන ආයතනවල බලතල හා වගකීම් ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන ගැටලු පිළිබඳ වැඩමුළුව | 01 | 01 | 100% |










**පර්යේෂණ හා සංවර්ධන අංශයට අදාල පර්යේෂණ දත්ත එක්රැස් කිරිම.**

- පළාත් පාලන ආයතන යටතේ ක්‍රියාත්මක වන පෙර පාසල්වල දත්ත ගබඩාවක් සකස් කිරීම
  තොරතුරු ලබා ගැනීම සඳහා භාවිතා කරන ලද පළාත් පාලන ආයතන සංඛ්‍යාව -262
  ප්‍රතිචාර දැක්වූ පළාත් පාලන ආයතන සංඛ්‍යාව - 194
  පෙරපාසල් නොමැති පළාත් පාලන ආයතන සංඛ්‍යාව - 28

| පළාත | දිස්ත්‍රික්කය | ප්‍රතිචාර දැක්වූ පළාත් පාලන ආයතන සංඛ්‍යාව | පෙර පාසල් සංඛ්‍යාව | ගුරුවරුන් | ගුරු සහායකයින් |
|---|---|---|---|---|---|
| මධ්‍යම | නුවර | 12 | 25 | 34 | 1 |
| | නුවර එළිය | 5 | 13 | 20 | |
| | මාතලේ | 5 | 18 | 22 | |
| දකුණ | ගාල්ල | 11 | 81 | 109 | |
| | මාතර | 9 | 19 | 34 | |
| | හම්බන්තොට | 9 | 27 | 53 | |
| උතුරු මැද | අනුරාධපුරය | 7 | 13 | 30 | |
| | පොළොන්නරුව | 8 | 14 | 29 | |
| වයඹ | කුරුණෑගල | 12 | 37 | 89 | 1 |
| | පුත්තලම | 11 | 81 | 183 | 3 |
| සබරගමුව | රත්නපුරය | 8 | 28 | 55 | |
| | කෑගල්ල | 10 | 20 | 34 | 5 |
| ඌව | බදුල්ල | 13 | 32 | 51 | 8 |
| | මොණරාගල | 8 | 12 | 34 | |
| බස්නාහිර | කොළඹ | 10 | 53 | 99 | 5 |
| | ගම්පහ | 12 | 43 | 68 | 3 |
| | කළුතර | 16 | 68 | 109 | 33 |
| | **මුළු එකතුව** | **166** | **584** | **1053** | **59** |

- පළාත් පාලන ආයතන යටතේ ක්‍රියාත්මක වන දින/සති පොළවල් පිළිබඳ දත්ත ගබඩාවක් සකස් කිරීම.
  තොරතුරු ලබා ගැනීම සඳහා භාවිතා කරන ලද පළාත් පාලන ආයතන සංඛ්‍යාව -262
  ප්‍රතිචාර දැක්වූ පළාත් පාලන ආයතන සංඛ්‍යාව - 173
  සති/දින පොළවල් නොමැති පළාත් පාලන ආයතන සංඛ්‍යාව - 27

| පළාත | දිස්ත්‍රික්කය | ප්‍රතිචාර දැක්වූ පළාත් පාලන ආයතන සංඛ්‍යාව | සති/දින පොළවල් සංඛ්‍යාව |
|---|---|---|---|
| මධ්‍යම | මහනුවර | 9 | 17 |
| | නුවරඑළිය | 5 | 8 |
| | මාතලේ | 7 | 10 |
| දකුණ | ගාල්ල | 10 | 19 |
| | මාතර | 7 | 15 |
| | හම්බන්තොට | 7 | 21 |
| උතුරු මැද | අනුරාධපුර | 9 | 11 |
| | පොළොන්නරුව | 5 | 16 |
| වයඹ | කුරුණෑගල | 11 | 31 |
| | පුත්තලම | 8 | 22 |
| සබරගමුව | රත්නපුරය | 16 | 29 |
| | කෑගල්ල | 10 | 14 |
| ඌව | බදුල්ල | 8 | 17 |
| | මොණරාගල | 8 | 19 |
| බස්නාහිර | කොළඹ | 6 | 16 |
| | ගම්පහ | 10 | 33 |
| | කළුතර | 10 | 20 |
| | **මුළු එකතුව** | **146** | **318** |

## 7. 2025 වසරේ දී ක්‍රියාත්මක කිරීමට යෝජිත ඉදිරි සැලසුම්

❖ **සංවර්ධන අංශය**

2025 වර්ෂය සඳහා පහත සඳහන් වැඩසටහන යටතේ වෙන් වන ප්‍රතිපාදන අනුව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

- පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ වැඩසටහන (ප්‍රාග්ධන) යටතේ අඩු ආදායම්ලාභී පළාත් පාලන ආයතනවල ස්වයං උත්පාදන ආදායම් මට්ටම වර්ධනය කරගත හැකි වන පරිදි එම ආයතන බල ප්‍රදේශවල පානීය ජල සම්පාදනය, වෙළෙඳපොල පහසුකම් වැනි පොදු යටිතල පහසුකම් ඇතුළු අනෙකුත් යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට අදාල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

❖ **ජාතික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සහායක මධ්‍යස්ථානය**

1. පළාත් පාලන ආයතනවල ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු විධිමත් කිරීම සඳහා ‘‘Clean Sri Lanka’’ වැඩසටහනට සමගාමීව ක්‍රියාත්මක කළයුතු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
2. අඩු ආදායම්ලාභී පළාත් පාලන ආයතනවල නාගරික අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු ඉහළ නැංවීම.
3. ATLAS මෙවලම යොදාගනිමින් දිවයිනේ සියලුම පළාත් පාලන ආයතනවල අපද්‍රව්‍ය කළමනාකරණය ශ්‍රේණිගත කිරීම.
4. KOICA ආධාර යටතේ **වව්නියාව** සහ **බදුල්ල** දිස්ත්‍රික්ක කේන්ද්‍ර කරගනිමින් ක්‍රියාත්මක කිරීමට නියමිත ඒකාබද්ධ කසළ කළමනාකරණ ව්‍යාපෘතියෙහි ඉදිරි කටයුතු සිදු කිරීම.
5. JICA ආධාර යටතේ පළාත් පාලන ආයතන මඟින් සිදු කරනු ලබන මළ අපජල කළමනාකරණයේ කටයුතු සඳහා උපදෙස් මාලාවක් සකස් කිරීම සහ මළ අපජල පිරිපහදු පද්ධති මඟින් ඉවත් කරන පාංශු මඟින් කෘෂිකාර්මික වැදගත්කමක් ඇති පොහොර නිෂ්පාදනය සඳහා වූ ව්‍යාපෘතියෙහි ඉදිරි කටයුතු සිදු කිරීම.
6. පළාත්වල නාගරික ඝන අපද්‍රව්‍ය ප්‍රධාන සැලැස්ම සකස් කිරීම සම්බන්ධ මාර්ගෝපදේශ පිළියෙල කිරීම පළාත්වල නාගරික.
7. අපද්‍රව්‍ය කළමනාකරණ දත්ත පද්ධතිය සකස් කිරීම.
8. පවතින කසල කඳු පුනරුත්ථාපනය කිරීම සහ නව කසල කඳු ඇතිවීම වළක්වා ගැනීම පිණිස ක්‍රියාමාර්ග ගැනීමට පළාත් පාලන ආයතන යොමු කිරීම.

9. පළාත් පාලන ආයතනවල කසල කළමනාකරණ කටයුතුවල යෙදෙන පුද්ගලයින්ගේ ධාරිතා සංවර්ධන වැඩසටහන් සම්පාදනය කිරීම.
10. පළාත් පාලන ආයතනවල නිෂ්පාදනය කරනු ලබන කොම්පෝස්ට් පොහොර සඳහා වෙලඳපලක් නිර්මාණය කිරීමට අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
11. JICA ආධාර යටතේ සකස් කරන ලද බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ලබා ගැනීම
12. අපද්‍රව්‍ය කළමනාකරණ සම්බන්ධ සෙසු පාර්ශවකාර ආයතන සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
13. අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය විමසීම.

❖ **පළාත් සභා අංශය**

1. පළාත් සඳහා වඩාත් ඵලදායි හා කාර්යක්ෂම අයුරින් ක්‍රියාත්මකවීමට අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සහ අවශ්‍ය අවස්ථාවලදී උපදෙස් ලබා දීමට කටයුතු කිරීම.

2. මධ්‍යම රජය හා පළාත් සභා අතර විධිමත් සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් ගොඩනැගීම සඳහා පළාත් ප්‍රධාන ලේකම්වරුන් හා මධ්‍යම රජයේ ආයතන
සම්බන්ධ කර ගනිමින් අන්තර් පළාත් විෂය සම්බන්ධීකරණ සමුළුව කාර්තුවකට එක බැගින් පැවැත්වීම සහ සමුළුවේදී මතුවන ගැටළු සඳහා පළාත් නවයටම අදාල වන ඒකීය ක්‍රම හඳුන්වා දීම.

3. පළාත් සභා හා පළාත් පාලන ආයතන සඳහා ඉඩම් අත්පත් කරගැනීම සම්බන්ධ කටයුතු.

4. පළාත් සභාවන්වල කටයුතු කඩිනම් හා පහසු කරවන මෙන්ම නෛතික රාමුව ආරක්ෂා කිරීමට අදාලව හඳුනාගත් ක්‍රියාකාරකම් සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශ සකස් කිරීම.

5. කළමනාකරණ සේවා චක්‍රලේඛ 03/2014 අනුව පළාත් රාජ්‍ය සේවයේ නව තනතුරු ඇති කිරීම සහ පළාත් රාජ්‍ය සේවයේ කාර්ය මණ්ඩල සමාලෝචන කටයුතු සිදු කිරීම.

6. පළාත් සභා සඳහා වාහන මිළදී ගැනීම සහ දීපව්‍යාප්ත සේවයේ විශ්‍රාමික නිලධාරීන් වෙත තීරු බදු සහන සහිත වාහන ආනයන බලපත්‍ර නිකුත් කිරීමට අදාලව නිර්දේශ ලබා දීම.

7. පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ අධීක්ෂණ හා මෙහෙයුම් කටයුතු සිදු කිරීම.

❖ **පළාත් පාලන අංශය**

1. පළාත් පාලන ආයතන නගා සිටුවීම සඳහා සැකසූ කාර්ය සාධන මෙවලම (2.0) යටතේ සියලුම පළාත් පාලන ආයතන ඇගයීම් කර 2025 වර්ෂයේ ජාතික ස්වර්ණපුරවර සම්මාන උළෙල පැවැත්වීම.
2. පළාත් පාලන ආයතනවල ආදායම් එකතු කිරීම හා ගිණුම්ගත කිරීමට තොරතුරු තාක්ෂණ විසඳුම් හඳුන්වා දීම.
3. රාජ්‍ය වියදම් සමාලෝචන කමිටු වාර්තාවේ නිර්දේශ අනුව (PERC) පළාත් පාලන ආයතන වසර 05ක් තුළ ස්වයං උත්පාදන ආදායමින් පමණක් ක්‍රියාත්මක විය හැකි පරිදි ශක්තිමත් කිරීමට අවශ්‍ය ප්‍රතිපත්තිමය පසුබිම සකසා ක්‍රියාවට නැංවීම.
4. පළාත් පාලන ආයතන බල ප්‍රදේශවල සංචාරක යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීම.
5. පළාත් පාලන ආයතනවල වරිපනම් තක්සේරු කිරීමේ ක්‍රියාවලිය සමාලෝචනය කිරීම හා කාලීනව අය කර ගැනීමේ යාන්ත්‍රණය ශක්තිමත් කිරීම
6. පළාත් පාලන ආයතන සඳහා පොදු මානව සම්පත් සංවර්ධන උපාය මාර්ග ක්‍රමයක් හඳුන්වා දීම.
7. පළාත් පාලන ආයතන, විදේශීය පළාත් පාලන ආයතන සමඟ සහෝදර නගර, මිතුරු නගර ගිවිසුම් මඟින් විදේශීය තාක්ෂණය, දැනුම සහ ව්‍යාපෘති පළාත් පාලන ආයතන වෙත හඳුන්වා දීම.
8. පළාත් පාලන ආයතන සඳහා කාර්ය සාධන ප්‍රදාන ලබා දීම.
9. මධ්‍යම රජය සහ පළාත් පාලන ආයතන / පළාත් සභා අතර සම්බන්ධීකරණය.

❖ **නීති අංශය**

1. රජය විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ පරිදි පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනත සංශෝධනය කිරීම.
2. රජය විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ පරිදි පළාත් සභා ඡන්ද විමසීම් පනත සංශෝධනය කිරීම.

3. පළාත් පාලන ආයතන සඳහා හඳුන්වා දීමට නියමිත නව රීති, රෙගුලාසි හා අතුරු ව්‍යවස්ථා පිළිබඳව දැනුවත්කිරීමේ වැඩසටහන්.
4. පළාත් පාලන ආයතනවල ස්වයං උත්පාදන ආදායමෙන් වැඩි ප්‍රතිශතයක් ආවරණය කරන උසාවි දඩ මුදල්, මුද්දර ගාස්තු ඍජුවම පළාත් පාලන ආයතනයේ ගිණුමට යොමුවන පරිදි පළාත් සභා පනතේ ඉදිරි සංශෝධන කටයුතු අවසන් කිරීම.
5. ජලභීතිකාව තුරන්කිරීම අරමුණු කොටගෙන ජලභීතිකා ආඥා පනත සඳහා යෝජිත සංශෝධන.
6. පළාත් පාලන ආයතනවල නෛතික ගැටළුවලට අදාළ උපදෙස් ලබාදීම.
7. දැනට විසිරුවා හැරී ඇති පළාත් පාලන ආයතනවල සංස්ථාපන නියම පළකිරීම සහ පළාත් පාලන ආයතනවල ධුර කාලය.

❖ **පාලන හා පුහුණු අංශය**

1. සංචාරකයින්ගේ දැඩි ආකර්ෂණයට ලක්ව ඇති ප්‍රදේශයක කණ්ඩලම සංචාරක බංගලාව පිහිටා ඇති හෙයින් එය වැඩිදියුණු කොට මෙම අංශයේ ආදායම් උත්පාදන මාර්ගයක් බවට පත්කිරීම.
2. නිලධාරීන්ගේ මූලික පුහුණු අවශ්‍යතා හඳුනාගෙන ඒවා වැඩි දියුණු වන පරිදි පුහුණු වැඩසටහන් පැවැත්වීම හරහා නිලධාරීන්ගේ නිපුණතා සංවර්ධනය කිරීම තුලින් මානව සම්පතින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම.
3. ප්‍රසම්පාදන සැලසුම්වලට යටත්ව පිරිවැය අවම වන පරිදි වාහන ඇතුළු අනෙකුත් නඩත්තු කටයුතු සඵලදායීව ඉටුකිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම.
4. තොරතුරු තාක්ෂණය භාවිතා කිරීම තුලින් (IT) සහකාර අධ්‍යක්ෂ තනතුරද, තොරතුරු තාක්ෂණ නිලධාරී තනතුරද සම්පූර්ණ කර ඇති බැවින්) වඩා කාර්යක්ෂමව හා අතහුරු ක්‍රමයට එහා ගිය ඵලදායිතාවක් අත්කර ගැනීම.
5. නීතිරීති / රෙගුලාසිවලට අනුකූලව අංශයේ මූල්‍යමය වියදම් අඩු කිරීමට අවශ්‍ය පියවර ගැනීම.

➢ **තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය**

8. තොරතුරු දැන ගැනීමේ පනත යටතේ මහජනතාව විසින් කරනු ලබන ඉල්ලීම් සඳහා ප්‍රතිචාර දැක්වීම.
9. පළාත් පාලන ආයතනවල ආදායම් රැස්කිරීම විධිමත් සහ කඩිනම් කිරීමට අදාළ සංශෝධන.
10. මහජන සහභාගීත්වය සහිත පළාත් පාලනයක් සහතික කරලීමට අදාළව සිදුකළ යුතු අණපනත් සංශෝධන.
11. තේරීපත්වීමට නියමිත නව පළාත් පාලන ආයතන සභිකයින් දැනුවත්කිරීමේ වැඩසටහන්.

1. Empowering Local Government - A Comprehensive Digitalization Project for Local Government ව්‍යාපෘතියේ මෘදුකාංග සංවර්ධන කටයුතු සිදු කිරීම. බස්නාහිර පළාත, දකුණ පළාත, ඌව පළාත යන පළාත් වලද මෙම පද්ධතිය ක්‍රියාත්මක කිරීම හා එම පළාත් පාලන ආයතන වල නිලධාරින් පුහුණු කිරිම.
2. අප මෘදුකාංග ක්‍රියාත්මක වන සියළුම පළාත් පාලන ආයතන සඳහා Payment Gateway ලබා දීම
3. දෘඩාංග සහ මෘදුකාංග ගැටළු ඇතුළු තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආශ්‍රිත කරුණු සඳහා සහය වීම.
4. අමාත්‍යාංශයේ වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම්.
5. අමාත්‍යාංශයීය ෆේස්බුක් පිටුව යාවත්කාලීන කිරීම.
6. අමාත්‍යාංශයේ ICTA හි LGN 2.0 ව්‍යාපෘති කටයුතු සම්බන්ධීකරණය සහ අධීක්ෂණය.
7. අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ දැනුම වර්ධනය සඳහා අවශ්‍ය පුහුණු වැඩසටහන් පැවැත්වීම.
8. අමාත්‍යාංශය තුළ කඩදාසි භාවිතයෙන් තොර පරිසරයක් පවත්වා ගැනීම සඳහා මෘදුකාංග පද්ධති සකස් කිරීම.
9. Zoom රැස්වීම් සඳහා යොමු සකස් කිරීම හා තාක්ෂණික සහය ලබා දීම.

❖ **මූල්‍ය අංශය**

1. විද්‍යුත් බැංකුකරණය ඔස්සේ ගෙවීම් පද්ධතිය ක්‍රියාත්මක කිරීම තුළින් අනවශ්‍ය ප්‍රමාදයන් වැළැක්වීම.

12. Slip ක්‍රමය මඟින් තෝරාගත් ගෙවීම් සිදු කිරීම.

3. ප්‍රසම්පාදන කටයුතු වඩාත් කාර්යක්ෂම ක්‍රියාත්මක කිරීමටත්, සමීපව අධීක්ෂණය කිරීමටත් පහසු වන ලෙස ගූගල් පැතුරුම්පත් සකස් කිරීම හා යාවත්කාලීන කිරීම.

❖ **වියදම් විමංසන අංශය**

01. 2025 වර්ෂය තුළදී ද මධ්‍යම රජය විසින් දෙනු ලබන ප්‍රදානයන් හා පළාත් සභා ආදායම් ඇස්තමේන්තුගත වියදම් සීමාවන්ට යටත්ව එම ආයතන විසින් වියදම් කරනු ලබන ආකාරය පිළිබඳව අඛණ්ඩ ඇගයීමක් කරගෙන යාමට අපේක්ෂිතය. ඒ අනුව 2025 වර්ෂයේ පළමු, දෙවන හා තෙවන කාර්තු සඳහා පළාත් සභා මූල්‍ය කාර්යය සාධන වාර්තා සකස් කිරීමට අපේක්ෂිතය. එලෙසම 2024 වර්ෂයේ දත්ත පදනම්ව 2024 වාර්ෂික පළාත් සභා මූල්‍ය කාර්යය සාධන වාර්තා සකස් කිරීමට අපේක්ෂිතය.

02. පළාත් සභා හා පළාත් පාලන ආයතනවල සේවක සංඛ්‍යා සම්බන්ධයෙන් පවත්වා ගෙන යනු ලබන 2024 වර්ෂයේ දත්ත පදනම් කරගනිමින් 2025 වර්ෂය සඳහා යාවත්කාලීන කිරීමට අපේක්ෂිතය.

03. පළාත් පාලන ආයතනයන්හි ආදායම් හා වියදම් පිළිබඳ තොරතුරු ඇතුළත් දත්ත පදනම මෙම වර්ෂයේ දී 2024 වර්ෂයට අදාළව යාවත්කාලීන කරන ලද අතර, එම තොරතුරු විශ්ලේෂණය කිරීමෙන් 2024 වර්ෂයේ පළාත් පාලන ආයතනවල මූල්‍ය කාර්ය සාධන වාර්තාව සකස් කිරීමට 2025 වර්ෂයේ දී සැළසුම් කර ඇත. එලෙසම 2025 වර්ෂයේ අර්ධ වාර්ෂික වාර්තාව සකස් කිරීමට සැලසුම් කර ඇත.

04. මෙම අමාත්‍යාංශයේ මෙහෙයවීම යටතේ ක්‍රියාත්මක වන විදේශාධාර ව්‍යාපෘතීන්හි මූල්‍ය කාර්යසාධනය හා සම්බන්ධ තොරතුරු මාසිකව ලබා ගෙන එම තොරතුරු පළාත් සභා මූල්‍ය කාර්ය සාධන වාර්තාවට ඇතුළත් කිරීම 2025 වසරේදී ද අඛණ්ඩව කරගෙන යාමට සැලසුම් කර ඇත.

05. පළාත් සභාවන්හි මූල්‍ය කටයුතු විමංසනය කිරීමේ අරමුණින් විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම, විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම, බැංකු සැසඳුම් පිළියෙළ කිරීම, අත්තිකාරම් ගිණුම් සැසඳීම, අග්‍රිම ගිණුම් සැසඳීම යනා දී කටයුතු සම්බන්ධයෙන් විශේෂයෙන් සකසා යවනු ලැබූ ආකෘති පත්‍ර මඟින් වර්ෂයේ දී කාර්තුමය වශයෙන් තොරතුරු පළාත් සභා වෙතින් ගෙන්වාගෙන එම දත්ත උපයෝගී කර ගනිමින් අදාළ කාර්යයන්හි ප්‍රගතිය සමාලෝචනය කර, එම කටයුතු සම්බන්ධයෙන් පවත්නා ප්‍රමාදයන් හෝ ගැටළු සහගත තත්ත්වයන් පළාත් මූල්‍ය කළමනාකරණයේ අවධානයට යොමු කිරීම 2025 වර්ෂයේ දී ද මෙම කාර්යය අඛණ්ඩව කරගෙන යාමට සැලසුම් කර ඇත.

06. පළාත් සභාවල මූල්‍ය කටයුතු සම්බන්ධීකරණය පදනම් කර ගෙන, පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්ගේ (මූල්‍ය) සහ අදාළ පාර්ශව සහභාගිත්වයෙන් රැස්වීම් පැවැත්වීමට ද 2025 වර්ෂයේ දී සැලසුම් කර ඇත.

07. පළාත් පාලන ආයතනවල මූල්‍ය හා භෞතික තොරතුරු දත්ත විශ්ලේෂණ හා දෘශ්‍යකරණ ඒකකය හා විමංසනය කිරීම.

08. පළාත් පාලන ආයතන වල 2025 වර්ෂයේ අයවැය ලේඛන සහ 2024 වර්ෂයේ අවසන් ගිණුම් වාර්තා දත්ත ඇතුළත් දත්ත පදනමක් පවත්වාගෙන යාම.

09. මෙම අමාත්‍යාංශය විසින් පළාත් සභා හා පළාත් පාලන ආයතන වෙත ලබා දී ඇති නමුත් තවදුරටත් එම ආයතන මඟින් පවරාගෙන නොමැති වාහන විධිමත් ලෙස පැවරීමට අවශ්‍ය කටයුතු කිරීම

10. විවිධ රාජ්‍ය ආයතන, ව්‍යවස්ථාපිත ආයතන හා වෙනත් ආයතන විසින් පළාත් සභා හා පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් අවස්ථානුකූලව ඉල්ලා සිටින තොරතුරු එම ආයතන වෙත ලබා දීම තුළින් ජාතික මට්ටමේ තීරණ ගැනීමට සහාය වීම.

❖ අභ්‍යන්තර විගණන අංශය

01. අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන කටයුතු:-

- විගණන සැලැස්ම අනුව විගණන අවධානම් ක්ෂේත්‍ර සැලකිල්ලට ගෙන විගණන කටයුතු සිදු කිරීම.
- මූලික වාර්තාව ඉදිරිපත් කිරීම.
- අභ්‍යන්තර විගණන අංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව මාසික ප්‍රගතිය වාර්තා කිරීම.
- කළමනාකරණ විගණන කමිටු රැස්වීම් පැවැත්වීම.
- ව්‍යාපෘති අභ්‍යන්තර විගණන සමාලෝචන කමිටු රැස්වීම් පැවැත්වීම.
- අමාත්‍යාංශයේ සහ විදේශීය ව්‍යාපෘති සම්බන්ධයෙන් කාර්තු වාර්තා ඉදිරිපත් කිරීම.
- අමාත්‍යාංශය යටතේ පවත්නා විදේශාධාර ව්‍යාපෘතිවලට අදාළව විගණන කටයුතු සිදු කිරීම.
- දේශීය ව්‍යාපෘතිවලට අදාළව විගණන කටයුතු සිදු කිරීම.
- ඉදිරි වර්ෂය (2026) සඳහා විගණන සැලැස්ම පිළියෙළ කිරීම
- ඉදිරි වර්ෂය (2026) සඳහා අභ්‍යන්තර විගණන අංශයේ සැලැස්ම පිළියෙල කිරීම

02. රාජ්‍ය ගිණුම් කාරක සභාව කැඳවීම් කරන අවස්ථාවලදී ඒ සඳහා සහභාගීවීම.

03. අමාත්‍යාංශ ලේකම් විසින් පවරනු ලබන විශේෂ විමර්ශන සිදු කිරීම.

❖ ක්‍රමසම්පාදන අංශය

1. 2025 වර්ෂයට අදාළ අමාත්‍යාංශයේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම.
2. 2024 ට අදාළ අමාත්‍යාංශයේ කාර්යසාධන වාර්තාව සකස් කිරීම.
3. ආයතනික ප්‍රතිඵල රාමුව සකස් කිරීම.
4. තිරසර සංවර්ධන අරමුණුවලට අදාළ කටයුතු සම්බන්ධීකරණය කිරීම.
5. සෙමාවුල් ව්‍යාපෘතියට (Saemaul Project) අදාළ පස් අවුරුදු ප්‍රාදේශීය සංවර්ධන සැලැස්ම සෙමාවුල් පදනම සමඟ ඒකාබද්ධව සකස් කිරීම.
6. ශ්‍රී ලංකාවේ සියලුම පළාත් පාලන ආයතන සම්බන්ධ කරගෙන දැනට නිර්මාණය කෙරෙමින් පවතින ජාතික මට්ටමේ දත්ත විශ්ලේෂණ හා දෘෂ්‍යකරණ පද්ධතිය ස්ථාපිතකොට පවත්වාගෙන යාම.
7. නව ව්‍යාපෘති යෝජනා හඳුනා ගැනීම සඳහා අවශ්‍යතා විශ්ලේෂණය කිරීම (Need Analysis) හා ව්‍යාපෘති යෝජනා සකස් කිරීම.

❖ ව්‍යාපෘති අධීක්ෂණ අංශය

| | ක්‍රියාකාරකම | 2025 වාර්ෂික ඉලක්ක කාර්තු 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|
| 1 | මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක සියලුම විදේශාධාර ව්‍යාපෘති, ව්‍යාපෘති අරමුණු කරා සම්බන්ධීකරණය කිරීම. | ✓ | ✓ | ✓ | ✓ |
| 2 | විදේශාධාර ව්‍යාපෘතිවල ප්‍රගති සමාලෝචනය සඳහා රැස්වීම් පැවැත්වීම, වාර්තා පිළියෙළ කිරීම හා ඒවායේ ගැටළු හා දුර්වලතා සම්බන්ධයෙන් මැදිහත් වී කටයුතු කිරීම. | ✓ | ✓ | ✓ | ✓ |
| 3 | ඒ ඒ ව්‍යාපෘතීන්ට අදාළව ජාතික මෙහෙයුම් කමිටු (NSC) රැස්වීම් පැවැත්වීම හා ඒ තුළින් පැනනගින ගැටලු නිරාකරණය කිරීම. | ✓ | ✓ | ✓ | ✓ |
| 4 | මාසික ප්‍රගති වාර්තා සකස් කිරීම හා අනෙකුත් රජයේ ආයතන මඟින් වරින්වර ඉල්ලුම් කරන වාර්තා සකස් කිරීම. | ✓ | ✓ | ✓ | ✓ |
| 5 | වසා දැමූ හා ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති සම්බන්ධයෙන් පැනනගින නෛතික ගැටළු නිරාකරණය සඳහා සේවා යෝජකයා වශයෙන් අදාළ ආයතන සමඟ සම්බන්ධව කටයුතු කිරීම. | ✓ | ✓ | ✓ | ✓ |
| 6 | මෙම වසරේ සහ ලබන වසරේ නිම කෙරෙන ව්‍යාපෘති නිසි පරිදි නිම කිරීමට අදාළ කාර්යයන් සහ ලේඛන සැකසීමට අවශ්‍ය සම්බන්ධීකරණයන් සිදු කිරීම . | ✓ | ✓ | ✓ | ✓ |

❖ **මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය**

බොරැල්ල, තිඹිරිගස්යාය, විස්ට්වයික්, මාළිගාවත්ත යන පොම්පාගාර සම්පූර්ණයෙන්ම සාදා විස්ට්වයික් නලය එලීම නිම කර, ඒවායේ ක්‍රියාකාරීත්වය සහ මෙහෙයුම් කටයුතු කොළඹ මහ නගර සභාවේ පාලනය යටතේ පවත්වාගෙන යාමට කටයුතු කිරීමත් සමඟ, මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතියේ වැඩ කටයුතු සාර්ථකව අවසන් කිරීම.

❖ **මහ කොළඹ ජල සහ අපද්‍රව්‍ය ජල කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන**

1. "කිරුළපන ප්‍රදේශය සඳහා නව ගුරුත්වජ මලාපවහන, පීඩන නල සහ පොම්පාගාර ඉදිකිරීම" කොන්තරාත්තුවේ ශේෂව පවතින ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කිරීම සහ පවත්වාගෙන යාම.

2. "කිරුළ-නාරාහේන්පිට මලාපවහන ජාල සංවර් ධනය" කොන්තරාත්තුවේ ඉදිකිරීම් කටයුතු වල ප්‍රගතිය පවත්වාගෙන යාම.

3. "කොළඹ නගරයේ දකුණු දිග කොටසේ අපජල මලාපවාහන පද්ධතිය පුනරුත්ථාපනය කර, පුළුල් කිරීම" කොන්තරාත්තුව ප්‍රදානය කර ඉදිකිරීම් කටයුතු කර ගෙන යාමට සැලසුම් කර ඇත.

❖ **නැගී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය (RIDEP)**

අදාල උපදේශක සමාගම් දෙකද සේවයට කැඳවා අතරමග වැඩ අත්හිටුවා වැඩ බිම් වලින් අයින් වී සිටි කොන්ත්‍රාත්කරුවන් සමග සාකච්ඡා කර ඔවුන් නැවත වැඩබිම් තුලට බලමුලු ගැන්වීම.

එසේ බලමුලු ගැන්වූ කොන්ත්‍රාත්කරුවන්ට ඉතිරි වී ඇති වැඩ වලින් 30% ක ප්‍රමාණයක් 2025 වර්ෂයේදී නිම කිරීමට ඔවුන් පෙළ ගැස්සවීම.

ව්‍යාපෘතිය නැවත ස්ථාපිත කිරීම සඳහා කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරණ ලද අතර එයට අනුමැතිය 2024.12.18 දින හිමි වී ඇත. උපදේශක සමාගම් මඟින් සංශෝධිත ඇස්මේන්තු ලබා ගැනීම.

❖ **සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ (GEM) ව්‍යාපෘතිය**

| | |
|---|---|
| ***DLI 4- පාසල පදනම් කරගත් වෘත්තීය ගුරු සංවර්ධනය (School Based Professional Teacher Development – SBPTD*** | කලාපවලින් අවම වශයෙන් 85% ක පාසල් SBPTD ප්‍රතිඵල ලබා ගැනීම |
| ***DLI 5 - නව වෘත්තීය සුදුසුකම් ලත් ගුරුවරුන් සංඛ්‍යාව වැඩි කිරීම*** | අමතර වෘත්තීය සුදුසුකම් ලත් ගුරුවරුන් 27,500ක් ඇති කිරීම (ඔවුන්ගෙන් අවම වශයෙන් 50%ක් කාන්තාවන් වීම) |
| ***DLI 6 - පාසල් තත්ත්ව සහතික ලබා දීම සඳහා ජාතික පද්ධතියක් ස්ථාපිත කිරීම*** | අවම වශයෙන් පාසල් 3,500ක පාසල් ප්‍රජාව පදනම් කරගත් තත්ත්ව සහතික ස්වයං සමාලෝචන සහ බාහිර සමාලෝචන සම්පූර්ණ කිරීම |
| ***DLI 7 - පාසල් වැඩිදියුණු කිරීම සඳහා, වැඩි දියුණු කරන ලද වැඩසටහන (Enhanced Program for School Improvement - EPSI)*** | කලාපවලින් අවම වශයෙන් 85% ක පාසල් EPSI ප්‍රතිඵල ලබා ගැනීම |

❖ **ග්‍රාමීය පාලම් ව්‍යාපෘතිය**

ග්‍රාමීය පාලම් ව්‍යාපෘතියේ අදියර V යටතේ නිම කිරීමට අපේක්ෂිත පාලම් 162 අවසන් කිරීම.

## ❖ දේශීය ණය සහ සංවර්ධන අරමුදල (LLDF)

1. ණය ලබාදීම සඳහා පමණක් සීමා නොවී ඉන් ඔබ්බට තාක්ෂණික සහාය ලබාදෙමින් කටයුතු කිරීමට හැකි ආයතනයක් බවට පත්කිරීම.

2. ණය ලබාදීමේ ක්‍රියාවළිය විධිමත් සහ කාර්යක්ෂම කිරීම සඳහා යහපත් යාන්ත්‍රණයක් සැකසීම.

3. යහපත් විගණන මතයක් පවත්වාගෙන යාම සඳහා කටයුතු කිරීම.

4. මෙහෙයුම් සහ මූල්‍ය ක්‍රියාවළිය කාර්යක්ෂමව සහ විනිවිද භාවයකින් පවත්වාගැනීම සඳහා විධිමත් ඒකාබද්ධ පරිගණක පද්ධතියක්සකස් කර හඳුන්වාදීම.

5. පළාත් පාලන ආයතන අතර සහසම්බන්ධතාවය වර්ධනය සඳහා ඩිජිටල් තාක්ෂණය භාවිතා කිරීම.

6. අරමුදලේ මූල්‍ය ශක්තිය වර්ධනය කරගැනීම සඳහා මූල්‍ය ශක්තිය වැඩිකිරීමට විදේශීය ආයතන සමග කටයුතු කිරීම.

7. ණය ලබාදෙන ක්ෂේත්‍රයන් ජාතික සංවර්ධන අවශ්‍යතාවයනට අනුව විවිධාංගීකරණය කිරීම.

8. මහජනතාව හා පළාත් පාලන ආයතන අතර අරමුදල සම්බන්ධ යහපත් මතයක් ඇති කිරීම සඳහා දිස්ත්‍රික්/ පළාත් මට්ටමින් දැනුවත් කිරීමේ වැඩසටහන් කිරීම.

9. වැඩි සේවයක් ලැබෙන පරිදි හා වර්තමානයට ගැලපෙන පරිදි අරමුදල පරිවර්තනය කිරීම සඳහා ආඥාපනත සංශෝධනය කිරීම.

10. චක්‍රීය අරමුදල ශක්තිමත් කිරීම.

## ❖ පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය (SLILG)

1. පළාත් පාලන දෙපාර්තම්මේන්තුව

- ප්‍රසම්පාදනයේ මූලික ක්‍රම පිළිබඳ වැඩමුළුව
  - රාජ්‍ය සේවකයන්ගේ අයිතිවාසිකම් හා වරප්‍රසාද පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුව (ගාස්තු අය කරනු ලබන)
- වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ පුහුණු වැඩමුළුව
- රාජ්‍ය පෞද්ගලික සහයෝගීතාව පිළිබඳ පුහුණු වැඩමුළුව
- ප්‍රසම්පාදනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (ගාස්තු අය කරනු ලබන)

2. භෞතික සැළසුම් හා ඉංජිනේරු දෙපාර්තමේන්තුව

- ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුව
- නගර සැලසුම්කරණය පිළිබඳ පුහුණු වැඩමුළුව
- 3R සංකල්පය පිළිබඳ පුහුණු වැඩමුළුව
- කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ පුහුණු වැඩමුළුව
- ව්‍යපෘති යෝජනා සකස් කිරීම පිළිබඳ පුහුණු වැඩමුළුව (ගාස්තු අය කරනු ලබන)
- පරිසර බලපත්‍ර නිකුත් කිරීම හා නෛතික ක්‍රියාවලිය පිළිබඳ පුහුණු වැඩමුළුව (ගාස්තු අය කරනු ලබන)
- පරිසර ආරක්ෂණ හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව

3. පොදු කළමනාකරණ හා නීති දෙපාර්තමේන්තුව

- ආකල්ප වර්ධනය හා ධනාත්මක සිතුවිලි ඇති කර ගැනීම පිළිබඳ පුහුණු වැඩමුළුව
- මූලික විමර්ශනයක් පවත්වන ආකාරය හා චෝදනා පත්‍ර නිකුත් කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුව
- කාර්යාල කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩමුළුව
- පළාත් පාලන නීතිය පිළිබඳ පුහුණු වැඩමුළුව
- පළාත් පාලන ආයතනවල අදායම් සහ බදු අයකිරීම පිළිබඳ පුහුණු වැඩමුළුව
- පළාත් පාලන ආයතනවල සභා කටයුතු පිළිබඳ පුහුණු වැඩමුළුව

- පෞද්ගලික ලිපිගොණු නඩත්තුව පිළිබඳ පුහුණු වැඩමුළුව පාඨමාලාව (ගාස්තු අය කරනු ලබන)

- උසාවි කටයුතු පිළිබඳ පුහුණු වැඩමුළුව (ගාස්තු අය කරනු ලබන)
- පළාත් පාලන ආයතනවල දේපොළ කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩමුළුව (ගාස්තු අය කරනු ලබන)
- පළාත් පාලන නීතිය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (ගාස්තු අය කරනු ලබන)

4. තොරතුරු තාක්ෂණ හා මූල්‍ය කළමනාකරණ දෙපාර්තමේන්තුව

- විද්‍යුත් පළාත් පාලනය පිළිබඳ තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමාව
- පරිගණක සහතික පත් පාඨමාලාව
- වර්ඩ්වෙප්‍රෙස් භාවිතයෙන් වෙබ් අඩවි නිර්මාණය පිළිබඳ පුහුණුව
- QGIS මෘදුකාංගය භාවිතයෙන් සිතියම් සකස් කිරීම පිළිබඳ පුහුණුව
- සුහුරු යෙදවුම් මගින් පළාත් පාලනය නව්‍යකරණය කිරීම පිළිබඳ පුහුණුව
- සභා කටයුතු ඩිජිටල්කිරීමේ මාර්ග සැලැස්ම පිළයෙල කිරීම පිළිබඳ පුහුණුව
- පළාත් පාලන ආයතනවල මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම හා ඉදිරිපත් කිරීම (අවසාන ගිණුම් සකස් කිරීම) පිළිබඳ පුහුණු වැඩමුළුව
- පළාත් පාලන ආයතනවල අයවැය සකස් කිරීම පිළිබඳ පුහුණු වැඩමුළුව
- පළාත් පාලන මූල්‍ය කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව (ගාස්තු අය කරනු ලබන)

5. පර්යේෂණ හා සංවර්ධන අංශය

- පළාත් පාලන ආයතන යටතේ ක්‍රියාත්මක වන දින/සති පොළවල් පිළිබඳ පර්යේෂණ අධ්‍යයනය
- පළාත් පාලන ආයතන යටතේ ක්‍රියාත්මකවන පෙර පාසල් පිළිබඳ පර්යේෂණ අධ්‍යයනය
- පළාත් පාලන ආයතනවල කාර්ය සාධනය මැනීම සඳහා ප්‍රමුඛ කාර්ය සාධන දර්ශක (KPIs) සංවර්ධනය කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුව
- විමර්ශන ක්‍රියාවලිය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (ගාස්තු අය කරනු ලබන)
- පුස්තකාල කළමනාකරණය (කොහා මෘදුකාංගය) පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (ගාස්තු අය කරනු ලබන)
- Excel for e-Governance and Research දෙදින වැඩමුළුව (ගාස්තු අය කරනු ලබන)